ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දහවන පාර්ලිමේන්තුව

(පළමුවන සැසිවාරය)




# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

# 2023

# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

## 2023

ජාතික විගණන කාර්යාලය

## අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

## අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

## අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

## අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

# ජාතික විගණන කාර්යාලයේ නිල ලාංඡනය

## මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ

- ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මඟින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.
- එහි මැද ඇති තරාදිය මඟින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මඟින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති පලා පෙති රටාව මඟින් ජාතික සංස්කෘතිය නිරූපණය කෙරේ.

# විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පවරා ඇති වගකීම් අතරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ ඵලදායී හා කාර්යක්ෂම පාර්ලිමේන්තු පාලනයක් සහතික කිරීම උදෙසා ස්වාධීන පරීක්ෂණයටලක් කිරීම යන්න ඇතුළත් වේ. මෙම වගකීම් ඉෂ්ඨ සිද්ධ කරමින් 2023 මූල්‍ය වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පහත සඳහන් කාණ්ඩයන්හි අතිරේක වාර්තා ඉදිරිපත් කිරීමට දැනටමත් කටයුතු යොදා ඇති අතර මෙම වාර්ෂික වාර්තාව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන 7 වන කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරමි.

| | | |
|---|---|---|
| 1 වන කාණ්ඩය | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |
| 2 වන කාණ්ඩය | - | රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල් |
| 3 වන කාණ්ඩය | - | ව්‍යවස්ථාපිත නොවන අරමුදල් |
| 4 වන කාණ්ඩය | - | විදේශ ආධාර ව්‍යාපෘති |
| 5 වන කාණ්ඩය | - | පළාත් සභා |
| 6 වන කාණ්ඩය | - | පළාත් පාලන ආයතන |
| 8 වන කාණ්ඩය | - | කාර්ය සාධන හා පාරිසරික විගණන පැවරුම් |
| 9 වන කාණ්ඩය | - | රාජ්‍ය සමාගම් |
| 10 වන කාණ්ඩය | - | විශේෂ විගණන පැවරුම් |
| 11 වන කාණ්ඩය | - | ත්‍රෛවාර්ෂික වාර්තා |

පසුගිය වසර පුරාවට අප විසින් මුහුණ දෙන ලද සැලකිය යුතු ජයග්‍රහණ හා අභියෝග පිළිබඳ සැලකීමේදී, විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් ගෞරවයෙනි. මෙම වාර්තාව අප විසින් සිදු කරන ලද කටයුතු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පමණක්ම නොව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ පාරදෘශ්‍යබව, වගවීම හා විශිෂ්ටත්වය උදෙසා අපගේ අප්‍රතිහත කැපවීම පිළිබඳ සාක්ෂියක් ද වේ.

සෞඛ්‍ය, අධ්‍යාපනය සහ යටිතල පහසුකම් ඇතුළු විවිධ ක්ෂේත්‍ර තුළ පෘථුල මට්ටමේ විගණන කටයුතු අපගේ කණ්ඩායම විසින් කැපවීමෙන් වසර පුරාවට සිදු කර ඇත. අපගේ මූලික පරමාර්ථය ඉතා පැහැදිලිය. එනම්, රාජ්‍ය සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව වෙන්කිරීම හා උපයෝජනය සහතික කිරීමයි. රාජ්‍ය මෙහෙයුම් තුළ පවතින ශක්තීන් මෙන්ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර යන දෙඅංශයම පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙමින් අප විසින් රාජ්‍ය අංශයේ සියලුම ආයතන ආවරණය වන පරිදි විවිධ වර්ගයේ විගණන සිදු කර ඇත.

මෙවර වාර්තාවේ මුඛ්‍ය තේමාවක් වන්නේ වගවීමේ දැඩි වැදගත්කමයි. රජයේ ආයතන, පාර්ලිමේන්තුව සහ විවිධ පාර්ශ්වකරුවන් සමඟ අපගේ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම සඳහා අපි උද්‍යෝගයෙන් කටයුතු කර ඇත. සහයෝගී සබඳතා වර්ධනය කර ගැනීමෙන්, රාජ්‍ය පරිපාලනයේ සෑම තලයකම වගවීම ප්‍රවර්ධනය කරන ශක්තිමත් රාමුවක් ස්ථාපිත කිරීමට අපි අරමුණු කරන්නෙමු. මෙම ප්‍රවේශය මගින් අපගේ සොයාගැනීම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම පමණක් නොව රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය උදෙසා වූ හවුල් වගවීමක් ද වර්ධනය කරයි.

අපගේ සාම්ප්‍රදායික විගණන ව්‍යවහාරයන්ට අමතරව, අපගේ කාර්යයට උසස් ක්‍රමවේද සහ තාක්ෂණික මෙවලම් ඒකාබද්ධ කිරීමෙන් නවෝත්පාදනය සිදු කිරීමට අපි සූදානමින් සිටින්නෙමු. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ යුරෝපා සංගමයේ සහ ලෝක බැංකුවේ මූල්‍ය ආධාර මගින් මෙම මුලපිරීමට සහාය ලබා දේ. වඩාත් සවිස්තරාත්මක ඇගයීම් සිදුකිරීමට මෙන්ම පූර්වයෙන් අපගේ අවධානයට ලක් නොවී පවතින ගැටළු හඳුනා ගැනීමට මෙම වැඩිදියුණු කිරීම් මගින් අපට හැකිවේ. අප විසින් සිදු කරනු ලබන විගණනය මහජනතාවට හා ප්‍රතිපත්ති සම්පාදකයින්ට එකසේ උපරිම වටිනාකමක් ලබා දෙන බව සහතික කරමින්, දත්ත විශ්ලේෂණ සහ අවදානම් තක්සේරුව කෙරෙහි අප තුළ පවතින අවධානය හේතුවෙන් අදාළ ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දීමට අපට හැකි වී ඇත.

පාර්ලිමේන්තුවට සහ අදාළ විගණිත අස්තිත්වයන් වෙත ඉදිරිපත් කරනු ලබන මාගේ වාර්තා මගින් රාජ්‍ය පරිපාලනය තුළ අඛණ්ඩ වැඩිදියුණුවක් ඇති කිරීමේ අවශ්‍යතාවය අවධාරනය කරනු ලබයි. පාලනය වැඩි දියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා රාජ්‍ය මුදල් විචක්ෂණ ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම ඉලක්ක කරගත් නිර්දේශ මා විසින් ඉදිරිපත් කර ඇත. මෙම නිර්දේශ අතිශයෙන් සැලකිල්ලට ගෙන ජනතා විශ්වාසයේ පදනම් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ඉදිරියට කටයුතු කරගෙන යාමේදී, අපගේ නිර්දේශ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා රජයට සහය දැක්වීම පිළිබඳ වගවීම තුළ අපි නොසැලී කටයුතු කරන්නෙමු. අපගේ කාර්යභාරය විගණන කාර්යයෙන් ඔබ්බට දිව යන්නකි. එනම්, සියලුම පුරවැසියන්ගේ අවශ්‍යතා ඉටු කරන වඩාත් වගකියන සහ විනිවිදභාවයෙන් යුක්ත රාජ්‍ය අංශයක් ගොඩනැගීම සඳහා සහය වීමට අපි අපේක්ෂා කරන්නෙමු.

මෙම වාර්තාව සකස් කිරීමට තම වෘත්තීයභාවය හා වෙහෙස මහන්සිය දායක කළ අපගේ කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි. අපගේ පාර්ශවකරුවන්ගේ නිරන්තර සහයෝගය හා සහයෝගීතාවය ද මම අගය කරමි.සාමූහික ප්‍රයත්නයක් තුලින් රාජ්‍ය සම්පත් විචක්ෂණශීලීව හා අරමුණු සහගතව කළමනාකරණය කරන අනාගතයක් කරා ගමන් කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කරමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2024 ඔක්තෝම්බර් 30 දින

# පටුන


| I කොටස - අපගේ සංවිධානය | පිටුව | | පිටුව |
|---|---|---|---|
| හැඳින්වීම | 01 | පාර්ලිමේන්තුවට සහය වීම | 10 |
| වාර්තාවේ සංයුතිය | 01 | රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය හා කාර්යසාධනය - ඇගයීම සඳහා වන ප්‍රශ්නාවලිය | 12 |
| ස්ථානගත වීම | 01 | වෙනත් කාරක සභා සඳහා වන ප්‍රශ්නාවලිය | 12 |
| විගණන අධිකාරි බලය | 02 | විගණකාධිපති විසින් අධිභාර පැනවීම | 12 |
| රාජ්‍ය විගණනයේ ඉතිහාසය | 02 | පලාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම | 13 |
| විගණනය සඳහා වර්තමාන අධිකාරි බලය | 02 | මහජන නියෝජන පරීක්ෂා කිරීම | 14 |
| 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සංශෝධිත | 02 | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉදිරිපත් කිරීම | 15 |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත | 03 | අපගේ සංවිධාන සටහන | 16 |
| වෙනත් විශේෂිත අණපනත් | 03 | අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය | 18 |
| විගණනයේ ස්වාධීනත්වය | 04 | 2023 ජනවාරි 01 සිට 2024 ජූනි 30 දක්වා කාලය තුළ පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ගත් ක්‍රියා මාර්ග පිළිබඳ විස්තර | 19 |
| ස්වාධීනත්වය පිළිබඳ ජාත්‍යාන්තර අවශ්‍යතා | 04 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 20 |
| අපගේ ස්වාධීනත්වය | 06 | දේශීය වශයෙන් පුහුණුව ලබා ගැනීම | 21 |
| විගණන සේවා කොමිෂන් සභාව | 07 | විදේශිය පුහුණු අවස්ථා සලසා දීම | 21 |
| අපගේ කාර්යභාරයන් | 08 | බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය ලබා දීම | 22 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාතික විගණන පනත | 08 | පුහුණු අවස්ථා සලසා දීම | 22 |
| විගණන ක්‍රමවේදය | 08 | සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම | 22 |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට හා විගණිත අස්ථිත්ව වෙත ඉදිරිපත් කිරීම | 09 | ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 23 |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නොවන විගණනය | 10 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2023 | 24 |

| II කොටස - විගණන නිරීක්ෂණය | පිටුව | | පිටුව |
|---|---|---|---|
| බුද්ධ ශාසන හා ආගමික කටයුතු | 29 | නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන | 295 |
| භාණ්ඩාගාරය හා රාජ්‍ය ණය | 35 | රාජ්‍ය පරිපාලන කටයුතු | 303 |
| රාජ්‍ය ආදායම | 53 | වැවිලි අංශය | 325 |
| බැංකු කටයුතු | 71 | කර්මාන්ත හා නිශ්පාදන කටයුතු | 335 |
| රක්ෂණ කටයුතු | 85 | ධීවර කටයුතු | 345 |
| ජාතික ආරක්ෂාව | 89 | පශු සම්පත් | 351 |
| ආපදා කළමණාකරණය | 101 | පරිසර | 357 |
| සන්නිවේදනය හා මාධ්‍යය | 109 | වනාන්තර හා වනජීවී | 365 |
| අධිකරණ හා බන්ධනාගාර කටයුතු | 119 | ජල සම්පාදන හා ජලාපවාහනය | 373 |
| සෞඛ්‍යය | 127 | කාන්තා හා ළමා කටයුතු | 383 |
| දේශීය වෛද්‍ය | 149 | වරාය හා නාවික | 391 |
| විදේශ කටයුතු | 155 | ගුවන් සේවා | 405 |
| වෙළඳ හා වාණිජ | 159 | ආයෝජන ප්‍රවර්ධන | 411 |
| මහාමාර්ග | 163 | මහජන ආරක්ෂාව | 417 |
| ප්‍රජා ප්‍රවාහනය | 177 | විදේශ රැකියා | 423 |
| කෘෂිකර්මාන්තය | 191 | කම්කරු | 431 |
| විදුලිබල හා බලශක්ති | 207 | ක්‍රීඩා | 437 |
| සංචාරක කටයුතු | 235 | වාරිමාර්ග | 449 |
| ඉඩම් | 243 | පතල් කැණීම් | 467 |
| නාගරික සංවර්ධන හා නිවාස | 247 | විදේශ ආධාර ව්‍යාපෘති | 475 |
| වතු යටිතල පහසුකම් | 261 | පළාත් සභා | 511 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 265 | පළාත් පාලන ආයතන | 537 |
| උසස් අධ්‍යාපනය | 275 | මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොමැති රාජ්‍ය ව්‍යවසායන් | 557 |
| අධ්‍යාපනය | 285 | | |
| **III කොටස - මූල්‍ය නොවන විගණන** | | | |
| කාර්යසාධන විගණන අංශය | 561 | විශේෂ විමර්ශන අංශය | 579 |
| විශේෂ වාර්තා අංශය | 571 | | |




# 01

# අපගේ සංවිධානය

# හැඳින්වීම

## වාර්තාවේ සංයුතිය

වාර්තාවේ පළමු කොටස ආයතනය හඳුනා ගැනීම, අධිකාර බලය, විගණනයේ ස්වාධීනත්වය, විගණන කාර්යභාරයන්, පාර්ලිමේන්තුවට සහාය වීම, අධිහාර පැනවීම, මහජන නියෝජන පරීක්ෂාව, සංවිධාන ව්‍යුහය, කාර්ය මණ්ඩල, පුහුණු කිරීම්, මූල්‍ය ප්‍රකාශන ආදී ලෙස වන ආයතනික තොරතුරුවලින් සමන්විත වේ.

වාර්තාවේ දෙවන කොටස මගින් ප්‍රධානතම ව්‍යවස්ථාපිත කාර්යභාරය වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, ව්‍යවස්ථාපිත ආයතන රාජ්‍ය සමාගම්, ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විදේශාධාර ව්‍යාපෘති, පළාත් සභා, පළාත් පාලන ආයතන ආදී වූ විගණන අස්තිත්වයන්හි වාර්ෂික විගණනවලදී නිරීක්ෂණය වූ ප්‍රධාන නිරීක්ෂණයන් මධ්‍යම රජයේ ආයතන, පළාත් සභා හා පළාත් පාලන ආයතන ආදී ලෙස වර්ගීකරණය කර දක්වා ඇත.

වාර්තාවේ තෙවන කොටස මගින් වාර්ෂික විගණනයන් නොවන කාර්යසාධන විගණනය, විශේෂ විගණනය, පරිසර විගණන, විශේෂ විමර්ශන ආදී වෙනත් විශේෂිත විගණන පිළිබඳ දක්වා ඇත. කෙසේ වුවද එම විගණනයන්ගෙන් අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණය II කොටස අදාළ විගණන ඡේදය යටතේ නිරීක්ෂණ ලෙසට ඇතුළත් කර ඇත.

## ස්ථානගත වීම

ජාතික විගණන කාර්යාලය බත්තරමුල්ල, පොල්දූව පාර, නො.306/72 ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධානතම ශාඛා කාර්යාලය බොරැල්ල, කොටා ටෙරසය,නො 07 ස්ථානයේ පිහිටුවා ඇත . තවද බස්නාහිර පළාත තුළ රජයේ ආයතන පරිශ්‍ර තුළ පමණක් ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාල හා ශාඛා කාර්යාල 185 ක් මගින් විගණන කටයුතු සිදු කරනු ලබයි.

මීට අමතරව ඉතිරි පළාත් 8 තුළද පළාත් පාලන ආයතන විගණනය සඳහා සහ පළාත තුළ ක්‍රියාත්මක මධ්‍යම රජයේ ආයතනවල විගණන කටයුතු සඳහා ජේෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාල සහ විගණන ශාඛා 164 ක් ස්ථාපිත කර ඇත.

අපගේ වෙබ් පිටුව : http://www.auditorgeneral.gov.lk

විද්‍යුත් ලිපිනය: ag@auditorgeneral.gov.lk

ෆැක්ස් : 011 2887223

දුරකථන අංක : 011-2887028 – 34

# විගණන අධිකාරය

## රාජ්‍ය විගණනයේ ඉතිහාසය

ලංකාවේ රාජ්‍ය විගණනයේ ආරම්භය 1799 දක්වා අතීතයට දිව යයි. බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් 1796 දී දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් පසු 1799 දී සිසිල් ස්මිත් මහතා ගණකාධිකාරි හා විගණකාධිපති ලෙස පත්කරනු ලැබ ඇති බවට ලේඛන මගින් තහවුරු වේ. ඉන්පසු 1931 දක්වා මෙම තනතුර විගණකාධිපති හා යටත් විජිත විගණක ලෙස වෙනස් වෙමින් පැවති අතර 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විගණකාධිපති ලෙස විගණන දෙපාර්තුමේන්තු ප්‍රධානියා හඳුන්වා ඇත. ඉන්පසු විගණකාධිපති තනතුරු නාමය වෙනස් වී නොමැති අතර එතෙක් පැවති විගණකාධිපති දෙපාර්තුමේන්තුව 2018 දී ජාතික විගණන කාර්යාලය ලෙස වෙනස් කරන ලදී.

1931 දී ඩොනමෝර් ව්‍යවස්ථාවට හා 1947 දී සෝල්බරි ව්‍යවස්ථාවට විගණකාධිපති කාර්යභාර්ය පිළිබඳ ඇතුළත් කර තිබී ඇති අතර 1972 දී ජනරජ ව්‍යවස්ථාව මගින් පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විගණනය පිළිබඳ ඇතුලත් කර ඇත.

## විගණනය සඳහා වර්තමාන අධිකාර බලය

### ➢ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ හා අමාත්‍ය කාර්යාල, අධිකරණ සේවා කොමිසන් සභාව ඇතුලු ස්වාධීන කොමිෂන් සභා, පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභා, පාර්ලිමේන්තු සභාව හා පාර්ලිමේන්තු මහලේකම්, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා , අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර හා කොටස්වලින් සියයට 50 ට වැඩි අයිතිය රජය, සංස්ථා හෝ පලාත් පාලන ආයතන දරන සමාගම් ද , ඒවායේ ගිණුම්ද ඇතුලුව විගණනය කරනු ලැබිය යුත්තේය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව මගින්, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි ඉටුකිරිම විගණකාධිපතිවරයා විසින් කළ යුතු බවට දක්වා ඇත. විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධානද එමගින් සළසා තිබේ.

➢ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී විගණිත ආයතනවල සියලු පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරිම, ගබඩා හා වෙනත් දේපලවලට පිවිස විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

## 2018 අංක 19 ජාතික විගණන පනත යටතේ අධිකාර බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම ඇතුලු කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම පිණිස ජාතික විගණන පනත සම්මත කරනු ලැබ ඇත. ඒ අනුව පනතේ 3(1) වගන්තිය මගින් විගණකාධිපතිවරයා විගණනය කරනු ලබන අස්ථිත්වයන්ට අදාල විගණන විෂය පථය දක්වා ඇත.

ඒ අනුව ඒකාබද්ධ අරමුදල ලැබෙන සියලු ආදායම් හා ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතු වේ.

එම විගණනයන් සිදු කිරීමේදී අදාළ ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හා කැඳවීම, තොරතුරු පිටපත් උද්ධෘත ලබා ගැනීමේ යම් තොරතුරක් සන්තකයේ තබා ගෙන සිටින සේවයේ යෙදෙන හෝ එසේ නොවන අයකු කැඳවීම හා එම ලේඛන ලබා ගැනීම මහේස්ත්‍රාත් අධිකරණයෙන් අවසර ලබා ගැනීමෙන් පසු සාවද්‍ය හෝ වංචා සහගත ගෙවීම් කරන ලද ආයතනයක ගිණුම්, ගණුදෙනු ආදිය පරීක්ෂා කල හැක.

## වෙනත් විශේෂිත අණපනත් මගින් ලැබී ඇති අධිකාර බලය

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහා නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය.
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය.
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය.
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය.
- ක්‍රිඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රිඩා සංගම් පනතේ 9 වගන්තිය.

# විගණනයේ ස්වාධීනත්වය

## ස්වාධීනත්වය පිළිබඳ ජාත්‍යන්තර අවශ්‍යතා

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

**1 ප්‍රතිපත්තිය** - යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

**2 ප්‍රතිපත්තිය** - උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධූරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

**3 ප්‍රතිපත්තිය** - උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නීතිමය රාමුවක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.
- රජයට හෝ රජයේ ආයතනවලට ලැබිය යුතු ආදායම් එකතු කිරීම.
- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව
- මූල්‍ය කළමනාකරණයේ හා වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ
- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්ති විගණනය නොකළ යුතු බැවින් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතනවලට අදාළ වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට එම ආයතන ගරු කළ යුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරා ගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩ සටහන්කරණය, වැඩසටහන් පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නීතිමය රාමුවේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ආකාරයට වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍යආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

**4 ප්‍රතිපත්තිය** - සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, නිවැරදිව, ඍජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතනය සතු විය යුතුය.

**5 ප්‍රතිපත්තිය** - ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

**6 ප්‍රතිපත්තිය** - විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.

- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු විය යුතුය.

- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මඟින් කළ යුතුය.

- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.

**7 ප්‍රතිපත්තිය** - උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.

- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීය වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

**8 ප්‍රතිපත්තිය** - මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නීතිමය රාමුවට (Mandate) අනුව කාර්යයන් සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නීතිමය රාමුවට අනුව කාර්යයන් (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

## අපගේ ස්වාධීනත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති ධූරය ස්ථාපිත කර ඇති අතර සුදුසුකම්ලත් විගණකවරයෙකු 41(අ) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විගණකාධිපති ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු බව තහවුරු කර ඇත. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් නොවන විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර ඇත. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා පනවන ලද ප්‍රතිපාදනයකි.

## විගණන සේවා කොමිෂන් සභාව

2022 නොවැම්බර් 4 දින ගැසට් කරන ලද 21 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව ව්‍යවස්ථාවේ 153(අ) සිට (ඍ) දක්වා වන වගන්ති මගින් විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීමත් සමග 2023 අප්‍රේල් 10 දින සිට විගණන සේවා කොමිෂන් සභාව බලාත්මක විය. විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුතුව ජාතික විගණන කාර්යාලයෙන් විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට ඉහළ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ හෝ මහාධිකරණ විනිසුරුවරයෙකුගෙන් හා විශ්‍රාමික 1 ශ්‍රේණියේ පරිපාලන නිලධාරියෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.

153 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින් පත් කිරීම් , උසස් කිරීම් ,මාරු කිරීම් , විනය පාලනය කිරීමේ බලතල කොමිෂන් සභාව සතුවන අතර 153(ඇ) 2 (ආ) වගන්තිය අනුව ජාතික විගණන කාර්යාලයේ ඇස්තමේන්තු සකස් කිරීම කොමිෂන් සභාවේ කාර්යයක් වේ. එමගින් ජාතික විගණන කාර්යාලයේ මූල්‍යමය හා පරිපාලන ස්වාධීනත්වය ස්ථාපනය කර ඇත.

මේ අනුව, 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්පූර්ණයෙන් බලාත්මක වීම මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය සඳහා පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග අනුගතවීමට කටයුතු කර ඇත.

2018 වර්ෂය දක්වා විගණකාධිපතිවරයාට ඔහුගේ වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීමට සිදු වූ අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ විගණකාධිපති, ඔහුගේ කාර්ය මණ්ඩලය ඇතුළත් ජාතික විගණන කාර්යාලය සඳහා වූ අයවැය, පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන අතර ඔහුගේ අයවැය පිළිබඳව විධායක පාලනයෙන් බැහැරව තීරණය කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපතිගේ අයවැය පාර්ලිමේන්තුව විසින් වෙනම තීරණය කිරීමට විධිවිධාන සලසා තිබීම මගින් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කිරීමේදී මූල්‍යමය ස්වාධීනත්වය තහවුරු කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තරාත්මකව දක්වා තිබීමේ අවශ්‍යතාවය 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් 2018 අගෝස්තු 01 දින සිට සම්පූර්ණ කර ඇත.

මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු අතර කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඇස්තමේන්තුව දින 10 ක් ඇතුළත මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කථානායකවරයා ලබා ගෙන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුව ජාතික අයවැයට ඇතුළත් කිරීම සඳහා කථානායකවරයා විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

# විගණන කාර්යභාරයන්

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාතික විගණන පනත

ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත. ඒ අනුව විගණකාධිපතිවරයාගේ කාර්යභාරයන් පහත පරිදි වේ.

විගණකධිපතිවරයා විසින්,

- ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියළුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියළු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
- විගණනය කරනු ලබන ආස්ථිතායන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කර ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
- වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය.
- එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.
- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකළ යුතු බව

## විගණන ක්‍රමවේදය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් සකස්කර ඇති ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් විගණන කටයුතුවලදී අදාළ කරගනු ලැබේ. එම ප්‍රමිතවලට අනුව මූල්‍ය විගණනයක් සැලසුම් කිරීමේදී අවදානම පාදක කරගත් නියැදියක් හඳුනාගන්නා අතර අවදානම හඳුනාගැනීම සඳහා ප්‍රමිතවල සඳහන් මඟපෙන්වීම පරිදි නිර්ණායක ලෙස ගණුදෙනු, සිද්ධි හෝ ශේෂවල පවත්නා ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක වැදගත් බව සැලකිල්ලට ගනු ලබයි.

වාර්ෂික විගණනවලදී මූල්‍යමය ගනුදෙනුවලට පමණක් සීමා නොවී අස්ථිත්වයේ කාර්යසාධනය පිළිබඳවද පවත්නා සම්පත් ඇතුලු සීමාවන් තුළ විගණනයක් සිදු කරනු ලබයි. ඒ අනුව අස්ථිත්වයේ කාර්සාධනය පිළිබඳ සිදුකරන ලද නිරීක්ෂණ සුදුසු පරිදි අස්ථිත්වය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට හා විගණිත අස්ථිත්වයන් වෙත ඉදිරිපත් කිරීම

2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විගණනයෙන් පසු පහත සඳහන් පරිදි විගණන වාර්තා ඉදිරිපත් කල යුතු වේ.

- පනතේ 10 වන වගන්තිය අනුව එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දක්වා ඇති කාල සීමාවන් තුළදී එක් එක් විගණනවල ප්‍රතිඵල පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කල යුතු බව
- පනතේ 11 වන වගන්තිය අනුව රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආස්ථිතයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආස්ථිතයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වීමෙන් පසු  මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු බව.
- පනතේ 12 වන වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව
- පනතේ 13 වන වගන්තිය අනුව අදාළ විගණනය කරනු ලබන ආස්ථිතය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආස්ථිතයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම
- පනතේ 14 වන වගන්තිය අනුව සෑම මුදල් වර්ෂ 3 ක් අවසන් වීමෙන් මාස 9 කට පසු විගණනය කරනු ලබන අස්ථිත්ව පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වේ.

ඒ අනුව 2023 වර්ෂය තුළදී ඉහත පරිදි වූ වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ විගණිත අස්ථිත්ව ප්‍රමාණය පහත පරිදි වේ.

| සේවාලාභියා | ආයතන ගණන |
|---|---|
| අමාත්‍යාංශ | 29 |
| දෙපාර්තමේන්තු | 110 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 341 |
| රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි හා රජයට පවරාගත් ව්‍යාපාර | 222 |
| රාජ්‍ය සමාගම් | 117 |
| රාජ්‍ය බැංකු | 09 |
| ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් | 67 |
| විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති | 113 |
| අනෙකුත් ස්වාධීන ආයතන | 11 |
| පළාත් සභා | 09 |
| පළාත් පාලන ආයතන | 341 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 565 |
| ක්‍රීඩා සංගම් | 66 |
| පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක | 273 |
| පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන | 70 |
| එකතුව | **2368** |

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නොවන විගණන

කාර්යසාධන විගණනය , විශේෂ විගණනය , පරිසර විගණනය හා විශේෂ විමර්ශන හා වෝහාරික විගණනය ආදී විගණන මගින් මූල්‍ය ප්‍රකාශ පදනම් කර නොගත් යම් විශේෂිත විෂය ක්ෂේත්‍රයක කාර්යසාධනය පිළිබඳ හෝ මතභේදයට තුඩු දෙන ගණුදෙනු හෝ සිදුවීමෙන් සම්බන්ධව ගැඹුරින් පරීක්ෂා කර වාර්තා කිරීම සිදු කෙරේ. වාර්තාවේ තෙවන කොටස මගින් මේ සම්බන්ධ විස්තර ඉදිරිපත් කර ඇත.

## පාර්ලිමේන්තුවට සහාය වීම

රාජ්‍ය ගිණුම් හා පොදු ව්‍යාපාර කාරක සභා අවස්ථා සඳහා සහභාගි වීම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හා 120 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තුවේ කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් එක් එක් ආයතන පිළිබඳව පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 119 යටතේ පිහිටුවන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය වනුයේ මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු වෙත ප්‍රතිපාදනය කරන ලද මුදල් භාවිතා කල ආකාරය පෙන්නුම් කරන ගිණුම්ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්ය සාධනය සහ කළමණාකරනය පරීක්ෂා කිරීම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථා, මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පරිපාටිය, කාර්යය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකු බැගින් වන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා සහ/ හෝ ඔහුගේ නියෝජිතයින් සෘජුවම එම කමිටුවලට සහාය වේ. එහි දී සාකච්ඡාවට භාජනය වන ආයතනයට අදාළ විගණන වාර්තාවේ ඇතුළත් වැදගත් නිරීක්ෂණවල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර යාවත්කාලීන කරන ලද නිරීක්ෂණය සමඟ වර්තමාන කාර්යය සාධනයට අදාළ කමිටුවේ සාකච්ඡා කිරීමට යෝග්‍ය නිරීක්ෂණ ඇතුළත් සාකච්ඡා සටහනක් පිළියෙල කර කමිටුව වෙත ඉදිරිපත් කරන අතර ඒ මත පදනම්ව කමිටු සභාපතිවරයා සාකච්ඡාව පවත්වාගෙන යනු ලබයි.

සාකච්ඡාවට භාජන වීමට නියමිත විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් කරුණුවලට අදාළ වර්තමාන තත්ත්වය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ලිඛිත තොරතුරු ඇතුළත් වාර්තාවක් සැපයීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. විගණකාධිපතිට පිටපතක් සහිතව ඉදිරිපත් කරන එම වාර්තාව පදනම් කරගෙන විගණකාධිපතිවරයා විසින් යථෝක්ත සාකච්ඡා සටහන පිළියෙල කරනු ලබන අතර පෙර පවත්වන ලද රැස්වීම් වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද පරීක්ෂා කර ඒ පිළබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු ද එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ.

කාරක සභා අවස්ථාවේදී විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ සාකච්ඡාවට බඳුන් වන කරුණු පිළිබඳව පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳව අදහස් දැක්වීම මඟින් කමිටුවට සහාය වීමයි. එහිදී අදාළ කරුණු පිළිබඳව මෙන්ම කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට සහ සාකච්ඡාවට කැඳවූ ආයතනයේ නිලධාරීන් ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අදහස් දැක්වීම ද විගණකාධිපතිවරයා විසින් බොහෝදුරට සිදු කරනු ලබයි.

ඒ අනුව, 2023 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 64 ක් හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 61 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා, විශේෂ විගණන වාර්තා හෝ කාර්යය සාධන වාර්තා සාකච්ඡා කරන ලද අතර එම කමිටු සභාවාර සඳහා විගණකාධිපතිවරයා සහාය වී ඇත.

## රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය හා කාර්යසාධනය ඇගයීම සඳහා වන ප්‍රශ්නාවලිය

ඊට අමතරව විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ස්වාධීන කොමිෂන් සභාවල මූල්‍ය පාලනය සහ කාර්යය සාධනය ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයීය නිලධාරීන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වී ඇත. තවද, ඒ එක් එක් ආයතන විසින් එම ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර ඒ බව වාර්තා කිරීම මඟින් අදාළ ඇගයීම් කටයුතු සාර්ථකව නිම කිරීමට වාර්ෂිකව විගණකාධිපතිවරයා තවදුරටත් එම කමිටුවට සහාය වේ.

## වෙනත් කාරක සභා සඳහා සහාය වීම

එමෙන්ම මුදල් පිළිබඳ කාරක සභාව, අයවැය කාරක සභා යනාදී විවිධ පාර්ලිමේන්තු කාරක සභා සඳහා විගණකාධිපති නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීම යනාදී වශයෙන් විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යය භාරයට අමතරව නන් අයුරින් පාර්ලිමේන්තු කටයුතු සඳහා 2023 වර්ෂය තුළ විගණකාධිපතිවරයා සහාය වී ඇත.

සති 8 ක් ඇතුළත සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර පිළිබඳව වාර්තා කිරීම සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයාට යොමු කරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳව පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114 ට අදාළව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තා පරීක්ෂා කර නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වර්ෂය තුළ විගණකාධිපතිවරයා විසින් ඉටුකරන ලද තවත් සුවිශේෂී වූ කර්තව්‍යයක් වේ.

## විගණකාධිපති විසින් අධිභාර පැනවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට බලාත්මක වීමත් සමඟම එහි 19 වගන්තිය පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපති විසින් විගණනය කරනු ලබන අස්ථිත්‍යයක යම් ගණුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මඟින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණන සේවා කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, යම් ගනුදෙනුවක් හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදු වූ සෑම

ඌනතාවකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, එම විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධානගණන් දීමේ නිලධරයා වෙත වාර්තා කළ යුතු වේ.

එලෙස වාර්තා කරනු ලබන වටිනාකම එම ඌනතාවයට හෝ පාඩුවට වගකිවයුතු තැනැත්තන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව අය කරගැනීමේ වගකීම අදාළ ප්‍රධාන ගනන්දීමේ නිලධාරී වෙත පවරා ඇත.

එසේ වුවද විගණකාධිපතිවරයාට තම කාර්යය ඉටුකිරීමේදී තමාට දැනගැනීමට ලැබුණු තොරතුරු වෙනත් පාර්ශවයකට හෙළි කිරීමට ජාතික විගණන පනතේ 09 වගන්තිය පරිදි සීමා පනවා තිබීම සහ විගණන පනතේ 19 වගන්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විගණන තොරතුරු විගණකාධිපතිගෙන් විගණන සේවා කොමිෂන් සභාවට ලැබිය යුතු ආකාරය පිළිබඳ නෛතික ප්‍රතිපාදන නොමැතිවීම මත අධිභාර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා එලෙස නෛතික ප්‍රතිපාදන ඇතුළත් වන පරිදි විගණන පනත සංශෝධනය කළ යුතු බවට නීතිපතිවරයා විසින් මතයක් ප්‍රකාශ කර ඇත.

එම තත්ත්වය තුළ විගණන පණත මඟින් හඳුන්වාදී ඇති අධිභාර ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණ තිබුණි.

එසේ වුවද ජාතික විගණන පනත බලාත්මක වීමටද ප්‍රථම සිට විශ්වවිද්‍යාල සහ පළාත් පාලන ආයතනවලට අදාළව අධිභාර පැනවීමට විගණකාධිපතිට වෙනත් ලිඛිත නීති මඟින් පවරා තිබූ බලතල මත එම අධිභාර ක්‍රියාවලිය විගණකාධිපතිගේ මැදිහත් වීම මත පෙර පරිදිම සිදුවෙමින් පවතී.

ඒ අනුව මෙම අධිභාර ක්‍රියාවලිය වඩාත් සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර ඒ සඳහා අධිභාර පැනවීම විගණකාධිපතිවරයා විසින් අවසන් කිරීමටත් ඒ සම්බන්ධයෙන් වූ අභියාචනා සලකා බැලීම විගණන සේවා කොමිෂන් සභාවටත් පැවරීම සඳහා ජාතික විගණන පනතේ ප්‍රතිපාදන සංශෝධනය කිරීම සභාවට පැවරීම වඩාත් සුදුසු බව නිර්දේශ කෙරේ. මේ සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 19 වන ඡේදය සඳහා සුදුසු සංශෝධන සිදු කළ යුතුව ඇත.

## පළාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම්

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර මහා නගර සභා 28 ක්, නගර සභා 37 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් වේ. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥාපනත් හා පනත්වලින්, නිතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත බලය පවරා ඇත. එකී බලය අනුව මහා නගර සභා ආඥා පනතේ 226 වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්ති වලින් විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේදී පාර්ශවකරුවන් 130 දෙනෙකු වෙත රු.මිලියන 79.24 ක අධිභාර නිවේදන නිකුත් කරන ලද අතර එම අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 10 දෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද රු.මිලියන 50.36 ක් වූ අධිභාර නිවේදන සඳහා මුදල් අදාල සභා අරමුදලට ගෙවා තිබුණි. ඉහත පරිදි නිකුත් කරන ලද අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 62ක් සඳහා රු.මිලියන 2.15 ක් වටිනා අධිභාර සහතිකද 2023 වර්ෂය තුළදී නිකුත් කර ඇත.

## මහජන නියෝජන පරීක්ෂා කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන ආස්ථිත්වයන්ට අදාළව ඕනෑම කාරණයක් පිළිබඳව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතුරින් යම් අයෙකු විසින් විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුම් දීමක් කර තිබෙන විට ඒ පිළිබඳව පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය වෙත මහජනතාව පෞද්ගලිකව හෝ මහජන නියෝජිතයන් හා විවිධ සංවිධාන හරහා ලැබෙන ලිඛිත නියෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යාලය තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කර ඇත. එම ඒකකය මගින් ආයතනයට ලැබෙන නියෝජන ලියාපදිංචි කර පරීක්ෂා කිරීම සඳහා නියෝජනයෙහි ස්වභාවය හා වැදගත්බව සැලකිල්ලට ගෙන විශේෂ විමර්ශන හා වෝහාරික විගණන ඒකකයට හෝ විෂයීගත කරුණ අදාළවන විගණන ශාඛාවට හෝ ප්‍රාදේශියව පිහිටුවා තිබෙන විශේෂ විගණන ඒකකවලට මහජන නියෝජන කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා ඉදිරිපත් කරනු ලබයි. එම අංශ විසින් නියෝජනවල ඇතුළත් තොරතුරු පාදක කරගෙන සිදුකරනු ලබන විගණනවලදී මතුකර ගනු ලබන නිරීක්ෂණවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අදාළ විගණන ආස්ථිත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික විගණන වාර්තාවලට ඇතුළත් කිරීමට හෝ විශේෂ වාර්තා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට හෝ ජාතික විගණන කාර්යාලය විසින් කටයුතු කරනු ලැබේ.

කෙසේ වෙතත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 09 වගන්තියෙහි පවත්නා සීමාකාරී විධිවිධාන පිළිබඳ අවධානය යොමුකර එම විගණනයන්ගේ ප්‍රතිඵල සෘජුව අදාළ නියෝජනයන් ඉදිරිපත් කරනු ලැබූ පාර්ශවයන් වෙත දැනුම් දෙනු නොලැබේ. එහෙත් නිර්නාමික නියෝජන හැරුණු විට අනෙකුත් නියෝජන සම්බන්ධයෙන් එය ලද බව හා ඒවා පරීක්ෂා කර සුදුසු පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව ඒවා එවන ලද පාර්ශවයන් වෙත දන්වා යවනු ලැබේ.

2023 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලය වෙත මහජන නියෝජනයන් 2601 ක් ලැබී තිබුණු අතර එම නියෝජනයන්ගෙන් 1492 ක් රජයේ හෝ රාජ්‍ය ආයතන වල පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් වූ අතර 99 ක් විවිධ පාර්ශවයන්ගෙන් දුක්ගැනවිලි සම්බන්ධයෙන් විය. තවත් නියෝජන 989 ක් ආයතනික වංචා හා දූෂණ සම්බන්ධයෙන් වූ අතර 21 ක් විවිධ පාර්ශවයන්ගේ පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් විය. එසේම මෙම නියෝජනයන් අතුරින් 915 ක් යොමු කරන්නාගේ අනන්‍යතාවය සහිතව ඉදිරිපත් කර තිබුණු අතර, නියෝජනයන් 1686 ක් නිර්නාමිකව ඉදිරිපත් කර තිබුණි. මේ අතුරින් වැඩි ප්‍රමාණයක් ප්‍රමාණවත් හෝ යම් තරමක හෝ සාක්ෂි සහිතව ඉදිරිපත් කර තිබුණි. සාක්ෂි කිසිවක් නොමැතිව වුවද ලැබෙන පැමිණිලි ද පරීක්ෂාවන්ට ලක් කරනු ලැබේ. වැඩිදුර විමර්ශන කටයුතු සඳහා යොමුකරන ලද ලිඛිත නියෝජනයන් පිළිබඳ ආංශික වර්ගීකරණයක් සිදුකිරීමේදී ප්‍රධාන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා 450 ක් ද, පළාත් පාලන අංශය සඳහා 288 ක් ද, සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා නියෝජනයන් 279 ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් නියෝජනයන් 120 ක් ද කෘෂිකර්ම, පාරිසරික, ප්‍රවාහන, සංස්කෘතික, මහාමාර්ග, උසස් අධ්‍යාපන, යන ක්ෂේත්‍ර සඳහා පිළිවෙලින් 187 ක් 61 ක් 58 ක් 60 ක් 71 ක් සහ 85 ක් ද වශයෙන් නියෝජනයන් ලැබී තිබුණු අතර රජයේ විවිධ ආයතන සඳහා තවත් නියෝජනයන් 285 ක් ජාතික විගණන කාර්යාලය වෙත ලැබී තිබුණි.

## තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉදිරිපත් කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය සඳහා තොරතුරු නිලධාරියෙකු සහ නම්කළ නිලධාරියෙකු පත්කර ඇත. එම තොරතුරු ඉල්ලීම් තැපැල් මගින් මෙන්ම විද්‍යුත් තැපෑල මගින්ද තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලැබේ. 2023 වර්ෂයේදී තොරතුරු පනත යටතේ තොරතුරු ඉල්ලීම් 105ක් ලැබී ඇති අතර එයින් 90ක් සඳහා තොරතුරු සපයා ඇත. ලද ඉල්ලීම් 15ක් පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රතික්ෂේපිත තොරතුරු ඉල්ලීම් බොහොමයක් විගණන විමසුම් පිටපත් ඉල්ලා ඉදිරිපත් කර ඇති අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 9 ඡේදය අනුව විගණනයට අදාළ තොරතුරු හා ලේඛන ලබා දීමට නොහැකි බැවින් විගණන විමසුම් පිටපත් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

# අපගේ සංවිධාන සටහන

| Senior Deputy Auditors General | Deputy Auditors General | Senior Assistant Auditors General | | | Assistant Auditors General | Superintendents of Audit | Audit Officers |
|---|---|---|---|---|---|---|---|
| | | **Sector** | **Name of the Divisional Head** | **Code** | | | |
| **Central Government Audit & Assurance<br>(CGAA-1)<br>Mr. Mr. G.H.D. Dharmapala** | Defence, Judicial, Law and Order **(DJL)**<br>**Room No. 102**<br>**Mr. S.T.B. Rathnayaka** | Defence | Mr. H.P.D. Gunasekara | **(DEF)** | | | |
| | | Judicial, Law & Order | Mrs. A.G.A. Helmimi | **(JLO)** | | | |
| | Transpotation, Avaiation, Ports and Shipping **(TAP)**<br>**Room No. 214**<br>**Vacant** | Community Transpotation | Mr. R.A.B. Indrajith | **(COT)** | | | |
| | | Port & Shipping | Mrs. M.R.R.K. Mallawa | **(PAS)** | | | |
| | | Aviation | Mrs. N.D.N.C. Kumari | **(AAV)** | | | |
| | Power and Energy **(POE)**<br>**Room No. 202**<br>**Mrs. M.I.P.Hemamali** | Power | Mr. K.A.A. Kulathunga | **(PWR)** | | | |
| | | Energy | Mr. N.H.A.R.K. Gunarathne | **(ENR)** | | | |
| | Foreign Funded Projects, Sports and Youth Affairs **(PSY)**<br>**Room No. 302**<br>**Mr. S.M.N.. Thilakarathna** | Sports and Youth Affairs | Mr. M.P.I.M. Rashmi | **(SYA)** | | | |
| | | Water & Sanitation | Mrs. M.A.S. Pushparani | **(WAS)** | | | |
| | Parliamentory Affairs, Other Independent Institutions, Media and Disaster Management **(PMD)**<br>**Room No. 201**<br>**Mr. K.H.U.D. Sarath Kumara** | Disaster Management | Mrs. W.G.R.N. Weerakkody | **(DMG)** | | | |
| | | Communication and Media | Mrs. G.H.I.Vindiya | **(CAM)** | | | |
| | | Parliamentary Affairs and Independent Commissions | Mr. K.N.M. Kumarasinghe | **(PIC)** | | | |
| | Special Audit Assignments & Public Representations<br>**(SPA) Room No. 306**<br>**Mrs. T.G.I. Padmini** | Performance, Environmental & Citizen Participatory Audits | Mrs. K.T.W.Gamage | **(PEC)** | | | |
| | | Special Investigation and Forensic Audits | Mr. B.O.D. Fernando | **(SIF)** | | | |
| | Health, Wellfare and Social Security **(HWS)**<br>**Room No. 402**<br>**Mr. H.M.U.S.A. Wijekoon** | Medical Supplies | Mr. K.K.S. Jayakody | **(MSU)** | | | |
| | | Teaching Hospitals | Mr. W. Ananda | **(THO)** | | | |
| | | Medical Administration | Mr. P. Masakorala | **(MED)** | | | |
| | | Labour and Social Welfare | Mrs. H.M.de Soyza | **(LSW)** | | | |
| | | Quality Assurance | Vacant | **(QUA)** | | | |
| | | Parliament Reporting & Coordination | Miss. W.V.S.P. Rathnaseeli | **(PRC)** | | | |
| | | Legal and Surcharge | Mr.K. M.N. Kumarasinghe | **(LEG)** | | | |
| | | IT Audits | Vacant | **(ITA)** | | | |
| | | | | | | | |
| **Central Government Audit & Assurance<br>(CGAA-2)<br>Mrs. Mrs. L.S.I. Jayarathna** | | Taxation & Procurement Audits | Mr. B.W.D. Lasantha | **(TAX)** | | | |
| | | Banking | Mrs. R.M.D.S. Rathnayaka | **(BAN)** | | | |
| | | Treasury & Public Debt | Mr. D.G.A.S. Anulasiri | **(TPD)** | | | |
| | | Public Revenue | Mr. E.M.K.M. Padmalal | **(PUR)** | | | |
| | | Insurance & Finance | Mr. S. Sanjeewa | **(INF)** | | | |
| | Industries, Trade & Commerce, Public Administration and Foreign Affairs **(ITP)**<br>**Mr. R.G. Hettiarachchi** | Industries and Manufacruring | Mrs. U.N. Aluthge | **(IMT)** | | | |
| | | Public Administration & Foreign Afffairs | Mrs. K.R.T. Menike | **(PAF)** | | | |
| | | Trade and Commerce | Mrs. S.M.C. Indika | **(TAC)** | | | |
| | Agriculture, Plantation, Fisharies and Irrigation **(APF)**<br>**Room No. 203**<br>**Mrs. H.N. Ranathunga** | Fisheries & Liverstock | Mrs. S. N. Welikala | **(FLS)** | | | |
| | | Irrigation, Water Resources & Mining | Mrs. M.D.S. Amarathunga | **(IWR)** | | | |
| | | Agriculture & Related Industries | Mr. P.K.M.P. Nonis | **(ARI)** | | | |
| | | Plantation & Land | Mrs. V.D. Seetha | **(PAL)** | | | |
| | Tourism, Investment Promotion, Wild Life, Forest, Culture and Arts **(TWC)**<br>**Room No. 205**<br>**Mrs. B.G.I. Niranja** | Cultural Affairs and Arts | Mrs. R.S. Katugampola | **(CAA)** | | | |
| | | Forest, Wild Life and Environment | Mrs. H.S.S. Perera | **(FWL)** | | | |
| | | Tourism & Investment Promotion | Mrs. M.S. Gunathilaka | **(TIP)** | | | |
| | Education and Vocational Training **(EVT)**<br>**Room No. 317**<br>**Mrs. W.M.P.A. Fonseka** | Education | Mrs. I.D.I. Priyadarshani | **(EDU)** | | | |
| | | Vocational Training | Mrs. N.N.K. Divakara | **(VOT)** | | | |
| | | Higher Education | Mrs. W.V.A.S. Pushpakumari | **(HED)** | | | |
| | Road Construction, Housing and Urban Development **(RCH)**<br>**Room No. 505**<br>**Mr. J. Sunil Shantha** | Road & Highways | Mr. E.A.D.P.P. Pushpakumara | **(RAH)** | | | |
| | | Construction & Engineering | Mrs. H.A.D. Chandani | **(CAE)** | | | |
| | | Housing & Urban Development | Mr. E.K.K.S. Edirisinghe | **(HUD)** | | | |
| | | | | | | | |
| **Zonal Audit & Assurance<br>(ZOAA)<br>Mrs. W.G.N. Menike** | Local Government Authorities and Provincial Councils **(LPS)**<br>**Room No. 315**<br>**Mr. M. Somathilaka** | Local Authorities of Central Province | Mr. H.A. Ananda | **(CPLG)** | | | |
| | | Local Authorities of Western Province | Mrs. M.U.M.N. Perera | **(WPLG)** | | | |
| | | Local Authorities of Sabaragamuwa Province | Mr. M.G. Madarasinghe | **(SGLG)** | | | |
| | | Local Authorities of North Central Province | Mrs. K.M.L. Ariyarathne | **(NCLG)** | | | |
| | | Local Authorities of Northern Province | Mr. B. A. Jeros | **(NPLG)** | | | |
| | | Local Authorities of Southern Province | Mrs. U.P.P. Perera | **(SPLG)** | | | |
| | | Local Authorities of Estern Province | Mr. P. Patkunan | **(EPLG)** | | | |
| | | Local Authorities of North Western Province | Mr. P.M.R. Pathiraja | **(NWLG)** | | | |
| | | Local Authorities of Uva Province | Mr. H.M.W. Pathmasiri | **(UPLG)** | | | |
| | | Institutions of the Central Province | Mr. S.P. Weerasinghe | **(CPPC)** | | | |
| | | Institutions of the Western Province | Mrs. S.A.D.C. priyadarshani (Act.) | **(WPPC)** | | | |
| | | Institutions of the Sabaragamuwa Province | Mrs. S. Rathnaweera | **(SGPC)** | | | |
| | | Institutions of the North Central Province | Mrs. J.A.S. Anesteen | **(NCPC)** | | | |
| | | Institutions of the Northern Province | Mr. V. Maniwadanan | **(NPPC)** | | | |
| | | Institutions of the Southern Province | Mr. K.W.S.A.K. Kariyawasam | **(SPPC)** | | | |
| | | Institutions of the Estern Province | Mr. K. Pratheepan | **(EPPC)** | | | |
| | | Institutions of the North Western Province | Mrs. M.A.S.R.S. Gunasekara | **(NWPC)** | | | |
| | | Institutions of the Uva Province | Mr. P. Liyanage | **(UPPC)** | | | |
| | Utilization of Central Government Allocation in Provincial Level **(CGW)**<br>**Room No. 206**<br>**Mr. M.S. Nayanakumara** | Central Govt. Allocation and institutions in Central Province | Ms. M.K.D.N. Mayakaduwa | **(CPCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Western Province | Mrs. S.A.D.C. priyadarshani | **(WPCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Sabaragamuwa Province | Mr. M.G. Madarasingha (Act.) | **(SGCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in North Central Province | Mrs. I.D.K. Pallegama | **(NCCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Northern Province | Mr. M.H.M. Arfath | **(NPCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Southern Province | Mr. K.M. Jayasinghe | **(SPCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Estern Province | Mr. W.C.V. Kuruppu | **(EPCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in North Western Province | Mrs. R.P.T.D. Rajapaksha | **(NWCG)** | | | |
| | | Central Govt. Allocation and institutions in Uva Province | Mr. B.G Asela Indunil | **(UPCG)** | | | |
| | Administration **(ADM)** | | | | | | |
| | | Training, Research and Development | Mr. L.K.I. Samantha | **(TRD)** | | | |
| | | Secretariat of the Auditor General & International Relations | | **(AGS)** | | | |

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලයට අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වලට ඇතුළත් කර ඇති නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 5 කින් සමන්විත වේ.

පළමු මට්ටම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. දෙවන මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රාජ්‍ය විගණන කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය හා සමස්ථ රාජ්‍ය විගණනය අධීක්ෂණය කිරීම සිදු කරන ලබයි. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ අංශ 72 ක් ස්ථාපිත කර ඇති අතර එම එක් එක් අංශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු තෙවන මට්ටම නියෝජනය කරනු ලබයි. එම ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ රජයේ හා පළාත් සභාවල විගණන කටයුතුද සිදු කරනු ලැබේ. අංශ ප්‍රධානීන් වෙත පැවරෙන අංශයක ඇති විගණන ''ශාඛා''වන්හි ප්‍රධානත්වය ''ශාඛා ප්‍රධානී'' ලෙස සහකාර විගණකාධිපතිවරයෙකු හෝ විගණන අධිකාරිවරයෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් සිව්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති සහකාර විගණන අධිකාරීන් හා විගණන නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කිරීම ශාඛා ප්‍රධානීන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් පස්වන මට්ටමට අයත් වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වීම විගණන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ඉහත සඳහන් තෙවන මට්ටමට අයත්වන අංශ 72 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ ප්‍රධානීන් 27 දෙනෙකු දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය විගණනය භාරව කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ අධීක්ෂණය නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු විසින් ඉටුකරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලයේ සමස්ථ මූල්‍ය හා පරිපාලන කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) විසින් ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී විසින් ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

මුදල් රෙගුලාසි 133 සඳහන් පරමාර්ථ ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර, ඔහු ඍජුව විගණකාධිපතිවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සේවා ව්‍යවස්ථාවක් පිළියෙළ කර අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, විගණන කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙනයාම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින්, රාජ්‍ය විගණන සේවය සඳහා ජාතික වැටුප් කොමිෂම විසින් නිර්දේශිත වැටුප්තල, සේවා නාමයන් හා සේවක සංඛ්‍යාව ශ්‍රී ලංකා විගණන සේවායේ හා විගණන පරීක්ෂක සේවයේ වැටුප් තලයන්ට, සේවා නාමයන්ට හා සේවක සංඛ්‍යාවට ආදේශ කර ජ්‍යෙෂ්ඨතාවයට නිලධාරීන් බඳවා ගැනීමට හා උසස්

කිරීමට 2021 සැප්තැම්බර් 13 දින අනුමත කර ඇති බැවින් එම කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඉටු ඉටු කර ඇත. විගණන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ දීර්ඝ කාලීනව පැවැති උසස්වීම් ලබා ගැනීමේ අවස්ථාව මෙම අන්තර්කාලීන විධිවිධාන තුළින් යම්තාක් දුරකට විසඳී ඇත.

## අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය

**2023 ජනවාරි 01 දිනට සහ 2024 ජුනි 30 දිනට ජාතික විගණන කාර්යාලයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

| | තනතුර | 2023.01.01 දිනට සේවක සංඛ්‍යාව | | | 2024.06.30 දිනට සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | තත්‍ය | පුරප්පාඩු | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
| 1. | විගණකාධිපති | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 2. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති | 3 | 0 | 3 | 3 | 2 | 1 |
| 3. | නියෝජ්‍ය විගණකාධිපති | 15 | 14 | 1 | 15 | 13 | 2 |
| 4. | අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 5. | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 6. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 7. | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති | 72 | 49 | 23 | 72 | 69 | 3 |
| 8. | සහකාර විගණකාධිපති | 455 | 15 | 324 | 455 | 18 | 259 |
| 9. | විගණන අධිකාරී | | 116 | | | 178 | |
| 10. | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 11. | ගණකාධිකාරී | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 12. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 13. | නීති නිලධාරී | 1 | 0 | 1 | 1 | 1 | 0 |
| 14. | පරිපාලන නිලධාරී {ක.සේ.නි.(අධි)} | 3 | 1 | 2 | 3 | 3 | 0 |
| 15. | තාක්ෂණ නිලධාරී විශේෂ | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 16. | සහකාර විගණන අධිකාරී | 360 | 332 | 28 | 360 | 340 | 20 |
| 17. | විගණන නිලධාරී | 1090 | 776 | 314 | 1090 | 568 | 522 |
| 18. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 3 | 1 | 2 | 3 | 1 | 2 |
| 19. | භාෂා පරිවර්තක | 10 | 8 | 2 | 10 | 7 | 3 |
| 20. | සංවර්ධන නිලධාරී | 55 | 56 | -1 | 73 | 67 | 6 |
| 21. | පුස්තකාලාධිපති | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 22. | තාක්ෂණ නිලධාරී - I | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 23. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 6 | 1 | 5 | 6 | 2 | 4 |
| 24. | කළමණාකරණ සේවා නිලධාරී | 121 | 113 | 8 | 121 | 110 | 11 |
| 25. | වාර්තා සැකසුම්කරු * | 41 | 41 | ** | 41 | 37 | ** |
| 26. | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 27. | රියදුරු | 48 | 46 | 2 | 48 | 47 | 1 |
| 28. | සංචාරක බංගලා භාරකරු | 13 | 7 | 6 | 13 | 6 | 7 |
| 29. | විදුලි කාර්මික | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 30. | ජලනල කාර්මික | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 31. | කා.සේ.සේ | 148 | 134 | 14 | 148 | 146 | 2 |
| 32. | දෙපාර්තමේන්තු කම්කරු ** | 2 | 1 | 1 | 2 | 1 | ** |

| එකතුව | 2459 | 1720 | 740 | 2477 | 1625 |
|---|---|---|---|---|---|

* මෙම තනතුර දැනට සිටින දෙපාර්තමේන්තුගත නිලධාරියාට පෞද්ගලික වන සේ පවත්වා ගැනීමෙන් පසු අහෝසි වීමට යටත්වේ.

** මෙම තනතුර දැනට සිටින දෙපාර්තමේන්තුගත නිලධාරියාට පෞද්ගලික වන සේ පවත්වා ගැනීමෙන් පසු අහෝසි වීමට යටත්වේ.

## 2023 ජනවාරි 01 දින සිට 2024 ජුනි 30 දක්වා කාලය තුළ පැවති පුරප්පාඩු පිරවීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර

අංක 21/1274/301/017 හා 2021 සැප්තැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ සහකාර විගණන අධිකාරි නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත නිලධාරීන් 125 ක් හා වෘත්තිය සුදුසුකම් මත 01ක් නිලධාරියෙක් වශයෙන් ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ IIශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට නිලධාරීන් 126ක් 2023.03.27 දින සිට උසස් කර ඇත. පසුව අප විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා එම සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ නමුත් පත්වීම් ලබාදුන් දිනය වන විට විශ්‍රාම ලබාසිටි තවත් නිලධාරීන් 20ක් සඳහා, ඔවුන් විශ්‍රාමලබා ගත් දිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ IIශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට පත් කරන ලදී. ඒ අනුව නිලධාරීන් 146ක් විගණන අධිකාරි තනතුරට උසස් කර ඇත.

2018 අංක 19 දරන ජාතික විගණන පනත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් නැවත විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත වීමත් සමඟම බලාත්මක විය. ජාතික විගණන කාර්යාලයේ පැවති ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය හා ශ්‍රී ලංකා විගණන සේවය ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා සකස්කළ නව සේවා ව්‍යවස්ථාව කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වශයෙන් අංක: 2366/31 හා 2024.01.12 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඒ අනුව 2024.01.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කෙරිණි.

එම ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ අන්තර්කාලීන විධිවිධාන අනුව එවකට පැවති පහත තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති තනතුරේ පැවති පුරප්පාඩු 03ක් 2024.03.05 දින පිරවීමට කටයුතු කර ඇත.
- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරේ පැවති පුරප්පාඩු 07ක් (2024.04.01දින 6ක් හා 2024.05.15 දින 01ක් වශයෙන්) පිරවීමට කටයුතු කර ඇත.
- නිලධාරීන් 39 දෙනෙක් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ IIශ්‍රේණියේ සිට II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම (සහකාර විගණකාධිපති) 2024.03.20 දින සිදු කර ඇත.
- නිලධාරීන් 36 දෙනෙක් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ I පන්තියට උසස් කිරීම (ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති ) 2024.05.31 දින සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ IIශ්‍රේණියේ සිටි නිලධාරීන් 07 දෙනෙක් 2024.01.17 දින සිට Iශ්‍රේණියට උසස් කර ඇත.
- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ Iශ්‍රේණියේ නිලධාරීන් 156 ක් 2024.05.16 දින සිට ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ අධි ශ්‍රේණියට උසස් කර ඇත.

ඒ අනුව ඉහත කී පරිදි කටයුතු කිරීම මඟින් ජාතික විගණන කාර්යාලයේ පුරප්පාඩු වලින් සැළකිය යුතු ප්‍රමාණයක් පිරවීමට කටයුතු කර ඇත.

එසේම 21/1274/301/017 හා 2021 සැප්තැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමිත පදනමින් තනතුරු පුරප්පාඩු පිරවීමට ලද තීරණයත් සමඟ අග්‍රාමාත්‍ය ලේකම් ප්‍රමුඛ රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචනය කිරීමේ කමිටුවේ , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ විගණන සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඒ අනුව ක්‍රියා කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ IIශ්‍රේණියේ විගණන නිලධාරීන් 469ක් බඳවා ගැනීම සඳහා සීමිත තරග විභාගය 2024 ජූනි හා ජූලි මස පවත්වා ඇත.

එම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ IIශ්‍රේණියේ විගණන අධිකාරීන් 165 ක් බඳවා ගැනීමට සීමිත තරග විභාගය 2024 අගෝස්තු 24 හා 25 යන දිනවලදී පවත්වා ඇත.

## කාර්ය මණ්ඩල පුහුණු කිරීම

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතන වල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන් දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1318 කින් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 356 කින් සමන්විත කාර්ය මණ්ඩලයක දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

එකී ව්‍යවස්ථාපිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම පිණිස ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ වර්තමානයට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

- දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරි ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- යහපත් ආකල්ප වර්ධනය කිරීම

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුක්තව ජාතික විගණන කාර්යාලයේ සෑම නිලධාරියෙකු විසින්ම අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (Continuous Professional Development –

CPD) සඳහා වර්ෂයකට පැය 100 කට නොඅඩු න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය ජාතික විගණන කාර්යාලය විසින් අවධාරණය කර තිබේ.

2018 වර්ෂයේ සිදු කරන ලද පුහුණු අවශ්‍යතා අධ්‍යයනය (Training Need Assessment) අනුව නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ලබාදිය යුතු බවට හඳුනාගත් පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමේ කාර්යභාරය ජාතික විගණන කාර්යාලය සිදු කරමින් පවතී.

- මූල්‍ය විගණනය
- විමර්ශන විගණනය
- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය
- වෝහාරික විගණනය
- ප්‍රසම්පාදන හා ඉදිකිරීම් විගණනය
- ව්‍යාපෘති විගණනය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිත
- බදුකරණය
- විසර්ජන ගිණුම් විගණනය
- පලාත් පාලන ආයතන ගිණුම් හා විගණනය
- අධිභාර ක්‍රියාවලිය
- විගණන වාර්ථාකරණය
- පරිගණක හැකියාව සංවර්ධනය
- භාෂාමය හැකියාවන් සංවර්ධනය

ඒ අනුව නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි වෘත්තීය මට්ටමින් සිදු කිරීමට අවශ්‍ය දක්ෂතාවයන් අත්පත් කරගත හැකි පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීමත්, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමටත් කටයුතු කරනු ලැබේ. එහිදී සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන්ගේ සහය මෙන්ම අවශ්‍ය පරිදි බාහිර දේශකවරුන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කරන අතර පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් අදාල පුහුණු අවශ්‍යතාවයන් සපුරා ගැනීම සිදු කරණු ලැබේ.

2023 වර්ෂයේ දී යුරෝපීය යූනියන් සහයෝගීතාවය ඇතිව ලෝක බැංකුව විසින් සපයන ආධාර යටතේ 2024 වර්ෂයේ දී බොහෝ දේශීය සහ විදේශීය පුහුණුවීම් අවස්ථා සැලසීමට හැකිවී තිබේ.

## දේශීය වශයෙන් පුහුණුව ලබා දීම

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2023 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය මගින් විගණන නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාතෘකා 5 ක් යටතේ පුහුණු වැඩසටහන් 27 ක් පවත්වා ඇති අතර විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබේ.

## විදේශීය පුහුණු අවස්ථා සලසා දීම

2023 වර්ෂයේදී වියදම් පාලනය පිළිබඳව පවත්නා රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා නිලධාරීන් 4 දෙනෙකු පමණක් විදේශීය පුහුණු වැඩසටහන් හා විවිධ වැඩමුළු සඳහා සහභාගී කරවීමට හැකිවිය.

2023 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් හා වැඩමුළු පිළිබඳව විස්තර පහත වගුවේ දක්වා ඇත.

| වැඩසටහන් විස්තරය | | වැඩසටහන් ගණන | සහභාගි වූ නිලධාරින් සංඛ්‍යාව | පුහුණු පැය ගණන |
|---|---|---|---|---|
| | **දේශීය පුහුණුවැඩසටහන්** | | | |
| **1** | මූල්‍ය විගණන පුහුණුව | 23 | 1220 | 26789 |
| **2** | උසස්වීම් ලද විගණන අධිකාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 1 | 115 | 4168 |
| **3** | විදේශ ව්‍යාපෘති විගණන පුහුණුව | 1 | 88 | 638 |
| **4** | ඉදිකිරීම් විගණන පුහුණුව | 1 | 100 | 3625 |
| **5** | ප්‍රසම්පාදන විගණන පුහුණුව | 1 | 275 | 1993 |
| | එකතුව | **27** | **1798** | **7,409** |
| | **විදේශිය පුහුණු වැඩසටහන්** | | | |
| **1** | උත්තරීතර විගණන ආයතන සහ දූෂණ විරෝධී ආයතන අතර සහයෝගීතාව වැඩිදියුණු කිරීම පිළිබඳ කලාපීය වැඩමුළුව - තායිලන්තය | 1 | 1 | **22** |
| **2** | දැනුම සම නිර්මාණ වැඩසටහන - JICA - ජපානය | 1 | 1 | **181** |
| **3** | "ආසියානු සංවර්ධන බැංකුව - 2023 ආසියානු ඇගයීම් සතිය - තායිලන්තය | 1 | 1 | **29** |
| **4** | ADB PEFA ආසියානු ප්‍රමුඛ පුහුණුව - පිලිපීනය | 1 | 1 | **22** |

## බාහිර ආයතන සඳහා සම්පත්දායකත්වය ලබාදීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන් 6 දෙනෙකු 2023 වර්ෂය තුළ දී ජාතික විගණන පනත හා විගණනයට සමගාමී ක්ෂේත්‍ර පිළිබඳ රාජ්‍ය සේවයේ නියුතු අනෙකුත් නිළධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය සඳහා තම සම්පත්දායකත්වය ලබා දීමට කටයුතු කර තිබේ.

## වෘත්තීය පුහුණු අවස්ථා සලසා දීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන්ගේ වෘත්තීය ප්‍රවීනතාව සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍ය නිළධාරීන් සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණු අවස්ථා සලසාදීමට අවශ්‍ය කටයුතු කර තිබේ.

## සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

විගණන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වන සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා සහ රාජ්‍ය සමාගම්, රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4)(අ) ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

ඒ අනුව සේවයේ යොදවන ලද විගණන සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවාව වෙනුවෙන් 2023 හා 2022 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 68.44 ක් හා රු.මිලියන 31.2 ක් ගෙවා ඇත.

සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදී සාධක සලකා බලන ලදී. ඊට අමතරව විගණන සමාගමට ඇති ජාත්‍යන්තර සම්බන්ධතා හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල ස්වභාවය යනාදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකවලට ඇතුළත් වී තිබුණි. ඒ අනුව විගණකවරුන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකළ අතර සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛන්ඩව එක් එක් විගණන කාර්යභාරය පවරන ලදී.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් 125 කින් සමාගම් 15 ක් විගණනය කිරීම සඳහා පමණක් ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් 02 ක් මට සහය විය. ඊට අමතරව ශ්‍රී ලංකා ක්‍රීඩා සංගම් 27 ක් විගණනය කිරීම සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් 13 දෙනෙකුගේ සහය ලබා ගන්නා ලදී.

රාජ්‍ය බැංකු 04 ක් විගණනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාගැනීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සහාය ලබා ගන්නා ලදි.

## ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් යුරෝපීය සහයෝගීතාවය යටතේ ක්‍රියාත්මක කරන විදේශාධාර ව්‍යාපෘතිය ජාතික විගණන කාර්යාලය ලද මහඟු අවස්ථාවකි. උත්තරීතර විගණන ආයතනයන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා වන ආයතනය විසින් කරන ලද ඇගයීමට අනුව ජාතික විගණන කාර්යාලය විසින් වර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව පෙන්වාදී ඇත. මීට සමගාමීව විගණන පණත යටතේ වන ව්‍යවස්ථාපිත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය වන ධාරිතාවය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටුකිරීමට අපේක්ෂිතය. ඒ අනුව ජාතික විගණන කාර්යාලයට රාජ්‍ය අංශයේ ආයතන වලට අදාලව ගුණත්වයෙන් උසස් විගණන වාර්තා නියමිත කාලයට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හැකියාව ලැබේ. ජාතික විගණන කාර්යාලය සතුව දැනට පවත්නා හැකියා මට්ටම වැඩිදියුණු කරගත හැකිවනවා මෙන්න ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ වඩාත් හොඳ භාවිතයන් සමඟ සමපාත වීමේ අවස්ථාවද ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් අවසාන වශයෙන් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් වන කටයුතු වල වගවීම සහ විනිවිධභාවය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

අත්සන් කර ඇති ආධාර ගිවිසුම අනුව එ.ජ.ඩො මිලියන 3.5 ක් ලැබීමට නියමිත අතර ව්‍යාපෘති කටයුතු 2026 වර්ෂයේ නොවැම්බර් 30 න් අවසන් වීමට නියමිතය. ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති කාලය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 1,050 ක් වේ. ව්‍යාපෘතිය විසින් දැනටමත් 2018 අංක 19 දරණ විගණන පනතේ දක්වා ඇති විශේෂිත විගණන ක්ෂේත්‍ර වලට අදාලව උපදේශකවරුන් බඳවා ගැනීමේ කටයුතුවල නිරත වෙමින් සිටී. ප්‍රසම්පාදනය, ඉඩම් අත්පත්කර ගැනීම, ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වූ පුහුණුසැසි බස්නාහිර, දකුණ සහ වයඹ පලාත් වල දැනටමත් අවසන්කර ඇති අතර ඉතිරි පළාත්වල ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ පුහුණු සැසි කිහිපයක්ද පවත්වා ඇත. වර්තමානයේ පවත්නා සියයට 40 ක පුරප්පාඩු නිසා ව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන යාම ඉතාමත් අභියෝගකාරී වී ඇති අතර 2024 දෙසැම්බර් අවසානය වන විට නව උසස් වීම් සහ බඳවාගැනීම් සමඟ මෙම තත්ත්වය මගහැරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන

## 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සත්‍ය 2023 රුපියල් | සත්‍ය 2022 රුපියල් |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | 1,499,559,208 | 1,481,951,627 |
| | | |
| මූල්‍ය වත්කම් | | |
| **අත්තිකාරම් ගිණුම්** | 149,680,375 | 194,108,547 |
| **මුදල් හා මුදල් සමාන දෑ** | - | - |
| | | |
| **මුළු වත්කම්** | **1,649,239,583** | **1,676,060,174** |
| | | |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | |
| **භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්** | 148,755,223 | (67,047,400) |
| **දේපළ පිරියත හා උපකරණ සංචිතය** | 1,499,559,208 | 1,481,951,627 |
| **කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය** | - | |
| | | |
| ජංගම වගකීම් | | |
| **තැන්පතු ගිණුම්** | 925,152 | 261,155,947 |
| **අග්‍රිම ශේෂය** | - | - |
| **මුළු වගකීම්** | **1,649,239,583** | **1,676,060,174** |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
විගණකාධිපති
2024 පෙබරවාරි 28 දින

කේ.නිලන්ති ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
2024 පෙබරවාරි

කේ.නිලන්ති ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික විගණන කාර්යාලය

## වාර්තාකිරීමේ පදනම

### වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

### මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

### දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

### දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

### මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | 415,611,400 | 489,581,029 |
| - | ආදායම් බදු | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | - | - |
| **300,000,000** | බදු නොවන ආදායම් හා වෙනත් | 415,611,400 | 489,581,029 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | **415,611,400** | **489,581,029** |
| - | **ආදායම් නොවන ලැබීම්** | **-** | - |
| - | භාණ්ඩාගාර අග්‍රිම | 1,769,796,000 | 1,532,936,000 |
| - | තැන්පතු | 172,584,544 | 190,875,670 |
| - | අත්තිකාරම් ගිණුම් | 83,389,954 | 80,667,273 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 53,828,162 | 5,509,635 |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | **2,079,598,660** | **1,809,988,578** |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | **2,495,210,060** | **2,299,569,607** |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | 50,251,023 | 103,715,921 |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | **2,444,959,037** | **2,195,853,686** |
| | **අඩු කළා : වියදම්** | | |
| | **පුනරාවර්තන වියදම්** | | |
| **2,038,510,000** | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 1,795,785,797 | 1,740,721,144 |
| **452,400,000** | අනෙකුත් භාණ්ඩ හා සේවා | 414,843,197 | 319,461,981 |
| **16,090,000** | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 14,186,831 | 14,499,269 |
| - | පොළී ගෙවීම් | - | - |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | - | - |
| **2,507,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | **2,224,815,825** | **2,074,682,394** |
| | **මූලධන වියදම්** | | |
| **16,000,000** | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10,418,737 | 6,724,786 |
| **28,800,000** | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 20,669,581 | 6,730,671 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | - | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | - |
| **3,000,000** | හැකියා වර්ධනය | 2,900,130 | 1,602,007 |
| **5,000,000** | වෙනත් මූලධන වියදම් | 1,087,688 | - |
| **52,800,000** | **මුළු මූලධන වියදම් (උ)** | **35,076,136** | **15,057,464** |
| | තැන්පතු ගෙවීම් | 432,815,339 | 104,543,186 |
| | අත්තිකාරම් ගෙවීම් | 38,961,782 | 50,533,345 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 53,828,162 | 5,509,635 |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | **525,605,283** | **160,586,166** |
| **2,559,800,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | **2,785,497,244** | **2,250,326,024** |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | (340,538,207) | (54,472,338) |
| - | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | (340,538,207) | (54,472,338) |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | - | - |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය 2023 රු. | 2022 සංශෝධිත රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | - | - |
| මුළු බදු ලැබීම් | 415,611,400 | 489,581,029 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 331,911,553 | 78,011,355 |
| අග්‍රිම ලැබීම් | 1,769,796,000 | 1,532,936,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 83,799,160 | 81,525,178 |
| තැන්පතු ලැබීම් | 172,584,544 | 190,875,670 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 53,828,162 | 5,509,635 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,827,530,819** | **2,378,438,867** |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,202,032,094 | 2,056,322,607 |
| සහනාධාර සහ මාරුකිරීම් | 14,186,831 | 14,499,269 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,645,156 | 28,578,887 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 50,251,023 | 103,715,921 |
| අත්තිකාරම් ගෙවීම් | 35,950,225 | 50,211,898 |
| තැන්පතු ගෙවීම් | 432,815,339 | 104,543,186 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 53,828,162 | 5,509,635 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,794,708,830** | **2,363,381,403** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **32,821,989** | **15,057,464** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| මූලධන වියදම් | 32,821,989 | 15,057,464 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **32,821,989** | **15,057,464** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(32,821,989)** | **(15,057,464)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | **0.00** | **-** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **0.00** | **-** |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |




# 02

# විගණන නිරීක්ෂණ

# බුද්ධශාසන හා ආගමික කටයුතු

2023 වර්ෂය ආරම්භයේ දී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 09 ක් සහ ව්‍යාස්ථාපිත මණ්ඩල / ආයතන 10 ක් බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්ව තිබුණු අතර අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කල යුතුව තිබුණි.

**කාර්යභාර්යන්**

බුද්ධාගම ඇතුළු සියළුම ආගම් ඇදහීමට සහ ආගමික අන්තවාදයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සියලු අයිතිවාසිකම් සහතික කිරීම සහ ආරක්ෂා කිරීම.

දහම් පාසල් අධ්‍යාපනයට පහසුකම් සැලසීම, පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම හා දුෂ්කර ප්‍රදේශවල පිහිටි ආගමික ස්ථාන වැඩිදියුණු කිරිම.

සියලු ආගම්වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම.

රාජ්‍ය ලේඛන විධිමත් කළමණාකරණය හා සංරක්ෂණය කිරීම ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කතෘ භාග ගෙවීම පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

මධ්‍යම සංස්කෘතික අරමුදල පරිපාලනය සහ නිසි අධ්‍යයනයක් කර ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගැනීම.

ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික උරුමයන් මෙන්ම නවීන හා සම්ප්‍රදායික සංස්කෘතික නිර්මාණ සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරිම සහ කලාකරුවන් දිරිමත් කිරීම.

සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන්වල අභිමානය ප්‍රමුඛ වන සංචාරක වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම, ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

## විගණන නිරීක්ෂණ

### පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**මහනුවර රජවාසල හා කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ අරමුදල් ඌන උපයෝජනය**

මහනුවර රජවාසල හා කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපද රජය විසින් එ.ජ. ඩොලර් 265,000 ක් වූ ආසන්න වශයෙන් රු.මිලියන 53 ක් ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධන සලකා බලා ඇමරිකා එක්සත් ජනපද රජය මඟින් ලබාදී තිබුණු මුදල එ.ජ. ඩොලර් 156,750 ක් වූ ආසන්න වශයෙන් රු.මිලියන 45.9 ක් දක්වා අඩුකර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 57 ක් ද, මූල්‍ය ප්‍රගතිය සියයට 21 ක් ද පමණක් වූ අතර, ගිවිසුම් කාලය 2024 අගෝස්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. මේ අතර 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ අක් මුදල් රු.මිලියන 41.9 කින් සියයට 63 ක් හෙවත් රු.මිලියන 26.8 ක් උපයෝජනය කර නොතිබුණි.

**හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන ලේඛනගත නොකිරීම**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය දක්වා හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 5,664 ක් විය. ඒ අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය තුළ ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබූ පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 2,706 ක් ද, එනම් හඳුනාගත් සංඛ්‍යාවෙන් සියයට 48 ක් විය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ ඇතුළත් භූ අවකාශීය දත්ත ගොණුවට ඇතුළත් කර තිබූ පුරාවිද්‍යා ස්ථාන ගණන 1,758 ක් පමණක් වූ අතර, ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් සියයට 69 ක භූගෝලීය ස්ථාන ක්‍රමාංකන දත්ත ලබාගෙන භූ අවකාශීය දත්ත ගොණුවට ඇතුළත් කර නොතිබුණි.

**පුරාවස්තු පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කටයුතු නොකිරීම**

පුරාවස්තු පනත උල්ලංඝනය කිරීම යටතේ 2023 වර්ෂයේ පුරාවස්තු සොරකම් කිරීම, පුරාවස්තු විනාශ කිරීම් හා අනවසර කැණීම් 179 කින් අදාළ සැකකරුවන් හඳුනා නොගත් අවස්ථා 12 ක් ද, සැකකරුවන් හඳුනාගත් නමුත්, නඩු පැවරීම් සිදු නොකළ අවස්ථා 64 ක් ද පැවතුණි. තවද, 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46 (1) වගන්තිය අනුව නීති කෙටුම්පත් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, 2023 වර්ෂය තුළ අයකර ඇති රු.මිලියන 130.5 ක් වූ අධිකරණ දඩ මුදලින් අඩක්, පුරාවිද්‍යා තැගි අරමුදලට බැර කොට නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු

ආපසු ලබා ගැනීමට හෝ ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීමට හෝ දායකවන තොරතුරු සපයන්නන්ට සහ ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ට තෑගි දීම ආදී නියමිත කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

**පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමේ ගාස්තු සංශෝධන නොකිරීම**

ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබාදීමේදී අය කෙරෙන ගාස්තු 2019 පෙබරවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.10,000 ක් ලෙස සංශෝධනය කර එම ගාස්තුව ඉදිරියේදී වර්ෂ 03 කට වරක් සංශෝධනය කළ යුතු බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 පෙබරවාරි 28 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) කොටසෙහි ඡේද අංක 05 ප්‍රකාරව වසර 03 කට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව ගාස්තු සංශෝධනය කළ යුතු විය. එසේ වුවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ ආකාරයට ගාස්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීමෙන් රජයට අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව බදු දී ඇති මාතර මහනගර සීමාව තුළ පිහිටි නුපේ පැරණි ඕලන්ද වෙළඳපොළ ගොඩනැගිලි සංකීර්ණය සඳහා ද එපරිදි ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු නොකර රු.5,000 ක ගාස්තුවකට බදුදී තිබුණි.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

**සුවිපත්‍ර පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය නිම නොකිරීම**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ රු.මිලියන 25.3 ක ඇස්තමේන්තුවක් මත ආරම්භ කළ සුවිපත්‍ර පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය 2019 වර්ෂයේ අවසන් කිරීමට කටයුතු යොදා තිබූ නමුත්, තාක්ෂණික නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හා නිවැරදි සැලසුමකට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය අවසාන වන විටත් රු.මිලියන 13.5 ක් වැයකර සුවිපත්‍ර 850,000 ක් පමණ පරිගණකගත කර පැවති අතර, තවදුරටත් පරිගණකගත කළ යුතුව 400,000 ක පමණ සුවිපත්‍ර ප්‍රමාණයක් පැවති බව නිරීක්ෂණය විය.

**ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු අවසන් නොකිරීම**

ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 992.2 ක් වූ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු 2021 මැයි 18 දින අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු නමුත්, නවීකරණ කටයුතු අවසන් කර නොතිබුණි. එදිනට රු.මිලියන 470.8 ක් වැයකර තිබුණු අතර, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

සියයට 47 ක් ද, භෞතික ප්‍රගතිය සියයට 53 ක් ද වූ නමුත්, නවීකරණ කටයුතු 2021 වර්ෂයේ සිට අතරමඟ නතර කර තිබුණි.

**ටෙරාබයිට් 500 ක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීම ක්‍රියාත්මක නොවීම**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ටෙරාබයිට් 500 ක ඩිජිටල් කෝෂ්ඨාගාර පිහිටුවීමට 2021 අප්‍රේල් 05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව වසර 05 ක් තුළ රු.මිලියන 120.2 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ වාර්ෂික ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. පූර්ව වර්ෂ සඳහා ප්‍රතිපාදන ලබාදී නොතිබුණු අතර, 2023 වර්ෂයට අදාළව රු.මිලියන 78.3 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් නොකිරීම.**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2023 දෙසැම්බර් දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර නොතිබුණි.

**කෞතුක වස්තූන් තක්සේරු කිරීමට කටයුතු නොකිරීම**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය කෞතුකාගාර 10 හි හා දෙපාර්තමේන්තු ගබඩාවල පවතින සමස්ත කෞතුක වස්තූන් පිළිගත් නිසි ක්‍රමවේදයක් සකස් කර තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

**සොරකම් සඳහා වගකිව - යුත්තන් හඳුනා නොගැනීම**

කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 4.44 ක් වූ කෞතුක භාණ්ඩ 221 ක් සොරකම් කිරීම සිදු කර 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 11 කට අධික කාලයක් ගතවී පැවති නමුත්, අදාළ නෛතික කාර්යයන් හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු අවසන් කර නොතිබුණි.

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ජාතික කලා උළෙල වැඩසටහන් සැලසුම් කළ පරිදි නොපැවැත්වීම**

ජාතික කලා උළෙල වැඩසටහන යටතේ 2023 වර්ෂයේ රු.මිලියන 66 කින් ක්‍රියාකාරකම් 10 ක් ඉටු කිරීමට සැළසුම් තිබුණු නමුත්, රු.මිලියන 10.5 ක් වෙන් කළ රාජ්‍ය නර්තන උළෙල හා ප්‍රාදේශීය සංස්කෘතික සංගම් සහ කලායතන වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉකුත් වර්ෂ දෙකෙහි ද නොපැවත්වූ රාජ්‍ය සංගීත සම්මාන උළෙල සඳහා 2023 වර්ෂයේදී රු.මිලියන 6 ක් ද, රූපවාහිණී රාජ්‍ය සම්මාන උළෙල සඳහා රු.මිලියන 6 ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබූ නමුත්, රු.මිලියන 1.4 ක වියදමකින් විනිශ්චය කටයුතු පමණක් සිදු කර තිබුණි.

**ඉඩම් හිමිකම් සනාථ කර නොගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන 03 ක් පිහිටි හෙක්ටයාර් 1.245 ක් වූ ඉඩම් 03 ක හිමිකම් සනාථ කරගෙන නොතිබුණි.

**නිසි අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත ලබාදුන් මුදල් සඳහා ප්‍රමාද ගාස්තු අය නොකිරීම**

ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීමේ අදියර I ට අදාළ කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැඟිල්ල භාර දී තිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 38.6 ක් අයකර තිබූ අතර, නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත එම මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම මුදල නැවත ආපසු ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද 2023 වර්ෂය දක්වාම එම මුදල අය කර ගෙන නොතිබුණු අතර, දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව මුද්‍රණ වියදම් දැරීම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව තරඟකාරී මිල කැඳවීමෙන් තොරව සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනේ චක්‍රලේඛ, ආකෘති පත්‍ර, ප්‍රවේශ පත්‍ර, කාල සටහන් සහ ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම සඳහා එකතුව රු. මිලියන 4.7 ක් වැය කර තිබුණි. තව ද, ආරාධිත අමුත්තන් වෙත ආරාධනා කිරීම සඳහා ලිපි යවා තිබියදී

උත්සවයට දින 2කට පෙර ආරාධනා පත්‍ර 1500ක් මුද්‍රණය කර බෙදා හැරීම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව තරඟකාරී මිල කැඳවීමෙන් තොරව 2021 සහ 2022 වර්ෂවලට අදාළව දහම් පාසල් ශ්‍රේණි විභාග වෙනුවෙන් ප්‍රශ්න පත්‍ර හා සහතික පත්‍ර මුද්‍රණය කිරීම සඳහා රු.මිලියන 40.2 ක් වැයකර තිබුණි. තවද, 2022 වර්ෂයේ ශ්‍රේණි විභාගවලට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව 832,875ක් වුවද ඊට වඩා ප්‍රශ්න පත්‍ර 165,609ක් හා එම විභාගවලට පෙනී සිටි 645,042 ක් වූ සිසුන් සංඛ්‍යාවට වඩා සහතික පත්‍ර 4,958ක් මුද්‍රණය කිරීමත්, 2021 වර්ෂයේදී විභාගයට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු තබා නොගෙන මුද්‍රණය කර තිබුණු ප්‍රශ්න පත්‍ර 1,067,946කින් 428,578ක් සහ විභාගයට පෙනී සිටි 639,368ක් වූ සිසුන් සංඛ්‍යාවට වඩා සහතික පත්‍ර 35,632 ක් මුද්‍රණය කර තිබීමත් හේතුවෙන් රු.මිලියන 6.2 ක නිෂ්කාර්ය වියදමක් ඇතිවී තිබුණි.

## හින්දු ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව

**දහම් පාසැල් සිසුන් සඳහා සහතික සහ ත්‍යාග ප්‍රදානයන් සිදු නොකිරීම**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබූ 2022 (2023) වර්ෂය සඳහා වූ ජාතික නිර්මාණ තරඟාවලියේ දහම් පාසැල් මට්ටම, ප්‍රාදේශීය මට්ටම, දිස්ත්‍රික්ක මට්ටම සහ ජාතික මට්ටමට අදාළ තරඟ රු. මිලියන 4 කට අධික වියදමකින් 2023 වර්ෂය තුළ පවත්වා, ප්‍රතිඵල නිකුත් කර තිබුණ ද, දහම් පාසැල් සිසුන් වෙත ඊට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් සිදු කර නොතිබුණි.

## මහා භාරකාර දෙපාර්තමේන්තුව

**බුදල් කළමනාකරණයෙන් අලාභ ලැබීම**

බුදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බුදල් කළමනාකරණය කර ඒවායේ ආදායම යොදා ගත හැකි වුවත් 2023 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන බුදල් 07 කට අයත් වතු 11 කට අදාලව රු.මිලියන 5.01 ක අලාභයක් ලබා තිබුණි. එය අපේක්ෂිත ලාභය වූ රු.මිලියන 19.58 න් සියයට 26 ක සෘණ ප්‍රතිශතයක් විය.

# භාණ්ඩාගාරය හා රාජ්‍ය ණය

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත. මෙම කාර්යයන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම සිදු කරන ප්‍රධානම යාන්ත්‍රණය භාණ්ඩාගාරය වේ. මෙම ඡේදයේදී රාජ්‍ය වියදම, රාජ්‍ය ණය හා රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ තොරතුරු හා නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

## රජයේ වියදම

2023 මුදල් වර්ෂය සඳහා රජයේ වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2022 අංක 43 දරන විසර්ජන පනතින් සලසා තිබුණි. ඒ අනුව, විසර්ජන පනතේ ප්‍රතිපාදන හා පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන ඇතුළුව රජයේ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 7,879,499 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඊට අතිරේකව 2023 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර රු.මිලියන 268,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රයක් මඟින් රු.මිලියන 9,565,000 ක ප්‍රතිපාදන විශේෂ නීති සේවා වියදම් සඳහා ලබා ගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 17,675,999 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණි. විස්තර වගුව 2.1 හි දැක්වේ.

| මූල්‍ය | මූලධන ප්‍රතිපාදනය | පුනරාවර්තන ප්‍රතිපාදනය | එකතුව |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සැපයුම් හා සේවා සඳහා විසර්ජන පනතින් සලසා තිබුණු ප්‍රතිපාදන (විසර්ජන පනත I වන උපලේඛනය) | 1,225,266 | 2,432,000 | 3,657,266 |
| පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන (විසර්ජන පනත II වන උපලේඛනය) | 2,019,970 | 2,202,263 | 4,222,233 |
| සැපයුම් හා සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු මඟින්) | 231,500 | 36,500 | 268,000 |
| පරිපූරක ප්‍රතිපාදන සැලසීම සඳහා අවුරා තබන ලද ප්‍රතිපාදන | (11,000) | (25,500) | (36,500) |
| විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ප්‍රතිපාදන | 9,000,000 | 565,000 | 9,565,000 |
| මු.රෙ.ප්‍රකාරව පුනරාවර්තන මඟින් මූලධන වෙත මාරු කරන ලද ප්‍රතිපාදන | 9,446 | (9,446) | - |
| එකතුව | 12,475,182 | 5,200,817 | 17,675,999 |

වගු අංක 2.1 : රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන

මූලාශ්‍ර - 2022 අංක 43 දරන විසර්ජන පනත හා පරිපූරක ඇස්තමේන්තු, වාර්ෂික වාර්තාව 2023- මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2022 අංක 43 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.මිලියන 356,099 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 301,767 ක ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 54,332 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර වගුව 2.2 හි දැක්වේ.

| වියදමේ ස්වභාවය | විසර්ජන පනතෙන් | පරිපූරක ඇස්තමේන්තු මගින් | මු.රෙ.66/69 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | වැය ශීර්ෂවලට ප්‍රතිපාදන මාරු කිරීම | ප්‍රතිපාදන ඉතිරිය |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන | 167,788 | 20,000 | - | 187,788 | 181,016 | 6,772 |
| මූලධන | 168,311 | - | - | 168,311 | 120,751 | 47,560 |
| එකතුව | 336,099 | 20,000 | - | 356,099 | 301,767 | 54,332 |

වගු අංක 2.2 : පරිපූරක සහය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂ වලට මාරු කිරීම

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූලාශ්‍ර ප්‍රකාශන 2023

## විගණන නිරීක්ෂණ

**සමස්ථ ප්‍රතිපාදන ඉතිරිවීම්**

2023 වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 17,675,999 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 6,482,350 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 11,193,649 ක් හෙවත් සියයට 172.68 කින් වැඩි වී තිබුණි. 2023 වර්ෂයේ සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10,674,332 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් රු.මිලියන 7,001,667 ක්, එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් ඉතිරි වී තිබුණි.

**පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිවීම්**

පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,200,817 ක් වී තිබුණු අතර 2023 වර්ෂයේදී ඉන් රු.මිලියන 4,729,386 ක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 471,431 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 9.06 ක් වී තිබුණි.

**ආයෝජන ප්‍රතිපාදන ඉතිරිවීම්**

රාජ්‍ය ආයෝජනය සඳහා රු.මිලියන 1,449,742 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර 2023 වර්ෂයේදී ඉන් රු.මිලියන 932,745 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 516,997 ක ප්‍රතිපාදන


ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් වී තිබුණි.

**ණය වාරික ගෙවීම සඳහා වූ ප්‍රතිපාදන ඉතිරිවීම්**

දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 11,025,440 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ණය ආපසු ගෙවීම සඳහා රු.මිලියන 5,012,201 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6,013,239 ක් හෙවත් සියයට 55ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**පොළී වියදම වර්ධනය වීම**

**2023** වර්ෂයේදි පොළී වෙනුවෙන් රු.මිලියන 2,455,599 ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 1,565,190 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 890,409 කින් හෙවත් සියයට 56.89 කින් වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 2.1 හි දැක්වේ.




රූප සටහන් අංක 2.1: මුළු පුනරාවර්තන වියදම හා පොලී වියදම

මූලාශ්‍රය : රජයේ මූල්‍ය ප්‍රකාශන

**ආදායම් ඌනතාවය**

2023 වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වල අයවැය කාර්යසාධනය හා හිභය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව ආදායමේ ඌනතාවය රු.බිලියන 1,650 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 1,540 ක් වී තිබුණි.

ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර එය රු.බිලියන 43 ක් වී තිබුණු අතර, රැස්කළ රජයේ ආදායමෙන් සියයට 7.52 ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ථ ආදායමේ

ඌනතාවය රු.බිලියන 7,969 ක් වී තිබුණි. එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි.

**ආදායම් ඌනතාවය පියවීම සඳහා ණය ලබා ගැනීම**

2006 සිට 2023 දක්වා වූ කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 28,025 ක්ද, විදේශීය ණය රු.බිලියන 8,318 ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 271 ක් වශයෙන් එකතුව රු.බිලියන 36,614 ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 4.44 ක සිට සියයට 45.59 ක පරාසයක ප්‍රතිශතයන් මගින් ආදායමේ ඌනතාවය මුල්‍යනය කර තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.25 ක්ද, 2020 වර්ෂයේදී සියයට 45.59 ක්, 2021 වර්ෂයේදී සියයට 42.39 ක්, 2022 වර්ෂයේදී සියයට 30.59 හා 2023 වර්ෂයේ දී සියයට 19.65 වශයෙන් උපයෝජනය කර තිබුණි.

| වර්ෂය | තථ්‍ය ආදායම (බදු හා බදු නොවන) | තථ්‍ය පුනරාවර්තන වියදම | ආදායමේ ඌනතාවය | ආදායමේ ඌනතාවය රැස්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | විදේශ ණය, ප්‍රදාන හා දේශීය ණය | ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| ------- | රු.බිලියන ------------ | රු.බිලියන ------------- | රු.බිලියන ------------ | සියයට ----------- | රු.බිලියන ------------ | සියයට ----------- |
| 2006 | 477 | 579 | 102 | 21.38 | 514 | 19.84 |
| 2007 | 572 | 615 | 43 | 7.52 | 587 | 7.33 |
| 2008 | 664 | 736 | 72 | 10.84 | 678 | 10.62 |
| 2009 | 708 | 882 | 174 | 24.58 | 1,019 | 17.08 |
| 2010 | 826 | 951 | 125 | 15.13 | 918 | 13.62 |
| 2011 | 943 | 1,020 | 77 | 8.17 | 998 | 7.72 |
| 2012 | 997 | 1,118 | 121 | 12.14 | 1,108 | 10.92 |
| 2013 | 1,066 | 1,254 | 188 | 17.64 | 1,289 | 14.58 |
| 2014 | 1,128 | 1,370 | 242 | 21.45 | 1,397 | 17.32 |
| 2015 | 1,394 | 1,673 | 279 | 20.01 | 1,750 | 15.94 |
| 2016 | 1,699 | 1,771 | 72 | 4.24 | 1,623 | 4.44 |
| 2017 | 1,845 | 1,946 | 101 | 5.47 | 1,466 | 6.89 |
| 2018 | 1,935 | 2,109 | 174 | 8.99 | 1,883 | 9.24 |
| 2019 | 1,907 | 2,322 | 415 | 21.76 | 2,049 | 20.25 |
| 2020 | 1,379 | 2,683 | 1,304 | 94.56 | 2,860 | 45.59 |
| 2021 | 1,467 | 2,757 | 1,290 | 87.93 | 3,043 | 42.39 |
| 2022 | 1,999 | 3,539 | 1,540 | 77.04 | 5,035 | 30.59 |
| 2023 | 3,078 | 4,729 | 1,651 | 53.64 | 8,396 | 19.66 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එකතුව | **24,084** | **32,054** | **7,970** | | **36,613** | |

වගු අංක 2.3 : පුනරාවර්තන වියදම පියවා ගැනීමට නොහැකි වූ ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවලින් උපයෝජනය කිරීම

මූලාශ්‍රය : 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

**පොලී ගෙවීම් වර්ධනය වීම**

2023 වර්ෂයේදී රු.බිලියන 2,455 ක පොලී ගෙවා තිබුණු අතර, එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 51.91 ක නියෝජනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ පොලී ගෙවීම් රු.බිලියන 1,565 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 44.22 ක් වී තිබුණි. පොලී ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 890 කින් වැඩි වී තිබුණි. තවද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් 2022 අප්‍රේල් 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශීය ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අප්‍රේල් 13 දින සිට 2023 වර්ෂයේ අවසන් දින වන විට ඇතැම් ණය වාරික හා පොලී ගෙවීම් අත්හිටුවා තිබුණ නමුත් ඊට අදාළව වූ ගෙවීම් සිදු කලේ නම් එම ඌනතාවය තවදුරටත් වර්ධනය වන බව නිරීක්ෂණය විය.

2006 වර්ෂයේදී රු.බිලියන 151 ක් වූ පොලී ගෙවීම් 2023 වර්ෂය වන විට එය රු.බිලියන 2,455 ක් දක්වා සියයට 1,526 කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබූ අතර ඒ සඳහා වන පොලී ගෙවීම වාර්ෂිකව වැඩි වී තිබුණි. අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව 2023 වර්ෂයේදී රැස්කරන ලද රු.බිලියන 3,079 ක් වූ රජයේ ආදායමෙන් රු.බිලියන 2,455 ක් හෙවත් සියයට 79.76 ක් පොලී ගෙවීමට සිදු වී තිබුණි. මෙම තත්ත්වය අදාළ කාලපරිච්ඡේදයේදී වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වෙමින් පැවැති අතර 2019 වර්ෂයේ සිට එය සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි.

| වර්ෂය | තත්‍ය පුනරාවර්තන වියදම | පොලී වියදම | පොලී වියදම මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | තථ්‍ය ආදායම | පොලී ගෙවීම තථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ------- | රු.බිලියන<br>--------------- | රු.බිලියන<br>--------------- | සියයට<br>--------------- | රු.බිලියන<br>------------- | සියයට<br>--------------- |
| 2006 | 579 | 151 | 26.08 | 477 | 31.66 |
| 2007 | 615 | 181 | 29.43 | 572 | 31.64 |
| 2008 | 736 | 212 | 28.80 | 664 | 31.93 |
| 2009 | 882 | 303 | 34.35 | 708 | 42.80 |
| 2010 | 951 | 348 | 36.59 | 826 | 42.13 |
| 2011 | 1,020 | 353 | 34.61 | 943 | 37.43 |
| 2012 | 1,118 | 409 | 36.58 | 997 | 41.02 |
| 2013 | 1,254 | 465 | 37.08 | 1,066 | 43.62 |
| 2014 | 1,370 | 446 | 32.55 | 1,128 | 39.54 |
| 2015 | 1,673 | 527 | 31.50 | 1,394 | 37.80 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | 1,771 | 611 | 34.50 | 1,699 | 35.96 |
| 2017 | 1,946 | 736 | 37.82 | 1,845 | 39.89 |
| 2018 | 2,109 | 852 | 40.40 | 1,935 | 44.03 |
| 2019 | 2,322 | 889 | 38.29 | 1,907 | 46.62 |
| 2020 | 2,683 | 975 | 36.34 | 1,379 | 70.70 |
| 2021 | 2,757 | 1,048 | 38.01 | 1,467 | 71.44 |
| 2022 | 3,539 | 1,565 | 44.22 | 1,999 | 78.29 |
| 2023 | 4,729 | 2,455 | 51.91 | 3,078 | 79.76 |
| **එකතුව** | **32,054** | **12,526** | | **24,084** | |

වගු අංක 2.4 : ණය පොලී ගෙවීම සඳහා රැස්කළ ආදායමෙන් වැය කිරීම
මූලාශ්‍ර : 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

ආදායම් රැස්කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව 2023 වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු.බිලියන 1,127 ක් විය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයට අදාළව එකතුකළ යුතුව තිබුණු රු.බිලියන 1,066 ක ආදායම්, එකතු නොකර හිඟහිටව පැවතුණි. එම ආදායම් 2023 වර්ෂයේදී රැස්කර ගැනීමට සමත් වූයේ නම් එම වර්ෂයේ ආදායම් ඌනතාවය රු.බිලියන 584 ක් හෙවත් සියයට 41.29 ක් දක්වා අඩු කර ගත හැකිව තිබුණි. එම හිඟහිටි ආදායම 2021 හා 2022 වර්ෂ වලදී පිළිවෙලින් රු.බිලියන 620 ක් හා රු.බිලියන 904 ක් වී තිබුණි. එම වර්ෂවලද එම හිඟහිටි ආදායම් රැස්කර ගත හැකිව තිබුණේ නම් 2021 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 670 ක් දක්වා සියයට 48.06 කින් ද 2022 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 636 ක් දක්වා සියයට 58.70 කින් අඩුකර ගැනීමට හැකියාව පැවතුණි.


| වර්ෂය | හිඟ හිටි ආදායම | ආදායම් ඌනතාවය | හිඟහිටි ආදායම් රැස්කර ගත්තේ නම් ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) | ආදායම් ඌනතාවය අඩුකර ගත හැකිව තිබූ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| --------- | රු.බිලියන --------------------- | රු.බිලියන --------------------- | රු.බිලියන -------------------- | සියයට -------------------- |
| **2019** | 579 | 414 | 165 | 139.86 |
| **2020** | 698 | 1,304 | (606) | 53.53 |
| **2021** | 620 | 1,290 | (670) | 48.06 |
| **2022** | 904 | 1,540 | (636) | 58.70 |
| **2023** | 1,066 | 1,650 | (584) | 41.29 |

වගු අංක 2.5 : දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟහිටි ආදායම් හා එය ආදායම් ඌනතාවය කෙරෙහි ඇතිකළ බලපෑම
මූලාශ්‍රය : 2019 සිට 2023 වර්ෂය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන හා රජයේ මූල්‍ය ප්‍රකාශන

**රාජ්‍ය ණය ලබා ගැනීම**

ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරීමත්,

අරපිරිමැසුම්දායක ලෙස වියදම් කළමනාකරණය නොකිරීමත් නිසා රාජ්‍ය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. රාජ්‍ය ණය ප්‍රමාණය ක්‍රමිකව ඉහළ යාම හේතුවෙන් ණය පොළී පිරිවැය ද වාර්ෂිකව වැඩිවී ඊට අනුරූපීව පුනරාවර්තන වියදමද වැඩි වී තිබුණි. ඒ අනුව, ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස් කර ගැනීමට නොහැකි වීම, පුනරාවර්තන වියදම් ක්‍රමිකව වැඩිවීම නිසා හා වාර්ෂිකව වියදම පියවා ගැනීමට තරම් ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි.





රූප සටහන් අංක 2.2 : ආදායම් ඌනතාවය තථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය : රජයේ මූල්‍ය ප්‍රකාශන 2007 -2023

**අයවැය හිඟයේ වර්ධනය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,584 ක් වී තිබු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.35 ක් වී තිබුණි. 2022 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,555ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.62 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සමස්ත කාල පරාසය පුරාවට අයවැය හිඟයක් පැවැතුණු අතර, 2006 වර්ෂයේදී පැවැති රු.බිලියන 300 ක අයවැය හිඟය 2023 වර්ෂය වන විට රු.බිලියන 2,584 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිඟය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 5.55 ක සිට සියයට 14.08 ක් දක්වා පරාසයක පැවතුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව තථ්‍ය අයවැය හිඟය තථ්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5 ක

සීමාවේ පැවැතිය යුතුව තිබුණ ද, එම කාලපරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී එම තත්ත්වය පවත්වා ගෙන නොතිබුණි.




රූප සටහන් අංක 2.3: අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර : මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සහ රජයේ මූල්‍ය ප්‍රකාශන 2006- 2023

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය**

රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන අයවැය හිඟය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් වන අයවැය හිඟය අතර වෙනස් අගයන් වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ වර්ගීකරණය අනුව පිළියෙල කර ඇති බවත්, ආර්ථික වර්ගීකරණය අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය ගණනය කර ඇති බවත් දන්වා තිබුණි. 2023 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව අයවැය හිඟය රු.මිලියන 2,282,267 ක් වී තිබුණි. නමුත් රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම හිඟය රු.මිලියන 2,583,601 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 301,334 ක වෙනසක් පැවැතුණි.


**අයවැය හිඟය මූල්‍යනය**

රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී, අයවැය හිඟය රු.මිලියන 28,860 කින් එනම් සියයට 1.12

කින් වැඩි වී තිබුණි. 2023 වර්ෂයේදී අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් විදේශ ණය රු.මිලියන 494,655 ක් හා ශුද්ධ වශයෙන් දේශීය ණය රු.මිලියන 2,866,377 ක් ලබා ගැනීමට සිදු වී තිබුණි.

**ණය ශේෂය වර්ධනය වීම**

වාර්ෂිකව අයවැය හිඟය වර්ධනය වීම හමුවේ ණය ලබා ගැනීම් ප්‍රමාණයද වැඩි වී තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය ලෙස රු.බිලියන 29,150 ක් වී තිබුණි. එම ශේෂය දේශීය ණය වශයෙන් රු.බිලියන 17,074 ක්ද, විදේශ ණය වශයෙන් රු.බිලියන 12,077 ක් වශයෙන් පැවතුණි. 2022 වර්ෂයේදී රජයේ ණය ශේෂය රු.බිලියන 27,379 ක් වී තිබුණි. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී ණය ශේෂය රු.බිලියන 1,771 කින් හෙවත් සියයට 6.47 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 2,431 ක ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 82.72 ක් වී තිබුණි. 2023 වර්ෂය අවසාන වන විට ණය ශේෂය රු.බිලියන 29,150 ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 105.5 ක් වී තිබුණි. තවද 2013 අංක 15 දරන සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව රජයේ බැරකම් දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 80 කට වඩා අඩු විය යුතුව තිබුණත්, 2023 වර්ෂය අවසානයේදී අනෙකුත් බැරකම් හැර රජයේ ණය බැරකම පමණක් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 105.5 ක් වී තිබුණි. මෙම සීමාව ඉක්මවීමේ තත්ත්වය 2020, 2021 හා 2022 වර්ෂ වලදී ද පැවතුණි.




රූප සටහන් අංක 2.4 : රාජ්‍ය ණය ශේෂය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර : රජයේ මූල්‍ය ප්‍රකාශන 2007- 2023 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

**රාජ්‍ය ණය**

2023 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත වී ඇති නමුත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් 2022 අප්‍රේල් මස 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශ ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අප්‍රේල් 13 දින සිට 2023 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම් 401කට අදාළව මූලික ණය මුදල් ගෙවීම් ලෙස රු.මිලියන 1,439,066 ක් ද, පොළිය ලෙස රු.මිලියන 673,964 ද වන රු.මිලියන 2,113,030 ක ණය වාරික ගෙවීම් අත්හිටුවා තිබුණි.

2023 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

| සංවර්ධන පාර්ශවකරු | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව ප්‍රදාන ඇතුලත්ව 2023 (එ.ජ.ඩො. මිලියන) | සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව 2023 (එ.ජ.ඩො. මිලියන) | විචලනය (එ.ජ.ඩො. මිලියන) | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (සියයට ) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 806 | 753.2 | (52.8) | (7) |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,011 | 856.9 | (154.1) | (15) |
| චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | 21 | 24.2 | 3.2 | 15 |
| ජපානය | 31 | 39.6 | 8.6 | 28 |
| කොරියාව | 10 | 0 | (10) | (100) |
| මැදපෙරදිග රටවල් | 47 | 28.9 | (18.1) | (38) |
| දකුණු ආසියානු රටවල් | 90 | 142.5 | 52.5 | 58 |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 30 | 32.2 | 2.2 | 7 |
| IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 15 | 9.7 | (5.3) | (35) |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 682 | 681.5 | (0.5) | 0.07 |
| **එකතුව** | **2,743** | **2,568.7** | **(174.3)** | |

වගු අංක 2.6 : 2023 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම
මූලාශ්‍රය : 2023 වර්ෂයේ කාර්යසාධන සැලැස්ම

**ප්‍රතිලබ්ධි වටිනාකම්**

2023 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,743 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,568.7 ක් වීම හේතුවෙන් සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො. මිලියන 174.3 කින් එනම්, සියයට 6 කින් පමණ අඩු වී තිබුණි.

දකුණු ආසියානු රටවල්, ජපානය, චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සහ රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් යන රටවල් වලින් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 58, 28, 15 සහ 7 කින් වැඩි වී තිබුණි.

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, මැදපෙරදිග රටවල් හා IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය පිළිවෙළින් සියයට 7, 15, 38 සහ 35 කින් අඩු වී තිබුණි.
2023 වර්ෂයේදී කොරියාවෙන් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද, වර්ෂය අවසාන වන විටත් ණය ලබාගෙන නොතිබුණි.

**දේශීය හා විදේශීය ණය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂයේදී විදේශීය ණය රු. මිලියන 831,951 ක් ද, දේශීය බැංකු නොවන ණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.මිලියන 7,541,282 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 8,373,233 ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.මිලියන 5,001,854 ක ණය ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) සමඟ සැසඳීමේදී, රු.මිලියන 3,371,379 කින් හෙවත් සියයට 67.40 කින් වැඩිවීමකි. 2023 වර්ෂයේදී රජය දේශීය ණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළුව) රු.මිලියන 4,218,528 ක දේශීය ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.මිලියන 3,322,753 කින් හෙවත් සියයට 78.77 කින් වැඩිවී තිබුණි. 2023 වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ණය ලබාගැනීමේ විස්තර වගුව 2.7 හි දැක්වේ.

| විස්තරය | 2023<br>රු.මිලියන | 2022<br>රු.මිලියන |
|---|---|---|
| විදේශීය ණය ගැනීම් | 831,951 | 783,326 |
| **දේශීය ණය ගැනීම්** | | |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | (33,929) | 1,855,672 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | **7,614,523** | **2,373,044** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | (39,656) | (77,701) |
| **සංවර්ධන බැඳුම්කර** | **344** | **67,441** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | - | 72 |
| **දේශීය කාලීන ණය පහසුකම්** | **-** | **-** |
| මුළු දේශීය ණය ගැනීම් | **7,541,282** | **4,218,528** |
| **වර්ෂය තුළ ලබා ගත් මුළු ණය ප්‍රමාණය** | **8,373,233** | **5,001,854** |

වගු අංක 2.7 : රජය විසින් ලබා ගත් දේශීය හා විදේශීය ණය

මූලාශය : රජයේ මූල්‍ය ප්‍රකාශන 2022 හා 2023

**ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) රු. මිලියන 29,150,389 ක් වූ අතර, එය 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 27,379,287 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) සමඟ සැසඳීමේදී රු.මිලියන 1,771,102 කින් හෙවත් සියයට 6.47 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂය හා 2023 වර්ෂය අවසානයට පැවති මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තරයක් පහත 2.8 වගුවෙහි දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|
| | **2023** | **2022** |
| | **රු.මිලියන** | **රු.මිලියන** |
| භාණ්ඩාගාර බිල්පත් | 4,092,454 | 4,126,384 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 12,021,359 | 8,692,135 |
| රුපියල් ණය | - | 24,088 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | 391,737 |
| විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය | 77,742 | 131,372 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති) | 20,269 | 24,500 |
| සුහුරුපාය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලබා ගත් ණය | 3,982 | 4,551 |
| භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රීය වගකීම් කළමනාකරණ පනත) | 23,000 | 30,000 |
| විශ්‍රාම පාරිතෝෂිත ණය | 44,854 | 48,924 |
| කල්බදු ණය හිමියන් | 1,313 | 1,865 |
| දේශීය කාලීන ණය පහසුකම් | - | - |
| රජය ඇප වූ ලංකා ඛනිජතෙල් සංස්ථාව | 788,682 | 884,093 |
| **මුළු දේශීය ණය** | **17,073,655** | **14,359,649** |
| විදේශීය (ව්‍යාපෘති) | 7,301,756 | 7,665,019 |
| විදේශ මුදලින් කාලීන ණය පහසුකම් | 709,741 | 797,589 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 4,065,237 | 4,557,030 |
| මුළු විදේශීය ණය | 12,076,734 | 13,019,638 |
| **මුළු රාජ්‍ය ණය ශේෂය** | **29,150,389** | **27,379,287** |
| **ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය** | **28,103,000** | **23,843,000** |
| **මුළු රාජ්‍ය ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස** | 103.73 | 114.83 |

වගු අංක 2.8 : වර්ගීකරණය කරන ලද වර්ෂය අවසානයට පැවති ණය ශේෂය

මූලාශ්‍රය : රජයේ මූල්‍ය ප්‍රකාශන 2022 හා 2023

**උපරිම බැරකම් සීමාව ඉක්මවීම**

2021 අංක 12 හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම් පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ

ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතුව තිබුණත්, 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණයද සැලකිල්ලට ගත් විට 2023 වර්ෂයේදී එම සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. විස්තර වගුව 2.9 හි දැක්වේ.

| බැරකම් | 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු.බිලියන |
|---|---|
| බැංකු අයිරාව | 80 |
| රාජ්‍ය ණය (රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව) | 29,150 |
| මහ බැංකු අත්තිකාරම් | - |
| මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම්: | |
| • ගිණුම්ගත නොකළ විදේශ ණය | 15 |
| මුළු බැරකම් | 29,245 |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | 28,103 |
| මුළු බැරකම් ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 104.06 |


වගු අංක 2.9 : උපරිම බැරකම් සීමාව ඉක්මවීම
මූලාශ්‍රය : රජයේ මූල්‍ය ප්‍රකාශන

**රාජ්‍ය ව්‍යාපාර ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපිවල වටිනාකම**

මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන තිබුණු ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපිවල වටිනාකම වූ රු.බිලියන 2,034 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශනවල ඇතුළත් රු. බිලියන 117 ක වටිනාකම්ද ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

**ඒක පුද්ගල ණය ප්‍රමාණය**


පහත තොරතුරු අනුව මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රු.264,811 ක් වූ ඒක පුද්ගල ණය වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට රු.1,322,793 ක් දක්වා වැඩිවී තිබුණි. එසේම එය, 2022 දෙසැම්බර් 31 දිනට රු.1,234,358 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.88,435 කින් හෙවත් සියයට 7.16 කින් පමණ වැඩිවී තිබුණි. 2023 වර්ෂයේ හා ඉකුත් වර්ෂ 09 ක ඒක පුද්ගල ණය ප්‍රමාණය රූපසටහන 2.5 හි දැක්වේ.




රූප සටහන් අංක 2.5 : ඒක පුද්ගල ණය ප්‍රමාණය
මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන 2007- 2023 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

**රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී ශුද්ධ ණය ගැනීම් (දේශීය හා විදේශීය) රු.මිලියන 208,368 කින් වැඩි වී තිබුණු අතර ණය සඳහා පොලී ගෙවීම්ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී රු.මිලියන 890,410 කින් හෙවත් සියයට 56.89 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂවලදී මෙන් 2023 වර්ෂයේදී ද ණයවාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. විස්තර රූපසටහන 2.6 හි දැක්වේ.




රූප සටහන් අංක 2.6 : ණය වාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම
මූලාශ්‍රය : රජයේ මූල්‍ය ප්‍රකාශන 2013- 2023

**රාජ්‍ය ව්‍යවසායන් සඳහා රජයේ ප්‍රාග්ධන දායකත්වය**

2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.මිලියන 2,407,633 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු. මිලියන 2,165,982 ක් විය. ඒ අනුව 2023 වර්ෂයට අදාළව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 241,651 කින් හෙවත් සියයට 11.16 කින් ඉහළ ගොස් තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ව්‍යවසායන් 305 අතරින් 2022 වර්ෂයට අදාළව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් 101 කට අදාළව මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

**අඛණ්ඩව අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන්**

2023 දෙසැම්බර් 31 දිනට රජය විසින් රු. මිලියන 1,124,665 ක ප්‍රාග්ධන දායකත්වය සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 13 ක 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු. මිලියන 1,047,967 ක් වූ අතර, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) සෘන රු. මිලියන 630,632 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධන දායකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ

වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. අදාළ ආයතන අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය සෘන අගයක් ගැනීම මේ සඳහා මූලික වශයෙන් හේතුවී තිබුණි.

**ප්‍රාග්ධන දායකත්වය අපහායනයට ලක්වෙමින් පවතින රාජ්‍ය ව්‍යවසායන්**

2023 දෙසැම්බර් 31 දිනට හා 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් රු. මිලියන 1,019,628 ක් සහ රු.මිලියන 892,035 ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල අගය රු. මිලියන 371,771 ක් වී තිබුණි. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**ශුද්ධ වත්කම් අපහායනය වන රාජ්‍ය ව්‍යවසායන්**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 2,165,982 ක් වූ අතර, එයින් රු. මිලියන 2,121,654 ක් රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ආයෝජනය කර තිබුණි. එසේ වුවද, මෙම කාණ්ඩයට අයත් රාජ්‍ය ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශ අනුව එදිනට ශුද්ධ වත්කම් රු. මිලියන 1,669,676 ක් වී තිබුණි. ඒ අනුව, එම ආයතනවල රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව සියයට 21 කින් හෙවත් රු. මිලියන 451,977 කින් අපහායනය වී ඇති බව නිරීක්ෂණය විය.

**සමස්ත ශුද්ධ අලාභය**

2022 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩල 32 කට අදාළව රු.මිලියන 117,719 ක ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, රාජ්‍ය සංස්ථා 36 කට සහ රජය සතු සමාගම් 30 කට අදාළව පිළිවෙලින් රු.මිලියන 804,795 ක් හා රු.මිලියන 133,722 ක් ලෙස ශුද්ධ අලාභ ඉපයීම හේතුවෙන් මෙම ආයතන 98 ට අදාළව සමස්තයක් වශයෙන් රු. මිලියන 820,799 ක ශුද්ධ අලාභයක් ලබා ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 22,181,000 වු අතර, ඒ අනුව රජය සතු ව්‍යාපාර ආයතන 98 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය රු.37,000 ක් පමණ වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ අවධානම**

2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යසායන් 17 කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකන් ගුවන්

සමාගමේ ජංගම අනුපාතය 0.15 ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වය**

2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනයට වඩා ගෙවීමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය ඍණ අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මගින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

**වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 269,386 ක් වූ අතර, ඉන් රු.මිලියන 34,090 ක් එනම් සියයට 13 ක එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය.

**මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ණය වාරික ගෙවීම**

මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ඈවර කිරීම සම්බන්ධව අංක MOF/DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා අංක (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, සමාගම ඈවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කිරීමෙන් පසුව භාණ්ඩාගාර ලේකම් විසින් වාණිජ මහාධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2018 මාර්තු 18 අධිකරණය විසින් ඈවරකරුවකු පත් කර තිබුණි. එසේ තිබියදී, එම සමාගමට අදාල ණය වාරික හා පොළි ගෙවීම සඳහා 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 272 ක් හා රු.මිලියන 441 ක් වශයෙන් එකතුව රු.මිලියන 713 ක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි.

## රාජ්‍ය ආදායම

2023 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම රු.බිලියන 3,408 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 2,084 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම රු.බිලියන 1,324 කින් හෙවත් ප්‍රතිශතයක් ලෙස සියයට 64 කින් ඉහළ නංවා රජයේ ආදායම ඇස්තමේන්තු කර තිබුණි.

## දළ දේශිය නිෂ්පාදිතය

2023 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදිතය රු.බිලියන 27,630 ක් වී තිබුණු අතර 2022 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදිතය රු.බිලියන 24,063 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ දේශිය නිෂ්පාදිතය රු.බිලියන 3,567 කින් හෙවත් සියයට 14.82 කින් වැඩි වී තිබුණි.

## ආදායම් ඇස්තමේන්තුකරණය

ආදායම් ඇස්තමේන්තුව පදනම් කර ගෙන අයවැය හිඟය ඇස්තමේන්තු කර තිබූ නමුත් මුල් ආදායම් ඇස්තමේන්තුව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රු.බිලියන 2,880 ක් ලෙස දක්වා රු.බිලියන 528 කින් අඩු කර සංශෝධනය කර තිබුණි. එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 10.4 ක් වී තිබුණි. ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම කෙරෙහි සැලැකිලිමත් විය යුතුව තිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර ආදායම අධි ඇස්තමේන්තුකරණයක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

## රැස්කළ රජයේ ආදායම

2023 වර්ෂයේ රැස්කළ රජයේ ආදායම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රු.බිලියන 3,079 ක් වී තිබුණු අතර එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා රු.බිලියන 199 කින් වැඩි වී තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික ආදායම් මුල් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී රු.බිලියන 329 කින් අඩු වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරාසය තුළ සෑම වර්ෂයකදීම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් ආදායමට වඩා රැස්කළ ආදායමේ අඩුවීම සියයට 4.08 ක සිට සියයට 26.06 ක පරාසයක් වී තිබුණ අතර එම කාල පරාසය තුළ වැඩිම ප්‍රතිශතය 2021 වර්ෂයේදී වාර්තා වී තිබුණි.

## පොළී ගෙවීම්

2023 වර්ෂයේදී අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රැස්කරන ලද රු.බිලියන 3,079 ක රජයේ ආදායමෙන් රු.බිලියන 2,455 ක් හෙවත් සියයට 79.73 ක් පොළී ගෙවීමට වැයකර තිබුණි.

## හිඟ ආදායම් ශේෂය

ආදායම් රැස්කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු.බිලියන 1,127 ක් විය.


## ආදායම් ඌනතාවය

නිවැරදි ආකාරයට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරීමත්, අරපිරිමැසුම්දායක ලෙස වියදම් කළමනාකරණය නොකිරීමත් නිසා රාජ්‍ය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. එම ණය ලබා ගැනීම වාර්ෂිකව වැඩි වී තිබීම නිසා ණය පොළී පිරිවැය වාර්ෂිකව වැඩි වී තිබීම හේතුවෙන් පුනරාවර්තන වියදම වැඩි වී තිබුණි. ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස් කර ගැනීමට නොහැකි වීමත්, පුනරාවර්තන වියදම වැඩිවීමත් නිසා වාර්ෂිකව වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි.

## රාජ්‍ය ආයෝජන

පුනරාවර්තන වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායම් රැස්කර ගැනීමට 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරාසය තුළදී අපොහොසත් වී තිබුණත්, එම කාල පරාසය තුළ රාජ්‍ය ආයෝජන වශයෙන් රු.බිලියන 10,145 ක් උපයෝජනය කර තිබුණි. එම උපයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සමස්තයක් වශයෙන් රාජ්‍ය ණය මගින් සිදු කර ඇති බව මුල්‍ය ප්‍රකාශන විශ්ලේෂණයේදී පැහැදිලි වේ.


2023 ඇතුලුව වර්ෂ 5 ක දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනයන්හි සංශෝධිත ඇස්තමේන්තුගත හා රැස්කළ තත්‍ය ආදායම පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.7 :සංශෝධිත ඇස්තමේන්තුගත හා රැස්කළ තත්‍ය ආදායම
මූලාශ්‍ර: 2019-2023 මුල්‍ය ප්‍රකාශන

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

2023 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ 5 ක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ තත්‍ය ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.8: 2019-2023 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත හා රැස්කළ තත්‍ය ආදායම
මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2019 -2023 මූල්‍ය ප්‍රකාශන


**ඇස්තමේන්තු කල හා රැස්කල ආදායම**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ ඇස්තමේන්තු කළ මුළු ආදායම රු. මිලියන 2,090,013 ක් වූ අතර එය නැවත රු. මිලියන 1,761,984 ක් දක්වා සංශෝධනය කලද වර්ෂය තුළ රු. මිලියන 1,832,274 ක ආදායමක් රැස්කර ගැනීමට හැකිව තිබුණි.

**හිඟ බදු ආදායම**

| වගුව අංක 2.1 | වර්ෂය | රැස්කළ සමස්ථ ආදායම රු.මිලියන | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම රු. මිලියන |
|---|---|---|---|
| | 2019 | 975,942 | 116,783 |
| | 2020 | 511,189 | 56,721 |
| | 2021 | 619,715 | 619,726 |
| | 2022 | 1,045,188 | 904,342 |
| | 2023 | 1,832,274 | 1,066,789 |

2.10:දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය වර්ෂ 05ක හිඟ බදු ආදායම
මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන




රූප සටහන් අංක 2.9:දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය වර්ෂ 05ක හිඟ බදු ආදායම
මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වූ මුළු හිඟ බදු ප්‍රමාණය රු.බිලියන 1,066 ක්ව පැවැතුණි. එම ආදායම් 2023 වර්ෂයේදී රැස්කර ගැනීමට සමත් වූයේ නම් එම වර්ෂයේ ආදායම් ඌනතාවය රු.බිලියන 584 ක් හෙවත් සියයට 35.39 කින් අඩු කර ගත හැකිව තිබුණි.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ පවතින අඩුපාඩු, හිඟ බදු අභියාචනා ක්‍රියාවලියේ දීර්ඝ කාලීන භාවය, හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට විශේෂිත වූ අධිකරණ පද්ධතියක් ස්ථාපිත වී නොතිබීම යන හේතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු අයකිරීමේ ප්‍රමාදයට බලපා තිබුණි.

**තෙවන පාර්ශවයන් විසින් රැස් කර ගන්නා බදු ආදායම කාලානුරූපීව අයකර ගැනීමට කටයුතු නොකිරීම**

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 454,927 ක් වූ සමස්ථ හිඟ එකතු කළ අගය මත බදු වලින් රු. මිලියන 347,372 විවිධ හේතූන්

මත අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර ඉතිරි රු. මිලියන 107,555 අය කරගත හැකි එකතු කළ අගය මත බදු අය කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව අය කරගත යුතු බදු නියමිත කාලය තුළදී අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දැනටමත් මහජනතාව විසින් කැපකිරීමක් කර රජයට ආදායමක් ලෙස ගෙවා තිබූ ආදායමෙන් විශාල ප්‍රමාණයක් අවභාවිතා වීමේ හෝ සහ රජයට අහිමිවීමේ අවධානමක් ඇති වී තිබුණි.

2008 අංක 15 දරන සංශෝධිත වැට් බදු පනතේ සඳහන් පරිදි “37 වගන්තිය යටතේ වසර 5ක් ඉකුත් වී ඇති අවස්ථාවක පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා පනතේ 42 වන, 43 වන, 44 වන හෝ 48 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු නීති කෘත්‍යයක් ආරම්භ නොකළ යුතුය” බව සඳහන් වන බැවින් අයකර ගත හැකි වූ මෙම හිඟ වැට් බදු හා දඩ මුදල් රජයට අය කර ගැනීමේ හැකියාව අවදානමට ලක් වී තිබුණි.

**ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ නඩත්තු කටයුතු**

දෙපාර්තමේන්තුව විසින් බදු ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (RAMIS) ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණු අතර ඒ සඳහා 2023 දෙසැම්බර් දක්වා ආසන්න වශයෙන් රු. මිලියන 14,428 ක් වැයකර තිබුණි. එහෙත් RAMIS පද්ධතියේ කාර්යසාධනයට අවශ්‍ය කටයුතු කාලීනව සිදු නොවීම මත 2024 ජනවාරි වන විටත් පද්ධතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2024 පෙබරවාරි 01 වන දින සිට 2027 ජනවාරි 31 වන දින දක්වා තවත් අවුරුදු 03 ක කාලයක් සඳහා වන RAMIS පද්ධතියේ නඩත්තු සේවා ගිවිසුම දීර්ඝ කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය 2024 අප්‍රේල් 30 දින ලැබී ඇති අතර ඒ සඳහා සිංගප්පූරු ඩොලර් මිලියන 31 ක් (රු. මිලියන 6,844) (ඉහත දිනට බදු රහිත) නොඉක්මවන මුදලක් වැය කිරීමට සිදු වන බවද නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා රේගුව

**ඇස්තමේන්තු කළ හා රැස්කළ තත්‍ය ආදායම**

2023 වර්ෂය ඇතුලුව පසුගිය වර්ෂ 5 ක ශ්‍රී ලංකා රේගුවේ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ තත්‍ය ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.10 : 2019-2023 ශ්‍රී ලංකා රේගුවේ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ සත්‍ය ආදායම
මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා රේගුවේ 2023 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 800,949 ක් වූ අතර එය නැවත රු.මිලියන 628,054 ක් දක්වා සංශෝධනය කර තිබුණු අතර රු.මිලියන 694,082 ක ආදායමක් රැස් කර තිබුණි.


**හිඟ බදු ආදායම**

2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 58,479 ක් වූ සමස්ත හිඟ බදු ආදායමෙන් රු. මිලියන 57,709 ක් හෙවත් සියයට 99 ක් 2020 වර්ෂයේ සිට පැවත එන හිඟ බදු ආදායම් වූ අතර පැරණි හිඟ බදු ආදායම්වලට අදාල තොරතුරු දෙපාර්තමේන්තුවෙන් සොයා ගැනීමට අපහසු වී තිබුණි.

| වර්ෂය | රැස්කළ සමස්ථ ආදායම රු.මිලියන | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම රු. මිලියන |
|---|---|---|
| 2019 | 619,458 | 22,934 |
| 2020 | 566,463 | 63,459 |
| 2021 | 522,419 | 60,885 |
| 2022 | 523,346 | 61,254 |
| 2023 | 694,082 | 58,479 |

වගු අංක 2.10.2 : ශ්‍රී ලංකා රේගුවේපසුගිය වර්ෂ 5 ක හිඟ බදු ආදායම

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන




රූප සටහන් අංක 2.11 : ශ්‍රී ලංකා රේගුවේපසුගිය වර්ෂ 5 ක හිඟ බදු ආදායම
මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන

**ඇඟිලි සළකුණු යන්ත්‍ර වාර්තා ඉදිරිපත් නොකිරීම**

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2,204 දෙනෙකු සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන තහවුරු කිරීමේ සාක්ෂිය වන ඇඟිලි සළකුණු යන්ත්‍ර වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව රු. මිලියන 996 ක්වූ අතිකාල ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

**දිගු කාලයක් අංගනවල වාහන ගාල් කර තැබීම**

වාර්ෂිකව රු. මිලියන 41.8 ක කුලී මුදලක් ගෙවමින් රේගුව විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකින් ලබා ගෙන තිබුණු ඉඩමක 2023 දෙසැම්බර් 31 දිනට අත්අඩංගුවට ගන්නා ලද වාහන 435 ක් රඳවා තිබුණු අතර ඒවායින් වාහන 152 ක් වසර 5ට පෙර අත්අඩංගුවට ගත් ඒවා විය. රුහුණුපුර වරාය භූමියේ ද තවත් වාහන 202 ක් රඳවා තිබුණු අතර එහි වසර 5කට පෙර අත්අඩංගුවට ගත් වාහන 36 ක් විය. දිගු කාලයක් අංගනවල ගාල් කර තැබීම හේතුවෙන් වාහන දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත්වීම නිසා වෙන්දේසියකින් සාධාරණ මුදලක් ඉපයීමට නොහැකි තත්ත්වයක් ද ඇති වී තිබුණි.

**වංචා කිරීමට උත්සාහ කළ තීරු බදු වටිනාකමට ලිහිල් කිරීම් ලබා දීම**

පුද්ගලික සමාගමක් විසින් ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කර 2023 වර්ෂයේ ආනයනය කරන ලද සත්ව ආහාර තොගයකට අදාළව එම සමාගම පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකම රු. මිලියන 15 ක් වූ අතර

අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම (Under Value) රු.මිලියන 64 ක් විය. කෙසේවුවද, විමර්ශන අවසානයේදී වංචා කිරීමට උත්සාහ කළ තීරු බදු වටිනාකම සඳහා රු. මිලියන 0.5 ක ලිහිල් කරන ලද අභිමි කිරීමක් ද අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම සඳහා රු. මිලියන 19 ක අභිමි කිරීමක්ද පමණක් පැනවීමට කටයුතු කර තිබුණු අතර එය සිදු කරන ලද වරදට සාපේක්ෂව විශාල ලිහිල් කිරීමක් බව නිරීක්ෂණය විය.

**රේගු වැරදි**

2023 වර්ෂය තුළදී අවසන් කරන ලද විමර්ශන සඳහා පාදක වූ රේගු වැරදි 1902 ක් අතුරින් අතිරික්ත භාණ්ඩ ආනයන අවස්ථා 224 ක්ද, ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනයන් 498 ක්ද, වටිනාකම අඩුවෙන් ප්‍රකාශ කර ආනයනය කිරීම් 207 ක්ද, තහනම් කරන ලද හෝ සීමා කරන ලද භාණ්ඩ ආනයනයන් 188 ක්ද, රේගු ආඥා පනත උල්ලංඝණය කරන ලද වෙනත් අවස්ථා 211 ක්ද විය.


**නිදහස් නොකර රඳවාගත් බහාලුම්**

1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 162 වගන්තිය ප්‍රකාරව අල්වා ගැනීමෙන් පසු නීති විරෝධී බැව් ප්‍රකාශ කළ බඩු සම්බන්ධයෙන් හැකි පමණ ඉක්මනින් සුදුසු පරිදි ක්‍රියාකළ යුතු වුවද, වටිනාකම තහවුරු නොකළ වසර 02 සිට වසර 12 දක්වා පැරණි විවිධ ආහාර ද්‍රව්‍ය, බෙහෙත් වර්ග සහ පොහොර ආදිය සහිත බහාලුම් 39 ක්ද, වසර 01 සිට 05 දක්වා පැරණි විවිධ ද්‍රව්‍ය අඩංගු බහාලුම් 448 ක්ද, අන්තර්ගත ද්‍රව්‍ය ඇති/නැති බව නොදන්නා වසර 05 සිට වසර 10 ක් දක්වා පැරණි බහාලුම් 116 ක් හා වසර 10 ට වැඩි බහාලුම් 38 ක්ද, වසර 01 සිට වසර 06 ක් දක්වා පැරණි රු.මිලියන 186 ක් වටිනා සහල් සහිත බහාලුම් 53 ක්ද වශයෙන් බහාලුම් 694 ක් පරීක්ෂණ කටයුතු අවසන් නොකර 2023 වර්ෂය අවසාන දින දක්වා රේගුව සතු විවිධ අංගනවල රඳවා තිබුණි.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**ඇස්තමේන්තු කළ හා රැස්කළ සත්‍ය ආදායම**

2023 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ 5 ක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායම රැස්කළ සත්‍ය ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.12 : 2023 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ 5 ක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායම රැස්කළ තත්‍ය ආදායම

මූලාශ්‍ර: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ ඇස්තමේන්තුගත බදු හා බදු නොවන ආදායම පිළිවෙලින් රු.මිලියන 630ක් හා රු.මිලියන 5,500 වූ අතර එය නැවත පිළිවෙලින් රු.මිලියන 1,650 ක් හා රු.මිලියන 11,500 ක් දක්වා සංශෝධනය කලද වර්ෂය තුළ පිළිවෙලින් රු.මිලියන 3,064 ක් හා රු. මිලියන 12,198 ක් රැස් කර තිබීම හේතුවෙන් අයවැය ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් හා පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව වෙනස් කර ඇති බව නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 31 දිනට හිඟ සුබෝපභෝගී බදු ආදායම රු.මිලියන 137ක් වී තිබුණි.

**නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයන කරන ලද යතුරුපැදි ලියාපදිංචි කිරීම**

2016 සැප්තැම්බර් 07 දිනැති අංක අමප/16/1307/709/061 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයන කරන ලද යතුරුපැදි ඉන්ධන ධාරිතාවය පදනම් කර ගනිමින් අධිභාරයක් අය කිරීමකට යටත්ව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ ලියාපදිංචි කිරීමේදී එන්ජින් ධාරිතාව 201CC සිට 450CC දක්වා කාණ්ඩයේ යතුරුපැදි 296 ක් සඳහා අයකල යුතු නියමිත ගාස්තු අය

නොකිරීම හේතුවෙන් රජයට ලැබිය යුතු රු.මිලියන 78 ක ආදායමක් අහිමි කර තිබුණු බව නිරීක්ෂණය විය. අමාත්‍ය මණ්ඩල තීරණ අනුව යතුරුපැදි ලියාපදිංචි කල යුතු සහන කාලය 2016 අගෝස්තු 30 දින සිට මාස 04 කින් අවසන් වුවත් කැබිනට් අනුමැතියකින් හා ලියාපදිංචියට අවශ්‍ය නීතිමය ලේඛන නොමැතිව යතුරුපැදි 3,088 ක් උක්ත සහන කාලයෙන් පසුව 2017 මැයි 30 දින දක්වා කාලය තුළ ලියාපදිංචි කර තිබුණි.

**ඊ-මෝටරින් ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විද්‍යුත් ලිපිගොනු කළමනාකරණ පද්ධතිය සකස් කර ගැනීම, වාහන ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම, දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීමේදී ඊට සම්බන්ධ සියලු ආයතනවල දත්ත පද්ධතීන් එකිනෙකට සම්බන්ධ කර ගැනීම හා සේවා විමධ්‍යගත කර සන්නිවේදන ජාලයක් ස්ථාපිත කර ගැනීමේ අරමුණින් 2004 වර්ෂයේ සිට ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් 2016 වර්ෂය දක්වා එකී සැලසුම්ගත ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2016 ජූලි 13 දිනැති අමප/16/1231/709/011-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සැපයුම්කරුවකු සමඟ 2018 ජූලි 19 දින ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුම අනුව වසර 5ක් තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කල යුතු වුවත් 2023 වර්ෂය අවසානය දක්වාම එකී ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සෑම වර්ෂයකදීම 2020 වර්ෂය හැර ඊ-මෝටරින් ව්‍යාපෘතිය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් එකතුව රු. මිලියන 441 ක් වෙන්කර තිබූ නමුත් ව්‍යාපෘතිය සඳහා 2023 දෙසැම්බර් 31 දක්වා වැය කර තිබූ මුදල රු. මිලියන 0.18 ක් පමණක් වී තිබුණි.

**අනුපිටපත් ලබා දීම**

මෝටර් වාහන පනත හෝ එහි යම් නියෝගයක් යටතේ දෙන ලද සහතිකයක් හෝ අවසර පත්‍රයක් අස්ථානගත වූ විට හෝ විනාශ වූ විට, නිකුත් කල බලධාරියා සෑහීමකට පත්වන තොරතුරු ඔප්පු කලහොත් එහි අනුපිටපතක් ලබා දිය හැක. එහෙත් ඊට පටහැනිව 2023 වර්ෂයේ අවස්ථා 19 කදී මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි දෙවන පිටපත නිකුත් කර වසර 5 සිට වසර 25 ක් දක්වා කල්ගත වූ සහතික සඳහා, දිවුරුම් ප්‍රකාශයක් මඟින් සිදු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාරීව ලියාපදිංචි කිරීමේ සහතිකයන්හි දෙවන පිටපත වෙනුවට මුල් පිටපත නිකුත් කර තිබුණි.

**L පුවරුවක් ලබා දීම**

මෝටර් රථ පනතේ 203 අධිකාරිය අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත රිය පුහුණුකරුවන් නොමැතිව පුහුණුවන්නෙකුට මෝටර් රථයක් තනිව පැදවීම නීතියෙන් තහනම් වේ.

එවැනි පසුබිමක් තුළ රිය පැදවීම පුහුණු වීම සඳහා L පුවරුවක් ලබා දුන්න ද එය ප්‍රායෝගිකව භාවිතා කළ නොහැක. එහෙත් ඒ පිළිබඳව තක්සේරු කිරීමකින් තොරව ලිඛිත විභාගය සමත් හා ප්‍රායෝගික පරීක්ෂණයන්ට පෙනී සිටීමට යෝජිත රියදුරු බලපත්‍ර අයදුම්කරුවන් වෙත L පුවරුවක් ලබා දීම සඳහා රු. මිලියන 162.5 ක රජයේ මුදල් භාවිත කිරීමට කටයුතු කර තිබුණි.

**හිඟ ආදායම් අය නොකිරීම හා ගිණුම් ගත නොකිරීම**

2023 දෙසැම්බර් 31 දින වන විට පසුගිය වසර පහක කාලය තුළ වේරහැර ආපනශාලාව බදු පදනම මත ලබා දී තිබූ ගැනුම්කරුවන් වෙතින් රු. මිලියන 4.1 ක ආදායමක් ද ප්‍රධාන කාර්යාලයේ හා වේරහැර පරිශ්‍රයේ බදු පදනම මත ස්ථාපිත අනෙකුත් ආයතන වෙතින් රු. මිලියන 2.5 ක ආදායමක් ද හිඟව පැවති නමුත් එකී ආදායම් අයකර ගැනීමට හෝ හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## අනීතිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල චැසි අංක හා එන්ජින් අංක මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතියට වංචනිකව ඇතුළත් කර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ව්‍යාජ සහතික නිකුත් කිරීම පිළිබඳව විශේෂ විගණන වාර්තාව-2022

**වයඹ පළාත් පරිශීලකයින් විසින් ERL පද්ධතිය තුළ ඇතුළත් දත්ත වෙනස්කිරීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මෝටර් රථයක මුල් ලියාපදිංචි දිනයේ සිට ආදායම් ලබාගත යුතු අතර, මුල් ලියාපදිංචි දිනයේ සිට ආදායම් බලපත්‍ර ලබාගත් වර්ෂ ගණන හා ආදායම් බලපත්‍ර ලබා නොගත් වර්ෂ ගණන අනුව හිඟ අදායම් බලපත්‍ර ගාස්තුව ERL පද්ධතිය තුළ නිරූපණය වේ. කිසිදු නීත්‍යානුකූල බලධාරී ආයතනයක අවසරයකින් තොරව ERL පද්ධතිය තුළ ඇතුළත් මුල් ලියාපදිංචි දිනය වෙනස් කර එනම් පසුදාතම් කර ඉහත පරිදි ගණනය වන හිඟ ආදායම් ගාස්තු අයකිරීමකින් තොරව ආදායම් බලපත්‍ර නිකුත් කිරීමට වයඹ පළාත් ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ දත්ත පද්ධතියේ පරිශීලකයින් කටයුතු කර තිබුණි.

**දෙපාර්තමේන්තු පරිශීලකයින් විසින් පද්ධතිය තුළ ඇතුළත් දත්ත වෙනස්කිරීම**

දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති ලියාපදිංචි යතුරුපැදි 99 කට අදාළ චැසි අංක හා එන්ජින් අංක පද්ධතියෙන් ඉවත් කර, වංචනිකව ආනයනය කරන ලද වෙනත් යතුරුපැදිවල එන්ජින් අංක හා චැසි අංක වංචනිකව පද්ධතියට ඇතුළත් කර පැරණි ලියාපදිංචි වාහන අංකය සඳහා නව යාවත්කාලීන මෝටර් වාහන ලියාපදිංචි සහතිකයක් නිකුත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත

පද්ධතියෙ හි පැරණි දත්ත මකා දමා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කර තිබුණි.

**අහිමි වී තිබූ රේගු බදු ආදායම්**

දත්ත වෙනස් කර අනීතිකව චැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර පද්ධතිය තුලින් නව (ව්‍යාජ) ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇති යතුරුපැදිවල එන්ජින් ධාරිතාවය සැලකිල්ලට ගත් කළ ලියාපදිංචි අංක 91කට අදාළ යතුරුපැදි වලංගු රේගු සටහන්කරයක් සහිතව ආනයනය නොකිරීම හේතුවෙන් රජයට රු. මිලියන 55.21ක රේගු බදු ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

**අහිමි වූ ආදායම්**

අධිභාර මුදල් අයකර ගැනීමකින් තොරව වංචනිකව පැරණි අංක යටතේ ලියාපදිංචි සහතික නිකුත් කිරීම හේතුවෙන් වාහන 91කට අදාළව රු.මිලියන 21.48 ක් වූ අධිභාර ගාස්තු හා නව ලියාපදිංචි ගාස්තු රජයට අහිමි වී තිබුණි.

**චැසි අංක හා එන්ජින් අංක වෙනස් කිරීම**

පූර්වයෙන් ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති වෙනත් වාහන පන්තියකට අදාලව ලියාපදිංචි වී ඇති වාහන 29 කට අදාළ චැසි අංක හා එන්ජින් අංක පද්ධතියෙන් ඉවත් කර වෙනත් නීත්‍යානුකූල නොවන ලෙස ආනයනය කරන ලද වාහනවල චැසි අංක හා එන්ජින් අංක පද්ධතියට ඇතුළත් කර පැරණි ලියාපදිංචි අංකය සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙහි උක්ත පැරණි ලියාපදිංචියට අදාළ දත්ත මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි.

**ආදායම් බලපත්‍ර ගාස්තු නොගෙවීම**

දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු සහිත ලියාපදිංචි යතුරුපැදි 04ක එන්ජින් අංකය හා චැසි අංකය වෙනස් කර වෙනත් අනීතිකව ආනයනය කරන ලද යතුරුපැදි 04ක එන්ජින් අංක හා චැසි අංක ඇතුළත් කර වංචනිකව 2022 වර්ෂයේ දී මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කර තිබුණි.

**ප්‍රතිඅපනයනිත වාහන අංක වංචනිකව භාවිතා කිරීම**

විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන් හා රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් ආනයනය කර රාජ්‍ය අනුග්‍රහය යටතේ තීරු බදු රහිතව නිෂ්කාශනය කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද පසුව එකී වාහන නැවත ප්‍රතිඅපනයනය කරන අවස්ථාවන්හි දී ලියාපදිංචිය අවලංගු කරන ලද වාහන 06 ක ලියාපදිංචි අංක සඳහා සාවද්‍ය ලෙස වෙනත් සුඛෝපභෝගී වාහනවල චැසි අංක පද්ධතියට හා එන්ජින් අංක ඇතුළත් කර වෙනත් පුද්ගලයෙකුගේ නමට ලියාපදිංචි සහතික නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි.


**අහිමි වී ඇති බදු ආදායම්**

නීත්‍යානුකූල නොවන ආකාරයට මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට එකලස් කරන ලද වාහන, වංචනිකව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම හේතුවෙන් දළ වශයෙන් සුඛෝපභෝගී බදු හා අනෙකුත් අයකිරීම් හැර ශ්‍රී ලංකා රේගුව විසින් අයකර ගත යුතුව තිබූ රු.මිලියන 122.28 ක බදු ආදායමක් සාවද්‍ය ලෙස රජයට අහිමි කර ඇති බව නිරීක්ෂණය විය.

## සුරාබදු දෙපාර්තමේන්තුව

ඇස්තමේන්තු කළ හා රැස්කළ තත්‍ය ආදායම

2023 වර්ෂය ද ඇතුළුව පසුගිය වර්ෂ 5 ක සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ තත්‍ය ආදායම පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.13 : 2019- 2023 සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ තත්‍ය ආදායම

මූලාශ්‍ර: සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන

2023 වර්ෂයේ ඇස්තමේන්තුගත සුරා බදු හා දුම්කොළ බදු ආදායම් රු. මිලියන 217,035 ක් වු අතර එය රු. මිලියන 182,000 දක්වා සියයට 16 ක ප්‍රතිශතයකින් අඩු කර සංශෝධනය කර තිබූ අතර රු. මිලියන 171,273 ක බදු ආදායමක් රැස්කර තිබුණි. රැස්කරන ලද ආදායම සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 94 ක් වුවද මුල් අයවැය ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී සියයට 79 ක් විය. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සංශුද්ධ මධ්‍යසාර ලීටර් මිලියන 8.39 කින්

හෙවත් සියයට 19 කින් මත්පැන් නිෂ්පාදනය අඩු වී තිබුණද සුරාබදු අනුපාතයන් සියයට 20 කින් වැඩිවීම, සුරාබදු ආදායම ඉහළ යාම සඳහා බලපා තිබුණි.

**හිඟ සුරාබදු හා දුම්කොළ බදු ආදායම්**

2023 වර්ෂය සඳහා ඉකුත් වර්ෂ 04ක හිඟ ආදායම් වාර්තා සමඟ සැසඳීමේදී හිඟ ආදායම් ක්‍රමයෙන් වැඩිවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට හිඟ බදු ආදායම (රු. මිලියන) |
|---|---|
| 2019 | 3,799 |
| 2020 | 3,969 |
| 2021 | 4,550 |
| 2022 | 5,569 |
| 2023 | 7,271 |

වගු අංක 2.10.3 : 2019-2023 වර්ෂවල හිඟ ආදායම්
මූලාශ්‍ර: සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව මත්පැන් නිෂ්පාදන ආයතන 13 කින් රු. මිලියන 7,159 ක්ද රා නිෂ්පාදන ආයතන 13 කින් රු. මිලියන 6.21ක්ද මත්පැන් ස්කාගාර 03 කින් රු. මිලියන 31.48 ක් වශයෙන් හිඟ සුරාබදු සහ මත්පැන් නිෂ්පාදන ආයතන 04 කින් අපනය සඳහා හිඟ බදු රු. මිලියන 68.39 ක්ද ඇතුළුව මුලු හිඟ සුරාබදු ආදායම සහ එයට අදාල හිඟ ප්‍රමාද ගාස්තු එකතුව රු. මිලියන 7,265 ක් විය. තවද, ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ආයතන 02 කින් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.68 ක දුම්කොළ බදු හිඟ ආදායමක් අය වීමට පැවතුණි. 2023 වර්ෂයේ බීඩි සඳහා බදු අය නොකල ආයතන 316 ක් පරීක්ෂාවේදී ඒ අතර ලියාපදිංචිය අළුත් කර නොතිබුණු හා පසු විපරම් සිදු කර නොතිබුණු ආයතන 212 ක්ද ලියාපදිංචි වී බදු නොගෙවු ආයතන 104 ක්ද වූ බව නිරීක්ෂණය විය.

**අපනයන මත සුරාබදු අවකරණය**

අංක 2155/19 දරන 2019 දෙසැම්බර් 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය පළ වූ අංක 10/2019 දරන සුරාබදු නිවේදනය පරිදි මත්පැන් අපනයනය මත 2023 වර්ෂයට අදාළව නිෂ්පාදන ආයතන 04 ක් සඳහා අවස්ථා 32 කදී මත්පැන් අපනයනයට අදාළව රු. මිලියන 7,301 ක

සුරාබදු මුදලක් අවකරණය කර තිබුණි. අදාළ අවකරණ සම්බන්ධ ගිණුම් තැබීමේ අඩුපාඩු හා ක්‍රියාවලියේ අඩුපාඩු නිරීක්ෂණය විය.

**ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය**

මත්පැන් බෝතල් සඳහා ඩිජිටල් සලකුණු මුද්‍රණය ක්‍රියාත්මක ධාන්‍ය මත්පැන් නිපදවන ප්‍රධාන සමාගමක ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවකදී සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් අනුව 2023 ජනවාරි 12 සිට 2023 සැප්තැම්බර් 19 දක්වා කාලය තුළ අවස්ථා 54 කදී බියර් බොතල් මිලියන 1.33 ක ප්‍රමාණයක් හා විවිධ ප්‍රමාණයේ බියර් කෑන් මිලියන 3.36 ක ඩිජිටල් සලකුණු මුද්‍රණය නොවීම් වාර්තා වී තිබුණු බව දක්වා තිබුණි. තවද එම බෝතල් හා කෑන් හඳුනාගත් ප්‍රදේශ වෙත නිකුත් කිරීම සහ අපනයනය කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ලිඛිත අනුමැතිය ලබා දී තිබුණු අවස්ථා නිරීක්ෂණය වීම මත සුරාබදු නිවේදන 7/2021 මගින් හඳුන්වා දුන් පාරිභෝගිකයා වෙත ළඟා වීමට පෙර, සෑම බෝතලයකම හෝ කෑන් එකක් මතම අනුමත ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම අඛණ්ඩව ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

අලෙවිය සඳහා බෙදා හරින බෝතල්වල ව්‍යාජ ස්ටිකර් අලවා තිබුණු බලපත්‍ර ලත් ස්ථාන 78 සම්බන්ධයෙන් සුරාබදු නිවේදන අංක 7/2021 හි 25 වගන්තිය සහ සුරාබදු ආඥා පනතේ 27, 47 හා 56 වගන්තිවල විධිවිධානවලට අනුකූලව බලපත්‍රලත් ස්ථාන 78 ක් වෙනුවෙන්, අදාළ නිෂ්පාදනාගාර 03 විසින් වගකීම භාර ගෙන තිබුණි. ඒ අනුව 2023 සැප්තැම්බර් මාසයේදී කාර්මික අපරාධ වාර්තා යටතේ සමථකරණය වී උපරිම සමථ ගාස්තු ලෙස රු. මිලියන 0.5 බැගින් රු. මිලියන 40.5 ක් සහ අදාල සුරාබදු මුදල් හා සියයට 3 ක ප්‍රමාද ගාස්තු වශයෙන් රු. මිලියන 17.94 ක් විමර්ශනයට භාජනය කර තිබූ නිෂ්පාදන ආයතන 3 න් අය කර ගෙන තිබුණි. ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ගවල ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොවිණි.

**ආදායම් පරිපාලන පද්ධතිය**

සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා කාර්යක්ෂම ආදායම් පරිපාලනය, සේවාදායකයන් සඳහා ඉහළ පෙළේ සේවා ලබා දීම, රාජ්‍ය ආයතන හා දත්ත හුවමාරුව විධිමත් කිරීම හා මානව සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැපයුම්දාමයක් ක්‍රියාත්මක කිරීම ආදී අරමුණු ඉටුකිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය බෙදාහැරීම් සහ සැපයුම්දාම නියාමනය, අපරාධ දත්ත සහ නීති කළමනාකරණය, සුරාබදු සහ බදු පරිපාලනය ආදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ආදායම් පරිපාලන තොරතුරු පද්ධතියක් (RASED) හඳුන්වා දීමට යෝජනා කර තිබුණි. 2022 සහ 2023 වර්ෂවල පිළිවෙලින් රු. මිලියන 100 ක් සහ රු. මිලියන 94 ක් අදාළ පද්ධතිය සඳහා මෘදුකාංග සංවර්ධනයට ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් එම වර්ෂයන් තුළ කිසිඳු වියදමක් සිදු කර නොතිබුණි.

**යෝජිත සුරාබදු රසායනාගාරය**

ප්‍රමිතියෙන් යුත් මත්පැන් වෙළඳපොළට නිකුත් කිරීමේ සහ නීති විරෝධී මත්පැන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමේ හැකියාව ලැබෙන පරිදි රසායනාගාරයක් ස්ථාපනය කිරීමට 2023 වර්ෂයේ රු. මිලියන 100 ක් ප්‍රතිපාදනය කර තිබුණද වැය කරන ලද වියදම රු. මිලියන 1.48 ක් පමණක් වී තිබුණි.

**මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම**

මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම යටතේ මත්පැන් වර්ග 11 ක් සඳහා නිර්ණායක 16 ක් යටතේ ප්‍රමිතීන් සකස් කර තිබුණද ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනය සඳහා විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ප්‍රමිතීන් සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් කිරීම සහ මහ රා සඳහා ප්‍රමිත ස්ථාපිත කිරීම 2023 වර්ෂයේ අවසානය දක්වාත් ඉටු වී නොතිබුණි.

## ජාතික ලොතරැයි මණ්ඩලය

පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීමේ අරමුණ ඇතිව 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය 1963 වර්ෂයේදී සංස්ථාගත කර තිබුණි.

**ඒකාබද්ධ අරමුදලට ලබා දිය යුතු අරමුදල් රඳවා ගැනීම.**

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයි පත් ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩු කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, එම විධිවිධානවලට පටහැනිව රු. මිලියන 3,603.1 ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අරමුදල තුළ රඳවා ගෙන තිබුණි. එසේම 2023 වර්ෂයේදී මණ්ඩලය විසින් පවත්වා තිබූ මහජන සම්පත විශේෂ දිනුම්වාරය ඇතුළු ලොතරැයි 11 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන් ප්‍රේෂණය කිරීම නිසා ඒකාබද්ධ අරමුදලට ලබා දිය යුතු මුදල රු.මිලියන 517.84 ක් අඩුවෙන් ලබා දී තිබුණි.

**නීති, රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 71 සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති මෙහෙයුම් අත් පොතෙහි (Operational Manual) 3.2 (i) විධිවිධානවලට පටහැනිව, මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මත පමණක් සේවයේ නියුතු නිලධාරීන් 341 ක් වෙත 2023 ඔක්තෝබර් මාසයේ සිට ඉදිරියට වැටුප් වර්ධක 06 බැගින් ලබා දී තිබුණු අතර, 2023

මූල්‍ය වර්ෂයට අදාළව පමණක් එම වැඩිකරන ලද වැටුප් සඳහා දරන ලද වියදම රු. මිලියන 3.1 ක් වී තිබුණි.

2022 අගෝස්තු 08 දිනැති අංක PED 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 වගන්තිය අනුව රාජ්‍ය ආයතනවල සංවත්සර ක්‍රියාකාරකම්වලට අදාල සියලු වියදම් අත්හැරිය යුතු වුවත්, 2023 වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 60 වන සංවත්සරය වෙනුවෙන් මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් වෙත එක් අයෙකුට රු. 63,000 ක් බැගින් භාණ්ඩ මිලදී ගැනීමේ වවුචර්පත් ලබා දීමට සහ සංගීත සාදයක් පැවත්වීම වෙනුවෙන් එකතුව රු. මිලියන 34.6 ක් වැයකර තිබුණි.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නිල වාහන සැපයීම**

2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් පස් දෙනෙකු සඳහා නිල වාහන සපයා දී තිබූ අතර ඒ වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස 2023 වර්ෂයේදී එකතුව රු. මිලියන 2.9 ක් වැයකර තිබුණි. තවද 2016 මැයි 30 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකමක් නොමැති නිලධාරිනියකට මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගත් මෝටර් රථයක් ලබා දී තිබූ අතර එම මෝටර් රථය සඳහා 2023 වර්ෂයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු. මිලියන 2.02 ක් ගෙවා තිබුණි.

**ආපසු එවුම් සඳහා ඉඩදී ඇති ප්‍රතිශතය**

බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත නිකුත් කරන ලොතරැයිවලින් ආපසු එවුම් සඳහා ඉඩදී ඇති ප්‍රතිශතය 2023 පෙබරවාරි සිට සියයට 05 සිට සියයට 10 ක් දක්වා වැඩි කිරීමට කළමනාකාරීත්වය අනුමැතිය ලබා දී තිබුණි. 2023 වර්ෂයේදී වාලම්පූරි, ලකී ත්‍රීඩම් සහ සුපිරි ධන සම්පත යන ලොතරැයි වර්ග 03 න් ආපසු එවූ ලොතරැයි පත් ප්‍රමාණය මිලියන 5.16 ක් වූ අතර එය විකිණීමට නිකුත් කරන ලොතරැයි පත් වලින් පිළිවෙලින් සියයට 28, 17 හා 21 ක් විය. එම නොවිකිණි ආපසු එවන ලද ලොතරැයි පත්වල මුද්‍රණ පිරිවැය රු. මිලියන 14.7 ක් වී තිබුණි.

# බැංකු කටයුතු

මූල්‍ය අංශයේ ප්‍රධාන අංශය වන බැංකු අංශය, 2023 වසර අවසාන වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 61.5කට හිමිකම් කියමින්, අවම නියාමන අවශ්‍යතාවන්ට වඩා වැඩියෙන් පවත්වාගත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් වල සහාය ඇතිව, ආර්ථික අර්බුදයෙන් හා අහිතකර ගෝලීය තත්වයන්ගෙන් පැන නැගුනු අභියෝගවලට ඔරොත්තු දීමට සමත් විය. 2023 වසර අවසන් වන විට, බැංකු අංශය, බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය.

**බැංකු අංශයේ වත්කම්**

බැංකු අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය වසර තුල රුපියල් බිලියන 989.4කින් ඉහල ගිය අතර 2023 දෙසැම්බර් වන විට එය රුපියල් ට්‍රිලියන 20.0 ඉක්ම විය. 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 15.4ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ සියයට 5.1ක වාර්ෂික වර්ධනයක්, බැංකු අංශයේ වත්කම් වාර්තා කරන ලදී. විනිමය අනුපාතිකය අධි ප්‍රමාණය වීමත් සමග විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණය සහ ලැබිය යුතු දෑ සහ ආයෝජන ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය වීම මෙම වර්ධනයේ පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ණය සහ ලැබිය යුතු දෑ, 2022 අවසානයේ පැවති සියයට 5.5ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 අවසානයේ දී සියයට 2.6කින් වාර්ෂික සංකෝචනයකට ලක් වූ අතර, 2023 වසරේ පළමු භාගය තුළ පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙයට හේතු විය.

**බැංකු අංශයේ වගකීම්**

බැංකු අංශයේ අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති තැන්පතු, 2023 වසර අවසානය වන විට මුළු ශේෂ පත්‍ර වගකීම්වලින් සියයට 81.5 ක් වූ අතර, ණය ගැනීම්වල දායකත්වය සියයට 6.8 ක් විය.

| අයිතමය | 2022 (අ) | | 2023 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2022 | 2023 |
| වත්කම් | | | | | | |
| ණය සහ අත්තිකාරම් | 11,312.5 | 58.3 | 11,017.6 | 54.0 | 5.5 | (2.6) |
| ආයෝජන | 5,931.7 | 30.5 | 7,314.0 | 35.8 | 19.4 | 23.3 |
| වෙනත් (ඇ) | 2,172.4 | 11.2 | 2,074.4 | 10.2 | 92.1 | (4.5) |
| වගකීම් | | | | | | |
| තැන්පතු | 15,298.7 | 78.8 | 16,623.6 | 81.5 | 18.8 | 8.7 |
| ණය ගැනුම් | 1,871.6 | 9.6 | 1,389.0 | 6.8 | (13.9) | (25.8) |
| ප්‍රග්ධන අරමුදල් | 1,598.1 | 8.2 | 1,766.9 | 8.7 | 18.5 | 10.6 |
| වෙනත් | 648.2 | 3.3 | 626.5 | 3.1 | 52.2 | (3.4) |
| මුළු වත්කම්/වගකීම් | 19,416.6 | 100.0 | 20,406.0 | 100.0 | 15.4 | 5.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් මිලදීගැනුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන් අංක 2.14: බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය
මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා - 2023

**බැංකු අංශයේ 3 වන අදියර යටතේ පවතින ණය**

3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් නිරූපණය කෙරෙන පරිදි, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ණය අවදානම ඉහල මට්ටමක පැවතුණි. ප්‍රධාන වශයෙන් 3 වන අදියර යටතේ පවතින ණය වැඩිවීම සහ ණය සහ ලැබිය යුතු දෑ වල සංකෝචනය හේතුවෙන්, බැංකු අංශයේ 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය, 2022 වසර අවසානයේ පැවති සියයට 11.3 ට සාපේක්ෂව 2023 වසර අවසානයේ දී සියයට 12.8 දක්වා වැඩි වූ අතර, එමගින් බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුව ද, 3 වන අදියර යටතේ පවතින ණය සඳහා වෙන් කිරීම් (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) සියයට 18.4කින් (වාර්ෂික) වර්ධනය වීම මගින්, 2022 වසර අවසානයේ පැවති 3 වන අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය වූ සියයට 44.9 ට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී එය සියයට 49.3 දක්වා ඉහල යෑමක් වාර්තා කළේය.

**බැංකු අංශයේ ද්‍රවශීලතාවය**

රුපියල් වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත්වලින් නියෝජනය වන ද්‍රවශීල වත්කම්වල ඉහල වර්ධනය හේතුවෙන්, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය (SLAR) සහ ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCRs) මගින් පෙන්නුම් කෙරෙන බැංකු අංශයේ ද්‍රවශීලතාවය 2023 වසරේ දී වර්ධනය විය.

**බැංකු අංශයේ ලාභදායීත්වය**

ප්‍රධාන වශයෙන් නව ණය හානිකරණ ගාස්තු අඩුවීම හේතුවෙන් වසර තුළ දී ලාභදායීත්වය වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 2023 වසර තුළ බැංකු අංශයේ පොලී ආදායම සියයට 25.5කින් ඉහළ ගිය අතර, පොලී වියදම් සියයට 42.7කින් වැඩි වීම, ශුද්ධ පොලී ආදායම සියයට 4.9කින් අඩු වීමට හේතුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර අවසානයේ සියයට 4.0 ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2023 වසර අවසානයේ දී සියයට 3.6 දක්වා අඩු විය.

| අයිතමය | 2022 (අ) | | 2023 (ආ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රුපියල් බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | වටිනාකම (රුපියල් බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස |
| **ශුද්ධ පොලී ආදායම** | **750.8** | **4.0** | **713.8** | **3.6** |
| පොලී ආදායම | 2079.4 | 11.0 | 2609.0 | 13.0 |
| පොලී වියදම | 1328.6 | 7.0 | 1895.2 | 9.4 |
| **පොලී නොවන ආදායම** | **280.6** | **1.5** | **206.8** | **1.0** |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 127.0 | 0.7 | 132.1 | 0.7 |
| **පොලී නොවන වියදම** | **324.0** | **1.7** | **373.2** | **1.9** |
| සේවක පිරිවැය | 173.2 | 0.9 | 190.0 | 0.9 |
| **ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම්** | **468.8** | **2.5** | **163.8** | **0.8** |
| බදු පෙර ලාභය (එකතුකළ අගය මත බදු අඩු කළ පසු) | 177.8 | 0.9 | 294.4 | 1.5 |
| බදු පසු ලාභය | 153.8 | 0.8 | 188.9 | 0.9 |

**රූප සටහන් අංක 2.15: බැංකු අංශයේ ලාභදායීත්වය**
මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා -2023

**බැංකු අංශයේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූලත්වය**

සමස්තයක් වශයෙන්, 2023 වසර තුළ දී, අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල වීමට බැංකු අංශය සමත්විය. ප්‍රධාන වශයෙන්, සමස්ත ණයවල සංකෝචනය, රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඉහල යෑම, සහ ශ්‍රී ලංකා රුපියල අධි ප්‍රමාණය වීම හේතුවෙන්, 2023 වසර තුළ දී අවදානම මත බර තැබූ වත්කම් ප්‍රමාණය පහත වැටීමෙන් 2022 වසර අවසානයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයෙහි දියුණුවක් වාර්තා විය.

**බැංකු අංශයේ ණය සංකේන්ද්‍රණය**

ප්‍රධාන අංශ හයකට ණය සංකේන්ද්‍රණය වූ බැවින් බැංකු අංශයේ සංකේන්ද්‍රණ අවදානම ඉහළ මට්ටමක පැවති අතර, මෙම අංශවලින් සමහරක් සාපේක්ෂ වශයෙන් ඉහළ 3වන අදියර ණය අනුපාත වාර්තා කළ අතර, එය පැහැර හැරීමේ වැඩි අවදානමක් පෙන්නුම් කරයි. අංශයේ ණය ප්‍රධාන වශයෙන් සංකේන්ද්‍රණය වී තිබුණේ පරිභෝජනය, ඉදිකිරීම්, වෙළඳ, නිෂ්පාදන, යටිතල පහසුකම් සහ කෘෂිකර්ම යන අංශ වෙතය.


**බැංකුවල ස්වෛරීත්ව නිරාවරණය**

රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සහ රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) ණය දීම ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, රාජ්‍ය බැංකු ස්වෛරීත්වයට බෙහෙවින් නිරාවරණය වී තිබුණි.

බැංකු අංශයේ ස්වෛරීත්ව නිරාවරණ අගය 2022 තුන්වන කාර්තුව අවසානයේ සිට 2023 තුන්වන කාර්තුව අවසානය දක්වා රු.බිලියන 895කින් වැඩි වී තිබූ අතර එය රු.බිලියන 8,612.3ක් දක්වා ළඟා වී තිබුණි. ඒ අනුව, ස්වෛරීත්ව නිරාවරණය බැංකු අංශයේ මුළු වත්කම් වලින් සියයට 43.4 ක් විය.

රාජ්‍ය බැංකුවල සමස්ථ ස්වෛරීත්ව නිරාවරණය සියයට 61.1ක් වූ අතර ප්‍රධාන වශයෙන් රජය සතු බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) දෙකෙහි ස්වෛරීත්ව නිරාවරණය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. දේශීය පෞද්ගලික බැංකු ද සමස්ත ස්වෛරීත්ව නිරාවරණයෙන් සැලකිය යුතු කොටසකට හිමිකම් කිවූ අතර විදේශීය බැංකුවල ස්වෛරීත්ව නිරාවරණය අඩු මට්ටමක පැවති අතර රුපියල්වලින් නාමනය කරන ලද සුරැකුම් පත්වල අයෝජනයන්ගෙන් පමනක් එය සමන්විත විය.

මෙම කාලය තුළ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන රු. බිලියන 1,500.9 කින් වැඩි වූ අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සතුව පැවති විදේශ මුදලින් නාමනය කරන ලද ණය, මධ්‍යම රජයට පවරා ගැනීම හේතුවෙන්, මධ්‍යම රජයේ විදේශ මුදලින් නාමනය කරන ලද ණය රු.බිලියන 371.2 කින් ඉහළ ගියේය. මෙම කාලය තුළ රාජ්‍ය ව්‍යවසායන්ට ලබා දී තිබූ විදේශ මුදලින් නාමනය කරන ලද ණය පහත වැටීමට මෙය හේතු විය. තවද, මෙම කාල සීමාව තුළ දේශීය ණය ප්‍රශස්ත කිරීමේ වැඩසටහන (DDO) යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs) ප්‍රතිව්‍යුහගත කිරීම මෙම අංශය විසින් සම්පූර්ණ කරන ලදී.





රූප සටහන් අංක **2.16 : 2023** තුන්වන කාර්තුව අවසානයේ බැංකු කාණ්ඩය අනුව ස්වෛරීත්ව නිරාවරණය

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා -2023

**රජය සතු ප්‍රධාන ව්‍යවසායන් (SOEs) වෙත බැංකු අංශයේ නිරාවරණය**

IMF-EFF විධිවිධාන යටතේ තෝරාගත් රජය සතු ව්‍යවසායන්හි (SOEs) ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සතුව පැවති විදේශ මුදලින් නාමනය කරන ලද ණය මෙම කාල සීමාව තුල මධ්‍යම රජයට පවරා ගැනීම හේතුවෙන් එම ආයතනය වෙත බැංකු අංශයේ නිරාවරණ සියයට 55.1 කින් අඩු විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට තනිකර සහාය ලබා දී තිබුනේ ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකකින් වන අතර, 2022 තෙවන කාර්තුව අවසාන වන විට විදේශ මුදලින් නාමනය කරන ලද ණය ඇමරිකානු ඩොලර් බිලියන 2.4 ක් ලබා දී තිබූ අතර එම ණය පසුව රජයට පවරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 තෙවන කාර්තුව අවසාන වන විට ඇමරිකානු ඩොලර් මිලියන 524.4 දක්වා අඩු වී තිබුණි. රජයට අයත් බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) දෙක මෑත මාසවලදී ලංකා විදුලිබල මණ්ඩලයට (CEB) තවදුරටත් ණය ලබා දී නොමැති බව නිරීක්ෂණය වූ අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) මුදල් ප්‍රවාහය වැඩිදියුණු වීමත්

සමග 2023 තෙවන කාර්තුව අවසාන වන විට CEB වෙත බැංකු අංශයේ නිරාවරණය සියයට 5.3 කින් අඩු වී තිබුණි.




**රූප සටහන් අංක 2.17 : CPC සහ CEB වෙත බැංකු අංශයේ නිරාවරණය - විදේශ මුදල්**

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා - 2023**

**රාජ්‍ය බැංකුවල අපේක්ෂිත ප්‍රතිසංස්කරණ**

රාජ්‍ය බැංකු ද බොහෝ දුරට මහජන අරමුදල්වලින් ප්‍රාග්ධනීකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව 2024 අයවැය යටතේ බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන වර්ධන ක්‍රියාවලියට සහාය වීම සඳහා රුපියල් බිලියන 450ක් වෙන් කර ඇත. මීට අමතරව, රජය සතු බලපත්‍රලාභී වාණිජ බැංකු (LCB) දෙකෙන් සියයට 20 ක් උපාය මාර්ගික ආයෝජකයින්ට හෝ මහජනතාවට වෙන් කිරීමට ද යෝජනා විය.

## ශ්‍රී ලංකා මහ බැංකුව

**නෛතික පුද්ගලභාවයක් සහිත සංස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවීම**

ශ්‍රී ලංකා මහ බැංකුව යනු ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රීය ස්ථානය උසුලනු ලබන ආයතනය වේ. 2023 සැප්තැම්බර් මාසයේ දී සම්මත වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත (2023 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන) මගින් 1950 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව අර්ධ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කළ 1949 අංක 58 දරන මුදල් නීති පනත අවලංගු විය. මෙම නව පනත යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව නෛතික පුද්ගලභාවයක් සහිත සංස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

මෙම නව පනත යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන සහ වගකීම් සහගත විය යුතුය. නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය සඳහා වගකිව යුතුය.

නව පාලන ව්‍යුහය සාමාන්තර තීරණ ගැනීමේ මණ්ඩල දෙකකින් එනම්, මහ බැංකු අධිපතිවරයා විසින් නායකත්වය දරනු ලබන, පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයෙන් සමන්විත වේ. පාලක මණ්ඩලය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම සහ මුදල් ප්‍රතිපත්තිය හැර ශ්‍රී ලංකා මහ බැංකුවේ පොදු ප්‍රතිපත්තිය නිර්ණය කිරීම කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමට සහ පවත්වා ගෙන යෑම සඳහා නම්‍යශීලී උද්ධමනය ඉලක්කගත කිරීමේ රාමුව හා අනුකූල ව නම්‍යශීලී විනිමය අනුපාතික පාලනයක් ක්‍රියාත්මක කිරීම කරනු ලැබේ.

සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව එහි ප්‍රාථමික අරමුණට අමතරව, සඵලදායී ලෙස සම්පත් උපයෝගීතාව උපරිම කරන අතරතුර, හිතකර හා ස්ථාවර ආර්ථික සහ මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීම පෙරදැරි ව කටයුතු කරයි. එබැවින්, මහ බැංකුවේ නව ප්‍රාථමික සහ අනෙක් අරමුණු පහත දැක්වේ.

**ප්‍රාථමික අරමුණ** - දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගෙන යෑම - ප්‍රාථමික අරමුණ හඹා යෑමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව නිමවුම එහි විභව මට්ටම කරා ස්ථායීකරණය පිළිබඳව සලකා බැලිය යුතු ය.

**අනෙක් අරමුණ**- මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගෙන යෑම - අනෙක් අරමුණ හඹා යෑමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය පද්ධතියේ සංවර්ධනය සහ කාර්යක්ෂමතාව සලකා බැලිය යුතු ය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් එහි අධිපතිවරයා තවදුරටත් කටයුතු කරනු ඇත. මීට අමතරව, රජයේ ආර්ථික කටයුතු උපදේශක මෙන් ම රජයේ බැංකුකරු ලෙස ද මහ බැංකුව කටයුතු කරනු ලබයි.

## විගණන නිරීක්ෂණ

**මුදල් මණ්ඩලයේ නියාමනයට හා අධීක්ෂණයට යටත් නොවන ආයතන**

ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු නමුත් තැන්පතු භාර නොගන්නා නමුත් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. මේ හේතුවෙන් එවැනි සමාගම් මහ බැංකුවේ මුදල් මණ්ඩලය/ පාලක මණ්ඩලය විසින් නියාමනයට හා අධීක්ෂණයට යටත් නොවී පැවතුණි.

**දේශීය ණය ප්‍රශස්තකරණය**

දේශීය ණය ප්‍රශස්තකරණයේ (Domestic Debt Optimization) කොටසක් ලෙස බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට දෙන ලද නොපියවූ

තාවකාලික අත්තිකාරම් සහ රජයෙන් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත් පිළිවෙලින් රුපියල් බිලියන 344.7 සහ රුපියල් බිලියන 2,368 ක්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියක් ලැබෙන නව භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් බවට ප්‍රතිව්‍යුහගත කර පරිවර්තනය කිරීම 2023 සැප්තැම්බර් 21 දින සිදු කරන ලදි. පරිවර්තනය කිරීමේදී, 2024 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා වන කාල සීමාවේදී කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් සහ වසර 6 සිට 15 දක්වා කල්පිරීමට නියමිත, 2024 තෙක් සියයට 12.4 ක පොලියක් ද (2024 ද ඇතුළත්ව), 2026 තෙක් සියයට 7.5 ක පොලියක් ද (2026 වසර ද ඇතුළත්ව) හා ඉන් පසුව කල්පිරෙන දිනය තෙක් සියයට 5 ක පොලියක් ද වශයෙන් ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියක් ලැබෙන භාණ්ඩාගාර බැඳුම්කර ලැබී තිබුණි. නව භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල සාධාරණ අගය සහ ගනුදෙනු අගය අතර වෙනස හේතුවෙන් ඉහත ප්‍රතිව්‍යුහගතකරණයේදී රු.බිලියන 766.4 ක එක්දින පාඩුවක් (Day one Loss) සිදුවී තිබුණි.

## ලංකා බැංකුව

**2023 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පසුබෑම**

2023 වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 26,694ක ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ ලාභය රු.මිලියන 31,972ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 5,278ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම් බදු වියදම සියයට 1471 කින් ඉහළ යෑම හේතු වී තිබුණි.

**ඉහළම අක්‍රිය ණය ශේෂ 10**

2023 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව රු.මිලියන 37,393.42 ක් වූ අතර එය එදිනට මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 1.52ක ප්‍රතිශතයක් විය. එසේම පෙර වර්ෂයට සාපේක්ෂව එය රු.මිලියන 300.45 ක එනම් සියයට 0.81ක වැඩි වීමක් වන අතර එය එදිනට බැංකුවේ III වන අදියරේ මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 11.99 ක ප්‍රතිශතයකි.

**2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ විධිවිධානවලට අනුකූල නොවීම**

පනතේ විධිවිධානවලට අනුකූල නොවීම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා බැංකුව වෙත 2023 නොවැම්බර් 07 වන දින රු.මිලියන 6 ක දඩයක් නියම කර තිබුණි.

**ශ්‍රී ලංකා යුද හමුදාවට තාවකාලිකව භාර දී ඇති බැංකුව විසින් අත්පත් කර ගත් දේපල**

බැංකුව විසින් අත්පත් කර ගත් දේපල 06 ක් 2020 සහ 2021 වසරවල දී ශ්‍රී ලංකා යුද හමුදාවට නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය සහිතව තාවකාලිකව භාර දී ඇත. කෙසේ වුවද බැංකුව විසින් එම දේපල නැවත අත්පත් කර ගැනීමට හෝ එම දේපල සඳහා සාධාරණ වටිනාකමක් නැවත ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් හිඟ ශේෂයන් පියවා ගැනීමට නොහැකි වී තිබුණි.

**ණය කපා හැරීම්**

බැංකුව 2023 වසර සඳහා රු.මිලියන 17.17 ක ණය කපා හැර තිබූ අතර පසුගිය වසර හය සඳහා එහි සමුච්චිත අගය රු.මිලියන 855.94 ක් ලෙස වාර්තා විය. එහි 2019 වර්ෂය තුළ පුද්ගලික සමාගමකට අයත් රු.මිලියන 616.46 ක ණය කපා හැරීමේ ශේෂය ද ඇතුළත් වේ.

## මහජන බංකුව

**රජය සතු ව්‍යවසායන්ට ලබා දී ඇති ණය හා අත්තිකාරම්**

2023 වසර අවසානය වන විට රජය සතු ව්‍යවසායන්ට ලබා දී ඇති ණය හා අත්තිකාරම් රු.මිලියන 781,402 ක් වූ අතර එය 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් වලින් සියයට 42.32ක් **විය.** 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු අනෙකුත් ලැබීම් රු.මිලියන 1,041,466 ක් වූ අතර, ඒ අනුව රජය සතු ව්‍යවසායන් සඳහා වූ මුළු නිරාවරණය රු.මිලියන 1,822,868 ක් හෙවත් බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 60 ක් වී තිබුණි.

**swap ගණුදෙනුවේ අලාභය**

පූර්ව ලිඛිත එකගතාවයකින් තොරව ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලැබිය යුතු එ.ජ.ඩො මිලියන 29.6 ට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එ.ජ.ඩො මිලියන 43 ක swap ගණුදෙනුව පියවීම හේතුවෙන් බැංකුවට රු.මිලියන 1,613.36 ක පාඩුවක් සිදු වී තිබුනි.

**මාර්ගස්ථ පෙර ගෙවුම් කාඩ්පතක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවය සඳහා මාර්ගස්ථ පෙර ගෙවුම් කාඩ්පතක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහා බැංකුව විසින් රු.මිලියන 93 ක් වැයකර තිබුණි. එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අවලංගු කොට නව ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**මෙහෙයුම් ප්‍රතිඵල**

2023 වර්ෂය තුලදී බැංකුව රු.බිලියන 4.29 ක බදුවලට පෙර ලාභයක් සහ රු.බිලියන 7.22 ක බදු පසු ලාභයක් වාර්තා කර තිබුණි. මෙම ලාභයන් පිළිවෙලින් පසුගිය වර්ෂයේ බදු පෙර ලාභය හා බදු පසු ලාභය වූ රු.බිලියන 4.51 ක් හා 2.52 ක් සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 4.9 ක අඩු වීම ක් සහ සියයට 186.5 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. පොළී ආදායමට සාපෙක්ෂව පොළී වියදම සැලකිය යුතු ලෙස වර්ධනය වීම මෙයට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය. බදු පසු ලාභය ඉහල ප්‍රතිශතයකින් වැඩිවීමට විලම්භිත බදු වත්කම් ඉහල යාම තුලින් ජනනය වූ බදු වියදම ඍණ අගයක් ගැනීම හේතු වී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂය අවසන් වන විට සියයට 0.28 ක් ලෙස වාර්තා වූ වත්කම් මත ප්‍රතිලාභය (ROA), 2023 වර්ෂයේදී සියයට 0.26 ක් දක්වා පිරිහී තිබුණි. එමෙන්ම පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 3.40 ක කොටස් මත ප්‍රතිලාභය (ROE) 2023 වර්ෂයේදී සියයට 9.36 ක් දක්වා පිරිහී තිබුණි.

**ණය සහ අත්තිකාරම්**

බැංකුවේ දළ ණය සහ අත්තිකාරම්වල වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 548,898 ක් වූ අතර මෙය පසුගිය වර්ෂයේ රු.මිලියන 570,256 සමග සැසඳීමේ දී සියයට 3.9 ක පමණ අඩු වීමකි. මුළු දළ ණය හා අත්තිකාරම්වලින් රුපියල් මිලියන 429,044 ක් ලබා දී තිබුණේ පුද්ගලික ණය, නිවාස හා දේපල ණය වශයෙනි. තවද, රු.මිලියන 94,935 ක් එනම් සියයට 17.3 ක් හා රු.මිලියන 15,220 ක් එනම් සියයට 2.8ක් ලබා දී තිබුණේ පිළිවෙලින් උකස් ණය සහ සේවක ණය වශයෙනි.

**මාලදිවයිනේ පුද්ගලික සමාගමකට ලබාදී තිබූ විදේශ ණය**

මුළු ණය හා අත්තිකාරම්වලින් රු.මිලියන 3,800 ක් විදේශ ණය වන අතර එම සම්පූර්ණ වටිනාකම වනුයේ, 2018 වර්ෂයේදී මාලදිවයිනේ පුද්ගලික සමාගමකට ලබාදී තිබූ එ. ජ. ඩොලර් මිලියන 9 ක් සහ 2023 දෙසැම්බර් 31 දිනට ඒ මත ගණනය කරන ලද හිඟ පොළිය වේ. විදේශ රටක සංචාරක කර්මාන්තයේ නියැලී සිටින පෞද්ගලික සමාගමකට ඉදිකිරීම් කටයුතු සඳහා ණය ලබා දීම, ජාතික ඉතිරිකිරීම් බැංකු පනතින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් වන අතර එම ණය මුදල ලබා දීමට පෙර විස්තීරණ ණය ඇගයීමක් හෝ අවදානම් තක්සේරුවක් සිදු කර තිබුණ බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවුණි. ණය මුදල ලබා දීමෙන් පසු ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා බැංකුව විසින් ලබා දී තිබූ වසරක මුලික සහන කාලය 2022 දක්වා වරින් වර දීර්ඝ කර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 5 දරණ චක්‍රලේඛයෙන් ආවරණය නොවන විදේශ සමාගමක් වුවද, බැංකුව විසින් එම චක්‍රලේඛය යටතේ ණය සහන ලබා දී තිබුණ ද, ණය ගැණුම්කාර සමාගම විසින්

2023 දෙසැම්බර් 31 දක්වා කිසිම ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදු කර නොතිබුණි. මෙම ණය මුදල වර්ෂ අවසානයේදී අක්‍රීය ණය මුදලක් බවට වර්ග කර තිබූ අතර මේ දක්වා මේ සම්බන්ධ තාක්ෂණික කුසලතා හා නිපුණතාවයක් ඇති ස්වාධීන පාර්ශවයක් විසින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කර නොතිබුණි.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

**අක්‍රීය ණය අවදානම් අනුපාතය** 2023 දෙසැම්බර් 31 දිනට ණය සහ අත්තිකාරම්වල මුළු ප්‍රාග්ධන හිඟ ශේෂය රු. මිලියන 23,875 ක් වූ අතර, එදිනට අක්‍රීය ණය සහ අත්තිකාරම් වටිනාකම රු.මිලියන 5,532 කි. ඒ අනුව අක්‍රීය ණය අනුපාතය මුළු ප්‍රාග්ධන හිඟ ශේෂයෙන් සියයට 23ක් වන අතර එය බැංකුවේ අක්‍රීය ණය අවදානම් දැරීම්/ ශක්‍යතාවය වන සියයට 20 ඉක්මවා යාමකි.

**අක්‍රීය ණය** 2023 වර්ෂය තුළ වටිනාකම රු.මිලියන 7,864 ක් වූ ණය 16,558 ක ප්‍රමාණයක් ලබා දී තිබූ අතර එයින් සියයට 12 ක් හෙවත් ණය 1,624 ක් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට එම ණය මුදල්වලට අදාළ මුළු හිඟ ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 959 ක් විය.

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාරික ණය 18කට අදාළ මුළු ප්‍රාග්ධන හිඟ ශේෂය රු. මිලියන 939 ක් වූ අතර එයින් රු.මිලියන 776 ක් හෙවත් සියයට 83 ක් 2023 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.

**හඳුනාගත් අලාභ** 2018 වර්ෂයේ අම්පාර ශාඛාව මගින් පුද්ගලික ඇඟළුම් කම්හලකට එකතුව රු. මිලියන 8 ක් වූ වංචනික ණය 07 ක් ප්‍රදානය කර තිබූ අතර පසුව එය අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට එකී ණයවල හිඟ ශේෂය රු. මිලියන 14.96 ක් වී තිබුණි.

**සේවක අර්ථසාධක අරමුදල් ණය** සේවක අර්ථසාධක අරමුදල් නොමැති වීම්/ ණය පද්ධතියෙන් වාර්තා මකා දැමීම හේතුවෙන් EPF ගනුදෙනුකරුවන් 70 දෙනෙකුගෙන් අය විය යුතු රු.මිලියන 3.45 ක හිඟ මුදල් 2022 කාලසීමාව සඳහා ගෙවීම මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එමගින් බැංකුවට රු. මිලියන 12.49 ක පාඩුවක් සිදුවිය හැකි අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**දේපළ උකස් ණය වටිනාකම** බැංකුවේ ණය මෙහෙයුම් අත්පොතේ 4.2.1.1 වගන්තියට අනුව ව්‍යාපාරික අරමුණු සඳහා දේපළ උකස් කිරීමේදී, බලකර විකුණුම් වටිනාකමෙන් (force sale value) සියයට 60 ක් ණය මුදල ලෙස සැලකිය යුතු විය . ඊට පටහැනිව කුලියාපිටිය ශාඛාව විසින් රු. මිලියන 49.60 ක් වටිනා ව්‍යාපාරික ණය 03 ක් පුද්ගලික

සමාගමකට ලබා දී තිබුණි. එය උකස් කර ඇති දේපලෙහි බලකර විකුණුම් වටිනාකමෙන් සියයට 124 ක් විය. කෙසේ වෙතත්, බැංකුව විසින් ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු 01 දින පවරා ගෙන තිබූ අතර එය 2021 ඔක්තෝබර් 08 වන දින රු.මිලියන 31 කට විකුණා තිබුණි. තවද රු.මිලියන 39.81ක මුදලක් ආපසු අය කරගත නොහැකිව පවතින අතර ඒ සඳහා කිසිදු උකසක් / ආරක්ෂණයක් නොමැති වීම හේතුවෙන් බැංකුවට අලාභයක් විය හැකිව පවතී.

**බැංකුවට පවරාගත් දේපල**

වටිනාකම රු.මිලියන 393.72ක් වූ (හිඟ ණය පොලී සහ ප්‍රාග්ධනය) ණය මුදල්, 2023 දෙසැම්බර් 31 දින වන විට පවරාගත් දේපල යටතේ වර්ගීකරණය කර තිබූ අතර එයින් රු.මිලියන 29.58ක ණය මුදල්වලට අදාළව පවරාගත් දේපල වසර පහක් පුරා විකුණා හිඟ ණය අයකර ගැනීමෙන් තොරව පැවතිණි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**මූල්‍ය ප්‍රතිඵල**

2023 වර්ෂය සඳහා බැංකුව රු.බිලියන 1.1 ක බදු පෙර ලාභයක් සහ වසරේ ශුද්ධ පොලී ආදායම රු.බිලියන 16 ක් වාර්තා කර තිබුණි. 2023 වසර අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් රු.බිලියන 299.7 ක් දක්වා වර්ධනය වී තිබූ අතර එය 2022 වසරේ මුළු වත්කම් වටිනාකම වූ රු.බිලියන 285 ට සාපේක්ෂව සියයට 5 ක වැඩිවීමකි. 2023 වර්ෂය අවසානයට ගනුදෙනුකරුවන්ගේ තැන්පතු රු.බිලියන 226 ක් වූ අතර එය 2022 වසර අවසානයට සාපේක්ෂව රු. බිලියන 15 ක හෝ සියයට 8 ක වැඩිවීමකි. 2023 මූල්‍ය වර්ෂය අවසානයට පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 10.09 ක් වූ අතර මුළු ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 17.28 කි. තවද, අදියර 3 යටතේ ණය හානිකරණ අනුපාතය (අදියර 3 යටතේ ණය හානිකරණය අඩු කළ පසු) 2023 වසරේ 8.8 ක් වූ අතර සමස්ථයක් ලෙස බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා මෙම අනුපාතය 10.6 වේ. කොටස් මත ඉපයුම් අනුපාතය 2023 සඳහා 1.54 වන අතර හිමිකම් මත ප්‍රතිලාභය 4.83 වේ.

**සාමාන්‍යාධිකාරී තනතුර පුරප්පාඩුව පැවතීම**

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 26 වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා පත්කල යුතුය. 26 (4) වගන්තියට අනුව අවම වශයෙන් වසර 3 ක කාලයක් නිලතල දැරීමට හැකි සමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියකු ස්ථිර පදනමින් පත් කලයුතු වුවද, 2019 පෙබරවාරි 01 දින සිට 2024 ජූනි 06 දක්වා වර්ෂ 5 මාස 4 ක කාලය තුළදී පුද්ගලයින් 5 දෙනෙකු ස්ථිර හෝ වැඩබලන පදනම් මත 8 වාරයකදී කෙටිකාලීනව සාමාන්‍යාධිකාරී තනතුරට පත්කර තිබූ බව නිරීක්ෂණය විය. තවද 2024 ජූනි 06 දින වන විට පත් කර තිබූ නිලධාරියාද වැඩබලන පදනම් මත පත්කර තිබුණි. දිගු කාලීන පදනමින් සාමාන්‍යාධිකාරී තනතුරේ පුරප්පාඩු පැවතීම එදිනෙදා බැංකු කටයුතුවලට බලපාන බව නිරීක්ෂණය විය.

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**මෙහෙයුම් ප්‍රතිඵල**

2023 වර්ෂයේ ශුද්ධ මෙහෙයුම් ආදායම රු.මිලියන 306 ක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ ආදායම රු.මිලියන 1,688ක් විය. ඒ අනුව ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලයේ රු.මිලියන 1382ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී අදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 1,347 කින් පහළ යෑම හේතු වී තිබුණි.

**අක්‍රීය ණය අනුපාතිකය**

බැංකුවේ මුළු අක්‍රීය ණය අනුපාතිකය 2022 වසරේ සියයට 22.02 සිට 2023 වසරේ සියයට 25.99 දක්වා වර්ධනය වූ අතර සේවක අර්ථ සාධක අරමුදල් ණය ඉවත් කරන ලද අක්‍රීය ණය අනුපාතිකය 2022 වසරේ සියයට 10.31 සිට 2023 වසරේ සියයට 12.32 දක්වා වැඩි වී තිබුණි.

තවද, හානිකරණ ගාස්තු පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 195 කින් එනම් සියයට 53 කින් ඉහළ ගොස් තිබුණි.

## බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ණය සහ අත්තිකාරම්, සමස්ත වත්කම්වලින් සියයට 68.6 ක් විය. 2022 වසරේ දී වාර්තා කල සියයට 7.7ක වර්ධනයට සාපේක්ෂව, මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ 2023 වසර තුළ දී රු.බිලියන 1,160.4ක් දක්වා සියයට 3.2කින් (රුපියල් බිලියන 38.0) සංකෝචනය විය.

2022 වසර අවසානයේ දී පෙන්නුම් කළ සියයට 17.4ට සාපේක්ෂව, දළ 3 වන අදියරෙහි ණය අනුපාතය සියයට 17.8ක් දක්වා ඉහල යාමෙන් පිළිඹිබු වන පරිදි, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පහළ ගොස් ඇත.

ශුද්ධ පොලී ආදායමේ සහ පොලී නොවන ආදායමේ ඉහල යෑම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ බදු පසු ලාභය 2022 වසරේ පැවති රු.බිලියන 42.8 සිට 2023 වසරේ දී රු.බිලියන 47.7ක් දක්වා සියයට 11.3කින් ඉහළ ගියේය.

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ වගකීම්වලින් ප්‍රධාන කොටස තවදුරටත් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් නියෝජනය කළ අතර එය සියයට 55.3ක් විය. 2023 වසර තුළ දී තැන්පතු රු.බිලියන 935.3ක් දක්වා සියයට 8.2කින් (රුපියල් බිලියන 70.8) වර්ධනය වූ අතර, ණය ගැනීම් රු.බිලියන 264.6ක් දක්වා සියයට 17.9 කින් (රුපියල් බිලියන 57.8) පහත වැටුණි.

## මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඈන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

**මෙහෙයුම් ප්‍රතිඵලය**

2023 වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 20.8 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ අලාභය රු.මිලියන 495.6 ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය

ප්‍රතිඵලයේ රු. මිලියන 516.4 ක වැඩිදියුණු වීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල මුළු මෙහෙයුම් ආදායම රු.මිලියන 714.9 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. වර්ෂය අවසානයේදී සමාගමේ වත්කම් සියයට 7.9 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, සමාගමේ ශේෂ පත්‍රය 2023 දෙසැම්බර් අවසානය වන විට රු. බිලියන 33.7 ක් දක්වා වැඩි වී තිබුණි. බැංකු හා මූල්‍ය ආයතනවල ස්ථාපනය කර තිබූ තැන්පතු රු.මිලියන 470.9 කින් සහ රජයේ සුරැකුම්පත් හා ලැයිස්තුගත සමාගම්වල සිදු කර තිබූ මූල්‍ය ආයෝජන රු.මිලියන 7,873.8 කින් වැඩිවී තිබූ අතර, ණය සහ ලැබීම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 21.98 කින් අඩුවීම එසේ වත්කම් වැඩිවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම සියයට 8.2 කින් වැඩි වී තිබුණි.

**ප්‍රාග්ධන අනුපාතය**

2023 වර්ෂය අවසානයට සමාගමේ ස්ථර I ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත පිළිවෙලින් සියයට 13.60 ක් සහ සියයට 16.75 ක් වූ අතර , ඒ අනුව 2022 වර්ෂය අවසානයේ සියයට 12.01 ක් ලෙස පැවතුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවම නියාමන අවශ්‍යතාවයට වඩා පහල අගයක් ගන්නා ලද සමස්ත ප්‍රාග්ධන අනුපාතය සමාගම විසින් 2023 වර්ෂයේදී සිදු කළ ණයකර නිකුතුව මගින් සපයා ගන්නා ලද රු. මිලියන 622.83 හේතුවෙන් එම ප්‍රාග්ධන අවශ්‍යතාවය නිවැරදි කරගැනීමට කටයුතු කර තිබුණි.

**අක්‍රීය ණය**

2023 වර්ෂයේදී අයකරගත නොහැකි අක්‍රීය ණය 127ක ට අදාලව එකතුව රු.මිලියන 64ක් ලියා හැර තිබුණි.

# රක්ෂණ කටයුතු

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය රක්ෂණ සමාගම් හා ආයතන 29 ක් රක්ෂණ තැරැව්කරුවන් 80 ක් අලාභ ගැලපුම්කරුවන් 29 ක් හා ආසන්න වශයෙන් 45000 ක් පමණ වන රක්ෂණ නියෝජිතයන් ප්‍රමාණයකින් සමන්විත වේ. මෙම කර්මාන්තයට අදාල නියාමන ආයතනය ලෙස 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කටයුතු කරයි.

## විගණන නිරීක්ෂණ

### ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

**දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය**

රක්ෂණ කර්මාන්මාන්තයේ මුළු වටිනාකම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.1ක් පමණ වේ. එය කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් ගත් කල ඉතා පහල අගයක් බව නිරීක්ෂණය විය. මෙම තත්වය හඳුනා ගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**අනුමත නොවූ කාර්යසාධන දීමනා ගෙවීම**

කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගරයේ අනුමැතිය ලබානොගෙන 2010 වර්ෂයේ සිට වර්ෂයක් සඳහා එක් මූලික වැටුපක් කාර්යසාධන දිරි දීමනා ලෙස ගෙවා තිබූ අතර 2019 වර්ෂයේ සිට එය දළ වැටුපෙන් මාස එක හමාරක් ලෙස වෙනස් කර ගෙවා තිබුණි. තවද මෙම කාර්යසාධන දීමනා ගෙවීමට අදාල තාත්වික කාර්යසාධන ඇගයීමක්ද සිදු කර නොතිබුණි. 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගෙවන ලද මුළු කාර්යසාධන දිරි දිමනාවල එකතුව රු. මිලියන 60.5 ක් විය.

### ජාතික රක්ෂණභාර අරමුදල් මණ්ඩලය

**ලියාපදිංචි නොවූ රක්ෂණ තැරැව්කරුවෙකු වෙත ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් සිදු කිරීම.**

රක්ෂණය විධිමත් කිරීමේ පනතේ නියමය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකු රක්ෂණ මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තැරැව්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නෙකු නම් සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන්නේ නම් මිස රක්ෂණ තැරැව්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම හෝ එලෙස පෙනී සිටීම නොකල යුතු බව දන්වා තිබියදී එකී නීති ප්‍රකාරව ලියාපදිංචි නොවූ රක්ෂණ තැරැව්කරුවෙකු වෙත 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා රු. මිලියන 1,204 ක් ගෙවීම් කර තිබුණි.

**ප්‍රතිරක්ෂණ ආවරණයකින් තොරව ආයතනය පවත්වාගෙන යාම.**

රු. මිලියන 516 ක මුදලක් ගෙවා 2023 ජුලි 31 දින දක්වා මාස 18ක කාලයකට ප්‍රතිරක්ෂණය කිරීම සඳහා තෝරා ගත් තැරැව්කාර සමාගම විසින් ඒකපාර්ශවීයව 2022 අප්‍රේල් 21 දින ගිවිසුමෙන් ඉවත් වීම නිසා එදින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිරක්ෂණ ආවරණයකින් තොරව ආයතනය පවත්වා ගෙන යාම නිසා අරමුදල දැඩි අවදානම් තත්වයක පැවතුණි.

**ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික මුදල් නොගෙවීම.**

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සාමාන්‍යය රක්ෂණ සමාගම් වෙත ගෙවිය යුතු ලෙසට හඳුනාගෙන ලිපිගොනු වැඩ අවසන් කර ඇති රු. මිලියන 30 ක මුදල අදාල ආයතන වෙත නොගෙවීම හේතුවෙන් එම සමාගම් විසින් අරමුදලට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික මුදල් රු. මිලියන 2,390 ක මුදලක් 2022 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ මාස 24 ක කාලයක් රඳවා ගෙන තිබුණි. මේ නිසා අරමුදලට රු. මිලියන 901 ක් පොලී ආදායමක් අහිමි වී තිබුණි.

**ප්‍රතිරක්ෂණ කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොතිබීම.**

ලැබිය යුතු ප්‍රතිරක්ෂණ ශේෂ රු. මිලියන 2,415 සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ අලාභ සටහන් කිරීම සඳහා නිසි කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොතිබීම නිසා ප්‍රතිරක්ෂණ වාරික කාලීනව එකතු කිරීම සහ ප්‍රතිරක්ෂණ අලාභ ගෙවීම ගැටළු සහගත තත්වයක පැවතුණි.

**ප්‍රාථමික රක්ෂණ සමාගම්වලින් අයකර ගත යුතු වාරික මුදල් අයකර නොතිබීම.**

1989 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ හා 2008 මාර්තු 25 දිනැති ගැසට් නිවේදනය අනුව වැඩවර්ජන, කැරලි ගැසීම්, ජන කැලඹීම් හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා සිදුවන හානි රක්ෂණය සඳහා ප්‍රාථමික රක්ෂණ සමාගම් විසින් නිකුත් කරනු ලබන සියළුම රක්ෂණ ආවරණ මගින් ලබාගන්නා වාරික මුදල්වලින් සියයට 95ක් ජාතික රක්ෂණ භාර අරමුදලට අය කර ගත යුතු වේ. එහෙත් ජාතික රක්ෂණ භාර අරමුදල ඒ අනුව කටයුතු නොකර මොටර් රථ රක්ෂණයෙන් සියයට 12 ක් ද මොටර් නොවන රක්ෂණයෙන් සියයට 80 ක ප්‍රතිශතයක් පමණක් අරමුදලට අයකරගෙන තිබීම නිසා පසුගිය වර්ෂ 15 ක කාලය තුළ අරමුදලට අලාභයක් සිදුවී තිබුණි.

**ප්‍රතිරක්ෂණ කිරීමේදී සිදුකර තිබූ නීති විරෝධී ක්‍රියා නිසා රජයට අලාභ සිදුකර තිබීම**

2016 වර්ෂයේදී ස්වභාවික විපත් රක්ෂණය ආවරණය කිරීම සඳහා රජයේ අරමුදල් යටතේ රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. නමුත් අරමුදල් භාවිතා කර ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමේදී සිදු කර තිබූ නීති විරෝධී ක්‍රියා නිසා රජයට රු. මිලියන 4,400 ක අලාභයක් සිදුකර තිබුණි. එම හේතුවෙන් ප්‍රධාන විධායක නිලධාරි සහ සහකාර සාමාන්‍යාධිකාරි මුදල් යන අය සේවයෙන් ඉවත් කර තිබුණද, අරමුදලට සිදු වූ අලාභ අයකර ගැනීම සඳහා වගකිව යුතු අය නිශ්චය කිරීමට විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොතිබුණි.

**අධිභාර බද්දට යටත් නොවන නමුත් අධිභාර බදු ගෙවා තිබීම.**

මණ්ඩලය විසින් අධිභාර බදු ලෙස රු.මිලියන 1,196 ක් 2023 වර්ෂයේ දී වැඩවර්ජන කැරලි කෝලහාල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. නමුත් මණ්ඩලය 2022 අංක 14 දරන අධිභාර බදු පනත අනුව අධිභාර බද්දට යටත් නොවන නමුත් එම බදු සහන ලබා ගැනීමට ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

**සංස්ථාවේ සාමාන්‍ය රක්ෂණ අංශයේ සහ ජීවිත රක්ෂණ අංශයේ වෙළඳපල කොටස**


2022 වර්ෂයදී සාමාන්‍ය රක්ෂණ අංශයේ වෙළඳපල කොටස සියයට 15.9 ක් වූ අතර 2021 වසරට සාපේක්ෂව එය සියයට 15 කින් අඩු වී තිබුණි. 2022 වර්ෂය සඳහා ජීවිත රක්ෂණ අංශයේ වෙළඳපොළ කොටස සියයට 15.4 ක් වූ අතර එය 2021 වසරට සාපෙක්ෂව සියයට 12.5 කින් අඩු වී තිබුණි.

# ජාතික ආරක්ෂාව

ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 06 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 16 ක් විසින් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

| | |
|---|---|
| **කාර්යභාරයන්** | ජාතික ආරක්ෂාව තහවුරු කිරීම,රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්‍ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම. |
| | පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි පිළිබඳ කටයුතු. |
| | ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය සහ පශ්චාත් සේවා අධ්‍යාපනය ලබා දීම. |
| | ගලවා ගැනීමේ මෙහෙයුම් සහ වෙරළාරක්ෂක සේවය පරිපාලනය කිරීම. |
| | උදර්පනයට අදාල කටයුතු, අන්තරායකර ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම. |
| | කාලගුණය සහ දේශගුණය පිළිබඳ සේවා සැපයීම,නාය යෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම. |

2023 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තු මත ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා අමාත්‍යාංශය හා ආරක්ෂක අංශයට අදාල දෙපාර්තමේන්තු 05 ක් වෙත එකතුව රු.මිලියන 402,948 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 381,598 ක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.




| | ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා යුධ හමුදාව | ශ්‍රී ලංකා නාවිකහමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන | 26,852 | 224,588 | 73,913 | 58,073 | 19,077 | 445 | 402,948 |
| ශු.වියදම රු. මිලියන | 24,651 | 219,264 | 73,811 | 44,964 | 18,615 | 293 | 381,598 |
| ඉතිරිය රු. මිලියන | 2,201 | 5,324 | 102 | 13,108 | 462 | 152 | 21,349 |

රූප සටහන් අංක 2.18 : ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## විගණන නිරීක්ෂණ

### ආරක්ෂක අමාත්‍යාංශය

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව තිබුණු අතර 2023 වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු විසින් රු.මිලියන 837.5 ක් හා එ. ජ. ඩොලර් මිලියන 3.68 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 19 ක් ඉල්ලුම් කිරීම මත අසම්භාව්‍ය බැරකමක් ඇතිවී තිබුණි.

ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 876.84 ක් වූ ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගොඩනැගිලි 03ක ගෙබිම හා පැන්ට්‍රි මතුපිට ග්‍රැනයිට් ටයිල් සපයා සවි කිරීමේ කාර්යය, ප්‍රසම්පාදන කාර්යයන් 03 ක් ලෙස ඛණ්ඩනය කර ලංසු කැඳවා තිබුණු නමුත් එම කොන්ත්‍රාත් ත්‍රිත්වය එක් කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 ප්‍රකාරව ලංසුකරුගේ මූල්‍ය,

තාක්ෂණික, නිෂ්පාදන, කාර්යසාධන, ප්‍රමිතීන් පිළිබඳ පූර්ව සුදුසුකම් ඇගයීමට ලක්කළ යුතු වුවත් රු. මිලියන 927.66 ක්වූ කොන්ත්‍රාත් කාර්යයන් තුනක් එකවර පිරිනැමීමේදී ඉහත කරුණු පිළිබඳව විධිමත් ඇගයීමක් සිදුකර නොතිබුණු අතර අනුමත කොන්ත්‍රාත් කාලය මෙන් තුන් ගුණයකට අධික කාලය දීර්ඝ කිරීම් අවස්ථා 04ක් ලබාදී ඇතත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි.

ත්‍රිවිධ හමුදාවන්ට ආහාර සැපයීම පිළිබඳ ප්‍රසම්පාදනය

2023 සැපයුම් වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවේ කඳවුරුගත සාමාජිකයන් 151,429 ක් වෙනුවෙන් අමු හා වියළි ආහාර සැපයීම සඳහා රු. බිලියන 96 ක වැය ඇස්තමේන්තුවක් මත ලංසු පිරිනමා තිබුණි. ත්‍රිවිධ හමුදා විසින් මෙම ආහාර ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒකාකාර හා නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය . ඒ අනුව ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුද්ගලයකුගේ දෛනික සහල් අවශ්‍යතාවය එක් සහල් වර්ගයකින් ග්‍රෑම් 190ක් ලෙස සම්මතයක් පවත්වාගනු ලැබුවද ඇස්තමේන්තු සකස් කිරීමේදී ග්‍රෑම් 633ක් ලෙස ගණනය කර තිබුණු අතර එක් නාවික හමුදා සාමාජිකයෙකුගේ එක් දිනක ආහාර අවශ්‍යතාවය සහල් ,ධාන්‍ය, එළවළු, මස් ,මාළු සහ කරවල ඇතුළු ආහාර වර්ග 140 කින් කි.ග්‍රෑ. 27 යි ග්‍රෑම් 590 ක් බවට අතාත්වික හා අධි ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. අනුයාත පූර්ව වර්ෂ තුනෙහි ඇස්තමේන්තුගත පිරිවැය සහ සත්‍ය පිරිවැය හා සංසන්දනය කිරීමේදී සියයට 192 සිට සියයට 231ක් අතර ප්‍රමාණයකින් අධි ඇස්තමේන්තු ගත කර තිබුණු බව නිරීක්ෂණය විය. පූර්ව වර්ෂයන්හි තථ්‍ය පාරිභෝජනය පිලිබඳ සැලකිල්ලට ගෙන ආහාර පරිභෝජනය පිළිබඳ නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමෙ හැකියාව පැවතුනද ප්‍රසම්පාදන අස්ථිත්වය, ප්‍රසම්පාදන කමිටුව හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇස්තමේන්තුවේ පවත්නා මෙම දුර්වලතාවයන් හඳුනාගෙන නොතිබුණි.

වාර්ෂික ආහාර අවශ්‍යතාව අධි තක්සේරු කිරීමෙන් මුළු පිරිවැය අධි තක්සේරුවීම, ඒ මත කාර්ය සාධන ඇපකර වටිනාකම ඉහළ යාම ආදිය හේතුවෙන් කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට මෙම ප්‍රසම්පාදනය සඳහා සහභාගීවීමේ හැකියාව අවම වී තිබුණි. මේ හේතුවෙන් ප්‍රසම්පාදනයේ මූලික පරමාර්ථ වන තරගකාරීත්වය උපරිමවීම හා සමාන අවස්ථා ලබාදීම යන අරමුණු ඉටුකරගැනීම කෙරෙහි හා අධි ඇස්තමේන්තු මත ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කෙරෙහිද අහිතකර ලෙස බලපෑම් ඇතිකරන බව නිරීක්ෂණය විය.

ආපදා කළමනාකරණ කටයුතු

ආපදා සහන මෙහෙයුම් වැඩසටහන යටතේ ක්‍රියාත්මක නායයෑමෙන් නිවාස අහිමිවූ හා නායයෑමේ අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ

දිස්ත්‍රික්ක 3ක නිවාස 205 ක් රු.මිලියන 344.4 ක රජයේ මූල්‍ය ආධාර මත ඉදිකර තිබුණි. එසේ වුවද ජල මූලාශ්‍ර නොමැතිවීම හා නිවාස 82ක් සඳහා විදුලිය පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම නිවාස වල පදිංචි වී නොතිබුණි. තවද එකතුව රු.මිලියන 15.9 ක ප්‍රතිලාභ හිමිගත්වා තිබුණු ප්‍රතිලාභීන් 17 දෙනෙකු විසින් එම නිවාසවල සහ ඉඩම්වල හිමිකම අතහැරදමා තිබුණි.

ඉහත වැඩසටහන යටතේ රු.මිලියන 200.6 ක ප්‍රතිලාභ ලබාගත් දිස්ත්‍රික්ක 05ක ප්‍රතිලාභීන් 258 දෙනෙකු විසින් ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් ඉටුකිරිමකින් තොරව ඉදිකිරීම් කටයුතු අත්හැරදමා තිබුණි. එකතුව රු.මිලියන 82.7 ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 90 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් පමණක් ඉටුකර ඉදිකිරීම් කටයුතු අත්හැරදමා තිබුණි. තවද නිවසක් සහිත ඉඩමක් මිළදිගැනිම සඳහා එකතුව රු.මිලියන 9.6 ක ප්‍රතිලාභ ගෙවා තිබුණු පුද්ගලයන් 06 දෙනෙකු විසින් එම මුදල් භාවිතාකර ඉඩම් මිලදී ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශ්‍රී ලංකා ගුවන් හමුදාව "ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ" දැක්ම මූලිකව "ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනූන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම" යන මෙහෙවර උදෙසා ප්‍රධාන කාර්යයන් 5ක් ඉටු කරනු ලබයි. මෙම කාර්යභාර්ය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා පරිපාලන ව්‍යුහය කොළඹ ගුවන් හමුදා මූලස්ථානය ඇතුළු මූලික කඳවුරු 05 කින් යුතුව ක්‍රියාත්මක වේ.

**හිඟ ගුවන් යානා කුලී ආදායම්**

2023 වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන 02 කින් ගුවන් යානා කුලී ආදායම් එකතුව රු.මිලියන 12.7 ක් වර්ෂ 05 ක සිට 20 ක් අතර කාල පරාසයන් තුළ හිඟ හිටව පැවතුණි.

**රජයේ ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම**

මුදල් රෙගුලාසි 2(1) (ඇ) ප්‍රකාරව රජය සතු සියළුම ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුවේ. එසේ වුවත් මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරඟ සඳහා පුහුණු වීමට කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙහි ගුවන් පථය ලබාදීම වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂයේ උපයාගෙන තිබූ රු.මිලියන 1.4 ක් ගුවන් හමුදාව විසින් ඒකාබද්ධ අරමුදලට බැර කරනු වෙනුවට ව්‍යවස්ථාපිත නොවූ අරමුදලක් වන සේවා ආයතන අරමුදල වෙත බැර කර තිබුණි.

මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ඒකල ගුවන් හමුදා කඳවුර තුල ගොඩනැගිලි 05 ක බදු ආදායම රජයේ අදායමට ගැනීමට එක් ගිවිසුමක් හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලකට ආදායම්

ලබා ගැනීමට තවත් ගිවිසුමක් ලෙස එකම ගොඩනැගිල්ලට ගිවිසුම් දෙකක් වශයෙන් ගොඩනැගිලි 05ක් සඳහා ගිවිසුම් 10 ක් අත්සන් කර තිබුණි. මේ හේතුවෙන් එකතුව රු.මිලියන 2.04 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.

ගුවන් යානා අළුත්වැඩියා කටයුතු

2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අළුත්වැඩියාවන් සඳහා විදේශයන් වෙත යවන ලද අළුත්වැඩියා වටිනාකම එ. ජ. ඩොලර් 191,289.22 ක් වූ ගුවන් යානා අමතර කොටස් 27 ක් හා අගයන් වාර්තා නොවූ එහි සුන්බුන් අගය එකතුව එ. ජ. ඩොලර් 63,000 ක් වූ ගුවන් යානා අමතර කොටස් 32 ක් විදේශයන් වෙත යවා 2024 පෙබරවාරි 09 දින වන විට වර්ෂ 09 සිට 19 ක් දක්වා කාල පරාසයන් ගතවී තිබුණද එම ගුවන් යානා ගුවන් හමුදාව වෙත ආපසු ලැබී නොතිබුණි.

## ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

ඉඩම් පවරා නොගැනීම

හෙයියන්තුඩුව පිහිටි තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම භාවිතයට ගනිමින් පැවති අතර ඉඩමෙහි විධිමත් අයිතිය විද්‍යාලය විසින් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි.

## රණවිරු සේවා අධිකාරිය

අවිධිමත් දීමනා ගෙවීම

රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි සිට 2017 නොවැම්බර් දක්වා මාස 18ක කාලය තුල අවිධිමත් ලෙස ගෙවන ලද රු.මිලියන 4.9 ක මුදල 2023 වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

වෘත්තීමයභාවය විශ්වාසනීයත්වය හා ගෞරවනීයත්වය තුළින් දේශයේ ඒකීයත්වය, ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම ප්‍රධාන කාර්යය කරගත්, රටතුළ සාමකාමී පරිසරයක් නිර්මාණය කරමින් රාජ්‍යයේ ආරක්ෂාවට අසමසම දායකත්වයක් ලබාදෙමින් ජාතික ව්‍යවසන හා හදිසි තත්ත්වයන්ටද සහයෝගය ලබාදෙමින් කටයුතු කරන විශාලතම හමුදාව යුද්ධ හමුදාව වේ.

සාම සාධක රාජකාරි

සාම සාධක රාජකාරී සඳහා මාලි රාජ්‍ය තුළ 685 ක භට පිරිසක් ස්ථාපිත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුලදී මිලදී ගෙන තිබුණි. එහෙත් එකඟ වූ වාහන/උපකරණ හා අමතර කොටස් ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හා ඒවා සුදුසු තත්ත්වයේ නොමැති වීම නිසා එම රාජකාරී සඳහා එක් කණ්ඩායමක් පමණක් සහභාගි කරවීම හේතුවෙන් මිලදී ගත් එම ප්‍රවාහන හා අනෙකුත්

උපකරණ අතරින් එකතුව එ. ජ. ඩොලර් මිලියන 4.57 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ තොග යුධ හමුදාවට අයත් ගබඩාවල තබා තිබුණි. මේ හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලබාගත හැකිව තිබූ එ. ජ. ඩොලර් මිලියන 3.33 ක ආදායමක් අහිමිවී තිබුණි.

අනාර්ථික වියදම්

2020 හා 2021 වර්ෂවල ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපායමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා ආධුනික සෙබලුන් 11,307 ක් බඳවා ගැනීමට අපේක්ෂා කර තිබුණි. එහෙත් අදාල ආධුනිකයන් බඳවා නොගැනීම නිසා රු.මිලියන 271 ක් වැයකර මිලදී ගන්නා ලද රෙදිපිළි හා ඇඟලුම් වර්ග 47 ක් නිශ්කාර්යව ගබඩාවල පැවතුණි.

සැපයුම් ලබා ගැනිමට නොහැකි වීම

රු.මිලියන 872 ක ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් සැලසුම්වලට ඇතුළත් නොවීම, අක්මුදල් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබීම සහ ගිවිසුම් ගතවීමේ දුර්වලතා නිසා එම ප්‍රසම්පාදනයන් අවලංගු කර තිබුණි. යථෝක්ත සැපයුම් ලබා ගැනිමට නොහැකි වීමෙන් යුද්ධ හමුදාවේ ඉදිකිරීම් හා නවීකරණයන්වලට බාධා එල්ල වී තිබුණි.

ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රමාදය

2023 වර්ෂයේ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් සඳහා රු.මිලියන 202 ක් වැයකර ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය මිලදි ගෙන තිබුණි. පරිභෝජන ස්වභාවයේ වූ එම ඖෂධ සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නියමයන්ට අනුව පිරිවිතර සකස් කර නොතිබුණි. මේ නිසා යථෝක්ත සැපයුම් හා සේවා නිසි කලට සිදුකර ගැනීමට නොහැකි වීම නිසා රෝගීන්ට එම ඖෂධ පිටතින් මිලදි ගැනීමට සිදු වී තිබුණි.

යුද්ධ හමුදාවේ වැටුප් හා දීමනා ගෙවීමේ දත්ත පද්ධතිය

2019 වර්ෂයේ මොරටුව විශ්ව විද්‍යාලය මඟින් යුද්ධ හමුදාවේ වැටුප් හා දීමනා ගෙවීමේ දත්ත පද්ධතියේ සංවර්ධනය කළ යුතු අංශ පිළිබඳව නිගමන හා නිර්දේශ 18 ක් ලබා දී තිබූ අතරම 2004 වර්ෂයේ සිට යුද්ධ හමුදාව විසින් පවත්නා පද්ධතියේ දෝෂ 72 ක් ද හඳුනාගෙන තිබුණි. එහෙත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ අතර දෝෂ නිවැරදි කිරීමටද කටයුතු කර නොතිබුණි. මේ නිසා වැටුප් හා දීමනා අඩුවෙන් හා වැඩියෙන් ගෙවීම් මෙන්ම, විවිධ අවිධිමත් ගෙවීම්ද සිදු වී තිබුණු අතර, වාර්ෂිකව රු. බිලියන 140 ඉක්මවා සිදු කරන වැටුප් හා දීමනා ගෙවීම්වල නිවැරදිතාවය සම්බන්ධයෙන් දැඩි අවදානමක් පැවතුණි. තවද, වර්තමානයේ හමුදා සමාජිකයින්ට ලබා දෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ නියාමනය කිරීමට හැකි වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීමටද කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් වූ මුහුදේ පවා රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම, අවි ජාවාරම, මත්ද්‍රව්‍ය ජාවාරම නීති විරෝධි සංක්‍රමණිකයින්, අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම, සියළු වරායන් සඳහා ආරක්ෂාව සැපයීම ඇතුලු රටේ අනෙකුත් ආරක්ෂක සේවා සමග එක් වී ගොඩබිම් මෙහෙයුම් දියත්කර රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම ආදිය කාර්යභාරය වේ. ශ්‍රී ලංකා නාවික හමුදාව සමස්ත දිවයින නාවික විධාන 07කට බෙදා පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

අරමුදල් ආදායම් වියදම් ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3 හා 6 වගන්ති ප්‍රකාරව ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම්, ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් සහ ගිණුම් පරීක්ෂා කළ යුතු වුවද, නාවික හමුදාවේ මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, කෘෂි ව්‍යාපෘති, තල් මසුන් නැරඹීමේ ව්‍යාපෘති, නිවාඩු නිකේතන වැනි අරමුදල්වලට අදාල ආදායම් වියදම් සම්බන්ධ ගිණුම් වාර්තා හා ලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එම ආදායම්වලින් ඒකාබද්ධ අරමුදලට කළ යුතු බැර කිරීම් ප්‍රමාණය පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ අනුව කටයුතු කලද භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

අගය එකතු කිරීමේ බදුවලින් නිදහස් භාණ්ඩ සඳහා බදු ගෙවීම

විදේශීය මිලදී ගැනීම්වලදී අගය එකතු කිරීමේ බදුවලින් නිදහස් කර තිබූ භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත අගය එකතු කිරීමේ බදු ලෙස රු.මිලියන 2.33 ක් ගෙවා තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් ඇති වූ වහාම පරීක්ෂණයක් කළ යුතු වුවද මේ සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ආදායම්, සුභ සාධක අරමුදලට බැර කිරීම

මුදල් රෙගුලාසි 177(1) වගන්තිය ප්‍රකාරව එකතුකර ගන්නා රජයේ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවද, නාවික නිලධාරීන්ගේ හා නාවිකයන්ගේ සුභ සාධක කටයුතු සඳහා යොදවා තිබෙන සුඛෝපභෝගී බස් රථ 04 කින් හා වෑන් රථ 02 කින් නාවික හමුදාව 2022 හා 2023 වර්ෂයන්වලදී උපයා තිබූ රු. මිලියන 19.88 ක ආදායම නාවික හමුදාවේ සුභ සාධක අරමුදලට බැර කර තිබුණි. එම කාලපරිච්ඡේදයට අදාලව ඉන්ධන සඳහා රු. මිලියන 17.11 ක් ද අළුත්වැඩියා වියදම් සඳහා රු. මිලියන 4.49 ක් ද වශයෙන් රු.මිලියන 21.6 ක වියදමක් එම වාහන වෙනුවෙන් නාවික හමුදාව විසින් වැයකර තිබුණි.

ආදායම්, ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ හා නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ බාහිර පාර්ශවයන්ට සැපයූ සේවා වෙනුවෙන් ඉපයූ

ආදායමෙන් සියයට 40 ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට එකඟ වී තිබුණි. එහෙත් ඉපයූ මුලු ආදායම වූ රු. මිලියන 337.5 කින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට නියමිත වූ රු. මිලියන 135 ක් 2023 වර්ෂය අවසාන වන විටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

**අක්‍රිය යාත්‍රා අළුත්වැඩියාව පමාවීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නෞකා, බෝට්ටු ඇතුළු යාත්‍රාවලින් අක්වෙරළ නිරීක්ෂණ නෞකා 06 ක්, වේග ප්‍රහාරක නෞකා 03 ක්, වෙරළ ආරක්ෂක වේග ප්‍රහාරක යාත්‍රා 31 ක්, වේග ප්‍රහාරක මුර යාත්‍රා 11 ක්, වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා 08 ක් මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා 04 ක් වශයෙන් වූ නෞකා හා යාත්‍රා 63 ක් 2023 වර්ෂය අවසාන දිනට අක්‍රියව පැවතුණි. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා නෞකා, බෝට්ටු, යාත්‍රා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. මිලියන 38.14 ක් ඇස්තමේන්තුගත කර තිබුණ ද, ප්‍රතිපාදන රු.මිලියන 17.85 ක් පමණක් ලැබී තිබීමත්, ලද ප්‍රතිපාදනවලින් රු.මිලියන 12.73ක් පමණක් උපයෝජනය කර තිබීමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කිරීම සහ බලාත්මක සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම ,ජෛව විවිධත්ව කළමනාකරණය, ස්වභාවික හා මිනිසා විසින් කරනු ලබන ව්‍යවසනයන් කළමනාකරණය සහ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමත් සමුද්‍ර පරිසරය සුරක්ෂිත කිරීම තුළින් පරිසරයේ සමතුලිතතාවය පවත්වා ගැනීම සහ සමුද්‍ර දූෂණය වැළැක්වීම මෙහෙවරකොට ගත් කාර්යභාරයන් 12කින් දෙපාර්තමේන්තුව සමන්විත වී තිබුණි.

නව පනතක් සම්පාදනය නොකිරීම

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිච්චින්න කර නව පනතක් සම්පාදනය කිරීම සඳහා 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, 2023 වර්ෂය අවසාන වන විටත් නව පනත සම්පාදනය කිරීමට අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකාව වටා ඇති නාවික සැතපුම් 148,721 ක දුර ප්‍රමාණය ආවරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතුව නෞකා 04 ක හා යාත්‍රා 27 ක ඇණියක් පවතින අතර ඉන් 2023 වර්ෂයේ දී ක්‍රියාකාරී තත්ත්වයේ පැවති නෞකා හා යාත්‍රා ප්‍රමාණය 22 ක් විය. අක්‍රීය තත්ත්වයේ පවතින යාත්‍රා 09 න් යාත්‍රා 06 ක් අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම හා අවශ්‍ය අමතර කොටස් ලබා ගත නොහැකි වීම නිසා වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ප්‍රකාරව කැඩෙට් නිළධරයන්, නිලධරයන් සහ රජයේ නිලධරයන් සඳහා රාජ්‍ය ආරක්ෂාව සහ යුධ හමුදා කළමනාකරණය සඳහා අදාල වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ උපදෙස් සැපයීම සඳහා පිහිටුවා ඇත.

**මුද්‍රණාල ආදායම් සහ වියදම් ගිණුම්ගත නොකිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 99 වගන්තිය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියලුම ආදායම් සහ වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුලත් කළ යුතු වුවත් විශ්ව විද්‍යාල මුද්‍රණාලයේ 2023 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු.මිලියන 18.5 ක මුද්‍රණාල ආදායම හා රු.මිලියන 8.43 ක මුද්‍රණාල වියදම ගිණුම්ගත කර නොතිබුණි.

**මුද්‍රණාලය ස්වාධීන ව්‍යාපාර අංශයක් බවට පත් කිරීම**

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2023 මාර්තු 09 දින සිට මුද්‍රණාලය විශ්ව විද්‍යාලයෙන් වෙන් වූ ස්වාධීන ව්‍යාපාර අංශයක් බවට පත් කරන බව 2023 මාර්තු 27 දිනැති අංක 652 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මගින් දක්වා තිබුණි. එහෙත්, 2023 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ පුනරාවර්තන ප්‍රදාන මගින් මුද්‍රණාලයේ කාර්යමණ්ඩල නිලධාරීන් 14 දෙනෙකු සඳහා රු.මිලියන 7.37 ක වැටුප් ගෙවා තිබුණි. තවද විශ්වවිද්‍යාලය විසින් රු.මිලියන 2.96 ක් වැයකර මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන තිබුණු අතර විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ලක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යමින් තිබුණි. මෙම කරුණු අනුව මුද්‍රණාලය වෙනම ව්‍යාපාර ඒකකයක් ලෙස හඳුනා ගැනීම විගණනයේදී මත භේදාත්මක කරුණක් විය.

**වායු නළ පද්ධතිය ඌණ උපයෝජනය**

2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල රෝහලේ රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් එ. ජ. ඩොලර් 530,000 ක් වැය කරමින් වායු නල පද්ධතියක් ස්ථාපනය කර තිබුණි. මෙම පද්ධතිය අංශ (Stations) 56 ක් සම්බන්ධ කරමින් ස්ථාපනය කර තිබූ අතර, එයින් අංශ 52 ක් අතර පමණක් 2023 වර්ෂයේ ගමන්වාර සිදු කර තිබුණි. ඉන් ගමන්වාර 100 කට වඩා අඩුවෙන් සිදුකර කර තිබූ අංශ 25 ක් පැවති අතර ඒ අනුව ඌණ උපයෝජිත අංශ ප්‍රමාණය සියයට 44 ක් බව නිරීක්ෂණය විය. රෝහල පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීම නිසා ඇතැම් අංශ භාවිතයට නොගැනීමද මෙම වායු නළ පද්ධතිය ඌණ උපයෝජනයට හේතු වී තිබුණි.

| | |
|---|---|
| නිශ්කාර්ය වෛද්‍ය උපකරණ | විශ්ව විද්‍යාලයට අයත් රෝහලේ 2024 මැයි 31 දින වන විට වගකීම් කාලය ඉක්ම වූ රු.මිලියන 15.03 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 17 කට අයත් ඒකක 183 ක් ගබඩා තුල නිශ්කාර්යව පැවති අතර, එම අයිතම 2018, 2019 සහ 2021 වර්ෂවලදී ගබඩාවට ලැබී තිබුණි.<br>තවද, හෘද උරස් ඒකකයක් විශ්ව විද්‍යාලයට අයත් රෝහල තුළ ස්ථාපනය කිරීම සඳහා 2018, 2021, 2022 සහ 2023 යන වර්ෂවලදී රු.මිලියන 197.12 ක් වැය කර මිලදී ගෙන තිබූ අයිතම 6 කට අදාළව ඒකක 18 ක් විගණිත දින වන විටත් නිශ්කාර්යව ගබඩා තුල පැවති අතර, එයින් වටිනාකම රු.මිලියන 61.8 ක් වූ ඒකක 14 ක වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි. |
| කළමනාකරණ තොරතුරු පද්ධතිය | එ. ජ. ඩොලර් මිලියන 1.3 ක් වැය කරමින් රෝහලේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිම කිරීම අවස්ථා 2 කදී කාලය දීර්ඝ කිරීමෙන් පසු 2024 මැයි 28 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද 2024 ජුනි 11 දින වන විටත් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 68.5 ක් පමණක් වී තිබුණි. |
| බිල්පත් පියවීමේ ප්‍රමාදය හේතුවෙන් දඩ මුදල් ගෙවීම | 2023 වර්ෂයේ විශ්ව විද්‍යාලයට අයත් රෝහලේ විදුලි වියදම රු.මිලියන 540.71 ක් වූ අතර, ඇතැම් මාසවල බිල්පත් පියවීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 12.13 ක් දඩ මුදල් ලෙස ගෙවීමට සිදු වී තිබුණි. මෙය මූල්‍ය කළමනාකරණයේ දුර්වලතාවක් බව නිරීක්ෂණය විය. |
| රෝහල් වාට්ටු උපයෝජනයෙන් තොරව පැවතිම | 2023 වර්ෂය අවසන් වන විටද විශ්ව විද්‍යාලයට අයත් රෝහලේ වාට්ටු අංක 5A, 7A හා 7B සහ දැඩි සත්කාර ඒකක 02, 03 හා 04 යන අංශ උපයෝජනයෙන් තොරව පැවති අතර, ඒ තුල පැවති රු.මිලියන 210.19 ක් වටිනා වෛද්‍ය උපකරණද නිශ්කාර්යව පැවතුණි. |

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

විජයග්‍රහණයෙන් පසු රටේ ජාතික සංවර්ධන ක්‍රියාවළියට දායකවීමේ මෙහෙවර යටතේ ප්‍රධාන අරමුණු 7කින් යුක්තව දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණි.

| | |
|---|---|
| රජයට පියවිය යුතු මුදල් නොපියවීම | වැලිසර උප බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන විශේෂ සහල් ව්‍යාපෘතිය මගින් 2021, 2022 හා 2023 යන වර්ෂවලදී බලකා 07 කින් ලබාගත් වී, ධාන්‍ය වර්ග හා අනෙකුත් බලකා නිෂ්පාදනයන්ට අදාළව රු.මිලියන 62.76 ක මුදලක් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු වුවත්, 2024 පෙබරවාරි 13 දින වන විටත් එම මුදල් පියවා නොතිබූ අතර එම වටිනාකම් පියවීමට ප්‍රමාණවත් මුදල් හෝ සහල් තොගද, වැලිසර සහල් ව්‍යාපෘතිය සතුව නොතිබුණි. |

| | |
|---|---|
| කජු ගස් ඌණතාවය සම්බන්ධයෙන් කටයුතු නොකිරීම | පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතිය අක්කර 187 කින් සමන්විත වන අතර එයින් අක්කර 155 ක භූමි ප්‍රදේශයක් තුල කජු ගස් සිටුවා ඇති බව සඳහන් වුවද, එම භූමි ප්‍රදේශය නිවැරදි ලෙස මැන සිතියම් ගත කර නොතිබූ බැවින් වගා කර ඇති භූමි ප්‍රමාණයෙහි ආදායම් වියදම් ගණනය කිරීමේ නිරවද්‍යතාව තහවුරු නොවීය. එමෙන්ම මෙම ව්‍යාපෘතියේ කජු ගස් 8,787 ක් ඇති බව සඳහන් වුවද, වර්තමානය වන විට එහි පවතින්නේ කජු ගස් 3,682 ක් වීම හේතුවෙන් කජු ගස් 5,105 ක ඌණතාවයක් වූ අතර එම ඌණතාවය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. |
| කෘමිනාශක කල් ඉකුත් වීම | කජු වගාව සඳහා භාවිතා කරන මොස්පිලාන් ඇසිටමිප්‍රිඩ් (Mospilan Acetamiprid) නම් කෘමිනාශක ග්‍රෑම් 100 පැකට් 2,930 ක් 2022 හා 2023 වර්ෂවලදී මිල දී ගෙන තාවකාලික ගබඩාවේ අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම පැකට් සියල්ල 2023 ජූලි වන විට කල් ඉකුත් වීම හේතුවෙන් රජයට සිදු වී තිබූ අලාභය රු.මිලියන 3.12 කට ආසන්න විය. |
| හිඟ ණය ශේෂ | නිලධාරීන් 102 කගෙන් 2023 වර්ෂය ආරම්භයේ අයවීමට පැවති රු.මිලියන 14.9 ක් වූ ණය ශේෂ වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වී තිබීමෙන් එම ආරම්භක ණය ශේෂ එලෙසම වර්ෂය අවසානයේදී ද අත්තිකාරම් ශේෂ තුල ඇතුලත්ව තිබුණි. |

# ආපදා කලමනාකරණය

රටක කාලගුණ හා දේශගුණ තත්ත්ව එම රටේ ජනතාවයේ සෞඛ්‍ය තත්වය සහ රටේ නිෂ්පාදනයේ විචලනයන් කෙරෙහිද ප්‍රබල වශයෙන් බලපෑම් සිදු කරනු ලබයි. එමෙන්ම කාලගුණ හා දේශගුණ තත්ත්වවල විචලනයන් කල්තියා හඳුනා ගැනීම තුලින් ඒ සඳහා පැහැදිලි සැලසුම් පිළියෙළ කිරීම මගින් අනාගතයේ සිදුවීමට නියමිත ව්‍යසනයන්ගෙන් රට හා එහි ජීවත්වන පුරවැසියන් මුදවා ගැනීමට කටයුතු කල හැකිය.

**කාර්යභාරයන්**

රටේ ස්භාවික ආපදා අවදානම් කල්තබා හඳුනා ගැනීම, ආපදා වළක්වා ගැනීම, හානි අවම කිරීම හා හානිවුවන් නගා සිටුවීම කාර්යක්ෂම කිරීම සඳහා ආපදා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධීකරණය කරමින් ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම.

ආපදා තත්ත්වයන් පිළිබඳ නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන තාක්ෂණය සහ දැනුමෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සවිමත් කිරීම,

ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක්වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියළු තොරතුරු ඇතුලත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම

ආපදා කලමනාකරණ අංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 02ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. එම ආයතන විසින් සිය කාර්යභාරයන් ඉටුකිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

## විගණන නිරීක්ෂණ

### කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**විදේශාධාර මත ලද ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 2 ක් සවි නොකිරීම.**

ජපන් ආධාර යටතේ (JICA) 2008 වර්ෂයේදී ලැබී තිබූ රු. මිලියන 570 ක් වටිනා උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, වර්ෂාපතනය, සුළගේ වේගය හා දිශාව, පීඩනය, සූර්ය විකිරණ ප්‍රමාණය යන පරාමිතීන් මනිනු ලබන ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 න් පද්ධති 02 ක් 2023 වර්ෂය අවසානය වනවිටත් සවිකිරීමට යෝජිත ස්ථාන වූ ත්‍රිකුණාමලය හා මාලිබොඩ යන ස්ථානවල සවිකිරීමට කටයුතු කර නොතිබුණි. එම උපකරණ ඌණ උපයෝජිතව පැවති අතරම අදාල සේවාවන් ලබාගැනීමට තිබූ අවස්ථා මග හැරී තිබුණි.

**ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති උපයෝජනය හා නඩත්තුව**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ පද්ධති 35 න් 2023 දෙසැම්බර් 31 දින වන විට පද්ධති 21 ක් මගින් GPRS තාක්ෂණය යටතේ නියමිත පරිදි දත්ත ආයතනයට නොලැබෙමින් පැවති අතර පද්ධති 10 ක බැටරිවල ආයුකාලය අවසන් වීම නිසා අක්‍රීයව පැවතුණි. එසේම දිවයින පුරා සවිකර ඇති සාම්ප්‍රදායික වැසි මාපක 453න් 44 ක විධිමත් පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් අඛණ්ඩව දත්ත නොලැබෙන තත්වයක් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කර තිබූ ස්වයංක්‍රීය වර්ෂාමාන 122 කින් වර්ෂාමාන 52 ක් අක්‍රීය වී තිබුණු අතර නඩත්තු කටයුතු සිදු කර තිබුණේ වර්ෂාමාන 36 ක පමණි. හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හිදී ස්වයංක්‍රීය හා සාම්ප්‍රදායික ලෙස දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත් වන අතර මේ හේතුවෙන් පද්ධති ස්ථාපිත කිරීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

**ඩොප්ලර් රේඩාර් පද්ධති ස්ථාපනය නොකිරීම.**

ජපන් ආධාර යටතේ ලබා දීමට නියමිත ඩොප්ලර් රේඩාර් පද්ධති 2 ක් පුත්තලම හා පොතුවිල් කාලගුණ මධ්‍යස්ථානවල ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු. මිලියන 563.58 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, 2023 වර්ෂය අවසානය වන විට අදාල කටයුතු සඳහා රු. මිලියන 0.46ක් පමණක් වැයකර තිබුණි. රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවිය යුතු වූ නමුත්, වර්තමානයේ මිල ගණන් ඉහළයාම නිසා ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත යන්ත්‍ර ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවයක් පැවතින නමුත් වර්ෂ 15 කට ආසන්න කාලයක් එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර එම අනාවැකිවල නිවැරදිතාවය පිළිබඳ ගැටලු පවත්නා බවද නිරීක්ෂණය විය.

**කාලගුණ විද්‍යා පර්යේෂණ වලදී ආරක්ෂිත ක්‍රමවේද භාවිතා නොකිරීම**

රේඩියෝසොන්ඩ් හා නියමු බැලූන් පිරවීම සඳහා හයිඩ්‍රජන් වායුව යොදා ගන්නා අතර, කොළඹදී හයිඩ්‍රජන් වායුව නිපදවා ගැනීම සඳහා හයිඩ්‍රජන් ජෙනරේටරය යොදාගනු ලබයි. හයිඩ්‍රජන් නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා අනතුරුදායක වුවද, හයිඩ්‍රජන් නිෂ්පාදනයේදී හා බැලූම යවන අවස්ථාවලදී එම නිලධාරීන් ආරක්ෂිත ඇඳුම්වලින් යුක්ත නොවීම, හයිඩ්‍රජන් නිෂ්පාදනාගාරය ආසන්නයේ වාහන ගාල් කිරීම සහ වාහන නිතර පනගැන්වීම සිදු කිරීම වැනි අනාරක්ෂිත ක්‍රියාවන් සිදුවන බව කොළඹ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**රත්මලාන ගුවන්තොටුපල කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ නඩත්තු දුර්වලතා.**

ගුවන් ගමන් සඳහා අවශ්‍යවන කාලගුණික දත්ත සැපයීම අරමුණු කරගෙන රත්මලාන ගුවන්තොටුපල ආශ්‍රිතව පිහිටුවා තිබූ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ කාලගුණ දත්ත ලබා ගැනීම හා දත්ත සන්නිවේදනය සඳහා වූ උපකරණ නඩත්තුව යන කරුණු පිළිබඳව කරන ලද සෝදිසි පරීක්ෂාවේදී ලෝක කාලගුණ විද්‍යා සංගමයේ මාර්ගෝපදේශ අනුව උපකරණ කොටුව සකස් කර නොතිබීම, ක්ෂණික සුළං ප්‍රහාර, එහි වේගය හා දිශාව පරීක්ෂා කිරීමට පැවතිය යුතු Gust Recorder යන්ත්‍රය වසර ගණනාවක සිට ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතීම, කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාලයට සම්ප්‍රේෂණය වන පරිගණක පද්ධතිය 2019 වර්ෂයේ සිට අක්‍රියව පැවතීම, උපකරණ කොටුව තුළ උෂ්නත්වමාන ගබඩාකර ඇති පෙට්ටිවල කණු දිරාපත් වීම යන කරුණු නිරීක්ෂණය විය.

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර නොගැනීම.**

සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීමට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, එම පනත පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 31 ක් ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි.

**ව්‍යාජ ලෙස නිල මුද්‍රා සකස්කර වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය**

2022 පෙබරවාරි සිට 2023 මාර්තු දක්වා කාලය තුළ නිලධාරීන් 23 දෙනෙකු විසින් අවස්ථා 29 කදී ව්‍යාජ බිල්පත් හා ව්‍යාජ ලෙස නිල මුද්‍රා සකස්කර රු.මිලියන 1.82 ක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. මෙලෙස ව්‍යාජ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් හයදෙනෙකුගෙන් රු. මිලියන 0.44 ක මුදලක් ආපසු අයකර ගෙන තිබුණද කිසිදු නිලධාරියකු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

**මූලික බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව බඳවාගැනීම් සිදු කිරීම.**

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - AR 2 තනතුරට බඳවාගැනීම සඳහා සකස් කරන ලද මූලික බඳවාගැනීම් පටිපාටියට පරිබාහිරව වෙනත් පටිපාටියක්

සකස්කර සම්මුඛ පරීක්ෂණ 02 ක් පවත්වා බඳවාගැනීමේ පටිපාටියේ ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් එම තනතුර සඳහා නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් මූලික සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් නිලධාරීන් තිදෙනෙකුට උක්ත තනතුරට උසස්වීම් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

**ස්වයංක්‍රීය වර්ෂාමාන අක්‍රියව පැවතීම**

අවධානම් සහිත දිස්ත්‍රික්ක 14ක නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම සඳහා දත්ත ලබාගැනීමට ස්ථාපිත කර තිබූ ස්වයංක්‍රීය වර්ෂාමාන 330 කින් 251 ක පමණක් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයට සම්බන්ධ කර තිබුණි. ඉන් වර්ෂාමාන 198 කින් පමණක් දැනට තොරතුරු ලැබෙන බැවින් ඉතිරි වර්ෂාමාන අක්‍රීය තත්වයක හෝ තොරතුරු නොලැබෙන මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**නායයෑම් සමීක්ෂණ වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය**

**2023** වර්ෂය අවසානයට නායයෑම් අවදානම් සහිත දිස්ත්‍රික්ක 11 කින් නායයෑම් පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා ඉල්ලුම්පත් 5,388 ක් ලැබී තිබුණු අතර ඒ අතරින් තවදුරටත් නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 1,545ක් විය. පසුගිය වර්ෂයේ ලද ඉල්ලුම්පත්ද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 2,889 ක් වූ අතර එය වර්ෂය තුළ නිර්දේශ ලබාදීමට පැවති ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රතිශතයක් විය.

**අනුමැතියකින් තොරව ප්‍රතිපාදන ආයෝජනය**

විවිධ කාර්යයන් සඳහා මහා භාණ්ඩාගාරය සහ වෙනත් ආයතනවලින් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා ලැබී තිබූ රු.මිලියන 309.85 ක මුදල් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය**

සංවිධානය වෙත වායු විමෝචන අරමුදලින් පරිත්‍යාග ලෙස ලැබුණු රු.මිලියන 41.37 ක් වටිනා ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සවි කරන ලද ලොරි රථය වසර 4 ක කාලයක සිට ජංගම අධීක්ෂණ සේවය නොසපයා කොළඹ මහ නගර සභා පරිශ්‍රයට පමණක් සේවය සපයා තිබුණි.

**කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා**

සංවිධානයේ නව ගොඩනැගිල්ලේ කොටස් වෙන් කිරීමේ කාර්යයන් හා විදුලි හා ජලනල සවිකිරීම් යන කාර්යයන් සඳහා රු. මිලියන 179.94 ක් වූ වටිනාකමකට කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත

2017 හා 2019 වර්ෂ තුලදී කොන්ත්‍රාත් ලබාදී තිබුණි. අවස්ථා 08 කදී එම කොන්ත්‍රාත්තුවල දින දිර්ඝ කර තිබුනත් එම කාලය තුලදීත් එකී කොන්ත්‍රාත්තු නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වී තිබුණි. මෙම කොන්ත්‍රාත්තු වෙනුවෙන් කල වැඩ වටිනාකම වූ රු.මිලියන 164.07ක් සඳහා ගෙවීම් කර තිබුණද වැඩ ප්‍රමාද වූ කාලයට ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසියක් නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

ඉහත ගොඩනැගිල්ල සඳහා ගිනි ආරක්ෂණ සහ හඳුනාගැනීමේ පද්ධතියක් සපයා සවිකොට ස්ථාපනය කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැටි රහිතව රු.මිලියන 8.28 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම්ගතව තිබුණි. 2023 ජූලි 24 දින සිට ආරම්භ කර දින 30ක් ඇතුළත නිම කල යුතුව තිබුනද 2023 නොවැම්බර් 24 විගණන දිනය වන විට දින 120 ක් ගතව තිබුණත් කාර්ය නිමකර නොතිබුණි. කල වැඩ වටිනාකම වූ රු. මිලියන 6.81 ක් ගෙවීම් සිදුකර තිබුණද වැඩ ප්‍රමාද වූ කාලයට ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසියක් නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

**සංවිධානයේ කාර්යයන්ට පටහැනි කාර්යයන් සිදු කිරීම**

වර්ෂාමාන උපකරණ සකස්කිරීම, අලෙවිකිරීම හෝ නොමිලේ බෙදාහැරීම සංවිධානයේ කාර්යයක් නොවුවද රු. මිලියන 1.50 ක් වූ අමුද්‍රව්‍ය මිලදීගෙන සාම්ප්‍රදායික වර්ෂාමාන 480ක් සකස්කර තිබුණි. විගණිත දිනය වූ 2023 නොවැම්බර් 13 න් පසුව මෙයින් වර්ෂාමාන 370 ක් නොමිලේ බෙදා දී තිබූ අතර වර්ෂාමාන 110ක් රු. මිලියන 0.61 කට අලෙවි කර තිබුණි.කෙසේ වුවද, බදුල්ල, කෑගල්ල හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක 03 ක් ආවරණය වන පරිදි සංවිධානය විසින් සවිකර තිබුණු සාම්ප්‍රදායික වර්ෂාමාන 145 ක් වර්ෂ 02ක පමණ කාලයක සිට දත්ත ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**නිශ්කාර්ය වියදම්**

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8(ඊ) ඡේදය යටතේ මධ්‍යස්ථානයේ එක් කාර්යයක් ලෙස ආපදා අවදානම් අවම කිරීම සඳහා රු. මිලියන 4.2 ක මුදල් වැයකර පර්යේෂණ වාර්තාවක් සකස් කර තිබුණි. එම පර්යේෂණ වාර්තාවෙන් පිටපත් 100 ක් ලබාගෙන තිබුණද එය සංවර්ධන හෝ ක්‍රම සම්පාදනය කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

**පනත සඳහා අවශ්‍ය සංශෝධන සිදු නොකිරීම**

2012 ජූලි 05 දින අමාත්‍ය මණ්ඩලය විසින් අන්තර්කාලීන කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දී

තිබුණද ඒ අනුව 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතට අවශ්‍ය සංශෝධන සිදු කර නොතිබුණි.

**හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම**

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 04 වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ ප්‍රධානම කාර්යයක් වන ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට 2005 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කටයුතු කර නොතිබුණි.

**තනතුරු පුරප්පාඩු**

2023 වර්ෂය අවසානයට මධ්‍යස්ථානයේ තනතුරු 22 කට අයත් පුරප්පාඩු සංඛ්‍යාව 169 ක් වු අතර මෙම පුරප්පාඩුවලින් අත්‍යවශ්‍ය තනතුරු 05ක් සඳහා පුරප්පාඩු වසර ගණනාවක සිට පැවතීමෙන් මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාමට බාධාවක් වී තිබුණි.

**හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ**

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකවලට තාවකාලිකව ලබාදී තිබූ රු.මිලියන 4.32 ක් වටිනා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ 153 ක් ආපදා තත්ත්වයකදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි නැවත ගෙන්වා ගැනිමට කටයුතු කර නොතිබුණි.

**සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.**

ව්‍යසන කළමනාකරණ පනතේ 8 (ඈ) හා (ඉ) යටතේ ආපදා වැලැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම මධ්‍යස්ථානයේ වගකීම වුවත් 2023 වර්ෂයේදී රු. මිලියන 162 ක ප්‍රතිපාදනවලින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 88ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එයින් රු. මිලියන 44ක ව්‍යාපෘති 29ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**ආපදා අවම කිරීම සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති**

ආපදා අවම කිරීමේ අංශය විසින් දිස්ත්‍රික්ක 6 ක රු. මිලියන 233.9 ක් වැය කරමින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති 8 අසාර්ථක වී හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| ව්‍යාපෘතියේ නම | වියදම (රුපියල් මිලියන) | ඌන උපයෝජිත/ අතරමඟ නවතා දමා ඇත. |
|---|---|---|
| වගා ළිං තැනීම -මොණරාගල | 12 | ඌන උපයෝජිත |
| දේවහුව ව්‍යාපෘතිය-ගංවතුර හානි අලුත්වැඩියා කිරීම | 5 | ඌන උපයෝජිත |
| නාවලපිටිය නගරයේ ගංවතුර ආපදා අවම | 20 | ඌන උපයෝජිත |

| | | |
|---|---|---|
| කිරීමේ ව්‍යාපෘතිය | | |
| දඹුල්ල නගරයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය | 87 | අතරමඟ නවතා දමා ඇත |
| අකුරණ නගරයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය | 33 | අතරමඟ නවතා දමා ඇත |
| ගම්පහ දිස්ත්‍රික්කයේ සිදුකරන ලද ව්‍යාපෘති | 54 | ඌන උපයෝජිත |
| පන්නල පානීය නල ළිං 5 ක් ඉදිකිරීම | 4 | ඌන උපයෝජිත |
| ගංගාරගොල්ල ගමෙහි ගල්පෙරලීමේ අවදානම අවම කිරීම | 18.9 | අතරමඟ නවතා දමා ඇත |

**වගු අංක 2.11 : ආපදා අවම කිරීමේ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්**

හලාවත ප්‍රදේශයේ මයික්කුලම හා සවරාන ග්‍රාම නිළධාරි වසම්වල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවෘත කාණුව, තිඹිල්ල ඇල හා අවරංකුලිය ඇල හරහා අමුණු ඉදිනොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු නොවී තිබුණු බැවින් ව්‍යාපෘතිය සඳහා වැය කළ රුපියල් මිලියන 1.4 ක මුදලද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

# සන්නිවේදනය හා මාධ්‍යය



භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා “විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම” සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍යය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම යන විෂය පථයකින් සමන්විත වූ ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතන පහළොවකින් පහත සඳහන් කාර්යභාරය හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කළයුතුව පැවතුණි.

| | |
|---|---|
| **කාර්යභාරයන්** | මාධ්‍ය භාවිතය සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම වර්ධනය කිරීම, ජන මාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම, රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| | ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම,විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම. |
| | ප්‍රවෘත්ති , චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම,වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශනයන් ඇතුළු ප්‍රචාරක කටයුතු. |
| | නවතම තාක්ෂණය සහ කළමණාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුළින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම හා ලංකා මුද්දර කාර්යංශය පරිපාලනය කිරීම. |
| | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම. |
| | සමාජ මාධ්‍යය ඇතුළු නව මාධ්‍යය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තිමය දැනුම හා අවබෝධය ලබාදීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තිමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම. |

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු තුනක් වෙත එකතුව රු.මිලියන 28,140 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 24,024 ක් උපයෝජනය කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

### ජනමාධ්‍ය අමාත්‍යාංශය

**භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම**

ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කර තිබුණද ක්‍රියාත්මක නොකිරීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් මගින් තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ තුළින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, 2024 මැයි 31 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2023 වර්ෂය සඳහා රු.මිලියන 330 ක් ලැබී තිබුණ ද උපයෝජනය කර තිබුණේ රු.මිලියන 8 ක් පමණක් වූ අතර රු.මිලියන 322 ක් උපයෝජනය කර නොතිබුණි.

ඇස්තමේන්තු ගත ආදායම ලබාගෙන නොතිබීම

2023 වර්ෂයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද මගින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ ආදායම රු. මිලියන 300 ක් වුවද අමාත්‍යාංශය ලද ශුද්ධ ආදායම රු .මිලියන150 ක් වූයෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයකින් ආදායම අඩුවෙන් රැස්කර තිබුණි.

**ආදායම අහිමි වීම**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිකර තිබූ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ස්ථාපිත කර තිබෙන ගොඩනැගිල්ලේ පවතින සිනමාශාලාව 2024 ජනවාරි 23 දින දක්වාම ක්‍රියාකාරී තත්වයට පත් කර නොතිබුණි. මේ නිසා චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් කුඩා සිනමා ශාලාවකට රු.25,000 ක ගාස්තුවක් අදාළ පුද්ගලයින් විසින් ගෙවිය යුතුව තිබූ අතර 2023 ජනවාරි 1 දින සිට 2023 අගෝස්තු 31 දක්වා දේශීය හා විදේශීය චිත්‍රපට 146 ක් පමණ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම නිසා රු. මිලියන 3.6 ක ආදායමක් අහිමිව තිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

| | |
|---|---|
| **ප්‍රධාන කාර්යාලයේ,වත්කම් විකිණීම ගිණුම්ගත නොකිරීම** | ඒකල කරගහතැන්න විකාශනාගාරවල 2023 වර්ෂයේදී රු.මිලියන 44 ක වටිනාකමකට ස්ථාවර වත්කම් විකුණා තිබුණද වත්කම් විකිණීමට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශවල සිදු කර නොතිබුණි. |
| **සංස්ථාව සතු ගොඩනැගිලි විනාශවීමට ඉඩ හැරීම** | සංස්ථාව ආරම්භයේ සිට ඒකල විකාශනාගාරය ස්ථාපිතව අක්කර 15 ක් විශාල ඉඩම තුළ ගොඩනැගිලි 06 කට අධික ප්‍රමාණයක් විනාශ වීමට ඉඩ හැර තිබුණු අතර ගොඩනැගිලි විනාශකර යකඩ සොරකම් කර තිබුණි. මෙම ගොඩනැගිලි වල තිබූ යකඩ සහ ඇස්බැස්ටෝස් තහඩු වලට සිදුවී තිබූ හානිය රු.මිලියන 13.6 ක් ලෙස තක්සේරු කර තිබුණද ගොඩනැගිලිවලට සිදුවී තිබූ හානිය තක්සේරු කර නොතිබුණි. |
| **ගොඩනැගිලි බදු දීමේදී සිදු වූ දුර්වලතා** | වර්ග අඩි 20,000 ක් වූ පර්චස් 10 ක ගොඩනැගිල්ලක් බදු දීම සඳහා පුවත්පත් දැන්වීම පළ කර තිබුණද විගණනය විසින් සිදු කළ පරික්ෂාවේදී පර්චස් 123.6 ක් වූ ඉඩමක් ද ඒ තුළ අන්තර්ගත බව නිරීක්ෂණය විය. මෙම ගොඩනැගිල්ල පමණක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 2 කට තක්සේරු කර තිබුණි. ඒ අනුව පුද්ගලික සමාගමකට මාසික බදු කුලිය රු.මිලියන 3 සිට වසර 02 කට වරක් සියයට 7.5 බැගින් කුලිය ඉහළ නංවා 2042 වනවිට මාසික කුලිය රු.මිලියන 5.75 ක් වන ලෙස වසර 20 කට බදු දී තිබුණි. එහිදී රු.මිලියන 72 ක අත්තිකාරමක් ලබාගෙන තිබුණු අතර මෙහි ගිවිසුම පුද්ගලික සමාගම විසින් ඒකපාර්ශවිකව සකස්කර තිබුණු අතර එකතුකළ බදු වටිනාකම සංස්ථාවට දැරීමට සිදුව තිබීමෙන් 2023 වර්ෂය තුල රු.මිලියන 3.75ක් සංස්ථාවට පාඩු වී තිබුණි. |
| **ඌණ උපයෝජිත වත්කම්** | ගුණාත්මක තත්ත්වයෙන් යුතු චිත්‍රපට නිපදවීමේ අරමුණින් 1999 දෙසැම්බර් 10 වන දින පෞද්ගලික ආයතනයක් හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ප්‍රංශ ෆ්‍රෑන්ක් 9,150,000 කට සමාන රු.මිලියන 102.2 ක් ණය ආධාර ලබා දී තිබුණි. මෙම ණය ආධාර මගින් 2003 වර්ෂයේ රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලයක් ගෙන්වීමේදී නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2024 අප්‍රේල් 30 දින දක්වාම නිශ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රෝපකරණ කට්ටලය ස්ථාපිත කර තැබීම සඳහා දෙපාර්තමේන්තුවේ විශාල භූමි ප්‍රමාණයක් සහිත ගොඩනැගිල්ලක් භාවිතයට ගැනීමෙන් එම ගොඩනැගිල්ලද ඌන උපයෝජිත වත්කමක් බවට පත් වි තිබුණි. |

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

**සංස්ථාවේ මූල්‍ය තත්වය පිරිහීම**

සංස්ථාවේ 2023 වර්ෂයේ හා පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව සැලකීමේ දී 2018 වර්ෂයේ දී රු. මිලියන 188 ක ලාභයක් ලබා තිබුණද එයින් පසු අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර 2023 වර්ෂයේ අලාභය රු.මිලියන 343 ක් විය. 2022 වර්ෂයේ දී අධ්‍යාපන වැඩසටහන් තුළින් රු .මිලියන 29 ක ආදායමක් උපයා තිබුණද 2023 වර්ෂය තුල දී අධ්‍යාපන වැඩසටහන් සඳහා රු. මිලියන 12 ක වියදමක් සංස්ථාව විසින් දරා තිබුණු අතර එම වැඩසටහන් විකාශය තුළින් කිසිදු ගුවන් කාල ආදායමක් උපයා නොතිබුණි.

**ණය අයකර ගැනීම සඳහා පියවර නොගැනීම**

2023 වර්ෂයේ අවසන් දිනට සේවාදායක ණයගැති ශේෂය රු. මිලියන 432 ක් වූ අතර එයින් වසර 5 ඉක්මවූ ශේෂය රු. මිලියන 130 ක් හෙවත් මුලු ණයගැති ශේෂයෙන් සියයට 30 ක් වී තිබුණි.

## ඉන්ඩිපෙන්ඩන් ටෙලිවිෂන් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ්

**සමාගමේ මූල්‍ය තත්වය පිරිහීම**

සමාගමේ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ රු. මිලියන 3,198 ක් වූ අතර අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් එය 2023 වර්ෂයේදී රු. මිලියන 489 දක්වා අඩු වී තිබුණි.

**ණය අයකර ගැනීම සඳහා පියවර නොගැනීම**

2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ ලැබියයුතු ශේෂය රු. මිලියන 905 ක් වූ අතර ඉන් ස්වාධීන රූපවාහිනී සේවයෙහි වර්ෂ පහ ඉක්මවූ ශේෂය රු. මිලියන 222 ක් විය. වසන්තම් රූපවාහිනී නාලිකාවේ, ලක්හඬ ගුවන් විදුලි නාලිකාවේ හා වසන්තම් ගුවන්විදුලි නාලිකාවේ වසර ඉක්මවූ ශේෂයන් පිළිවෙළින් රු .මිලියන 46 ක්, රු .මිලියන 8.9 ක් හා රු. මිලියන 1.50ක් විය. රු. මිලියන 1.35ක වටිනාකමකින් යුතු ණයගැති ශේෂය සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු නමුත් ඉතිරි ශේෂ අයකර ගැනීම සඳහා සමාගම විසින් 2023 වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

## සැලසිනේ රූපවාහිනී ආයතනය / සැලසිනේ මීඩියා සොලූෂන්ස් පෞද්ගලික සමාගම

**සමාගමේ මූල්‍ය තත්වය පිරිහීම**

සැලසිනේ රූපවාහිනී ආයතනය නමින් පැවති මෙම ආයතනය 2023 ජූනි 20 දින සිට සැලසිනේ මීඩියා සොලූෂන්ස් පෞද්ගලික සමාගම ලෙස ලියාපදිංචි කර තිබුණි.

2023 වර්ෂයේ හා පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව සැලකීමේ දී සමාගම 2019 වර්ෂයේදී රු. මිලියන 8 ක ලාභයක් ලබා තිබුණු අතර එයින් පසුව අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර 2023 වර්ෂයේ සමස්ථ අලාභය රු.මිලියන 23.4 ක් වී තිබුණි.

**උපායමාර්ග සපුරා නොගැනීම**

2022 - 2026 සංයුක්ත සැලැස්ම අනුව 2023 වර්ෂයේ දී රු. මිලියන 903 ක ආදායමක් ඉලක්ක කළද උපයා තිබුණු ආදායම රු. මිලියන 233 ක් පමණක් වී තිබුණි.

## රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

**නියමිත පරිදි බදු නොගෙවීම නිසා දඩ ගෙවීමට සිදුවීම**

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ බදු පනතේ 09 වගන්තිය අනුව විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර ප්‍රමාද වී බදු ගෙවීම නිසා රු.මිලියන 8.83 ක අමතර දඩ මුදලක් සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි.

**ණයගැති ශේෂ අයකර නොගැනීම**

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.මිලියන 1,008 ක් වූ අතර ඉන් වසර 4 ත් – 11 ත් අතර කාල පරාසයක සිට පැවත එන ණයගැති ශේෂ රු.මිලියන177 ක් 2023 වර්ෂය අවසාන වන විටද අය කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

**නියමිත පරිදි ඇණවුම් භාර නොදීම නිසා ප්‍රමාද හා දඩ ගෙවීමට සිදුවීම**

2023 වර්ෂයේ සංස්ථාව නියමිත දිනට මුද්‍රණ ඇණවුම් භාර නොදීම නිසා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පෙළපොත් මුද්‍රණයට අදාලව රු. මිලියන 22 ක්, ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණයට අදාලව රු.මිලියන 5.6 ක් එකතු වටිනාකම රු.මිලියන 27.6 ක් ප්‍රමාද හා දඩ වශයෙන් අයකර ගෙන තිබුණි.

## රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව

**නිසි අනුමැතියකින් තොරව ගෙවීම**

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට කැලි පදනම මත දිමනා ගෙවීමට අනුමැතියක් ලබා ගෙන නොතිබියදී දෙපාර්තමේන්තුවේ විවිධ සැපයුම් වැය විෂය යටතේ රු. මිලියන 298 ක් කැලි පදනම මත දීමනා ලෙස ගෙවා තිබුණි.

**හිඟ ශේෂ අයකර නොගැනීම**

2023 දෙසැම්බර් 31 දිනට 2009 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා මුද්‍රණ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ආයතන 10 කින් අයවිය යුතු රු. මිලියන 81 ක් වූ හිඟ ආදායම් සහ 2010 සිට 2019 වර්ෂය දක්වා කාලය සඳහා අයවිය යුතු රු.මිලියන 162ක් වූ හිඟ ආදායම් 2023 වර්ෂය තුළදීද අයකර ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා පදනම

**බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය ලබා ගැනීම**

ශ්‍රී ලංකා පදනම විසින් පාඨමාලා පැවැත්වීම සඳහා අනුමත කර ගෙන ඇති ස්ථිර කථිකාචාර්ය තනතුරු 13 ක් වන අතර 2023 දෙසැම්බර් 31 දිනට බඳවාගෙන තිබූ සත්‍ය කථිකාචාර්යවරු සංඛ්‍යාව 09 ක් විය. නියැදි පරීක්ෂාවකදී 2023 වර්ෂයේ ආරම්භ කල පාඨමාලා 21 කින් පාඨමාලා 04 ක් සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය ලබාගෙන තිබූ අතර පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි. තවත් පාඨමාලා 12 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා ගොස් තිබුණි.

**ආයතනයට අවාසිදායක වන පරිදි තීරණ ගැනීම**

ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරෙහි සේවය කළ නිලධාරියා 2022 අගෝස්තු 28 දින සිට ස්ථිර විශ්‍රාම ගැන්වීම හේතුවෙන්, ශ්‍රී ලංකා පදනම එදිරිව එම නිලධාරියා විසින් නඩුවක් පවරා තිබුණි. 2023 ජූලි 07 දිනැති එම නඩුවේ තීන්දුව මගින් ඔහුට හිමි සියළු හිඟ වැටුප් ගෙවීමට සහ අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරෙහි නැවත සේවයේ පිහිටුවීමට නියෝග කර තිබුණි. ඒ අනුව පදනමේ සේවය නොකළ 2019 අප්‍රේල් සිට 2023 නොවැම්බර් මාසය දක්වා කාලයට අදාළව හිඟ වැටුප්, සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල්, සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් සහ නීතිඥ ගාස්තු ලෙස එකතුව රු.මිලියන 5.7 ක අතිරේක පිරිවැයක් දැරීමට පදනමට සිදුවී තිබුණි.

## සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

**එකඟ වූ කොන්දේසි ඉටු කර නොතිබියදී සේවකයන් විශ්‍රාම ගැන්වීම**

සමාගමේ සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමට අදාළ රු. මිලියන 300 ක රාජ්‍ය ප්‍රදානයක් ලබා ගැනීම සඳහා 2023 ජුනි මස 23 වන දින අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. ආයතනික සංයුක්ත සැලැස්ම, ක්‍රමෝපාය සැලැස්ම,ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික ව්‍යුහය, දෙපාර්තමේන්තු ව්‍යුහය, රඳවා ගන්නා තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ සැලසුම් සමාගම විසින් 2023 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වුවද රාජ්‍යය ප්‍රදාන ලබා ගෙන සේවකයන් විශ්‍රාම ගැන්වීමට අදාළ වියදම් සිදු කර තිබුණි.

**ප්‍රතිවෙළඳ ගිවිසුම් නොමැතිව දැන්වීම් පළ කිරීම**

2023 වර්ෂය තුළදී සමාගම විසින් ආයතන 03 ක් සමඟ වලංගු ප්‍රතිවෙළඳ ගිවිසුම් නොමැතිව වටිනාකම රු . මිලියන 21 ක දැන්වීම් පළ කර තිබුණු අතර ගිවිසුම් ඉදිරිපත් වූ එක් පෞද්ගලික මාධ්‍ය ආයතනයක් සමඟ ඇති කර ගත් ප්‍රතිවෙළඳ ගිවිසුමේ එකඟ වී තිබුණු වටිනාකම ඉක්මවා රු. මිලියන 1.8ක් වූ දැන්වීම් පළ කර තිබුණි.

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

**පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය නොකිරීම**

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් ලියාපදිංචි කිරීම් හා එසේ ලියාපදිංචි කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ද නියෝග සෑදීම සිදු කළ යුතු වුවද, තාක්ෂණික දියුණුවත් සමග e-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇතත්, එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

## තැපැල් දෙපාර්තමේන්තුව

**වත්කම් පරිපාලන දුර්වලතා**

දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට විධිමත්ව පවරා නොගත් තැපැල් කාර්යාල 449 ක් වූ අතර එදිනට දෙපාර්තමේන්තුව විසින් පවරාගෙන ඇති නමුත් තක්සේරු කර නොමැති ඉඩම් ප්‍රමාණය 68 ක් සහ ගොඩනැගිලි ප්‍රමාණය 63 ක් විය.

**අතිකාල දීමනා ගෙවීමේදී නිසි තහවුරු කිරීමක් සිදු කර නොගැනීම.**

සේවයට පැමිණීම හා පිටවීම වාර්තා කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර තිබියදී ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සලකා බැලීමකින් තොරව රු.මිලියන 57 ක අතිකාල දීමනා තැපැල් මූලස්ථානයේ සේවකයන් වෙත දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. තවද තැපැල් ප්‍රවාහන අංශයේ සහ පාලක (විමර්ශන) අංශයේ සේවකයන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර නොතිබුණු අතර ඒ හේතුවෙන් අතිකාල ගෙවීම්වලට නිවැරදිතාවය පරීක්ෂාවට පදනම් කරගත හැකි වූ ප්‍රබල සාක්ෂියක් විගණනයට අහිමි වී තිබුණි. මේ නිසා එම අංශවල සේවකයන් වෙත ගෙවා තිබුණු රු. මිලියන 4.3 ක් වූ අතිකාල දීමනාවල නිවැරදිතාවය තහවුරු කල නොහැකි විය.

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**නිෂ්කාර්ය වියදම් දැරීම**

හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම කොමිෂන් සභාව, කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව අදාළ කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින නිම කිරීමට නියමිතව තිබුණද ගිවිසුම අවසන් කරන විටද නිමකර තිබුණේ කොන්ත්‍රාත්තුවෙන් සියයට 33 ක් පමණි. ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුව අතරමග නතර කර තිබුණු අතර වැය කරන ලද රු. මිලියන 711 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. කෙසේ වුවද එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.

## කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම

**කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම Citrus Leisure PLC සමාගම සමඟ ව්‍යාපාරයක් සිදු කිරීම සඳහා ගිවිසුම්ගත වීම.**

කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම හා Citrus Leisure පී.එල්.සී සමාගම කුලුනේ 25, 26, 27 හා 28 මහල් සහ මුළුතැන්ගෙය Hospitality Industry ක්‍රමයට ව්‍යාපාරයක් සිදු කිරීම

සඳහා ගිවිසුම්ගත වී තිබුණි. එම ගිවිසුමේ 8.1 වගන්තිය ප්‍රකාරව දළ ආදායමින් සියයට 3.5 ක කළමනාකරණ ගාස්තුවක්ද, 8.2 වගන්තිය ප්‍රකාරව සෑම මසකම මුළු සේවක පිරිවැයට අමතරව එම පිරිවැයෙන් තවත් සියයට 10 ක ප්‍රමාණයක්ද නෙලුම් කුලුන සමාගම විසින් ගෙවිය යුතුව තිබුණි. ඊට අතිරේකව දළ මෙහෙයුම් ලාභයෙන් සියයට 20 ක් ගෙවිය යුතු විය. Citrus Leisure පී.එල්.සී සමාගමේ මෙහෙයුම් කටයුතු සිදුකළ 2023 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු. මිලියන 20.3 ක ශුද්ධ අලාභයක් ලබා තිබියදී එම කාලය සඳහා රු. මිලියන 1.4 ක කළමනාකරණ ගාස්තුවද රු. මිලියන 1.06 ක සේවක වැටුප් පිරිවැයක්ද කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වුවත් ඉහත පරිදි දළ මෙහෙයුම් අලාභයක් ලැබූ අවස්ථාවකදී ක්‍රියා කරන ආකාරය පිළිබඳව ගිවිසුමේ කොන්දේසි ඇතුළත් කර නොතිබුණි.

තවද සමාගම විසින් Citrus Leisure පී.එල්.සී සමාගමට මාසික ඉලක්ක ලබාදී නොතිබුණු අතර එහි කටයුතු අධීක්ෂණය සඳහා වගකිව යුතු නිලධාරියෙකු පත්කර නොතිබුණි. තවද ඉහත ගිවිසුමේ 3.1(a) වගන්තිය ප්‍රකාරව සේවකයින් තෝරාගැනීම, පත්කිරීම, සේවය අවසන් කිරීම හා වැටුප් තීරණය කිරීම සමාගම සමඟ සාකච්ඡා කර තීරණය කළ යුතු වුවත් Citrus Leisure පී.එල්.සී සමාගමේ සේවකයින් තෝරාගැනීම, පත්කිරීම, සේවය අවසන් කිරීම හා වැටුප් තීරණය කිරීමේ කිසිඳු කාර්යයකට සමාගම සම්බන්ධ වී නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් Citrus Leisure පී.එල්.සී සමාගමට අවශ්‍ය වන පරිදි සේවකයින් බඳවාගැනීම, වැටුප තීරණය කිරීම සිදුකළ හැකිව තිබුණු අතර එම සමාගම ඉදිරිපත් කරනු ලබන ඕනෑම වැටුප් හා දීමනාවක් සමාගම විසින් ගෙවීමට බැඳී තිබුණි. එසේම ජංගම දුරකථන ලබාදීම සඳහා රු.මිලියන 1.01 ක් ගෙවා තිබුණද ඒ සඳහා ගිවිසුමෙන් අනුමැතියක් ලැබී නොතිබුණි.

**කොළඹ නෙලුම් කුලුන පිළිබඳ භෞතික පරීක්ෂාව**

කුලුනේ නැරඹුම් මහලේ බිත්ති ආලේපවලට හානිවන ලෙස නම් හා විවිධ රූප ඇඳ තිබුණි. එම හානි අවම කිරීම සඳහා රු. මිලියන 1.08 ක් වැය කර නැරඹුම් පීටිකාවේ විදුලි ආලෝකයෙන් දැල්වෙන ප්ලාස්ටික් පුවරු සවි කළද ඒවාද නරඹන්නන් විසින් හානිකර තිබුණි. කුලුන තුළ ආරක්ෂක කැමරා පද්ධති සවිකර එහි ක්‍රියාකාරීත්වය සඳහා සේවකයින් යොදවා තිබුණද හානි කළ පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාවක් සේවයේ යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

# අධිකරණ හා බන්ධනාගාර කටයුතු

රටේ මහජනතාව විශ්වාස කරන නීති පද්ධතියක් හා සාධාරණ ශ්‍රී ලංකාවක් යන දැක්ම යටතේ ක්‍රියාත්මක අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු 08 කින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 11 කින් සමන්විත වන අතර, නීති විද්‍යාලය මෙම අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබෙන නමුත්, ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

**කාර්යභාරයන්**

සමාජ අවශ්‍යතාවන් හා ගෝලීය ප්‍රවනතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ කිරීම, නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම. අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු

රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු, රජය සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම, නීති කෙටුම්පත් කිරීම.

සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

කම්කරු විනිශ්චය සභා පරිපාලනය හා ඊට අදාළ අනෙකුත් කටයුතු සිවිල් ආරවුල් අධිකරණය දක්වා නොගොස් විසදා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම හා අතුරුදහන් වූවන් හා ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම, ගැටුම් හා අර්බුද හේතුවෙන් හා හානියට පත් වූ පුද්ගලයන් සඳහා හානිපූරණයට අදාළ කටයුතු.

රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයන් ප්‍රවර්ධනය කරලීම හා ඒ සඳහා ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම, ජාතීන් අතර සහයෝගීතාව හා සහජීවනය ප්‍රතිස්ථාපනය සංවාද වැඩසටහන් හඳුන්වාදී ක්‍රියාවට නැංවීම.


නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම, ජනතා පරමාධිපත්‍ය හා ජාතික ආරක්ෂාව තහවුරු වන බවට සහතික වෙමින් කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පියවර ගැනීම.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය, බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම, බන්ධනාගාරගත වූවන් පුනරුත්ථාපනය කිරීම.

ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු, අර්බුද හේතුවෙන් ශාරීරික හා මානසික ආබාධවලට ලක් වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ත්‍රස්තවාදී ක්‍රියාවන්හි යෙදී සිටි තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යයභාරය ඉටුකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 09 ක් වෙත එකතුව රු. මිලියන 35,179 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර ලබාදී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට එමගින් එකතුව රු. මිලියන 31,383 ක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත වගුවේ දැක්වේ.




| | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ පරිපාලනය | ණයසහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 7042 | 11241 | 77 | 12571 | 2086 | 155 | 375 | 22 | 1030 | 580 | 35179 |
| සත්‍ය වියදම | 5182 | 11005 | 61 | 11471 | 1795 | 138 | 342 | 16 | 842 | 531 | 31383 |
| ඉතිරි ප්‍රතිපාදනය | 1860 | 236 | 16 | 1100 | 291 | 17 | 33 | 6 | 188 | 49 | 3796 |

**රූප සටහන් අංක 2.19 : 2023 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 09 ක් වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන හා වියදම්**

**මූලාශ්‍රය: 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන**

ඉහත සඳහන් කාර්යයභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පින්ඩනය කර පහත දැක්වේ.

## විගණන නිරීක්ෂණ

### අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**කළමනාකරණ දුර්වලතා**

මහව දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට

අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2022 නොවැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 24.1 ක් වැයකර සියයට 60 ක භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබියදී ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. මේ නිසා වැයකරන ලද මුදල්වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, කුලියාපිටිය දිසා අධිකරණයේ කාර්යාලය හා ලේඛනාගාරයේ උසාවි ශාලාව සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් හා කල්පිටිය අධිකරණ කාර්යාල ගොඩනැගිල්ල සහ ලේඛනාගාරය ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම්ගතව රු. මිලියන 11.1 ක් හා රු. මිලියන 9.9 ක් බැගින් අත්තිකාරම් ගෙවා තිබුණු අතර, ව්‍යාපෘති පිළිවෙලින් 2022 හා 2023 වර්ෂවලදී අවසන් කිරීමට නියමිතව පැවතුණි. කුලියාපිටිය දිසා අධිකරණයේ ඉදිකිරීම් 2022 වර්ෂයේ ආරම්භ කිරීමට නොහැකි වූ බැවින් ද, කල්පිටිය අධිකරණයේ ඉදිකිරීම් සැලසුම් වෙනස්වීම හේතුවෙන් ද නතර කර තිබූ අතර, ව්‍යාපෘති වෙනුවෙන් ලබා දී තිබුණු අත්තිකාරම් පෞද්ගලික ආයතනය විසින් මාස 15 ක් හා මාස 18 ක කාලයක් නිෂ්කාර්යව තබාගැනීමෙන් අනතුරුව පිළිවෙලින් 2023 මාර්තු හා අගෝස්තු මාසවලදී අමාත්‍යාංශය වෙත ගෙවා තිබුණි.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගැනීම**

දිවයිනේ පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ඉතාම අවම මට්ටමක පවතින අවස්ථාවකදී වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය මූලික කරගෙන පවත්වාගෙන යන ජාතික පාසල සඳහා ලබාදී ඇති මානව හා භෞතික සම්පත්වලට සාපේක්ෂව ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැතිවීම හා අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ද වඩාත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතිය මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.


**අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දින 31 ක් තුළ වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් අවස්ථා 233 කදී නිලධාරීන්ගේ නිවාස පරිශ්‍රයන් තුළ සේවයේ යොදවා තිබූ අතර, බන්ධනාගාර නියාමක නිලධාරීන්ගේ මිනිස් දින 234 ක කාලයක් ද ඒ සඳහා වැයකර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ නිවාස පරිශ්‍රයන් වෙත සිරකරුවන් රැගෙන යාම සඳහා අවස්ථා 62 කදී බන්ධනාගාර මූලස්ථානයේ සංචිත වාහන 09 ක් කිලෝ මීටර් 372 ක් ධාවනය කර තිබුණි. තවද, 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 මගින් අතිකාල වියදම් ද දැඩි සේ පාලනය කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරනය කර තිබුණ ද, 2023 වර්ෂයේ අතිකාල හා නිවාඩු දීමනා වශයෙන් දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 982 ක් වැයකර තිබුණු අතර, එය 2022 වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 106 ක වැඩි වීමක් විය.

**බන්ධනාගාර ඉඩ පහසුකම්**

පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුගතව රැඳවියන්ගේ මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු වුවත්, 2023 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාව අනුව බන්ධනාගාර ආයතන 05 ක සිර වාට්ටු 62 ක රැඳවිය යුතු රැඳවියන් සංඛ්‍යාවට වඩා වැඩිපුර රැඳවියන් 2,601 දෙනෙකු රඳවා තිබුණු අතර, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ වාට්ටු 12 ක රැඳවිය යුතු සංඛ්‍යාවට වඩා අඩුවෙන් රැඳවියන් 127 දෙනෙකු රඳවා තිබුණි.

2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිටි රැඳවියන් ප්‍රමාණය පහත පරිදි විය.




**රූප සටහන් අංක 2.20: 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිටි රැඳවියන් ප්‍රමාණය**

**මූලාශ්‍රය - 2024 වර්ෂයේ සංඛ්‍යා ලේඛන වාර්තාව බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**බන්ධනාගාරවල තදබදය සඳහා හේතු**

බන්ධනාගාරවල පවතින අසාමාන්‍ය තදබදයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි නිසා බන්ධනාගාරගත කිරීම් ප්‍රධාන හේතුවක් වී තිබූ අතර, ඒ සම්බන්ධ රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් නිසා කවර ආකාරයකින් හෝ අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට ඔවුන් උත්සාහ කරනු ලබන අතර, එවැනි තත්ත්වයන් වැලැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවීම නිසා බන්ධනාගාරයේ ප්‍රධාන අරමුණු කරා ළඟාවීමට මෙන්ම බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව

හා ක්‍රියාකාරීත්වයට බාධාවක් වී තිබුණි. මේ සම්බන්ධව මීගමුව හා කළුතර බන්ධනාගර තුළ සිදුකළ භෞතික පරීක්ෂාවේදී මීගමුව බන්ධනාගාරයේ 2023 අගෝස්තු 27 වන දිනට මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 2,225 න් සියයට 65 ක් එනම් 1,442 ක් ද, කළුතර බන්ධනාගාරයේ 2023 සැප්තැම්බර් 19 දිනට රඳවා සිටින මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 1,275 න් සියයට 69 ක් එනම් 885 ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ වන රැඳවියන් විය.

## බන්ධනාගාර තුල පවතින තදබදය කළමනාකරණය පිලිබඳව සිදුකරන ලද කාර්යසාධන විගණන වාර්තාවේ නිරීක්ෂණ

**මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ වන රැඳවියන්**

මත්ද්‍රව්‍ය වැරදි වැඩිවීම රටේ අනෙකුත් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමට සෘජුවම බලපායි. ලංකාවේ 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර රැඳවියන් සංඛ්‍යාව 26,176 ක් වූ අතර ඉන් සියයට 53 කට අධික පිරිසක් එනම් 13,794 ක් මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ වන රැඳවියන් විය. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් රැඳවියන් 4,406 දෙනෙකු සිරකරුවන් වන අතර 9,388 දෙනෙකු සැකකරුවන් වේ.

**වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත ස්ථාපනය**

වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියට අදාල සැලසුම් හා නිර්මාණ කටයුතු, අභ්‍යන්තර මාර්ග, ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සියයට 30 ක් පමණ නිම කර ඇත. කෙසේ නමුත් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි.

**සනීපාරක්ෂක පහසුකම්**

බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රැඳවියන් ප්‍රමාණය වැඩිවෙත්ම රැඳවියන් හට ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක පහසුකම් ලබා දීම දුෂ්කර වේ. 2023 අප්‍රේල් 30 දින වන විට බන්ධනාගාර 27 ක වැසිකිළි 187 ක හිඟයක් පැවති අතර, දැනට තිබෙන වැසිකිලිවලින්ද 287 ක් අළුත්වැඩියා කල යුතු තත්ත්වයේ පැවතුණි.

**රස පරීක්ෂණ වාර්තා ඉදිරිපත් වීමේ ප්‍රමාදය**

අධිකරණය මඟින් බන්ධනාගාර ගත කර ඇති සැකකරුවන්ට අදාලව පොලීසිය විසින් රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාල රස පරීක්ෂණ වාර්තා මාස 12 ක් නොඉක්මවන කාල සීමාවක් තුල ඉදිරිපත් කල යුතු වුවත් මෙම රස පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොවීම නිසා 2022 දෙසැම්බර් 31 වන දිනට රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් සංඛ්‍යාව 5,676 දෙනෙකු විය.

**අභියාචනා ඉදිරිපත් කොට අවසන් තීරණ අපේක්ෂිතව සිටි රැඳවියන්**

රැඳවියන් විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනා සම්බන්ධව අධිකරණ ක්‍රියාවලියේ විවිධ හේතූන් මත විභාගයට නොගැනීම, ප්‍රමාද වී විභාගයට ගැනීම හා අවසන් නොවීම යන කරුණු හේතුවෙන් එය සාමාන්‍ය පරිපාලනයෙන් බැහැරව පවතින කරුණකි. 2022 දෙසැම්බර් 31 දිනට අභියාචනා ඉදිරිපත් කොට අවසන් තීරණ ලබා ගැනීමට සිටි බන්ධනාගාරගතව සිටි රැඳවියන් සංඛ්‍යාව 301 ක් විය.

**සිරකරු ශ්‍රමය පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල යෙදවීම**

බන්ධනාගාර තදබදය ඉහල යාමත් සමඟ රැඳවියන් ප්‍රමාණය වැඩිවීම නිසා සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට තිබෙන භෞතික හා මානව සම්පත් හිඟතාවය මත සිරකරු ශ්‍රමය පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල යෙදවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 මැයි 14 දිනැති අංක 20/0792/207/025 යටතේ අනුමැතිය ලබී තිබුණි. නමුත් පෞද්ගලික සමාගම්වල සේවයේ යෙද වූ සිරකරුවන්ට ඒ සඳහා අදාල ක්ෂේත්‍රයේ මාස 03 ක පුහුණුවක්, වෘත්තීය මට්ටමේ සහතිකයක් (NVQ) ලබා දීමත්, විදේශීය රැකියා සඳහා විදේශීය භාෂා පුහුණුවක් ලබා දීමත් සිදු කර නොතිබුණි.

**රැඳවියන් පුනරුත්ථාපනය**

කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම බන්ධනාගාරයේ ප්‍රධාන කාර්යයන් අතරින් එකකි. නමුත් බන්ධනාගාර තදබදය හමුවේ රැඳවියන් පුනරුත්ථාපනයේදී ගැටළු මතු වේ.

## නීතිපති දෙපාර්තමේන්තුව

**හිඟ ආදායම් අයකිරීමේ ප්‍රමාදය**

මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ ආදායම රු. මිලියන 324 ක් වූ අතර එම හිඟ ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු. මිලියන 105 ක ශේෂයක් ද විය.

## රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

2023 වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 12,189 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, 2023 වර්ෂයේදී තවත් නඩු 58,886 ක් ලැබී තිබුණි. මෙයින් 2023 වර්ෂය තුළදී අවසන් කළ නඩු සංඛ්‍යාව 53,253 ක් වූ අතර, වර්ෂය අවසානයේදී විශ්ලේෂණය කර

වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 17,822 ක් ඉතිරි වී තිබුණි. එය විශ්ලේෂණ කර වාර්තා නිකුත් කිරීම සඳහා තිබූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 25 ක් බව නිරීක්ෂණය විය.

**කළමනාකරණ දුර්වලතා**

වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් එම නිලධාරිනියන් දෙදෙනාගෙන් අයකර ගත යුතු ව තිබූ රු. මිලියන 2.3 ක මුළු දණ්ඩන මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## අධිකරණ අමාත්‍යාංශයට සම්බන්ධ අනෙකුත් ආයතන

### උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

**අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් නොවීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) ප්‍රකාරව හා 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන එම දෙපාර්තමේන්තුවේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, මෙම ආයතනයෙහි අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත් කර නොතිබුණි.

### හානිපූරණය සඳහා වන කාර්යාලය

**වන්දි ඉල්ලුම් ලිපිගොනු විස්තර ඇතුළත් ලේඛනයක් නොවීම**

වන්දි ගෙවීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව නිවැරදිව තහවුරු කරගැනීම සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ ලිපිගොනු විස්තර ඇතුළත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය ද එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලය අපොහොසත් විය. 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් වන්දි ගෙවීමට ඇති ලිපිගොනු 8,626 ක් පවතින බව කාර්යාලය විසින් දන්වා තිබුණ ද, ලිපිගොනු කුමන කාලපරිච්ඡේදයක සිට වන්දි අයදුම් කළ අයදුම්කරුවන්ගෙන් සමන්විත වන්නේ ද යන්න පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වූ අතර, මින් ලිපිගොනු 4,917 කට අදාළ ව රු. මිලියන 1,802 ක මුදලක් වන්දි ගෙවීමට නියමිතව තිබුණ ද, ඉතිරි ලිපිගොනු 3,709 ක ප්‍රමාණයට අදාළව වන්දි ගෙවීමට ඇති මුදල තක්සේරුකර නොතිබුණි.

# සෞඛ්‍යය

දේශයේ ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ දැක්මකින් යුතුව ක්‍රියාත්මක වන, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය

මහජන සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම

අන්තර් ජාතික නිරෝධායන හා සනීපාරක්ෂණයට අදාල නීතිරීති ක්‍රියාත්මක කිරීම

පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය

ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය

වසංගත, බෝවන හා බෝ නොවන රෝග තත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම

පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාල වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම

වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන් පිළිබඳ කටයුතු සාමාන්‍ය සනීපාරක්ෂණය

ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම

සියලුම රෝහල් හා රෝහල් සේවකයින් පරිපාලනය (පළාත් සභා යටතේ ඇති රෝහල් හැර)

පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය සහ අනෙකුත් උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන හා සම්බන්ධීකරණය

ජාතික රුධිර පාරවිලයන සේවාවන් පිළිබඳ කටයුතු

ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතු

ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාල පරිපාලනය හා පිරිස් කළමනාකරණය

වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇති කිරීම

සෞඛ්‍ය අංශයට අදාල පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම

ජාතික සෞඛ්‍ය රක්‍ෂණ වැඩසටහන් පිළිබඳ කටයුතු

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට රු. මිලියන 377,029 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 319,318 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

| අමාත්‍යාංශ වියදම | | වර්ෂය | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 134,490 | 211,148 | 312,526 |
| මූලධන - | 42,371 | 45,438 | 64,503 |
| **මුළු ශුද්ධ ප්‍රතිපාදනය** | **176,861** | **256,586** | **377,029** |
| ප්‍රතිපාදන උපයෝජනය - පුනරාවර්තන | 121,632 | 207,456 | 293,254 |
| මූලධන වියදම | 33,144 | 33,396 | 26,064 |
| **මුළු ප්‍රතිපාදන උපයෝජනය** | **154,776** | **240,852** | **319,318** |
| ඉතිරිය - පුනරාවර්තන | 12,858 | 3,692 | 19,272 |
| - මූලධන | 9,227 | 12,042 | 38,439 |
| **මුළු ඉතිරිය** | **22,085** | **15,734** | **57,711** |

වගු අංක 2.12 : සෞඛ්‍ය අමාත්‍යාංශය -2021,2022 හා 2023 වර්ෂවල ප්‍රතිපාදන හා උපයෝජනය
මූලාශ්‍රය- සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### සෞඛ්‍ය අමාත්‍යාංශය

**ජාතික සෞඛ්‍ය උපාය මාර්ගික මහා සැලැස්ම**

ජාතික සෞඛ්‍ය උපායමාර්ගික මහා සැලැස්ම 2016-2025 ට අනුව සෞඛ්‍ය පරිපාලන හා සෞඛ්‍ය මානව සම්පත පිළිබඳ තේමා මූලික අංශ 2 හි හඳුනාගත් සෞඛ්‍ය මානව සම්පත් ගැටළු ලෙස අවම සේවක සංඛ්‍යාව හා සම්මතයන් (Norms) ප්‍රමිතිගත නිර්ණායක අනුව (සේවා ඉල්ලුම/ වැඩ ප්‍රමාණය/ ජන විකාශ, භූගෝලීය හා භෞමික සාධක /ජාත්‍යන්තර ප්‍රමිතීන් ආදිය) සංශෝධනය විය යුතු බව දක්වා තිබුණි. මෙම ගැටළු සඳහා යෝජිත උපායන් ලෙස සෞඛ්‍ය මානව සම්පත් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම කළයුතු (සැලසුම් කිරීම/ බඳවා ගැනීම/පුහුණුව/ යෙදවීම/ වෘත්තීය සංවර්ධනය) දක්වා තිබුණි. ඒ අනුව මානව සම්පත් උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීමට

2023 වර්ෂය තුළ සැලසුම් කළද තෙවන කෙටුම්පත් වාර්තාව පිළියෙල කර විශේෂඥ අදහස් ලබාගැනීම සඳහා අදාළ පාර්ශවයන්ට හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අදහස් ලබා ගැනීමට යොමු කර තිබුණ නමුත් වර්ෂය අවසන් වන විටත් අවසන් වාර්තාව සකසා නොතිබුණි.

**විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

අනායාචිත ව්‍යාපෘති යෝජනාවකට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, චීන සමාගමක් සහ මැලේසියානු සමාගමක් අතර 2019 ඔක්තෝබර් 02 දින අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධතියක් (PACS/RIS) රෝහල් 20 ක් තුළ ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් කිසිඳු ශක්‍යතා අධ්‍යයනයක්, පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.තවද, එකී රෝහල් තෝරාගත් පදනමක්ද විගණනයට ඉදිරිපත් නොවුණි.

යෝජිත රෝහල් 20 තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය එ. ජ. ඩොලර් මිලියන 33.25 ක්වූ අතර එම මුදල එ. ජ. ඩොලර් මිලියන 1.31 ක් වූ පොළිය සමඟ වර්ෂ 11 ක් තුළ ගෙවිය යුතු විය. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස රෝහල් 05 ක පද්ධතිය ස්ථාපිත කිරීම මාස 03 ක් ඇතුළත අවසන් කිරීමටත් ඉතිරි රෝහල් 15 ක පද්ධතිය ස්ථාපිත කිරීම අවුරුදු 02 ක් තුළ නිම කිරීමටත් එකඟ වී තිබුණද ව්‍යාපෘතිය නියමිත කාල රාමුව ඇතුළත ක්‍රියාත්මක කර නොතිබුණි. එසේවුවද, යෝජිත කාලරාමුව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත ණය වාරික ගෙවීම් සඳහා එකඟ වූ කාලරාමුව, වාරික මුදල හා පොළිය ඇතුළත් උපලේඛනය සංශෝධනය කර ගිවිසුම සංශෝධනය කළ යුතුව තිබුණද වගකිව යුතු පාර්ශවයන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2022 ජූලි මස පුද්ගලයින් 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් රෝහල් 05කට අදාළව මෙම ව්‍යාපෘතියේ පළමු වාරිකය ගෙවීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාත්මකභාවය පිළිබඳ ඇගයීමක් සිදුකර තිබුණු අතර ඒ අනුව නිර්ණායකයන් 04 ක් සම්පූර්ණයෙන් සතුටුදායක නොවන (Not Satisfactory) බවත්, නිර්ණායකයන් 38 ක කොටසක් පමණක් සතුටුදායක නොවන (Partially Satisfactory) බවත් දක්වා තිබුණි. මෙම වාර්තාවට අනුව නිර්ණායකයන් 16 ක් පමණක් සතුටුදායක මට්ටමේ පවතින බව සහතික කර තිබුණි. සමස්ථයක් ලෙස මෙම ව්‍යාපෘතිය රෝහල් 05 ක ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොමැති බව මෙම ඇගයීමට අනුව තහවුරු වී

තිබුණි. මෙම කමිටු නිර්දේශයන් අනුව හා ව්‍යාපෘතියේ විෂයපථය හා ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව සම්පූර්ණයෙන්ම වෙනස් වීම මත ගිවිසුම්ගත ගෙවීම් උපලේඛනය පදනම් කරගෙන වාරික ගෙවීමේ කිසිදු හැකියාවක් නොවන බව නිරීක්ෂණය විය. 2023 මාර්තු 20 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද රෝහල් 05 ට අදාළව කොටස් ගෙවීමක් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද, අමාත්‍යාංශය පත් කළ 05 දෙනෙකුගෙන් යුත් කමිටුවේ නිර්දේශය මත, අමාත්‍ය මණ්ඩල අනුමැතිය හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට නොගෙන රෝහල් 20 තුළම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව එළඹෙන ඊළඟ වර්ෂයේදී ගෙවිය යුතු වාරික මුදල වූ එ.ජ.ඩොලර් මිලියන 3.02 ක සම්පූර්ණ වාරික මුදලම මෙම වර්ෂය තුළ ගෙවා තිබුණි.

**ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම**

අමාත්‍යාංශය විසින් එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2017 ජූලි 01 දින සිට ඒවා ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු ලෙස උපදෙස් ලබාදී තිබුණි. එහෙත් එයට පටහැනි ලෙස වර්තමාන වැටුප පදනම් කර ගෙන 2023 වර්ෂයේදී ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 38,236.83 ක්ද ගෙවා තිබුණි. එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 72 ක් පමණ වී තිබුණි.

**තිරසර සංවර්ධන දර්ශක**

සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන දර්ශක 31 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් දර්ශක 13 ක් සඳහා 2023 වර්ෂයට අදාළ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. ප්‍රගතිය වාර්තා කරන ලද දර්ශක 12 කට අදාළ දර්ශකවල අවශ්‍ය කාර්යසාධන මට්ටම කරා ළඟා වී නොතිබුණි.

**තනතුරු පුරප්පාඩු**

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල්, ආයතන හා අංශවලට අදාළ 2023 ජුනි 30 දිනට අනුමත සමස්ත කාර්ය මණ්ඩලය 95,948 ක් හා එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 81,915 ක් විය. ඒ අනුව සමස්ත කාර්යමණ්ඩලයේ 14,033 ක ඌණතාවයක් පැවතුණි. ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම යටතේ අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් 1,103 දෙනෙක් සේවයේ යොදවා තිබුණද කාර්ය මණ්ඩල තොරතුරුවලට ඇතුළත් කර තිබුණේ තනතුරු 5 ක් පමණි. මාසිකව රු.27,000 ක පමණ දීමනාවක් යටතේ සේවයේ යොදවා ඇති මෙම තනතුරු සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් 2024 මාර්තු දක්වා ලැබී නොතිබුණි.

**විශේෂඥ වෛද්‍ය සේවය**

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව විශේෂඥ ක්ෂේත්‍ර 58 කට අදාළව අනුමත විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2837 ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විශේෂඥ ක්ෂේත්‍ර 50 කට අදාළව එම සංඛ්‍යාව 2,740 ක් විය. විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රයන් 08 කට අදාළව අනුමත තනතුරු 66 සඳහා කිසිඳු වෛද්‍යවරයෙකු පත්කර නොතිබුණි. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව හා සැසඳීමේදී 2023 වර්ෂයේ නොවැම්බර් වන විට විශේෂඥ ක්ෂේත්‍ර 35 කට අදාළව විශේෂඥ වෛද්‍යවරුන් 972 ක ඌනතාවයක් පවතින බවත්, විශේෂඥ ක්ෂේත්‍ර 12 කට අදාළව විශේෂඥ වෛද්‍යවරුන් 113 ක් අතිරික්තව සේවයේ යොදවා ඇති බවත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අවස්ථාවේදී හඳුනාගෙන නොතිබුණු හා පසුව එම විශේෂඥ ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීම සඳහා විධිමත් අනුමැතියක් හෝ ලබානොගත් විශේෂඥ ක්ෂේත්‍ර 12 ක් තුළ විශේෂඥ වෛද්‍යවරුන් 141 ක් සේවයේ යොදවා ඇති බවත්,නිරීක්ෂණය විය. තවද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ මූලික අරමුණක් ලෙස වෛද්‍යවරුන්ගේ කැමැත්ත අනුව නොව අවශ්‍යතාවය මත විශේෂඥ ක්ෂේත්‍රයන් තෝරගැනීම තීරණය කිරීම දක්වා තිබුණද අමාත්‍යාංශය විසින් ඊට අනුගත නොවී වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි විශේෂඥ ක්ෂේත්‍රය තෝරාගැනීමට ඉඩ සලසා දී ඇති බව නිරීක්ෂණය විය.

## තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම විගණනය කිරීම - ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ සුවපහසු ජාතික මහජන සෞඛ්‍ය පද්ධතිය (තිරසර සංවර්ධන ඉලක්ක 3(ඇ)) සම්බන්ධව සිදුකරන ලද කර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ

**ජාතික සෞඛ්‍ය සභාව**

ජාතික සෞඛ්‍ය සභාව සෞඛ්‍ය ගැටලු ඉහළම මට්ටමින් සාකච්ඡා කිරීම සඳහා වැදගත් වේදිකාවක් වුවද, එය 2004 සිට රැස් වී නොමැති අතර ජාතික මට්ටමින් මෙන්ම උප ජාතික මට්ටමින් අන්තර් අංශ සහයෝගීතාව සඳහා දේශපාලන කැපවීම සහතික කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැති වීමට එය හේතු වී ඇත.

ජාතික සෞඛ්‍ය සභාව වැනි ඉහළ මට්ටමේ සෞඛ්‍ය සංවර්ධන ආයතනයක් නොමැති වීම හේතුවෙන් විවිධ ජාතික මෙහෙයුම් කමිටු සහ ජාතික කාර්ය සාධක බළකා කලින් කලට පිහිටුවා තිබුණි.

**සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තමන් නොදන්නා බවත් ඒ සඳහා වගකිව යුතු නැති බවත් ආයතන අටක් ප්‍රකාශ කර තිබුණි. ඉහත තත්ත්වය ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR) මගින් නියම කෙරෙන තත්ත්වයන් ළඟාකර ගැනීමට යාමේදී අදාළ ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිකම නිරීක්ෂණය විය.

ජාතික සෞඛ්‍ය සංවර්ධන කමිටුව යනු 1980 වර්ෂයේ දී පාර්ලිමේන්තුව විසින් හඳුනාගෙන අනුමත කරන ලද සෞඛ්‍ය සංවර්ධන ජාලයේ අතරමැදි මට්ටමයි. මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා වැදගත් වන වේදිකාවකි. සෞඛ්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වය යටතේ වර්ෂයකට කමිටු (NHDC) රැස්වීම් දෙකක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු නමුත් 2020 සහ 2021 වර්ෂ තුළ වර්ෂයකට එක් රැස්වීමක් පමණක් පවත්වා ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම**

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (NDMP 2013-2017) මත පදනම්ව සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සඳහා ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP 2021) සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කර තිබුණි. කෙසේ වුවද, ආපදා කළමනාකරණය සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම ප්‍රමාණවත් නොවීය. ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP 2021) සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ පැරණි ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මත පදනම් වූ බව නිරීක්ෂණය විය.

**නිරෝධායන සහ සංක්‍රමණ සෞඛ්‍ය ඒකක**

ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසිවලට (IHR 2005) අනුකූලව ජාත්‍යන්තර මට්ටමින් ව්‍යාප්ත වන රෝග රට තුළට පැමිණීමේ හැකියාව පිළිබඳව නිරෝධායන සහ සංක්‍රමණ සෞඛ්‍ය ඒකකවල සුපරීක්ෂාකාරී බව සම්බන්ධයෙන් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියේ අවධාරණය කර ඇත. දේශගුණික විපර්යාස සහ දේශගුණික විෂමතා හේතුවෙන් සෞඛ්‍යයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම අවශ්‍ය වේ.

**හදිසි අනතුරු සහ හදිසි අවස්ථා**

හදිසි අනතුරු සහ හදිසි අවස්ථා සම්බන්ධව වළක්වා ගත හැකි මරණ සහ රෝගාබාධ අවම කිරීම සඳහා සෞඛ්‍ය සත්කාරක සේවාවේ සෑම තරාතිරමකම විස්තීර්ණ හදිසි අනතුරු, හදිසි අවස්ථා සහ හදිසි සත්කාරක සේවා සැපයීම සහතික කිරීම අවශ්‍ය වේ.

**සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAPHS) ට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (Mo FAR) විසින් මානව සහ සත්ව අංශ අතර බහුආංශික සම්බන්ධීකරණය සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රති ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය (AMR) පිළිබඳ ජාතික උපදේශක කමිටුව හරහා යාන්ත්‍රණයක් ස්ථාපනය කර තිබුණද, ප්‍රධාන වශයෙන් අරමුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රති ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය (AMR)

උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**ජෛව ආරක්ෂණ නිරීක්ෂණ සහ අධීක්ෂණ වැඩසටහන්**

2019 වර්ෂයේ සිට 2023 වසර දක්වා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) මගින් ගොවිපොළවල ආසාදන පාලන නිරීක්ෂණ ශක්තිමත් කිරීමට සැලසුම් කර තිබුණි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) මගින් කුකුළු අභිජනන ගොවිපොළවල ජෛව ආරක්ෂණ නිරීක්ෂණ සහ අධීක්ෂණ වැඩසටහන් ආරම්භ කර තිබුණද, වාණිජ පශු සම්පත් සහ කුකුළු ගොවිපොළවල මෙය ආරම්භ කර නොතිබුණි.

**රෙගුලාසි පැනවීම**

නිදර්ශක ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ක්‍රමානුකූල ජාතික වැඩසටහනක් සකස් කිරීම සහ එක් එක් මූලික පරීක්ෂණ සඳහා ආදර්ශ යොමු කිරීමේ ජාලයක් සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමට 2019 වසරේ සිට 2023 දක්වා සැලසුම් කර තිබුණු නමුත් මෙම ක්‍රියාකාරකම සිදු කර නොතිබුණි.

**ආපදා සූදානම සහ ප්‍රතිචාර සැලැස්ම යාවත්කාලීන කිරීම**

2021 වර්ෂය අවසන් වන විට වර්තමාන ආපදා සූදානම සහ ප්‍රතිචාර සැලැස්ම යාවත්කාලීන කිරීමට වෛද්‍ය සැපයුම් අංශය මගින් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, නියමිත කාල සීමාව තුළ එම කාර්යය සම්පූර්ණ කිරීමට වෛද්‍ය සැපයුම් අංශයට (MSD) නොහැකි වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**අනුකරණ අභ්‍යාස පිළිබඳ වාර්ෂික සාකච්ඡා**

අනුකරණ අභ්‍යාස පිළිබඳ වාර්ෂික සාකච්ඡා (Annual Desktop Simulation Exercise) හරහා සූදානම සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව තක්සේරු කිරීම ආරම්භ කිරීමට වෛද්‍ය සැපයුම් අංශය මගින් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රියාවලිය 2023 මාර්තු 21 දින වන විටත් ආරම්භ කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 1990 - සුවසැරිය පදනම

**රීති සෑදීම**

2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 18 (5) සහ 25 (1) වගන්ති යටතේ මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් සහ රීති සෑදිය හැකි ප්‍රධාන කරුණු 05 කින් කිසිදු කරුණක් සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි.

## පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව

**පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කිරීමේ කටයුතු**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත අනුව ඒ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන පහසුකම් වලට අනුව ඒවා වර්ග කිරීමේ ක්‍රමයක් හා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ දක්වා ඇත.

නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබූ අතර මේ හේතුවෙන් ගාස්තු නියාමනය කිරීමේ කටයුතුද ඇනහිට තිබුණි.

**නියෝග සෑදීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 18(2)(උ) හා 18(2)(1) වගන්ති අනුව "සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් පැමිණිල්ලක් භාරගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පරිචය" සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි වුවත්, අමාත්‍යවරයා විසින් මෙම කරුණ සම්බන්ධයෙන් නියෝග සකස් කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

**මුදල් සැපයූ අරමුණට යොදා නොගැනීම**

යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 192.09 ක් ලෝක ආහාර වැඩසටහන (**WFP**) මගින් 2021 වර්ෂය තුළදී ලබාදී තිබුණු අතර, එම මුදල් සැපයූ අරමුණ ඉටු නොකර ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

**1/20 ක දීමනාව ලබා ගැනීම**

රජයේ නිවාඩු දිනයක වැඩ කිරීම වෙනුවෙන් ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/20 ක සමාන මුදලක් ලබා ගැනීම සඳහා දිනකට පැය 08 කට නොඅඩු කාලයක් සේවය කළයුතු වුවත් මෙම දීමනාව ලබාගෙන තිබුණු සමාගමේ සියලුම නිළධාරීන් පැය 08ක සේවා කාලයක් සේවයේ යෙදී නොතිබුණි. ඒ අනුව 2023 වර්ෂය සඳහා රු.මිලියන 1.62 ක නිවාඩු දින දීමනාවක් ලබාගෙන තිබුණි. ඇතැම් නිළධාරීන් අදාළ නිවාඩු දින සේවයට වාර්තා කර නොතිබුණද, එම දිනයන් සඳහාද මෙම දීමනාව ලබාගෙන තිබුණි. තවද, එක් කාර්යයක් වෙනුවෙන් අදාළ කරගත යුත්තේ එක් දීමනාවක්/ වරප්‍රසාදයක් පමණක් වුවද මෙම දීමනාවට අමතරව වැඩ කරන මෙම එක් එක් නිවාඩු දිනයක් වෙනුවෙන් හිලව් නිවාඩු දිනයක් හෝ හිලව් නිවාඩු දින දීමනාවක් සමාගම විසින් ලබාදී තිබුණි.

## වෛද්‍ය පර්යේෂණායතනය

**අන්තිම කැමති පත්‍රයකින් පරිත්‍යාග කර තිබුණු ඉඩම**

ගොඩගම-මාලඹේ ප්‍රධාන මාර්ගයට හා වල්ගම-අතුරුගිරිය මාර්ගයට මායිම්ව පිහිටි අක්කර 02 යි රූඩ 02යි පර්චස් 29.70 ක වපසරියකින් යුක්ත වූ ඉඩම, 1998 අප්‍රේල් 01 දිනැති අංක 4205 දරන අන්තිම කැමති පත්‍රය මගින් හිමිකරු විසින් වෛද්‍ය පර්යේෂණ ආයතනයට පරිත්‍යාග කර තිබුණු අතර එහි වටිනාකම ආසන්න වශයෙන් රු.

මිලියන 1,074 ක් විය. මෙම ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු 2022 පෙබරවාරි 17 වන දින මරණයට පත් වී තිබුණු අතර ඒ බව 2022 පෙබරවාරි 21 වන දින ලිඛිතව වෛද්‍ය පර්යේෂණ ආයතනයට දැනුම් දී තිබුණි. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 516 වන වගන්තිය ප්‍රකාරව අන්තිම කැමති පත්‍රකරු මියගිය ස්ථානයට අදාළ දිසා අධිකරණය වෙත මාස තුනක් (03) ඇතුළත එකී අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කොට එය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 524 වන වගන්තිය ප්‍රකාරව විරෝධතාවකින් තොරව ඔප්පු කරවා ගත යුතු වේ. එහෙත් ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු මිය ගොස් 2024 මාර්තු 31 දිනට මාස 25 ක කාලයක් ඉක්ම ගොස් තිබුණද අංක 4205 දරන අන්තිම කැමති පත්‍රය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට විරෝධතාවකින් තොරව ඔප්පු කරවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## ශික්ෂණ හා ජාතික රෝහල්

### රිජ්වේ ආර්යා ළමා රෝහල

**ඌන උපයෝජිත වත්කම්**

වර්තමානය වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ රෝහල් පද්ධතිය තුළ රෝගීන්ගේ පෙනහළු හා හෘදය තාවකාලිකව සහ දරුණු ලෙස අකර්මන්‍ය වූ අවස්ථාවන්හිදී රෝගියාට සම්බන්ධ කර භාවිතා කරනු ලබන Extra- Corporeal Membrane Oxygenation (ECMO) නැමැති යන්ත්‍ර දෙකක් පැවතුණි. මේ අතරින් එක් යන්ත්‍රයක් රු.මිලියන 13.5 ක් වැය කර රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද හා උරස් ඒකකයට 2015 පෙබරවාරි මස 05 වන දින රෝහල විසින් මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍රය 2023 මැයි 31 දක්වා රෝහල් 05 ක් අතර හුවමාරු කර ගෙන රෝගීන් 4 දෙනෙකු සඳහා පමණක් භාවිතා කර තිබුණු නමුත් යන්ත්‍රය මිලදී ගෙන තිබුණු රිජ්වේ ආර්යා ළමා රෝහල සහ 2021 සැප්තැම්බර් 28 දින සිට මෙම යන්ත්‍රය පවරා තිබුණු කොළඹ ජාතික රෝහල විසින් කිසිදු රෝගියකු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. කෙසේවුවද, 2022 වර්ෂයේදී යන්ත්‍රය සඳහා පිළිවෙලින් රු.මිලියන 13.3 ක පිරිවැය සහිත පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඒකක 61 ක්ද, රු.මිලියන 12.2 ක පිරිවැය සහිත අමතර උපාංග ඒකක 8 ක්ද රෝහල විසින් මිලදී ගෙන තිබුණි.

### මහරගම අපේක්ෂා රෝහල

**නිෂ්කාර්ය වත්කම්**

මහරගම අපේක්ෂා රෝහල විසින් ඖෂධ ගබඩා කිරීම සඳහා ශීත කන්ටේනරයක් රු.මිලියන 5.4 ක් වැය කරමින් 2018 අගෝස්තු 30 වන දින රෝහල් භූමිය තුළ ස්ථාපිත කර තිබුණි. නමුත් මෙම ශීත කන්ටේනරය රෝහලේ අවශ්‍යතාවයට අනුකූලව පිළියෙල කර නොමැති බව සඳහන් කරමින් ඖෂධවේදීන් විසින් දිගින් දිගටම එහි

ඖෂධ ගබඩා කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ඖෂධවේදීන්ගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් තවදුරටත් රු.මිලියන 2.7 ක් වැය කර 2022 නොවැම්බර් 28 දින එහි නවීකරණ කටයුතු අවසන් කර තිබුණද ඒ සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමට මාස 16 ක් පමණ ගත කර 2024 මාර්තු 25 දින ලබා ගෙන තිබුණි. නමුත් 2024 අප්‍රේල් 30 දින වන විටත් රෝහල විසින් එය ඖෂධ ගබඩා කිරීම සඳහා භාවිතා කර නොතිබුණි. එබැවින් රු.මිලියන 8.1 ක් වැයකර ස්ථාපනය කර තිබුණු මෙම ශීත කන්ටේනරය වසර 5 කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

## කොළඹ ජාතික රෝහල

**ආහාර සැපයුම් ටෙන්ඩර් ප්‍රදානය**

කොළඹ ජාතික රෝහලේ 2022 වර්ෂයේ වාර්ෂික අමු ආහාර අවශ්‍යතාවය කාණ්ඩ 05 ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු අතර ජාතික තරඟකාරි ලංසු කැඳවීම් ක්‍රමය යටතේ වෙන් වෙන් වශයෙන් ලංසු කැඳවා තිබුණි. එහිදි ඉදිරිපත් වූ අවම ලංසු වටිනාකමට වඩා රු.මිලියන 51 කින් වැඩි ලංසු වටිනාකමකට ඉහත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු අතර එයට හේතු ලෙස අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු විසින් සතුටුදායක සේවාවක් සපයා නොතිබීම සහ එම ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ සෑහීමකට පත් නොවීම යන කරුණු අමාත්‍යාංශ ප්‍රසම්පාදන B කමිටුව විසින් දක්වා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ කාලය 2022 දෙසැම්බර් 31 දින අවසන් වීමට නියමිතව තිබුණද එම කොන්ත්‍රාත් කාලය 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

මේ සම්බන්ධ විගණන පරීක්ෂාවේදී හෙළිදරව් වූ පරිදි 2022 වර්ෂයේ රෝහලේ සත්‍ය අමු ආහාර ද්‍රව්‍ය භාවිතය එහි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් පමණක් වී තිබුණි. මේ අනුව ඇස්තමේන්තුව සියයට 68 කින් එනම් රු.මිලියන 250 කින් අධි තක්සේරු කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1.2 ක් වූ අයිතම 12 ක් කිසිඳු අවස්ථාවක මිලදී ගෙන නොතිබුණි. තවද, අමු ආහාර ද්‍රව්‍ය අයිතම පහක අධි ඇස්තමේන්තුව මගින් පමණක් මුළු පිරිවැය ඇස්තමේන්තුවට සිදුකර තිබුණු බලපෑම සියයට 40 කට වඩා වැඩි බවත් නිරීක්ෂණය විය. මෙලෙස අවශ්‍යතාවය සියයට 68 කින් අධි ගණනය කිරීම නිසා ලංසුකරුවන් ලබා දිය යුතු වන කාර්යසාධන ඇපකර වටිනාකම සත්‍ය අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවයට සාපේක්ෂව සියයට 25 සිට සියයට 152 ක් දක්වා ඉහළ පරාසයක පැවති බවත් එමගින් හැකියාවක් සහිත කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රසම්පාදනයන් සඳහා සාධාරණ ලෙස සහභාගි වීමේ අවස්ථාව අධෛර්යමත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

## මහනුවර ජාතික රෝහල

**හෘද කැතීටකරන යන්ත්‍රයක් අක්‍රිය වීම**

මහනුවර ජාතික රෝහලේ හෘද රෝග අංශය තුළ භාවිතයට ගන්නා හෘද කැතීටකරන යන්ත්‍ර 02 ක් මගින් දෛනිකව රෝගීන් 30 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකගේ හෘද රෝග පරීක්ෂණ හා ප්‍රතිකාර සිදුකර තිබුණු වසර 17 කට වඩා පැරණි Siemens Axiom Artis DFC Cath Lab (Machine – SN3542602626) යන්ත්‍රය 2023 මැයි 01 දින සිට අක්‍රිය වී තිබුණි. එය අළුත්වැඩියා කිරීම ඵලදායී නොවීම හේතුවෙන් ඒ වෙනුවට නව යන්ත්‍රයක් ස්ථාපිත නොකිරීම මත දෛනික හෘද රෝග පරීක්ෂණ සියයට 50 කින් පමණ අඩු වී තිබුණි. 2019 වර්ෂයේ සිට 2023 මැයි 29 දින දක්වා ප්‍රතිකාර සඳහා රෝගීන් 8,024 ක් ලියාපදිංචි වී පොරොත්තු ලේඛනය තුළ රැඳී සිටින අතර යන්ත්‍රය අක්‍රීය වීම හේතුවෙන් පොරොත්තු ලේඛනය තවදුරටත් දීර්ඝ වන බව නිරීක්ෂණය විය.

## මඩකළපුව ශික්ෂණ රෝහල

**ඩයෝඩ ලේසර් යන්ත්‍රය භාවිතා නොකිරීම**

මඩකළපුව ශික්ෂණ රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරයාගේ ඉල්ලීම මත 2019 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 63.9 ක වියදමින් ද්විත්ව 200W ඩයෝඩ ලේසර් යන්ත්‍රයක් (200W Dual Diode Laser Machine) මිලදී ගෙන තිබුණි.කෙසේ වුවද යන්ත්‍රයේ වගකීම් කාලය එය භාවිතා කිරීමට පෙර කල් ඉකුත් වී තිබූ අතර අමතර කොටස් ලබා ගැනීමේ සහතිකයක් ද ලබාදී නොතිබුණි. මීට අමතරව, යන්ත්‍රය ස්ථාපනය නොකර රෝහල් කාර්ය මණ්ඩලය සඳහා අදාළ විස්තීරණ පුහුණුවක්ද ලබාදී නොමැතිව තිබියදී ටෙන්ඩර් කොන්දේසිවලට පටහැනිව සම්පූර්ණ ගෙවීම සිදු කර තිබුණි. ඒ අනුව විවිධ වෛද්‍ය තත්වයන්ට ප්‍රතිකාර කිරීමේ හැකියාව ඇති සැලකිය යුතු ආයෝජනයක් සහිත මෙම යන්ත්‍රය මිලදී ගැනීමෙන් පසු වසර හතරක් ගතව තිබුණද 2024 මාර්තු වන විටත් වෛද්‍යවරුන් විසින් නියම කරන ලද ප්‍රතිකාර ක්‍රම සඳහා භාවිතයට නොගෙන පැවතීම හේතුවෙන් රෝගීන්ගේ යහපත උදෙසා අදාළ යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට අපොහොසත් වී තිබුණි.

**අභාවිත වත්කම්**

කරාපිටිය ශික්ෂණ රෝහලේ රක්ත කාන්දු පෙරණ ඒකකය හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 790.1 ක් වූ මහල් 8 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 අගෝස්තු 13 දින වැඩ ආරම්භ කර තිබුණි. 2016 පෙබරවාරි 13 දින වැඩ අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින දක්වාම අදාළ වැඩ අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීමේ ලිඛිත සාක්ෂි හෝ දින දීර්ඝ කළ කාලය තුළ වැඩ අවසන් කිරීමේ

සැලැස්ම පිළිබඳ සාක්ෂි කිසිවක් ලිපිගොනුව තුළ ඇතුළත් නොවීය. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට ප්‍රථම රක්ත කාන්දු පෙරණ ඒකකයට හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකයට අවශ්‍ය එකතුව රු. මිලියන 198.86 ක් වූ ශල්‍ය හා වෛද්‍ය උපකරණ හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණු අතර, 2023 ජුනි 02 විගණිත දින වන විට ඒවා ගොඩනැගිල්ලේ තැනින් තැන ගොඩගසා නිෂ්කාර්යයව පැවතුණි. රක්ත කාන්දු පෙරණ ඒකකයට හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකයට 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.මිලියන 83.57 ක් වූ කාණ්ඩ 20 කට අදාළ ශල්‍ය හා වෛද්‍ය උපකරණ අයිතම් 114 ක් 2023 ජුනි 02 විගණිත දින වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර, එම උපකරණ සියල්ලේම වගකීම් කාලය (Warranty Period) උපයෝජනයට පෙර සිටම අවසන් වී තිබුණි.

එසේම මෙම රෝහලේ වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ සඳහා 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.මිලියන 16.9 ක් වූ වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ උපකරණ 03 ක් වසර 07 ක කාලයක් තුළ කිසිදු රසායනාගාර පරීක්ෂණයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය.

**අභාවිත වත්කම්-** Digital Static X – Ray යන්ත්‍රය

චීන ආධාර යටතේ රෝහල්වල සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් නාවලපිටිය දිස්ත්‍රික් රෝහල සඳහා වටිනාකම රු. මිලියන 20.9 ක GE Health Care/ Model/ Optima XR 646 දරන Digital Static X – Ray යන්ත්‍රය 2022 මාර්තු 29 දින ලබා දී තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා නාවලපිටිය රෝහල විසින් පරිශ්‍රය සකස් කිරීම, වයරින් කිරීම, තෙකලා විදුලි බල සැපයුම ලබා ගැනීම සහ විදුලි රැහැන් ඇදීම සඳහා රු. මිලියන 19.9 ක් වැය කර තිබුණද යන්ත්‍රය රෝගී සත්කාර සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටද භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය

**වෘත්තීය ගාස්තුව**

1999 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පවතින වෘත්තිය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අය කර ගැනීමේ ක්‍රමවේදය අනුව 2023 වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තුව වූ රු.මිලියන 601.74කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු. මිලියන 0.94 ක් පමණක් වී තිබුණි. මේ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොවුණි. තවද මේ තුළ භාණ්ඩාගාර හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද රු. මිලියන 60.73 ක් ද ඇතුළත් වී තිබුණි.

**වෘත්තිය ගාස්තු මත උපයන විට බදු නොගෙවීම**

රෝහල විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවකට අදාළව බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 10 දිනැතිව ලබා දී තිබුණු වාර්තාව අනුව වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගෙවිය යුතු බවට රෝහල වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013/2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගණනය කර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**අනුමැතියකින් තොර ගෙවීම්**

1996 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක් වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. මෙම තීරණය පදනම් කරගෙන සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරි දීමනා හා අතිකාල දීමනා සඳහා 2018 වර්ෂයේ දී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි අතිරේක රාජකාරි දීමනා හා අතිකාල දීමනා සඳහාද සියයට 35 වැඩිවීම එකතු කර ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 168.43 ක්, රු.මිලියන 162.47 ක් හා රු.මිලියන 158.07 ක් ලෙස කැබිනට් මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

## විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය

**ඖෂධ හා වෛද්‍ය උපාංග මිලදී ගැනීම**

2007 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 හා 2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව ඖෂධ හා වෛද්‍ය උපාංග මිලදී ගැනීමේදී සියලුම ලංසුකරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ. එහෙත් එයට අනුකූල නොවන ලෙස ලංසු ලියවිලි සමග ලියාපදිංචිය ඉදිරිපත් නොකල හා ලියාපදිංචිය කල් ඉකුත්ව තිබුණු ලංසුකරුවන් වෙත අවස්ථා 09 කදී වටිනාකම රු.මිලියන 5.93 ක් වූ ලංසු ප්‍රදානය කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමු වී නොතිබුණි.

## ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

**පරිත්‍යාග මුදල්**

1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අරමුදල වෙත විවිධ ව්‍යාපෘති 04 කට අදාළව ලැබී තිබුණු රු.මිලියන 13.76 ක් වූ පරිත්‍යාග මුදල් අරමුණුගත කාර්යයන් ඉටු කිරීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

**පරිත්‍යාග ඌන උපයෝජනය**

ලිට්ල් හාට් ව්‍යාපෘතිය රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා මහල් දහයකින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වන “ලිට්ල් හාට්” (Little Heart) ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂය අවසානය වන විට රු.මිලියන 624.43 ක් වූ මහජන අරමුදල් රැස් කර තිබුණි. එසේවුවද, එම මුදලින් වර්ෂය තුළ රු.මිලියන 81.39 ක් පමණක් වැය කර තිබුණි. මීට අමතරව එම රෝහලේ ශල්‍යාගාර සංකීර්ණය වැඩිදියුණු කිරීම සඳහා 2020 ජූලි 20 දින පරිත්‍යාගශීලියෙකු විසින් අන්තිම කැමති පත්‍රයකින් ලබා දී තිබුණු රු.මිලියන 42.03 ක් හා ශල්‍යකර්ම සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2023 වර්ෂය තුළ ලැබී තිබුණු රු.මිලියන 11.25 ක් අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමේ රු. මිලියන 406.24 ක් පැවති අතර 2022 හා 2023 වර්ෂයන්හිදී මෙම අරමුදල් කිසිදු ඵලදායී කාර්යයක් සඳහා භාවිතා කර නොතිබුණි.

**යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වැඩිදියුණු කිරීම**

2012 මැයි 04 දිනැති අංක අමප/12/0489/509/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උතුරු පළාතේ පිළිකා රෝගීන් වෙනුවෙන් පරීක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සහ ආධාරක ආයතනය වන පුද්ගලික සමාගමක් අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගෙන තිබූ අතර එපරිදි මෙම ව්‍යාපෘතිය යටතේ තෙලිප්පලේ මූලික රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම හා යාපනය ශික්ෂණ රෝහලේ ළමා ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ලබා දීමට යෝජිතව පැවතුණි. ඒ අනුව තෙලිප්පලේ රෝහලේ ඉදිකිරීම වෙනුවෙන් අදාළ සමාගම රු.මිලියන 218.6 ක් ආධාර වශයෙන් ලබා දී තිබුණි. කෙසේවුවද, යාපනය ව්‍යාපෘතිය නමින් 2023 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ඉහත භාරකාර සමාගම විසින් (යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වැඩිදියුණු කිරීම සඳහා) එකතු කරන ලද රු.මිලියන 72.35 ක මුදලක් ගිවිසුමේ සඳහන් පරිදි නොයොදවා එම සමාගම භාරයේ රඳවාගෙන තිබුණි.

**පොදු අරමුදල උපයෝජනය**

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 31 දිනට පොදු අරමුදලේ ශේෂය රු.මිලියන 729.41 ක් වූ අතර පනතේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදල්වලින් වැය කර තිබුණු මුදල රු.මිලියන 60.61 ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 8.3 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

**ද්‍රව්‍ය ආනයන, අපනයනකරුවන් ලියාපදිංචිය හා අධීක්ෂණය**

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නිති විරෝධි ලෙස ජාවාරම් කිරීම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමග 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබූ නියෝග අංක 1653/7- 2010 මැයි 10 දින අති විශේෂ ගැසට් පත්‍රයේ IV වැනි කොටස පරිශ්‍ර ලියාපදිංචි කිරීම නියෝග 9 අනුව ද්‍රව්‍ය ආනයන කිරීමට හෝ අපනයන කිරීමට අදාළ වන කාර්යයන් කර ගෙන යන්නා වූ පරිශ්‍රයන් බලපත්‍ර නිකුත් කල දින සිට මාසයක් ඇතුළත සෑම බලපත්‍රලාභියකු විසින්ම අධිකාරිය සමග ලියාපදිංචි විය යුතු අතර ප්‍රවර්තන වර්ෂයේදී පරිශ්‍ර 16 ක් ලියාපදිංචි කර 10 කට බලපත්‍ර නිකුත් තර තිබුණි. තවද අධිකාරියේ සාමාජිකයින් අවම වශයෙන් මාස 3 ට වරක් හෝ බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ ක්‍රියාකාරකම් පිළිබඳ අධික්ෂණය කළ යුතු අතර, ද්‍රව්‍යයන් ගබඩා කර ඇති ආකාරය, උපකරණ භාවිතය පවත්වා ගෙන යනු ලබන පොත් ලේඛන රෙජිස්ටර් සහ වාර්තා පරීක්ෂා කල යුතුයි. එසේ වුවත් 2023 වර්ෂයේ බලපත්‍රලාභී ආනයනකරුවන්ගේ 91 දෙනෙකුගේ පරිශ්‍ර 51 ක් පමණක් පරීක්ෂා කර තිබුණි.

**බලපත්‍ර යාවත්කාලීන නොකල පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන**

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුශාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 12 දිනැති අංක 1653/19- 2010 ගැසට් පත්‍රයේ නියෝග අංක 2 අනුව ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැක බලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා නියෝග ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පවත්වා ගෙන යා නොහැකිය. එසේවුවද, 2023 වර්ෂය අවසන් වන විට රට තුළ පැවති පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 න් මධ්‍යස්ථාන 13 ක් පමණක් බලපත්‍ර ලියාපදිංචිය යාවත්කාලීන කර තිබුණි. 2024 මැයි 10 විගණන දින වන විට 2023 වර්ෂය සඳහා පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 ක බලපත්‍ර යාවත්කාලීන කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබුණද එම

මධ්‍යස්ථානයන් සඳහා ආරක්ෂණ නිෂ්කාශනය නොලැබීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට මෙම මධ්‍යස්ථාන 13 හි බලපත්‍ර යාවත්කාලීන කල නොහැකිව පැවතුණි.

## වෛද්‍ය සැපයීම්

වෛද්‍ය සැපයීම්, සෞඛ්‍ය අංශයේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය, වෛද්‍ය සැපයීම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මේ සම්බන්ධව ක්‍රියා කරන ප්‍රධාන ආයතන වේ .

වෛද්‍ය සැපයීම් අංශය විසින් පමණක් පසුගිය වර්ෂ 5ක කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම වෙනුවෙන් වැයකිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | වැය කළ මුදල (.මි.රු) |
|---|---|
| 2019 | 54,068 |
| 2020 | 83,545 |
| 2021 | 73,638 |
| 2022 | 73,050 |
| 2023 | 143,551 |

වගු අංක 2.13 : පසුගිය වර්ෂ 5කදී වෛද්‍ය සැපයීම් වෙනුවෙන් වැය කිරීම

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලියේ පසුබෑම**

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව මහජනතාවට ලබා දෙන ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ ජාතික ඖෂධ නියාමන අධිකාරිය තහවුරු කළ යුතු අතර 58 වගන්තිය ප්‍රකාරව සියලුම ඖෂධ ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම හා විකිණීම සඳහා ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගැනීම අනිවාර්ය වේ. එසේ වුවද අධිකාරියේ ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලිය පසුබෑමට ලක්ව තිබුණු අතර 2023 වර්ෂය අවසානයට ලියාපදිංචි කටයුතු අවසන් නොකළ පොරොත්තු ගොනු 1,500 ට අධික සංඛ්‍යාවක් පැවතුණි. මෙම පසුබෑමට පිළියම් වශයෙන් අධිකාරී පනතට සහ ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබා දීමේ නියෝගයට පටහැනිව ඖෂධවල පැවති ලියාපදිංචිය දීර්ඝ කිරීමේ සහ තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීමේ ක්‍රමවේදයන් අනුගමනය කර තිබුණු අතර ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය සම්බන්ධයෙන් කළින් කල සිදු කරනු ලැබිය යුතු සමාලෝචනයන් නියමිත පරිදි ඉටු කර නොතිබුණි.

**තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සාම්පල් ඉදිරිපත් නොකිරීම**

පනතේ 59(4) (ආ) උපවගන්තිය ප්‍රකාරව ඖෂධ ලියාපදිංචියේදී එහි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත සාම්පලයක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 වර්ෂය තුළ ලියාපදිංචියට ඉදිරිපත් කළ ඖෂධ අතුරින් සියයට 95ක සාම්පල් පරීක්ෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. සාම්පල් පරීක්ෂාවකින් තොරව ඖෂධ ලියාපදිංචි කිරීම හේතුවෙන් ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳව තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ආනයනය කිරීමේ අවධානමක් පවතින බව සහ ගුණත්වය පිළිබඳව ගැටලු ඇති බව අනාවරණය කර ගන්නා අවස්ථාව වන විට එම ඖෂධවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රෝගීන් සඳහා භාවිතා කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**විධිමත් ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලිය භාවිතා නොකිරීම**

පනතේ 109 වන වගන්තියෙන් බැහැරව ලියාපදිංචිය නිදහත් කිරීමේ ක්‍රියාවලිය භාවිතා කිරීමෙන් ඇති වන ගැටලු පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළද, ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු අතර විධිමත් කමිටු අනුමැතියකට යටත්ව ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රමවේදයෙන් බැහැරව 2022 හා 2023 වර්ෂ තුළදී වේගවත් යාන්ත්‍රණයක් හරහා (Special Pathway) අදාළ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් සහ ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය තහවුරු කරන ලේඛන ඇගයීමෙන් හෝ වෙනත් ක්‍රමවේදයකින් තොරව ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික 287 ක් නිකුත් කර තිබුණි.

**ලියාපදිංචි නිදහස් කිරීමේ සහතික මත ආනයනය කරන ඖෂධවල ගුණත්වය පිළිබඳ වගකීම**

ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික මත ආනයනය කරන ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ වගකීම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන/ තාක්ෂණික ඇගයීම් කමිටු වෙත හා වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෙත පවරා අධිකාරිය විසින් තම මූලික නියාමන වගකීමෙන් බැහැර වී තිබුණු අතර අදාළ පාර්ශ්වයන් විසින් ද එම වගකීම ප්‍රතික්ෂේප කර තිබුණි. ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව අධිකාරිය ස්ථාපනය කිරීමේ මූලිකම අරමුණක් වන ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීමේ අරමුණ අධිකාරිය විසින් සඵලදායී ලෙස සාක්ෂාත් කර ගෙන නොතිබුණි.

**ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය**

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය විසින් සිය ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු සහතිකය ලබා ගැනීමටත්, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සහ ලෝක සෞඛ්‍ය

සංවිධානය විසින් යෝජනා කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, විශ්ලේෂණ කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන උපකරණ සම්පාදනය කර ගැනීමටත්, සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් නියමිත කාල සීමා තුළ ප්‍රමිතියෙන් යුතු පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමට අපොහොසත් වී තිබුණු අතර 2023 වර්ෂය අවසානයට පරීක්ෂණ අවසන් නොකළ නියැදි 337 ක් පැවතුණි.

**ඖෂධවල මිල නියාමනය සඳහා වූ බලතල සාධණීය අයුරින් භාවිතා නොකිරීම**

උපලේඛනගත ඖෂධවල උපරිම සිල්ලර මිල ඉහළ දමන අවස්ථාවලදී අනෙකුත් ඖෂධවල මිල ද ඉහළ දැමීමට අවසරය ලබා දී තිබුණද, 2023 දී සිදු කරන ලද ආසන්නතම මිල පහළ දැමීමට සාපේක්ෂව අනෙකුත් ඖෂධවල මිල පහත හෙළන ලෙස දැනුම් දීමට කටයුතු කර නොතිබුණු බැවින් මහජනතාව වෙත හිමි කර දිය හැකිව තිබූ මිල වාසිය ඖෂධ සමාගම් වෙත රඳවා ගැනීමට අවස්ථාව සලසා දී තිබුණි.

**ඖෂධ ගබඩා කිරීම, බෙදාහැරීම සහ ප්‍රවාහනය කිරීම නියාමනය**

14 පනතේ(ඉ) උපවගන්තිය ප්‍රකාරව ඖෂධ ගබඩා කිරීම, බෙදාහැරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කර්තව්‍ය ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු වුවත්, වෛද්‍ය සැපයීම් අංශය, ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ හා රජයේ රෝහල් තුළ පවත්වා ගෙන යන ඖෂධ ගබඩා සහ ඖෂධ ප්‍රවාහන රථ නියාමනය කිරීමේ සහ බලපත්‍රීකරණය කිරීමේ ක්‍රමවේදයක් අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණ අතර නිදහස් සෞඛ්‍ය පද්ධතිය තුළට මුදාහරින ඖෂධවල ගුණත්වය, ප්‍රත්‍යක්ෂභාවය හා ආරක්ෂාව විධිමත් නියාමන ක්‍රියාවලියක් මගින් අඛණ්ඩව තහවුරු කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය හා, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය

**ප්‍රසම්පාදන කටයුතුවල දුර්වලතා නිසා ඖෂධ හිඟව පැවතීම**

වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 වර්ෂය සඳහා වූ සාමාන්‍ය වාර්ෂික ඇණවුම් පිළියෙල කර ක්‍රියාත්මක නොකිරීම, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කිරීම, ප්‍රසම්පාදන ප්‍රමාදය හේතුවෙන් ලංසුකරු විසින් සැපයුම භාර නොගැනීම, වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අතර පැවති දුර්වල සන්නිවේදන සම්බන්ධතාවය නිසා ලංසුකරුවන් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අංශයේ මතය ලබා ගැනීමට දිගු කාලයක් ගත කර තිබීම, ප්‍රසම්පාදන

කටයුතු වෙනුවෙන් අනවශ්‍ය ලෙස දීර්ඝ කාලයක් ගත කර ඇතැම් ඇණවුම් අවලංගු කිරීම හා තාවකාලිකව අත්හිටුවීම, සැපයුම්කරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොසිටීම වැනි හේතු මත 2020 දෙසැම්බර් සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ ඖෂධ 18 ක් මාස 04 සිට මාස 35 ½ දක්වා කාල පරාසයන් තුළ විහිදෙන පරිදි හිඟව පැවතුණි.

**හදිසි මිලදී ගැනීම් සිදුකිරීම**

2022 වර්ෂයේදී ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ එ.ජ.ඩො. මිලියන 200 ක ප්‍රතිපාදන සෞඛ්‍ය අංශයට ලැබී තිබුණු අතර මුදල් අමාත්‍යාංශය විසින් හදිසි මිලදී ගැනීම් සඳහා අනුගමනය කිරීමට ලිහිල් කොන්දේසි සහිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ද හඳුන්වා දී තිබුණි. එසේ තිබියදී ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය විසින් අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය යටතේ සහ අනායාචිත යෝජනා යටතේ සැපයුම්කරුවන් තෝරා ගෙන හදිසි මිලදී ගැනීම් සිදුකර තිබුණි. එම මිලදී ගැනීම්වලදී ඖෂධ ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙනුවට ඇගයීම් කමිටුවක් පමණක් පත්කර තිබුණි. මේ අනුව ප්‍රමිතිය පිළිබඳව විධිමත් තහවුරුවකින් තොරව මිලදී ගන්නා ඖෂධවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

තවද, 2022 හා 2023 වර්ෂයන් තුළ එකතුව රු.මිලියන 22,000 කට වඩා වැඩි වටිනාකමක් සහිත ප්‍රසම්පාදනයන් 663 කට අදාළ හදිසි ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් මාසික වාර්තාවන් ද සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි.

**ලියාපදිංචියෙන් නිදහස් කිරීම් යටතේ නියමිත ගුණත්වයෙන් තොර ඖෂධ සැපයීමේ අවදානම**

2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 ඡේදය අනුව ඖෂධ ප්‍රසම්පාදනයේදී ගුණාත්මක ඖෂධයක්ද යන්න සහතික කෙරෙන ලියාපදිංචි සහතිකය අනිවාර්ය වුවද ඒ පිළිබඳ නොසලකා අභිලාෂ කැඳවීම් ක්‍රමයේදී ලියාපදිංචියෙන් නිදහස් කිරීම් යටතේ ප්‍රසම්පාදනයන් සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දී තිබුණි. මේ හේතුවෙන් බොහෝ සැපයුම්කරුවන් වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැතිව ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙලෙස කොන්දේසි ලිහිල් කිරීම හරහා ගුණත්වයෙන් යුතු ඖෂධ සැපයෙන බවට තහවුරු කෙරෙන ක්‍රමවේදයෙන් බැහැර වී තිබූ බව නිරීක්ෂණය විය.

**හදිසි මිලදී ගැනීම් යටතේ ව්‍යාජ ඖෂධ මිලදී ගැනීම**

අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය හරහා හදිසි මිලදී ගැනීම් යටතේ රු.මිලියන 144 ක් ගෙවා මිලදී ගත් Human Immunoglobulin IV 5-6g හා Rituximab inj. 500mg නමැති ඖෂධ භාවිතයෙන් රෝගීන්ට බරපතල අහිතකර ප්‍රතික්‍රියා ඇති වී තිබුණි. එම ඖෂධ ව්‍යාජ ඖෂධයන් බවත්, අදාළ සමාගම විසින් එම ඖෂධ ආනයනය කර

නොමැති බවත්, අදාළ ඉන්දියානු නිෂ්පාදන සමාගම ද මෙම ඖෂධ සපයා නොමැති බවත් අනාවරණය විය. එහෙත් සැපයුම්කරු විසින් මෙම ඖෂධයේ දේශීය නියෝජිත ලෙස කටයුතු කරන බව දක්වා තිබූ අතර අදාළ ඖෂධ ඇසුරුම්වල හා අනෙකුත් ලේඛනවල ඖෂධයේ නිෂ්පාදක ලෙස ඉන්දියාවේ සමාගමක නම යොදා තිබුණි. තවද තම සමාගම ඖෂධ ආනයනය කර සපයන බවට ද වංචා සහගත ලෙස දක්වා තිබුණි. එසේම අදාළ ඉන්දියානු නිෂ්පාදක සමාගමේ නම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයට ද ඇතුළත් කර තිබූ අතර ඉන්දියානු සමාගමේ තත්ත්ව පාලන දෙපාර්තමේන්තුවේ යැයි සඳහන් ව්‍යාජ විශ්ලේෂණ සහතික ද ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, ලංසු ලේඛනවල සඳහන් පරස්පර විරෝධී කරුණු සම්බන්ධයෙන් හා මීට පෙර වෛද්‍ය සැපයීම් අංශයට කිසිදු අවස්ථාවක ඖෂධ අයිතම සපයා නොමැති වූ හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නොමැති වූ මෙම සැපයුම්කරු අදාළ ඉන්දියානු නිෂ්පාදකගේ බලයලත් දේශීය නියෝජිතයෙකු ද යන්න පිළිබඳව තහවුරු කර ගැනීමට ඇගයීම් කමිටුව අවධානය යොමු කර නොතිබුණි.

**පර්යේෂණ සඳහා සමාගම් වෙත රුධිර ප්ලස්මා නිකුත් කිරීම**

විධිමත් අනුමැතිය ලත් පර්යේෂණයක් ද යන්න හෝ පර්යේෂණ සිදුකළ යුතු ආචාරධර්මවලට අනුකූල වන ලෙස කටයුතු කර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව ද, භාවිතයෙන් පසු ආසාධිත නොවන බවට රසායනාගාර පරීක්ෂණ මඟින් තහවුරු නොකරන ලද රුධිර ප්ලස්මා ඉහත සැපයුම්කාර සමාගමට ලබාදීමට කටයුතු කර තිබූ අතර, රුධිර පාරවිලයනය ආයතනය විසින් පත්කළ කමිටුවක් විසින් ආචාරධර්මවලට අනුකූලව පර්යේෂණ කටයුතු සිදු කරන බවට තහවුරු කළ බවට සාක්ෂි ලබාගැනීමකින් තොරව මෙම සමාගමට රුධිර ප්ලාස්මා නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණි, මෙම කමිටුව මඟින් පර්යේෂණයට අදාළ භූමිභාගය පරීක්ෂා කිරීමට යෝජනා කර තිබුණද එවැනි පරීක්ෂාවක් ද සිදු කිරීමකින් තොරව රුධිර ප්ලාස්මා නිකුත් කිරීමටත් කටයුතු කර තිබුණි .

ඉහත සැපයුම්කරුගේ නිෂ්පාදන ආයතනය GMP තත්ත්ව පරීක්ෂාවට ලක් කර තිබූ අතර එය අසමත් වී තිබුණි. එහෙත් මෙවැනි නිෂ්පාදන ආයතන අනීතික ලෙස දිගින් දිගට ඖෂධ නිෂ්පාදනය කිරීමේ කටයුතුවල නොයෙදෙන බවට පසුවිපරම් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබුණු අතර, අධිකාරියේ හදිසි වැටලීම් අංශයේ ඖෂධ පරීක්ෂකවරුන්ට මෙවැනි නිෂ්පාදනාගාර අඛණ්ඩව පරීක්ෂා කිරීමට, පසුවිපරම් කිරීමට දැනුවත් කර නොතිබුණි. පළාත් හා ප්‍රාදේශීය බලයලත් නිලධාරීන්ගේ සහයෝගයෙන් එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙවැනි විෂමචාරී සමාගම්වලට ව්‍යාජ ඖෂධ නිෂ්පාදනය කිරීමට ඉඩ සැලසී ඇති බව නිරීක්ෂණය විය.

**තත්ත්වයෙන් අසමත් ඖෂධ මිලදී ගැනීම**

ශල්‍යකර්මවලදී නිර්වින්දනය සඳහා භාවිතාකරන Bupivacaine 0.5% + Glucose 8% inj.4 ml Amp. ඖෂධය පෞද්ගලික සමාගමකින් රු. මිලියන 40.74 ක වටිනාකමකට හදිසි මිලදී ගැනීම් යටතේ මිලදී ගෙන තිබුණු අතර අභිලාෂ කැඳවීම යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවන සමාගමකට ඖෂධය පිළිබඳව ඇගයීමකින් තොරව විශේෂ ක්‍රමවේදයක් යටතේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලබා ගැනීමට යටත්ව මෙම ඇණවුම ප්‍රදානය කර තිබුණි. මෙම ඖෂධය භාවිතා කළ පසු එක් ගර්භණී කාන්තාවක් මරණයට පත්වූ බවත්, තවත් කාන්තාවකට ජීවිත තර්ජන ඇති වීමත් හේතුවෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඖෂධයේ භාවිතය අත්හිටුවා තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත මෙම ඖෂධය නිකුත් කිරීමට පෙර ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය මඟින් ඖෂධවල තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර තොගය තත්ත්වයෙන් අසමත් බව හඳුනා ගන්නා විට මුළු තොගයෙන් සියයට 50 ක්ම රෝගීන් වෙත නිකුත් කර තිබුණි.

අක්ෂි රෝගීන් සඳහා සිදුකරන කැටරැක් ශල්‍යකර්මයෙන් පසු භාවිතා කරනු ලබන Prednisolone Acetate Eye Drop ඖෂධයේ 50,000 ක බෝතල් තොගයක් වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන තිබුණු අතර මෙම ඖෂධය භාවිතා කළ පසු අදාළ රෝගීන්ට ඇති වූ අක්ෂි ආසාත්මිකතා හා බරපතල අහිතකර ප්‍රතික්‍රියා හේතුවෙන් වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක විසින් ඖෂධය භාවිතයෙන් ඉවත් කර තිබුණි. කෙසේ නමුත් මෙම ඖෂධය භාවිතයෙන් ඉවත් කරන විටත් මුළු තොගයෙන් සියයට 43 ක්ම රෝගීන් සඳහා භාවිතා කර තිබූ අතර මෙම ඖෂධය භාවිතා කිරීම හේතුවෙන් ජාතික අක්ෂි රෝහලේ රෝගීන් දෙදෙනෙකු පූර්ණ අන්ධභාවයට පත් වී නුවරඑළිය දිස්ත්‍රික් මහා රෝහලේ රෝගීන් 16 දෙනෙකු ආසාත්මිකතාවයට පත් වී තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය හෝ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් රෝහල් වෙත මෙම ඖෂධය නිකුත් කිරීමට පෙර ඖෂධවල තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**ගුණාත්වයෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබා දීමේ අවශ්‍යතාවය**

2019 සිට 2022 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයුම් සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු චක්‍රලේඛ අනුව තත්ත්වයෙන් අසමත් වූ ප්‍රතිජීවක ඖෂධ, ආසාත්මිකතා, ඇදුම, පිළිකා, හෘද රෝග, අක්ෂි ආසාදන හා වකුගඩු රෝග සඳහා භාවිතා කරන ඖෂධ ඇතුළුව ඇතැම් ඖෂධවල වීදුරු කැබලි පැවතීම, දෘශ්‍ය අංශු පැවතීම, මැරුණු කැරපොත්තෙකු සිටීම, පෙති කැඩීයාම, වර්ණය වෙනස් වීම, බ්‍රිතාන්‍ය ඖෂධවේද පිරිවිතරයන්ට අනුකූල නොවීම, අහිතකර ප්‍රතික්‍රියා හේතුවෙන් මරණ සිදු වීම, ක්ෂුද්‍ර ජීවී ආසාධන යනාදී කරුණු

හඳුනා ගෙන තිබුණි. ඒ හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර හෝ භාවිතය අත්හිටුවා තිබුණි. මෙලෙස තත්ත්වයෙන් අසමත් බව අනාවරණය වන විට එම ඖෂධ රෝගීන් විසින් භාවිතා කර තිබුණි. විගණනය විසින් වර්ෂ ගණනාවක් තිස්සේ මෙම තත්ත්වය අනාවරණය කළද මෙතෙක් මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2023 වර්ෂයට අදාළව රු.මිලියන 2,482.12 ක් වටිනා ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් රු.මිලියන 515.7 ක් වටිනා වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා තිබුණි. ඒ අතර අක්ෂි රෝග, පිළිකා රෝග, නිර්වින්දනය හා ප්‍රතිශක්තිකරණය සඳහා භාවිතා කරන ඖෂධ ඇතුළුව වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කිරීමත්, ඖෂධ භාවිතයෙන් පසු රෝගීන්ට අහිතකර ප්‍රතික්‍රියා ඇති වී තිබුණු බවත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ගුණත්වයෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබා දීමේ අපේක්ෂාව ඉටු වී නොතිබුණි.

**බෙදාහැරීමට පෙර ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් නොමැතිවීම**

ඖෂධ රෝහල්වලට බෙදාහැරීමට පෙර ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලෙසට වර්ෂ කට වැඩි 06 කාලයක සිට විගණනය විසින් කළමනාකරණය වෙත දැනුම් දුන්න ද මෙතෙක් ඒ සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම හේතුවෙන් තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට නිකුත් කිරීම අවම කිරීමට මේ දක්වාම නොහැකි වී තිබුණි

# දේශීය වෛද්‍ය

හෙළ වෙදකමින් සැමට සුවසෙත සැලසීම දේශීය වෛද්‍ය අංශයේ දැක්ම වේ. ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් සමස්ථ ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම මෙහෙවර වේ. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශයේ කාර්යභාරයන් පහත පරිදි විය.

**කාර්යභාරයන්**

දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනගා ගැනීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම

දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම

දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහල දැමීම

සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය රටේ සංවර්ධනයට දායක කර ගැනීම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම

මෙම කාර්යන් ඉටු කිරිම සඳහා අමාත්‍යාංශයේ සෘජු අධීක්‍ෂණය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, හෝමියෝපති වෛද්‍ය සභාව සහ හෝමියෝපති රෝහල ක්‍රියාත්මකව පවතින අතර ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද ශික්‍ෂණ හා පර්යේෂණ රෝහල් 10 ක්ද ඔසු උයන් 7 ක්ද බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය සහ ආයුර්වේද වෛද්‍ය සභාව නම් ආයතන 3 ද ක්‍රියාත්මකව පවතී.

## විගණන නිරීක්ෂණ

### සෞඛ්‍ය අමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය

**ප්‍රතිපාදන හා උපයෝජනය**

2023 වර්ෂය තුළ ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දේශීය වෛද්‍ය අංශයේ මූලධන වියදම් සඳහා රු. මිලියන 14.4 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 359.6 ක්ද ප්‍රතිපාදනය කර තිබුණු අතර මූලධන ප්‍රතිපාදනවලින් සියයට 77.63 ක් හෙවත් රු. මිලියන 11.18 ක්ද පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 98.93 ක් හෙවත් රු.මිලියන 355.76 ක්ද වැයකර තිබුණි.

**ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම සනාථ කර නොගෙන දීමනා ගෙවීම.**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් 2023 වර්ෂය තුළදී අමාත්‍යාංශයේ සේවකයන්ට අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු. මිලියන 5.23 ක් ගෙවා තිබුණි.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

2023 වර්ෂයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 63.88ක මූලධන ප්‍රතිපාදන හා රු.මිලියන 1,975.46 පුනරාවර්තන ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 50.73ක මූලධන වියදමක් හා රු.මිලියන 1,942.9 ක පුනරාවර්තන වියදමක් දරා තිබුණි.

**පංචකර්ම මධ්‍යස්ථාන නියාමනය**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රම භාවිතය නියාමනය කළ නොහැකි වී තිබුණි.

**අතිකාල දීමනා පාලනය**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් 2023 වර්ෂය තුළදී ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවකයින්ට අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.මිලියන 53.32 ක් ගෙවා තිබුණි.

**නිශ්කාර්ය වියදම්**

ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, 2005 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 1,171.86 ක් වැය කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් දෙපාර්තමේන්තුවෙ වැය විෂයයන් මඟින්

ආවරණය කරමින් තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම නිශ්කාර්ය බව නිරීක්ෂණය විය.

**අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන යන්ත්‍ර මිලට ගැනීම.**

අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර එයින් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2023 දෙසැම්බර් 31 දිනය වන විටත් සවිකර නොතිබුණි. පිරිවැය රු. මිලියන 14.59 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම් වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද 2023 වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු සම්පූර්ණ මුදලම අනාර්ථික වියදමක් වී තිබුණි.

**යෝජිත කළමනාකරණ දත්ත පද්ධතිය සකස් නොකිරීම**

දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, 2024 මැයි මාසය අවසන් වන විටද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැතුණි.

**වත්කම්වල අයිතිය පවරා නොගැනීම**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා ඉඩම් 19 ක් සඳහා 2023 වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත හිමිකම් සහතික ලබාගෙන නොතිබුණි.

**ඌන උපයෝජිත වත්කම්**

බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288 ක ධාරිතාවයෙන් 120 ක් හෙවත් සියයට 42 ක්ද රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274 කින් 76 ක් හෙවත් සියයට 28 ක්ද ඌන උපයෝජිතව පැවතුණි. එසේම නව ගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88 ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ

පැරණි ගෙවන වාට්ටු 32 කින් 08 ක් ඌන උපයෝජිතව පැවති බවද නිරීක්ෂණය විය.

## ආයුර්වේද වෛද්‍ය සභාව

**ආයුර්වේද වෛද්‍යවරුන් නියාමනය නොකිරීම**

2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 13,016 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි.

**වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව පවත්වා නොගැනීම.**

2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 27,205 ක් බවත්, මියගිය සංඛ්‍යාව 4,024 ක් බවත් වර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාළ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩ කඩ පැවතුණි.

**ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යසාධනය නියාමනය නොකිරීම.**

ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා හෛසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම අඩුවීම**

2023 වර්ෂයේ සංස්ථාවේ මුළු විකුණුම් ඇස්තමේන්තුව රු.මිලියන 1,700 ක් වූ අතර තත්‍ය ආදායම රු. මිලියන 1,215.28 ක් විය. ඉන් රු.මිලියන 770.88 ක් හෙවත් සියයට 63 ක්ම රාජ්‍ය අංශයෙන් ලැබී තිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණු ආදායම රු.මිලියන 444.4 ක් හෙවත් සියයට 37 ක් විය. ඒ අනුව නිරායාසයෙන් ලැබෙන

රාජ්‍ය අංශයේ ඉල්ලුම සපුරාලීම සඳහා පමණක් වැඩි අවධානයක් යොමු කිරීමත්, වෙළඳපොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීමත් හේතුවෙන් පෞද්ගලික අංශයේ විකුණුම් අදායම සාපේක්ෂව අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකිරීම**

2017, 2018 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබි තිබුණු රු.මිලියන 97 කින් රු.මිලියන 26.15 ක් හෙවත් සියයට 27ක් 2024 අප්‍රේල් 30 වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

**රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම**

රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.මිලියන 45.73 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම, රු.මිලියන 37 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.මිලියන 12.14 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2024 අප්‍රේල් 30 වන විට වසර 05 ක් ගතවී තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණු අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබු මුදල අනාර්ථික බවට පත්ව තිබුණි.

**අනුමැතියකින් තොරව දිරි දීමනා ගෙවීම**

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ නියමයන්ට පටහැනිව 2023 වර්ෂයේදී නිෂ්පාදන දිරි දීමනා රු. මිලියන 28.51ක්, පැමිණිමේ දීමනා රු. මිලියන 10.46ක්, ඵලදායිතා දීමනා රු. මිලියන 43.48ක් ද, වශයෙන් එකතුව රු. මිලියන 82.45ක් ගෙවා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 09 තුළදී රු. මිලියන 676 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් කටයුතු නොකිරීම**

2023 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව අලෙවි සැල් 15ක හා නිමි තොග ගබඩා 02ට අදාලව රු. මිලියන 10.92 ක් වටිනා නිමි තොග ඒකක 33,053 ක ඌනතාවයන් හා අලෙවි සැල් 11ක හා නිමි තොග ගබඩාවකට අදාලව රු. මිලියන 4.3 ක් වටිනා නිමි තොග ඒකක 8,841ක අතිරික්තයක් පැවැති නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**පරිත්‍යාග ලෙස ඖෂධ නොමිලේ නිකුත් කිරීම**

සංස්ථාව විසින් අවස්ථා 160 කදී රු. මිලියන 2.13 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු. මිලියන 1.54 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදා හැරීම් වියදම් යටතේ දක්වා තිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව පරිත්‍යාග ලබාදීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට 2019 ජුලි 08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර වසර 05කට ආසන්න කාලයක් ගතවී තිබුණද මෙතෙක් එකී මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

# විදේශ කටයුතු

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නියමුවා ලෙස ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලි සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම විදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වේ.

ඉහත මෙහෙවර ඉටුකිරීම සඳහා විදේශීය වශයෙන් මහකොමසාරිස් කාර්යාල 12 ක්, තානාපති කාර්යාල 35 ක්, එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩල 2 ක්, නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාල එකක්, කොන්සල් ජනරාල් කාර්යාල 10 ක් හා නියෝජිත කාර්යාලයක් වශයෙන් ගෝලීයව ව්‍යාප්ත වී ඇති විදේශ දූත මණ්ඩල 61 කින් සමන්විත ජාලයක් පවත්වා ගෙන යනු ලබයි. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය ද මෙම අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කරනු ලබයි.

ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා 2023 වර්ෂයේදී විදේශ කටයුතු අමාත්‍යාංශයට රු. මිලියන 19,000 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 16,977 ක් උපයෝජනය කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

**විදේශයන්හි මියගිය/ආපදාවන්ට ලක්වූ ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්දි මුදල් ගෙවීම.**

2010 හා ඊට පෙර වර්ෂවලදී කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා ගොස්, අනතුරු හේතුවෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකු වෙනුවෙන් වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපිගොනු කාල ප්‍රමාදයන් හේතුවෙන් වසා දැමීමට කම්කරු අධිකරණය තීරණය කර ඇති බව කටාර් විදේශ දූත මණ්ඩලයේ තානාපති 2022 වර්ෂයේදී දන්වා තිබුණි. මෙහිදී ඉල්ලුම්කරුවන් නිසි පරිදි ලියවිලි කාලීනව ඉදිරිපත් කර තිබියදී කටාර් තානාපති කාර්යාලයේ නිලධාරීන් නියමිත කාලවකවානු තුළ වන්දි ලබා ගැනීමට වගකිව යුතු අන්දමින් ක්‍රියාත්මක නොවීම මත වින්දිතයන්ට වන්දි හා දීමනා ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශගත වූ තැනැත්තෙකු හදිසි අනතුරකින් 2012 සැප්තැම්බර් 10 වන දින මිය ගොස් තිබුණු අතර කටාර් ප්‍රාථමික අධිකරණය වන්දි වශයෙන් (Blood money) කටාර් රියාල් 200,000 ක් ළඟම ඥාතියාට (NOK) ගෙවන ලෙස නියම කර තිබුණි. එසේවුවද, එම මුදල් නොගෙවීම හේතුවෙන් නඩුව ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා බලය පවරමින් නෛතික ලියවිලි 2013 නොවැම්බර් 25 දින තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබු නමුත් විගණිත දිනය දක්වාම වන්දි අයකර ගැනීමක් කර නොතිබුණි.

විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් මරණයට පත්වීම, රැකියා අහිමි වීම, අර්ධ හෝ පූර්ණ වශයෙන් ආබාධිත තත්ත්වයට පත්වීම හේතුවෙන් අදාළ පාර්ශවයන්ට ගෙවීම සඳහා වන්දි, රක්ෂණ, සේවය අවසන් කිරීමේ

වැටුප් යනාදි වශයෙන් විදේශයන්ගෙන් ලද රු. මිලියන 56.92 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාලයක සිට අදාළ පුද්ගලයන්ට ගෙවීමට කටයුතු නොකර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

තවද, පහත සඳහන් වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- සෞදි අරාබියේ රැකියාවක් සඳහා ගොස් තිබුණු පුද්ගලයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම.


- කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා 2009 දෙසැම්බර් 19 දින විදේශගත වූ තැනැත්තියක් 2012 ජනවාරි 29 දින මිය යාම.

- වර්ෂ 17 ක පමණ කාලයක් කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවයෙහි යෙදී සිටි තැනැත්තියක් අසනීප වී සුරක්ෂාගාරයට පැමිණීම හා ඒ තුළදී මිය යාම.

- ජෙද්දාහීදි 2011 වර්ෂයේදී මරණයට පත් වූ පුද්ගලයෙකු සියදිවි නසා ගැනීමක්ද මරණයට පත් වීමක්ද යන්න සනාථ කර ගැනීම හා වන්දි ලබා ගැනීම.


**අග්‍රිම නිරවුල් නොකිරීම**

අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් දෙකක් පැවති අතර ඒවායෙහි පිළිවෙලින් රු. මිලියන 50.97 ක් හා රු. මිලියන 959.52 ක් වශයෙන් එකතුව රු. මිලියන 1010.49 ක ශේෂයක් පැවතුණි. මෙයින් රු. මිලියන 50.97 ක් වූ අග්‍රිම ශේෂය 2013 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාළව නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි. එම ශේෂයෙන් රු. මිලියන 32.47 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන ලද භාවිතයට නොගන්නා නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 103 කින් සමන්විත වී තිබුණි. වසාදමන ලද ෆ්රැන්ක්ෆර්ට් දූත මණ්ඩලයට අදාළ නිවාස සඳහා තබන ලද රු. මිලියන 2.23 ක ආරක්ෂිත තැන්පතු ද ඒ තුළ පැවතුණ අතර ඉතිරි රු. මිලියන 18.5 නොපියවූ අතුරු අග්‍රිමවලින් සමන්විත වී තිබුණි.




රූප සටහන් අංක 2.21: 7002-0-0-35-13 -අග්‍රිම ගිණුමේ සංයුතිය

රු. මිලියන 959.52 ක ශේෂයක් පවතින අනෙක් අග්‍රිම ගිණුමේ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු. මිලියන 379.89 ක් විය. ඉන් රු. මිලියන 56.63 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වූ අතර රු. මිලියන 9.2 ක් වසා දමන ලද දූත මණ්ඩල තුනකට අදාළ නිවාස සඳහා තබා තිබූ ආරක්ෂිත තැන්පතු වී තිබුණි. තවද මෙම අග්‍රිම ගිණුමෙහි රු. මිලියන 7.1 ක නොපියවූ අතුරු අග්‍රිම ශේෂයක්ද පැවතුණි.




රූප සටහන් අංක 2.22 : 7002-0-0-35-23 -අග්‍රිම ගිණුමේ සංයුතිය

**වත්කම් කළමනාකරණය**

ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සතු ගොඩනැගිලි දෙකක් පිළිවෙලින් 2007 වර්ෂයේ හා 2012 වර්ෂයේ සිටද, 1972 වර්ෂයේ මිලදී ගෙන තිබූ ස්වීඩනයේ තානාපති නිල නිවාස ගොඩනැගිල්ල 2011 වර්ෂයේ සිටද, 1976 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ශ්‍රී ලංකා මහකොමසාරිස් නිල නිවස 2014 වර්ෂයේ සිටද භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර භාවිතයට නොගැනීම හේතුවෙන් 2023 වර්ෂයේදී නිල නිවාස කුළී වශයෙන් රු. මිලියන 173.54 ක් ගෙවීමට සිදු වී තිබුණි.

# වෙළඳ හා වාණිජ

“තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්” යන දැක්ම යටතේ, පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම පිණිස පිහිටුවා ඇති වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයත් ඒ යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන 08 ක් මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කර ගැනීමට අපේක්ෂිතය.

**කාර්යභාරයන්**

ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වන ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කිරීම.

පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වෙළඳපොල තරඟකාරිත්වය ඇති කිරීම, වෙළඳපොල අධීක්ෂණය, වැටලීම් කිරීම හා වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

දේශීය වෙළඳපොල තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.

ලෝක වෙළඳපොල තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

මෙම කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2023 වර්ෂයේදී ඉහත සඳහන් ආයතන වෙත රු. මිලියන 6,881 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට එයින් රු. මිලියන 6,147 ක් උපයෝජනය කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

### වෙළඳ , වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

**ප්‍රධාන අරමුණු ඉටු නොවීම**

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කර නිම කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතිය පවත්වාගෙන යෑම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමග සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම සහ ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම යන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**නීති අණපනත් යාවත්කාලීන නොකිරීම**

පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කටයුතු කඩිනම් කලයුතු නමුත් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය

දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත 2023 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.

**වෙළඳසැල් කුලී, විදුලි හා ජල බිල්අයකර නොගැනීම**

අමාත්‍යාංශය විසින් කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 2,178 ක ප්‍රමාණයක ස්ථාපිත කර ඇති වෙළඳසැල තුළ 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින්ද, 2023 අගෝස්තු සිට විගණිත දින දක්වා උමන්දාව ග්‍රීන් හට් නැමති ආයතනය විසින්ද ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් තිබුණු අතර එම මහලේ කුලී මුදල්, විදුලි බිල් හා ජල බිල්පත් සඳහා 2022 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා අමාත්‍යාංශ වැය ශීර්ෂය මඟින් දරා තිබූ රු. මිලියන 5.41 ක් විධිමත් ගිවිසුමක් මත අදාල ආයතන වලින් අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් උපකරණ සහ මිනුම් ප්‍රමිත සත්‍යාපනය නොකිරීම**

වෙළඳාම් සඳහා භාවිතා කරන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කලයුතු වුවද එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කර ගැනීමේ නිසි ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කර නොතිබුණි. තවද 2023 වර්ෂය තුලදී දිස්ත්‍රික්ක 12 ක් තුල මිනුම් ප්‍රමිතීන් නැවත සත්‍යාපනය කිරීමට සැලසුම් කර තිබුණද, දිස්ත්‍රික්ක 05 ක පමණක් එම කාර්යය ඉටුකර තිබුණි.

**නිෂ්කාර්යව පවතින විද්‍යාගාර**

2015 වර්ෂයේදී විද්‍යාගාර කාමර 66 ක් සහිතව ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා තිබුණද වර්තමානයේ මිනුම් ක්ෂේත්‍ර 12 ක් සඳහා විද්‍යාගාර කාමර 33 ක් පමණක් ක්‍රියාකාරීව පවත්වාගෙන යන අතර ඉතිරි කාමර 33 (වර්ග අඩි 140,060 ක ප්‍රමාණයක්) නිෂ්කාර්යව පැවතුණි.

## සි/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

**අලාභ ලැබූ ව්‍යාපෘති**

සමාගම විසින් 2015 වර්ෂයේ දී වී තොග රැස් කිරීම සඳහා ජංගම ගබඩා (Cocoon) 50ක් පිරිවැය රු.මිලියන 96.25 කට පිලිපීන රජයෙන් ආනයනය කර තිබූ අතර එම තොගයෙන් ඒකක 15 ක් පමණක් අලෙවිකර තිබුණි. වර්ෂ 7 කට අධික කාලයක් නොවිකිණී පැවති පිරිවැය රු. මිලියන 25.02 ක් වූ ඒකක 13 ක් 2022 වර්ෂයේදී හා පිරිවැය රු. මිලියන 42.35 ක් වූ ඒකක 22 ක් 2023 වර්ෂයේදී

රාජ්‍ය ආයතන සඳහා නොමිලේ බෙදා දී තිබූ බැවින් සමස්ත ව්‍යාපෘතියේ අලාභය රු. මිලියන 67.38ක් වී තිබුණි.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**හිඟ භාණ්ඩ සම්බන්ධයෙන් වැටලීම් ප්‍රමාණවත් නොවීම**

2023 වර්ෂයේ දී දේශීය කිරි සම්බා සහල් වෙළඳපොළ තුළ දැඩි හිඟයක් පැවතුණු අතර උපරිම සිල්ලර මිලක්ද පනවා තිබුණි. එසේ වුවද, කිරි සම්බා සහල් සම්බන්ධයෙන් වැටලීම් 596 ක් සිදුකර තිබුණු අතර එය අධිකාරිය විසින් 2023 වර්ෂයේ සිදුකර තිබූ සමස්ත වැටලීම් සංඛ්‍යාව වූ 24,848 න් සියයට 2 ක් පමණක් විය. තවද වෙළඳපොළ තුළ වරින් වර මිල සංශෝධනයන්ට ලක් වූ සහ හිඟ තත්ත්වයන් වාර්තා වූ ගෘහස්ත ගෑස් සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළ වැටලීම් 32ක් පමණක් සිදු කර තිබුණු අතර එය 2023 වර්ෂයේ අධිකාරිය විසින් සිදුකර තිබූ සමස්ත වැටලීම් සංඛ්‍යාවෙන් සියයට 0.1 ක් පමණක් වී තිබුණි.

**ගිවිසුම් කඩකිරීම හේතුවෙන් වන්දි මුදල් ගෙවීමට සිදුවීම**

අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන මඟින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා සිසිල් බීම, බෝතල් කළ පානීය ජලය, ආහාර පිසින තෙල්, දන්තාලේප, සබන්, ෂැම්පු, තීන්ත හා විදුලි උපාංග ආදී හඳුනාගත් නිෂ්පාදන කීපයක් සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහාධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මඟින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් එම ස්විට්සර්ලන්ත සමාගම සමඟ එළඹි ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් සමාගම විසින් අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර අධිකාරිය විසින් සමාගම වෙත සම්පූර්ණ ආයෝජන මුදල වූ රු. බිලියන 2.72 ක් ද, බේරුම්කරණ ගාස්තුව වශයෙන් එ.ජ.ඩොලර් 325,000 ක මුදලක් ද ගෙවියයුතු බවට නියෝග කර තිබුණි. එම ප්‍රදානයට එරෙහිව අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් අභ්‍යන්තර විමර්ශණයක් පවත්වා නොසැලකිලිමත්භාවය සහ අකාර්යක්ෂමතාවය ආදිය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.


## ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**වෙළඳ ලකුණු සම්බන්ධ කටයුතු සඳහා අධික කාලයක් ගත කිරීම**

2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණු වෙළඳ ලකුණු අයදුම්පත් අතරින් 2023 දෙසැම්බර් 31 වන විට අයදුම්පත් 12,898 ක වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබූ අතර 2023 වර්ෂයේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධයෙන් සිදුකළ නියදි පරීක්ෂාවේදී, ලියාපදිංචිය සඳහා වර්ෂ 2 සිට වර්ෂ 28 දක්වා කාලයක් ගතකර තිබූ අවස්ථා 27 ක් පැවතුණි. තවද ගාස්තු නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත් වෙළඳ ලකුණු ගැසට් පත්‍රයේ පළ කිරීම සති 04 ක කාලයක් තුළ සිදු කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විට ගාස්තු ගෙවා ඇති නමුත් ගැසට් නොකළ වෙළඳ ලකුණු සංඛ්‍යාව 690 ක් විය. එසේම 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතික්ෂේපිත වෙළඳ ලකුණු අයදුම්පත් 1,923 කින් වර්ෂ එකකට අඩු කාලයකදී අයදුම්පත් 62 ක් පමණක් ප්‍රතික්ෂේප කර තිබූ අතර අයදුම්පත් 37 ක් සඳහා වර්ෂ 5ක් ද, අයදුම්පත් 104 ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 4 ක් ද, අයදුම්පත් 1,720 ක් සඳහා වර්ෂ 01 සිට වර්ෂ 02 ක අතර කාලයක් ද, ගතකර ප්‍රතික්ෂේප කර තිබුණි.

# මහාමාර්ග

මහා මාර්ග ජාලය රටක වඩාත් වටිනාම සහ වඩාත් සුවිශාල වූ සාමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික, සමාජයීය, සංස්කෘතිමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද සමාජ සුභසාධනය උදෙසා ඉතා වැදගත් අංශයක් ලෙස පිළිගෙන ඇත. ඒ අනුව ආර්ථික අංශ වලට සමානව සේවා හා යටිතල පහසුකම් සැපයීමෙන් නාගරික හා ග්‍රාමීය සංවර්ධනයේ විෂමතාවයට පිළියමක් වශයෙන් කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම මූලික අවශ්‍යතාවයක් ලෙස රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති තුළින් හඳුනා ගෙන ඇත. රට තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම උදෙසා රජය විසින් නිරන්තරයෙන් ආයෝජනයන් සිදු කරනු ලබන අතර, ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලීම උදෙසා මහා මාර්ග අංශය සඳහා සමස්ථයක් ලෙස ඉතා ඉහළ ආයෝජනයක් සිදුකරනු ලැබේ. ඒ අනුව ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ග ද ඇතුළත්ව රටේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් මහී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම, මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මෙම අංශය සඳහා සිදුකරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය වටිනාකමක් උත්පාදනය කරනු ලබන බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකාවේ ජාතික මහා මාර්ග ජාලය 2023 වර්ෂය අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී.12,568 කින් යුක්ත වන අතර එය “ඒ” ශ්‍රේණියේ මහා මාර්ග දුර කි.මී. 4,217.42 කින් ද, “බී” ශ්‍රේණියේ මහා මාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 8,037.98 කින්ද, අධිවේගී මාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 312 කින්ද, පාලම් 4,254 කින්ද සමන්විත වේ.




රූප සටහන් අංක 2.23 : ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය

2023 වර්ෂයේ මහාමාර්ග අංශයේ වාර්ෂික ඇස්තමේන්තු අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

| | |
|---|---|
| **කාර්යභාරයන්** | මාර්ග හා මහා මාර්ග විෂයයට සහ සංස්ථාපිත ආයතනවලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම. |
| | ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ සම්බන්ධ කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇති වන ලෙස උසස් තත්වයෙන් |


යුක්ත වන පරිදි ජාතික මහා මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

අධිවේගී මාර්ග ගාස්තු නියම කිරීම, රැස්කිරීම හා නියාමනය කිරීම.

රජයේ ප්‍රමුඛතාවය සහ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගනිමින් ප්‍රාදේශීය සහ පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කර ඒවා සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.

## ප්‍රතිපාදන උපයෝජනය

2023 වර්ෂයේදී ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වැය ශීර්ෂය සඳහා රු.මිලියන 377,837 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 250,575 ක් උපයෝජනය කර තිබුණි. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා 2023 වර්ෂය හා ඊට පෙර වසර 05 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය, වියදම් කළ ප්‍රමාණය හා ඉතිරිය පහත පරිදි වේ.




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය (රු.මිලියන) | 218,534 | 284,665 | 298,027 | 410,118 | 272,062 | 377,837 |
| වියදම (රු.මිලියන) | 185,920 | 177,644 | 258,646 | 230,297 | 214,962 | 250,575 |
| ඉතිරිවීම (රු.මිලියන) | 32,614 | 107,021 | 39,382 | 179,821 | 57,099 | 127,262 |

රූප සටහන් අංක 2.24 : පසුගිය වසර 6 ක කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශයට ලබා දී තිබුණු ප්‍රතිපාදන, උපයෝජනය සහ ඉතිරිය

මූලාශ්‍ර - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2018 සිට 2021 දක්වා වූ ඉකුත් වසර 06 ක කාලය තුල ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණු සමස්ථ ප්‍රතිපාදනය රු.මිලියන 1,861,243 ක් වූ අතර සමස්ථ වියදම රු.මිලියන 1,308,044 ක් වූයෙන් සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 553,199 ක් හෙවත් සියයට 30 ක් උපයෝජනය කර නොතිබුණි.

## විගණන නිරීක්ෂණ

### මාර්ග සංවර්ධන අධිකාරිය

**මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම**

උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස් කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට විෂය භාර අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 6 (1) වගන්තිය යටතේ පිහිට විය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා තිබුණද, එම සභාව ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

**ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම**

පනතේ 7(1) වගන්තිය ප්‍රකාරව සෑම දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවක් පත් කර එම පනතේ 7(3) වගන්තිය ප්‍රකාරව මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**මාර්ග වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබීම**

මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් A සහ B ශ්‍රේණි වලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කි.මී. 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග 285 කට අයත් කි.මී. 3,267 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව සමස්ත මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 73 ක ප්‍රතිශතයක් වූ කි.මී. 8,958 ක මාර්ගයන්හි වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**අධිකාරියේ විෂය පථයට අයත් නොවූ මාර්ග ප්‍රතිසංස්කරණය**

මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග කි.මී. 6,426 ක් ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා වැය කළ රු.මිලියන 3,810 ක් ද ඇතුළත්ව, මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් නොවූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 147,153 ක් වැය කර තිබුණි.

**හිඟ බැරකම් පියවීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම**

දේශීය බැංකු මගින් ලබාගත් ණය මුදල් සඳහා ණය පොලිය සහ වාරික ලෙස 2023 දෙසැම්බර් 31 දිනට හිඟව තිබූ බැරකම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලා තිබූ අතර ඒ සඳහා රු.මිලියන 39,956 ක භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කර තිබුණි. ඊට අමතරව මාර්ග කි.මී. 100,000 යේ වැඩසටහනට අදාලව කොන්ත්‍රාත්කරුවන් 34 දෙනෙකු වෙත ගෙවීමට තිබුණු රු.මිලියන 9,298 ක් සඳහා ද මධ්‍යම අධිවේගී මාර්ග ඉදිකිරීම් II කොටසේ බිල් පියවීම සඳහා රු.මිලියන 11,582 ක් සඳහා ද 2023 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබුණි.

**2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ණය ශේෂ**

අධිකාරිය විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට දේශීය බැංකු මගින් ලබාගත් ණයවලින් ආපසු ගෙවීමට ඇති ණය ශේෂය රු.මිලියන 408,541 ක් වූ අතර, ණය ලබාගැනීම නිසා වසර 06 ක කාලය තුළ දේශීය වාණිජ බැංකු වෙත ගෙවීමට සිදු වී තිබුණු පොළී ප්‍රමාණය රු.මිලියන 178,028 ක් වී තිබුණි. තවද, 2023 වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය පොළිය රු.මිලියන 36,086 ක් ද, ගෙවිය යුතු ණය වාරික වටිනාකම රු.මිලියන 342,070 ක් ද විය.

**කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම්**

2020 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම සඳහා ඉදිකිරීම් අරක්ෂණ අරමුදල වෙත රු.මිලියන 32,553.12 ක් නිදහස් කර තිබුණි. එසේ නිදහස් කල මුදලින් රු.මිලියන 224.2 ක් 2023 වර්ෂය අවසන් වන විට අදාළ අරමුදල මගින් රඳවාගෙන තිබුණි. කොන්ත්‍රාත් 212 කට අදාළ රු.මිලියන 1,492.82 ක වටිනාකමින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සහ රු.මිලියන 29.94 ක් වටිනා බිල්පත් ඉහත ක්‍රමවේදයෙන් බැහැරව ඍජුව කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණු අතර එම රු.මිලියන 29.94 ක බිල්පත් ව්‍යාජ ඒවා බව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් අනාවරණය කර ගෙන තිබුණි.

**අධිවේගී මාර්ග ගාස්තු ආදායම් වංචා කිරීම**

දක්ෂිණ අධිවේගී මාර්ගයේ අධිවේගී මාර්ග ගාස්තු ආදායමෙන් රු. මිලියන 2.07 ක් රාජකාරී සිදු කළ නිලධාරීන් 16 දෙනෙකු විසින් 2021 වර්ෂයේ සිට 2023 අගෝස්තු 30 දින දක්වා කාලය තුළ වංචා කර ඇති බව අනාවරණය වී තිබුණි. දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද අයකැම් පද්ධතිය නිසි පාලනයකින් තොරව මේ දක්වා ක්‍රියාත්මක කිරීම සහ නවීන තාක්ෂණය අනුව ගෙවීම් සිදු කළ හැකි මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු නොකිරීම තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන්

කරන වාහන වලින් දෛනික අය විය යුතු ආදායමින් සැළකිය යුතු ප්‍රතිශතයක් වංචා කිරීමට ඉඩ කඩ සලසා තිබුණි.

**අධිවේගී මාර්ගයේ ස්ථාපිත කර ඇති වත්කම් ආරක්ෂා කර ගැනීම**

දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් රු.මිලියන 767,630 ක පමණ වටිනාකමකින් යුතු අධිවේගී මාර්ග කි.මී. 312.6 ක් ඉදිකර තිබුණු අතර මෙම සියලු මාර්ගයන්හි පරිපාලන හා මෙහෙයුම් කටයුතු අධිකාරිය වෙත පවරා තිබුණි. ශ්‍රී ලංකා පොලිසියට පහසුකම් සැපයීම ඇතුළුව මෙහෙයුම් කටයුතු සඳහා රු.මිලියන 2,000 කට වැඩි පිරිවැයක් වාර්ෂිකව දරමින් පැවතිය දී, අධිවේගී මාර්ගයේ ස්ථාපිත කර ඇති වත්කම් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක වැඩපිළිවෙළක් සකස් කිරීමට අධිකාරිය අපහොසත් වී තිබුණි. සියලු හානි වාර්තා කිරීමේ වැඩපිළිවෙලක් සකස්කර නොතිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ගයන්ට අදාළව වාර්තා වී තිබුණු දේපළ සොරකම් කිරීම හා හානිවීම්වල වටිනාකම පමණක් රු.මිලියන 913.17 ක් බවට ඇස්තමේන්තු කර තිබුණි.

## මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම්

### සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්) සමාගම

**සමාගම සංස්ථාගත කිරීම**

අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතියකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියේ පූර්ණ හිමිකම්කාරිත්වය යටතේ අනුබද්ධිත සමාගමක් ලෙස “එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්” පිහිටුවීමට අදාළව අංක. 1551/2014 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2014 අප්‍රේල් 07 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. උක්ත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සමඟ යෝජිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ කෙටුම්පතක් හෝ ඉදිරිපත් කර නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසලකා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවිධිමත් ලෙස අනුමැතිය ලබාදී තිබීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගමක් ලෙස 2007 අංක 07 දරන සමාගම් පනත අනුව 2014 මැයි 06 දින PV 98435 අංකය යටතේ සමාගම සංස්ථාගත කර තිබුණි.

**සංස්ථාගත කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය**

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සමාගමක් පිහිටුවීමට ප්‍රතිපාදන නොමැති බවට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ මත පදනම්ව “එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්” සමාගම මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පූර්ණ වශයෙන් රජය (මහා භාණ්ඩාගාරය) සතු සමාගමක් වශයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ස්ථාපිත කලයුතු බවටත් “නව සමාගම මහා භාණ්ඩාගරයේ සෘජු

අධීක්ෂණයට යටත් විය යුතු අතර සමාගමේ හිමිකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන" ඇතුළත්ව සාංගමික ව්‍යවස්ථාවලිය සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවටත් 2014 මැයි 08 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද එයට අනුගත වී නොතිබුණි.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අඛණ්ඩව ගිණුම් වර්ෂ 08 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

මෙම සමාගම අසාර්ථක වීම හේතුවෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරීම හා ඈවරකරුවෙකු හරහා සමාගමේ කටයුතු අවසන් කිරීමට 2023 ජුනි 26 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත නියම කර තිබුණි. ඒ අනුව රු. මිලියන 216 ක වටිනාකමකින් යුතු සුඛෝපභෝගී බස්රථ 20 ක් හා අධිවේගී මාර්ගයේ බස් රථ ධාවන වාරවලින් සියයට 15 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරා දී තිබුණු නමුත් සමාගම ඈවර කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින දක්වා නිමකර නොතිබුණි.

## මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන පුද්ගලික සමාගම

**සමාගම සංස්ථාගත කිරීම**

අමාත්‍ය මණ්ඩලයේ, භාණ්ඩාගාරයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන පුද්ගලික සමාගම පිහිටුවීම සඳහා අංක 795/2004 දරණ 2004 ජුනි 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබුණි. එකී තීරණයට අනුව උක්ත සමාගම 2004 ජුනි 10 දින PV 37809 දරණ අංකය යටතේ සංස්ථාගත කර තිබුණි.

**සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය**

සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු.100 බැගින් වූ කොටස් මිලියනයක් එනම් රු.මිලියන 100 ක කොටස් ප්‍රාග්ධනයකින් සමන්විත විය යුතු වුවත් සමාගමේ ප්‍රවර්ථකයන් ලෙස රු.100 ක කොටස බැගින් මාර්ග සංවර්ධන අධිකාරියට සහ පෞද්ගලික පාර්ශවයකට කොටස් 02 ක් නිකුත් කර තිබුණි. 2013 පෙබරවාරි 14 දින පැවැත් වූ රැස්වීමේදී සංශෝධනය කරන ලද අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ අයිතියෙන් වැඩි කොටසක් භාණ්ඩාගාරයට හිමිවන පරිදි හා ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ

සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට ගෙන තිබූ ප්‍රතිපත්තිමය තීරණ මේ දක්වා ක්‍රියාත්මත කර නොතිබුණි.

**අධිකාරියට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් නොලැබීම**

සමාගමේ ප්‍රධාන ගනුදෙනුකරු මාර්ග සංවර්ධන අධිකාරිය වූ අතර සමාගමේ මෙහෙයුම් සඳහා භාවිතා කරන ස්ථාවර වත්කම්වලින් වැඩි ප්‍රතිශතයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දී තිබුණි. අවසන් වරට විගණනයට ඉදිරිපත් කර තිබුණු 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ වාර්ෂික අලෙවි අදායම රු. මිලියන 238 ක් වූ අතර එයින් සියයට 94 ක් එනම් රු. මිලියන 223 ක් මාර්ග සංවර්ධන අධිකාරියට සිදු කල විකුණුම් විය . එහෙත් ඒ සඳහා පසුගිය වසර 17 ක කාලය තුල අධිකාරියට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලබා දී නොතිබුණි.

## මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම

**සමාගම සංස්ථාගත කිරීම**

අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්ති තීරණයකින් තොරව, භාණ්ඩාගාරයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම පිහිටුවීම සඳහා අංක 795/2004 දරණ 2004 ජුනි 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබුණි. එකී තීරණයට අනුව උක්ත සමාගම 2004 ජුනි 11 දින PV 37844 දරන අංකය යටතේ සංස්ථාගත කර තිබුණි.

2013 පෙබරවාරි 18 දිනැති අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ අයිතියෙන් වැඩි කොටසක් භාණ්ඩාගාරයට හිමි වන පරිදි හා ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට ගෙන තිබූ තීරණය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

**කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා රු. මිලියන 193,518 ක වැඩ ඇණවුම් 2481 ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සීමා සහිත මහනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම වෙත 2020, 2021, 2022 වර්ෂ තුළ ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 131,650 ක වැඩ ඇණවුම් 1824 ක කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර තිබූ අතර රු.මිලියන 32,736 ක වැඩ ඇණවුම් 351 ක් අවලංගු කර තිබුණි. තවත් රු. මිලියන 29,130 ක වැඩ ඇණවුම් 306 ක කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර නොතිබුණි.

**සේවා සැපයුම්කරුවන් හරහා කොන්ත්‍රාත් වැඩ සිදුකිරීම**

කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර තිබූ වැඩ ඇණවුම් 1824 න් රු.මිලියන 5,920 ක වැඩ ඇණවුම් 71 ක කොන්ත්‍රාත් වැඩ පමණක් සමාගම විසින් සෘජුව සිදු කිරීම සඳහා භාර ගෙන තිබූ අතර මාර්ග සංවර්ධන

අධිකාරියේ අංක 2008/1109 හා 2008 අගෝස්තු 01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුගත නොවී රු. මිලියන 125,730 ක වැඩ ඇණවුම් 1753 ක කොන්ත්‍රාත් වැඩ, සේවා සැපයුම්කරුවන් හරහා සිදු කර ගැනීමට කටයුතු කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය සියයට 25 ක ලාභාන්තිකයක් සහිතව සමාගමට ලබා දී තිබූ වැඩ ඇණවුම් සමාගම විසින් සියයට 20 ක ලාභාන්තිකයක් සහිතව උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. සමාගම, මාර්ග සංවර්ධන අධිකාරිය හා සේවා සපයන්නන් අතර, අතරමැදියෙකු ලෙස මේ ආකාරයෙන් ක්‍රියාකර සියයට 05 ක ලාභාන්තිකය වශයෙන් 2021 වර්ෂය තුළ රු.මිලියන 652 ක් උපයා ගෙන තිබුණි.

කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා සමාගම මෙම සේවා සපයන්නන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබූ අතර විනිවිදභාවයකින් තොරව කටයුතු කර තිබුණි.

**කලාප සම්බන්ධිකාරකවරුන් බඳවා ගැනීම**

කි.මී. 100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් හා ප්‍රගතිය ඇගයීම සඳහා පළාත්, දිස්ත්‍රික්ක හා කලාප සම්බන්ධිකාරකවරුන් බඳවා ගෙන තිබූ අතර, 2021 වර්ෂය තුළ මොවුන් වෙනුවෙන් රු.මිලියන 39 ක් ගෙවා තිබුණි. නිසි හා විනිවිදභාවයකින් මෙම සම්බන්ධිකාරකවරුන් බඳවා ගත්තේ ද යන්න හා මොවුන්ගෙන් ඉදිකිරීම් ප්‍රගතිය ඇගයීම සත්‍ය වශයෙන් සිදු වූයේ ද, යන්න විගණනයට අනාවරණය නොවිය.

**අධිකාරියට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලැබී නොතිබීම**

සමාගමේ පූර්ණ හිමිකම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවතියද පසුගිය වසර 17 ක කාලය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

## මහනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම

**නිෂ්පාදන කටයුතු**

ශක්‍යතා අධ්‍යනයන් සහ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා සැපයීමත්, මාර්ග ඉදිකිරීම් කටයුතු සහ පුනරුත්ථාපන අංශය සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම සමාගම පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුවත් 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 දරන කැබිනට් තීරණයට අනුව සමාගම ඈවර කර මෙහෙයුම් කටයුතු අවසන් කරන තෙක් Cold mix නිෂ්පාදන අලෙවිය හා ඉදිකිරීම් කටයුතු පමණක් සිදුකර තිබුණි.

ඉදිකිරීම් කර්මාන්තය මූල්‍ය අර්බුදයකට ලක්වීම හේතුවෙන් ප්‍රමාණවත් තරම් ව්‍යාපාරික අවස්ථා නොමැති වීම තුළ මෙම සමාගම ඇතුළුව ඉහත මහනැගුම සමාගම් තුන ඈවර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කිරීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කර තිබුණු අතර මාර්ග

සංවර්ධන අධිකාරියේ එකඟතාවයකින් තොරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇවරකරුවෙකු පත්කර තිබුණි. ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය (VRS) යටතේ මෙම සමාගමේ සියලු සේවකයින් සේවයෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණද, සමාගමේ මෙහෙයුම් කටයුතු නවතා ඇති පසුබිමක ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වූ කාර්ය මණ්ඩලයෙන් 25 දෙනෙකු සමාගමේ ඇවර කිරීමේ කටයුතු සඳහා සහය වීම වෙනුවෙන් නැවත බඳවාගැනීමට 2023 අගෝස්තු 11 දින අධ්‍යක්ෂ මණ්ඩලය නැවත තීරණය කර තිබුණි. 2023 මැයි මස වන විටත් සමාගමේ ඇවර කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර, 2023 සැප්තැම්බර් සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ මොවුන්ට වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 7.79 ක මුදලක් ගෙවා තිබුණි.

## රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය

### විකල්ප මාර්ග කි.මී. 100,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන

**ව්‍යාපෘති කටයුතු අතරමඟ නතර කිරීම**

මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ දී ආරම්භ කර 2020 – 2023 කාල සීමාව තුළ රු.මිලියන 167,306 ක් වැයකර තිබූ අතර සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද මාර්ග කි.මී. 17,847 න් කි.මී. 11,549 ක් හෙවත් සියයට 65 ක් අතරමඟ නතර කර තිබුණි.

ව්‍යාපෘතියේ අතරමඟ වැඩ නවතා දමන ලද මාර්ග නැවත ධාවන තත්ත්වයට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදී තිබූ අනුමැතිය නොසලකා රු.මිලියන 2,891.24 ක් වූ ඇස්තමේන්තු පිරිවැයකින් යුතු නව මාර්ග කි.මී. 212.3 ක් සංවර්ධනය කිරීමට තෝරා ගෙන තිබුණි.

**කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවීම්**

ව්‍යාපෘතිය විසින් ලබාගත් සේවාවන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට ඇති බැදීම් පිළිබඳ නිවැරදි ගණනය කිරීමකින් තොරව අවස්ථා දෙකකදී භාණ්ඩාගාරයෙන් රු.මිලියන 40,651.55 ක් වූ බැඳුම්කර නිදහස් කර ගෙන තිබුණි. එකී කොන්ත්‍රාත්කරුවන් 9 දෙනෙක් වෙත ගෙවන ලද රු.මිලියන 121.24 ක වටිනාකමට අදාළ සේවාවන් සපයා නොමැති බව පසුව හඳුනා ගෙන තිබුණි. එකී වැඩිපුර ගෙවූ වටිනාකමට සමාන මුදලක් කොන්ත්‍රාත්කරුවන් විසින් ආපසු ගෙවා තිබූ නමුත් එම මුදල් මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව විධිමත් අධිකාරී බලයකින් තොරව වෙනත් වියදම් සඳහා යොදවා තිබුණි. ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන විනයානුකූල කටයුතු කිරීමට හා ඒ මත රජයට සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**කාර්යසාධන බැඳුම්කර අය නොකිරීම**

මෙම ව්‍යාපෘතියට අදාළව ඉදිකිරීම් අරක්ෂණ අරමුදල විසින් කොන්ත්‍රාත්කරුවන් 313 දෙනෙකු සඳහා රු.මිලියන 1,800 ක කාර්යසාධන බැඳුම්කර සහ රු.මිලියන 452.2 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර ලබා දී තිබුණි. 2023 වර්ෂය අවසන් වන විට වර්ෂ 2 කට වැඩි කාලයක සිට කිසිදු කාර්යයක් ආරම්භ නොකල කොන්ත්‍රාත් පැකේජ 09 කට අදාළ රු.මිලියන 52.73 ක්ද ඇතුළුව කොන්ත්‍රාත්කරුවන් 22 කුට ගෙවා තිබූ රු.මිලියන 259.26 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම අරමුදලින් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

## මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

කඩවත සිට දඹුල්ල දක්වා කි.මී. 170 ක මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති I හා II, කොටස් පිළිවෙලින් 2020 හා 2017 වර්ෂයන්හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ අතර, III කොටසේ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම 2021 වර්ෂයේදී හා IV කොටසේ ඉඩම් පවරා ගැනීමේ හා ප්‍රසම්පාදන කටයුතු 2016 වර්ෂයේදී යනාදී වශයෙන් ආරම්භ කර තිබුණි. ඊට අදාළ රු.මිලියන 638,072 ක් වූ ඇස්තමේන්තු වටිනාකමින් සියයට 42 ක් හෙවත් රු.මිලියන 268,363 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම්, ඉඩම් අත්පත් කර ගැනීම් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා වැයකර තිබුණි.

| අදියර | දුර ප්‍රමාණය කි.මී. | ඇස්තමේන්තුගත ව්‍යාපෘති වටිනාකම (රු. මිලියන) | 2023-12- 31 දිනට වියදම (රු.මිලියන ) | භෞතික ප්‍රගතිය හා වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය I (කඩවත සිට මීරිගම දක්වා) | 36.59 | 177,220 | 94,917 | 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 35.95ක් වූ අතර 2024 ජූලි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 36.02ක් විය. |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය II (මීරිගම සිට කුරුණෑගල දක්වා) | 40.91 | 149,021 | 151,510 | 2022 ජනවාරි 15 දින වන විට වැඩ අවසන් කර මහජනයා සඳහා භාවිතයට විවෘත කර තිබුණි. |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය III (පොතුහැර සිට ගලගෙදර දක්වා) | 34.12 | 132,000 | 19,597 | 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ පළමු කොටසේ ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය- කොන්ත්‍රාත් පැකේජ 17න් පැකේජ 16 ක 12% - 43% අතර පරාසයක පැවති අතර ඉතිරි පැකේජයේ ප්‍රගතිය 75% ක් විය. දෙවන කොටසේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කර තිබුණද ආයෝජකයෙකු නොමැති වීම නිසා ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය IV | 59.30 | 179,831 | 2,339 | 2016 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබූ |

| | | | | |
|---|---|---|---|---|
| (කුරුණෑගල සිට දඹුල්ල දක්වා) | | | | අතර 2022 වර්ෂය අවසාන වන විට පුද්ගලික ඉඩම් කැබලි 3505ක් අත්පත් කර ගෙන තිබුණි. අවස්ථා 03 කදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර තිබූ නමුත් අසාර්ථක වී තිබුණි. 2022 දෙසැම්බර් 13 වන දින සිට අත්හිටුවා ඇත. |
| එකතුව | 170.92 | 638,072 | 268,363 | |

වගු අංක 2.14 : 2023-12- 31 දිනට මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය

**ආරම්භක මීටර් 500 කොටස සම්පූර්ණ නොකිරීම**

පිටත වටරවුම් අධිවේගී මාර්ගය ව්‍යාපෘති යටතේ කඩවත සිට මීරිගම මාර්ගයේ ආරම්භක මීටර් 500 කොටස සම්පූර්ණ කිරීමකින් තොරව 2015 වර්ෂයේදී අවසන් කර තිබුණි. ඒ පිළිබඳව සැලකිල්ලකින් තොරව කඩවත සිට මීරිගම දක්වා වූ කි.මී. 36.59 කින් යුත් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 1 වන කොටස රු.මිලියන 177,220 කට 2015 වර්ෂයේදී පිරිනමා තිබුණි. ආරම්භක මීටර් 500 කොටසට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ දක්වා ද ආරම්භ කර නොතිබුණ අතර උක්ත මීටර් 500 නිම කිරීමකින් තොරව කඩවත සිට මීරිගම දක්වා වූ කොටස වාහන ධාවනයට සුදුසු පරිදි නිමකළ නොහැකි බව නිරීක්ෂණය විය.

**පොතුහැර සිට ගලගෙදර දක්වා තෙවන අදියර**

පොතුහැර සිට ගලගෙදර දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ තෙවන අදියර සඳහා ලබා දුන් 2021 ජනවාරි 11 දිනැති අංක. අමප/20/2072/319/021 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව සමස්ථ දිග ප්‍රමාණයෙන් පළමු කි.මී. 12 ක ඉදිකිරීම් කටයුතු 2021 ජනවාරි මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සෘජුවම ඉටු කිරීමට කටයුතු කර තිබුණි. කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුධයෙන් පසු 2023 ජූලි මාසයේ සිට ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර පැවතුණි.

**ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානම**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 1 කොටසේ නිමකළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 40,348ක් ගෙවීම් කර නොතිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමෙහි සාමාන්‍ය කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 1 අදියරෙහි කොන්ත්‍රාත්කරුගේ බිල්පත් ප්‍රතිපූර්ණය නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නවත දමා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට පෙර

සැකසුම්කරණ ලද beams 1284 ක් ස්ථාපිත කර තිබූ අතර, තවත් beams 554 ක් ස්ථාපිත නොකර වැඩබිම් පරිශ්‍රයන් 09 තුළ ගබඩා කර තිබුණි. 2024 මැයි 04 දිනVD 10 P1 – P2Girder ස්ථානයේ එකක් (බාල්ක) කඩා වැටීම හා Girders දෙකක් ඇලවීමක් සිදු වී ඇත. එමෙන්ම ගබඩා කර ඇති හා ස්ථාපිත කර ඇති beams දීර්ඝ කාලයක් පුරා පරිසරයට නිරාවරණය වීම තුළින් ඉදිකිරීම්වල ගුණාත්මකභාවයට බලපෑමක් ඇති විය හැක.

## විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය

### කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**බිල්පත් ප්‍රතිපූරණ ප්‍රමාදයන්**

මූලික ඇගයීමකට අනුව කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමෙන් දිනකට රු.මිලියන 4.26 ක මුදලක් ජාතික ආර්ථිකයට ඉතිරි කර ගත හැකි බව හඳුනා ගෙන තිබුණද, ඉදිකිරීම් කටයුතු අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රතිඵල ළඟා කර ගැනීම තවදුරටත් ප්‍රමාද වී තිබුණි.

2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව වටිනාකම යුරෝ මිලියන 20.15 ක් වූ අතුරු ගෙවීම් බිල්පත් (IPC) 19 ක් විදේශ ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කර තිබුණද, එයින් බිල්පත් 13 කට අදාළ යුරෝ මිලියන 6.3 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමෙහි සාමාන්‍ය කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

### මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය

**ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හා වන්දි මුදල් ගෙවීම**

ව්‍යාපෘතිය 2021 මැයි 06 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද සිවිල් හා උපදේශන වැඩ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි සිවිල් වැඩ ආරම්භ කර නොතිබුණි. ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා 2021 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපාර අලාභ ලෙස පුද්ගලයින් 825 දෙනෙකු වෙත රු.මිලියන 712 ක් වන්දි ලෙස ගෙවා තිබුණි. ඉදිකිරීම් කටයුතු නිමවන තුරු මෙම වන්දි මුදල් දිගින් දිගටම ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය කරන අතර ඉහත වන්දි ගෙවූ පුද්ගලයින් අතරින් පුද්ගලයින් 17 දෙනෙකු වෙත 2023 සහ 2024 වසර සඳහා පිළිවෙළින් රු.මිලියන 11.49 ක් සහ රු.මිලියන 11.69 ක් නැවත ගෙවීමට සිදුව තිබුණි.

### වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය

**ප්‍රමාද ගාස්තු අය නොකිරීම**

ඉදිකිරීමට අදාළ උපදේශකවරයාගේ ප්‍රගති වාර්තාවට අනුව, කොන්ත්‍රාත්කරු විසින් වගකිව යුතු ප්‍රමාදයක් පවතින අතර, අපේක්ෂිත නිම කිරීමේ දිනය වන 2024 සැප්තැම්බර් 08 දිනට කටයුතු අවසන් කිරීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2024 මැයි මාසය වන විටද, ප්‍රමාද ගාස්තු අය කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට කාලය දීර්ඝ කිරීම් පිරිවැය සඳහා රු.මිලියන 493.03 ක මුදලක් ගෙවා තිබුණි.

**කාර්ය මණ්ඩලය සංචලන වියදම් ගෙවීම**

සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිම කර ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීම ප්‍රමාද වීම හේතුවෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට සිටින කාර්ය මණ්ඩලය සංචලනය කිරීම සඳහා විචලන නියෝග 03 ක් යටතේ 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 221.53 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ තුළ අනුක්‍රමික උෂ්ණත්වය ඉක්මවීම, ABC ඉහළ මට්ටමේ වෙනස්වීම්, ඉහළ සහ පැති මතුපිට ඉරිතැලීම්, කුළුණුවල අඩු ශක්තිය, බැවුම් ආරක්ෂාව සඳහා ගෙන ඇති නුසුදුසු ක්‍රියාමාර්ග, bottom ducts නොගැලපීම යනාදී දෝෂ සඳහා නිකුත් කරන ලද අනුකූල නොවීමේ වාර්තා (non-conformance reports) 21 ක් 2023 දෙසැම්බර් 31 වන විට ද නිවැරදි කර නොතිබුණි.

## ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

**අනාර්ථික වියදම්**

2023 දෙසැම්බර් 31 දිනට කොළඹ-රත්නපුර-පැල්මඩුල්ල අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 10,258.71 ක්ද, නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,239.6 ක්ද දේශීය අරමුදල් මගින් වියදම් කර තිබුණු අතර එහි කිසිදු ඉදිකිරීම් කාර්යයක් ආරම්භ කිරීමකින් තොරවද, කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 04 කොටස රු. මිලියන 2,339 ක් වැය කිරීමෙන් පසුවද ඉදිකිරීම් අතහැර දමා තිබුණි.

## මහනුවර උමං මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**පාරිසරික බලපෑම තක්සේරු වාර්තා ලබා ගැනීම**

වර්ෂ ගණනාවක සිට මහනුවර නගරයේ පවතින දැඩි වාහන තදබදයට පිළියමක් ලෙස තැන්නෙකුඹුර සහ සුදුහුම්පොළ අතර කි.මී. 4.36 ක දුරකින් යුතු උමං මාර්ග 04 ක්, පාලම් 03 ක් හා අන්තර් හුවමාරු 04 කින් සමන්විත කි.මී. 5.56 ක දුරකින් යුතු මං තීරු 04 ක මාර්ගයක් මාස 58 කින් ඉදිකිරීම සඳහා EDCF - කොරියානු

මූල්‍යකරණ නියෝජිතායතනය සමඟ එ. ජ. ඩොලර් මිලියන 252.3 ක එනම් ශ්‍රී ලංකා රු.මිලියන 50,461 ක වියදමකින් යුතුව 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අවලංගු කර වෙනත් ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘතියකට මුදල් වෙන් කරන ලෙස 2017 අගෝස්තු 21 දින ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුවෙන් ඉල්ලා තිබුණු බැවින්, ඒ වන විට ව්‍යාපෘතිය අක්‍රියව පැවතිණි. පසුව, ව්‍යාපෘතිය සහ එහි කාර්යයන් ආරම්භ කිරීමට පෙර මහනුවර උමං මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම තක්සේරු කිරීම (Environmental Impact Assessment) සඳහා 2021 මාර්තු 25 දින මාර්ග සංවර්ධන අධිකාරිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2017 වසරේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පසුබිම් වැඩ කටයුතු සකස් කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට පාරිසරික බලපෑම් තක්සේරුව පමණක් අවසන් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 78.36 ක මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළියෙල කිරීම, නැවත පදිංචි කිරීම් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සහ ව්‍යාපෘති පරිපාලන කටයුතු සඳහා එකතුව රු.මිලියන 90.75ක් දේශීය අරමුදල් මගින් වියදම් කර තිබුණු අතර සියයට 2.9 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා කර ගෙන තිබුණි.

## ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් අංශය

**ව්‍යාපෘති කාර්යසාධනය**

2021 වර්ෂයේ ග්‍රාමීය පාලම් 466 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර 2023 ජුනි 30 දින වන විට සම්පූර්ණයෙන් වැඩ අවසන් කල ග්‍රාමීය පාලම් සංඛ්‍යාව 84 ක් පමණක් වී තිබුණි. කොන්ත්‍රාත් පිරිනමන ලද ග්‍රාමීය පාලම් වලින් 271 ක ගිවිසුම් අවලංගු කර තිබුණු අතර එය මුළු පාලම් සංඛ්‍යාවෙන් සියයට 58 ක් වූ ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. මෙසේ ගිවිසුම් අවලංගු කර තිබුණු පාලම් 97 ක ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට 2023 ජුනි 30 දිනට රු.මිලියන 333 ක් ගෙවීම් කර තිබුණි. දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ග්‍රාමීය ඉදිකිරීම් ව්‍යාපෘති සංඛ්‍යාව 111 ක් වන අතර එයින් පාලම් 60 ක ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමකද, පාලම් 51 ක ප්‍රගතිය සියයට 51 - 100 ත් අතර මට්ටමකද පැවතිණි.

# ප්‍රජා ප්‍රවාහනය

ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නවතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම ප්‍රවාහන අංශයේ මෙහෙවර වී තිබුණි. එම මෙහෙවර ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.

පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

මාර්ග තදබදය, මඟී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වාදීම.

රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.

දුම්රිය හා බස්රථ නැවතුම් පොළවල් ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරිමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.

දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම.

දුම්රිය මැදිරි, බස් රථ, මෝටර් රථ දේශිය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවයක් ගොඩනැගීම.

කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.

තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පළවල්වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම.

වත්මන් බස් සංචිත ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස්රථ හඳුන්වා

දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහනයට අනුකූල කර ගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

පාසල් බස්රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම.

ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම.

## විගණන නිරීක්ෂණ

### ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

**තත්ත්වයෙන් බාල අමතර කොටස් ආනයනය හා ගෙවීම් ප්‍රමාදය සඳහා වන්දි ගෙවීම**

2011 වර්ෂයේදී සමාගම් දෙකකින් ගෙන්වන ලද අමතර කොටස් තත්ත්වයෙන් බාල අමතර කොටස් වීම හේතුවෙන් එම අමතර කොටස් තොගය ප්‍රතික්ෂේප කර ටෙන්ඩරය අවලංගු කර නැවත ටෙන්ඩර් පරිපාටියට යන ලෙස කමිටුවක් මඟින් නිර්දේශ කර තිබුණි. එහෙත් ඒ පිළිබඳ නොසලකා හරිමින් 2012 වර්ෂයේ සිට නැවත වසර 04 ක් අඛණ්ඩව රු. මිලියන 1942 ක් වටිනා අත්‍යාවශ්‍ය නොවන අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර ඒවායින් බොහොමයක් ගබඩාවේ නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. එසේ වුවද එම අමතර කොටස් සඳහා ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් සැපයුම්කාර සමාගම් විසින් පවරන ලද බේරුම්කරණ නඩුවේ සමථ තීන්දුව ප්‍රකාර ගෙවිය යුතු වූ රු. මිලියන 664 ක් සැපයුම්කරු වෙත නොගෙවීම හේතුවෙන් සැපයුම්කරු විසින් නැවත බේරුම්කරණ නඩුවක් පවරා තිබුණි. එහි සමථ තීන්දුව ප්‍රකාර 2023 වර්ෂයේදී රු.මිලියන 1,126 ක් ගෙවීම් කිරීම හේතුවෙන් රු.මිලියන 462 ක විනිමය පාඩුවක් මණ්ඩලයට සිදුවී තිබුණි.

**බස් රථ 125 ක් සඳහා GPS ඒකක හා CCTV කැමරා පද්ධති සවි කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථක වීම**

මණ්ඩලයට අයත් අධි සුඛෝපභෝගී බස් රථ 125 කට GPS ඒකක හා CCTV කැමරා පද්ධති සවි කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2018 වර්ෂයේදී ගිවිසුම්ගතව තිබූ අතර ඒ සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 33 ක් ගෙවා තිබුණි. මෙම පද්ධති සවි කිරීම සඳහා අධි සුඛෝපභෝගී බස්රථ ලබා නොදීම, පරිගණක මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය නොකිරීම, අන්තර්ජාල පහසුකම් ලබා නොදීම ආදී කරුණු මත ව්‍යාපෘතිය මේ වන විට සම්පූර්ණයෙන්ම අසාර්ථක වීමෙන් මණ්ඩලය විසින් ගෙවන ලද

සම්පූර්ණ මුදලම පාඩුවක් වී තිබූ අතර එම උපකරණද අස්ථානගතවී තිබුණි.

**නැවත පිරවූ හා පෙරසවි ටයර් මිලදී ගැනීමට නව ටෙන්ඩර් ප්‍රදානය නොකිරීම**

නැවත පිරවූ ටයර් 8,840 ක් හා පෙරසවි ටයර් 34,856 ක් මිලදී ගැනීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු කැඳවීමට පෙර සලකා බැලිය යුතුව තිබූ කරුණු හා සාධක සලකා බැලීමට යටත්ව අනුමත කිරීමකින් තොරව ටෙන්ඩරය සඳහා අනුමැතිය ලබා දීම කල්දමා තිබුණි.

2017 වර්ෂයේ සිට නව ටෙන්ඩර් කැඳවීමකින් තොරව මිලදී ගනිමින් සිටි සැපයුම්කරුවන්ගෙන් වෙළඳපල තත්ත්වයන් මත මිල ගණන් ඉහළ දමමින් මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂයේ ලංසු කැඳවා තෝරා ගන්නා ලද ලංසුකරුවන්ගේ මිල ගණන් මිලදී ගනිමින් සිටි සැපයුම්කරුවන්ගේ මිල ගණන් වලට වඩා අඩු වුවද, ප්‍රසම්පාදනය නොසලකා හරිමින් ටයර් සපයමින් සිටි සැපයුම්කරුවන්ගෙන්ම වැඩි මිලට මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් රු. මිලියන 356 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**වැඩි මිලට GPRS ටිකට් යන්ත්‍ර සඳහා තාපන කඩදාසි ටිකට් රෝල් මිලදී ගැනීම**

ලංසුකරුවන්ගෙන් මිල ගණන් කැඳවීමකින් තොරව ටිකට් රෝල් 161,110 ක්, රු.75 ක් වූ ටිකට් රෝලක වෙළඳපල මිලට වඩා රු.108.84 ක මිලකට මිලදී ගැනීමෙන් ටිකට් රෝලකට රු.19.64 ක් බැගින් ඩිපෝ 24 ක් මඟින් ටිකට් රෝල් 364,400 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 7.16 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද ලංසු කැඳවා ටිකට් රෝල් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද රු. 49.65 මිල වෙනුවට පූර්ව ලංසුකරුගෙන් රු.108.84 කට මිලදී ගැනීමෙන් ටිකට් රෝලක් සඳහා රු.59.19 ක වැඩි මිලකට ටිකට් රෝල් 603,180 ක් මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 35.7 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම සපයන ලද ටිකට් රෝල් කඩදාසිවල පළල, රෝලක විෂ්කම්භය හා රෝලක තිබිය යුතු තත්ත්ව බර, විචලනය වී තිබූ අතර, ප්‍රවේශ පත්‍ර කඩදාසිවල කාබන් ඇතුරුම් ඝෘෂ්ඨය ප්‍රමාණවත් නොවීම තුළ ප්‍රවේශ පත්‍ර පැහැදිලිවම මුද්‍රණය වී නොතිබුණි.

**ආසන 32 නව බස් රථ 500 ක් මිලදී ගැනීම**

ඉන්දියානු ණය නියම ගිවිසුම යටතේ ශ්‍රී ලංකා රජයට ලැබුණු ණය මුදලින් ඉතිරිව තිබූ එ.ජ. ඩොලර් මිලියන 20 උපයෝගි කර ගෙන පිටුපස උස් ඇන්ද සහිත ආසන 50-54 (2x2) නව බස් රථ 400 ක් හා පිටුපස උස් ඇන්ද සහිත ආසන 32-35 (2x2) බස් රථ 100 ක්

වශයෙන් බස් රථ 500 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2018 වර්ෂයේ දුන් ප්‍රතිපත්තිමය තීරණය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. නමුත් කිසිදු විද්‍යාත්මක පදනමකින් හා අවශ්‍යතා විශ්ලේෂණයකින් තොරව 2020 වර්ෂයේදී නව ප්‍රතිපත්ති තීරණයක් මගින් ආසන 32-35 නව කුඩා බස් රථ 500 ක් හා ආසන 42-45 පිටුපස උස් ඇන්ද සහිත නව බස් රථ 100 ක් වශයෙන් බස් රථ 600 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආසන 32 ක් සහිත නව බස් රථ 500 ක් එක් බස් රථයක් එ.ජ.ඩොලර් 26,662.5 බැගින් එ.ජ.ඩොලර් 13,311,250 කට එනම් රු.මිලියන 5,513 කට ඉන්දියානු සමාගමක් වෙතින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව එක් බස් රථයක වටිනාකම රු.මිලියන 11.02 ක් වූ අතර ආසන 32-35 බස් රථයක 2018 වර්ෂයේ ඇස්තමේන්තු වටිනාකම වූ රු.මිලියන 5 ට අනුව එම වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර බස් රථ මිලදී නොගෙන 2023 වර්ෂයේදී මිලදී ගැනීම හේතුවෙන් 2018 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකමට වඩා බස් රථයකට රු.මිලියන 6.02 ක් වශයෙන් රු.මිලියන 3,010 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.

**දෛනික සැලසුම් කළ ගමන්වාර සඳහා බස් රථ නොයෙදවීම**

කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයෙහි දෛනිකව සැලසුම් කළ ගමන් වාර සඳහා නියමිත පරිදි බස් රථ යොදවා නොතිබීම හේතුවෙන් රු.මිලියන 2,342 ක ආදායමක් ද, රුහුණු ප්‍රාදේශීය කාර්යාලය විසින් පාලනය වන ඩිපෝවන් විසින් ධාවනය කළ යුතු දුර ගමන් සේවා 41 ක් හා කෙටි ගමන් සේවා 124 ක් දීර්ඝ කාලීනව ධාවනය නොකිරීම හේතුවෙන් රු.මිලියන 2,431 ක ආදායමක් ද, රුහුණු ප්‍රාදේශිකයට අයත් ඩිපෝවන් මගින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ කාලසටහන් අවශ්‍යතාවය අනුව බස්රථ යොදවා නොතිබීම මත රු. මිලියන 803 ක් ද වශයෙන් 2023 වර්ෂයේදී උපයා ගත හැකිව තිබූ එකතුව රු.මිලියන 5,576 ක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

**නව ටයර් මිලදී ගැනීම**

2023 වර්ෂයේදී බස් රථ සඳහා නව ටයර් මිලදී ගැනීමේදී ඉදිරිපත් කරන ලද ලංසු තාක්ෂණික පිරිවිතරයන්ට අනනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය කර තිබූ සැපයුම්කරුවෙකුට සභාපතිවරයාගේ උපදෙස් මත ටෙන්ඩරය පිරිනැමීමට පෙර නව ටයර් 2,660 ක ඇණවුමක් ලබා දී තිබුණි. ඒ අනුව ගෙන්වන ලද ටයර් තාක්ෂණික පිරිවිතරයන්ට අනනුකූලව තිබියදීම අදාළ සැපයුම්කරුට උක්ත ටෙන්ඩරය පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය.

**ඉන්ධන ඌන උපයෝජනය**

2023 වර්ෂය තුළ බස් රථ සඳහා වැය කර ඇති ඉන්ධන වියදම රු.මිලියන 40,415 ක් විය. ශ්‍රී ලංගම රථ ඇණියට අළුතින් එක් කළ බස් රථ 500 හැර අනෙක් සියළුම බස් රථ වසර 05 කට වඩා වයසින්

වැඩි වන අතර එම බස් රථ වල ඉන්ධන පොම්පවල පවතින දුර්වලතාවය මත ඉන්ධන දහනය ලීටරයකට කි.මී. 2.5 - 3.1 අතර පරාසයක පැවතුණි. විගණන භෞතික යාන්ත්‍රික පරීක්ෂණයට අනුව අළුත්වැඩියා කරන ලද ඉන්ධන පොම්පයකින් ධාවනය කළ හැකි කිලෝමීටර් ප්‍රමාණය 3.8 - 4 අතර වූ නමුත් අළුත්වැඩියාවට නියමිත ඉන්ධන පොම්පයකින් ධාවනය කළ හැකි කිලෝමීටර් ප්‍රමාණය 2.5 ක් විය. එබැවින් ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර බස් රථ ධාවනය කිරීමේදී ඉන්ධන පාරිභෝජනය ලීටරයට කිලෝමීටර් 3.8 - 4 දක්වා පරාසයක පවත්වාගත හැකිව තිබුණි. ඒ අනුව ඉන්ධන තුලනය ලීටරයකට කි.මී. 3.8 ක් ලෙස සැලකූ විට ලීටරයකින් ධාවනය කල හැකි කි.මී. ප්‍රමාණය කි.මී. 0.7 කින් වැඩි වන බව නිරීක්ෂණය විය.

**කාර්යය මණ්ඩල ප්‍රවාහන ගාස්තු අය කර ගැනීම**

කොවිඩ් කාල වකවානුව තුළදී ප්‍රාදේශික 09 ක රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා 2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මණ්ඩලයේ බස් රථ යෙදවීම හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අය කරගත යුතුව තිබූ රු.මිලියන 151 ක් අය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**තිරසාර සංවර්ධන අරමුණු**

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව එම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාළ වන අරමුණු හඳුනා ගැනීමටත්, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පරීක්ෂා කිරීම සඳහා කාර්යසාධන දර්ශක (KPI) හඳුනා ගැනීමටත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි

.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ඇණිය උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කිරීම පිලිබඳව සිදු කරන ලද කාර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් වූ ප්‍රධාන නිරීක්ෂණ

**ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය**

1991 නොවැම්බර් 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය 2009 ඔක්තෝබර් 14 දින සංශෝධනය කර තිබුණි. 2023 මාර්තු 01 දින වන විටත් වසර 15 ක කාලයක් ගතව තිබුනද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කර නොමැතිව තවදුරටත් කෙටුම්පත් අවස්ථාවේ පවතින බව නිරීක්ෂණය විය.

**ලාභ නොලබන ගමන් මාර්ග සේවා සහ ගමන්වාර**

පනතේ පූර්විකාවේ (ඈ) වගන්තිය අනුව සමාජීය වශයෙන් අවශ්‍ය එහෙත් ලාභ නොලබන ගමන් මාර්ග සේවා සහ ගමන්වාර බස් රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ ප්‍රමාණවත් බස් සේවාවක් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීමත් එම සේවා සපයන්නන් අතර යහපත් තරඟයක් ඇති කර අසාධාරණ සහ ලාභ නොලබන තරඟකාරීත්වය වැලැක්වීමට අවශ්‍ය කටයුතු සහ වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වූවත්, කොමිෂන් සභාව විසින් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

**බස් රථ ඇණිය**

ශ්‍රී ලංගම කාර්මික කොට්ඨාශය මගින් ප්‍රාදේශික හරහා බස් රථ 5,918 ක් හා මධ්‍යම බස් රථ කාර්යාලයේ සහ අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ බස් රථ 85 ක් වශයෙන් එකතුව බස් රථ 6,003 ක් දෛනිකව සේවයට ලබා දීමට සැලසුම් කර තිබුණද කාර්මික කොට්ඨාශය මගින් ධාවනයට ලබා දීමට සමත්ව ඇති බස් රථ ප්‍රමාණය 5,118 ක් හෙවත් සියයට 85.26 ක් බව නිරීක්ෂණය විය.

**රියදුරු සහ කොන්දොස්තරවරුන් ප්‍රමාණවත් නොවීම**

බස් රථ ඇණිය මුළුමනින්ම ධාවනයට යෙදවීමට ප්‍රධාන බාධකය බවට මණ්ඩලයේ පවතින රියදුරු සංඛ්‍යාව 7,786 ක් හා කොන්දොස්තර සංඛ්‍යාව 7,768 බලපා ඇති බව නිරීක්ෂණය විය. දීර්ඝ කාලයක සිට රියදුරු සහ කොන්දොස්තර මහතුන් අළුතින් බඳවා නොගැනීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

පවත්නා බස් රථ ඇණියෙහි ආයු කාලය වසර 15 ක් ඉක්මවා ධාවනය නොවන ටාටා වර්ගයේ බස් රථ 630 ක් ලේලන්ඩ් වර්ගයේ බස් රථ 425 ක් වෙනත් වර්ගවල බස් රථ 50 ක් වශයෙන් එකතුව බස් රථ 1,105 ක සංඛ්‍යාවක් පවතින අතර, මෙම බස් රථ කිසිඳු ආරක්ෂක පියවරකින් තොරව ඩිපෝවල ගාල්කර පැවතුණි.

**2022 වර්ෂයේ බස් රථ පුනරුත්ථාපනය**

බස් රථ පුනරුත්ථාපනය සඳහා 2022 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 750 ක් ලබා දී තිබූ නමුත් එම මුදල් උපයෝජනය කර පුනරුත්ථාපනය කර ධාවනයට එක් කරන ලද බස් රථ පිළිබඳ කිසිඳු වාර්තාවක් මණ්ඩලය සතුව නොතිබුණි. එයින් රු.මිලියන 606.31 ක් ගමනාගමන මණ්ඩලය විසින් හා රු.මිලියන 143 ක් ලක්දිව ඉංජිනේරු ආයතනය විසින් පුනරාවර්තන වියදම් සඳහා වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය.

**2023 වර්ෂයේ බස් රථ පුනරුත්ථාපනය**

2023 වර්ෂය සඳහාද මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 2020 ක මුදලක් බස් රථ පුනරුත්ථාපනය සඳහා වෙන්කර තිබුණද 2023 වර්ෂයේ ධාවනයට එක් කරන ලද බස් රථ ඇණිය පිළිබඳව සත්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වුවද දැනට මෙම මුදල් බස් රථ පුනරුත්ථාපනය සඳහා නොව පුනරාවර්තන වියදම් සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය.

**ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය බැහැර කිරීම**

ගමනාගමන මණ්ඩලයට අයත් සියළුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපලවල ඇති අංගනවල ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් භාවිතා කළ යුතු අතර, ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබා ගත යුතුව ඇත. නමුත් මණ්ඩලයට අයත් ප්‍රාදේශික 12 හි දත්ත අනුව එකී ප්‍රාදේශිකවලට අයත් ඩිපෝ සහ වැඩපලවල් 111 කින් ඩිපෝ සහ වැඩපලවල් 51 ක ප්‍රමාණයක් පාරිසරික බලපත්‍ර ලබා ගෙන නොතිබූ

අතර අපද්‍රව්‍ය පරිසරයට හානිකර නොවන ලෙස බැහැර කිරීමද සිදුකර නොතිබුණි.

**දුම් පරීක්ෂණ සහතික ලබා නොගැනීම**

ගමනාගමන මණ්ඩලය සතු රථ ඇණියේ බස් රථ විශාල සංඛ්‍යාවක ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතු වායු විමෝචන සහතික (දුම් පරීක්ෂණ සහතික) ලබා ගෙන නොතිබූ අතර, පරීක්ෂාවට භාජනය කළ මහනුවර ප්‍රාදේශිකයේ ඩිපෝ 07 කට අයත් බස් රථ 566 ක ප්‍රමාණයෙන් බස් රථ 226 ක් සඳහා වායු විමෝචන සහතික ලබා ගෙන නොතිබුණි. නිසි පරිදි දුම් සහතික ලබා නොගැනීම මත බස් රථවලින් දහනය කරන ඉන්ධන මගින් පිටකරන අහිතකර වායු එනම් Co,S වැනි බැර ලෝහ පරිසරයට එකතු වීම මගින් හා අහිතකර වායු විමෝචනය මගින් පරිසර දූෂණය වීමක් සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට 2023 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. මිලියන 29,600 ක් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. මිලියන 22,593 ක් වශයෙන් රු. මිලියන 52,193 ක මුළු ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එයින් ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් රු. මිලියන 11,897 ක් එනම් සියයට 53 ක් උපයෝජනය කර තිබූ අතර පුනරාවර්තන ප්‍රතිපාදනවලින් රු. මිලියන 27,842 ක් එනම් සියයට 94 ක් උපයෝජනය කර තිබුණි. ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ නැගෙනහිර දිස්ත්‍රික් ඉංජිනේරු වෙත වෙන්කර තිබූ රු. මිලියන 6.7 ක් වටිනා ව්‍යාපෘති 06 ක් වර්ෂය තුළ ආරම්භ කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**පොදු ප්‍රවාහනය සඳහා දායකත්වය**

දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ සමස්ත මගී ප්‍රවාහනයෙන් සියයට 6 ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 6.5 ක් දායකත්වයක් ලබා දෙන දුම්රිය සේවය එකී දායකත්වය ඉහළ නංවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර 1934 වර්ෂයේ දී දුම්රිය මාර්ගස්ථ ජාලය කිලෝමීටර් 1521 ක් වුවද වර්තමානය වන විට (බෙලි අත්ත දක්වා වූ කිලෝ මීටර් 32 ද ඇතුළත්ව) එය කිලෝ මීටර් 1465 ක් දක්වා කිලෝ මීටර් 56 කින් අඩු වී තිබුණි.

**කාලසටහනකට අනුව දුම්රිය ධාවනය නොවීම**

කාලසටහනකට අනුව දුම්රිය ධාවනය 1865 දී ආරම්භ කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී සැලසුම් කළ මුළු දුම්රිය ධාවන වාර සංඛ්‍යාව 122,426 ක් වූ අතර එයින් අවලංගු කර තිබූ දුම්රිය ධාවන වාර සංඛ්‍යාව 10,531 ක් වී තිබුණි. නිශ්චිත වේලාවට ධාවනය කර තිබූ දුම්රිය වාර ගණන 36,771 ක් වූ අතර ඒ අනුව සැලසුම් කළ දුම්රිය ධාවන වාර සංඛ්‍යාවෙන් සියයට 70 ක් නියමිත පරිදි ධාවනය වී නොතිබුණි.

**මහව -අනුරාධපුර -ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය වැඩි**

**දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ඉන්දියානු ණය ගිවිසුම (Indian Credit Line) යටතේ වූ ණය ආධාර අනුව මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු එක්සිම් (Exim) බැංකුව සමඟ එළඹි ණය ගිවිසුමේ කොන්දේසිවලට යටත්ව මෙම දුම්රිය මාර්ගය අදියර 04 ක් යටතේ පිළිසකර කිරීම සඳහා ඉන්දීය රජයේ සමාගම්වලින් මිල ගණන් කැඳවා එ.ජ.ඩොලර් මිලියන 91.27 කට 2019 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 69 ක් පමණක් වී තිබුණි.

**බූ ඔය නව දුම්රිය ස්ථානය හා වේදිකා ඉදිකිරීම**

මහව - ඕමන්තේ දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව බූ ඔය නව දුම්රිය ස්ථානයක් හා වේදිකා දෙකක් ඉදිකිරීම රු. මිලියන 47.18ක ඇස්තමේන්තුවක් මත 2022 අප්‍රේල් සිට දුම්රිය දෙපාර්තමේන්තුව මගින් වැඩ ආරම්භ කර තිබුණි. මෙම දුම්රිය ස්ථානය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ වූයේ දුම්රිය දෙකක් මාරු වීම සඳහා මැදවච්චිය හා වවුනියාව දුම්රිය ස්ථාන අතර වෙනත් ස්ථානයක් නොමැති වීම මත එම දුම්රිය ස්ථාන දෙක අතර පවතින කි.මී. 23 ක දුර ප්‍රමාණය අවම කර බූ ඔය දුම්රිය ස්ථානයෙන් දුම්රිය දෙකක් මාරු වීමට ඉඩ සලස්වා දුම්රිය ප්‍රමාදය අවම කිරීම විය. අනුරාධපුර - ඕමන්ත දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු අවසන් කර 2023 ජූලි 15 සිට දුම්රිය ධාවන කටයුතු ආරම්භ කර පැවතිය ද සැලසුම්ගත පරිදි දුම්රිය ස්ථානය හා වේදිකා ඉදිකිරීම 2023 ජූලි 01 දින වන විට අවසන් කල යුතු වුවද 2023 දෙසැම්බර් වන විටත් අවසන්ව නොතිබූ බැවින් එදින දක්වා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකිව පැවතුණි.

**දීර්ඝ කාලයක සිට නිරවුල් නොවූ ණයවර ලිපි**

2023 වර්ෂය අවසානයට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. මිලියන 412 ක් වූ අතර එයින් සියයට 29 ක් වූ රු. මිලියන 119 ක් වර්ෂ 02 ත් 25 ත් අතර කාල පරාසයන් දක්වා වූ පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී තිබූ මෙම ශේෂයන් භාණ්ඩ ලැබීම් තුණ්ඩු මගින් නිරවුල් නොකිරීමට හේතු හා මෙතෙක් සැපයුම් කර නොමැති භාණ්ඩ සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

**දුම්රියේ එළවළු ප්‍රවාහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම**

2022 වර්ෂයේ අතුරු අයවැය ප්‍රතිපාදන මගින් “දුම්රියේ එළවළු ප්‍රවාහනය” කිරීම සඳහා රු.මිලියන 200 ක් භාණ්ඩාගාරයෙන් ලබාදී තිබූ අතර එයින් රු. මිලියන 198.8 ක් වැය කර දුම්රිය මැදිරි 05 ක් අලුත්වැඩියා කර තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම සම්පූර්ණ වියදම නිෂ්කාර්ය වී තිබුණි.

**චලනය නොවන තොග**

2023 වර්ෂය අවසානයට පැවති රු.මිලියන 7,978 ක් වූ තොග ලිහිසි තෙල් හා දුම්රිය එන්ජින් අමතර කොටස් තොගයෙන් රු. මිලියන 330 ක් වටිනා තොග අයිතම පසුගිය වර්ෂ 04 තුළ කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

**පිබිදෙමු පොලොන්නරුව සංවර්ධන වැඩසටහන**

"පිබිදෙමු පොලොන්නරුව" සංවර්ධන වැඩසටහන යටතේ කඳුරුවෙල නගරයේ පිහිටි පිඹුරු අංක 3868A හි සඳහන් දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 03 පර්චස් 17.9 ක ඉඩම පවරා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2017 වර්ෂයේදී අත්සන් කර තිබූ අවබෝධතා ගිවිසුම අනුව වර්ග අඩි 442 ක රැස්වීම් ශාලාවක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකර 2020 පෙබරවාරි 22 ට පෙර දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දිය යුතු විය. කෙසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එකී ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කර හෝ නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව අදාල ඉඩම ආපසු ලබා ගැනීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට අයත් ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලය, විවේකාගාර, උපකරණ ගබඩාව, තෙල් ගබඩාව හා දිස්ත්‍රික් ඉංජිනේරු විවේකාගාරය පවත්වාගෙන යාම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් ඉඩම හා ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිදහස් කරගෙන දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පවරා දිය යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම ගොඩනැගිලි හා ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවට ලබාදී නොතිබුණි.

## කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP)

ඉදිරි වර්ෂ විස්සක කාලයක් සඳහා මෙරට දුම්රිය සේවයෙන් ජාතික ප්‍රවාහන පද්ධතියට ලබා දිය යුතු දායකත්වය හඳුනාගෙන ඒ සඳහා කොළඹ තදාසන්න ප්‍රදේශය තුළ තිබෙන දුම්රිය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වේ.

**ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම්**

2023 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව විසින් රු.මිලියන 1,551.35 කට සමාන ඇ.ඡ.ඩො.මිලියන 8.52ක් ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු අතර එම මුදලින් සියයට 95ක් වූ රු.මිලියන 1,469.05 ක් ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් සඳහා වන උපදේශන සේවා වෙනුවෙන් වැය කර තිබුණි. එම වාර්තා 2021 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණ ද, දුම්රිය පද්ධතිය සංවර්ධනය කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා එම වාර්තා භාවිතා කිරීම අවම මට්ටමක තිබුණි.

**කැළණිවැලි දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු**

කැළණිවැලි දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු සඳහා එම මාර්ගය දෙපස දුම්රිය ප්‍රවේශ අයිතිය තුල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස සංකීර්ණ 07 කින් අවශ්‍ය නිවාස ඒකක 1244 ක් රු.මිලියන 5,412 කට මිළදී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2017, 2018 වර්ෂවලදී අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි. ගිවිසුම්ගත දිනයේ සිට වසර 02 ක් තුළ නිවාස ඉදිකර ව්‍යාපෘතිය භාරදීමට එම අධිකාරිය එකග වී තිබුණද, ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා නැවත නැවතත් කාලය දීර්ඝ කර තිබූ අතර මේ වන විට වසර 06ක් ගතවී ඇතත් නිවාස ඒකක 550 ක් ව්‍යාපෘතිය වෙත භාර දී නොතිබුණි. මේ හේතුවෙන් නැවත පදිංචි කිරීම කටයුතු තවදුරටත් ප්‍රමාද වන බවත්, ඒ අනුව ව්‍යාපෘති කටයුතු තවදුරටත් ප්‍රමාද වන බවත් නිරීක්ෂණය විය. එමෙන්ම ඉදිකෙරෙමින් පවතින නිවාසවල මිල ගණන් නැවත සලකා බැලීමට අධිකාරිය විසින් තීරණය කර ඇති අතර ඒ අනුව නිවාස ඒකකයක ගිවිසුම්ගත මිල රු.මිලියන 5 සිට රු.මිලියන 10 ක් දක්වා වැඩි වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

## කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (CSREIP)

**මහනුවර නගරාශ්‍රිත දුම්රිය සේවාව වැඩිදියුණු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය හා ඉංජිනේරු සැලසුම් සකස් කිරීම හා උපදේශන සේවා**

ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ මහනුවර නගරාශ්‍රිත දුම්රිය සේවාව වැඩිදියුණු කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම හා උපදේශන සේවාව ලබා ගැනීමට සඳහා වූ කොන්ත්‍රාත්තුව කැබිනට් අනුමැතිය මත මාස 18 කින් නිම කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත එ.ජ.ඩො. මිලියන 2.64 ක් සහ යූරෝ මිලියන 1.38ක් සහ රු. මිලියන 194.12 ක වටිනාකමට 2019 වර්ෂයේදී පවරා තිබුණි. ව්‍යාපෘතිය විසින් රු. මිලියන 719.2 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අදාල සමාගමට ගෙවා තිබුණු නමුත් උපදේශන සමාගම විසින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණු අතර ඒ සඳහා වූ හේතුව ලිඛිතව වාර්තා වී නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන වියදම නිශ්කාර්ය වී තිබුණු අතර ශක්‍යතා අධ්‍යයනයෙන් පසු සංවර්ධන කටයුතු වෙනුවෙන් අරමුදල් ප්‍රභවයක් හඳුනා ගැනීමට කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය.

**දිප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම**

ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ දිප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම

සඳහා එ.ජ.ඩොලර් මිලියන 7.49 ක වටිනාකමකට දේශීය පුද්ගලික සමාගමක් සමග ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතිය යටතේ නව සන්නිවේදන පද්ධතිය භාවිත කරමින් ජනතාවට වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත දුම්රිය සේවාවක් ලබාදීමට අපේක්ෂා කර තිබුණි. රු.මිලියන 1,901.27 ක මුදලක් වැය කර 2022 සැප්තැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය අවසන්කර තිබුණු නමුත් එම පද්ධතිය ප්‍රායෝගිකව භාවිතා නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු අතර දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි.

## ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

**සේවා මධ්‍යස්ථානය හා උපකරණ ඌන උපයෝජිතව පැවතිම**

සමාගමේ සේවා මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ආරම්භ කර පවත්වා ගෙන යමින් පැවතියද ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් සේවක මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් වාහන බාහිර ආයතන වෙත ලබා දී අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. 2023 වර්ෂය තුළ දී වාහන අලුත්වැඩියා සඳහා බාහිර ආයතන වෙත රු. මිලියන 15 ක් ගෙවා තිබුණි. සේවා මධ්‍යස්ථානයේ පිරිවැය රු. මිලියන 20.8 ක් වන විට ආදායම රු. මිලියන 17.9 ක් වීම හේතුවෙන් සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යාම තුළින් 2023 වර්ෂයේදී සමාගමට රු. මිලියන 2.9 ක අලාභයක් සිදුවී තිබුණි.

සේවා මධ්‍යස්ථාන කටයුතු සිදුකිරීම සඳහා මිල දී ගන්නා ලද රු. මිලියන 11.4 ක් වටිනා උපකරණ ඌන උපයෝජිතව පැවති අතර ඒවා අතරින් රු. මිලියන 1.7 ක් වටිනා 3ඩී වීල් එලයින්මන් (3D Wheel Alignment) උපකරණය ක්‍රියාකරවීමට නොහැකිව පැවතුණි.

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම**

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීමට හා අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට ප්‍රතිපාදන සලසා තිබුණි. කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර මගී සේවා අවසර පත්‍ර ටෙන්ඩර් වටිනාකම, අවම තාක්ෂණික අගය මත, රු.3,000, රු.10,000 හා රු.15,000 යන වටිනාකම් මත ලබා දී තිබුණි.

## ශ්‍රී ලංකාවේ දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව

**දුම්රිය හරස් මාර්ග අනතුරු**

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය හරස් මාර්ග සඳහා වූ ආරක්ෂණ පද්ධති නිසි පරිදි ස්ථාපනය නොකිරීමත්, නඩත්තු නොකිරීමත් හේතුවෙන් 2000 වර්ෂයේ සිට 2022 වර්ෂය වන විට අනතුරු 1,501 ක් සිදු වී ඇති අතර එම කාල පරිච්ඡේදය තුළදී ජීවිත හානි 298 ක් සිදු වී තිබුණු අතර පුද්ගලයින් 1,054 ක් තුවාල ලබා තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

**මිය යන පුද්ගලයන් සඳහා වන්දි ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙලක් නොවීම**

මිය යන පුද්ගලයන් සඳහා වන්දි ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙලක් දුම්රිය දෙපාර්තමේන්තුව හෝ රජය සතුව නොමැති අතර, මිය යන පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය සහ පුද්ගලයන් මියයාම හේතුවෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සිදුවන පීඩා පිළිබඳ සොයා බලා කටයුතු කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නැති බවද ඔවුන් වෙනුවෙන් පනතේ 32 වන වගන්තියේ සංශෝධනයට අනුව දුම්රිය සාමාන්‍යාධිකාරී වග වී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

**දුම්රිය ආඥා පනත වර්ෂ 120 ක් පමණ පැරණි බව**

දැනට ක්‍රියාත්මක වන දුම්රිය ආඥා පනත වර්ෂ 120 ක් පමණ පැරණි වන අතර එහි පවත්නා දණ්ඩන නියම කිරීම් වර්තමාන රුපියලේ අගය හා සසඳන විට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අදාළ තැනැත්තන් වරදකට යොමු නොවීමකට එමගින් පෙළඹවීමක් ඇති නොවන බවත් අදාල දණ්ඩන ගාස්තු පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වන අතර භාවිතා කර ඇති ඇතැම් නිල නාමයන්ද (ආණ්ඩුකාරවරයා) වර්තමානය වන විට නොගැලපෙන බව නිරීක්ෂණය විය.

**සුළු හරස් මාර්ගවල හරස් මාර්ග ගේට්ටු ඉදිකර නොතිබීම**

සුළු හරස් මාර්ගවල ආරක්ෂාව වෙනුවෙන් ආඥා පනතේ විධිවිධාන පරිදි හරස් මාර්ග ගේට්ටු ඉදිකර නොතිබුණු අතර ඒවායේ පාලනය හා ආරක්ෂාව පිළිබඳව පනතේ විධිවිධාන පරිදි ක්‍රියාකර නොතිබුණු අතර පදිංචි ස්ථාන සඳහා වූ හරස්මාර්ග නිසි ලෙස හඳුනාගෙන ඒවායේ ආරක්ෂාව සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීමත්, ඒවා ස්ථාපනය කිරීම සඳහා දරන ලද ආරම්භක පිරිවැය හා නඩත්තුව සඳහා වූ වාර්ෂික කුළිය අදාළ මාර්ග භාවිතා කරන්නන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**විද්‍යාත්මක සැලැස්මක් සකස් කර නොතිබීම**

දුම්රිය හරස් මාර්ග මුළුමනින්ම ආවරණය වන පරිදි මාර්ග ආරක්ෂණ පද්ධති ඉදිකිරීම සඳහා විද්‍යාත්මක සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා හා පළාත් පාලන ආයතන සමඟ දුම්රිය හරස් මාර්ග ඉදිකිරීම හා ඒ සඳහා මාර්ග

ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම අරභයා ඒකාබද්ධ සැලසුම් හා විධික්‍රම ක්‍රියාවට නංවා නොතිබුණි.

**දුම්රිය මාර්ග හරහා අළුතින් හරස් මාර්ග ඉදිකිරීම**

දුම්රිය මාර්ග හරහා අළුතින් මාර්ග ඉදිකිරීමේදී එම මාර්ග ඉදිකරනු ලබන ආයතනවලින් හා පුද්ගලයන්ගෙන් ගාස්තු අයකර මාර්ග ආරක්ෂණ පද්ධති ස්ථාපනය කල යුතු වුවත් එලෙස අළුතින් ඉදිවන මාර්ග සම්බන්ධයෙන් නිසි ඇගයීමක් කර ගාස්තු අය කර මාර්ග ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**සීනු හා විදුලි පද්ධති ක්‍රියාකාරීත්වය**

දෙපාර්තමේන්තුව මගින් මෙම වාර්තාවේ දින දක්වා ස්ථාපනය කර ඇති සීනු හා විදුලි (Bell & Light) පද්ධති බොහෝමයක ක්‍රියාකාරීත්වය නිසි පරිදි සිදු නොවන අතර, එම පද්ධති ක්‍රියාත්මක වන්නේද නැද්ද යන්න පිළිබඳව දුම්රිය දෙපාර්තමේන්තුවේ සංඥා දෙපාර්තමේන්තුවට හෝ දුම්රිය රියදුරුට සන්නිවේදනය කර ගැනීමේ හැකියාවක් මෙම පද්ධති තුළ නොමැති බව නිරීක්ෂණය විය. තවද සීනු හා විදුලි සංඥා පද්ධතියෙහි ඉලෙක්ට්‍රොනික පද්ධතියේ දෝෂයක් නිසා හෝ විදුලි සැපයුම් පද්ධතියේ දෝෂයක් නිසාවෙන් හෝ පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවුනහොත් ඒ පිළිබඳව අදාළ දුම්රිය රියදුරුට හෝ සංඥා දෙපාර්තමේන්තුවට සෘජුවම දැන ගැනීමේ හැකියාවක් අදාළ පද්ධතිය තුළ නොතිබුණි.

# කෘෂිකර්මාන්තය

ආහාර සුරක්ෂිතතාව හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ඇති කිරීම තම දැක්ම ලෙසත්, ස්වාභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව ගෝලීය තරඟකාරී නිෂ්පාදනයක් බිහි කරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම තම මෙහෙවර ලෙසත් හඳුනාගත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය, පොහොර අංශය හා ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය යටතේ දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 08 ක් පහත කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

කාර්යභාරයන්

ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම

නවීන තාක්ෂණය යොදා ගැනිමින් තොග පවත්වා ගැනීම හා සැපයුම් කටයුතු ක්‍රියාත්මක කිරිම

භෝග විවිධාංගීකරණය හා වගා අවශ්‍යතා අනුව ජල කළමනාකරණය

සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම.

වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම හා තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරිගැන්වීම.

රසායනික පළිබෝධක නියාමනය කිරීම හා ප්‍රමිතියෙන් යුතු බීජ හා පැළෑටි සැපයීම හා ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය

දේශගුණික සහ කාලගුණික වෙනස්කම් ගොවි ජනතාවට දෛනික සන්නිවේදනය.

කෘෂිකාර්මික සංවර්ධන කලාප , කෘෂි ගම්මාන හා තිරසාර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම.

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණය .

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නඟා සිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ගුණාත්මක රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර ආනයනය, බෙදා හැරීම හා රජයේ සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීම .

දේශීය ගොවියාට හා පාරිභෝගිකයාට සාධාරණ මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරිම.

දේශීය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම හා කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම

කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය හා පරිභෝජන අවස්ථා පුළුල් කිරීම.

## විගණන නිරීක්ෂණ

### කෘෂිකර්ම අමාත්‍යාංශය

**ප්‍රතිපාදන උපයෝජනය**

2023 වර්ෂයේ දී කෘෂිකර්ම අමාතංශයේ සඳහා රු.මිලියන 93,938.63 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ඉන් රු.මිලියන 85,577.16 ක ප්‍රතිපාදන උපයෝජනය කර රු.මිලියන 8,361.47ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**ආර්ථික මධ්‍යස්ථාන**

අමාතංශයේ ග්‍රාමීය ආර්ථික අංශය විසින් 2017 වර්ෂයේ මඩකලපු දිස්ත්‍රික්කයේද, 2018 වර්ෂයේ වවුනියාව හා යාපනය යන දිස්ත්‍රික්කවලද විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම ආරම්භ කර එකතුව රු.මිලියන 774.91 ක් වැයකර 2023 වර්ෂය තුළ වැඩ නිමකර තිබුණත් 2024 ජූලි 31 දින වන විටත් එම මධ්‍යස්ථානය විවෘත කර නොතිබුණි. එහෙත් එම මධ්‍යස්ථාන 03 සඳහා 2023 වර්ෂය වෙනුවෙන් විදුලි ගාස්තු, ජල ගාස්තු හා ආරක්ෂක සේවා ගාස්තු ලෙස රු.මිලියන 10.54 ක් නිෂ්කාර්යව වැයකර තිබුණි.

**අනාර්ථික ණය පොලී**

කෘෂිකර්ම අමාත්‍යාංශ පොහොර ලේකම් කාර්යාලයේ අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් 2023 වර්ෂයේ සහනාධාර පොහොර ආනයනයේදි සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් සැපයුම්කරුවන්ට ගෙවීම සඳහා කෙටිකාලීන බැංකු ණය මගින් ලබාගත් ණය වෙනුවෙන් එකතුව රු. මිලියන 16,279.65 ක් පොලී වියදම් ලෙස වැයකර තිබුණි. එම ණය මුදල් දිගුකාලීන ණය බවට පරිවර්තනයේදි එකතුව රු.මිලියන 3,723.07 ක් වූ උපචිත පොලී වටිනාකමක් ඇතුළත් කර තිබූ අතර ඒ හේතුවෙන් පොලිය මත පොලියක් ගෙවීමට සිදුවී ඇති බවද නිරීක්ෂණය විය.

**ආරක්ෂිත තැන්පතු**

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ පස් අවුරුදු කාල සීමාවක් සඳහා ඇතිකර ගත් අංක 2178 දරන බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට 2020 ජනවාරි 31 දින භාරදී තිබුණි. එසේ වුවද, බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව 2023 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

**වාහන අලුත්වැඩියාව**

2021 ජූනි 21 දින ග්‍රාමීය ආර්ථික අංශයේ CAV-5064 දරන රේන්ජ් රෝවර් ජීප් රථය පණගැන්වීමට නොහැකි තත්ත්වයකට පත්වීමට බලපෑ නිශ්චිත කරුණු හා ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබූ අතර එම වාහනය අලුත්වැඩියාව සඳහා අවස්ථා 5කදී ඇස්තමේන්තු ලබා ගෙන තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ දී රු.මිලියන 3.08 කට මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අලුත්වැඩියා කටයුත්ත වසර 03 කට පසු ඒ සඳහා රු.මිලියන 9.04 කට සිදු කිරීම සඳහා දේශීය නියෝජිතයා වෙත භාරදී තිබුණත් 2024 ජූලි 31 දින වන විටත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබුණි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අපේක්ෂිත හා ඉටුකළ කාර්යයන්**

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාළ සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබා දීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2023 වර්ෂය තුල ඒකක 10 ක් මගින් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබූ කාර්යයන් ප්‍රමාණය 158 ක් විය. එම කාර්යයන් අතුරින් කාර්යයන් 110 ක් සියයට 90 ත් 100 ත් අතර ප්‍රගතියක්, කාර්යයන් 25 ක් සියයට 75 ත් 89 ත් අතර ප්‍රගතියක්, කාර්යයන් 17 ක් සියයට 50 ත් 74 ත් අතර ප්‍රගතියක් හා කාර්යයන් 06 ක් සියයට 50 ට වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි.

**නිෂ්කාර්ය වියදම්**

2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල විධිමත් තාක්ෂණික ඇගයීමකින් තොරව රු.මිලියන 93.05 ක් වැයකර නුවරඑළිය බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල 05 ක විදුලි වැටවල් 05 ක් ඉදිකර තිබුණි. එයින් රු.මිලියන 67.2 ක් වූ විදුලි වැටවල් 03 ක් වසර 01 ත් 07 ත් අතර කාලයක සිට සක්‍රීයව භාවිතයට ගෙන නොතිබුණි.

**ලොකු ළූණු නිෂ්පාදනය පහත වැටීම**

පසුගිය වසර 08 ක කාලය තුල රු.මිලියන 337.2 ක් වැය කර ලොකු ළූණු නිෂ්පාදන ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර තිබුණද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව 2014 වර්ෂයේ මෙ.ටො. 98900 ක් වූ දේශීය ලොකු ළූණු නිෂ්පාදනය 2022 වර්ෂය වන විට මෙ.ටො. 15,840 ක් දක්වා මෙ.ටො. 83,060 කින් හෙවත් සියයට 84 ක ප්‍රමාණයකින් පහළ ගොස් තිබුණි.

**එළවළු බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය දුර්වල වීම**

ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 10 ක කාලය තුල ප්‍රරෝහණ ප්‍රතිශතය දුර්වල වීම හේතුවෙන් අසමත් වූ රු.මිලියන 44.3 ක් වටිනා එළවළු බීජ

කි.ග්‍රෑ. 5699 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව කටයුතු කර පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි.

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

2023 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 14,179.8 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 12,023.2 ක් සහ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා ජනාධිපති කාර්යාලය විසින් විවිධ ව්‍යාපෘති සඳහා ලබාදුන් රු.මිලියන 3,042.2 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,591.4 ක් උපයෝජනය කර තිබුණි.

**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් රු. මිලියන 45.7 ක් වැය කර ප්‍රතිසංස්කරණය කල වැව් 09 කින් 2024 මාර්තු 28 දින වන විට වැව් 05 ක වැඩ අවසන් කර තිබුණද එම වැව්වල පස් සහ බොරළු යොදා සකස් කල වැව් බැමි සේදී ගොස් තිබුණි. එසේම, රු.මිලියන 37.5 ක ඇස්තමේන්තු කර, ගලින්ද කුඩා වැව ප්‍රතිසංස්කරණය 2023 ජූලි 28 දින ආරම්භ කිරීමට සැලසුම් කර ඇතත් එය ආරම්භ කර නොතිබුණි.

**පොහොර සහනාධාර වවුචර්පත් මුද්‍රණය හා බෙදාහැරීම**

2023 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ගොවීන්ට පොහොර ලබාදීම සඳහා රු. මිලියන 11,147 ක් වටිනා වවුචර් පත් 1,626,000 ක් මුද්‍රණය කර තිබුණු අතර එයින් වවුචර් පත් 1,466,214 ක් ගොවීන් වෙත නිකුත් කර තිබුණි. නිකුත් නොකල රු. මිලියන 907 ක් වටිනා වවුචර් පත් 159,786 ක් ප්‍රධාන කාර්යාලයට ආපසු එවා තිබුණි. දිස්ත්‍රික් කාර්යාල 16 ක් විසින් එවන ලද තොරතුරු අනුව ගොවීන් වෙත රු. මිලියන 6,555.5 ක් වටිනා වවුචර්පත් 855,859 ක් නිකුත් කර තිබුණි. නිකුත් කළ වවුචර්පත් අතරින් රු. මිලියන 222.6 ක් වටිනා වවුචර්පත් 46,470 ක් සඳහා පොහොර නිකුත් කර නොතිබු අතර යල කන්නයේ ගොවීන් වගා නොකිරීම නිසා රු.මිලියන 33 ක් වටිනා වවුචර්පත් 5,327 ක් අවලංගු වී තිබුණි. තවද,පොහොර අවශ්‍ය ගොවීන් නිශ්චිතව හඳුනාගත නොහැකි වීම නිසා රු. මිලියන 1,162 ක් වටිනා වවුචර් 211,583 ක් අවලංගු වී තිබුණි.

**මූල්‍ය සහනාධාර අවශ්‍ය වේලාවට ලබා නොදීම**

2023/2024 මහ කන්නය සඳහා වී වගා කරන ගොවීන් වෙත මූල්‍ය සහනාධාර ලබාදීමට 2023 ජූලි 17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබුණි. එහෙත් මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 16 ක ගොවීන් 32,563 කට රු.මිලියන 534.4 ක මුදලක් මහ කන්නයේ ආරම්භක මාසය වන ඔක්තෝබර්

මාසයේදී ලබාදී නොතිබීම නිසා වී වගා කළ ගොවීන්ට පොහොර අවශ්‍ය වේලාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**හරිත ගෘහ ඉදිකිරීම**

සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු අස්වැද්දවීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 25 ආවරනය වන පරිදි සුහුරු ගම්මාන වැඩසටහන යටතේ හරිත ගෘහ ඉදිකිරීම සඳහා රු.මිලියන 375 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එම වැඩසටහන යටතේ රු.මිලියන 151.3 ක ප්‍රතිපාදන මත දිස්ත්‍රික්ක 16 ගෘහ 291 ක් ඉදිකිරීම සඳහා යෝජිතව පැවති අතර 2023 වර්ෂය තුළදී හරිත ගෘහ 145 ක ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. එහි ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 49 ක් වී තිබුණි.

**ගබඩා නිෂ්කාර්යව පැවතීම**

ලෝක බැංකු ණය ආධාර යටතේ කොවිඩ් 19 හදිසි තත්ත්වය මත ගබඩා පහසුකම් ඇති කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදි ලද රු. මිලියන 113.8 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන දිස්ත්‍රික් කාර්යාල 06 ක ගබඩා 11 ක් 2023 මැයි 31 දින වැඩ අවසන් කර තිබුණද ඒවා 2024 පෙබරවාරි 29 දින වන විටත් නිෂ්කාර්ය වත්කම් ලෙස පැවතුණි.

**පුරන් කුඹුරු අස්වැද්දීම**

2023 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව පුරන් කුඹුරු අක්කර 3,809 ක් අස්වැද්දීම සඳහා රු.මිලියන 162.8 ක ප්‍රතිපාදන වෙන්කර අක්කර 2,986 ක් පමණක් අස්වැද්දීමට එයින් රු. මිලියන 137.6 ක් වැයකර තිබුණි.

**පැරෂුට් තැටි 3,265,800 ක් ගොවීන් වෙත බෙදා දීම**

තිරසර ජාතික ආහාර සුරක්ෂිතතාවය උදෙසා කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව යෙදවීම සහ යටිතල පහසුකම් සැපයීම තුළින් ඵලදායීතාව ඉහළ නැංවීමේ සංවර්ධන වැඩසටහන යටතේ පැරෂුට් ක්‍රමය භාවිතයෙන් කුඹුරු අක්කර 6,682 ක වී වගා කිරීම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 200 ක් ප්‍රතිපාදනය කර තිබුණි. රජයේ දායකත්වය ලෙස රු.මිලියන 144.4 ක් වැයකර පැරෂුට් තැටි 3,265,800 ක් ගොවීන් වෙත බෙදා දුන් බව සඳහන් වුවද තැටි 447,985 ක් දිස්ත්‍රික් කාර්යාලවල පැවතුණි. ලබා දී තිබූ පැරිෂුට් තැටි වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගෙන් රු.මිලියන 20.8 ක් අයකරගත යුතුව පැවතුණි.

**නිෂ්කාර්ය වාහන**

ලෝක ආහාර ව්‍යාපෘතියෙන් 2015 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR-0098 දරන ජීප් රථය ලියාපදිංචිය සිදුකර භාවිතයට නොගෙන එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි.

**ගබඩා භාරකරු විසින් ටයර් 58 ක් වංචනික ලෙස ඉවත් කිරීම**

නාරාහේන්පිට අමතර කොටස් ගබඩාවේ ගබඩා භාරකරු විසින් භාණ්ඩ ලැබීම් තොග පොත්වලට ඇතුළත් නොකර, නිකුත් නියෝග මගින් ටයර් නිකුත් කළ බව දැක්වීම හා ටයර් ශේෂයන් වැරදි ලෙස

තුලනය කර 2021 වර්ෂයේ සිට, 2023 ජූනි 12 දින දක්වා කාලය තුළ මිලදී ගෙන තිබුණු රු. මිලියන 2.1 ක් වටිනා ටයර් 58 ක් වංචනික ලෙස ඉවත් කර තිබුණි. එසේ වුවද එම අලාභය අයකර ගැනීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට 2024 අප්‍රේල් 31 දක්වා කටයුතු කර නොතිබුණි.

**සහනාධාර පොහොර ඌනතාවය**

2005/2006 මහ කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මඩාටුගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය කළ යුතු සහනාධාර පොහොර ඌනතාවය වූ රු. මිලියන 32.5 ක් වූ නමුත් එක් නිලධාරියෙකුගෙන් අය කළ යුතු වටිනාකම වූ රු. 77,912 ක් පමණක් අය කරගෙන තිබුණි. ඉතිරි රු. මිලියන 32.4 ක මුදල 2024 මාර්තු 31 දින දක්වා අය කරගෙන නොතිබුණි. මෙම අලාභයෙන් රු. මිලියන 16.2 ක අලාභයට වගකිව යුතු ගොවිජන සංවර්ධන නිලධාරියා සාමාන්‍ය ක්‍රමය යටතේ වයස 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගැන්වීම සිදුකර තිබූ නමුත් එම අලාභය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 43(අ) යටතේ අයකර ගැනීමට කටයුතු කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. එහෙත් 2024 මාර්තු 31 දින දක්වා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**අලාභහානි අයකර නොගෙන විශ්‍රාම ගැන්වීම**

ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රැහැන් රහිත අන්තර් ජාල පද්ධතියට අයත් රු. මිලියන 0.9ක් වටිනා checkpoint 3200 වර්ගයේ firewall උපකරණය, 2020 වර්ෂයේ මාර්තු 15 දින අස්ථානගතවීම සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 22 දින ලබා දුන් මූලික විමර්ශන වාර්තාව අනුව එම අලාභය ජල කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් අයකර ගැනීමට තිරණය කර තිබුණි. එසේ වුවද මූලික විමර්ශනය සිදුකරමින් තිබියදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2/17 මගින් 2020 නොවැම්බර් 10 දින එම නිලධාරියා විශ්‍රාම ගන්වා තිබුණි. තවද, ඔහුගේ උසස්වීමකට අදාල හිඟ වැටුප් හා විශ්‍රාම නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී ගෙවිය යුතු දීමනාව වශයෙන් රු. මිලියන 1.4ක් 2022 දෙසැම්බර් මාසයේදී ගෙවීම් කිරීමේදී ඉහත අලාභය අයකර නොගැනීම හා අදාළ නිලධාරියා ප්‍රශ්ණකාරී අවස්ථාවක විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2/17 මගින් විශ්‍රාම ගැන්වීම විගණනයට ගැටළු සහගත විය.

## සීමාසහිත කොමර්ෂල් පොහොර සමාගම

**අය විය යුතු මුදල්**

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම පෞද්ගලිකරණය කර 1997 ජූලි 29 දින සිට නැවත එම සමාගමෙ රජය විසින් 1997 ජනවාරි 20 යන කාල සීමාව තුළදී අත්පත් කරගෙන ඇත. එම කාළ සීමාව තුළදී ණය පදනම මත විවිධ පෞද්ගලික සමාගම් 15 ක් වෙත පොහොර නිකුත් කිරීම වෙනුවෙන් සමාගමට අය විය යුතු රු.මිලියන

22.05 ක් වූ ණය ශේෂ සනාථ කර ගැනීම සඳහා ලියවිලි නොපැවතීම හේතුවෙන් ණය අයකර ගැනීමට හෝ ඒ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2023 දෙසැම්බර් 31 දක්වා සමාගම අපොහොසත් වී තිබුණි.

## සීමාසහිත ලංකා පොහොර සමාගම

**අය විය යුතු මුදල්**

2023 දෙසැම්බර් 31 දිනට පැවති ණයගැති ශේෂය රු.මිලියන 1,066.77 ක් වූ අතර එම ශේෂයෙන් වර්ෂ 10 කට වඩා වැඩි රු.මිලියන 86.5 ක් වූ අතර එයින් රු.මිලියන 86.31 ක් රජයේ ආයතන වලින් ලැබිය යුතු විය.

## ගොවිජන සංවර්ධන අරමුදල

**අය විය යුතු මුදල්**

ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ ලබාදී ඇති රෝද 02 ට්‍රැක්ටර් සඳහා අයවිය යුතු මුදල් 2015 වන විට අයකර ගත යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 105.1 ක මුදලක් ගොවීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**තොරතුරු පද්ධතිය**

2022 ඔක්තෝබර් මාසයේදී රු. මිලියන 30.9 ක් වැය කරමින් ගොවිජන සේවා කාරක සභා සහ ගොවි බැංකු සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීමට ගිවිසුමකට එළඹ තිබුණි. ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව අදියර 05 ක් යටතේ මාස 07 ක් ඇතුළත අදාළ කාර්යය නිම කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින දක්වාම අදාළ කාර්යය නිමකර නොතිබුණි.

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

**අරමුදල් උපයෝජනය**

2023 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට භාණ්ඩාගාරයෙන් රු. මිලියන 178.2 ක් ද වෙනත් ආදායම් ලෙස රු. මිලියන 108.3 ක්ද ලැබී තිබූ අතර එයින් රු. මිලියන 271.2 ක් උපයෝජනය කර තිබුණි.

**ජීව වායු ව්‍යාපෘතිය**

2011 වර්ෂයේදී රු. මිලියන 1.1 ක් වැයකර ආරම්භ කළ ජීව වායු ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට අක්‍රීය වී තිබුණු අතර 2022 ජුනි 23 දින ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාව අනුව හිටපු අධ්‍යක්ෂකවරයා විසින් ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කර එම ව්‍යාපෘතියට අවශ්‍ය අමතර කොටස් මිළදී ගෙන යෙදීම හා අනෙකුත් නිලධාරීන්ද සම්බන්ධ කරගෙන එහි ක්‍රියාකාරිත්වයට බාධා වන පරිදි ක්‍රියාකර ඇති බවට නිගමනය කර ඇතත් සිදු වූ එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**වැටුප් හා දීමනා ප්‍රතිපූරණය**

2020 පෙබරවාරි 07 දින සිට 2022 නොවැම්බර් දක්වා වී අලෙවි මණ්ඩලයේ උප සභාපති තනතුර සඳහා පත්කර තිබුණු ආයතනයේ

ජොෂ්ඨ පර්යේෂණ නිලධාරියා වෙනුවෙන් ඉහත සඳහන් කාලය සඳහා ගෙවන ලද රු. මිලියන 4.2 ක වැටුප් හා දීමනා වී අලෙවි මණ්ඩලයෙන් අයකර ගෙන නොතිබූ නමුත් ලැබිය යුතු මුදලක් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

**අරමුදල් උපයෝජනය**

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයට භාණ්ඩාගාරයෙන් රු.මිලියන 29 ක් ද වෙනත් ආදායම් ලෙස රු. මිලියන 103 ක්ද ලැබී තිබූ අතර එයින් රු. මිලියන 72 ක් උපයෝජනය කර තිබුණි.

**අවිධිමත් කාර්යයන්**

පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු. මිලියන 81.1 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලය මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර ලැබූ මුදලින් රු.මිලියන 76.1 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

**බඩඉරිඟු ආනයනය**

2023 වර්ෂයේ මණ්ඩලයට ලැබී තිබුණු ආනයන බලපත්‍රය යටතේ පුද්ගලික සමාගම් දෙකක් විසින් ගෙන්වන ලද කි.ග්‍රෑම් 8,484,036 ක් වූ බඩඉරිඟු මණ්ඩලයේ මැදිහත් වීමකින් තොරව විකුණා තිබුණි.

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**තොරතුරු පද්ධතිය**

වගාහානි රක්ෂණ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා නිර්මාණය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය, වටිනාකම තක්සේරු කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

තවද, වගා හානි අයදුම්පත් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ගොවීන් වෙතින් මාර්ගගත ක්‍රමයට අයදුම්පත් ලබා ගැනීමට හා ඒවායේ හානිය පරීක්ෂා කිරීමට දිස්ත්‍රික් කාර්යාලවල සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ට හැකිවන ලෙසින් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන Geo Goviya තොරතුරු පද්ධතිය සමඟ සම්බන්ධ කර නොතිබුණි. ඒ හේතුවෙන් වන්දි ගණනය කිරීම සහ එහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට එමගින් අවස්ථා සලසාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් සේවයේ යෙදවීම**

2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් 2022 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන සහ වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 5 ක් සේවයේ යොදවා අනුමැතියකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 4 ක් ගෙවීම් කර තිබුණි.

**වන්දි මුදල් නොගෙවීම**

ගොවීන් 8,185 ක් වෙත ගෙවීම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී බැංකු වෙත යවන ලද රු.මිලියන 70.8 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මගින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම ශේෂය නිරවුල් කිරීමට හෝ භාණ්ඩාගාරයට ආපසු යැවීමට කටයුතු කර නොතිබුණි.

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක අරමුදල්

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය**

යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සංඛ්‍යාව 64,117 ක් වූ අතර 2018 වර්ෂයෙන් පසු කිසිදු සාමාජිකයෙකු බඳවා ගෙන නොතිබුණි. ධීවරයින්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයින්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයින් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**අඛණ්ඩ පැවැත්ම**

යෝජනා ක්‍රමයේ මුළු වත්කම් රු.මිලියන 2,202.7 ක් සහ මුළු වගකීම් රු.මිලියන 89,457.3 ක් වූයෙන් වත්කම් ඉක්ම වූ වගකීම් රු.මිලියන 87,254.5 ක්ද, මුළු ජංගම වත්කම් රු.මිලියන 1,092.5 ක් සහ මුළු ජංගම වගකීම් රු.මිලියන 2,527.3 ක්ද වූයෙන් ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.මිලියන 1,434.8 ක්ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.

**විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය**

යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක් වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස්ගත වූ ගොවීන් 474,803 ක් වුවත් එයින් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප්

ගෙවා නොතිබුණි. 2022 වර්ෂයේදී අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප් හිමිවිය යුතු ඉල්ලුම්පත්‍ර එවා නොමැති, දායකයින් සොයා විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් වෙත 2023 ජුනි 23 යොමු කරන ලද අංක 6/FPS/පා/2 දරන ලිපිය මගින් දැනුම් දී තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 12 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී එයින් කාර්යාල 6 ක් නියමිත පරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**තොරතුරු පද්ධතිය**

තොරතුරු පද්ධතියක් සඳහා දත්ත රැස්කිරීමට 2017 වර්ෂයේදී රු.මිලියන 5.6 ක් වියදම් කර ඇතත් අපේක්ෂිත තොරතුරු රැස් නොකිරීම නිසා තොරතුරු පද්ධතිය සකස්කර නොතිබුණි.

## ගොවීන්ගේ භාරකාර අරමුදල

**අයකර නොගත් ණය**

2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවිමේදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.මිලියන 44.2 ක කෙටිකාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 1.4 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු පත් කර තිබුණු නමුත්, තවදුරටත් අයකර නොගත් ණය ශේෂය රු. මිලියන 39.9 ක් වී තිබුණි.

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

**වැඩිපුර ගෙවූ යැපුම් දීමනා**

2017 වර්ෂයේ සිට කොවිඩ් වසංගත තත්ත්වය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පශ්චාත් උපාධි සඳහා විදේශගත වූ, ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් 25 දෙනෙකු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපත්ති සභාවට නොදන්වා මෙරටට පැමිණ සිටි කාලසීමාව සඳහා ගෙවා තිබුණු යැපුම් දීමනාව රු.මිලියන 21 කින් තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 8.4 ක් වී තිබුණි.

**නිෂ්කාර්ය අරමුදල්**

කෙන්යා පර්යේෂණ මධ්‍යස්ථානයකින් ලද මූල්‍යාධාරවලින් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අංක 2323246 දරන ව්‍යාපෘති බැංකු ගිණුමෙහි ශේෂව පවතින රු.මිලියන 1.2 ක මුදල සභාව වෙත ලබාගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර හෝ නොතිබුණි.

## ජාතික කෘෂිකාර්මික විවිධාංගකරණ හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය)

**ප්‍රතිලාභීන් වෙත නිකුත් කළ චෙක්පත්**

2016 සිට 2017 දක්වා කාලය තුළ පාංශු සංරක්ෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිලාභීන් වෙත නිකුත් කර තිබූ එකතුව රු.මිලියන 1.62 ක චෙක්පත් 341 ක් ගෙවීම සඳහා ඉදිරිපත් නොවීම සම්බන්ධයෙන්

අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව දිගුකාලීන බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**අධිකාරියට පවරා නොගත් ඉඩම්**

කොත්මලේ අක්කර 05 ක ගොවිපල ඉඩම අධිකාරියට පවරා ගෙන නොතිබුණි.

## ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

**මිලදීගත් උපකරණ භාවිතා නොකිරීම**

ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 7.29 ක් වැයකර මිලදීගෙන තිබූ Gps Trackers unit 100 ක් හා Tempered Data Lorggers 130 ක් භාවිතයට ගෙන නොතිබුණි. මේ නිසා එම සමස්ත වියදම ආයතනයට ආර්ථික නොවූ වියදමක් බවට පත්වී තිබුණු නමුත් එම උපකරණ මිලදී ගැනීමට නිර්දේශකළ, අනුමත කළ සහ වගකිව යුතු අනෙකුත් පාර්ශව සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**ඌන උපයෝජිත පර්යේෂණ යන්ත්‍රය**

2015 වර්ෂයේදී විද්‍යාගාර පර්යේෂණ කටයුතු සඳහා රු.මිලියන 15.21කට මිලදීගෙන තිබූ Gas Chromatograph Mass Spectrometer (GCMS) යන්ත්‍රය, පූර්ණ වායුසමන තත්ත්වයක් යටතේ පවත්වා ගෙන යායුතු අතර සහ වාර්ෂික නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 0.27 ක් වැයකල යුතු විය. එහෙත් මෙම යන්ත්‍රය මිලදී ගෙන වර්ෂ 09 කට ආසන්න කාලයක් ගත වී ඇතත් විගණිත දින වූ 2023 මාර්තු 20 දින විට අවස්ථා කිහිපයකදී හැර භාවිතයට ගෙන නොතිබූ අතර ඌන උපයෝජිතව පැවතුණි.

**නවෝත්පාදන යන්ත්‍ර සමාජගත කිරීම**

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ ක්‍රියාත්මක පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණක් වේ. නමුත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී 2000 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 24ක කාලය තුළ යාන්ත්‍රික වැඩපොළේ පවත්වාගෙන යන නිෂ්පාදිත යන්ත්‍ර සහ උපකරණ ලේඛනය අනුව එළිදක්වා ඇති නවෝත්පාදන යන්ත්‍ර වර්ග 19 න් එක් යන්ත්‍ර වර්ගයක් පමණක් සමාජගතකර තිබුණු අතර යන්ත්‍ර හා උපකරණ 09 ක් සඳහා පමණක් පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබුණි.

**දත්ත සමුදායක් පවත්වාගෙන නොයාම**

කෘෂි භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර, ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල් තබාගත නොහැකි කෘෂි බෝගවල පසු අස්වනු හානිය සියයට 30 ත් සියයට 40 ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. 2023 වර්ෂය අවසන්වන විට එම සමීක්ෂණය

සිදුකර වසර 14 ක කාලයක් ගතවී තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් පසුඅස්වනු හානිය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රමවේදයන් මඟින් හඳුනාගෙන තිබූ පසුඅස්වනු හානිය අවම කරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොතිබුණි.

**රසායනාගාර යන්ත්‍ර අක්‍රියවීම**

රසායනාගාරයේ පැවති එකතු වටිනාකම රු.මිලියන 8.33 ක් වූ Atomic Absorption Spectrophotometer සහ Handel Wheel Vertical Autoclave යන්ත්‍ර 02 ක අක්‍රියවීම හේතුවෙන් එම යන්ත්‍රය භාවිතා කර කරනු ලබන පර්යේෂණ කටයුතු පිළිවෙලින් 2018 හා 2019 යන වර්ෂවල නවතා තිබුණි. මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට 2020 වර්ෂයේ සිට සැලසුම්ගත වැඩපිළිවෙලක් ආයතනය ක්‍රියාත්මක කර නොතිබුණි.

**පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වාදීමේ පර්යේෂණය**

2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වාදීමේ පර්යේෂණයේ (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.මිලියන 9.57 ක් වැය කර තිබුණද, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි.

**ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක බැරලෝහ පරීක්ෂාව**

2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.මිලියන 1.95 ක් වැයකර නියැදි 500 ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරු කරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර, ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබුණි.

## අපනයන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය හා ප්‍රවර්ධනයට සම්බන්ධ රාජ්‍ය ආයතනවල කාර්යභාරය ඇගයීම සම්බන්ධයෙන් සිදුකරන ලද කාර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ

**පනතට අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම**

කුළු බඩු හා ආශ්‍රිත බෝගවලින් ජාතික ආදායමට වන දායකත්වය ක්‍රමවත්ව ඉහළ නැංවීමටත් ඒ ක්ෂේත්‍රයේ ඉදිරි සංවර්ධන හා පර්යේෂණ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා පුළුල්ව සිදු කිරීමේ අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන 1992 අංක 46 දරන පනතේ ඇතුලත් නොවන බව නිරීක්ෂණය කර තිබුණි. එබැවින් 2009 ඔක්තෝබර් 28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පනතට අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව සංශෝධන ඇතුළත් කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර එකඟතාවය ලබාගෙන ඇතත් අමාත්‍යාංශ වරින් වර මාරුවීම නිසා 2022 සැප්තැම්බර් 02 විගණන අවස්ථාව වන විටත් පනත සංශෝධනය කිරීම සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

**පුවක් පැළ නිෂ්පාදනය අඩු වීම**

2018 වර්ෂයේ දී 283,953 ක් වූ පුවක් පැළ නිෂ්පාදනය 2021 වන විට 88,958ක් දක්වා අඩු වී තිබුණි. එම කාල සීමාව තුළ පුවක් පැළ නිෂ්පාදනය සියයට 29 සිට සියයට 4.37 දක්වා අඩු වී තිබෙන බව නිරීක්ෂණය විය.

**කෝපි පැළ නිෂ්පාදනය වැඩිවීම**

2018 වර්ෂයේ දී 56,509 ක් වූ කෝපි පැළ නිෂ්පාදනය 2021 වන විට 203,258 දක්වා වැඩි වී තිබුණි. 2018 වර්ෂයේ සිට 2021 දක්වා කාල සීමාව තුළ පැළ තවාන් 11 හි සමස්ත පැළ නිෂ්පාදනයෙන් කෝපි පැළ නිෂ්පාදනය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි වී තිබීම යහපත් ප්‍රවණතාවයක් බව නිරීක්ෂණය විය.

**කෘෂිකාර්මික බෝග පිළිබඳ ප්‍රමිත**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික බෝග පිළිබඳ ප්‍රමිත සකස් කර බීජ සහතික කිරීමේ සේවයට ලබා දී තිබුණි. 2003 අංක 22 දරන බීජ පනත සම්මත වී වසර 20 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද එම ප්‍රමිත ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

## නැනෝ නයිට්‍රජන් දියර පොහොර ආනයනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

**පොහොර ආනයනය සඳහා ගෙවීම**

නැනෝ දියර පොහොර ලෙස සඳහන් පොහොර ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කාලපරිච්ඡේදය වන විට ඉන්දියානු නිෂ්පාදකයා වූ IFFCO සමාගමේ වෙබ් අඩවියෙහි නැනෝ දියර පොහොර මිලි ලීටර් 500 ක බෝතලයක මිල එ.ජ.ඩොලර් 3.185 ට සමාන වූ ඉන්දියානු රුපියල් 240 ක් ලෙස දක්වා තිබුණ ද රේගු

සටහන්කර අනුව එම බෝතලයක් එ.ජ.ඩොලර් 5 කට ශ්‍රී ලංකාවට ගෙන්වා තිබුණි. කෙසේ වෙතත් එම වෙබ් අඩවියෙහි සඳහන් මිලටම ශ්‍රී ලංකාවට ආනයනය කල හැකිව තිබූ බව කරුණු විගණනයේදී තහවුරු නොවුණ ද අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි සඳහන් පරිදි දියර පොහොර මිලිලීටර 500 ක බෝතලයක මිල එ.ජ.ඩොලර් 5.25 (FCA) ක් බවට 2021 නොවැම්බර් 10 දින පැවති රැස්වීමකදී අනාවරණය වී තිබුණි. එවැනි දැනුවත් භාවයක් තිබියදී අඩු මිලකට මිලදී නොගෙන නැනෝ නයිට්‍රජන් දියර පොහොර බෝතල් 100,224 ක් එ.ජ.ඩොලර් 12.45 සහ බෝතල් 206,232 ක් එ.ජ.ඩොලර් 10 ක් වැනි ඉහළ මිලකට මිලදී ගෙන තිබීම හේතුවෙන් රජයට වාසිදායක මිලකට සැපයුම්කරු සමඟ ගිවිසුම්ගත වීමට CCFL සමාගම සහ/හෝ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු කර නොමැති බව සහ එම තත්ත්වය තුල සාධාරණ ලාභාන්තිකයක් ඉක්ම වූ ලාභයක් සැපයුම්කරු/ ඔහුගේ නියෝජිතයා/ නිෂ්පාදකයා ලබා ගෙන ඇති බව නිරීක්ෂණය විය.

**රජයන් දෙක අතර ගනුදෙනුවක් ලෙස සිදු කිරීමේ හැකියාව ගැන ඇගයීමක් සිදු නොකිරීම**

ඉන්දීය ණය පහසුකම ලැබෙමින් තිබිය දී සහ අදාල සැපයුම්කරු ඉන්දීය රජයට අයත් ආයතනයක් ලෙස විවිධ අවස්ථාවල හඳුන්වා දී තිබියදීත් මෙන්ම එම ණය පහසුකම යටතේ දියර පොහොර ලබාදීමේ හැකියාව ද පවතින බව සඳහන් කර තිබියදීත් මෙම ගනුදෙනුව රජයන් දෙක අතර ගනුදෙනුවක් ලෙස සිදු කිරීමේ හැකියාව පිළිබඳව ඇගයීමක් කර තිබූ බව නිරීක්ෂණය නොවීය.

**ස්වකැමැත්තෙන් ඉදිරිපත් කළ සියලු යෝජනා ඇගයීම් නොකිරීම**

කෘෂිකර්ම අමාත්‍යවරයා හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් 2021 සැප්තැම්බර් 21 දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී පැවති සාකච්ඡාවක දී ඉතා හදිසි කටයුත්තක් ලෙස සලකා ස්වකැමැත්තෙන් ඉදිරිපත් කළ යෝජනා (Unsolicited Proposal) ඇගයීම් කර පොහොර ආනයනය කිරීමට සීමා සහිත CCFL සමාගමට උපදෙස් ලබාදී තිබුණු බව 2021 සැප්තැම්බර් 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ දක්වා තිබුණි. එසේ වුවද Muller International සමාගම විසින් ඉදිරිපත් කළ ලංසු ලේඛන හෝ මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් නොකළ බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ ලේකම් විසින් 2023 අගෝස්තු 14 දින විගණනයට දන්වා තිබූ හෙයින් අමාත්‍යාංශ උපදෙස් නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

**නිෂ්පාදන ධාරිතාවය තහවුරු නොවීම**

IFFCO සමාගම වෙනුවෙන් UFT විසින් ලබා දුන්නේ යැයි සැලකෙන යෝජනාව තුල දියර පොහොර මිලි ලීටර් 500 ක් අඩංගු බෝතල් 4,250,000 ක් නියමිත කාලය තුළ නිපදවීමට අවශ්‍ය ධාරිතාවය, ගබඩා පහසුකම්, අපනයන සඳහා අනුමැතිය හා හැකියාව

පවතින බව සඳහන් කර නොතිබුණු අතර අදාල ඇගයීම් කිරීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය ඒ පිළිබඳව යොමු වී තිබුණු බවද නිරීක්ෂණය නොවීය.

**අමාත්‍ය මණ්ඩලය වෙත තොරතුරු වසන්කිරීම**

ශ්‍රී ලංකා ආර්ථිකයට ඉතා වැදගත් තීරණයක් ගැනීම සඳහා පාදක කර ගන්නා ලද යෝජනා දෙකෙන් එක් යෝජනාවක් වූ Muller International සමාගමෙහි යෝජනාව ඇගයීම සඳහා ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් නොකිරීමට, Muller International සමාගමෙහි යෝජනාවෙහි ඇතුලත් පොහොර වර්ගය කාබනික පොහොර වර්ගයක් ලෙස නිරීක්ෂණය වීම සහ ඒ වන විට කාබනික පොහොර ආනයනය සඳහා පැවති ජනතා විරෝධය ඉවහල් වූ බවත් එහෙයින් එම යෝජනාව සම්බන්ධයෙන් අවධානය යොමු නොකරන ලද බවත් 2023 සැප්තැම්බර් 01 දින එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ අතිරේක ලේකම් (සංවර්ධන) විසින් විගණනයට කරුණු දක්වන ලදී. එසේ වුවද එවැනි කරුණු මත ගන්නා ලද එම තීරණය විචක්ෂණශීලී ලෙස ගන්නා ලද තීරණයක්ද යන්න විගණනයට තහවුරු නොවුණි. මේ බව අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා නොකිරීම මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත තොරතුරු වසන්කර ඇති බව නිරීක්ෂණය විය.

**පූර්ව ගනුදෙනු තහවුරු නොවීම**

IFFCO සමාගම නැනෝ නයිට්‍රජන් දියර පොහොර ආනයනය කිරීම සඳහා තෝරාගෙන තිබුණු බව 2021 නොවැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි දක්වා තිබුණ ද එම සමාගම සමඟ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය හෝ සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම කිසිදු ගනුදෙනුවක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය නොවිය.

**කාබනික නිෂ්පාදන ලෙස නොපිළිගැනීම**

නැනෝ නයිට්‍රජන් දියර පොහොර කාබනික පොහොර වර්ගයක් ලෙස ලියාපදිංචි කිරීමට UFT සමාගම 2021 අගෝස්තු 24 දින ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය, ක්ෂුද්‍ර තාක්ෂණ නිෂ්පාදන (Nano technology Product) කාබනික නිෂ්පාදන ලෙස පිළිනොගන්නා බැවින් නැනෝ නියට්‍රජන් දියර පොහොර කාබනික පොහොර වර්ගයක් ලෙස ලියාපදිංචි කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රතික්ෂේප කර තිබියදීත් කාබනික පොහොර ආනයනය කිරීමට ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් මත UFT සමාගමෙන්ම මෙම දියර පොහොර ආනයනයට කටයුතු කර තිබුණි.

# විදුලිබල හා බලශක්ති

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 12ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකල යුතුව පැවතුණි

**කාර්යභාරය**

සූර්ය, ජලය, තාප, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මඟින් පුනර්ජනනීය බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය හා අධීක්ෂණය.

ශ්‍රී ලංකාවේ විදුලි අවශ්‍යතාවය සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම හා බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.

දිගුකාලීන අවශ්‍යතා පදනම් කර ගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.

ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාවය සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.

විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.

හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම,ග්‍රාමීය විද්‍යුතනය.

ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු, ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වාභාවික වායු ආනයනය, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.

ඛනිජ තෙල් හා ස්වභාවික වායු ගවේෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු.

ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් පෙට්‍රෝලියම් වායු සහ අතුරු නිෂ්පාදන කටයුතු, තොග පවත්වා ගැනීම හා නිෂ්පාදන සහ බෙදා හැරීම.

ඉන්ධන සැපයීම සහ බෙදාහැරීමට අදාල වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.

නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදමින් විදුලිබලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති සහ සූර්යකෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පුද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම.

කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් බලශක්ති උත්පාදනය ඉහළ දැමීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත රු.මිලියන 40,417 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර, 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 13,293 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය


**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

බස්නාහිර, මධ්‍යම හා උතුරු මැද පළාත්වල නව සම්ප්‍රේෂණ මාර්ග හා නව ජාල උපපොලවල් ඉදිකිරීම මගින් සම්ප්‍රේෂණ ජාල සංවර්ධනය කිරීම හා සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් පැකේජ් 4 ක් යටතේ ක්‍රියාත්මක ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය 2015 ජනවාරි ආරම්භ කර 2018 ජනවාරි නිම කිරීමට නියමිතව තිබුණි.

කෙසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 39,942 ක් වැයකර තිබූ මෙම ව්‍යාපෘතියේ පැකේජ 1 හා 2 හි භෞතික ප්‍රගතිය වාර්තා අනුව පිළිවෙලින් සියයට 60 ක් හා 70 ක් විය. ක්‍රියාත්මක කිරීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර(Termination) තිබූ කොන්ත්‍රාත්වලට අදාල පැකේජ 3 හා 4 හි විෂයයන් නැවත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

### ලංකා විදුලිබල මණ්ඩලය


2020 සිට 2023 දක්වා වර්ෂ අවසානය තෙක් ස්ථාපිත කරන ලද විදුලි බලාගාරවල ධාරිතාව පහත රූප සටහනේ දැක්වේ.




රූප සටහන් අංක 2.25.1 : 2020 සිට 2023 දක්වා වර්ෂවල වර්ෂාවසානයට විදුලිබලාගාර ධාරිතාවය
මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2020-2023

ඉහත ප්‍රස්තාරය අනුව 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා එක් එක් බලශක්ති මූලාශ්‍රයන් යටතේ ස්ථාපිත බලශක්ති ධාරිතාවය සැලකීමේදී 2020 වර්ෂයේ මෙගාවොට් 1,383 ක් වූ මණ්ඩලයේ ප්‍රධාන ජල විදුලි බලාගාරයන්හි ධාරිතාවය 2023 වර්ෂයේදී මෙගාවොට් 1,413 දක්වා සියයට 2කින් වැඩිවී තිබූ අතර මණ්ඩලයේ ඉන්ධන බලාගාර ධාරිතාවය මෙගාවොට් 654 සිට මෙගාවොට් 801 දක්වා සියයට 22 කින් වැඩිවී තිබුණි. 2020 වර්ෂයේ මෙගාවොට් 31 ක්ව පැවති මණ්ඩලයේ සුළං බලාගාර ධාරිතාවය 2021 වර්ෂයේ මෙගාවොට් 104 දක්වා සියයට 235 කින් වැඩිවී තිබූ අතර එතැන් සිට 2023 වර්ෂය දක්වා මෙගාවොට් 104 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.එසේම මණ්ඩලයේ ගල් අඟුරු බලාගාර ධාරිතාවය 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙගාවොට් 900 ක් විය. තවද, කුඩා ජලවිදුලි බලාගාර, සුළං, වෙනත් පුනර්ජනනීය බලශක්ති හා ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය බලශක්තිය යනාදී වශයෙන් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන්ගෙන් මිලදී ගනු ලබන බලශක්ති ධාරිතාවය 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙගාවොට් 683 සිට මෙගාවොට් 775 දක්වා සියයට 13 කින් වැඩිවී තිබුණි.

2020 සිට 2023 දක්වා විදුලිබලය ජනනය කරන ලද මූලාශ්‍ර පහත රූප සටහනේ දැක්වේ.





රූප සටහන් අංක 2.25.2 : 2020 සිට 2023 දක්වා විදුලිබලය ජනනය කරන ලද මූලාශ්‍ර
මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2020-2023

බලශක්ති ධාරිතාවයන් ඉහත පරිදි වුවද සත්‍ය ලෙස ජනනය කරන ලද විදුලි බල ධාරිතාවය සැලකීමේදී මණ්ඩලයේ ප්‍රධාන ජල විදුලි බලාගාරයන්හි 2023 වර්ෂයේදී ගිගාවොට් පැය 4,573 ක්ද, මණ්ඩලයේ ගල් අඟුරු බලාගාරයන්ගෙන් උත්පාදනය කරන ලද විදුලි ඒකක ප්‍රමාණය ගිගාවොට් පැය 4,646 ක් ද, මණ්ඩලයේ ඉන්ධන බලාගාරයන්ගෙන් ගිගාවොට් පැය 1,972 ක්ද වී තිබුණි.

මීට අමතරව, කුඩා ජලවිදුලි බලාගාර, සුළං, වෙනත් පුනර්ජනනීය බලශක්ති, ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය බලශක්තිය හා වහලය මත සූර්ය පැනල යනාදී ප්‍රභවයන් වශයෙන් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන්ගෙන් මිලදී ගනු ලැබූ බලශක්ති ඒකක ප්‍රමාණය 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගිගාවොට් පැය 1,858 සිට ගිගාවොට් පැය 2,831 දක්වා සියයට 52 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබූ අතර ඒ අතරින් වහලය මත සූර්ය පැනල මගින් උත්පාදනය කරනු ලබන විදුලි බල ඒකක ප්‍රමාණය ගිගාවොට් පැය 269 සිට 632 දක්වා සියයට 135 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වුවද එය 2023 වර්ෂයේ මුළු බලශක්ති නිශ්පාදනයෙන් සියයට 4 ක් පමණක් වී තිබුණි.

**මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල**

2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ උපයන ලද මෙහෙයුම් ලාභය/(අලාභය) සහ කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය/ (අලාභය) පහත රූප සටහනේ දැක්වේ.




රූප සටහන් අංක 2.26: 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ උපයන ලද මෙහෙයුම් ලාභය/(අලාභය)
මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2013-2023

ඉහත ප්‍රස්තාරය අනුව 2015 වර්ෂය හැර 2014 සිට 2022 දක්වා කාලය තුළදී ලංකා විදුලිබල මණ්ඩලය ලබා තිබූ සමස්ත අලාභය රු. මිලියන 558,048 ක් වී තිබුණි. 2023 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද රු. බිලියන 18.7 ක මූල්‍ය අලාභය අයකර ගැනීමට 2023 ඔක්තෝබර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු සියයට 18 කින් පමණ වැඩි කර තිබුණි. මෙම වැඩි කරන ලද විදුලි ගාස්තු සහ 2023 වර්ෂයේ ලංවිම ජලවිදුලි බලාගාරවලින් ඇස්තමේන්තුගත ජලවිදුලියට වඩා ගි.වො.පැය 790 ක පමණ ජලවිදුලියක් ජනනය කිරීම හේතුවෙන් රු. බිලියන 118.94 ක සැලකිය යුතු මෙහෙයුම් ලාභයක් (මූල්‍ය පිරිවැයට පෙර) සහ රු. බිලියන 61.24 ක සැලකිය යුතු ශුද්ධ ලාභයක් 2023 වසර සඳහා උපයා තිබුණි.


**විදුලිය ගාස්තු සංශෝධන**

2013 අප්‍රේල් 20 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු වැඩි කර තිබුණු අතර ගෘහස්ථ කාණ්ඩය සඳහා 2014 සැප්තැම්බර් 16 දින සිට බලපැවැත්වෙන පරිදි සහ ගෘහස්ථ නොවන කාණ්ඩය සඳහා 2014 නොවැම්බර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු අඩු කර තිබුණි. ඉන් අනතුරුව, 2022 අගෝස්තු 09 දක්වා කිසිදු විදුලි ගාස්තු සංශෝධනයක් සිදු කර නොතිබුණි. 2022 මාර්තු 07 දින සිට රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම සහ 2022 මාර්තු 11 දින ඉන්ධන මිල විශාල ලෙස ඉහළ යාම සැලකිල්ලට ගනිමින් සියයට 79 කින් පමණ මණ්ඩලයේ ආදායම් වැඩි කිරීම සඳහා 2022 අගෝස්තු 10 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු වැඩි කර තිබුණි. 2023 වර්ෂය සඳහා රු. බිලියන 288 ක පුරෝකථනය කළ මුළු අලාභය අයකර ගැනීම සඳහා සියයට 66.2 කින් පමණ

ආදායම් වැඩි කිරීම සඳහා 2023 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි නැවත විදුලි ගාස්තු වැඩි කර තිබුණි.


එක්සත් ජනපද ඩොලරයක විනිමය අනුපාතය සියයට 12 කින් අඩු වීම, ඉන්ධන මිල අඩු වීම සහ විදුලි ඉල්ලුම සියයට 18 කින් අඩු වීම සැලකිල්ලට ගනිමින් 2023 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු සියයට 14.2 කින් පමණ අඩු කර තිබුණු අතර නැවතත්, 2023 මූල්‍ය අලාභය අයකර ගැනීමට 2023 ඔක්තෝබර් 20 සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු සියයට 18 කින් පමණ වැඩි කර තිබුණි. මෙම වැඩි කරන ලද විදුලි ගාස්තු 2024 මාර්තු 04 දක්වා ක්‍රියාත්මක විය.

ඒ අනුව, 2022 අගෝස්තු 10 සිට 2023 ඔක්තෝම්බර් 20 දක්වා කාලය තුළදී විදුලි ගාස්තුවල බලශක්ති අනුපාත සහ කි. වො 300 ට වඩා අඩු කර්මාන්ත කුඩා කාණ්ඩය හැර මාසික ස්ථාවර ගාස්තු වැඩිවීමේ ප්‍රතිශතයන් පහත රූප සටහන්වල දැක්වේ.




රූප සටහන් අංක 2.27 : 2022 ආගෝස්තු 10 ට පෙර පැවති අනුමත විදුලි ගාස්තු සහ 2023 ඔක්තෝබර් 20 සිට අනුමත විදුලි ගාස්තු

මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2020-2023




රූප සටහන් අංක 2.28: විදුලි ගාස්තුවල ස්ථාවර ගාස්තු වැඩිවීමේ ප්‍රතිශතය

මූලාශ්‍ර :ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2020-2023

**අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

මණ්ඩලය විසින් සකස්කර තිබුණු 2018 - 2037 අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018 සිට 2021 දක්වා වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එම වර්ෂ සැලසුම් කරන ලද එකතුව මෙගාවොට් 2,032 ක ධාරිතාවයෙන් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

එසේම, එම සංශෝධනය කරන ලද 2022 - 2041 සැලැස්මට අනුව, 2022 වර්ෂයේදී එකතුව මෙගාවොට් 544 ක ධාරිතාවයකින් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

තවද, 2023 - 2042 සංශෝධිත සැලැස්මට අනුව එකතුව මෙගාවොට් 607 ක ධාරිතාවකින් යුත් බලාගාර 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 185.6 ක ධාරිතාවකින් යුත් නව විදුලි ජනන බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**බලපත්‍රයක් නොමැති නිෂ්පාදකයින්ගෙන් බලශක්තිය මිලදී ගෙන තිබීම.**

ශ්‍රී ලංකා විදුලිබල පනතේ වගන්තිවලට පටහැනිව නියාමකගෙන් අධිකාරි බලය ලබා නොගෙන හා උත්පාදන බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණු විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙදෙනෙකුගෙන් (අයි.පී.පී) 2023 වර්ෂය තුළදී රු. බිලියන 2.96ක් වූ ගිගාවොට් 27.31 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.

**සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කළ යුතු සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන කාර්යයන් 7 ක් 2021 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 102 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද, 2022 අංක 16 දරන විදුලිබල

(සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත අනුමැතිය ලැබී තිබුණු එකතුව මෙගාවොට් 598 ක ධාරිතාවයකින් යුතු NCRE ව්‍යාපෘති අතුරින්, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 4 ක ධාරිතාවයක් සහිත බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**මූල්‍ය අලාභ හේතුවෙන් සැළකිය යුතු පොළී වියදමක් දැරීමට සිදුවීම**

විදුලිය මිලදී ගැනීම් සඳහා සහ ඉන්ධන මිලදී ගැනීම් සඳහා නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද පොළිය ලෙස 2023 වර්ෂය සඳහා පමණක් රු.මිලියන 21,940 ක් වැයකර තිබුණි. තවද, මණ්ඩලයේ අඛණ්ඩ මූල්‍ය අලාභ හේතුවෙන් ප්‍රධාන වශයෙන් ඉන්ධන, ගල් අඟුරු සහ අමතර කොටස් ප්‍රසම්පාදනය, විදුලිය මිලදී ගැනීම් සඳහා ගෙවීම සහ ප්‍රාග්ධන වියදම් සඳහා වන මුදල් ප්‍රවාහ අවශ්‍යතා සඳහා ලබාගත් බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ දිගුකාලීන ණය සඳහා පොලී ලෙස 2023 වර්ෂය සඳහා පමණක් රු. මිලියන 36,873.4 ක් වැයකර තිබුණි.

**අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා විවිධ දීමනා ගෙවීම**

නියැදි විගණන පරීක්ෂණයකට අනුව 2008 අප්‍රේල් 09 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් නොවූ හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් දීමනා වෙනුවෙන් 2023 වර්ෂයේ පළමු මාස 09 සඳහා පමණක් රු. මිලියන 507.47 ක් ගෙවා තිබුණි.

**විදුලි මාර්ග අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම**

දකුණු පළාතේ විදුලිබල පද්ධතියේ පවතින විදුලිබල ජනනයේ සීමාවන් සහ සම්ප්‍රේෂණ ජාලයේ පවතින සීමාවන් ඉස්මතු කරමින් 2016 වසරේ සිට හදිසි විදුලිය මිලදී ගැනීම සඳහා මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉල්ලුම්කර තිබුණි. කෙසේවෙතත්, සැළකිය යුතු ප්‍රමාදයකින් පසුව දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත පොල්පිටිය - හම්බන්තොට කි.වො. 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත 2022 අප්‍රේල් 20 දින නිම කිරීමට අපේක්ෂිත වූ හොරණ - පාදුක්ක කි.වො 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 දෙසැම්බර් 31 දිනටත් නිමකර නොතිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 51.15 ක් වී තිබුණි. 2021 ජනවාරි 23 දින නිම කිරීමට අපේක්ෂිත කි.වො. 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය මූල්‍ය ගැටළු මත

කොන්ත්‍රාත්තුව අවසන් කර (Terminate) තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 59 ක් වී තිබුණි.

**අය කරගත යුතු වෙළඳ ණය**

2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වෙළඳ ණයගැති ශේෂය රු.බිලියන 70.02 ක් විය. එයින් රු. බිලියන 6.18 ක් 2023 දෙසැම්බර් 31 වන දිනට මාස 6 කට වඩා වැඩි කාලයක සිටද රු. බිලියන 2.25 ක් එනම් සමස්ත වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 3.22 ක් වසර 5 කට වැඩි කාලයක සිටද අය නොවී පැවතුණි.

**මිලදී ගත් ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීම**

ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක් වැයකර මිලදී ගත් ඉඩම් 18 ක් 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වාත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. එම ඉඩම් අතරින් රු. මිලියන 36.48 ක් වටිනා ඉඩම් 4 ක් බෙදාහැරීමේ අංශවල ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණු අතර නියදි විගණන පරීක්ෂණයකට අනුව බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, පුනර්ජනනීය බලශක්ති ලබා ගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය හා ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්, ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්හි විවිධ ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කරගෙන තිබූ ඉඩම් 10ක් අත්පත් කර ගැනීමේ කටයුතු අදාළ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර වර්ෂ 6ක් ඉක්මවා ගියද සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

**විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික ප්‍රතිසංස්කරණ**

2002 අංක 28 දරණ විදුලිබල ප්‍රතිසංස්කරණ පනතේ vi වැනි පරිච්ඡේදයේ "විෂය පථය" සහ "ආයතනික කාර්ය රාමුව" අධ්‍යනය කිරීමට හා සමාලෝචනය කිරීමට සහ පොදු මහජනතාවගේ වර්තමාන හා අනාගත අභිලාෂයන් සැපිරෙන වඩාත් උද්යෝගීමත්, ජවසම්පන්න, එලදායී, සහ කාර්යක්ෂම ආයතනික රාමුවක් නිර්දේශ කිරීමට සහ විශේෂයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා සහ ලංකා විදුලි සමාගමද ඇතුලත්ව පොදුවේ "විදුලිබල කර්මාන්තය" සඳහා "ව්‍යාපාර ශ්‍රේණිගත කිරීමේ දර්ශකය" තුළ ශ්‍රී ලංකාව ඉහල නැංවීමට කමිටුවක් පත් කිරීම සඳහා 2022 ජූලි 29 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1089/621/008 වූ "විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ" යන මැයෙන් ඉදිරිපත් කරන ලද සංදේශය මඟින් කරන ලද යෝජනාවට 2022 අගෝස්තු 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

තවද, වර්තමානයේ ලංකා විදුලිබල මණ්ඩලය සතු වන ජල විදුලිය උත්පාදනය, තාප විදුලිය උත්පාදනය සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය යනාදී කටයුතු 2007 අංක 07 දරන සමාගම් පනත

යටතේ සංස්ථාගත කරනු ලබන සීමිත සමාගම් 12 ක් සතු කිරීම සඳහා විධිවිධාන ඇතුළත් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත 2024 ජුනි මස 27 වන දින සිට බලාත්මක කර තිබුණි.

## විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතිය

විදුලිබලය සැපයීමේ සහ බෙදාහැරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම සඳහා වූ මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,228 වූ අතර මෙම ව්‍යාපෘතිය 2017 ජුනි 29 දින ආරම්භ කර 2021 සැප්තැම්බර් 30 දින වනවිට අවසන් කල යුතුව තිබුණ ද අවසන් කිරීමේ දිනය 2025 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ පැකේජ 4 හි කිලෝමීටර් 285, කිලෝ වොට් 33 කුළුණු මාර්ග, 2 එස්එස්බීබී ගැන්ට්‍රි 13ක් ඉදිකිරීමට අදාල (285km ,33kV tower lines 13Nos of 2 SSBB gantries) කොන්ත්‍රාත්තුව 2019 මැයි 30 දින ප්‍රදානය කර තිබූ අතර එය 2021 ඔක්තෝබර් 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද ඉදිකිරීම්වල සැලකිය යුතු ප්‍රමාදයන් නිසා 2024 මාර්තු 31 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 65 ක් ද මූල්‍ය ප්‍රගතිය සියයට 69 ක් ද වී තිබුණි. එමෙන්ම පැකේජ 7 හි ලොට් A1 ට අදාළව 100 MVAr Breaker Switched Capacitor ස්ථාපනය කිරීමේ කටයුතු 2019 අගෝස්තු 01 දින ආරම්භ කර තිබූ අතර එය 2021 ජනවාරි 21 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණ ද, 2024 මාර්තු 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 79 ක් සහ සියයට 88 ක් වී තිබුණි.

## හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර II)

පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම සඳහා වූ මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 39,808 ක් වූ අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූලි 10 දින ආරම්භ කර 2021 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කල යුතුව තිබුණ ද අවසන් කරන දිනය 2024 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන අවසාන ණය දීර්ඝ කිරිම 2024 ජුනි 30 දින දක්වා විය. එසේ වුවද, 2024 මාර්තු 31 වන විට පැකේජ 8 (ලොට් B) අම්බලන්ගොඩ 132/33 kV කොටුමා උපපොළ වැඩිදියුණු කිරීම, පන්නල 132/33kV කොටුමා උපපොළ වැඩිදියුණු කිරීම සහ 132/33kV 31.5 MVA අමතර ට්‍රාන්ස්ෆෝමර් 2ක් සැපයීම සහ පැකේජය 9 කිලෝ වොට් 220 කෙරවලපිටියේ ස්විචින් ස්ටේෂන් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 76 ක් සහ 96 ක් වී තිබුණි.

## LTL ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම

**LTL ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමේ විගණනය සම්බන්ධයෙන් වූ සීමාවන්**

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ රාජ්‍ය සමාගම්වල විගණනය විගණකාධිපතිගේ විෂය පථය යටතට පත්වූ අතර LTL හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම සහ එහි පරිපාලිත සමාගම් විගණනය සම්බන්ධයෙන් LTL ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමේ සේවක සංගමය සමග තවත් දෙදෙනෙක් ගරු අභියාචනාධිකරණයේ ගොනුකල නඩුකරය සහ එච්.ඩී. චමින්ද සහ තවත් 15 දෙනෙකු විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනුකල නඩුකරය මගින් LTL හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ ව්‍යවස්ථාපිත විගණනය විගණකාධිපති විසින් සිදුකරීමට එරෙහිව අතුරු තහනම් නියෝගයක් 2020 ජුලි 10 දින ලබාගෙන තිබුණි. එසේ තිබියදී 2022 ඔක්තෝබර් 10 දිනැති අධිකරණ නියෝගය මඟින් එකී බාධකය ඉවත් කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපතිට පැවරී ඇති බලතල මත එම සමාගමේ විගණනය මාගේ විධානය පරිදි කලහැකිව තිබුණි. එසේ වුවද ඒ වන විට එකී සමාගමේ වාර්ෂික මහසභා රැස්වීමේදි පත්කරනු ලැබූ විගණක ඉවත් කිරීම සඳහා පැවැත්වීමට යෝජිතව තිබූ විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට එරෙහිව වාණිජ මහාධිකරණයෙන් ලබාගෙන තිබූ අතුරු තහනම් නියෝගය හුවා දක්වමින් මාගේ කාර්ය මණ්ඩලයට LTL හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ විගණනයට බාධා පනවා තිබුණි. ඉහත කරුණු හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම සමාගමේ විගණන කටයුතු මාගේ විධානය පරිදි සිදු කිරීමට නොහැකි විය.

කෙසේවෙතත්, 2024 ජනවාරි 01 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විදුලි බල මණ්ඩලය සතුව තිබූ LTL හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ සියයට 63 ක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 28 ක් විදුලි බල මණ්ඩලය විසින් වෙස්ට්කෝස්ට් පුද්ගලික සමාගමට පියවීමට තිබූ හිඟ ශේෂයෙන් කොටසක් පියවීම සඳහා එම සමාගමට පවරා දීමට 2024 පෙබරවාරි 01 වන දින පැවති විදුලි බල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව ඊට අදාල කොටස් 919,517,200 ක් රු.බිලියන 26.08 ක ප්‍රතිශ්‍යාවකට 2024 පෙබරවාරි 07 දින LTL හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම විසින් වෙස්ට්කෝස්ට් පුද්ගලික සමාගමට පවරා තිබුණි.

## ලංකා ගල් අඟුරු සමාගම

**ගල් අඟුරු අඩුවෙන් සැපයීම**

විදේශීය ගල් අඟුරු සමාගමකින් වර්ෂ නවයක කාලයක සිට අයවියයුතු රු.මිලියන 590 ක් ලංකා ගල් අඟුරු සමාගම විසින් එකඟ වූ බේරුම්කරණ ක්‍රමයක් යටතේ 2023 වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

## ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල

**භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයන් හි සිදු වී ඇති අක්‍රමිකතා**

2014 වර්ෂයේදී එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා රු. මිලියන 400.4 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබූ නමුත් මධ්‍යම තැන්පතු පද්ධතිය තුළ අරමුදල නමින් මෙම ආයෝජනයට අදාළ සුරැකුම්පත් නොමැති බව 2015 වසරේදී අනාවරණය විය. කෙසේ වෙතත්, 2018 දී කල් පිරෙන දින දක්වා වූ උපචිත කූපන් පොලිය සමඟ ආයෝජිත මුදල අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව වසර 2 කට වැඩි ප්‍රමාදයකින් පසුව සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. එහෙත්, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි.

## ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල

**නිසි අනුමතීන් නොමැතිව අරමුදලේ රීති වෙනස් කිරීම**

කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් මගින් මින්මතු ඕනෑම අවස්ථාවක දී කලින් කලට හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට අදාල රීති හෝ ඒවායින් යමක් විවර්තනය කිරීම, වෙනස් කිරීම, විකරණය කිරීම, නැවත සෑදීම හෝ පරිවර්ජින්න කිරීම කළ හැකිවේ. කෙසේවෙතත්, අධ්‍යක්ෂක මණ්ඩලයේ, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතීන් නොමැතිව සහ සංශෝධන ගැසට් නිවේදනයක් හරහා ප්‍රකාශයට පත් නොකර, කළමනාකරණ කමිටුවේ බලතල හා රාජකාරිවලට අදාළ රීති, ආයෝජන බලතල, සාමාජිකයින්ට ණය ලබා දීම යනාදී කරුණු අරමුදල විසින් සංශෝධනය කර ඒ අනුව කටයුතු කර තිබුණි.

**භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයන් හි සිදු වී ඇති අක්‍රමිකතා**

2008 සහ 2009 වර්ෂවල එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා භාණ්ඩාගාර බැඳුම්කර තුනක අර්ථසාධක අරමුදලේ මුදල් රු.බිලියන 2.3 ක් ආයෝජනය කර තිබූ අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ අරමුදලේ නමින් මෙම ආයෝජනයට අදාළ සුරකුම්පත් නොමැති බව 2015 වසරේදී අනාවරණය විය. කෙසේ වෙතත්, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් කාලීනව ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි.

## මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු නොගෙවීම**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පළමු කොටසෙහි පරිච්ඡේද (ii) හි 7 වන ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව බද්දට යටත් වන ආයෝජන ආදායම් ඉපයුවද, එම පනතේ 126 (i) ඡේදය ප්‍රකාරව බදු වාර්තා ඉදිරිපත් කොට එම පනතේ 145 වන ඡේදය ප්‍රකාරව බදු ගෙවීම් සිදු නොකරන බව නිරීක්ෂණය විය. විගණනයේ ගණනය කිරීම් අනුව 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා උපයා ගත් ආයෝජන ආදායම් මත ගෙවිය යුතු මුළු බදු මුදල ආසන්න වශයෙන් රු.මිලියන 95.61 ක් වන බව නිරීක්ෂණය වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මේ සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

**ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත, කොමිෂන් සභාවේ නියාමනයට යටතට නොගැනීම**

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත එනම් විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළයුතු වුවත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වර්ෂ 21 කට වැඩි කාලයක් මුළුල්ලේ ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීමට නොහැකි වී තිබුණි. එහෙත් ඛනිජ තෙල්, ලිහිසි ද්‍රව්‍ය හා ජල කර්මාන්ත නියාමනය නොකලද, ඒ වෙනුවෙන් පත් කරන ලද උපදේශකවරුන් සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 20.13 ක් වැය කර තිබුණි.

**සභාවේ බලපත්‍ර නොමැතිව ආයතනවලින් විදුලිය මිලදී ගැනීමට ඉඩහැරීම**

විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කල්ඉකුත් වී තිබුණු ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්ගලික) සමාගම සහ ඒෂියා පවර් (පුද්ගලික) සමාගම්වලින් 2009

අංක 30 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලපත්‍ර නොමැතිව 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මූලික විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කරමින් කෙටිකාලීන පදනමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් උක්ත පනතේ 7 වන වගන්තිය අනුව එම සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


### දේශීය ඛනිජ තෙල් වෙළඳපොල

2023 වර්ෂයේ දේශීය ඛනිජ තෙල් වෙළඳපොල සැපයුම තෙල් ලීටර මිලියන 3,950 ක් වන අතර ඉන් සියයට 91 කට වැඩි සැපයුමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) මඟින් සිදු කර තිබුණි. 2023 වර්ෂයේදී සමස්ථ ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා රු. මිලියන 940,840 ක් සංස්ථාව විසින් වැය කර තිබුණි.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම්වල තත්ත්වය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 162,114 ක දළ ලාභයක් වාර්තාකර තිබුණු අතර එය 2022 වර්ෂයේදී වාර්තාකළ දළ ලාභය වූ රු.මිලියන 39,849 ට සාපේක්ෂව රු. මිලියන 122,265 ක වැඩිවීමකි. එසේම, 2023 වර්ෂයේදී රු. මිලියන 120,310 ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණු අතර 2022 වර්ෂයේ රු. මිලියන 617,589 ක්වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව සංස්ථාවේ ශුද්ධ ලාභය රු. මිලියන 737,899 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ රු. මිලියන 529,477 ක්ව පැවති විනිමය අනුපාත විචලනයේ අවාසිය 2023 වර්ෂයේදී රු. මිලියන 20,340 ක විනිමය අනුපාත විචලනයේ වාසියක් දක්වා රු. මිලියන 549,817 කින් වැඩිවීම සහ 2022 වර්ෂයේදී රජයේ අරමුදල් මඟින් රු. මිලියන 884,093 ක විදේශීය බැංකු ණය පියවීම නිසා 2023 වර්ෂයේදි විදේශීය ණය මත පොලී වියදම රු. මිලියන 97,144 කින් අඩුවීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.

2023 වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4 ක සංස්ථාවේ ආදායම, විකුණුම් පිරිවැය, මූල්‍ය වියදම සහ බදු පසු ලාභය පහත රූප සටහන මඟින් දැක්වේ.




රූප සටහන් අංක 2.29 :2019-2023 දක්වා සංස්ථාවේ ලාභ/අලාභ
මූලාශ්‍රය - සංස්ථාවේ විගණිත මූල්‍ය ප්‍රකාශන

**ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) නිසා රටට සිදුකර තිබුණු පාඩුව**

2007 සිට 2009 දක්වා කාලය තුළ සංස්ථාව විසින් තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කර තිබුණු හෙජින් ගනුදෙනුවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව, එම ගනුදෙනුවලින් 2023 දෙසැම්බර් 31 දක්වා රටට සිදු වූ මුළු පාඩුව රු. මිලියන 14,028 ක් වී තිබුණි. තවද, සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6 ක අයිතියක් සඳහා පෞද්ගලික වාණිජ බැංකුවක් විසින් කොළඹ වාණිජ මහ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2023 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

**මාසික උපයෝගිතා ගාස්තු**

අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව, සංස්ථාව සතු සියලුම අලෙවි නියෝජිත (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු වෙළෙඳුන් විසින් පවත්වාගෙන යනු ලබන (TODO) පිරවුම්හල්වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් 2014 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, CODO සහ TODO පිරවුම්හල් 220 ක් අතරින් අලෙවිකරුවන් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගිතා ගාස්තුව අය කරගෙන තිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 වනවිට සංස්ථාවට අයවිය යුතුව පැවති රු. මිලියන 4,848 ක මුදල අයකර ගැනීමට මේ දක්වා සංස්ථාව අපොහොසත්වී තිබුණි.

**අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට පටහැනිව අලෙවි නියෝජිත කොමිස් ගෙවීම**

2019 ජුලි 30 දිනැති අංක 05/1231 අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව ඛනිජ තෙල්වල දේශීය වෙළඳපොළ මිල උච්චාවචනයන්ගේ බලපෑම මත බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් ප්‍රමාණය උච්චාවචනයවීම මත සංස්ථාවට සහ බෙදුම්කරුවන්ට වන අහිතකර බලපෑම බැහැර කිරීම සඳහා පහත පරිදි ඉහළ හා පහළ සීමාවන්ට යටත්ව කොමිස් ප්‍රතිශතය තීරණය කර තිබුණි.

| | පෙට්‍රල් | | ඩීසල් | |
|---|---|---|---|---|
| | 92 Oct | 95 Oct | LAD | LSD |
| **Upper Cap** | Rs.162 | Rs.170 | Rs.121 | Rs.145 |
| **Lower Cap** | Rs.117 | Rs.128 | Rs.95 | Rs.110 |

වගු අංක: 2.15 ඉහළ හා පහළ සීමාවන්ට යටත්ව කොමිස් ප්‍රතිශතය තීරණය කිරීම

එසේ වුවද, මෙම අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට පටහැනිව, ඉහළ සීමාවන් නොසලකා බෙදුම්කරුවන්ට අලෙවි නියෝජිත කොමිස් මුදල් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂය තුළදී වැඩිපුර ගෙවා තිබුණු රු. මිලියන 14,874 ක අලෙවි නියෝජිත කොමිස් විකුණුම් හා බෙදාහැරීමේ වියදම් යටතේ දක්වා තිබුණු අතර 2024 අප්‍රේල් 30 දිනට වැඩිපුර ගෙවූ මුලු අලෙවි නියෝජිත කොමිස් මුදල රු. මිලියන 31,021 ක් වී තිබුණි.

**පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් ලංකා ඉන්දියන් තෙල් සමාගම සමඟ ගිවිසුම්ගත නොවීම**

ශ්‍රී ලංකා රජය, සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) අතර ඇති කර ගත් 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණද ඒ සඳහා සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ එකඟතාවයෙන් එම ගිවිසුම අලුත් කර හෝ සංශෝධනය කර නොතිබුණි. එසේ තිබියදී සංස්ථාව විසින් 2019 මැයි මස 13 වන දින LIOC පාර්ශවකරුවෙකු ලෙස ගෙන නොමැතිව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) අතර ඇති කරගෙන තිබුණු නියමයන් සහ කොන්දේසි LIOC විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් සම්බන්ධයෙන් වූ අවදානම විගණනයේදි බැහැර කළ නොහැකි විය.

**SAP පරිගණක පද්ධතිය යාවත්කාලීන නොකිරීම**

සංස්ථාව විසින් SAP ERP පද්ධතිය සම්බන්ධයෙන් 2005 වර්ෂයේදී හඳුන්වා දුන් මූලික අනුවාදය (Initial Version) (SAP ECC 6.0) 2010 අප්‍රේල් මස 01 දින සිට මේ දක්වා කිසිදු යාවත්කාලීන කිරීමකින් තොරව භාවිතා කරනු ලබන අතර SAP පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කඩිනම් පියවර මේ වනවිටත් ගෙන නොතිබුණි. මෙම පද්ධතියේ යම් බිඳවැටීමක් හේතුවෙන් රටෙහිම තෙල් සැපයුම අකර්මන්‍ය වීමේ අවදානමක් පවතින බවට නිරීක්ෂණය කෙරේ.

## ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පෞද්ගලික සමාගම (TPTL)

**ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම**

2022 ජනවාරි 06 දිනැති ශ්‍රී ලංකා රජය, CPC, LIOC සහ TPTL අතර ඉදිරි වසර පනහක (50) වලංගු කාලයක් සඳහා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සන්තකයේ තබා ගැනීම, සංවර්ධනය කිරීම සහ භාවිතය සඳහා අත්සන් කරන ලද සිවි පාර්ශවීය ගිවිසුම අනුව TPTL වෙත ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හෝ වෙනත් නිෂ්පාදන ගබඩා කිරීම, ගබඩා කර ඇති නිෂ්පාදන අපනයනය කිරීම වැනි CPC සහ LIOC අතර වඩාත් සම්පූර්ණයෙන් එකඟ වූ ව්‍යාපාර කරගෙන යාමට බලය ලබා දී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපාර කරගෙන යාමට සුදුසු පරිදි ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර තිබුණද එය මූල්‍යනය කිරීම සඳහා සුරක්ෂිත මූලාශ්‍රයක් නොමැති වීමෙන් සැලසුම් කර තිබුණු පරිදි සංවර්ධන කාර්යය සිදුකර නොතිබුණි. එසේම තෙල් ටැංකි සංකීර්ණයේ පවතින ජැටි, නල මාර්ග සහ අනෙකුත් අනුබද්ධ සේවා භාවිතය ඇතුළු පොදු පරිශීලක පහසුකම් භාවිතා කිරීම පිළිබඳව CPC, LIOC හා අනෙකුත් අවශ්‍ය පාර්ශව සමඟ විධිමත් එකඟතාවයකට එළඹ නොතිබුණි.

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශය පියවර නොගැනීම**

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 47 වගන්තිය ප්‍රකාරව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ව්‍යාපෘති සඳහා ණය ඉල්ලුම්කරන ආයෝජකයින් සඳහා අවශ්‍ය ඇප ලබාදීමේ අරමුණින් පිහිටුවා තිබුණු සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 67 වගන්තිය ප්‍රකාරව නියෝග සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂය අවසානයට රු.මිලියන 152.5 ක් වූ අරමුදල අපේක්ෂිත අරමුණට භාවිතා කර නොතිබුණි. තවද පනතේ 46 (3) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල මඟින් සිදු කල යුතු

කාර්යයන් වූ තෝරාගත් නැවත බලගැන්විය හැකි බලශක්ති මත පදනම් වූ බලශක්ති පරිවර්තන පිරියත සඳහා වූ සහනාධාර සැපයීම, බලශක්ති කාර්යක්ෂම උපකරණ සහ තාක්ෂණය භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සහනාධාර සැපයීම, කාර්මික තාප අධික යෙදවුම් ඇතුළු ඉන්ධනවලට හැරවීම සඳහා වූ ප්‍රාග්ධන සහනාධාර සැපයීම සහ බලශක්ති සංරක්ෂණ පියවර යොදාගැනීම දිරිමත් කිරීම සඳහා සහ රටේ සියලු ප්‍රදේශවල ග්‍රාමීය බලශක්ති සේවා දියුණු කිරීම සඳහා යම් සමිතියකට හෝ ප්‍රජාපාදක සංවිධානවලට දිරිදීමනා හෝ වෙනත් සමාන මූල්‍ය ආධාර ලබාදීම යන කාර්යයන් කිසිවක් 2023 වර්ෂය අවසානය වන විටත් සිදුකර නොතිබුණි.

**පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් නොකිරීම**

පනතේ 8 වගන්තිය අනුව එක් එක් ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 16 ක් ගත වී තිබුණද 2024 ජූලි වන විටත් එවැනි සැලැස්මක් ගැසට් කර නොතිබුණි. එසේම පනතේ 19 (1) වගන්තිය යටතේ මධ්‍යම ජාලය තුල වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් වාර්ෂිකව රාජ්‍ය භාගයක් අයකල හැකි වුවත් ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි සකස්කර අදාල ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශය පියවර නොගැනීම**

අධිකාරිය විසින් ඉහළ කාර්යක්ෂම වාහන සහ විදුලි වාහන ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විදුලි වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන 90 ක් සංවර්ධනය කිරීම ඇතුළු පුනර්ජනනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාළ කාර්යයන් 3 ක කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර තවත් ව්‍යාපෘති කාර්යයන් 24 ක ප්‍රගතිය සියයට 10 සිට සියයට 54 ක් වැනි අවම අගයක් වී තිබුණි.

**මධ්‍යම ජාලයෙන් බැහැර වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය නොකිරීම**

ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය ( Available Grid Capacity ) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid ) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 ( අ) වගන්තිය ප්‍රකාරව 2024 ජූලි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර

කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීමට හැකි වී නොතිබුණි.

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

**ආනයනික පාරිභෝගික ද්‍රව්‍යවල විකිරණශීලී ද්‍රව්‍ය හඳුනාගැනීමට පරීක්ෂාවන් සිදු නොකිරීම.**

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 12 (ග) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙරටදී ලබාගත හැකි යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය පරීක්ෂාකිරීම (inspect), විකිරණශීලීතාවය පිරික්සීම සඳහා සාම්පල් ලබාගැනීම සහ සභාව අවශ්‍ය යැයි හෝ යෝග්‍යයැයි සලකන අවස්ථාවක ඒ පිරික්සුමේ ප්‍රතිඵල මහජනයාගේ සහ අදාල සියලු නිලධාරීන්ගේ දැනගැනීම පිණිස පළකිරීම සිදුකල යුතු වුවත් සභාව විසින් ආනයනික කිරිපිටි හැර අනෙකුත් විකිරණශීලී ද්‍රව්‍ය පැවතිය හැකි ආනයනික පාරිභෝගික ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන අහඹු පරීක්ෂාවන් හෝ සිදුකර නොතිබුණි.

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

**බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය සහිත ගැමා මධ්‍යස්ථානය ඉදිකිරීම**

රු. මිලියන 670 ක පමණ වියදමකින් 2014 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය සහිත ගැමා මධ්‍යස්ථානය ඉදිකිරීමේදී දේශීය මාළු, කරවල, එලවළු සහ පළතුරු අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුකූල වන පරිදි විදේශ රටවලට අපනයනය කිරීම තුලින් ඉදිරියේදී ශ්‍රී ලංකාව ජගත් ආහාර කේන්ද්‍රයක් බවට පත්කිරීම තුලින් විශාල විදේශ විනිමයක් ඉපයීමට අපේක්ෂා කර තිබුණද ඒ සඳහා අවශ්‍ය කිසිදු උපායමාර්ගික වැඩසටහනක් මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම තාක්ෂණය භාවිතා කරමින් ඉහත ආහාර ද්‍රව්‍ය ජීවාණුහරණය කිරීම සඳහා දේශීය ආහාර නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් යොමු වී නොතිබුණි.

## ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**කොලොන්නාව තෙල් පර්යන්තයේ නව පොම්පාගාරය ඉදිකිරීම අවසන් නොකිරීම**

සමාගම විසින් 2018 වර්ෂයේදී කොලොන්නාව තෙල් පර්යන්තයේ කලාප 06 හි නව පොම්පාගාරයක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. මෙම පොම්පාගාරය තනි ඉදිකිරීම් පැකේජයක් ලෙස ඉදිකිරීම වෙනුවට සමාගම මෙම කාර්යය වෙන වෙනම ඉදිකිරීම් 05 කට බෙදා

තිබුණි. ගොඩනැගිල්ල, නල ආධාරක ඉදිකිරීම, විදුලි සවිකිරීම්, අංගන සංවර්ධනය සහ සිම්ප්ලෙක්ස් බාස්කට් පෙරනයක් සෑදීම ලෙස සමාගම විසින් මෙම ඉදිකිරීම් 05 වෙන් වෙන් වශයෙන් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ලබා දී තිබුණි. 2019 සහ 2020 වර්ෂයන් තුළදී පොම්පාගාර ගොඩනැගිල්ල, විදුලි සවිකිරීම් සහ අංගන සංවර්ධනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 වර්ෂය අවසන් වන විටත් නල ආධාරක ඉදිකිරීම අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස පොම්පාගාරය අපේක්ෂිත භාවිතයට සුදුසු තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය. මේ සඳහා 2023 වර්ෂය අවසානය දක්වා වියදම රු. මිලියන 97 ක් වී තිබුණි.

**අනාරක්ෂිත ලෙස ගබඩා කිරීම හේතුවෙන් මූරිං හෝසර් එකක් විනාශවීම.**

සමාගම විසින් යූරෝ 44,911 ක් වැයකර තිම්බල් සහිත මූරිං හෝසර් (Mooring Hawser) 02 ක් ආනයනය කර තිබූ අතර එය 2022 ඔක්තෝම්බර් 27 වන දින සමාගම වෙත භාර දී තිබුණි. 2023 නොවැම්බර් 16 හෝ 17 දින, සමාගමේ තෙල් පහසුකම් අංශයේ එළිමහන් ගබඩාවක අනාරක්ෂිත ලෙස ගබඩා කිරීම හේතුවෙන් භාවිත නොකළ රු. මිලියන 13 ක් වටිනා එක් මූරිං හෝසර් ( Mooring Hawser) එකක් නැවත භාවිතා කළ නොහැකි ලෙස විනාශ වී තිබූ බව නිරීක්ෂණය විය.

**ඉඩම් කල්බදු ගිවිසුම් අලුත් නොකිරීම**

සමාගමේ උප ඩිපෝ 09 ක ඉඩම් අයිතිය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඇති අතර, සමාගම මෙම ඉඩම් කල් බදු පදනම යටතේ භාවිතා කරනු ලබයි. මෙම ඉඩම් පරිහරණය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඇති කල් බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ අතර සමාගම මෙම කල්බදු ගිවිසුම කල් ඉකුත් වූ පසුවත් නව ගිවිසුමකට එළඹීමෙන් හෝ පවතින ගිවිසුම අලුත් කිරීමකින් තොරව අඛණ්ඩව මෙම ඉඩම් භාවිතා කරනු ලබන බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය

**ක්‍රියාවලි අත්පොත් සකස් නොකිරීම**

2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය - මෙහෙයුම් අත් පොත 2.3 වගන්තිය අනුව තම ආයතනයට අයත් ප්‍රධාන මෙහෙයුම් කටයුතු සඳහා ඒවා සිදු කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලි අත්පොතක් ද පරිපාලන හා මූල්‍ය මෙහෙයුම් කටයුතු සඳහා ක්‍රියාවලි අත්පොතක් ද සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන කලින් කලට සමාලෝචනය කර

යාවත්කාලීන කිරීම සිදුකල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## ලිට්රෝ ගෑස් ලංකා සමාගම

**ශ්‍රී ලංකාවේ ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් අවශ්‍යතාවය සහ ආනයනය කිරීම**

ශ්‍රී ලංකාවේ LPG පාරිභෝජන අවශ්‍යතාවය දළ වශයෙන් දෛනිකව මෙට්‍රික් ටොන් 1,000 ක් වන අතර, මාසික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 25,000 - 30,000 ක් අතර ප්‍රමාණයක් වේ. තවද වාර්ෂික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 330,000 ක් පමණ වන බව හඳුනා ගෙන තිබුණු අතර එම ප්‍රමාණයෙන් තොග සහ කර්මාන්ත අවශ්‍යතාවය වෙනුවෙන් සියයට 12 ක් ද, සියයට 6 ක් වාණිජ අවශ්‍යතාවය වෙනුවෙන් ද ඉතිරි සියයට 82 ක ප්‍රමාණය ගෘහස්ථ ගෑස් අවශ්‍යතාවය වෙනුවෙන් ද යොදාගනු ලබන බව ද ලිට්රෝ ගෑස් සමාගමෙහි 2023 වාර්ෂික වාර්තාව අනුව අනාවරණය විය.

ඒ අනුව මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා ලිට්රෝ ගෑස් ලංකා සමාගම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් (CPC) තම ගෑස් අවශ්‍යතාවයෙන් සියයට 5 කට වඩා අඩු ප්‍රමාණයක් සපුරා ගනු ලබන අතර ඉතිරි සියයට 95 ක පමණ අවශ්‍යතාවය සෑම මසකම පවතින ගෝලීය වෙළෙඳපොළ මිලට (සෞදි කොන්ත්‍රාත් මිල මත) පහත සඳහන් ගිවිසුම් මිල එකතු වූ පසු මිලකට ආනයනය කර තිබුණි. මෙහි දී වාර ප්‍රසම්පාදනය (Term Contract) යටතේ 2010 සිට 2023 වර්ෂය දක්වා ආනයන සම්බන්ධයෙන් මිල ගණන් පහත වගුවේ දක්වා ඇති අතර මීට අමතරව කෙටිකාලීනව ක්ෂණික ප්‍රසම්පාදනයන්ද (Spot Contract) සිදු කර තිබුණි.

ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය මිල 2010 සිට 2023 දක්වා

| වර්ෂය | සැපයුම්කරු | මෙට්‍රික් ටොන් 1 ක් සඳහා ගිවිසුම් මිල (එ.ජ.ඩො.) | මිල වෙනස්වීමේ ප්‍රතිශතය(%) |
|---|---|---|---|
| 2010 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 82.00 | |
| 2011 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 86.50 | 5 |
| 2012 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ | 126.00 | 46 |
| 2013 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 135.00 | 7 |
| 2014 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 140.00 | 4 |
| 2015 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 105.75 | -24 |
| 2016 | ෂෙල් ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් සමාගම | 58.01 | -45 |
| 2017 | ෂෙල් ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් සමාගම | 47.50 | -18 |
| 2018 | ෂෙල් ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් සමාගම | 47.50 | 0 |
| 2019 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 68.00 | 43 |
| 2020/2022 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 105.40 | 55 |
| 2022 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 118.16 | 12 |
| 2023 | ඕමාන් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් | 118.68 | 0.4 |

වගු අංක 2.16 :ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය මිල 2010 සිට 2023 දක්වා

ඒ අනුව මෙම කාලපරිච්ඡේදය තුලදී වාර ප්‍රසම්පාදනය යටතේ සමාගම් දෙකකින් පමණක් ගෑස් මිලදී ගෙන තිබුණු අතර පසුගිය වසර දහතුනක කාලසීමාව තුළ වසර දහයක්ම එක් සැපයුම්කරුවෙකු වෙත ගෑස් සැපයීමේ වාර ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එම සමාගම් දෙක සැපයූ මිල ගණන් හා පෙර වර්ෂයට සාපේක්ෂව එම මිලෙහි සිදු වූ වෙනස්වීම් ඉහත වගුවෙහි දක්වා ඇත.

ලිට්‍රෝ ගෑස් සමාගම විසින් සිය අවශ්‍යතාවයෙන් සියයට 90 ක පමණ ප්‍රමාණය ඉහත පරිදි ආනයන වෙළෙඳපළෙන් සපුරා ගන්නා අතර ඉතිරි අවශ්‍යතාවය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට කටයුතු කරනු ලබයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බොරතෙල් පිරිපහදු කිරීම මගින් නිපදවන ලද ගෑස්, තොග වශයෙන් ලබාගෙන තිබූ අතර ලෝක වෙළෙඳපළෙහි පවතින ගෑස් මිලට එ.ජ.ඩොලර් 100 ක ප්‍රවාහන ගාස්තුවක් (මෙට්‍රික් ටොන් එකකට) එකතුකල මිලකට එම තොග සමාගම ලබා ගෙන තිබිණි. පසුගිය වර්ෂ 12 ක කාලපර්ච්ඡේදය තුලදී ලිට්‍රෝ ගෑස් සමාගම විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ගෑස් මිලදී ගැනීම පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

**ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ගෑස් මිලදී ගැනීම 2011-2023**

| වර්ෂය | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| **2011** | 14,479.72 |
| **2012** | 11,766.27 |
| **2013** | 16,264.53 |
| **2014** | 20,281.79 |
| **2015** | 6,498.35 |
| **2016** | 6,503.99 |
| **2017** | 16,704.44 |
| **2018** | 15,943.81 |
| **2019** | 18,866.32 |
| **2020** | 20,042.49 |
| **2021** | 10,845.05 |
| **2022** | 3,551.05 |
| **2023** | 19,421.21 |

වගු අංක 2.17 : ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ගෑස් මිලදි ගැනීම 2011-2023

**ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා ගබඩා පහසුකම් සීමාවීම**

ලිට්‍රෝ ගෑස් සමාගම සතුව ගෑස් මෙට්‍රික් ටොන් 8,000 ක් ගබඩා කිරීමේ පහසුකම කෙරවලපිටිය ගබඩා සංකීර්ණයෙහි පවතින අතර මාබිම ගබඩා සංකීර්ණයෙහි මෙට්‍රික් ටොන් 400 ක් පමණ ගබඩා කිරීමේ පහසුකම් ඇත. ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගනු ලබන ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මාබිම සංකීර්ණයේ ගබඩා කරනු ලබන අතර එම ගෑස් කර්මාන්ත අංශය සඳහා නිකුත් කරනු ලබයි. ඒ අනුව පවත්නා මෙට්‍රික් ටොන් 8,400 ක ගබඩා ධාරිතාවය අනුව ශ්‍රී ලංකාවේ පරිභෝජනය සඳහා ආසන්න වශයෙන් දින 8.4 කට පමණක් ප්‍රමාණවත් ගෑස් ගබඩා කර ගත හැකිව ඇත.
සමාගම සතු කෙරවලපිටිය පිහිටි බෝයා පහසුකම (CBM Facility) ප්‍රමාණවත් වනුයේ මෙට්‍රික් ටොන් 3,500 - 5,000 අතර කුඩා ප්‍රමාණයේ ගබඩා පහසුකම් පවතින නැව් ගෙන්වීමට පමණි. නමුත් වර්තමානය වන විට ලෝක ගෑස් ප්‍රවාහනය තුල මෙට්‍රික් ටොන් 20,000 - 100,000 අතර ප්‍රමාණයේ ඉතා විශාල නැව් යොදා ගනු ලබයි. සමාගම සතු බෝයා පහසුකමේ සීමිත බව මත සමාගමට ගෑස් වඩා අඩු මිලකට මිලදී ගැනිමට පවතින හැකියාව සීමා වී ඇත. මෙම බෝයා පහසුකමට ගැලපෙන කුඩා නැව් වර්තමානයේ ගෑස් ප්‍රවාහනයේ දී භාවිතයට ගැනීම අඩු බැවින් ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සමාගමට සිදු වේ. තවද ගෑස් ගොඩබෑමේ පහසුකම සීමා සහිත වීම හේතුවෙන් ශ්‍රී ලංකාව වෙත ගෑස් ආනයනය කිරීමේ දී වරකට රැගෙන ආ හැකි නෞකාවක උපරිම ධාරිතාවය ගෑස් මෙට්‍රික් ටොන් 4,000 ක් පමණ විය.

## බහාලුම්ගත ජංගම ඩීසල් විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම පිළිබඳව සිදු කරන ලද කාර්යසාධන විගණනය

ලංවිම ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ දත්ත සහ කැලණිතිස්ස විදුලි බලාගාරයේ පවත්වාගෙන යනු ලබන ජනක යන්ත්‍ර 50 ට අදාල විදුලිය බිඳවැටීම් වාර්තා අනුව , කොන්ත්‍රාත්කරු විසින් ඉටුනොකරන ලද අතපසුවීම්, අඩුපාඩු, සැලසුම්කරණයේ දුර්වලතා හේතුවෙන් සිදුවූ යන්ත්‍ර බිඳවැටීම් හා නැවැත්වීම් වල බලපෑම නිසා 2022 ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා කාලය තුල ලංකා විදුලිබල මණ්ඩලයට රු. මිලියන 1,263 ක ඇස්තමේන්තුගත මූල්‍ය අලාභයක් සිදුව ඇති බව අනාවරණය වී තිබුණි.

**ජනක යන්ත්‍ර නිරන්තරයෙන් කාර්මික දෝෂයන්ට ලක්වීම**

ජනක යන්ත්‍ර නිරන්තරයෙන් කාර්මික දෝෂයන්ට ලක්වන බවත් ඒ හේතුවෙන් ඒවා උපරිම බලාගාර සාධකයකින් භාවිතා කිරීමේ අවස්ථාව මණ්ඩලයට අහිමි වී ඇති බවත් දෝෂ වගකීම් කාලය තුල කොන්ත්‍රාත්කරු විසින් එම දෝෂ නිවැරදි කිරීම සඳහා ලබා දුන් දායකත්වය අවම මට්ටමක පැවති බවත් නිරීක්ෂණය කෙරේ.

**මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සියළුම සම්බන්ධිත පිරිවැය ඇතුලත් මුළු පිරිවැය

ඇස්තමේන්තුවක් පිළියෙල කල යුතු වුවද මෙම ව්‍යාපෘතියට අදාලව එවැනි ඉංජිනේරු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ලංසුකරුගේ මිල හා තෝරාගත් ලංසුකරුගේ මිල සැසඳීමේදී ද, තෝරාගත් ලංසුකරුගේ මිල රු.මිලියන 1,313.49 (3,432.6 – 2,119.11) කින් අඩු වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 ට අනුව තීරණාත්මක හෝ ඉතා වැදගත් අයිතමයන් පිළිබඳව ලංසුකරු විසින් අතාත්වික අඩු අනුප්‍රමාණයන් සඳහන් කර ඇත්නම්, ඉදිරිපත් කර ඇති අනුප්‍රමාණ අනුව, එම අයිතමයන් ලබා ගත්තේ කෙසේද එම වැඩ ඉටු කරන්නේ කෙසේද එම සේවා සපයන්නේ කෙසේද යන්න පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත්වන පරිදි ලංසුකරුවන්ගෙන් තොරතුරු ඉල්ලා සිටිය යුතු වුවත් මෙම මිලගණන් අතර පවතින සැලකිය යුතු වෙනස පිළිබඳව එපරිදි ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර තිබූ බව නිරීක්ෂණය නොවීය.

**අවම මිල පිළිබඳ තීරණය**

තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද ලංසුකරු හා අවම මූල්‍යමය ලංසුකරු ඉදිරිපත් කල ලංසු අතර ඇති විශාල මූල්‍ය වෙනස හා ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේදී ජාතික යහපතද සලකා අඩුම වාණිජ ප්‍රතිචාර දක්වන ලංසුකරුට (Lowest Commercial Responsive Bidder) ලංසුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ මූලික අරමුණ වනුයේ අවම පිරිවැය සහිත ලංසුව තෝරා ගැනීම නොව, උසස් ගුණාත්මකභාවයක් සහිත අවම පිරිවැයකින් යුතු ඉහල ආර්ථික වාසි ගෙනදෙන ලංසුව තෝරා ගැනීම වේ. නමුත් මෙහිදී තාක්ෂණික වශයෙන් වැදගත් වන යාන්ත්‍රික මෙවලම් තුල ඊට අදාල වන පරිදි කරුණු සැලකිල්ලට ගනිමින්, ප්‍රසම්පාදන කමිටු තීරණ සම්පූර්ණ විය යුතු වුවද එසේ කටයුතු නොකර අවම මිල පිළිබඳ තීරණය ඉහත නිගමන තුල මතුකර දක්වා තිබුණි.

**සැලසුම් සහගත අයුරින් ක්‍රියාත්මක නොවීම**

2019 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ඩීසල් ජනක යන්ත්‍රයන්හි ක්‍රියාකාරීත්වය සැලකීමේදී එය සමස්ත කාලච්ඡේදය පුරා පැය 53,792 ක් ධාවනය වී ඇති බව හා සැලසුම් සහගත නොවන අයුරින් එනම් ඉන්ධන නොමැතිවීම , ලිහිසි තෙල් නොමැතිවීම හා ජනක යන්ත්‍රයන්හි කාර්මික දෝෂ හේතුවෙන් පැය 98,133 ක් ක්‍රියාවිරහිත වී තිබූ බව නිරීක්ෂණය විය.

**ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව**

**සමාගම මිලදී ගැනීමේ අවස්ථා අහිමි වීම**

ලංකා විදුලිබල මණ්ඩලයට දිගුකාලීන ජනන සැලසුම් ළඟාකර ගැනීමට නොහැකි වීමෙන් ජනනය කරනු ලබන විදුලි ඒකක

ප්‍රමාණය දේශීය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගමෙන් විදුලිය මිලදී ගැනීම සඳහා වර්ෂ 10 ක ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු මෙම බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට 2016 මාර්තු 23 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලයේ දී තීරණය කර තිබුණ ද එලෙස කටයුතු කිරීමකින් තොරව 2016 අප්‍රේල් 6 දින සිට 2022 සැප්තැම්බර් 8 දින දක්වා අවස්ථා 4 කදී වසර 05 මාස 06 ක කාලයක් මූලික ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලයට අයත්කර ගෙන රජයට වඩා වාසිදායක ලෙස කටයුතු පවත්වාගෙන යාමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම සමාගමේ හිමිකරු විසින් සමාගම විකිණීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද මිලට වඩා අඩුවෙන් තක්සේරු වී තිබීම හේතුවෙන් මෙම මිලදී ගැනීමේ අවස්ථා අහිමි වී තිබුණි.

**මුල් ගිවිසුමේ අඩුපාඩු**

2003 වර්ෂයේදී ඇතිකර ගත් මුල් ගිවිසුම වර්ෂ 10 කින් අවසන් වුවද එම ගිවිසුම් කාලය අවසන් වීම මුල් ගිවිසුමේ 11 වන ව්‍යවස්ථාව අනුව, Buy out Event පිළිබඳව ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව මෙම ගිවිසුම අනුව ගිවිසුම් කාලය අවසන් වීම මත Buy out Event අවස්ථාවක් ලෙස මෙම බලාගාරය මිළදී ගැනීමේ අයිතිය (සමාගම විසින් බලාගාරය මණ්ඩලය වෙත අලෙවි කිරීමට යෝජනා නොකළද) ලංවිමට අහිමි වී තිබුණි. තවද වසර 20 ක ඵලදායි ජීව කාලයක් සහිත වත්කමක් සඳහා එම වත්කමෙහි පූර්ණ වටිනාකමම වසර 10 ක කාලයක් තුල ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය සමාගම වෙත ගෙවා තිබුණි.

**ප්‍රමාද පොළී ගෙවීම**

පළමු ගිවිසුම් කාලය තුළ ප්‍රමාද පොළී ලෙස රු. මිලියන 580 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාගම වෙත ගෙවා තිබූ බව නිරීක්ෂණය වූ අතර ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලය තුළ ඒ සඳහා රු. මිලියන 1,364 ගෙවා තිබුණි. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය යටතේ ණය ප්‍රාග්ධනය යෙදවීම මඟින් හෝ බලාගාරය මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් ලංවිමට වඩා වාසිදායක තත්වයක් ලගා කර ගැනීමට හැකියාවක් පැවති බව නිරීක්ෂණය විය.

**විවිධ බදු වියදම් ගෙවීම**

මුල් ගිවිසුම් කාලය තුල සමාගම විසින් විවිධ බදු වියදම් සඳහා දරන ලද රු.මිලියන 4,784 ක මුදලක් ලංවිම වෙතින් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි. මේ පිළිබඳ TEC සහ SCANC කමිටුව සිය අවධානය යොමු කර තිබූ බවක් නිරීක්ෂණය නොවුණු අතර ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලය තුළ බදු ප්‍රතිපූර්ණය වෙනුවෙන්, රු. මිලියන 1,499 ක් ගෙවා තිබුණි. එසේම මෙවැනි කොන්දේසි ඇතුළත් ගිවිසුමක් යලි දීර්ඝ කිරීමට කටයුතු කිරීම තුලින් පෞද්ගලික සමාගමක් විසින් රජයට ගෙවිය යුතු බදු රජයේ ආයතනයක් විසින්ම

ගෙවීම හේතුවෙන් රජයට හිමිවිය යුතු තත්‍ය බදු ආදායම් අහිමි වී තිබුණි .

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ නියමයන් ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙතින් විදුලි ජනනය සඳහා බලපත්‍ර ලබාගත යුතුය. ඒ අනුව උක්ත පනතේ 43 (1) වගන්තිය ප්‍රකාරව එසේ බලපත්‍ර හිමිවූ සමාගම් වෙතින් පමණක් විදුලිය ජනනය සහ සැපයීම සිදුකළ යුතු වුවද එසේ ජනන බලපත්‍ර ලබාගෙන නොමැති ඒස් පවර් ඇඹිලිපිටිය සමාගමෙන් 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

## ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL) සමාගම විසින් 2022/2023 වර්ෂය සඳහා සිදුකළ ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ වාර්තාව.

**අනුමත සැපයුම්කරුට ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම**

අවම මිලක් ඉදිරිපත් කරන ලද Siam Gas Trading Pvt Ltd සමාගම 2022-2023 වර්ෂය සඳහා සුදුසුකම් ලද සැපයුම්කරු බවට 2022 අප්‍රේල් 26 දින තාක්ෂණ ඇගයීම් කමිටුව නිර්දේශ කර ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 අප්‍රේල් 28 දින අනුමත කර තිබුණි. තවද මෙම සමාගම සැපයුම්කරු ලෙස තෝරා ගැනීම සඳහා 2022 මැයි 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද හිමි වී තිබුණි. ඉන් අනතුරුව OQ Trading Ltd විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බැලූ අභියාචනා මණ්ඩලය ද අදාළ ප්‍රසම්පාදනය මෙම සමාගමටම පිරිනැමීම සඳහා 2022 මැයි 28 දින අනුමැතිය ලබා දී තිබුණි. එසේ අනුමැතීන් ලබා දී තිබිය දී සහ 2022 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාවට ගෑස් මිලදී ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ද නොමැති අවස්ථාවක Siam Gas Trading Pvt Ltd සමාගම විසින් සැපයීමට එකඟ වූ මිල වූ CP+ 96 USD මිලද ඉක්මවා OQ Trading සමාගම වෙතින් ගෑස් මිලදී ගනිමින් තිබිය දී 2022 ජූනි 13 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නව ප්‍රසම්පාදනයක් ආරම්භ කිරීමට තීරණය කර තිබුණි.

**අමතර වැය බරක් රජයට දැරීමට සිදු වීම**

Siam Gas Trading Pvt Ltd සමාගම තේරී පත් වී තිබියදීත් එම වාර ප්‍රසම්පාදනය අවලංගු කර එම මිලට වඩා ඉහළ මිලකට OQ Trading සමාගම වෙතින් ගෑස් මිලදී ගැනීම හේතුවෙන් එ.ජ. ඩොලර් මිලියන 3.14 ක් එනම් රු මිලියන 1,138.84 ක අමතර වැය බරක් පවත්නා ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකා රජයට දැරීමට සිදු වී තිබුණි.

**අමාත්‍ය මණ්ඩල සංදේශයේ කරුණු දැක්වීම**

2022 ජූනි 08 දින අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයයෙහි පසුබිමෙහි 3.2 (ii) හි දැක්වෙන පරිදි අවම වශයෙන් මෙට්‍රික් ටොන් 100,000 ක් සහතික කල SBLC හෝ

එ.ජ.ඩො. මිලියන 20 ක පෙරගෙවුම් කොන්දේසි මත ගෙවීම් සකස් විය යුතු බවට OQ Trading සමාගම විසින් දන්වා තිබුණු බව දක්වා තිබුණ ද අනුමැතිය ඉල්ලීමේදී (සංදේශයෙහි 3.3 (a) ඡේදයෙහි ) එලෙස OQ Trading විසින් ගෙවීම් සම්බන්ධයෙන් කොන්දේසි ඉදිරිපත් කර ඇති බවක් දක්වා නොතිබීම ගැටළු සහගත වේ. තවද බැංකු ඇපකරයක් නොමැතිව ගෙවීම් කිරීම ලිට්රෝ සමාගමෙහි පවත්නා ක්‍රමවේදය ලෙස සඳහන් කරමින් බැංකු ඇපකරයක් නොමැතිව භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණ ද එලෙස බැංකු ඇපකරයක් නොමැතිව ගෙවීමේ ක්‍රමවේදයක් සමාගම අනුගමනය කරන බව (ආර්ථික අර්බුදය හමුවේ එක්වරක් පමණක් එසේ බැංකු ඇපකරයක් නොමැතිව ගෙවීම් කර තිබුණි) නිරීක්ෂණය නොවුණු අතර අමාත්‍ය මණ්ඩල සංදේශයේ එම කරුණු දැක්වීම ද විගණනයේදී ප්‍රශ්නකාරී ලෙස නිරීක්ෂණය විය.

**පෙරගෙවුම් කොන්දේසි**

පොරොත්තු ණයවර ලිපියෙහි (SBLC) වටිනාකම මාසයක සැපයුමට සමාන වටිනාකමක් දක්වා අඩුකිරීමේ කොන්දේසියට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් අදාල ප්‍රසම්පාදනය අනුමත කර තිබුණ ද අදාල ණයවර ලිපිය ලබා දීමට නොහැකි වීම ප්‍රධාන හේතුවක් කරගනිමින් නව ප්‍රසම්පාදනයකට යාමට තීරණය කර තිබුණ ද ඉන්පසු OQ Trading සමාගමෙන් ක්ෂණික මිලදී ගැනීම් (Spot Contract) යටතේ මෙට්‍රික් ටොන් 100,000 ක පොරොත්තු ණයවර ලිපිය (SBLC) හෝ එ.ජ.ඩොලර් මිලියන 20 ක පෙරගෙවුම් යන කොන්දේසි යටතේ ලබා ගැනීමට එකඟ වී තිබුණු බව නිරීක්ෂණය විය.

**ප්‍රසම්පාදනයේ විනිවිදභාවය හා විචක්ෂණශිලිභාවය ගැටළු සහගත වීම**

අඩු මිලකට ගෑස් ලබා දීමට එකඟ වූ Siam Gas Trading Pte Ltd සමාගම ද ක්ෂණික මිලදී ගැනීම් සඳහා SBLC සැපයීමට නොහැකි නම් කලින් ගෙවීමේ පදනම මත ගෑස් සැපයීමට එකඟ වී තිබියදීත් තීරණ ගැනීමේදී එම ඉල්ලීමට ඉඩ නොදී / ඉදිරිපත් කිරීම් සලකා බැලීමකින් තොරව එම කොන්දේසීන් යටතේම වැඩි මිලක් යටතේ එක් සමාගමකට පමණක් අවස්ථාව ලබා දීම ප්‍රසම්පාදනයන් සිදුකිරීමේ විනිවිදභාවය හා විචක්ෂණශිලිභාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැක.

**කොන්දේසි සම්පූර්ණ නොකිරීම**

Siam Gas Trading Pte Ltd සමාගම 2022 මැයි හා ජුනි මාසය සඳහා CP+ 102 USD ක මිලකට ගෑස් සැපයීමට කැමැත්ත ප්‍රකාශ කර තිබූ අතර එම සමාගම විසින් ඉදිරිපත් කර තිබූ කොන්දේසි දෙක සම්පූර්ණ කිරීමට නොහැකි බැවින් මිලදී ගැනීම් සිදු කර නොතිබුණි. ඒ අනුව ඉහත එම මිලට මැයි මස ගෑස් අවශ්‍යතාවය සපුරා ගැනීමට ලබාදී තිබුණු දින දෙකක වලංගු කාලය ප්‍රමාණවත් නොවීම මත අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට ලිට්රෝ ගෑස් සමාගම කටයුතු කර නොතිබුණු බව දක්වා තිබුණද මෙම ප්‍රසම්පාදනයට අදාල ඇතැම්

තීරණ එක් දිනක් තුල ගෙන තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. තවද Siam Gas Trading Pte Ltd සමාගම වෙතින් නැවත වරක් 2022 මැයි මාසය සඳහා ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් විමසීමක් සිදු කර තිබුණු  අතර එහිදි එම සමාගම විසින් CP+ 105 USD ක මිලක් ලබා දී තිබුණි.

# සංචාරක කටයුතු

බොහෝ ආසියාතික රටවල් විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාර්ගයක් වශයෙන් සංචාරක කර්මාන්තයේ නියැලෙන අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය, වැඩිදියුණු කිරීම හා සංචාරක ප්‍රවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබා දෙයි. ශ්‍රී ලංකාව කලාපයේ බොහෝ රටවලට වඩා සංචාරක ආකර්ෂණය දිනා ගන්නා රටක් වුවද සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු නොකිරීම හා සංචාරකයන්ට අවශ්‍ය මූලික පහසුකම් දියුණු නොකිරීම තුළ සංචාරක කර්මාන්තය විශාල පසුබෑමකට ලක් වී තිබේ.

රටේ සංචාරක කර්මාන්තයේ දියුණුව හා අභිවෘද්ධිය සඳහා පහත සඳහන් ආයතනවලින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කළ යුතුව තිබුණි.

1. සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සංචාරක අංශය
2. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
3. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
5. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
6. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

**කාර්යභාරය**

ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම හා උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම.

සංචාරක නියෝජිතායතන හා සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන් ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු සිදු කිරීම.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඪ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් ශ්‍රී ලංකාව සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම.

සංචාරකයින් සඳහා නිවාඩු නිකේතනයන් හා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථාන, හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම.


සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම.

සංචාරක අංශය සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සංචාරක අංශය සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 1, 148 ක ප්‍රතිපාදන 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 991

ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 157 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. විස්තර රූප සටහන 2.30 හි දැක්වේ.




රූප සටහන් අංක 2.30 : පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනය, වියදම හා ඉතිරිය
මූලාශ්‍රය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

**ව්‍යවස්ථාපිත ආයතනවල ආදායම් ඉපයීම, උපයෝජනය කිරීම සහ රජයට ලබා දුන් දායකත්වය**


2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ III පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති සංචාරක සංවර්ධන අරමුදලට රැස් කර ගන්නා අපගමන බද්ද (Embarkation Levy) සහ සංචාරක සංවර්ධන බදු (Tourism Development Levy) මුදල් පහත ආයතන වෙත ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය හා ඊට අදාළ කාර්යයන් සඳහා භාවිතා කිරීමට බෙදා හරිනු ලබන අතර එසේ බෙදා හරින ලද ආදායම ද ඇතුළුව මුළු ආදායම, වර්ෂය තුළ වැය කිරීම හා 2023 වර්ෂයේදී රජයට ලබා දුන් දායකත්වය ලෙස භාණ්ඩාගාරය වෙත ලබා දුන් ප්‍රේෂණ පිළිබඳ තොරතුරු පහත වේ.

| ආයතනය/අරමුදල | උපයන ලද ආදායම (රු.මිලියන) | 2023 වර්ෂයේදී රජයට ලබා දුන් දායකත්වය (රු.මිලියන) | මුළු වියදම (රු.මිලියන) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 1,519 | 75 | 768 |
| ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශය | 5,956 | 500 | 1,964 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 1,032 | 100 | 615 |
| ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | 326 | 20 | 270 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල | 5,923 | 19 | 5,904 |
| එකතුව | 14,756 | 714 | 9,540 |

වගු අංක 2.18 : ආදායම් ඉපයීම, උපයෝජනය කිරීම සහ රජයට ලබා දුන් දායකත්වය


**සංචාරකයින් පැමිණීම හා ආදායම වෙනස් වීම**

2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත විදේශ සංචාරකයින් 719,978 ක් පැමිණ තිබූ අතර 2023 වර්ෂයේදී එම ප්‍රමාණය සියයට 107 කින් වැඩිවී විදේශිය සංචාරකයින් 1,487,303 දෙනෙකු පැමිණ තිබුණි. කොවිඩ් වසංගතය හේතුවෙන් වරින් වර වසා දමා තිබුණු රට ක්‍රමයෙන් ප්‍රකෘති තත්ත්වයට පත් වීම හා රටේ පැවති දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය යම් සමනයකට පත්වීම මීට හේතු වී තිබුණි. සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතනවල කාර්යයන් හා කර්තව්‍යයන්ගේද තිබුණු සීමාවීම් ඉවත්වීම මෙම සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම නිසා සිදු වී තිබුණි. 2023 වර්ෂයේ සංචාරකයින්ගේ පැමිණීම ඉකුත් වසර පහ සමඟ සසඳා රූපසටහන 2.31 හි දැක්වේ.




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| පැමිණි විදේශ සංචාරකයන් ගණන | 2,333,796 | 1,913,702 | 507,704 | 194,495 | 719,978 | 1,487,303 |

රූප සටහන් අංක 2.31 : 2023 වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ පහේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංචාරක ව්‍යාපාරයෙන් ලද ආදායම (රු.මිලියන) | 405,492 | 512,293 | 598,356 | 711,961 | 646,362 | 124,189 | 100,620 | 362,426 | 677,360 |

සංචාරක ව්‍යාපාරයෙන් ලද ආදායම (රු.මිලියන)

රූප සටහන් අංක 2.32 : - 2023 වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ පහේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2018 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරයෙන් එ.ජ.ඩො.මිලියන 4,380.6 කට සමාන රු.මිලියන 711,961 ක ආදායමක් රැස් කර තිබුණ අතර 2021 වර්ෂයේදී එය එ.ජ.ඩො.මිලියන 506.9 කට සමාන රු.මිලියන 100,620 ක් දක්වා අඩු වී තිබුණි. 2023 වර්ෂයේදී එම ආදායම නැවත එ.ජ.ඩො.මිලියන 2,068 කට සමාන රු.මිලියන 677,360 ක් දක්වා වැඩි වී තිබුණි.

## විගණන නිරීක්ෂණ

### සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සංචාරක අංශය

**ලැන්ඩ් රෝවන් ඩිස්කවරි වර්ගයේ වාහන 02 ක් මිලදී ගැනීම**

රාජ්‍ය ආයතන වෙත වාහන මිලදී ගැනීමේ පොදු ප්‍රතිපත්තිය උල්ලංඝණය කරමින් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව ජීප් රථ දෙකක් මිලදී ගැනීම සම්බන්ධ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අමප/230927/615/036 හා 2023 ජුනි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මෙම වාහන සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය දෙවන අයිතිකරු ලෙස ලියාපදිංචි කර තිබුණු අතර එහි පළමු අයිතිය පුද්ගලයන් දෙදෙනෙකු සතුව තිබුණු බවත් රජයේ තීරු බදු සහන යටතේ ආනයනය කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

**නානු ඔය දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීම**

සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන්, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මගින් ඉදිකිරීම් සිදු කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 74.63 ක වටිනාකමකට පුරාවිද්‍යාත්මක අනන්‍යතාව රැකෙන පරිදි දුම්රිය උරුමයක් ලෙස නානු ඔය දුම්රිය ස්ථානය නවීකරණය කිරීමට එම පාර්ශවයන් අතර ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2021 ඔක්තෝබර් 27 දින ආරම්භ කර මාස 9 ක කාලයකින් නවීකරණ කටයුතු අවසන් කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද 2021 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු අතර 2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවාගෙන නොතිබුණි. 2024 මාර්තු 20 දින වන විට ව්‍යාපෘතියේ වැඩ නිම කළ යුතු දිනය ඉක්මවා වසරකුත් මාස 8 ක් ගතවී තිබුණද ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි. 2023 මැයි මස 16 දින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා අමාත්‍යාංශය අතර පැවැති සාකච්ඡාවේදී, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 16 ක්ද , ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 84 ක්ද වැය කිරීමට එකඟවී තිබුණද ව්‍යාපෘති වැඩ කටයුතු නිම කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**විදේශ දූත මණ්ඩල වෙත විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් ලබාදීම**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් විදේශ දූත මණ්ඩල වෙත යැවූ විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම්වල 2023 වර්ෂය අවසාන දිනට ශේෂය වූ රු.මිලියන 46 ක් සඳහා අදාළ ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**බදු දුන් ඉඩම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම**

2014 වර්ෂයේදී සමාගම් 5 කට අක්කර 35 ක් ද, 2019 සහ 2020 වර්ෂවල තවත් සමාගම් 2 කට අක්කර 16.8 ක් ද වශයෙන් යාල පලටුපාන සංචාරක සංවර්ධන කලාපයේ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබුණ ද, සමාගම් 2 ක් පමණක් 2023 වර්ෂය අවසාන දින වනවිට මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා කුච්චවෙලි හි 2011 සහ 2014 වර්ෂවලදී පවරා ගත් ඉඩම් අක්කර 510.086 ක් වූ භූමි ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 49 ක් පමණක් සමාගම් 3 කට බදු දී තිබුණ ද එම සමාගම් 3 න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12 ක ඉඩම් අක්කර 2055.87 ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණ ද, එම දූපත් 12 න් දූපත් 05 කට අයත් ඉඩම් අක්කර 206.58 ක් පමණක් 2010, 2011 සහ 2020 වර්ෂවලදී සමාගම් 03 කට බදු දීමට කටයුතු කර තිබුණි. කෙසේවුවද, එම කිසිදු සමාගමක් 2023 වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, 2024 අප්‍රේල් 29 වන විට කල්පිටියේ බදු දී ඇති දූපත් 10 කට අදාළ බදුකරුවන් හත් දෙනෙකුගෙන් අධිකාරිය වෙත රු.මිලියන 92.96 ක බදු මුදල හිඟව පැවතුණි.

**තානායම් බදු දීම**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් වසර දෙක සිට අට දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල නිශ්කාර්යව පැවතුණි. 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තානායම් 34 කින් අයවිය යුතු හිඟ කුලී ආදායම රු.මිලියන 30 ක් වූ අතර ඉන් වසර 4 කට වඩා පැරණි හිඟ කුලී ආදායම රු.මිලියන 10 ක් හෝ සියයට 34 ක් විය.

බිබිල තානායම වසර 17 කට වැඩි කාලයක සිට පරිශ්‍රයේ ආක්‍රමණ සහ ආරක්‍ෂාව සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීම හේතුවෙන් අත්හැර දමා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් පසුව 2016 නොවැම්බර් 02 දින තෝරාගත් බදුකරු සමඟ ගිවිසුමකට එළඹ තිබුණද ප්‍රමාණවත් ආරක්ෂාව නොමැතිවීම හේතුවෙන් 2016

නොවැම්බර් 02 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා බදුකරුගෙන් අයකර ගත හැකිව තිබුණු මුළු කුලී ආදායම රු.මිලියන 10 ක් අධිකාරියට අහිමි වී තිබුණි.

**ජාතික නිවාඩු නිකේතන දිගින් දිගටම අලාභ සිදුවීම**

අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 05 හි 2023 වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා පිළිවෙළින් රු.මිලියන 50.1 ක් සහ රු.මිලියන 51.3 ක් අලාභ සිදු වී තිබුණි. කෙසේ වෙතත්, එම නිවාඩු නිකේතනවල පාඩුව අවම කර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

**සංචාරක සංවර්ධන කලාප සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීම ප්‍රමාද වීම**

2018 ජූනි 06 දිනැති අංක: අමප/18/1073/806/002 දරන කැබිනට් තීරණයට අනුව මාස 18 ක් ඇතුළත සංචාරක සංවර්ධන කලාප 07 හි ප්‍රධාන සැලසුම් රු. මිලියන 39 ක මුළු වියදමකින් සකස් කිරීම සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) 2019 පෙබරවාරි 13 වන දින අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹ තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට පිළිවෙළින් 2020-2030 සහ 2021-2030 කාලසීමාවන් සඳහා ඇල්ල සහ ආරුගම්බේ සඳහා ප්‍රධාන සැලසුම් දෙකක් පමණක් සකස් කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියට සැලසුම් 05 ක් සකස් කිරීම සඳහා රු.මිලියන 18.4 ක මුදලක් ගෙවා තිබුණි. තවද, ඉහත සැලසුම් තුළ ක්‍රියාකාරකම් සහ ඉලක්කවලට අදාලව නිශ්චිත කාල සීමාවක් ස්ථාපිත කර නොතිබූ අතර මේ සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් මේ දක්වා පත් කර නොතිබුණි. එම සංචාරක ප්‍රදේශවල දීර්ඝ කාලයක් තිස්සේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පවත්නා පහසුකම් විධිමත්ව නඩත්තු කර නොතිබුණි.

**ඉඩම් අත්පත් කර ගැනීම ඵලදායී නොවීම**

දෙද්දුව ප්‍රදේශයේ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 173 ක මුදලක් ගෙවා 2017 වන විට එම ක්‍රියාවලිය අවසන් කර තිබුණද 2023 වර්ෂය අවසන් වන විටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

2019 වසරේදී රු.මිලියන 61 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණද, මන්නාරමේ ඉඩමක අයිතිය අද දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

**හෝටල් පාසල සඳහා වන ඉහළ ඉල්ලුම සපුරාලීමට ක්‍රියාමාර්ග නොගැනීම**

2023 වර්ෂය සඳහා හෝටල් පාසල යටතේ විවිධ පාඨමාලා සඳහා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 11,788 ක් වුවද, පාඨමාලා සඳහා අයදුම්කරුවන් 5,912 ක් හෙවත් සියයට 50 ක් අයදුම්කරුවන් ලියාපදිංචි කර තිබුණි. මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් පන්තිකාමර සඳහා ඉඩකඩ නොමැතිකම නිසා ඇති වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉහළ ඉල්ලුමක් සපුරාලීම සඳහා විසඳුමක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ආයතනයේ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. තවද, ග්‍රාමීය ප්‍රදේශවල පවත්වාගෙන යන හෝටල් පාසල් ශාඛා සඳහා නේවාසිකාගාර පහසුකම් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**සමුද්‍රා හෝටලය සහ අවන්හල ඵලදායී ලෙස පවත්වාගෙන නොයාම**

සමුද්‍රා පුහුණු හෝටලය, කොළඹ හෝටල් පාසල සමඟ එක්ව පිහිටා ඇති අතර එය සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා භාවිතා කරනු ලැබේ. එමෙන්ම, සමුද්‍රා අවන්හල, කාමර, ශ්‍රවණාගාරය ආදිය හරහා ව්‍යාපාරික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. සමුද්‍ර පුහුණු හෝටලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

සමුද්‍රා හෝටලය සඳහා අලෙවි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර කාමරවල පහසුකම් සහ සුවපහසුව සතුටුදායක මට්ටමක නොතිබුණි.

2023 වර්ෂය සඳහා කාමර රාත්‍රී (Room Nights) සංඛ්‍යාව 494 ක් එනම්, මුළු කාමර රාත්‍රී (Room Nights) 4,380 න් සියයට 11 ක් පමණක් භාවිත කර තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට සමුද්‍රා හෝටල් ණය ගැති ශේෂය රු.මිලියන 26 ක් වූ අතර එම ණය ශේෂය මාස 24 කට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව 2023 වර්ෂය තුළ සමුද්‍රා අවන්හල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මිලියන 6 ක මුදලක් වැය කර තිබූ අතර සමුද්‍ර අවන්හල සැලසුම් කර තිබූ ආකාරයට 2024 ජුලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| **ඉඩම් හිමිකම් සහතික ලබා නොගැනීම** | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව උද්‍යාන 05 කට අයත් හෙක්ටයාර් 362.37 ක වපසරියකින් යුතු ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා ගැනීමේ කටයුතු 2023 වර්ෂයේ අවසන් දින වන විටත් අවසන් කර නොතිබුණි. |
| **අක්‍රිය වත්කම්** | හක්ගල උද්භිද උද්‍යානයට ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු ආසන්නයේ LED පුවරු 02 ක් සවිකිරීම සඳහා සැපයුම්කරුවෙකුට රු.මිලියන 6.5 ක් ගෙවා තිබුණද එම LED පුවරු 02 සවිකළ දිනයේ සිටම අක්‍රියව පැවතුණි. |
| **වැඩ ඉටු කර නොතිබියදී බිල්පත් සඳහා ගෙවීම** | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ජල අවශ්‍යතාවය සඳහා ෆෙරෝ සිමෙන්ති ටැංකියක් ඉදිකිරීම සඳහා රු.මිලියන 5.61 කට 2021 අගෝස්තු 19 දින ගිවිසුම්ගතව කොන්ත්‍රාත් ආයතනයකට ඉදිකිරීම පවරා තිබුණි. 2021 නොවැම්බර් 15 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද, යථෝක්ත කොන්ත්‍රාත්තුව 2023 වර්ෂයේ අවසාන දින වන තෙක් එහි වැඩ අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබියදී 2023 දෙසැම්බර් 31 දිනට අවස්ථා 05 කදී එකතුව රු.මිලියන 5.86 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම් බිල්පත්වල සඳහන් 27 හා 29 සිට 41 දක්වා වැඩ ඉටු කර නොතිබියදී ඉටු කළ බවට බිල්පත් සාවද්‍ය ලෙස සකස් කර, නිර්දේශ කර ඒ සඳහා රු.මිලියන 2.15 ක් ගෙවා තිබුණි. |
| **නිශ්කාර්ය වෙළඳ කුටි** | මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ 2013 වර්ෂයේ ඉදිකර තිබුණු වටිනාකම හඳුනාගත නොහැකි වූ වෙළඳ කුටි 09 ක් වර්ෂ 10 ක කාලයක සිට නිශ්කාර්යයව පැවතුණි. |

# ඉඩම්

තිරසාර සංවර්ධනයක් උදෙසා ඉඩම් සම්පත ප්‍රශස්තව උපයෝජනය අත්කර දෙමින් සියලු පාර්ශවකරුවන් වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා සම්බන්ධීකරණය ඉඩම් අමාත්‍යාංශයෙන් අපේක්ෂාකරන ප්‍රතිඵලය වී තිබුණි. ඒ අනුව රජයේ ඉඩම්වල ආරක්ෂාව සහතික කිරීම, සංවර්ධන ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ඉඩම් ලබාදීම, රටේ සියලු ඉඩම්වල හිමිකම තහවුරු කිරීම අරමුණු විය.

ඉඩම්

## විගණන නිරීක්ෂණ

### සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

**වන්දි ගෙවීම් ප්‍රමාද වීම මත අමතර පොලී වියදම්**

2023 වර්ෂය අවසාන වනවිට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධව සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂාවට අනුව පරීක්ෂා කළ ලිපිගොනු 11 කින් ලිපිගොනු 06 ක් වෙනුවෙන් අත්පත් කර ගැනීමේ වන්දි ලෙස රු.මිලියන 147.91 ක් සහ ගෙවීම් ප්‍රමාද වීම මත අමතර පොලී ලෙස රු.මිලියන 67.3ක් ගෙවා තිබුණි. රාජ්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා වර්ෂ 10 කට ආසන්න කාලයක් ගතවීම සහ එම ක්‍රියාවලියට ගතවන කාලය හේතුවෙන් වන්දියට අමතරව පොලී විශාල වැය බරක් වී තිබු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | අත්පත් කරගත් ඉඩම් විස්තර | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | ගෙවූ වන්දි වටිනාකම රු. | අමතර පොලී වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| (i) | ගම් පුළුල් කිරීම යටතේ අපරුක්කවත්ත සහ මහබොටුවත්ත අත්කර ගැනීම | 2018.01.08 | 2022.02.23 | 43,700,100 | 12,616,658 |
| (ii) | නකල්ස් කලාපය සඳහා ඉඩම් අත්කර ගැනීම | 2010.03.17 | 2013.11.21 | 31,770,300 | 14,955,327 |
| (iii) | වීරඹුගෙදර පොලිස් ස්ථානය සඳහා ඉඩම් අත්කර ගැනීම | 2019.01.11 | - | 12,564,000 | ගණනය කර නොමැත |
| (iv) | අධ්‍යාපන අමාත්‍යාංශයට ඉඩමක් අත්කර ගැනීම | 2010.02.15 | 2020.06.23 | 40,140,000 | 30,320,821 |
| (v) | පදියතලාව නව පොලිස් ස්ථානයට ඉඩමක් අත්කර ගැනීම | 2015.12.15 | 2022.10.27 | 18,484,750 | 8,884,412 |
| (vi) | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා A,C,F සහ J ඉඩම් කැබලි අත්කර ගැනීම. | 2017.01.19 | 2023.01.04 | 1,255,000 | 523,630 |
| | එකතුව | | | 147,914,150 | 67,300,848 |

වගු අංක 2.19 : ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**නිවැරදිව තක්සේරු මත බදු මුදල් අය නොකිරීම**

2021 පෙබරවාරි 01 දිනැති අංක 2020 / 06 (1) දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය සහ ඊට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දීර්ඝ කාලීන බදුකරුවන් සඳහා බදු සහන ලබා දීම යටතේ බදු ගණනයේදී දෙවන බදු කාලය ආරම්භ වන දිනයේ සිට අමාත්‍ය

මණ්ඩලයේ අනුමැතිය ලබා දුන් 2020 නොවැම්බර් 16 දින දක්වා දෙවන බදු කාලයට අදාලව ගනු ලැබූ තක්සේරුව මත බදු මුදල් නිවැරදිව ගණනය කර අය කල යුතු වේ. එහෙත් එයට පටහැනිව අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් අමතන ලද 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/පොදු/බදු සහන (L2) දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බදු ගොනු 08 ක් සම්බන්ධයෙන් වූ බදු අය කළ යුතු ආකාරය දන්වා එවා තිබීම නිසා රජයට රු.මිලියන 70.52 ක බදු මුදලක් අහිමි වී තිබුණි. එසේම මේ හේතුවෙන් අදාළ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉතිරි බදුකරුවන් 74 දෙනා බදු ගෙවීම් අධෛර්යමත් වීමේ අවධානමක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත්, ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවමින්, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා ඉඩම් සංචිතයක් පවත්වා ගෙන යමින් ජාතික සංවර්ධනයට සහයවීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යය වේ.

**ගැටළු සහගත අර්ථකථනයන් මත පදනම්ව ඉඩම් ලබා දීම**

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44(ඕ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න සඳහන් වේ. ඒ මත පදනම්ව කොමිෂන් සභාව විසින් සභාවේ වසර 5 ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්.20 බැගින් ලබා දීම කර තිබුණි. ඒ අනුව 2009 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා නිලධාරීන් 396 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි.

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**නවීන තාක්ෂණික දියුණුවත් සමග සම්මතයන් වෙනස් නොකිරීම**

මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කර ඉන් මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතුන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20 ක් වන අතර ඉඩම් කැබලි නම් 30 ක් විය.එලෙස වර්ෂ 16 කට පෙර පිහිටුවාගත් සම්මතය (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර පරිදි ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම යාවත්කාලීන වී නොතිබුණු නමුත්, 2018 සිට 2021 වර්ෂය දක්වා මුල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් යටතේ නවීන මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 207 ඉක්මවූ මුදලක් වැය කර තිබුණි.

**ඉටු නොකළ මැනුම් ඉල්ලීම්**

2023 දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 08 ක් යටතේ ලැබී තිබූ මුළු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 129,270 කින් නිම නොකළ සංඛ්‍යාව 33,337 ක් හෙවත් සියයට 26 ක් විය. එම මැනුම් ඉල්ලීම් අතර වර්ෂ 4 ට වැඩි මැනුම් ඉල්ලීම් 8,688 ක්ද, වර්ෂ 3 ත් 4ත් අතර වූ මැනුම් ඉල්ලීම් 3,834 ක් ද, වර්ෂ 2 ත් 3ත් අතර වූ මැනුම් ඉල්ලීම් 4,712 ක් ද, වර්ෂ 1 ත් 2ත් අතර මැනුම් ඉල්ලීම් 6,276 ක් ද විය.

**ඌන උපයෝජිත පුහුණු ආයතනය**

මැනුම් සහ සිතියම්කරණය පිළිබඳව විවිධ පාඨමාලා පැවැත්වීම සඳහා පිහිටුවා ඇති පුහුණු ආයතනය විවිධ ගොඩනැගිලි අංග 121 කින් සමන්විත අක්කර 61 ක භූමිභාගයක් තුළ ඉතා විශාල භෞතික සම්පත් සහිතව පිහිටුවා ඇත. එසේ වුවද, 2022 සිට 2026 දක්වා වූ වර්ෂ 4 ක පාඨමාලාව සඳහා සිසුන් 22 කින් සමන්විත එක් කුඩා උපාධි කණ්ඩායමක් පමණක් අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටින බව නිරීක්ෂණය විය. ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීම් නොමැති අවස්ථාවලදී උපාධි පාඨමාලාව සඳහාද සිසුන් නොමැති වන බවද නිරීක්ෂණය විය.

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

**ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීම**

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කල අවසන් කෙටුම්පත ඉඩම් හා සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## ඉඩම් මැනුම් සභාව

**මහජන පැමිණිලි විභාග කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත්, තහවුරු කිරීම අරමුණු කරගෙන ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කර තිබුණි. මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාව විසින් සභාව වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2023 වර්ෂයට පෙර ලැබී තිබුණු පැමිණිලි 134 හා 2023 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 78 ද ඇතුළුව 212 ක් වූ පැමිණිලි අතුරින් පැමිණිලි 149 ක් 2023 වර්ෂය අවසන් වන විටත් විසඳා නොතිබුණි.

# නාගරික සංවර්ධනය හා නිවාස

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා ඒ යටතේ පැවති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

**ප්‍රධාන කාර්යයන්**

මහනගර, උපනගර සහ තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය.

නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.

පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය,මධ්‍යම පාන්තිකයන්ගේ නිවාස ගැටලු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ණය පහසුකම් සැලසීම

කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දීම.

නිවාස ඉදිකිරීමේ ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබාදීම මඟින් නව නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දිරිමත් කිරීම,නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය, නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම , නිවාස මූල්‍යාධාර සැපයීම නාගරික ඝණ අපද්‍රව්‍ය  කළමනාකරණය.

වගකීම් රහිත කසල බැහැර කිරීම වැලැක්වීමට පියවර ගැනීම

සියලු නාගරික ඉදිකිරීම්වල දී රථවාහන නැවැත්වීමේ අංගන හා අබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම සහතික කිරීම.

ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදු කිරීම, ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම හා නියාමනය සිදුකිරීම.

සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු, මහජන සහාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.

පහත්බිම් සංවර්ධනය කිරීමට අදාළ කටයුතු, නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරුබිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම.

රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියාමනය කිරීම.

පරිසර හිතකාමී හා පිරිවැය ඵලදායි ලෙස පිරිවැය ඵලදායි නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මග පෙන්වීම.

රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉන්ජිනේරු සේවා සැපයීම, අදාළ නීති රීති හා ප්‍රමිතින් වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.

ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම, දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම

බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.

දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උපකොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම ආරක්ෂාව සැලසීම.

සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු, සමුද්‍ර සහ සමුද්‍රාශ්‍රිත දූෂණ නිවාරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම, වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.

අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් මුහුදු තීරයට සහ මුහුදු පතුළට සිදු වී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුද්‍රරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම.


වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජීය සහ සංස්කෘතිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම, ග්‍රාමීය වතු අංශයන් හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන “ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන” පිහිටුවීම.

වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 03 කට රු.මිලියන 47,783.4 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 33,642.6 ක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 14,140.8 ක් උපයෝජනය කර නොතිබුණි.

විස්තර පහත රූපසටහනේ දැක්වේ.




| | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | රජයේ කර්මාන්තශාලාව | භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 46,484.50 | 558.80 | 341.90 | 398.20 | 47,783.40 |
| වියදම | 32,699.10 | 534.90 | 228.10 | 180.50 | 33,642.60 |
| ඉතිරිය | 13,785.40 | 23.90 | 113.80 | 217.70 | 14,140.80 |

රූප සටහන් අංක 2.33 :ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**හෝල්ලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය**

2022 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යභාරයක්ද එකතුකර රු. මිලියන 341.96 ක වටිනාකමකට හෝල්ලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය ලෙස නම්කර සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 450.56 ක් එනම් ගිවිසුම්ගත මුදලින් සියයට 131 ක් වැය කර තිබූ අතර මෙලෙස අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවන කාර්යයක් වෙනුවෙන් මුදල් වැය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී මතභේදාත්මක විය.

**අරුවක්කාලු සනීපාරක්ෂක**

**කසළ රැඳවුම් ව්‍යාපෘතිය**

ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 19,127 ක් වූ අරුවක්කාලු සනීපාරක්ෂක කසළ රැඳවුම් ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින ආරම්භ කර පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතියේ කසල හුවමාරු මධ්‍යස්ථානය , සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණු නමුත් එම ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය යටතේ, දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මිලියන.8.27 ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර වසර 03 ගතවී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් එ.ජ.ඩොලර් මිලියන 0.8ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණි. දුම්රිය වැගන් 34 ක් එ.ජ.ඩොලර් මිලියන 2.3ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 21 දින ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල ආයතනය විසින් ගිවිසුම ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රිය කර තිබුණු බැවින් 2023 වර්ෂාවසානය වන විටද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 24,016 ක් වැය කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව භෞතික ප්‍රගතිය සියයට 92 ක් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙහි කටයුතු නිම කර රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය මත මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සැළසුම්කර තිබුණ ද, 2024 අගෝස්තු 31 දක්වාම එය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි.

**යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම**

2019 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික ඉදිකිරීම් සමාගමක් තෝරා ගෙන තිබුණි. ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර තිබූ අතර 2024 ඔක්තෝබර් 09 දින දක්වා දින 1125 ක දින දීර්ඝ කිරීම් 04 ක් ලබා දී තිබුණි. කෙසේ වුවද 2023 දෙසැම්බර් 31 වන විටද එහි භෞතික ප්‍රගතිය සියයට 66 ක් පමණක් වූ අතර මූල්‍ය කාර්යසාධනය රු.මිලියන 1,636.15 ක් වන බව අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය. තවද, කොන්ත්‍රාත් විටිනාකම රු. මිලියන 3,769 දක්වා රු.මිලියන 1,627 කින් වැඩිකිරීමටද කටයුතු කර තිබුණි.

**පානදුර පොදු වෙළෙඳපොල සංකීර්ණය ඉදිකිරීම**

කඩකාමර 258 ක් සහිත පානදුර පොදු වෙළෙඳපොල සංකීර්ණය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව, මූලික ලංසු සුදුසුකම් පරීක්ෂාවේදී ප්‍රතික්ෂේප වූ කොන්ත්‍රාත් ආයතනයක් වෙත රු. මිලියන 385 (වැට් රහිත) අගයකට 2021 සැප්තැම්බර් 23 දින පිරිනමා තිබුණු අතර එය 2023 මාර්තු 24 දින නිමකල යුතුව තිබුණි. නමුත් එදිනට වැඩ අවසන් නොකිරීම නිසා නැවත 2024 ජනවාරි 15

දක්වා දින 297 ක් සඳහා දින දීර්ඝ කිරීම අනුමත කර තිබුණද එම කාලය තුළදී ද ඉදිකිරීම් කටයුතු නිම කළ නොහැකි වී තිබුණි.

**ඔබට ගෙයක් රටට හෙටක් ව්‍යාපෘතිය**

නිවාස සංවර්ධන අධිකාරිය හරහා රු.මිලියන 8,413 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් "ඔබට ගෙයක් රටට හෙටක් ව්‍යාපෘතිය" යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඒකක 14,022 ක් ඉදිකිරීමට යෝජිත විය. මෙම ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් වන විට අවසන් කල යුතු වුව ද 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 7,704.95 ක් වැය කර සියයට 79 ක ප්‍රගතියක් හෙවත් නිවාස ඒකක 7,744 ක් පමණක් ඉදිකර තිබුණු අතර නිවාස ඒකක 75 ක් ඉදිකිරීම අත්හිටුවා තිබුණි.

**සියපත නිවාස හා කටාන පොලිස් අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාරය ඉදිකිරීම**

අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශය විසින් ක්‍රියාත්මක කර තිබූ මරදගහමුල නිවාස ඒකක 40 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (සියපත) හා කටාන පොලිස් අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් රු.මිලියන 110.66 ක් හා රු. මිලියන 132.8 ක් වැයකර තිබුණි. එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 35 ක් සහ සියයට 31 ක් පමණක් වූ අතර 2023 වසරේදී මෙම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් වැයකරන ලද රු. මිලියන 243.46 ක් වූ වියදම නිෂ්කාර්යය වී තිබුණි.

**මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති**

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ මැදි ආදායම් ලාභීන්ගේ දායකත්වය මත නිවාස ව්‍යාපෘති 12ක් ඉදිකිරීම් කටයුතු 2020 හා 2021 වර්ෂවලදී ආරම්භ කර තිබුණි. ඒ අතරින් නිවාස ඒකක 2939කින් යුත් නිවාස ව්‍යාපෘති 09 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 11,353.15 ක් වැයකර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනෙන් පසු මෙම ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

**කොළඹගේ මාවත නිවාස 615 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

නාගරික පුණර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම් ලාභීන් වෙනුවෙන් කොළඹගේ මාවත නිවාස 615 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 2,546.10 ක ඇස්තමේන්තු වටිනාකමක් මත 2014 ඔක්තොම්බර් 30 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. නමුත් 2020 නොවැම්බර් 20 දින වන විට එහි ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබූ අතර ඒ වන විට රු.මිලියන 1255.30 ක් වැය කර සියයට 39 ක භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබුණි. ඒ අනුව උක්ත ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද රු.මිලියන 1,255.30 ක මුදල නිශ්කාර්ය වී තිබුණි.

**මහර පරිපාලන හා වාණිජ සංකීර්ණය**

කොළඹ නුවර ප්‍රධාන මාර්ගයට යාබදව පිහිටි වටිනාකම රු. මිලියන 370 ක් වූ මහර පරිපාලන හා වාණිජ සංකීර්ණයේ ඉදිරිපස කඩකාමර මෙන්ම සියලු පහසුකම් සහිත භෝජනාගාරය සහ ආසන 428 කින් යුතු ශ්‍රවණාගාරය ඉදිකිරීමෙන් වසර 05 කට පමණ පසුවද නිශ්කාර්යව පැවතුණි. සෝපාන යන්ත්‍ර දෙකක් ස්ථාපිත කර තිබූ අතර එම යන්ත්‍ර ස්ථාපිත කරන ලද දින සිටම ප්‍රයෝජනයට ගෙන නොතිබීම සහ සේවා නොකිරීම නිසා අක්‍රියව පැවතුණි. මෙහි ඉදිකිරීම් වැඩ 2019 සැප්තැම්බර් 30 දින අවසන් කර තිබුණද 2024 ජනවාරි 30 දින වන විටත් වර්ග මීටර් 8,032.9 ක භූමි ප්‍රමාණයෙන් වර්ග මීටර් 1,164.9 ක් පමණක් කාර්යාල 07 ක් පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණු අතර ඉතිරි වර්ග මීටර් 6,868 ක් නිෂ්කාර්යව පැවතුණි. නීත්‍යානුකූල ගිවිසුම් මගින් පවරාදී නොතිබුණු බැවින් කිසිදු කුලී ආදායමක් නොලබන බවද නිරීක්ෂණය විය.

## නාගරික සංවර්ධන අධිකාරිය

**නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ 2015 දී ආරම්භ කරනු ලැබූ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙන් ඉදිකිරීමට යෝජිත වූ නිවාස ඒකක 68,000 කින් 2024 අප්‍රේල් 30 දිනට නිවාස ඒකක 13,602 ක් සම්පූර්ණ කර නිවාස ඒකක 13,536 ක ප්‍රතිලාභීන් පදිංචි කර තිබුණි. ඉදිකරන ලද තවත් නිවාස ඒකක 66 ක් භාවිතයට නොගෙන හිස්ව පැවතුනි. ඉදිකිරීම් අවසන්කර ඇති නිවාස ව්‍යාපෘති 22 කින් එක් නිවාස ව්‍යාපෘතියකට පමණක් සහාධිපත්‍ය කළමනාකරණ සහතිකය ලබාගෙන තිබුණි. මේ නිසා නිවාස ව්‍යාපෘතිවල පරිපාලනය කළමනාකරණ කමිටු වලට පැවරීමට නොහැකි වීමෙන් නිවාස නඩත්තු කටයුතු වෙනුවෙන් 2023 හා 2024 වර්ෂ වලදී පමණක් අධිකාරියට රු.මිලියන 668 ක් වැයකිරීමට සිදුව තිබුණි. තවද මෙම නිවාසලාභීන්ගෙන් අධිකාරියට අයවීමට ඇති මුළු මුදල 2024 අප්‍රේල් 30 දිනට රු.මිලියන 1,037 ක් වී තිබුණි.

**ඉඩම් අයිතිය පවරා ගැනීමේ ප්‍රමාදය**

නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා අඩු ආදායම්ලාභීන් පදිංචි වී සිටි වතු ඉඩම් 18 ක ඉඩම් අක්කර 47 ක් නිදහස් කරගෙන තිබූ නමුත් එයින් අක්කර 09, රූඩ් 03 ක් පමණ වූ ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරාගැනීමේ කටයුතු අවසන් නොවීම මත සංවර්ධන කටයුතු සඳහා යොදාගත නොහැකිවී තිබුණි.

**පන්නිපිටිය වීරමාවත නිවාස යෝජනා ක්‍රමය**

පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස යෝජනා ක්‍රමය A,B,C,D සහ E ලෙස කුළුණු 05 කින් සමන්විත වූ අතර දින දීර්ඝ කිරීම්ද සහිතව 2022 සැප්තැම්බර් 29 දින ව්‍යාපෘති වැඩ අවසන් විය යුතුවිය. මෙයින් A සහ E කුළුණු ඉදිකිරීම් 2023 වසර අවසාන වන විටත් අවසන් නොවී පැවතීම නිසා නිවාස ඒකක 197ක් අදාළ පාර්ශ්වයන්

වෙත භාරදීමට නොහැකි වී තිබුණි. තවද මෙම නිවාස ව්‍යාපෘතියෙහි B කුළුණෙහි පිහිටි නිවාස 71 ක කුලිය භාණ්ඩාණ්ඩාගාරයෙන් අයකර ගැනීමේ පදනම මත පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සඳහා ලබා දී තිබුණි. මෙම නිවාස ඒකක වෙනුවෙන් 2024 ජුනි 30 දිනට අධිකාරියට අයවිය යුතු හිඟ ජල, විදුලි සහ කළමණාකරණ ගාස්තුවල එකතුව රු.මිලියන 11.86 ක් වී තිබුණි.

**මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව**

හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන ශ්‍රවනාගාරය ඉදිකිරීම සඳහා , කොරියානු අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සිය විසින් (KOICA) එක්සත් ජනපද ඩොලර් මිලියන 6.4 ක් (රු.මිලියන 851.2) වැය කර තිබූ අතර සම්මන්ත්‍රණ ශාලාවේ අනෙකුත් ඉදිකිරීම් සඳහා රජයේ අරමුදල් රු.මිලියන 3.83 ක් වූ වැයකර තිබුණි. තවද , සම්මන්ත්‍රණ ශාලාව පවත්වා ගෙන යාම සඳහා අයභාර වියදම් ලෙස 2017 සිට 2023 දක්වා වූ වර්ෂ 7 සඳහා පමණක් රු.මිලියන 110.53 ක් අධිකාරිය විසින් වැයකර තිබුණි. එසේ වුවද එම සම්මන්ත්‍රණ ශාලාවෙන් අදාල කාලපරිච්ඡේදයට අදාළව උපයා තිබූ ආදායම රු. මිලියන 20.63 ක් පමණක් වී තිබුණි. මෙම මධ්‍යස්ථානය භාවිතයට ගැනීම සඳහා අධිකාරිය සහ පුද්ගලික අංශය එකාබද්ධව සිදු කිරීමට බලාපොරොත්තු වූ කටයුතු ද මේ දක්වා සාර්ථක වී නොතිබුණි.

**නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සකස් කිරීම**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 8 ඡේදයේ (එ) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සකස් කර අදාළ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි. තවද මේ දක්වා නාගරික සංවර්ධන ප්‍රදේශ 273 ක් ප්‍රකාශයට පත්කර තිබුනද මේ වන විට එම සංවර්ධන බලප්‍රදේශ අතුරින් 175 ක් ආවරණය සඳහා සංවර්ධන සැලසුම් සකස්කර නොතිබුණි. එබැවින් එවැනි ප්‍රදේශ සඳහා පනතේ 8(ඌ) වගන්තිය අනුව සකස්කල යුතු ප්‍රාග්ධන වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙලවල් මෙන්ම පනතේ 89(ඒ) අනුව එම ප්‍රදේශවල පරිසර තත්ත්වන් වර්ධනය කිරීම සඳහා යෝජනාද පිළියෙල කර නොතිබුණි.

**ඔටර්ස් ඇක්වටික් හා 80 සමාජශාලා**

දිවයිනේ ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ සහ පෞද්ගලික ඉඩම්, අධිකාරිය වෙත පවරාගැනීමට 2020 ඔක්තෝම්බර් 12 දිනැති අංක MUD/H/2020/CP/37 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020 ඔක්තෝබර් 27 දින අනුමැතිය ලැබී තිබුණි. එම සංදේශයට ඇමුණුම්කර ඇති ඉඩම් 45 ක් අතුරින් සමාජශාලා ලෙස පවත්වාගෙන ගිය ඔටර්ස් ඇක්වටික් හා 80 සමාජශාලාව යන ආයතන දෙක පිහිටි හෙක්ටර්යාර් 1.8274 ක ගොඩනැගිලි සහිත ඉඩම් තුනක් අධිකාරිය විසින් පවරාගෙන

සංවර්ධනය කර මහජනයාට විවෘත කළ යුතු බවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද එකී අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2020 ඔක්තෝම්බර් 16 දිනැති මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ අනුව මෙම සංදේශයට ඇමුණුම් කර ඇති ඉඩම් වාණිජමය කටයුත්තක් සඳහා යොදවා ගන්නේ නම්, එමඟින් උත්පාදනය වන ආදායමෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාළ ඉඩම් සංවර්ධනය කිරීමේදී හා අත්පත්කර ගැනීමේදී දරනු ලැබූ වියදම් අඩුකර ගැනීමෙන් පසු වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු බව අවධාරණය කර තිබුනද අධිකාරියට මේ දක්වා සුදුසු වාණිජ කටයුත්තක් සඳහා යොදාගැනීමට නොහැකි වී තිබුණි.

**ට්‍රාන්ස්වර්ක් චතුරස්‍ර ඉඩම**

කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් චතුරස්‍ර ඉඩම රු.මිලියන 4,999.71 කට දේශියව ස්ථාපිත විදේශීය පුද්ගලික සමාගමක් වෙත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා බදු ගිවිසුම් 04 ක් මඟින් බදු දී තිබුණි. කෙසේ නමුත් 2024 අගෝස්තු 31 දින දක්වා මෙම ව්‍යාපෘතිය නිමකර නොතිබූ අතර ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අපේක්ෂිත සම්පූර්ණ මහල් 81 කින් සමන්විත වූ ගොඩනැගිල්ලෙන් මහල් 60 ක් සඳහා ගොඩනැගිලි සැකිල්ල පමණක් ඉදිකර තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් නැවත ගිවිසුම්ගත වූ 2018 ජුලි 04 දිනට වූ වෙළඳපොල වටිනාකමත් පූර්ව කල්බදු වටිනාකමත් අතර වෙනස වූ රු.මිලියන 1,290.04 ක් මෙම ව්‍යාපෘතිය අවසන් නොවීම හේතුවෙන් මේ දක්වා අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**ඉඩම් වන්දි ගෙවීම් හා භාවිතයට ගැනීම**

අධිකාරිය 1981 වර්ෂයේ සිට අත්පත් කරගෙන තිබූ ඇතැම් ඉඩම් සඳහා තවමත් වන්දි ගෙවා නොතිබූ අතර 2024 අප්‍රේල් 30 දින වන විට ගෙවිය යුතු වන්දි මුදලේ එකතුව රු. මිලියන 26,106 ක් වී තිබුණි. තවද අධිකාරිය විසින් මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කරනු ලැබූ අධිකාරියේ ඉඩම් පිළිබඳ තොරතුරු අනුව අධිකාරිය විසින් 1981 සිට 2021 දක්වා අතර කාලය තුළදී අත්පත්කරගන්නා ලද ඉඩම් අක්කර 1,908 ක් මේ දක්වා කිසිදු කාර්යයකට නොයොදවා නිශ්කාර්යව පැවතුණි.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**ආදර්ශ ගම්මාන ව්‍යාපෘති**

2015 – 2019 වර්ෂවල අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කර තිබූ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියෙහි අවිච්ඡේද ගම්මාන 2150 ක් යටතේ නිවාස 39815 ක් ඉදිකළ යුතු විය. මෙම නිවාසවල වැඩ නිම කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 220 ක් 2023 වර්ෂයේ ලබාදී තිබූ අතර ඉන් නිවාස 681 ක පමණක් ඉදිකිරීම් නිමකර තිබුණි. 2017 – 2019 වර්ෂවල ආරම්භ කළ ඉන්දියානු නිවාස ආධාර යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබූ අතර දිවයින පුරා ගම්මාන 25 ක් තුල නිවාස 600 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2023 වර්ෂයේ මෙම

ඉදිකිරීම් අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් 2023 වර්ෂය අවසන් වන විට එයින් සියයට 81 ක එනම් නිවාස 486 ක වැඩ අවසන් කර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේ රු. මිලියන 103 ක් වැයකර අළුතින් නිවාස 143 ක් ඉදිකිරීමට බලාපොරොත්තු වුවද රු. මිලියන 6.38 ක් වැයකර නිවාස 29 ක් පමණක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේ ආරම්භ කර තිබූ ග්‍රාම ශක්ති දකුණු පළාත් අදියර I ව්‍යාපෘතිය ආරම්භ කර 2023 වර්ෂයේ අවසන් කළයුතු ව්‍යාපෘතියක් වුවද වර්ෂය අවසාන වන විට එහි ප්‍රගතිය සියයට 20 ක් පමණක් වී තිබුණි. මෙම වැඩසටහන යටතේ 2023 වර්ෂයේ නිවාස 499 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර වර්ෂය තුල රු. මිලියන 9.63 ක් වැයකර තිබූ නමුත් නිවාස 02 ක් පමණක් ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණි. එමෙන්ම ග්‍රාම ශක්ති දකුණු පළාත් අධියර II ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂය වන විට නිවාස 595 ක් නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද නිම කර තිබුණේ සියයට 23 ක් පමණි. තවද ග්‍රාම ශක්ති උතුරු පළාත් ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂය වන විට නිවාස 511 නිම කිරීමට සැලසුම් කර තිබුණද ඉදිකර තිබුණේ නිවාස 32 ක් පමණි.

**රාජ්‍ය පෞද්ගලික ආයෝජන ව්‍යාපෘති**

අධිකාරිය පෞද්ගලික ආයෝජකයන් හා එක්ව 2013 වර්ෂයේ ආරම්භකර තිබූ කවිරත්න රෙසිඩන්සීස්, හන්තාන දුනුමඩලාව විලාස්, කුණ්ඩසාල හයිටස් පාර්ක්, යක්කල සියනෑ නේවර් පාර්ක්, හන්තාන රෙසිඩන්සීස්, මවුන්ට් ක්ලිපර්ඩ් යන නිවාස ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. වසර 10 ක් ගත වී ඇතත් එම ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කර නොතිබුණි.

**කඩ සාප්පු උපබදු දීම්**

සොයිසාපුර කාර්යාලය සතුව බදු පදනම මත ලබාදුන් කඩ සාප්පු 22 ක් පැවති නමුත් එයින් 13 ක් බදුකරු නොවන වෙනත් පුද්ගලයන් වෙත බදුකරු විසින් උප බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් අධිකාරිය දැනුවත් කළද කිසිදු ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි. තවද කඩ කාමර 3ක් (අංක 1,2,3) මොරටුව සමුපකාරය වෙත 1999 මාර්තු 01 දින සිට රු. 195 බැගින් බදු දී තිබුණද කුලී වටිනාකම තක්සේරු කර යාවත්කාලීන කුලී වටිනාකමක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද කිරිහලක් පවත්වාගෙන යෑම සඳහා 1998 ජනවාරි 01 දින මාසික කුලිය රු. 65 බැගින් දී තිබූ කඩකාමරය සඳහා 2023 නොවැම්බර් 10 දක්වා අවුරුදු 11 මාස 7 ක් වූ කාල පරිච්ඡේදය සඳහා කුලී අයකර නොතිබුණි.

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

**ජාතික භෞතික සැලැස්ම පිළියෙළ කිරීම**

දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිළියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව සිදු කිරීමටත් කලාපීය සහ නගර භෞතික සැලසුම් සකස් කිරීමක් කළ යුතුවේ. මේ සඳහා රටේ විවිධ

ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොමැති බව නිරීක්ෂණය විය. ජාතික භෞතික සැලසුම ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරන නගර නිර්මාණ සංශෝධන මගින් අවශ්‍ය සංශෝධනයක් සිදු කලත් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 11 කට වැඩි කාලයක් ගත වුවත් ජාතික භෞතික සැලසුම් පිලියෙල කිරීම සහ අනිකුත් කලාපීය සහ නගර සැලසුම් කාලීනව පිළියෙළ කර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි.

**ප්‍රාදේශීය භෞතික සැලසුම්**

2023 වර්ෂය තුලදී මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විටත් එයින් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පළාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකළ නොහැකි වී තිබුණි.මේ හේතුවෙන් සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරිම් සිදුකර තිබීම සහ පොදු පහසුකම් විධිමත්ව සපයා නොමැති වීම හේතුවෙන් පාරිසරික ගැටළු ඇති වී තිබුණි.

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය.

**සහාධිපත්‍ය සහතිකය ලබා නොගැනීම**

1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ 5(2) වගන්තිය අනුව අනුකූලතා සහතික ලබා නොගත් දේපල වල තැනැත්තෙකු පදිංචි නොකළ යුතු වේ. එහෙත් 2023 වර්ෂය අවසන් වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර තිබූ සහාධිපත්‍ය දේපල 21 සඳහා අවසන් සහතික ලබාගෙන නොතිබූ අතර පවුල් 12,734 ක් එම මහල් නිවාස වල පදිංචි කර තිබුණි. සහාධිපත්‍ය සහතිකය ලබා නොගැනීම හේතුවෙන් මෙම නිවාස සංකීර්ණවල කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී තිබූ අතර නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකිරීම සහ නිවාස හිමියන්ට ඔප්පු ලබා දීමට නොහැකි වී තිබුණි. තවද මෙම සහාධිපත්‍ය දේපලවල පැවතිය යුතු පොදු පහසුකම් පවතිද සහ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත ප්‍රකාරව දේපල හිමි අය විසින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව අධිකාරිය සිය වගකීම් පැහැර හැර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

**කළමනාකරණ සංස්ථා**

කළමනාකරණ සංස්ථා විසින් වාර්ෂිකව මහ සභා රැස්වීම් පැවැත්විය යුතු අතර කළමනාකරණ සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම්වල පිටපත් අධිකාරියට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් අධිකාරියේ

ලියාපදිංචි කළමනාකරණ සංස්ථා 1014 න් 586 ක් ලියාපදිංචි කරන ලද දින සිටම වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර නොතිබූ අතර ඉතිරි සංස්ථා 428 න් 403 ක ප්‍රවර්තන වසරේ විගණිත වාර්ෂික ගිණුම් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර මාස 3ක් ඇතුලත කළමනාකරණ සංස්ථා පිහිටවිය යුතු වුවත් 2022 – 2023 කාලය තුල ලියාපදිංචි කළ දේපල 39ක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථා පිහිටුවා නොතිබුණි.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නිවාස යෝජනා ක්‍රම පිහිටි ඉඩම් පවරා නොගැනීම**

අධිකාරිය විසින් නිවාස ඒකක 512 ක් සහිත ඉදිකිරීම් නිම කළ නිවාස යෝජනා ක්‍රම 03 ක් හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රමයක් පිහිටි හෙක්ටයාර 2.32 ක ඉඩම් අදාල ආයතනවලින් පවරා ගැනීමට 2023 වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් ඉදිකර අයිතිය භාර දී ඇති නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් මත නිවාස ක්‍රමවල කළමණාකරන සංස්ථා පිහිටුවා නිවාස වල භාරකාරත්වය පැවරීමට නොහැකි වී තිබුණි.

**අධිකාරියේ නිලධාරීන්ට නිවාස ලබාදීම**

අධිකාරිය විසින් අමාත්‍ය මණ්ඩල තීරණ අංක MUDRH/2020/CP/55 ට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ අධිකාරියේ නිලධාරීන්ට නිවාස ලබාදෙන අවස්ථාවල නිවාස විකුණුම් මිල තීරණය කිරීමේදී අයකරනු ලබන සියයට 20 ක සේවා ගාස්තුව අය නොකිරීමටත් නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර එම පිරිවැය අවුරුදු 25 ක කාලයක් තුළ සියයට 2 ක සහනදායි වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ ගෙවීම් සිදුකිරීම සඳහා පහසු ගෙවීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියේ නිලධාරීන්ට නිවාස ඒකක 22 ක් ලබාදී තිබුණු අතර අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කටයුතු කිරීම මත රජයට අහිමි වූ වටිනාකම රු.මිලියන 18.96 ක් වී තිබුණි.

**ධීවර මහල් නිවාස වෙනත් පුද්ගලයන්ට ලබාදීම**

අධිකාරිය විසින් ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අඟුලාන මහල් නිවාස ක්‍රමයෙහි පැවති නිවාස 288 කින් රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක් මුදල් අයකිරීමෙන් තොරව නිදහස් දීමනා පත්‍ර මගින් 2016 සැප්තැම්බර් 26 වන දින සිට 2019 පෙබරවාරි මස 12 අතර කාලය තුළ සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයන්ට භුක්තිය ලබාදී තිබුණි. පසුව එනම් 2019 සැප්තැම්බර් මස 18 දිනැති හා අංක අමප/අංක/19/2761/122/085 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම නිවාස සඳහා සාධාරණ මුදලක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට දන්වා තිබුණු නමුත් අධිකාරිය විසින් 2023 වර්ෂය අවසානය වන විටද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. එමෙන්ම නීතිපතිතගේ 2022 දෙසැම්බර් 04 දිනැති ලිපියෙහි උපදෙස්

පරිදි නිවාස 32 ක නිදහස් දීමනා අවලංගු කිරීමටද කටයුතු කර නොතිබුණි.

**අලාභය අයකර ගැනීම සඳහා අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු නොපැවරීම**

සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමේදි සිදුව තිබු රු. මිලියන 47.75 ක මුල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින අලාභය අයකර ගැනීම සඳහා අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට උපදෙස් ලබා දී තිබුණි. රේඛිය අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 103 පරිදි කටයුතු කර වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතු බව දන්වා තිබුණද රේඛිය අමාත්‍යාංශය විසින් 2024 ජුනි වන විටත් ඒ පිළිබද කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

**විකුණුම් මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම**

සංස්ථාවට නිදහස් රදවා ගැනීමේ පදනම මත (Free Hold Basis) රජය විසින් ලබාදී තිබු මුතුරාජවෙල පිහිටි අක්කර 02 ක පමණ ඉඩමක් සඳහා අමප/19/2832/16/11 අංක හා 2019 ඔක්තෝබර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා දැරූ සංවර්ධනය කිරීමේ වියදම් අයකර ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙසට දන්වා තිබුණි. එම ඉඩම 2019 දෙසැම්බර් 17 දින විකුණා රු. මිලියන 272.62 ක් ලබාගෙන තිබු නමුත් දැරූ සංවර්ධන වියදම රු. මිලියන 21.02 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු රු. මිලියන 251.60 ක් 2023 නොවැම්බර් දක්වාම බැරකර නොතිබු අතර එම වගකීම් හඳුනාගෙන ඒ සඳහා මුල්‍ය ප්‍රකාශන තුළ වෙන් කිරීම්ද සිදුකර නොතිබුණි.

**විධිමත් අනුමැතියක් හා ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘති ඉටුකිරීම**

අතුරුගිරිය කොතලාවල අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛිය උද්‍යානයක් ඉදිකිරීමේ සහ ජලාපවහන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබුණි. එහෙත් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන රේඛීය රේඛිය අමාත්‍යාංශයෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමක් කර නොතිබුණි. එවකට සංස්ථාවේ සභාපතිවරයා සහ ජනාධිපතිතුමා අතර පැවති සාකච්ඡාවකදි ජනාධිපතිතුමා දුන් වාචික උපදෙස් වලට අනුව මෙම කොන්ත්‍රාත්තුව සංස්ථාව විසින් ආරම්භ කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලබාගෙන නොතිබුණි. එමෙන්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා සංස්ථාව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ව්‍යාපෘති යෝජනාව සඳහා පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. 2023 වර්ෂය අවසානයට සිදු

කර තිබු වැඩවල වටිනාකම රු. මිලියන 193.3 ක් වූ අතර අදාල වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් එම මුදල් අයකර ගැනීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමෙන් සමාජ වගකීම සඳහා වන ක්‍රියාකාරීම් ගිණුමට හරකර ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

එසේම ඉදි කරන ලද ව්‍යාපෘතිය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා කඩුවෙල මහ නගර සභාව වෙත පැවරීමට සංස්ථාව අපොහොසත් වීම හේතුවෙන් සංස්ථාවට 2023 නොවැම්බර් දක්වා රු.මිලියන 3.81ක පමණ නඩත්තු වියදමක් දැරීමට සිදුවී තිබුණි.

**විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව බදුදීම්**

සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 22 රූඩ් 02 හා පර්චස් 37.14 ක් වූ බිම් කොටස හා වර්ග අඩි 55900 ක ගොඩනැගිල්ල රු. මිලියන 2,195.79 ක බදු මුදලකට පෞද්ගලික සමාගමකට වසර 50 ක දිගු කාලීන බදු පදනම මත ලබා දීමට 2021 ජුනි 02 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.මිලියන 500 ක් ලබා ගෙන තිබු නමුත්, ඉතිරි මුදල වූ රු. මිලියන 1,695.79 ක මුදල ලබා ගැනීමට හා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට 2023 දෙසැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි.

**අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය**

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් එලෙස ගැසට් කරන ලද පළාත් ගණන 07 කට සීමාවී තිබුණි. මායිම් ගැසට් කර තිබුණු ප්‍රදේශවල සිදු වන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමටද සංස්ථාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඉහත පනතේ 8 (අ) වන වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදි සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 25 ක කාලයක් ගතව තිබුණද ඉන් වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 400 ක් එනම්, සියයට 50 ක් පමණක් වී තිබුණි.

**සාධාරණ හේතුවකින් තොරව ව්‍යාපෘති අත්හිටුවීම**

වෙරළෙන් ඔබ්බෙහි පිහිටි මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් කැණීම සහ පොම්ප කිරීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීම සඳහා සංස්ථාව 2018 වර්ෂයේදි විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ

කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත් විෂය පථය සම්පූර්ණ කර නොගෙන සහ සාධාරණ හේතුවකින් තොරව සහ සංස්ථාවට දැරීමට සිදුවන මූල්‍ය අලාභ පිළිබඳ ඇගයීමකින් තොරව ඉහළ කළමනාකාරිත්වය විසින් සිය අභිමතය පරිදි 2020 අප්‍රේල් 10 දින මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. මෙම ගිවිසුමට එළඹීමේදි නෛතික අවශ්‍යතාවයන් පිළිබඳ අවබෝධාත්මකව ගිවිසුම්වලට එළඹ නොතිබූ අතර ව්‍යාපෘතිය සඳහා වැයවන අමතර පිරිවැය, ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට නිසි පරිදි උපදෙස් ලබා නොදීම, කොන්ත්‍රාත්කරු සමඟ පැවති ලිඛිත ගිවිසුම අවසන් වීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුව වෙනත් ව්‍යාපෘතියකට නිදහස් කිරීම වැනි කරුණු කෙරෙහි සංස්ථාව අවධානය යොමු නොකිරීම විගණනයේදි ප්‍රශ්නකාරී විය. මේ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවය විසින් බේරුම්කරණයට යොමුව තිබූ අතර එම තීන්දුවට අදාළ විදේශීය පෞද්ගලික සමාගමට රු.මිලියන 753.08 ක මුදලක් හා අවසාන බිල්පතට අදාලව රු මිලියන 585.79 ක් සංසංථාව විසින් ගෙවා තිබුණි. මෙලෙස විශාල වන්දි මුදලක් ගෙවීමට සිදුවීම සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු වූ පාර්ශවයන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

**මැදමුලන අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම**

මැදමුලන අනුස්මරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් අයවිය යුතු බවට අධිකරණය වෙත වාර්තා කළ හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස රු. මිලියන 47.37 ක් විය. එම වියදම ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් එම අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කළමණාකරනය කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2021 ජූනි 28 දිනැති අංක MRW/5404 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ගත් තිරණයට අනුව පොත්වලින් කපා හැරීම සඳහා සංස්ථාව විසින් කටයුතු කර තිබුණි.

# වතු යටිතල පහසුකම්

කඳුකර සම්භවයක් සහිත ප්‍රජාවගේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මගින් ජීවන තත්වය නගා සිටුවීම, සමාජ ආර්ථික ප්‍රගතිය වේගවත් කිරීම සහ ශ්‍රී ලාංකේය සමාජයට ස්වයංපෝෂිත සහ සාඩම්බර දායකයින් වීමට ප්‍රජා සාමාජිකයින් සවිබල ගැන්වීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ වන වතු යටිතල පහසුකම් අංශයේ අරමුණ වන අතර ඒ සඳහා පහත සඳහන් කාර්යයන් ඉටුකල යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

රජය හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන හා නගර නිර්මාණය කිරීම.

වතු අංශයේ ප්‍රජාවගේ මූලික පහසුකම් ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.

ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## විගණන නිරීක්ෂණ

### නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය- ග්‍රාමීය වතු යටිතල පහසුකම් අංශය

**වාහන අනතුරු අලාභ**

2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අමාත්‍යාංශය සතු වාහන 08 කට අවස්ථා 10 කදී සිදුවී තිබූ අනතුරු සම්බන්ධයෙන් ඇස්තමේන්තුව හා අලාභය වූ රු.මිලියන 4.63 ක අයකර ගැනීමට විගණන දිනය වූ 2024 මාර්තු 05 දින වන විටත් අමාත්‍යාංශට නොහැකි වී තිබුණි.

**ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය**

ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය (අදියර 01) යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර 2023 වර්ෂය තුල නිවාස ඒකක 154 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, 2023 වර්ෂය අවසාන වන විට භෞතික ඉලක්ක ළඟාකර ගැනීම නිවාස ඒකක 16 ක් පමණක් එනම් සියයට 10 ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි.

**පාසල් පහසුකම් සැපයීම**

වතු යටිතල පහසුකම් ක්ෂේත්‍රයට අදාළව තෝරාගත් පාසල්වල 2023 වර්ෂය තුළ ස්මාට් පන්තිකාමර 60 ක් ස්ථාපිත කිරීම සඳහා සහ පවතින පන්ති කාමර ස්මාට් පන්ති කාමර ලෙස යලි සකස්කිරීම වෙනුවෙන් රු. මිලියන 155 ක් වෙන්කර තිබුණ ද, අදාල කාලපරිච්ඡේදය තුළ කිසිදු මුදලක් වැයකර නොතිබූ අතර ඒ සඳහා අවශ්‍ය පාසල් තෝරාගැනීමේ කටයුතු හා ගිවිසුම්ගත වීමේ කටයුතුද අවසන්ව නොපැවතුණි.

**වැවිලි මානව සංවර්ධන භාරය මගින් සිදුකරන වියදම්**

අමාත්‍යාංශයේ වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් 2017, 2018 හා 2021 වර්ෂයන්වලදී ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත

# වතු යටිතල පහසුකම්

වටිනාකම රු.මිලියන 435.76 ක් වූ නිවාස ව්‍යාපෘති 19 ක කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම වෙනුවෙන් රු.මිලියන 82.12 ක මූලික අත්තිකාරම් මුදලක් හා කළමණාකරණ ගාස්තු වෙනුවෙන් රු.මිලියන 3.61 ක මුදලක්, වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණි. එසේ වුවද අදාල ව්‍යාපෘති අත්හැර දැමීම, අවලංගු කිරීම හා නවතා දැමීම සිදුකර ඇති හෙයින් නැවත එම මුදල් අමාත්‍යාංශයට ප්‍රතිපූර්ණය නොකර වැවිලි මානව සංවර්ධන භාරයේ වෙනත් ව්‍යාපෘති වියදම් වෙනුවෙන් රු.මිලියන 72.66 ක් හිලව් කර තිබුණි. මෙම ව්‍යාපෘති වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණයන් අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගෙන නොතිබූ බැවින් ඉහත තත්ත්වය මත රජයට සිදු වන පාඩුව පියවා ගැනීමට නොහැකි වී තිබුණි.

**ඉදිකිරීම් ප්‍රමාදය**

හරිත රන් නිවාස ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද නුවර ප්‍රදේශයේ රොත්චයිල්ඩ් වතුයායේ නිවාස ඒකක 15 ක් සඳහා රු.මිලියන 3.36 ක ඇස්තමේන්තු සකස්කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට මුළු මුදලම වැයකර තිබුණද, ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. එමෙන්ම 2016, 2017 හා 2018 වර්ෂවලදී නුවරඑළිය, හැටන්, නුවර, ගාල්ල හා රත්නපුර යන ප්‍රදේශවල ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ඒකක 211 ක් සඳහා රු.මිලියන 48.14 ක් වැයකර තිබුණද, වර්ෂ 05 ක් ගත වී පළමු අදියර පමණක් සම්පූර්ණකර තිබූ අතර තවත් නිවාස ඒකක 298 ක් ඉදිකිරීම් ආරම්භකර වර්ෂ 05 ක් ගත වී ඇතත් ඒ සඳහා 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 117.18 ක් වැයකර තිබුණද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

**නව ජීවන නිවාස ව්‍යාපෘතිය**

2021 වර්ෂයේදී නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද නුවරඑළිය, හැටන්, නුවර හා කෑගල්ල යන ප්‍රදේශවල වතු 08 ක නිවාස ඒකක 157 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 112.53 ක් වූ ඇස්තමේන්තු මුදලින් රු.මිලියන 92.34 ක් එනම් සියයට 82 ක් වැයකර පළමු අදියර පමණක් සම්පූර්ණ කර තිබුණි. එමෙන්ම 2020 හා 2021 වර්ෂවලදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද නුවරඑළිය, හැටන්, නුවර ප්‍රදේශයන්හි නිවාස ඒකක 104 ක් මාස 06 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතු වුවද ඒ සඳහා රු.මිලියන 45.58 ක් වැයකර ඇතත් 2023 දෙසැම්බර් 31 වන විටත් වසර 03 ක් ගතවී තිබුණද ඉදිකිරීම් නිමකිරීමට කටයුතු කර නොතිබූ අතර 2020 හා 2021 වර්ෂවල ඉදිකිරීම් ආරම්භ කර තිබූ කෑගල්ල හා හැටන් යන ප්‍රදේශවල ඇස්තමේන්තු මුදල රු.මිලියන 173.24ක් වූ නිවාස ඒකක 56 ක ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි.

**වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම්**

නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැවිලි මානව සංවර්ධන භාරය හා අදාල සමිති සංවිධානය සමග වූ ගිවිසුම් ප්‍රකාරව

## වතු යටිතල පහසුකම්

මාස 06 ක කාලසීමාවක් ඇතුලත නිවාස ව්‍යාපෘතිය සම්පූර්ණ කර භාර දිය යුතු වුවද 2016 සිට 2021 දක්වා වන වර්ෂවලදී ආරම්භ කර තිබූ නිවාස ව්‍යාපෘති 62 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබූ අතර එම ව්‍යාපෘති ඉදිකිරීමේ කාල සීමාවන් මාස 19 සිට මාස 85 දක්වා වූ පරාසයන් තුළ විය. එම ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම සඳහා රු.මිලියන 846.84 ක මුදලක් සහ අධීක්ෂණය හා කළමණාකරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.මිලියන 51.36 ක මුදලක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම, අමාත්‍යාංශයේ නිසි අධීක්ෂණයක් නොවීම මෙම ප්‍රමාදයන්ට හේතු වී තිබුණි.

# ඉදිකිරීම් හා ඉංජිනේරු

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ඉදිකිරීම් කර්මාන්තය විශාල කාර්යයක් ඉටු කරනු ලබන අතර ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අනුව 2023 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනයට සියයට 7 කට ආසන්න දායකත්වයක් දක්වයි. ඉදිකිරීම් හා ඉංජිනේරු අංශය ප්‍රධාන ප්‍රාග්ධන වත්කම් හා යටිතල පහසුකම් ගොඩනගන්නා වන හෙයින් අනිකුත් අංශයන්හී වර්ධනයට ශක්තිමත් පදනමක් සපයයි. නමුත් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව ඉදිකිරීම් අංශයේ එකතු කළ අගය සියයට 20.9 ඍණ අගයක් දක්වා පහත වැටී තිබුණි. මෙම කණගාටුදායක තත්ත්වයට වසංගත තත්ත්වය, මූල්‍ය අර්බුදය, පුහුණු වෘත්තිකයන්ගේ හිඟය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය අත්හිටුවීම, කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද වීම සහ ඉදිකිරීම් ව්‍යාපෘති අත්හිටුවීම ප්‍රධාන වශයෙන් මෙයට බලපා තිබුණි. එම නිසා ඉදිකිරීම් හා ඉංජිනේරු අංශයේ මිලියනයකට වැඩි සෘජු හා වක්‍ර රැකියා අහිමි වී තිබුණි.

ඉදිකිරීම් සහ ඉංජිනේරු අංශයට සම්බන්ධ ආයතන වන ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය යන ආයතන 05 නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික ) සමාගම වාරිමාර්ග අමාත්‍යාංශය යටතේද රාජ්‍ය ඉදිකිරීම් සහ නිර්මාණ නීතිගත සංස්ථාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේද ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යටතේද 2023 වර්ෂයේදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**කාර්යභාරයන්**

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම ඉදිකිරීම් සම්බන්ධව ජාතික උපදේශන සභාව පිහිටුවීම,

ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම හා ශ්‍රේණිගත කිරීම

**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වර්ෂවලදී මහා භාණ්ඩාගාරයෙන් අධිකාරිය වෙත ලබා දී තිබුණු රු. මිලියන 35.7 ක මුදලින් රු. මිලියන 13.82 ක මුදලක් 2024 අප්‍රේල් 30 දින වන විටත් අරමුණුගත කාර්යය වෙනුවෙන් යොදානොගෙන ඉතිරිව පැවතුණි. මීට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපනය සඳහා 2022 මාර්තු 11 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය රු.මිලියන 3.35 ක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණු අතර එය දින 21 ක් තුළ අවසන් කළ යුතු වුවද 2024 අප්‍රේල් 30 දින දක්වාත් අවසන් කර නොතිබුණි. තවද නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට පෙර ඊට

අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ පළකල යුතු වුවද අධිකාරිය විසින් එසේ කටයුතු නොකර ගාස්තු අය කරමින් 2023 ජූලි 31 දින වන විට හැඳුනුම්පත් 228 ක් නිකුත්කර තිබුණි

**පනතේ අරමුණු ඉෂ්ඨ නොකිරීම**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 33 වගන්තියට අනුව විදේශීය උපදේශකවරුන් ලියාපදිංචි කර ගැනීම සඳහා අධිකාරිය විසින් ක්‍රියාපටිපාටි සකස් කර නොතිබුණි. තවද,පනතේ 43 සහ 44 වගන්ති ප්‍රකාරව ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිෂ්පාදකයන් හා උපාංග සපයන්නන්ගේ නාමාවලියක් හා දැනට තිබෙන බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණවල නාමාවලියක් පවත්වාගෙන යා යුතු වුවත් අධිකාරිය විසින් මෙතෙක් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

**සම්මත ලංසු ලේඛණ කාලීනව සංශෝධනය නොකිරීම**

පනතේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛණ එනම් ප්‍රසම්පාදන වැඩ (SBD – 01) හා ප්‍රසම්පාදන වැඩ සුළු (SBD – 03) කාලීනව සංශෝධනය කර නොතිබුණි.

**ආරවුල් තීරනකරණය**

පනතේ 51 (2) වගන්තිය පරිදි කාර්මික ආරවුල් තීරනකරණ ක්‍රියා පටිපාටිය නියම කළ යුතු වුවද අධිකාරිය විසින් අදාල ක්‍රියාපටිපාටි සකස්කර නොතිබුණි.තවද, පනතේ 53 වන වගන්තියෙහි පරිදි අභියාචනා මණ්ඩලයක්ද පත්කර නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

2021 හා 2022 වර්ෂවල අධිකාරියේ මානව සම්පත් කළමනාකරණයේ කැපී පෙනෙන ගැටළුකාරී තත්ත්වයන් පැවතීම හේතුවෙන් නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම, අනිවාර්ය නිවාඩු යැවීම, ඉල්ලා අස්වීම, අධිකාරියට විරුද්ධව නඩු පැවරීම, වන්දි ගෙවීම් හේතුවෙන් සමලෝචිත වර්ෂය අවසන් වන විට නීති වියදම් රු.මිලියන 7.79 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. තවද පුද්ගලික නඩු කටයුත්තක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව රු.මිලියන 0.34 ක නිතීඥ ගාස්තුවක්ද ගෙවා තිබුණි.

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**කාර්යභාරයන්**

රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, ඇස්තමේන්තු සෑදීම,

ගොඩනැගිලි ගාස්තු උපලේඛණය සකසා යාවත්කාලීනව පවත්වාගෙන යාම,

ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම, ගොඩනැගිලි සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම,රජයේ

ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම සහ නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය රෙගුලාසියට අනුව ගොඩනැගිලි තත්ත්ව වාර්තාව සහතික කිරීම

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒවායෙහි ඉදිකිරීම් කටයුතු සිදුකර ගැනීම පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී පවරා දෙනු ලැබූ රු.මිලියන 1,335.89 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු. මිලියන 691.79 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52 ක් වේ. මේ තුල ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකළ ව්‍යාපෘති 08 ක් පැවති අතර එම වටිනාකම රු.මිලියන 310.93 ක් වී තිබුණි.

**දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම**

බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහතිකයක් එම සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2024 ජූලි 02 දින වන විට මෙලෙස නිවාස දේපළ 2,352 කට අදාළ ඉල්ලීම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද මේ දක්වා ලබා දී තිබුණේ සහතික 1,017 ක් පමණි. මෙම පනත 2018 අගෝස්තු 18 දින සිට වසර පහක කාලසීමාවක් සඳහා පමණක් ක්‍රියාත්මක බැවින් 2023 අගෝස්තු 18 දින වන විට එම කාලසීමාව අවසන් වී තිබුණද ආරක්ෂණ සහතික නිකුත් නොකිරීම හේතුවෙන් ඔප්පු ලබා දීමට නොහැකිව තිබුණි.

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

අයවැයෙන් වෙන්කර තිබුණු ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා දී දීර්ඝ කාලයක් ගතකර තිබුණද කොන්ත්‍රාත්තු යටතේ වූ කාර්යයන් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගත නොහැකිවීම මත කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ තනිකඩ භට නිවාස ඉදිකිරීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මඩකලපුව කාර්යාලයේ විදුලි උත්පාදන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවිකිරීම, වැල්පොතුවැව කොබෙයිගනේ මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, වරකාපොළ කම්කරු කාර්යාලය, මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර 04 යනාදී ව්‍යාපෘති අත්හිටුවා තිබුණි.

**අතරමග නවතා දමා තිබූ ව්‍යාපෘති**

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 06 ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල්

මිලියන 659 ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 23 ක් අතරමග නවතා දමා තිබුණි.

**තාක්ෂණික මෙවලම් භාවිතය අනුව සම්මතයන් වෙනස් නොකිරීම**

2023 වර්ෂයේ ගොඩනැගිලි ගාස්තු උපලේඛණය (BSR) යාවත්කාලීනව පිළියෙල කර තිබුණද ඒකකයකට සහ විවිධ වර්ග ප්‍රමාණයන්ට අවශ්‍ය ශ්‍රමය, අමුද්‍රව්‍ය ආදී වශයෙන් වූ සම්මතයන් (Norms) 1988 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. එම නිසා ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී වර්තමානයේ දියුණු තාක්ෂණික මෙවලම්, යන්ත්‍ර සූත්‍ර යොදාගැනීමෙන් ශ්‍රමයෙහි ඇති වන වෙනස්කම් හා සාම්ප්‍රදායික සිමෙන්ති, ගඩොල්, වැලි වෙනුවට යොදාගන්නා විකල්ප අමුද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන වෙනස්කම් සමඟ ද මෙම සම්මතයන් වෙනස් නොවීම හේතුවෙන් ඒවා වර්තමානයේ යොදාගැනීම තාත්ත්වික නොවන බව නිරීක්ෂණය විය.

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

**කාර්යභාරයන්**

භාණ්ඩාගාර කළවැඩ අත්තිකාරම් ගිණුම යටතේ සහ ගබඩා අත්තිකාරම් ගිණුම යටතේ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන , ඉදිකිරීම්, අලුත්වැඩියා සහ නඩත්තු, හා යාන්ත්‍රික ඉංජිනේරු උපදේශන සේවා සැපයීම

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු.මිලියන 36.94 ක් වුවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව රු.මිලියන 4.05 ක් සඳහා පමණක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයන්ට අදාළ ඉහත සඳහන් රු.මිලියන 36.94 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2020 මාර්තු 06 දිනවන විට එකතුව රු.මිලියන 22.20ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 05 ක් ගත වුවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති ඉටුකරලීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් නොවුවද ජන මාධ්‍ය අමාත්‍යාංශයේ පැරණි මැදිරි සංකීර්ණය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීමේ

කොන්ත්‍රාත්තුව භාරගෙන රු.මිලියන 16.51ක (වැට් රහිත) කොන්ත්‍රාත් අගයකට බාහිර කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි.

කොන්ත්‍රාත්කාර සමාගමේ රේටයන් හා ඉංජිනේරු ඇස්තමේන්තුව අතර සියයට 8 සිට සියයට 409 දක්වා විචලතාවයක් දක්නට තිබුණද මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 පරිදි ඒ සඳහා කොන්ත්‍රාත්කරුගෙන් හේතු පැහැදිලි කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මෙසේ නවීකරණය කරන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල වැහි දිනවල ජලයෙන් පිරී යන බැවින් වර්තමානයේ භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

## සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

1970 අංක 33 දරන "ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත" යටතේ 1971 වර්ෂයේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කර තිබුණි. 1987 අංක 23 දරන "රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම" පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ දී සියයට 100 ක් රජය සතු සීමා සහිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි.

**කාර්යභාරයන්**

ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මක භාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීම.

**වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරීම**

2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර 2022 ගනුදෙනු වාර්තාවට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු**

2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002-1 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

මෙම නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් සහ ගිවිසුම්ගතවීමක් නොමැතිව රු.මිලියන 13.07 ක මුදලක් ගෙවමින් තෝරාගනු ලැබූ ගෘහ නිර්මාන ශිල්පීන්ගේ වාචික උපදෙස් මත ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඔවුන් විසින් නම් කරනු ලැබූ සැපයුම්කරුවන් 16 දෙනෙකුගෙන් තරඟකාරි මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගැනුම් ඇනවුම් මත මෙම නිල නිවාස ව්‍යාපෘතියට භාණ්ඩ නිකුත්කර ඉන්වොයිස් කර තිබුණි.

සමාගම විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට නවීකරණ කටයුතු සඳහා සැපයුම් කරන ලද භාණ්ඩ වෙනුවෙන් මුදල් අයකර ගැනීම සඳහා රු.මිලියන 639.22ක් වූ ඉන්වොයිස් 590 ක් අග්‍රාමාත්‍ය ලේකම් වෙත නිකුත් කර තිබූ අතර එයින් රු.මිලියන 554.58ක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපාදන මත ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කර තිබුණු අතර රු. මිලියන 84.63 ක් එදින වන විට ප්‍රතිපූරණය කර නොතිබුණි.

**ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීම**

2015 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සූරිය පොකුණ දෙබොක්කාව නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස හිමියන්ට ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් අම්බලන්තොට, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්ස, වීරකැටිය, ඇඹිලිපිටිය, සූරියවැව යන ශාඛා ගබඩාවන්ගෙන් රු. මිලියන 34.70 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය කිසිඳු සීමාවක් නොතකා නිකුත් කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින දක්වාම මෙම ණයශේෂ නිරවුල් කරගෙන නොතිබුණි.

**වත්කම් කළමනාකරණය**

සමාගමට පවරාදී තිබුණු කොළඹ 10, සංඝරාජ මාවතේ අංක 541හි පිහිටි ඉඩමෙන් අක්කර 01 යි පර්චස් 31.4ක ප්‍රමාණයක් පනතෙහි කොන්දේසි නොතකා 2005 ජූලි 19 හා 2006 ඔක්තෝබර් 03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත සමාගම විසින් HDFC රියල් එස්ටේට් ඩිවලොප්මන්ට් ලිමිටඩ් ආයතනයට රු.මිලියන 222.50 කට විකුණා තිබුණි.

ඉහත දේපළවල නිරවුල් භුක්තිය ලබා ගැනීම සඳහා සමාගමට එරෙහිව ගොනු කර තිබූ නඩුවේ තීන්දුව අනුව 2012 ජනවාරි 10 දින සමාගම විසින් රු.මිලියන 359.32ක මුදලක් ඉහත ආයතනයට 2012 ජනවාරි 31 දිනට පෙර ගෙවා ඉඩම්වල අයිතිය නැවත පවරා ගැනීමට එකඟවීම මත, නඩුව සමථයට පත්වී තිබුණි. එහෙත් එකඟ වූ පරිදි අදාළ මුදල් සමාගම විසින් නොගෙවීම නිසා ඉඩම්වල නිරවුල් බුක්තිය ලබා ගැනීමට HDFC බැංකුව මේ වන විට ක්‍රියා කර ඇති බවද නිරීක්ෂණය විය.

**බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකිරීම**

2022 වර්ෂය සඳහා ආරම්භක සහ අවසාන ශේෂයන් සඳහන් කරමින් මුදල් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සක්‍රීය බැංකු ගිණුම් 10 සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

නිසි අනුමැතිය සහිත බඳවා ගැනීමේ පරිපාටියක් සමාගම සතුව නොතිබුණි.

## ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය

**ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම**

සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව තීරණය කිරීම, සේවකයන් පත්කිරීම, උසස් කිරීම සේවයෙන් ඉවත්කිරීම සහ විනය ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම වැටුප්, දීමනා සහ පාරිතෝෂික ලබා දීම මණ්ඩලයේ වගකීමක් වුවද මණ්ඩලයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම නිලධාරීන් සහ සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ අතර ඉන් නිලධාරීන් 16 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දිනට වසර 01 ක සිට 18 ක් දක්වා කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. මීට අමතරව දැනට සේවයේ නියුතු සේවකයන් දෙදෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොමැති බව ද පුද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

**අලාභ වාර්තා කිරීම**

ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ ඇති අංශ 14 කින් 07 ක් 2023 වර්ෂයේදී රු.මිලියන 54.86 ක සමස්ත මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණු අතර උපදේශන අංශයේ වියදම් මධ්‍යස්ථාන 22 කින් 14 ක් රු.මිලියන 305.49 ක මෙහෙයුම් අලාභ වාර්තා කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශය මුළු මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන 145.57 ක අලාභයක් වාර්තා කර තිබුණි.

**ණයගැති ශේෂ අයනොකිරීම**

2023 වර්ෂය අවසානයේ මුළු ණයගැති ශේෂය රු.මිලියන 4,549.28 ක් වූ අතර ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3 – 5 අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 246.91 ක් සහ රු.මිලියන 1,280.47 ක් වූ අතර උපදේශන අංශයේ වර්ෂ 3 – 5 ත් අතර සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 270.49 ක් සහ රු.මිලියන 356.55 ක් විය. ඒ අනුව කාර්යාංශයට ලැබිය යුතු ණයගැති මුදල් කාලීනව එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ණයහිමි ශේෂ නොගෙවීම**

2023 වර්ෂය අවසානයේ මුළු ණයහිමි ශේෂය රු.මිලියන 1,874.15 ක් වූ අතර ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3 – 5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 219.18 ක් සහ රු.මිලියන 767.84 ක් වූ අතර උපදේශන අංශයේ වර්ෂ 3 – 5 ත් අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 2.92 ක් සහ රු.මිලියන 39.04 ක් විය. ඒ අනුව කාර්යාංශය විසින් ගෙවිය යුතු

ණයහිමි ශේෂ කාලීනව පියවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**මිශ්‍ර කෘෂිකාර්මික ව්‍යාපෘතිය** ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ රඹකැන්ඔය මහවැලි කලාපයේ පිහිටි පොල්ලේබැද්ද මහවැලි කොට්ඨාශයේ ඉඩම් අක්කර 150 ක් මිශ්‍ර කෘෂිකාර්මික ව්‍යාපෘතියක් සඳහා කාර්යංශය වෙත ලබා දී තිබුණු අතර කාර්යාංශය විසින් මේ දක්වා එම ඉඩම දිගුකාලීනව බදු පදනම මත ලබා ගැනීම සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. මෙම කෘෂිකාර්මික ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම විසින් පවත්වා ගෙන යන අතර මේ දක්වා සුදුසු පරිදි සමාගම වෙත පැවරීමට අවශ්‍ය කටයුතුද සිදු කර නොතිබුණි.

## මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික ) සමාගම

**අධික අලාභ ලැබීම** සමාගම එහි සම්පූර්ණයෙන් නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් පිළිවෙළින් 2023, 2022 සහ 2021 වර්ෂයන් හි දී රු. මිලියන 942.90 ක රු. මිලියන 667.42 ක සහ රු. මිලියන 888.15 ක මෙහෙයුම් අලාභයන් ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 40 කින් රු. මිලියන 528.57 ක අලාභයක් ලබා තිබුණි. මෙම අලාභ සමාගමේ අඛණ්ඩ පැවැත්ම සඳහා සෘජුවම බලපාන බැවින් ඒ සඳහා සෘජුව හෝ වක්‍රව වගකිව යුතු පුද්ගලයන් සහ හේතු හඳුනාගෙන මෙවැනි අධික අලාභ අවම කිරීම සඳහා කළමනාකාරිත්වය ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**ප්‍රමාද වන්දි අයකිරීම** ව්‍යාපෘති කළමණාකරනයේ දුර්වලතා ආදී කරුණු හේතුවෙන් ව්‍යාපෘති 62 කට අදාලව රු.මිලියන 105.75 ක් ප්‍රමාද වන්දි (Liquidated Damages) ලෙස සේවායෝජකයින් විසින් බිල්පත්වලින් අඩුකර ගෙන තිබුණි. මෙයින් ව්‍යාපෘති 09 ක් සඳහා අඩුකල රු.මිලියන 36.81 ක මුදල් අයකර ගැනීමට හැකි වුවද, ව්‍යාපෘති 18 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉල්ලුම් කළ කාලය දීර්ඝ කර ගැනීම් වෙනුවෙන් අනුමැතීන් ලැබී නොතිබුණු අතර ව්‍යාපෘති 35 කට අදාලව අඩු කල ප්‍රමාද වන්දි මුදල වූ රු. මිලියන 49.01 ක් නැවත අයකර ගත නොහැකිව තිබුණි.

## ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල

**කාර්යභාරයන්** ජාතික ලියාපදිංචියක් ඇති සුළු හා මාධ්‍යම පරිමාණ කොන්ත්‍රාත්කරුවන්හට ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන බැදුම්කර, ඇපකර සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සුරැකුම්පත් ලබා දීම

**ඇපකර මත මුදල් ගෙවීම**

කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යයසාධනය අඩුවන අවස්ථාවලදී ඇපකර මුදල් ලෙස සේවායෝජකයන් වෙත අරමුදල විසින් ගෙවා තිබුණු එකතුව රු. මිලියන 139.80 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට නැවත අරමුදලට අයකර ගත නොහැකිව තිබුණි.

**කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය**

කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සිදු කරන කොන්ත්‍රාත්කරුවන් 314 කගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 සිට 2023 වසර දක්වා අරමුදල වෙත රු.මිලියන 33,389 ක් ලබාදී තිබුණු අතර එයින් රු. මිලියන 32,782 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණි.

තවද, එම මුදලින් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර රු. මිලියන 220.62 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙයින් රු. මිලියන 88.10 ක් වසර 01 - 03 ක කාලයක සිටද, රු. මිලියන 3.43 ක් වසර 03- 05 ක කාලයක සිටද රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. එසේම, සංකීර්ණ සහ අවදානම් වැඩි ලෙස හඳුනාගෙන තිබුණු ඉහත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ අරමුදල විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම රඳවාගත් මුදලින් සම්පූර්ණයෙන් වැඩ නිමවා තිබූ ව්‍යාපෘතීන් 123 කට අදාල රු. මිලියන 60.55 ක මුදල කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර අරමුදල රඳවාගෙන ඇති අතර මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

**බිල්පත් වට්ටම් කර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම්**

2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් බිල්පත් වට්ටම් කර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ මුදලින් සේවායෝජකයින් විසින් බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා පියවා ගත නොහැකි වූ මුදල් ශේෂය රු. මිලියන 10.30 ක් විය. එයින් රු. මිලියන 10.21 ක් හෙවත් සියයට 98 ක් එක් පුද්ගලික කොන්ත්‍රාත් ආයතනයකින් වසර 04 කට අධික කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

**නිෂ්කාර්ය මුදල්**

අරමුදල 1999 දී ආරම්භ කර තිබූ අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 55 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබාදී තිබුණි. එහෙත් වාර්ෂික ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ අතර, 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 949.79 ක් වූ සමුච්චිත ඉපැයීම්වලින් රු. මිලියන 500 ක් “යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන” නම් සංචිත ගිණුමකට මාරු කර නිෂ්කාර්යව පවතින බවද නිරීක්ෂණය විය.

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

| | |
|---|---|
| **කාර්යභාරය** | පාලම්, මහා මාර්ග, ජලාශ, වාරිමාර්ග පද්ධති, ජල විදුලි බලාගාර, උමං හා ඇළ මාර්ග, ජල සැපයීම් ව්‍යාපෘති, ගොඩනැගිලි හා ඉදිකිරීම් වැනි ඉංජිනේරුමය ව්‍යාපෘතිවල නිරත වීම |
| **හිඟ ණය** | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සංස්ථාව විසින් සංස්ථාවේ දේපළ හා භාණ්ඩාගාර ඇප මත බැංකුවලින් ලබාගෙන තිබෙන රු.මිලියන 1,808 ක ණය මුදලක්ද, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.මිලියන 1,352.86 ක් හා එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම මත පනවා ඇති අධිභාරය රු.මිලියන 1,087.21 ක්ද 2023 වර්ෂය අවසානය දක්වාම නොගෙවා පැවතුණි. |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

| | |
|---|---|
| **කාර්යභාරයන්** | ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපාර කටයුතු, ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය, යාන්ත්‍රික හා විදුලි කටයුතු, ඉංජිනේරුමය කාර්යයන් සහ උපදේශන කටයුතු |
| **මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම** | 2020 මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. |
| **සේවක අර්ථ සාධක දායක මුදල් නොගෙවීම** | 2022 වර්ෂයේ පෙබරවාරි මස සිට 2023 ජුනි මස දක්වා සේව්‍ය සේවක දායක මුදල් ලෙස රු.මිලියන 73.52ක්ද ඒ මත අධිභාරය ලෙස රු.මිලියන 36.76 ක්ද 2006 වර්ෂයේ සිට 2015 වර්ෂයේ ජූලි මස දක්වා ජීවන වියදම් දීමනාව මත සේව්‍ය සේවක දායක මුදල් ලෙස රු.මිලියන 307.82 ක් ද ඒ මත අධිභාරය ලෙස රු.මිලියන 153.91 ක්ද 2023 දෙසැම්බර් 31 දින වන තෙක්ම සේවක අර්ථ සාධක අරමුදලට සංස්ථාව විසින් ගෙවා නොතිබුණි. |
| **හිඟ බදු** | සංස්ථාව විසින් 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු. මිලියන 1,381.67 ක් හා එම මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම මත පනවා ඇති අධිභාරය රු. මිලියන 883.37ක් වූ ව්‍යවස්ථාපිත ගෙවීම් සංස්ථාව විසින් 2023 දෙසැම්බර් 31 දින වන විටද ගෙවා නොතිබුණි. |
| **රාජ්‍ය බැංකුවලින් ලබා ගෙන තිබූ ණය** | සංස්ථාවේ දේපල හා භාණ්ඩාගාර ඇප මත රාජ්‍ය බැංකුවලින් ලබා ගෙන තිබූ ණය මුදල වූ රු. මිලියන 2,737ක් හා ඊට අදාළව ගෙවිය යුතු වූ පොලිය රු. මිලියන 1,891.49ක් ද 2023 වර්ෂය අවසානය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

# උසස් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සහශ්‍ර දෙකක් තරම් ඈතට දිව යන දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් වශයෙන් හඳුන්වා දී ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ස්ථාපිත කර ඇති විශ්ව විද්‍යාල 17 ක් හා උසස් අධ්‍යාපන ආයතන 19 ක් විසින් පහත කාර්ය කර්තව්‍ය ඉටුකළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**


ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්ව විද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම

විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් උසස් අධ්‍යාපන ආයතනවලට බෙදා වෙන්කරදීම සහ ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින් කරනු ලබන වියදම් පාලනය කිරීම.

උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්වයන් පවත්වා ගැනීම

උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම

ඉහත සඳහන් කාර්ය කර්තව්‍ය ඉටු කිරීම සඳහා උසස් අධ්‍යාපන අංශය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පිළිවෙලින් රු. මිලියන 26,061 ක හා රු.මිලියන 66,571 ක ප්‍රතිපාදන 2023 වර්ෂය තුල පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වන විට එයින් පිළිවෙලින් රු.මිලියන 21,853 හා රු.මිලියන 64,803 ක් පමණක් උපයෝජනය කර තිබුණි.




රූප සටහන් අංක 2.34 : ප්‍රතිපාදන උපයෝජනය

ඉහත ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ සිදුකල විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකර ගත යුතු මුදල් අයකරගෙන නොතිබීම**

විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන 22 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 551 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම මත 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,262ක් අයකර යුතුව තිබුණ ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**මුල් කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල ලබා ගැනීම**

කොමිෂන් සභාව විසින් මාසික කුලිය රු. මිලියන 0.35 කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337කින් යුත් ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ලක් රු. මිලියන 0.95ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 වර්ෂයේදී ලබාගෙන තිබුණි. නමුත් මුල් කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 මාර්තු දක්වා තවදුරටත් එම ගොඩනැගිල්ල වෙනුවෙන් එකතුව රු. මිලියන 12.6ක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි.

**විශ්වවිද්‍යාල සිසුන් සඳහා වූ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම**

2020/2021 හා 2021/2022 අධ්‍යයන වර්ෂ දෙක සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පිළිවෙලින් 1,857ක් හා 1,084ක් පැවති අතර එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම අධ්‍යයන වර්ෂ දෙකේදී පමණක් සිසුන් 2,941කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.

**පශ්චාත් උපාධි ප්‍රදානලාභීන් පාඨමාලා සම්පූර්ණ නොකිරීම**

2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පශ්චාත් උපාධි ප්‍රදාන ලබාගත් ප්‍රදානලාභීන් 22ක් 2023 දෙසැම්බර් 31 දින දක්වා පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණු අතර ඔවුන්ගෙන් 11 දෙනෙකු වෙත ලබා දී තිබූ ප්‍රදානයන්ගෙන් රු. මිලියන 17ක් 2023 දෙසැම්බර් 31 දක්වා අයකර ගත යුතුව පැවතුණි. එමෙන්ම, 2022 සහ 2023 වර්ෂවලදී කිසිදු අයදුම්කරුවෙකු වෙත පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදී නොතිබුණි.

## රුහුණු විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ඒකකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම, වෛද්‍ය හා හෙද වෘත්තිය වැඩි දියුණු කිරීම, පශ්චාත් වෛද්‍ය උපාධි අභ්‍යාසලාභීන් බඳවා ගැනීම වැඩි දියුණු කිරීම හා සායනික පුහුණුව පිළිබඳ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 ජුනි 24 දින රු.මිලියන 1,138.5 ක වටිනාකමකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජුනි 16 දින වැඩ නිම කළ යුතුව පැවතිය ද, 2023 වර්ෂය අවසන් වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 64ක් පමණ වී තිබුණි.

**වෛද්‍ය පීඨය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 1,092 ක වටිනාකමකට 2020 ජුනි 01 වන දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය වෙත පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2021 සැප්තැම්බර් 06 වැඩ නිම කිරීමට අපේක්ෂිතව තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට මහල් 10 ක් දක්වා කොන්ක්‍රීට් තට්ටු (Concret Slab) දැමීම සිදුකර 07 වැනි මහල දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරීමේ කටයුතු පමණක් සිදුකර තිබුණි.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල නව පාඨමාලා 04 ක් ආරම්භ කර එමඟින් වසරකට උපාධිධාරීන් 350 ක් පමණ බිහිකිරීම සඳහා රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් මස පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 1,501 කට ප්‍රදානය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2023 ජුනි 02 දින එහි වැඩ නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද, දින දීර්ඝ කිරීම් ලබාගෙන තිබුණු 2024 අප්‍රේල් 10 වන දින විටද ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ජල සැපයුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු**

විශ්වවිද්‍යාලයේ ජල සැපයුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 714ක වටිනාකමකට 2020 ජූලි 10 දින වන විට අවසන් කිරීමේ පදනමට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2018 වර්ෂයේදී පවරා දී තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 421ක් ගෙවා තිබුණු අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක්ව තිබියදී ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. පසුව එහි ඉතිරි කටයුතු නිම කිරීමට මුල් ඇස්තමේන්තුව ඉක්මවා

රු.මිලියන 785ක අතිරේක ඇස්තමේන්තුවක් 2023 ජූලි 20 දින මණ්ඩලය විසින් නැවත ලබා දී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබුණි.

**අග්‍රහාර රක්ෂණ දායකය විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවීම** 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් රු.මිලියන 49.8 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

## සබරගමුව විශ්වවිද්‍යාලය

**ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

සබරගමුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 63.01ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබියදී, කොන්ත්‍රාත්කරු කර්මාන්තය අතරමග අතහැර දමා තිබුණි. එහෙත් රු. මිලියන 72.46 ක් වූ (වැට් සහිත) අත්තිකාරම් බැඳුම්කර කල් ඉකුත් වීමට පෙර මුදල්කර නොගැනීම නිසා අත්තිකාරම් මුදලින් රු. මිලියන 28.81 ක් පියවා ගැනීමට නොහැකි වී තිබුණි.

## මොරටුව විශ්වවිද්‍යාලය

**ජීවවායුව නිෂ්පාදනය ව්‍යාපෘතිය**

විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය ආපනශාලාව තුළින් බැහැර කරන ආහාර අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ජීවවායුව නිෂ්පාදනය කර එම වායුව ආපනශාලාවල ආහාර පිසීම සඳහා භාවිතයට ගැනීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 1.4 ක් වැයකර තිබුණි. එහෙත්, එමගින් නිපදවන ජීවවායු ප්‍රමාණය ආපනශාලාවේ උඳුන් දැල්වීමට ප්‍රමාණවත් නොවන බැවින් වායු පද්ධතියේ ධාරිතාව වැඩි කිරීමට යෝජනා වී තිබුණ ද, 2024 අප්‍රේල් 30 දින වන විටත් පද්ධතියේ ධාරිතාව වැඩිදියුණු කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ඌන උපයෝජිත අරමුදල් පැවතීම**

විශ්වවිද්‍යාලයේ සංවර්ධන අරමුදල යටතේ ඒ ඒ දෙපාර්තමේන්තු හා පාඨමාලා සඳහා අරමුදල් ගිණුම් 91ක රු. මිලියන 265 ක ශේෂයක් උපයෝජනය නොකර පැවතුණි. ඉන් අරමුදල් 15ක පැවති එකතුව රු. මිලියන 5.60 ක් අවුරුදු 07 ක සිට උපයෝජනය කර නොතිබුණි.

**ශිෂ්‍යත්ව අරමුදල් 27 කින් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබීම.**

2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 සිට වර්ෂ 13 අතර කාලයක් තුළ එකතු වටිනාකම රු. මිලියන 19.39 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 27කින් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි.

**පර්යේෂණ ප්‍රදාන ලබාගෙන තිබුණ ද පර්යේෂණ නිමකර නොතිබීම**

2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මොරටුව විශ්වවිද්‍යාලය විසින් කථිකාචාර්යවරුන් 124 දෙනෙකු වෙත ප්‍රදානය කළ දිගුකාලින පර්යේෂණ ප්‍රදාන 155 කින් රු.මිලියන 83.58 ක් දරන ලද පර්යේෂණ 66ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි

**වෛද්‍ය සිසුන්ට මහාචාර්ය ඒකකවල සායනික පුහුණුවට අවශ්‍ය පහසුකම් සැපයීම**

විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අවසාන වසරේ ශිෂ්‍යයන් සඳහා අත්‍යවශ්‍ය මහාචාර්ය ඒකකයන්හි සායනික පුහුණුව 2025 ජනවාරි වන විට ආරම්භ වීමට නියමිත වුවත්, දැනට සායනික පුහුණුව ලබාදෙන නාගොඩ රෝහල තුළ එම පහසුකම් නොමැති බැවින් 2023 නොවැම්බර් 15 දින පැවැති පොදු ව්‍යාපාර කාරක සභාව සහ මීට පෙර ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම සායනික පුහුණුව සඳහා නෙවිල් ප්‍රනාන්දු රෝහල භාවිතා කිරීමට නිර්දේශ කර තිබුණ ද, එම නිර්දේශයන් 2024 අප්‍රේල් දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි. ඒ අනුව 2025 ජනවාරි වන විට නෙවිල් ප්‍රනාන්දු රෝහල මෙම මහාචාර්ය ඒකක වලින් යුත් රජයේ රෝහලක් ලෙසට පවත්වාගෙන යාමට අපොහොසත් වුවහොත් වෛද්‍ය පීඨයේ අවසාන වසරේ සිසුන්ට නියමිත කාල වකවානුව තුළදී වෛද්‍ය උපාධිය ලබා ගැනීමේ දැඩි අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

**ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුකූලව නිමකර නොතිබීම**

පිළිවෙලින් 2016 හා 2021 වර්ෂයන්හි පළමු අදියරේ වැඩ නිමකර තිබුණු ඉංජිනේරු පීඨය සඳහා ඉදිකරන ලද බහු කාර්යය ගොඩනැගිල්ලේ හා වාස්තු විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ වහලවල්වල තහඩු එම ගොඩනැගිලි භාවිතයට ගැනීමටත් ප්‍රථම දිරාගොස් ජලය කාන්දු වීම හේතුවෙන් ඒවා ඉවත් කර නැවත තහඩු ඇතිරීම සඳහා රු.මිලියන 14ක අමතර පිරිවැයක් දරා තිබුණි. මෙම මුදල උපදේශක සේවා සැපයූ ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ විදේශ සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීමෙන් පසුව 2022 අගෝස්තු 30 දිනට නිමකළ යුතුව තිබුණි. එහෙත්, එදින වන විට භෞතික ප්‍රගතිය සියයට 75 ක් පමණ වූ අතර ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 148 ක් වැය කර තිබියදී 2022 මැයි මාසයේ සිට ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි.

**බාහිර විභාග ඒකකය සඳහා පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ඒකකය සඳහා යෝජිත පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු. මිලියන 14 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී තිබියදී, කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. පසුව පාලක සභාව විසින් ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට තීරණය කර තිබීම හා බැඳුම්කරයෙහි කාලය ඉකුත් වී තිබීම හේතුවෙන් අත්තිකාරම් මුදලින් රු.මිලියන 2.78ක් ආවරණය කර ගැනීමට නොහැකිව තිබුණි.

## කැලණිය විශ්වවිද්‍යාලය

**වාණිජ හා කළමනාකරණ පීඨයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨයට මහල් 10 කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා උපදේශන සේවා සපයන ආයතනය වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී එකතුව රු.මිලියන 15 ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණ ද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දක්වාම ආරම්භ කර නොතිබුණි.

**නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම**

2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු මහල් 4 කින් යුතු නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු විශ්වවිද්‍යාලය හා කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර හේතු මත අවසන් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) ගේ 2021 ජූනි 21 දිනැති ලිපිය මගින් උපදෙස් දී තිබුණි. ඒ අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අතරමග අවසන් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 4.03 ක් අමතරව ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම, 2023 වර්ෂය අවසන් වන විටත් සිසුන් සඳහා අවශ්‍ය නේවාසිකාගාර

ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, වැයකර තිබුණු රු. මිලියන 65.46ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

## සබරගමුව විශ්වවිද්‍යාලය

**ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුකූලව නිමකර නොතිබීම**

විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ කර්මාන්තයේදී Powder Coated Aluminum හා Cladding භාවිතයෙන් නිමකළ යුතු දොරවල් 370ක් Plywood වලින් යොදා තිබුණු අතර දොරවල් 316ක Door Closers සවිකර නොතිබුණි. එසේ තිබියදී, මිල යෝජනාව තුළ නිවාස ඒකකයක් සඳහා එකවර මුදලක් (Lump sum) ලෙස අනුමත කර තිබුණු සම්පූර්ණ වටිනාකම ගෙවා තිබීමෙන් රු. මිලියන 13.94 ක අලාභයක් සිදු වී තිබුණි. එමෙන්ම, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අවසන් බිල්පත අනුව වැඩ විෂයයන් 03ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකළ හා ඔහු විසින් ඉල්ලුම් නොකළ රු. මිලියන 2.60 ක් ද වැඩ ඉංජිනේරුගේ සහතිකය මත ගෙවීම් කර තිබුණි.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව කටයුතු කර තිබීම**

ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2021 වර්ෂය තුළ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවී පූර්ව අත්දැකීම් රහිත සැපයුම්කරුවෙකු තෝරාගෙන සමස්ත ප්‍රසම්පාදනයෙන් සියයට 76ක් හෙවත් රු.මිලියන 20.20 ක් වූ වටිනාකමකට පොත් වර්ග 118කට අයත් ඒකක 421ක් මිල දී ගෙන තිබුණි. ඉන් රු.මිලියන 7.59ක් වටිනා පොත් වර්ග 33කට අයත් ඒකක 114ක් පෙර පරිහරණය කළ පොත් (used book) විය. එමෙන්ම, රු.මිලියන 6.92ක් වැයකර විෂයය නිර්දේශවලට අදාළ නොවූ පොත් වර්ග 69කින් ඒකක 179ක් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, අන්තර්ජාතික වෙළඳපොළ තුළ පැරණි හා නව පොත් අලෙවිවන අවම මිල ගණන් වලට සාපේක්ෂව පොත් වර්ග 63කින් ඒකක 227ක් වැඩි මිලකට මිලදී ගැනීම නිසා රු.මිලියන 12.11ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

## කොළඹ විශ්වවිද්‍යාලය

**පර්යේෂණ අවසන් කර නොතිබීම හා අවලංගු කිරීම**

කොළඹ විශ්වවිද්‍යාලය අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත 2018 සිට 2020 දක්වා වර්ෂ තුළ ලබා දී තිබුණු රු. මිලියන 8.19 ක් වූ පර්යේෂණ 13 ක් අවසන් කිරීමට නියමිත දින ඉක්මවා අවුරුදු 1 ½ සිට අවුරුදු 4 ½ දක්වා කාලයක් ගත කර තිබුණ ද ඒවා අවසන් කර

නොතිබුණි. තවද 2018, 2019 හා 2020 වර්ෂවලදී වටිනාකම රු. මිලියන 8.82 ක් වූ පර්යේෂණ 17 ක් විවිධ හේතු මත අතහැර දැමීම හා අවලංගු කිරීම් සිදුකර තිබුණි.

**විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීම**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා කොළඹ විශ්වවිද්‍යාලය විසින් සෘජු විදේශ ප්‍රදාන පිළිවෙලින් රු.මිලියන 144 ක් හා රු.මිලියන 340ක් 2023 වර්ෂය තුළදී ලබා ගෙන තිබුණි.

**අනුමැතිය නොලත් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම සඳහා ගෙවීම් කිරීම**

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති කිසිදු දීමනාවක්, සුභසාධන වැඩසටහන්, සංවර්ධන සහායන් හෝ සහනාධාර ලබාදීම් නතර කරන ලෙස අයවැය චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී තිබුණ ද, ඊට පටහැනිව 2022 මැයි මාසයේ සිට 2023 සැප්තැම්බර් දක්වා අභ්‍යන්තර රක්ෂණ ක්‍රමයක් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් රු. මිලියන 34.8 ක් ද, කොළඹ විශ්වවිද්‍යාලය විසින් 2023 වර්ෂය තුළ රු.මිලියන 37 ක් ද ගෙවා තිබුණි.

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් නොකිරීම**

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සියලු දෙනා පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**විශ්වවිද්‍යාලය අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය**

2020 දෙසැම්බර් 31 දින විශ්වවිද්‍යාලය අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වටිනාකම රු.මිලියන 17.5 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට පද්ධතිය ස්ථාපනය කර භාරදිය යුතු වුවත්, 2024 අප්‍රේල් 01 දින දක්වාම නිමකර විශ්වවිද්‍යාලය වෙත භාරදී නොතිබුණි.

**අතරමඟ නතරකර තිබුණු ඉදිකිරීම්**

මිහින්තලය පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 52.7 ක වටිනාකමකට කොන්ත්‍රාත් ගිවිසුමකට 2016 දෙසැම්බර් 23 වන දින එළඹ තිබුණු අතර ඒ වෙනුවෙන් සචලීකරණ අත්තිකාරම් ලෙස රු.මිලියන 15.86 ක්ද ගෙවීම් කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම අතරමඟ නතරකර තිබුණු අතර ඉදිකිරීම් නතර කරන අවස්ථාව වන විට කළ වැඩ

වටිනාකම රු.මිලියන 10.62 ක්ව පැවතුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 දින ගිවිසුම අවසන් කර තිබුණු අතර එදිනට රු.මිලියන 15.76 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතු විය. කොන්ත්‍රාත්තුවට අදාල රු. මිලියන 3.95 ක් වූ අත්තිකාරම් බැඳුම්කරය හා රු.මිලියන 10.54 ක් වූ කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට හැකියාව පැවතියදීත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. වැඩියෙන් ගෙවන ලද මුදල් අයකර ගෙන පාඩුව අවම කර ගැනීමට විගණිත දින වූ 2024 අප්‍රේල් 01 වන දින දක්වාම වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**බැඳුම්කර නැවත අගය කිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 12 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 03/2022 හා 2022 ජූනි 22 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ ලිපි අංක 02/2022 ප්‍රකාරව බැඳුම්කර නැවත අගය කිරීම කළ නොහැකි විය. එකී විධානයන්ට පටහැනිව බැඳුම්කර කඩ කර ඇති කථිකාචාර්යවරු දෙදෙනෙකු සම්බන්ධයෙන් 2023 ජූනි 26 දින පැවති 272 පාලක සභා 05.10.27 තීරණය ප්‍රකාරව බැඳුම්කර නැවත අගය කළ යුතු බව තීරණය කර තිබුණි. ඒ අනුව 2023 ජනවාරි 01 දිනට ඉහත සඳහන් කථිකාචාර්යවරු දෙදෙනාගෙන් ලැබිය යුතු වූ රු.මිලියන 15.15 ක බැඳුම්කර කඩකිරීම් වටිනාකම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැර තිබුණි.

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

**නිල නිවාසලාභීන්ගේ ජල හා විදුලි ගාස්තු විශ්වවිද්‍යාල අරමුදලින් වැය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාසලාභීන් විසින් ජලය හා විදුලි වියදම් දැරිය යුතු වුවත්, 2023 වර්ෂය තුළදී නිල නිවාසවල ජලය හා විදුලිය වෙනුවෙන් එකතුව රු.මිලියන 15.48 ක් විශ්වවිද්‍යාල අරමුදලින් වැය කර තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමෙන් තොරව විදේශීය පැවිදි සිසුන් 25 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසීමට හැකි පරිදි ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ 2020 ජනවාරි 14 දින නිම කර තිබුණද, උපාධි පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට නිසි වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් රු.මිලියන 84.25 වටිනාකමැති අදාළ ගොඩනැඟිලි සහ සවිකිරීම් වසර 04 කට වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි.

**සම්පත් කළමනාකරණය තොරතුරු තාක්ෂණ පද්ධතිය**

වටිනාකම රු.මිලියන 8 ක් වූ සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning)

ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවද, විගණිත දින වූ 2024 අප්‍රේල් 01 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර එදිනට රු.මිලියන 4 ක් වැය කර තිබුණි.

## නැගෙනහිර විශ්වවිද්‍යාලය

**සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ඉඩම් අත්පත් කරගැනීම**

විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2009 වසරේ සිට ආරම්භ කර තිබූ අතර 2016 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අදාල ඉඩම් සඳහා තක්සේරු වාර්තාව ලබාගෙන තිබුණි. 2017 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවීම කිරීම සඳහා රු.මිලියන 65.8 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මුදල් ගෙවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දින දක්වා ඉහත ඉඩම් අත්පත් කර ගෙන නොතිබුණි.

# අධ්‍යාපනය



ඕනෑම රටක අනාගත අභිවෘද්ධිය තීරණය කරන ප්‍රධාන සාධකය එරටේ අධ්‍යාපනය සඳහා සිදුකරන ආයෝජනයයි. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය බොහෝ දියුණු රටවල් අභිබවා ගොස් තිබුණ ද, සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවන් තවදුරටත් අනුගමනය කිරීම නිසා ලෝක ශ්‍රම ඉල්ලුමට සරිලන තාක්ෂණික දැනුමක් සහිත ශ්‍රමිකයින් දැනට පවතින අධ්‍යාපන ක්‍රමය තුලින් බිහිකිරීමට නොහැකි වී තිබේ. එම නිසා නවීන අධ්‍යාපන ක්‍රමවේදයන් තුලින් දැනුමෙන් හා තාක්ෂණික හැකියාවෙන් පිරිපුන් සමාජයක් බිහිකිරිම අධ්‍යාපන අංශයේ වගකීමයි. එම වගකිම ඉටුකිරීම අරමුණ කරගත් අධ්‍යාපන අංශය ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

**කාර්යභාරයන්**

පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.

පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබාදීම.

සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම, විෂය සමගාමී සහ බාහිර ක්‍රියාකාරකම් පාසැල් තුළ ප්‍රචලිත කිරීම.

ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම හා සියලු පාසැල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියළු භෞතික පහසුකම් දියුණු කිරීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටු වන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු කිරීම.

පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය, පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය


ගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් වන ජනාධිපති කාර්යසාධක බලකාය හා විශේෂ කමිටුවල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම.

තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.

ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම, ගුරුවරුන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය.

මෙම කාර්යයභාරයන් ඉටුකිරීම සඳහා අමාත්‍යාංශයේ අධ්‍යාපන අංශය යටතේ දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 02 ක් ක්‍රියාත්මකව පැවතුණි. එම ආයතන සඳහා ප්‍රතිපාදිත මුදල් හා වැයකිරීම් පිළිබඳ විස්තර පහත පරිදි විය.




| | | | | | |
|---|---|---|---|---|---|
| **ප්‍රතිපාදනය** | **154,951** | **10,813** | **173** | **78** | **166,015** |
| උපයෝජනය | 123,190 | 6,574 | 90 | 67 | 129,921 |
| ඉතිරිය | 31,761 | 4,239 | 83 | 11 | 36,094 |

රූප සටහන 2.30.: ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2023 මුල්‍ය ප්‍රකාශන

**ජාතික පාසල්වල පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛ ප්‍රතිපාදනවලට සිදුකල යුතු අත්‍යවශ්‍ය වෙනස්කම්**

ජනප්‍රිය පාසල් සඳහා 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදි පදිංචිය තහවුරු කිරීම වෙනුවෙන් බදු ඔප්පු ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන්ගේ ප්‍රමාණයේ ඉහළ යාම නිසාත් එම අයදුම්කරුවන් විසින් පාසලට ආසන්නතාව මත ලබාදෙන ලකුණු 50 ආරක්ෂා කරගැනීම සඳහා පාසලට ආසන්නතම ලිපිනයක බදු ගිවිසුම්ගත වීම සිදුකර තිබීම නිසාත් ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ට වඩා ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බදු ඔප්පු හිමියන්ට අවස්ථාව ලැබී තිබුණි. මාස 06 ට අඩුවෙන් ලියාපදිංචි කරන ලද බදු ඔප්පු සඳහා වුවද 0.5 ක් ලකුණු ප්‍රමාණයක් ලබාගෙන, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා වූ ලකුණු 50 ම ලබා ගනිමින් පාසලට ඇතුළත් වූ අවස්ථා විශාල සංඛ්‍යාවක් පැවතුණි. මේ නිසා දීර්ඝ කාලයක සිට එම ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සහිත දරුවන්ට පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

අදාළ පාසලේ ආදී ශිෂ්‍ය / ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්කරු විසින් පාසල් කාලය තුළ ලබාගත් අධ්‍යාපනික ජයග්‍රහණ සඳහා උපරිම ලකුණු 25 ක්ද, විෂය සමගාමී කටයුතු වලින් ලබාගත් ජයග්‍රහණ වෙනුවෙන් උපරිම ලකුණු 25 ක්ද

ආදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබාදුන් විවිධ ආකාරයේ සහයෝග සඳහා උපරිම ලකුණු 24 ක්ද වශයෙන් ලකුණු 74 ක් ලබා දිය යුතුය. එම ලකුණු 74 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඒකඟතාවය පරිදි අනු කොටස්වලට බෙදීමට චක්‍රලේඛය මගින් අවස්ථාව ලබා දී තිබුණු අතර මෙහිදී අදාළ කරුණු සම්බන්ධයෙන් පාසල් විසින් විවිධාකාර වෙනස්කම් සහිත පදනම් යොදාගෙන තිබුණු අතර මෙම ගණය යටතේ මුළු ලකුණුවලින් සියයට 74 ක්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඒකඟතාවය මත ලබාදීම තුළින් විවිධ අක්‍රමිකතා සිදුව තිබුණි.

**වංචනික ස්වරූපයේ ගනුදෙනු** 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත ප්‍රකාරව රජයට පවරාගත් පාසල්වල දේපළ අධ්‍යාපන අමාත්‍යාංශය සතු වන අතර අමාත්‍යාංශයට අයත් දේපළ වෙනත් පුද්ගලයෙකුට බදුදීම අනුමත කිරීමට බස්නාහිර පළාත් සභාවට නෛතික හැකියාවක් නොමැති වේ. එසේවුවද, බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පර්චස් 40 කින් යුත් කො/පිංවත්ත උපනන්ද පාසලේ භූමිය හා ගොඩනැගිලි 2008 නොවැම්බර් 01 දින සිට වසර දෙකක කාලයක් සඳහා පෞරාණික රූකඩ කළා ආයතනයක් පවත්වාගෙන යාමට පුද්ගලයෙකු වෙත බදුදීමට කටයුතු කර තිබුණු අතර බදු කාලය අවසන් වී තිබුණද දේපල නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. පාසලක් වැසීම පාසල් ව්‍යුහ කමිටුවේ අනුමැතිය අනුව සිදුකළ යුතු වුවත් මෙම පාසල වසා දැමීම සම්බන්ධයෙන් පළාත් පාසල් ව්‍යුහ කමිටු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**වත්කම් කළමනාකරණ දුර්වලතා**

උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පනත අනුව ගැසට් කරන ලද පාසල් හා ගුරු විද්‍යාල සම්බන්ධයෙන්, ඒවායේ නම, පිහිටීම, ගොඩනැගිලි ප්‍රමාණය, ඉඩමේ ප්‍රමාණය, හා විශේෂයෙන් පවරා ගත්තේ කාගෙන්ද ආදී විස්තර සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ පළාත් කාර්යාලවල දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

මාතර රාහුල විද්‍යාලයේ දැනට හා මතුවට ඉගෙනුම ලබන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පිහිටුවන ලද අබේගුණසේකර භාරයේ ගිණුම අක්‍රිය තත්ත්වයේ පැවතිය ද රු.මිලියන 4.94 ක් ගිණුමට බැර කර තිබුණු අතර එම මුදල් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා නොකර වසර 06 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

අමාත්‍යාංශය පරිශ්‍රය තුළ ධාරිතාවය ආසන 25 සිට 320 දක්වා වූ ශ්‍රවණාගාර හා කමිටු රැස්වීම් ශාලා 06ක් තිබියදීත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වැඩමුළුවලින් විශාල ප්‍රමාණයක්

අමාත්‍යාංශ පරිශ්‍රයෙන් බාහිර ආයතනවල දේශන ශාලා භාවිතයෙන් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන10.59 ක් ගෙවා තිබුණි.

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

2016 වසරේ සිට 2020 වසර දක්වා ක්‍රියාත්මක වූ ළඟම පාසල හොඳම පාසල ජාතික වැඩසටහන රු. මිලියන 5,439.91ක බැරකම් ප්‍රමාණයක් තිබියදී 2020 දෙසැම්බර් 31 නිමාවකින් තොරව අවසන් කර තිබුණි. එසේම ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන ආරම්භ කර එයද පාසල් 23 ක් පමණක් ජාතික පාසල් බවට පත්කර අතරමැද නවතා දමා තිබුණි.

ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය එකඟතාවය මත අවසන් කල රු. මිලියන 367 ක් වටිනා ව්‍යාපෘති 45 ක්ද, ප්‍රතිපාදන සීමාවීම මත කොටසක් ඉදිකල රු. මිලියන 352 ක් වටිනා ව්‍යාපෘති 32 ක්ද මධ්‍යම පළාත තුල 2023 වර්ෂය අවසන් වන විට පැවතුණි.

ද්විතීයික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ පාසල් තුළ තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව අතර මග වැඩ නවතා දමා තිබුණු විද්‍යාගාර තුනක් වූ අතර ඒ සඳහා රු. මිලියන 24.69ක් වැය කර තිබුණි.

**නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

2007 දෙසැම්බර් 13 දිනැති අංක 20/2007 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව වඩාත් පහසු පාසල් වර්ගීකරණයට අයත් පාසලක ගුරුවරයෙකුගේ සේවා කාලය උපරිම අවුරුදු 6 ක් ලෙස නියම කර තිබුණද පරීක්ෂා කරන ලද වඩාත් පහසු පාසල් 04ක වසර 10 ට වැඩි සේවා කාලයක් ඇති ගුරුභවතුන් 113 ක් සේවයේ නිරත වී තිබුණි.

මහජන දිනය තුළ රැස්වීම්, වැඩමුළු, උත්සව ආදිය සංවිධානය නොකළ යුතු වුවද නියැදි පරීක්ෂාවේදී එම දිනයන් තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැඩමුළු 102 ක් පවත්වා තිබුණි.

විෂයානුබද්ධ රාජකාරියට අයත් විවිධ අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරිම, චක්‍රලේඛ සකස් කිරීම, ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම, වැනි දේශන ස්වරූපයේ නොවන කාර්යයන් වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් සඳහා 2023 වර්ෂයේදී ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 අප්‍රේල් 27 දිනැති ලිපියේ උපදෙස්වලට පටහැනිව සම්පත් දායක දීමනා ලෙස රු. මිලියන 7.42 ක් ගෙවා තිබුණි.

**මාර්ගෝපදේශ යාවත්කාලීන නොකිරීම**

වර්තමාන ව්‍යූහ කමිටු කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී 1981 වර්ෂයේදී සකස් කරන ලද උපදෙස් සංග්‍රහයේ සඳහන් කරුණු අනුව කටයුතු කරන අතර මෙය වර්තමානයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීමක් සිදුකර නොතිබුණු අතරම මෙම උපදෙස් සංග්‍රහයට නීත්‍යානුකූල ආකාරයෙන් අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය මෙම මාර්ගෝපදේශය අනුව කටයුතු කරමින් පැවතුණි.

**ව්‍යූහ කමිටු අනුමැතියකින් තොරව අතරමැද නව පන්ති ආරම්භ කිරීම**

2023 අප්‍රේල් 25 දිනැති අංක 17/2023 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ (ඇ) ඡේදයට අනුව ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යූහ කමිටුවේද පළාත් පාසලක් නම් පළාත් ව්‍යූහ කමිටුවේද අනුමැතියක් නොමැතිව පන්ති/සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නොකළ යුතු වුවද ව්‍යූහ කමිටු අනුමැතියකින් තොරව අතරමැද පන්ති සඳහා නව පන්ති ආරම්භ කර තිබුණි.

**අතර මැද වෙනත් නව පන්ති ආරම්භ කර තිබීමෙන් ශිෂ්‍යත්ව කඩඉම සමත් ළමුන්ට තිබුණු අවස්ථා අහිමි වීම**

6 වසර පන්තිය සඳහා ශිෂ්‍යත්ව කඩ ඉමෙන් ළමුන් ඇතුලත් කිරීමෙන් පසු 7 වසර පන්තිය සඳහා සැලකිය යුතු ලෙස නවක සිසුන් බඳවාගැනීම ඇතැම් පාසල්වලින් සිදුකර තිබුණු අතර මෙය ශිෂ්‍යත්ව කඩඉම සමත් ළමුන් එම පාසල්වලට ඇතුලත් කිරීමට තිබුණු අවස්ථාව අහිමි කිරීමක් වී තිබුණි. ඒ අනුව පරීක්ෂාවට ලක් කළ පාසල් 70 හි 2016 වර්ෂයේ 7 ශ්‍රේණියේ නව ඇතුළත් කිරීම් 470 ක්ද 2017 වර්ෂයේ 503 ක්ද 2018 වර්ෂයේ 718 ක්ද 2019 වර්ෂයේ 829 ක්ද 2020 වර්ෂයේ 382 ක්ද 2021 වර්ෂයේ 707 ක්ද 2022 වර්ෂයේ 889 ක්ද වශයෙන් නව ඇතුළත් කිරීම් සිදුකර තිබුණි.

2021 මැයි 28 දිනැති 13/2021 චක්‍රලේඛය හා 22/1960/607/079 අංක දරණ 2022 ජනවාරි 02 දින නිකුත් කල අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1 වසර සිට 5 වසර දක්වා පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40ක්ද 6 වසර සිට 11 වසර දක්වා පන්තියක ශිෂ්‍ය සංඛ්‍යා 45 ක්ද ලෙස දක්වා තිබෙන අතර මේ තුලින් එක් පන්තියකට ශිෂ්‍යත්වයෙන් තවත් ළමුන් 5 දෙනෙකු ඇතුලත් කර ගැනීමට හැකියාවක් පැවතුනද 5 ශ්‍රේණිය වන විට 40 සීමාව ඉක්මවා ළමුන් පන්තිවලට බඳවාගැනීම සිදුකර තිබුණි. පරීක්ෂාවට භාජනය කල පාසල් 70න් පාසල් 25ක ළමුන් 548 දෙනෙකු මෙම සීමාව ඉක්මවා ඇතුලත් කිරීම සිදු කර තිබුණු අතර මේ හේතුවෙන් 5 වසරේදී පන්තියක උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40, 6 වසර වන විට 45 දක්වා වැඩි කලද ඒ වන විටත් එම

පන්තිවල පුරප්පාඩු අඩුවෙන් පවතින බැවින් එම පන්ති වලට ශිෂ්‍යත්ව කඩඉමෙන් ළමුන් වැඩි පිරිසකට ඇතුල්වීමට ඇති හැකියාව අහිමි වී තිබුණි.

**ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් නියාමනය සඳහා වැඩ පිළිවෙලක් ස්ථාපිත නොකිරීම**

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාර්ෂික කාර්යසාධන වාර්තා අනුව ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා මැදිහත් වීමට පවත්නා නීතිමය බාධක හඳුනාගෙන පවත්නා රෙගුලාසි සංශෝධනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව 2019 වර්ෂය වන විට රෙගුලාසි සකස් කිරිමට හා රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා නීති සැකසීමට අපේක්ෂා කර තිබුණි. මේ පිළිබඳව ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය මැයෙන් සිදුකරන ලද විශේෂ කාර්යසාධන වාර්තාවේද එහි අවශ්‍යතාවය දක්වා තිබුණු නමුත් 2019 වර්ෂයෙන් පසු මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**විශේෂ අවශ්‍යයතා ඇති ළමුන් වෙනුවෙන් ඉදිකල විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය උපයෝජනයට නොගැනීම**

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් ලබාදීම අරමුණු කරගෙන වෙනිවැල්කොළ විශේෂ අධ්‍යාපන සම්පත් හා තොරතුරු මධ්‍යස්ථානයක් රු.මිලියන 247 ක් වැයකර ඉදිකර තිබුණි. එම මධ්‍යස්ථානය 2019 සැප්තැම්බර් 09 දින විවෘත කර තිබුණද ළමුන්ගේ අවශ්‍යතාවය පරිදි හා නියමිත කොන්ත්‍රාත් ප්‍රදානය අනුව ඉදිකර නොතිබීම හේතුවෙන් මේ වන විටත් එම තත්ත්වයන් නිරාකරණය කර නොගැනීම නිසා වසර 04 ක් ගත වුව ද මධ්‍යස්ථානය පිහිටු වීමේ අරමුණට අනුව ළමුන්ගේ උපයෝජනය සඳහා යොදවා නොතිබුණි.

**පිරිවෙන් අංශයේ කාර්යසාධනය**

1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතට නව සංශෝධන එක් කරමින් 2018 වර්ෂයේ දී සකස් කර තිබූ පනත් සංශෝධන කෙටුම්පත නීතිපතිවරයාගේ අනුමැතිය වෙත යවා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කර නොතිබුණි.

2013 වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව ජාතික පිරිවෙන් අධ්‍යාපන සැලැස්මක් සකස් කිරිම පිළිබඳ සඳහන් වුවද 2023 වර්ෂය වන විටත් ජාතික පිරිවෙන් අධ්‍යාපන සැලැස්මක් සකස් කිරිමට අපොහොසත් වී තිබුණි.

2011 වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව පිරිවෙන් 45 ක ත්‍රිභාෂා අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ බව සඳහන් වුවද වර්තමානය වන විට පිරිවෙන් 822 ක් ක්‍රියාත්මක වුවද ත්‍රිභාෂා අධ්‍යාපන වැඩසටහන කිසිදු පිරිවෙනක ක්‍රියාත්මක කර නොතිබුණි.

**ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වීම**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ පිහිටුවා 2020 සිට 2022 දක්වා වූ වර්ෂ 03 තුළදී රු. මිලියන 5,219 ක් වැයකර තිබුණද සැලසුම් කල පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. 2023 වර්ෂය සඳහා රු. මිලියන 200 ක ප්‍රතිපාදන ඒ සඳහා වෙන් කර තිබුණු නමුත් 2023 මාර්තු මාසයේදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකිරීමට අපොහොසත්ව තිබුණු අතර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම පමණක් 2023 වර්ෂය තුළදී සිදුකර තිබුණි. ඒ අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාද වී තිබුණි.

**ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය**

පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් මොඩියුල 09 ක් යටතේ ක්‍රියාත්මක පරිගණක පද්ධතියක් (NEMIS) රු.මිලියන 61 ක් පමණ වැයකර පිළියෙල කර තිබුණද දත්ත පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා 2023 වර්ෂය තුළදීත් සිදුකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

**ද්විතීක අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහනේ කාර්යසාධනය**

ආසියානු සංවර්ධන බැංකුව සමග එළැඹි ණය ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය ලබාගත් ණය මුදල් ප්‍රමාණය මත වෙනස් වන පොළී අනුපාත යටතේ පොළී මුදලක් හා නිදහස් කර නොගත් ණය මුදල් ප්‍රමාණය මත සියයට 0.15 ක බැඳීම් ගාස්තු ගෙවිය යුතු වේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිදහස් කරගත් එ.ජ.ඩොලර් මිලියන 216 ක් මත රු. මිලියන 3,592 ක පොළී මුදලක් හා නිදහස් කර නොගත් එ.ජ.ඩොලර් මිලියන 184 ක් මත රු. මිලියන 103 ක බැඳීම් ගාස්තු ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් විසර්ජන සබැදි දර්ශක ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම මත බැදීම් ගාස්තු ගෙවීමට සිදු වී තිබුණු අතර වැඩසටහන දිගින් දිගටම අසාර්ථක වුවහොත් නිශ්කාර්ය වියදම් තවදුරටත් ඇතිවන අතර ගෙවන ලද බැදීම් ගාස්තුවද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

**නඩත්තු කටයුතු සඳහා වූ**

**ගිවිසුම්වලට නොඑළැඹීම**

2018 වර්ෂයේදී රු. මිලියන 28.5 ක් වැය කර කිලෝවොට් 250 ක සූර්ය බලශක්ති පද්ධතියක් දෙපාර්තමේන්තුවේ සවිකර තිබුණි. සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය කළ දින සිට වසර හතක කාලයක් අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සැපයිය යුතු බවත් රඳවාගත් මුදල් සියයට 10ක් නිදහස් කිරීමට පෙර සැපයුම්කරු විසින් නඩත්තු සේවා සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළ යුතු බවත් ලංසු ලියවිලිවල දක්වා තිබුණි. එහෙත් විභාග දෙපාර්තමේන්තුව විසින් 2018 ජූලි 12 දින වන විට මෙම ව්‍යාපෘතියට අදාළ සියලුම මුදල් ගෙවා අවසන් කර තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දක්වාම සේවා සපයන ආයතනය සමඟ අදාළ ගිවිසුමට එළැඹ නොතිබුණි. මේ හේතුවෙන් සූර්ය බලශක්ති පද්ධතියේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කර නොතිබුණි.

දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන්ට අදාල සේවා ගිවිසුම 2021 නොවැම්බර් 30 වන දින අවසන් වී තිබුණ ද වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට නොහැකි වීම නිසා වෙබ් අඩවිය හා විද්‍යුත් සේවාවන් අනාරක්ෂිත වී පැවතුණි.

**1990 වර්ෂයට පෙර වර්ෂවල විභාග ප්‍රතිඵල ලේඛන පරිගණකගත කිරීමේ ප්‍රමාදය**

1990 වර්ෂයට පෙර වර්ෂවල වූ විභාග ප්‍රතිඵල ලේඛන මහජනතාව වෙත අවශ්‍ය අවස්ථාවන්හී දී නිකුත් කිරීමට පහසු වන ආකාරයට එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (scan) කර තබාගත හැකි ආකාරයේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් ඒ තුළින් අපේක්ෂා කරන ලද පැරණි ප්‍රතිඵල ලේඛන සංරක්ෂණය කිරීම, මුල් පිටපත පරිලෝකනය කිරීම, ප්‍රතිඵල ලේඛනයේ ඇතුළත් තොරතුරු පදනම් කරගනිමින් සහතික පත්‍ර / සනාථ ලිපි මුද්‍රිත පිටපත් ලෙස ලබාගැනීම, විභාග අංකය හා වර්ෂය ඇතුලත් කර විභාග ප්‍රතිඵල නිවැරදිව ලබාගැනීමට හැකිවන සේ දත්ත පද්ධතියක් සකස් කිරීම, පරිගණක තොරතුරු පද්ධතියක් තුල විභාග සහතිකපත්‍රයේ අඩංගු සියලුම විස්තර ඇතුලත් කිරීම සහ එම තොරතුරු දත්ත පද්ධතියක් ලෙස පවත්වාගෙන යාම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**මිළදී ගත් දින සිට භාවිතා නොකල වත්කම්**

ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා 2018 වර්ෂයේදී රු. මිලියන 8 ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස මිලදීගෙන තිබුණ ද දැනට භාවිතා කරන රහස්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ එම කොටස නොගැලපීම හේතුවෙන් මේ දක්වා එම යන්ත්‍ර කොටස නිශ්කාර්යව පැවතුණි.

2005 වර්ෂයේදී මිලදී ගනු ලැබූ Stitch Master Gathering and wire Stitching යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී කොළ ඉවතට හැලීම

හේතුවෙන් මිලදීගත් මුල් අවස්ථාවේ සිට 2023 වර්ෂය අවසානය දක්වාම භාවිතයෙන් ඉවත් කර තිබුණි.

**බ්‍රේල් පෙළපොත් කටයුතුවල ප්‍රමාද වීම්**

2023 වර්ෂය වෙනුවෙන් විශේෂ පාසල්/කලාප 10 කට ලබාදිය යුතු බ්‍රේල් පෙළපොත් 5,698 න් 2023 අගෝස්තු මාසය වන විටත් ලබාදීමට කටයුතු කර හැකිව තිබුණේ පොත් 1,659 ක් පමණක් වී තිබුණි.

**බඳවාගැනීමේ පටිපාටියට අනුකූල නොවන බඳවාගැනීම්**

ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නොතිබුණු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දරණ නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දුන් අඩුපාඩු සියල්ල ආයතනයේ කළමණාකරණය විසින් පිළිගෙන වර්ෂයක කාලයක් ගත වී තිබුණද සුදුසුකම් නොමැති තනතුරු දරන නිලධාරීන් දෙදෙනාට තවදුරටත් අදාල වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි.

# නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන

දැනුමෙන්, වෘත්තීය නිපුණතාවයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මගින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම වර්තමානයේ දැඩි අවශ්‍යතාවයකි. ඒ සඳහා වර්තමාන හා අනාගත ශ්‍රම බලකාය වඩාත් සංකීර්ණ ආර්ථික රටාවකට ගැළපෙන පරිදි නවීකරණය වීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා කුසලතා හා දැනුම අතර පරතරය සම්පූර්ණ කිරීමට ආර්ථිකයෙහි පවතින උසස් හා තෘතීයික අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවිය යුතුව ඇත. එම අපේක්ෂාව ඉටු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 20 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.


| | |
|---|---|
| **කාර්යභාරය** | වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම. |
| | අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය හා පහසුකම් සැපයීම, අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකි වන පරිදි ප්‍රතිපත්ති සැකසීම |
| | දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම. |
| | වෘත්තීය විෂයමාලා නවීකරණයක් කොට - One TVET සංකල්පය යටතේ අදාළ ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම. |
| | ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම. |
| | දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම. |
| | වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂයමාලා සංශෝධනයක් සිදු කිරීම. |
| | ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මගින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම. |
| | ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම. |

ජාතික නවෝත්පාදන ආයතන පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.

විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා රු.මිලියන 15,690.10 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 11,952.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් හෙවත් රු.මිලියන 3,737.28 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහනෙහි දැක්වේ.




| | අධ්‍යාපන අමාත්‍යාංශය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය) | කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිපාදනය (රු. මිලියන) | 13,253.10 | 2,437.00 | 15,690.10 |
| වියදම (රු. මිලියන) | 9,737.86 | 2,214.96 | 11,952.82 |
| ඉතිරිය (රු. මිලියන) | 3,515.24 | 222.04 | 3,737.28 |

රූප සටහන් අංක 2.35 : පාර්ලිමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය

මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## විගණන නිරීක්ෂණ

### අධ්‍යාපන අමාත්‍යාංශය - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන අංශය

**පුහුණු ශ්‍රමිකයන් විදේශගත කිරීම**

2021 වර්ෂයේදී පුහුණු ශ්‍රමිකයන් 100,000 ක් විදේශගත කිරීමේ අරමුණින් නිපුණතා සංවර්ධන හා විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගෙන තිබුණි. එසේ වුවද, මේ යටතේ 2023 දෙසැම්බර් 31 දක්වා වාර 05 කදී පුහුණුලාභීන් 1,606 දෙනෙකුගේ තොරතුරු පමණක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමුකර තිබුණි. යොමු කරනු ලබන පුහුණුලාභීන් අතුරින් සැබෑ වශයෙන්ම විදේශගත සංඛ්‍යාව, රැකියාව හා ගැටළු සම්බන්ධ තොරතුරු ද අමාත්‍යාංශය සතුව නොතිබුණි.

**පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය**

අවස්ථා 02 කදී විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් එවන ලද විදේශ රැකියා සම්බන්ධ තොරතුරු හා සසඳන විට විදේශ රැකියා ක්ෂේත්‍රය තුළ ඉහළ ඉල්ලුමක් පවතින රැකියා අවස්ථා 65,657 ක් ලැබී තිබූ අතර එම රැකියා අවස්ථා තුළ තවදුරටත් පුහුණුලාභීන් යොමුකල හැකිව තිබූ රැකියා අවස්ථා 33,596 ක් තිබුණ නමුත් ඒ සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට පියවර ගෙන නොතිබුණි

**නිපුණතා සංවර්ධන නිලධාරීන්**

ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා කර්මාන්ත හා සේවා අංශවල දායකත්වය සඳහා නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් ඇති කිරීමට ප්‍රබල දායකත්වයක් නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගෙන් ලබාගත යුතු වූ අතර ඒ සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 474 ක් සඳහා නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 317 දෙනෙක්ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා එම නිලධාරීන් 58 දෙනෙක්ද අනුයුක්ත කර තිබුණු නමුත් එම නිලධාරීන්ගේ 2023 වර්ෂයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පවරා තිබූ ප්‍රධාන කාර්යයන් 22 න් 18 කට අදාළව වර්ෂයේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 35 දක්වා වූ පහළ අගයක් ගෙන තිබුණි.

### තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**ජාතික වෘත්තීය අධ්‍යාපන සංවර්ධන සැලැස්ම**

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ මූලික අරමුණුවලින් එකක් වූ ජාතික වෘත්තීය අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම කොමිෂන් සභාව පිහිටුවා වසර 32 ක් ගත වී තිබුණද 2023 වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කිරීම කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2023 වර්ෂය අවසන් වන විටත් සැලැස්ම සකස් කර නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

**ලියාපදිංචි නොවූ ආයතන**

2023 වර්ෂයේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියාමනයෙන් බැහැරව කටයුතු කරන ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි පරිදි පනත සංශෝධනය කර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද පනත සංශෝධනය කිරීමේ කාර්යය 2023 වර්ෂය තුළදී අවසන් කර නොතිබුණි. තවද, කොමිෂන් සභාව විසින් පාඨමාලා පැවැත්වීම තාවකාලිකව තහනම් කරන ලද ආයතන සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් 15 දින වන විට සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 16 ක් අතරින් ආයතන 13 ක්ම එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගනිමින් නියාමන ආයතනයේ නියෝග නොසලකා හරිමින් සාමාන්‍ය පරිදි තම ඉගැන්වීම් කටයුතු සිදු කරන බව නිරීක්ෂණය විය.

**ලියාපදිංචිය අලුත් නොකිරීම**

2024 මාර්තු මාසය වන විට කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු ආයතන අතරින් ලියාපදිංචිය කල් ඉකුත් වී වසර 20 කට වැඩි ආයතන 16 ක්ද වසර 05 ත් වසර 20 ත් අතර කාලයක් ගත වී තිබුණු ආයතන 486 ක්ද ලියාපදිංචිය අලුත් කර ගැනීම සඳහා ඉල්ලීම් කර නොතිබුණි. තවද, ලියාපදිංචිය අලුත් නොකර වෘත්තීය පුහුණු කටයුතු පවත්වා ගෙන යනු ලබන බවට පරීක්ෂා කිරීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම 2016 වසරේ සිට 2022 දක්වා ආයතන 36 ක් ලියාපදිංචිය අලුත් කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබුණද එම ආයතනවල ලියාපදිංචිය අලුත් කර නොතිබුණි.

## වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

**පාඨමාලාවල තත්ත්ව සහතික**

විශ්වවිද්‍යාලය පිහිටුවා වසර 10 ට වැඩි කාලයක් ගත වී තිබුණද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පවත්වා ගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා, අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලාවල තත්ත්ව සහතික කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතීතනය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**අසම්පූර්ණ ඉදිකිරීම්**

විශ්වවිද්‍යාලයට බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබු අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 304.5 ක් වියදම් කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලේ හඳුනා ගත් දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## වෘත්තීය පුහුණු අධිකාරිය

**වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම් අතරමග නතර කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වැඩහල් ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 19.05 ක් වැයකර තිබුණු අතර 2015 ජනවාරි මස සිට ඉදිකිරීම් අත්හිටුවා තිබුණි. ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ගොඩනැගිල්ල 2023 වර්ෂය අවසන් වන විටද භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**නිෂ්කාර්ය වත්කම් - නේවාසිකාගාර**

අධිකාරියට අයත් ඔරුගොඩවත්ත ශ්‍රී ලංකා ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා 2020 වර්ෂයේදී කොරියානු රජයේ ආධාරයෙන් සිසුන් 100 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි කාමර 48 කින් යුත් සියලු පහසුකම් සහිත ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකර තිබුණද පූර්ණකාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

තවද, අධිකාරියට අයත් කුච්චවේලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් ලබා දිය හැකි අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදලින් රු.මිලියන 140.21 ක් වැයකර ඉදිකර තිබුණද ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම නේවාසිකාගාරයද භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

**නිෂ්කාර්ය වත්කම් - ඉඩම්**

අධිකාරිය විසින් 2010 වර්ෂයේදී රු.මිලියන 5.82 ක් වැයකර මිලදී ගෙන තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව වෙලේවත්ත පිහිටි රූඩ් 02 පර්චස් 33.5 ක ඉඩම සහ 2017 වර්ෂයේදී රු.මිලියන 34.03 ක් වැයකර දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගත් පානදුර මෝදරවිල පිහිටි අක්කර 01 කින් යුත් ඉඩම් 2023 වර්ෂය වන විටත් වෘත්තීය පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීමකින් තොරව පැවතුණි.

**තොරතුරු පද්ධතිය**

කවුන්සිලය විසින් තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) අංශයේ පාඨමාලා සම්පූර්ණ කරන සිසුන් හා කර්මාන්තකරුවන් ලියාපදිංචි කර සේවා ලබා ගැනීමේ අරමුණින් රු.මිලියන 11.23 ක වැයකර ජංගම යෙදුමක් නිර්මාණය කර තිබූ නමුත් එය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයා නොමැති වීම හේතුවෙන් අදාළ පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ ලබා ගත නොහැකි වී තිබුණි.

## සාගර විශ්වවිද්‍යාලය

**සිසු සවිය ශිෂ්‍යාධාර ලබා නොදීම**

ආර්ථික දුෂ්කරතා ඇති සිසුන් සඳහා අමාත්‍යාංශය මගින් නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ 2023 ජූනි මාසයේදී සිසුන් 418 දෙනෙක් සඳහා රු.මිලියන 6.63 ක් සාගර විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබුණි. ඉන් සිසුන් 178 දෙනෙකුට රු.මිලියන 0.62 ක් පමණක් ගෙවා ඉතිරි රු.මිලියන 6.01 ක් ජංගම ගිණුමකට බැර කර 2023 දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

**අසම්පූර්ණ ඉදිකිරීම්**

ආයතනයේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යාමේ අරමුණ සහිතව දෙහිවල උසස් තාක්ෂණ ආයතන භූමියේ රු.මිලියන 20.49 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි මහල් 3 ක වැඩ අවසන් කර 2017 පෙබරවාරි 21 දින ආයතනය වෙත භාර දී තිබුණ නමුත් ඉතිරි මහල් දෙකෙහි වැඩ නිම නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. අපේක්ෂිත පරිදි ගොඩනැගිල්ල නිම නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 64.48 ක් බදු කුලී ලෙස වැය කිරීමට සිදු වී තිබුණි. ගොඩනැගිල්ල නවීකරණ කිරීම සඳහා රු. මිලියන 4.25 ක මුදලක් වැය කර තිබුණද 2024 ජූනි 30 දක්වා ප්‍රධාන කාර්යාලයේ කටයුතු එම ගොඩනැගිල්ලේ ආරම්භ කර නොතිබුණි.

## ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**පුහුණු උපකරණ නොලැබීම**

රේඛීය අමාත්‍යාංශය මගින් මෙහෙයවන ලද ඔස්ට්‍රියානු ව්‍යාපෘතිය යටතේ අධිකාරියට අයත් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයට 2021 වර්ෂයේදී රු.මිලියන 1,936 ක් විදේශාධාර (ණය) ලෙස ලැබී තිබුණි. ඒ යටතේ ලැබිය යුතු වූ රු.මිලියන 13.7 ක පුහුණු උපකරණ 2024 වර්ෂය දක්වා ආයතනය වෙත ලැබී නොතිබුණි. තවද, රු.මිලියන 87.6 ක වටිනාකමින් යුත් පුහුණු උපකරණ භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා රු. මිලියන 68.5 ක් ගෙවා තිබුණද භාවිතයට ගත හැකි වන පරිදි ස්ථාපිත නොකිරීම සහ එම උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය අනෙක් උපකරණ නොලැබීම හේතුවෙන් වසර 02 ක් ඉක්ම ගොස් තිබුණද ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM)

**මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් අත්පොත**

විද්‍යායතනය විසින් සකස් කර තිබුණු මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් අත්පොත සඳහා අදාළ මාර්ගෝපදේශ හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
තවද, විද්‍යායතනය භාවිතා කරන නිශ්චිත කාර්ය මණ්ඩලය හා පාරිශ්‍රමික, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් හා උසස් කිරීම් කාර්යපරිපාටිය සඳහා අදාළ චක්‍රලේඛ අනුව රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**පාඨමාලා ගාස්තු වැඩි කිරීම**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ Phase II ව්‍යාපෘතියේ පාඨමාලා ගාස්තු වර්ෂ තුනකට වරක් පමණක් වැඩි කිරීමට යටත්ව අනුමැතිය ලබා ගෙන තිබුණි. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත උපාධි පාඨමාලාවල හා විදේශ විශ්වවිද්‍යාල අනුබද්ධ උපාධි පාඨමාලා සඳහා ඊට පටහැනි ලෙස 2020 හා 2021 වර්ෂවල පාඨමාලා 12 ක් වර්ෂයකට වරක් හා 2022 හා 2023 වර්ෂවල පාඨමාලා 17 එක් වර්ෂයකට දෙවරක් බැගින් සියයට 17 සිට සියයට 75 ත් අතර පරාසයකින් පාඨමාලා ගාස්තු වැඩි කර තිබුණි.

## අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය

2013 සැප්තැම්බර් 04 දිනැති අංක 4-1/2/1/4/4/III ලිපිය මගින් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟත්වය පරිදි අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයට ලබා දීමට යෝජිත අක්කර 02 රූඩ් 03 පර්චස් 17 ක වපසරිකින් යුත් භූමියෙන් අක්කර 01 ක පමණ භූමිය තුළ ඉදිකර ඇති ගොඩනැගිලිවල සිසුන් 600 ක් පමණ වාර්ෂිකව ඉගෙනුම ලබයි. ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය තුළ අනුරාධපුර තාක්ෂණ විද්‍යාලයට අයත් පැරණි නිවාස 04 ක් පිහිටා ඇති අතර, එම නිවාස වසර 03 කට පසු කඩා ඉවත් කිරීමට හා පදිංචිකරුවන් ඉවත් කිරීමට 2017 වර්ෂයේ සැලසුම් කර තිබුණි. එහෙත් 2023 දෙසැම්බර් දක්වාම එම කාර්යය ඉටු කර භූමියේ නිරවුල් හිමිකම ලබා ගැනීමට පාලන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනය සංවර්ධනය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට හා නිදහස් හා අලංකාර භෞතික පරිසරයක් සිසුන් වෙනුවෙන් නිර්මාණය කිරීමටත් පවත්නා සීමිත ඉඩකඩ තුළ නොහැකි වී තිබුණි.

## නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**නිෂ්කාර්ය වත්කම්**

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් කටයුතු සඳහා ඡායාරූප ලබා ගැනීමේ අරමුණින් 2016 වර්ෂයේදී රු.මිලියන 10.56 ක් වූ නියමුවන් රහිත ගුවන් යානයක් මිලදී ගෙන එය ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 0.11 ක් වැය කර අවශ්‍ය පුහුණුව හා පියාසර කිරීමට අවශ්‍ය අවසරය ලබා ගෙන තිබුණද මිලදී ගත් දින සිට අදාළ කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

**තොරතුරු පද්ධතිය**

කොමිසම විසින් නවෝත්පාදන කඩිනම් කිරීමේ යාන්ත්‍රණය හරහා ණය හා ප්‍රදාන ලබා ගැනීම සඳහා ලැබෙන අයදුම්පත් හැසිරවීම වෙනුවෙන් නිසි ශක්‍යතා අධ්‍යනයකින් හා සැලැස්මකින් තොරව රු.මිලියන 4.6 ක් වැය කර 2018 වර්ෂයේදී සකස් කරන ලද දත්ත පද්ධතිය 2023 වර්ෂය වන විට අක්‍රියව පැවතුණු අතර මේ දක්වා ලැබී තිබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව 39 ක් වී තිබුණි.

# රාජ්‍ය පරිපාලන කටයුතු

රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්'' ඇති කිරිම පිණිස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

**කාර්යභාරයන්**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය,

ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම,

ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාරකණය,

පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන් ඉටු කිරීම

2023 වර්ෂයේදී එම කාර්යභාරය ඉටුකිරීම සඳහා අමාත්‍යාංශය වෙත එකතුව රු. මිලියන 51,285 ක ප්‍රතිපාදන සලසා දී තිබූ අතර එයින් වර්ෂය අවසානය වන විට රු. මිලියන 39,447 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 11,837 උපයෝජනය කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341ක්, පළාත් පාලන ආයතන 341ක්, දෙපාර්තමේන්තු 03 ක්, සංස්ථා/ මණ්ඩල 05ක්, එක් කොමිෂන් සභාවක් සහ එක් සමාගමක් මෙම අමාත්‍යාංශය යටතේ වන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඉහත කාර්යයන් ඉටුකිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**හිඟ ගොඩනැගිලි කුලී අයකර ගැනීමට කටයුතු නොකිරීම**

2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 4(ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතු වීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගත යුතු වුවත්, ආයතන 32 කින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුළී ආදායම රු. මිලියන 332.7 ක් වී තිබුණි. එයින් රු. මිලියන 198.7 ක් 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට එනම් වර්ෂ 3 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළ අයවිය යුතුව පැවැතුණි. මෙම හිඟ කුළී මුදලින් සියයට 18 ක් හෙවත් රු.

මිලියන 59 ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා නිවාස, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි.

තවද, අමාත්‍යාංශයට අදාළ ආදායම් සංකේතාංකයට අයත් ගොඩනැගිලි පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2024 මැයි 30 දක්වා අමාත්‍යාංශය විසින් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**අවිධිමත් ලෙස රජයේ නිවාස උපලේඛනගත කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.1 හා 1.2 වගන්ති ප්‍රකාර තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි වේ. ඒ අනුව 2003 ඔක්තෝම්බර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් මෙම අමාත්‍යාංශය සතුව උපලේඛනගත නිවාස නොමැති බව නිශ්චය කර තිබුණි. එසේවුවද, ආයතන සංග්‍රහයට සහ මෙම චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06 ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16 ක් උපලේඛනගත කර නිලධාරීන්ට ලබා දී තිබුණි.

**ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම**

2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණ අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරීන් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණු බව ද නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන් 602 ගෙන් නිලධාරීන් 197 ක් සඳහා පමණක් සහ ඒකාබද්ධ සේවයට අයත් සේවා 07 ක අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන් 14,323 ගෙන් 3,916 ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි.

දිස්ත්‍රික් ලේකම්වරු පත් කිරීමේදී සළකා බලනු ලබන නිර්ණායක සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දිස්ත්‍රික් ලේකම් තනතුරු සඳහා තෝරා ගැනීමේ නිර්ණායක නැවත සකස් කර ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කළ යුතු බවට වූ තීරණය අනුව 2022 දෙසැම්බර් 02 දින නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර තිබුණද 2024 මැයි 30 දින දක්වාම, අදාළ නව නිර්ණායක සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

**E -ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඌන උපයෝජනය**

ග්‍රාම නිලධාරීන් විසින් ජනතාවට ලබා දෙන සේවාවන් සඳහා එදිනෙදා අවශ්‍ය තොරතුරු රැස්කර තබා ගැනීමට හා පරිශීලනය කිරීමට අවශ්‍ය දත්ත ඇතුළත් E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ පළමු අදියර නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක, ග්‍රාම නිලධාරී වසම් 133 ක් තුළ රු.මිලියන 56.94 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් එහි සාර්ථකත්වය මත දෙවන අදියර ග්‍රාම නිලධාරී වසම් 7,000 ක් ආවරණය වන පරිදි රු.මිලියන 1,689.22 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. මේ වෙනුවෙන් 2023 වර්ෂය සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 1,500 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 37 ක් එනම් සියයට 2.5 ක් පමණක් වැයකර තිබුණි. 2017 සිට 2019 දක්වා වර්ෂ සඳහා වාර්ෂික ප්‍රතිපාදන වෙනම දක්වා නොතිබුණු අතර 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 3,080 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් රු.මිලියන 368 ක් පමණක් වැයකර තිබුණි. සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම ඒ සඳහා හේතු වී තිබුණි.

**ගාල්ල ආසන 2000 ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් අත්හැර දැමීම**

මෙම ඉදිකිරීම සඳහා 2019 – 2020 කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 2,700 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර 2023 ජුනි 14 දින වන විට රු. මිලියන 718.6 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. 2022 පෙබරවාරි 15 දින කල්ඉකුත් වී තිබුණු රු. මිලියන 133 ක් වූ කාර්යසාධන බැඳුම්කරය දින දීර්ඝ කර ගැනීමට හෝ මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් ලබා දුන් අත්තිකාරම් බැඳුම්කරය 2022 ජනවාරි 29 දිනෙන් පසු දින දීර්ඝ කර නොතිබූ අතර පියවා නොගත් අත්තිකාරම් මුදල රු. මිලියන 475 ක් විය. ඉදිකිරීම් අත්හැර දමන ලද ශ්‍රවනාගාරයේ ඡායාරූපයක් පහත දැක්වේ.



ඡායාරූප අංක : 2.1

**විදේශාධාර ව්‍යාපෘති අරමුදල් ඌන උපයෝජනය**

| ව්‍යාපෘතිය | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | 2023 වර්ෂය තුළ වැය කිරීම් (රු.මිලියන) |
|---|---|---|
| ඉන්කියුබේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම - යාපනය | විදේශාධාර 250<br>ශ්‍රී ලංකා රජය 50 | 0.49 |
| අපද්‍රව්‍ය වලට වටිනාකමක් එකතුකිරීමේ ව්‍යාපෘතිය | ජර්මන් රාජ්‍ය ප්‍රදාන 260<br>ශ්‍රී ලංකා රජය 15 | නැත |
| මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | යුරෝපීය ආයෝ. බැංකු 947<br>ශ්‍රී ලංකා රජය 380 | නැත |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය | එක්සත් රාජධානි ණය 200 | නැත |

වගු අංක 2.20 : විදේශාධාර ව්‍යාපෘති අරමුදල් උපයෝජනය

**සීමා නීර්ණ වාර්තාව ඉදිරිපත් නොකිරීම**

සීමා නීර්ණය සඳහා පළමු අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී වසර දෙකක් හා දෙවන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී වසරක් ගත වී තිබුණි. 2021 සහ 2022 වර්ෂවල ඒ වෙනුවෙන් රු.මිලියන 7.76 ක් වැයකර තිබුණද සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සහිත සවිස්තරාත්මක අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත 2024 මැයි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## දිස්ත්‍රික් ලේකම් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කර තිබූ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය පිළිබඳ නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

**ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 තුල 2018 හා 2019 වර්ෂවල ජනාධිපති වැය ශීර්ෂය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ලබාදුන් අරමුදලින් ග්‍රාම ශක්ති සමිති නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 111ක 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 33.62ක් වසර 03කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක ග්‍රාම ශක්ති සමිති 13ක් විසින් චක්‍රීය ණය ක්‍රමය යටතේ ලබාදී තිබුණු රු. මිලියන 5.14ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.28ක ණය මුදලක් හා රු.52,824 හිඟ පොළිය ලෙස එකතුව රු. මිලියන1.33ක මුදලක් අය කරගෙන නොතිබුණි.

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක මෙම වැඩසටහන යටතේ ග්‍රාම ශක්ති සමිති 103 ක් ලියාපදිංචිකර තිබූ

අතර 2023 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 80 ක් එනම් සියයට 78 ක් අක්‍රියව පැවතුණි. එම නිසා එදිනට එම සමිතිවල බැංකු ගිණුම්වල ශේෂව පැවති රු මිලියන.28.323 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක එකී ක්‍රියාකාරීව පැවති සමිතිවල සාමාජිකයින්හට ලබාදී තිබූ ස්වයංරැකියා ණය අතරින් රු. මිලියන 2.285 ක්ද 2023 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව පැවතුණි.

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 කට අයත් ග්‍රාම ශක්ති පලමු අදියරේ සහ දෙවන අදියරේ සමිති 99 ක් අක්‍රීයව පැවති අතර 2023 මාර්තු 31 දිනට එම සමිති ගිණුම්වල රු.මිලියන 36.2 ක මුදලක් අක්‍රියව පැවතුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කය මඟින් ක්‍රියාත්මක කල ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ධාරිතා සංවර්ධනය හා චක්‍රීය ණය වැඩසටහන සඳහා ලබා දී තිබූ රු. මිලියන 178.79 ක මුදලින් සියයට 44 ක් වන රු. මිලියන 77.97 ක් 2023 වර්ෂය අවසානයට ද උපයෝජනයක නොකර පැවතුණි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාතිය යටතේ 2018 වර්ෂයේදී රු.මිලියන 6.9 ක් වැයකර බීජ බෝංචි ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් හා ශීතාගාරයක් ඉදිකර තිබුණද 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර, තමන්කඩුව, මැදිරිගිරිය, ලංකාපුර, හිඟුරක්ගොඩ, වැලිකන්ද හා දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 07 ක පිහිටුවා ඇති ග්‍රාම ශක්ති ජනතා සමිති 85 ක් අතරින් සමිති 61 ක් අක්‍රීය මට්ටමේ පවතින අතර, එම සමිති වලට අයත් ගිණුම් තුළ 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16.37 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි.

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පිහිටු වන ලද ග්‍රාමශක්ති සමිති 166 න් සමිති 121 ක් අක්‍රීයව පවතින අතර මෙම සමිතිවලට අයත් බැංකු ගිණුම්වල 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 102.39 ක මුදල් ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.

## අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා දීමනා ලබා ගැනීම**

22/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන

ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වේ. එහෙත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.මිලියන 3,089 න් සියයට 1 ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17ක් සඳහා රු.මිලියන 30.89ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණි. ඒ අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් මගින් ගන්නා ලද තීරණයක් අනුව සම්බන්ධ වූ නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.මිලියන 15.58 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා අවසන් කර තිබුණි. මීට අමතරව උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 16 දෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් අතිකාල හා ගමන් වියදම් දීමනා ලෙස මෙම මුදල්වලින් රු.මිලියන 0.37 ක් ගෙවා තිබුණි.

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදල් ආපසු නොලැබීම**

2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉතිරි වී තොග සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් මාසයේදී ටෙන්ඩර් කැඳවීමෙන් ගැනුම්කරුවකු තෝරාගෙන තිබුණි.එහෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක තෝරාගත් වී මෝල් 24ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබූ රු.මිලියන 170.12 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,226,373ක් 2024 මැයි 05 දින වන විටත් ගැනුම්කරු වෙත ලබා දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදල් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

## අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**පශු සම්පත් ණය වැඩ සටහන**

වනිතා සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් 2010 වර්ෂයේදී ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි .ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ක 10 පශු සම්පත් ණය ලබාදීම සඳහා ආරම්භ කර තිබූ බැංකු ගිණුම්වල රු.මිලියන 33 ක මුදලක් අදාළ කාර්යය සඳහා යෙදවීමට ප්‍රමාණවත් නොවන බව දක්වමින් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීම සඳහා ඉඩම් බැහැර කිරීම**

2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති

දීමනා පත්‍රවල පසු  කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව කෘෂිකාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීමේ වාණිජ කාර්යය සඳහා එම ඉඩම්වලින් කොටසක් බැහැර කර ඇති අවස්ථාවල අදාළ  දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ vi කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. එහෙත් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ  ප්‍රාදේශීය ලේකම්  කොට්ඨාශ 14  ක්  තුළ පිහිටුවා තිබූ සම්ප්‍රේෂණ කුලුනු 139 ක් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුලද දීමනා පත්‍ර යටතේ ලබා දී තිබූ පර්චස් 66.9 කට වැඩි ඉඩම් ප්‍රමාණයක රජයේ අනුමැතියකින් තොරව සන්නිවේදන කුළුණු 04 ක් ඉදිකරීමට ඉඩ ලබා දී තිබුණු අතර, මෙම කුළුණු මගින් අදාල දීමනා පත්‍ර හිමියන් ආදායම් උපයමින් පැවතුණි. එහෙත් අදාල බලධාරීන් විසින් අදාල ඉඩම් කොටස් විධිමත්ව රජයට පවරා ගෙන බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**සංචිත රථය භාවිතා කරමින් ඉන්ධන දීමනා ලබා ගැනීම**

කාර්යාලයේ සියළු නිල රාජකාරී කටයුතු සඳහා සංචිත රථය භාවිතා කර ඒ සඳහා ඉන්ධන ඇනවුම් මගින් ඉන්ධන ලබාගෙන තිබියදී  2022 පෙබරවාරි සිට  2023 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුල කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නිරත වූ ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනෙකු විසින් රු.මිලියන 0.8 ක ඉන්ධන දීමනාද ලබාගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි 119  අනුව වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනාව 2023  දෙසැම්බර්  31 දින වන විට ද අයකරගෙන නොතිබුණි.

**නායයෑමේ අධි අවදානමට ලක්වූ පවුල්  නැවත පදිංචි නොකිරීම**

නායයෑමේ අධි අවදානමට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකට අයත් පවුල් 236 ක් නැවත පදිංචි කිරීම සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල  02 කට අදාලව රු.මිලියන 46 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 සිට 10 දක්වා කාලයක් ගත වී තිබුණද මෙම අවදානමට ලක්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බැවින් අවදානමට ලක්වූ පවුල් ජීවිත අවදානම දරා ගනිමින් මුල් ස්ථානවලම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

**ඌණ උපයෝජිත වත්කම්**

කන්දකැටිය හා හල්දුම්මුල්ල  ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා  2022 මැයි  20 හා 21  වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.මිලියන 4.5 ක් වූ ගම්මිරිස්

වියලන යන්ත්‍ර 02 ක් 2024 මාර්තු 31 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි.

## මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අධිකාරියකින් තොරව වැලි, පස් සහ බොරළු කැණීම් සහ ප්‍රවාහනය සඳහා එක් දින බලපත්‍ර නිකුත් කිරීම**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතට සහ 2009 අංක 66 සංශෝධිත පනතට අනුව වැලි, පස් සහ බොරළු සඳහා වාණිජ නොවන අරමුණු සඳහා එක් දින බලපත්‍රයක් නිකුත් කිරීමේ බලය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිවන අතර පතල් කැණීම සහ ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරා තිබුණි .භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව, වාණිජ නොවන ක්‍රියාකාරකම් යනු කුඩා ප්‍රමාණයේ, විකුණුම් අරමුණකින් තොරව ස්වයං අවශ්‍යතා සඳහා වන කැනීම් වේ .කෙසේ වෙතත්, මන්මුනේ නිරිතදිග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වාණිජ කටයුතු සඳහා එක් දින බලපත්‍රයක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය .ඒ අනුව 2022 ජනවාරි සිට 2023 අප්‍රේල් 30 දක්වා මාස 16ක කාලයක් තුළ වැලි කියුබ් 64 ක් සහ පස් සහ බොරළු කියුබ් 508 ක් කැණීම සහ ප්‍රවාහනය කිරීම සඳහා පුද්ගලයන් හතර දෙනෙකු සඳහා එක් දින බලපත්‍ර නිකුත් කර තිබුණි

.

**අනවසර ඉඩම් අල්ලාගැනීම්**

ඉඩම් නියෝග අංක 180, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ අංක 2008/04 සහ 1995 ජූනි 15 දිනැති ඉඩම් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 10 අනුව, රජයේ ඉඩම් අල්ලා ගැනීම් වලක්වාලීම ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරීන්ගේ යුතුකමක් සහ වගකීමකි. කෙසේ වෙතත්, කන්නකිපුරම් ග්‍රාම නිලධාරී වසමේ අක්කර 04 ක රජයේ ඉඩම කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත ග්‍රාම නිලධාරීවරුන් දෙදෙනකු විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබුණු නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් මේ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**අවිධිමත්ව ඉඩම් ලබාදීම්**

කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹුරුමොලෙයි ග්‍රාම නිලධාරී වසමේ නිවාස යෝජනා ක්‍රමය අසල පොදු කටයුතු සඳහා වෙන්කර ඇති රජයේ ඉඩමක් විධිමත්ව ඉඩම් කච්චේරි පවත්වා තෝරා නොගත් පුද්ගලයන් 50 දෙනෙකුට ලබා දී තිබුණි. ඉහත රජයේ ඉඩම් අන්සතු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රූප සටහන අවහිර කිරීම(BOD) දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය සහ පළාත් ඉඩම් කොමසාරිස්ඉඩම් / .ලබාගෙන නොතිබුණි කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඉඩම් කච්චේරියට ඇතුලත් කිරීමේ අරමුණින් එම පුද්ගලයන්ගේ ඡන්ද නාම ලේඛන හිතාමතාම කෝරළෙයි පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුම්පුරුමූලෙයි ග්‍රාම නිලධාරී කොට්ඨාශයට මාරු කර

තිබුණි. ඔවුන්ගෙන් බහුතරයක් එම ඉඩම්වල පදිංචි නොමැති බව නිරීක්ෂණය වූ අතර කොටස් 50 කට වැඩි ප්‍රමාණයක් වැටවල් මගින් වෙන් කර ගෙන ඉඩම්වල තාවකාලික පැල්පත් සකසා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම**

සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම සඳහා 2005 වර්ෂයේදී මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිරෙයිමඩු ප්‍රදේශයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඉඩම් පවරාගෙන තිබුණි. එම ඉඩම් වලින්, සුනාමියට ගොදුරු නොවූ රාජ්‍ය නිලධාරීන් සඳහා ඉඩම් කැබලි 50ක් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලබා දී තිබුණි. ඊට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) මගින් නිවාස ඉදිකිරීම සඳහා ණයද ඔවුන් වෙත ලබා දී තිබුණි. මේ නිසා අත්පත් කරගත් ඉඩම් අවභාවිතා කර ඇති බව නිරීක්ෂණය විය.

## ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ව්‍යාපෘතීන් අතරමග නවතා දැමීම**

දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 19 ක් සඳහා රු.මිලියන 8.4ක වියදමක්ද දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 0.6 ක්ද අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 14 ක් සඳහා රු.මිලියන 5.1ක් වැය කිරීමෙන් පසු ව්‍යාපෘතීන් අතරමග නවතා දමා තිබුණි.

**නිල සේවා ගොඩනැගිලි හා සේවා පියස ඉදිකිරීම**

මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිල සේවා ගොඩනැගිලි 07 ක් ඉදි කිරීම සඳහා රු.මිලියන 1.4ක් හා සේවා පියස් 10 ක් ඉදි කිරීම සඳහා රු.මිලියන 8.2ක් වියදම් කර තිබුණද ඉදි කිරීම් කටයුතු අවසන් කර නොමැති වීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව පැවතුණි.

## කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**නිවෙස්වල අයිතිය අදාල ප්‍රතිලාභීන්නමට පවරාගෙන නොතිබීම**

නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක ප්‍රතිලාභීන් 16 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.මිලියන 24.07 ක ප්‍රතිලාභ මුදල් මගින් මිලදිගත් ඉඩම්වල සහ නිවෙස්වල අයිතිය අදාල ප්‍රතිලාභීන් නමට පවරාගෙන නොතිබුණි. තවද තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක

ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත නිවාස මිලදී ගැනීම සඳහා රු. මිලියන 4.6 ක් ලබාදී තිබූ අතර ඔවුන් විසින් මිලදී ගත් නිවාස සහිත ඉඩම් පසුව වෙනත් පාර්ශවයන්ට විකුණා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභීන් 06 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු. මිලියන 9.5 ක ප්‍රතිලාභ මගින් මිලදී ගෙන තිබුණු ඉඩම් සහ නිවාසවල අයිතිය එම ප්‍රතිලාභීන් නමට නොවීය.

**නිශ්කාර්ය ගොඩනැගිලි**

විගණනයට ඉදිරිපත් වූ තොරතුරුවලට අනුව 2024 පෙබරවාරි 27 දිනට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක පවතින ගොඩනැගිලි 65 ක් නිශ්කාර්යව දිරාපත් වීමට ලක්වෙමින් පැවතුණි. එම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 26 ක අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුවද ඉතිරි ගොඩනැගිලි 39 වෙනත් බාහිර රාජ්‍ය ආයතන සතුව පැවතුන අතර මෙම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 48 ක්ම නැවත අලුත්වැඩියා කර භාවිතා කල හැකි තත්වයේ පැවතුණ නමුත් ඒ සඳහා අවධානය යොමුකර නොතිබුණි.

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන**

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ගොටුකොළ ආශ්‍රිත නිෂ්පාදිතවලට අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 8.72 ක් වැය කර තිබුණි. 2017 වර්ෂයේ දී ජාතික ආහාර වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලැබී එහෙත් වසර 05 ක කාලයක් තුළ භාවිතා කර නොතිබුණු, වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ ආහාර විජලන යන්ත්‍රයක් හා ද්‍රව්‍ය කුඩුකිරීමේ යන්ත්‍රයක්ද ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණි. නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් ලෙස දක්වා තිබුණ ද ඒ සඳහා සපුරාලිය යුතු භෞතික අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබීම මත, එම තත්ත්ව සහතිකය ලබාගත නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් අරමුණුගත පරිදි නිෂ්පාදන, විදේශීය වෙළඳ පොලට මෙන්ම දේශීය වෙළඳපොලටද ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. එම සහතික ඉදිරියේදී හෝ ලබාගැනීම සඳහා වන අවශ්‍යතාවයන් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමා තිබුණි.

තවද, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම වැඩසටහන යටතේ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිලාභීන් 72 දෙනෙකු වෙත රු. මිලියන 6. ක් වටිනා මල් පෝච්චි අච්චු, සෙවිලි තහඩු සහ GI බටද ලබාදී තිබුණි. වැඩසටහනේ ප්‍රතිලාභීන් 20 දෙනෙකු පිලිබදව විගණනය විසින් සිදුකරන ලද නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු. මිලියන 1.31 ක් වටිනා එම උපකරණ 2024 ජනවාරි 19 වන විගණිත දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

## කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **අයකර නොගත් බදු** | කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2005 සිට 2023 දක්වා බදු දුන් ඉඩම සඳහා බදු සහ දඩ මුදල් වශයෙන් රු.මිලියන 3.13 ක් අයකර නොතිබුණි. |
| **ඌන උපයෝජිත වත්කම්** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් විවිධ අමාත්‍යාංශ හා ව්‍යාපෘති යටතේ පපඩම්, හකුරු, තෙලිජ්ජ ඇසුරුම්,කොම්පෝස්ට්, මුරුංගා කොළ කුඩු යනාදිය නිෂ්පාදනයට හා පළතුරු සහ එළවළු සැකසීම සඳහා යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ නිෂ්පාදන මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු. මිලියන 62.64ක් වැය කර තිබුණි. මේවා 2018 සහ 2019 වර්ෂවලදී සමුපකාර සමිති හතරකට සහ ග්‍රාම සංවර්ධන සමිති දෙකකට භාර දී තිබුණු නමුත් එම යන්ත්‍රෝපකරණ, අංගන සහ මධ්‍යස්ථාන අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝගී කර නොගෙන වසර පහකට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතින බව නිරීක්ෂණය විය. |
| **අභාවිත වත්කම්** | පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු.මිලියන 4.6 ක් වටිනා මහජන ශාලා හතරක් සහ ගොඩනැගිලි වසර 1 සිට 10 දක්වා කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. |

## මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම** | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල පියස රජයේ නිවාස සංකීර්ණයේ වහලයේ 2021 වර්ෂයේ රු.මිලියන 1 ක් වැය කර කිලෝවොට් 4.08 ක සූර්ය බල විදුලි පද්ධතියක් සපයා සවි කර වසර 02 ක කාලයක් ගත වී තිබුණද, 2023 වර්ෂය අවසන් වන විටත් සූර්ය බල පද්ධතියෙන් ජනනය වන කිලෝ වොට් 4.08 ක විදුලිය අලෙවි කර ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **අනාර්ථික ගනුදෙනු** | අය වැය යෝජනා මත ග්‍රාමීය මට්ටමෙන් සංවර්ධන ව්‍යාපෘති 2022 අප්‍රේල් මාසයෙන් පසුව ක්‍රියාත්මක නොවී පැවතියදී 2022 අප්‍රේල් 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක නිලධාරීන් 20 ක් වෙත රු.මිලියන 2.1 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. |
| **සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන** | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බුලත්වැල්කඳුර ග්‍රාමනිලධාරී වසමේ අඩු ආදායම්ලාභී පවුල් කේන්ද්‍ර කර ගනිමින් පිටි ඇඹරුම් කර්මාන්තයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව පිටි සැකසුම් මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, විජලන යන්ත්‍රයක් මිලදී ගැනීම, ප්‍රතිලාභීන් 33 ක් වෙත පිටි ඇඹරුම් යන්ත්‍ර 33 ක් ලබා |

දීම ඇතුලු ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු.මිලියන 4.65 ක් වැය කර තිබුණි. කෙසේ වුවද 2024 පෙබරවාරි 27 දින සිදු කළ භෞතික පරීක්ෂාව අනුව පිටි සැකසුම් මධ්‍යස්ථානයේදී අදාළ විජලන කටයුතු සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර, ඒ වෙනුවෙන් දරන ලද රු.මිලියන 2.9 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

**ඉඩම් අත්පත් කර ගැනීම් හා පැවරීම් කටයුතු**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ඉඩම් අත්පත් කර ගැනීමේ හා ඉඩම් පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් ලිපිගොනු 350 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ගොනු ආරම්භ කර වසර 03 ත් වසර 40 ත් අතර කාල පරාසයන් ගත කර තිබුණද ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ඉඩම් පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**නාය යෑම් අධි අවදානම් කලාපවලින් ජනතාව ඉවත් නොකිරීම**

මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් කලාප ලෙස හඳුනාගෙන තිබූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක පවුල් 1845 ක් අතරින් 2023 දෙසැම්බර් 31 දින වන විට පවුල් 1386 ක් එම ප්‍රදේශයේම පදිංචි වී සිටින බවට නිරීක්ෂණය විය.

## මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ගිනි අවි බලපත්‍ර අලුත් කර නොතිබීම**

2023 සැප්තැම්බර් 19 දිනැති අංක 2023/04 දරන ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛයේ 1 ඡේදය අනුව 2024 වර්ෂය සඳහා දිස්ත්‍රික්කයේ සියලුම ගිනි අවි බලපත්‍ර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රථම අලුත් කිරීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණද, ගලේවෙල, දඹුල්ල හා අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුද්ගලයින් 60 දෙනෙකු 2024 පෙබරවාරි වන විටත් ගිනි අවි බලපත්‍ර අලුත් කර නොතිබුණි.

**වංචනික ස්වරූපයේ ගනුදෙනු**

බිරිඳවෙල සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සිදුකර තිබුණු රු.මිලියන 4.6 ක මූල්‍ය වංචාව සම්බන්ධව 2023 දෙසැම්බර් 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**ප්‍රසම්පාදනයන්**

උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් (B -කොටස 6 වන අදියර) ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 19 ක් ඉටුනොකර තිබියදී ඉටුකළ බවට බිල්පත් නිර්දේශ කර රු.මිලියන 1.3 ක් ගෙවා තිබුණි. තවද නව ගොඩනැගිල්ලේ අතිරේක වැඩ නිමකිරීම් ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 11 ක් සඳහා රු.මිලියන 1.5 ක් ගෙවා තිබුණද එම වැඩ විෂයයන් සිදුකර නොතිබුණි. කාර්යසාධන සුරක්ෂණය 2024 ජනවාරි 15 දිනෙන් අවසන් වී තිබුණු අතර වැඩ අවසන් කළ යුතු දිනය 2023 දෙසැම්බර්

11 වුවත් 2024 පෙබරවාරි 05 දින වන විටත් වැඩ අවසන් නොකිරීම හේතුවෙන් අයකළයුතු රු.මිලියන 0.8 ක ප්‍රමාද ගාස්තු අයකරගෙනද නොතිබුණි.

**හිඟ ණය**

මාතලේ දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු 11ක නියැදියක් පරීක්ෂාවේදී 2023 ජූනි 30 දිනට ප්‍රතිලාභීන් 176 දෙනෙකු වෙත රු.මිලියන 19.3 ක ණය නිකුත් කර තිබුණු අතර එයින් රු.මිලියන 10.3 ක් හිඟව පැවතුණි.

**වන්දි මුදල් ගෙවීම ප්‍රමාදය**

1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38(අ) වගන්තියේ අතුරු විධානය පලකළ දිනට අත්පත්පත් කර ගැනීමට අදාළ වන්දි මුදල් ගෙවිය යුතු වුවත් වසර 3- 10කට වඩා වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී තිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ඉඩම් හිමියන් 06 දෙනෙකු වෙත රු.මිලියන 5 ක පොලී මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

## මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**රටකජු වගා ව්‍යාපෘතිය**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආධාර යටතේ යන්ත්‍රෝපකරණ සහ බීජ සඳහා රු. මිලියන 17.74 ක් වැය කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද රටකජු වගා ව්‍යාපෘතියේ රටකජු වර්ධන වේගය සියයට 25 සිට සියයට 50 දක්වා පමණක් වූ අතර ඒ අනුව දුර්වල ප්‍රතිඵලයක් ලැබී තිබුණි. මේ නිසා නැවත රටකජු මිලදී ගෙන නැවත වගා කිරීමට ප්‍රතිලාභීන්ට සිදු වී තිබුණි.

**මුදල් අවභාවිතා කිරීම**

මුසලි සමෘද්ධි බැංකුව මුදල් රෙගුලාසි 136-140 උල්ලංඝනය කරමින් සමෘද්ධි සංවර්ධන නිලධාරියාට රු.මිලියන 3.392ක් ලබා දී තිබුණි. මෙම මුදල නිලධාරියා විසින් අවභාවිත කර ඇති අතර එය පාඩුවක් ලෙස හඳුනාගෙන ඇත. මෙම මුදලින් රු.මිලියන 2.650ක් අයකරගෙන තිබුණ ද, ඉතිරි මුදල වූ රු.මිලියන 0.942ක් 2023 දෙසැම්බර් දක්වා අයකරගෙන නොතිබුණි.

**සමෘද්ධි ප්‍රතිලාභ නොගෙවීම**

සමෘද්ධි ප්‍රතිලාභීන් 223 දෙනෙකුටගෙවන ලද මාසික දීමනා මාස 10 සිට 48 දක්වා කාලසීමාවක් සඳහා ඔවුන් විසින් ලබාගෙන නොතිබුණි. සුදුසුකම් නොලැබූ එම සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරාගැනීම හේතුවෙන් එම රු.මිලියන 17.74ක මුදල භාවිතයට නොගෙන ඉතිරිව තිබුණි.

## මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**නිෂ්කාර්ය නිලනිවස**

2007 වසරේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.මිලියන 11.8 ක් වැය කර තිබුණ ද එම නිල

නිවස පසුගිය වසර 16 තුලම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.

**නිෂ්කාර්ය වත්කම්**

මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල, අතුරලිය හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල එකතුව රු. මිලියන 4.2 ක් වැයකර සංවර්ධනය කර තිබුණු ක්‍රීඩා පිටි 03ක් අරමුණුගත කාර්යයට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

තවද, අතුරලිය, මුලටියන හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03හි ග්‍රාම නිලධාරි වසම්වල පිළිවෙලින් බතික් නිෂ්පාදනය, කුරුඳු බේල් කිරීම හා බට ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් 83කට රු. මිලියන 5.5 ක වටිනාකම සහිත උපකරණ අයිතම 611 ක් ලබා දී තිබූ නමුත් එම උපකරණ අදාළ කාර්යයන් සඳහා යොදාගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි

## මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**රජයේ ඉඩම් සඳහා අය කරගතයුතු මුදල්**

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2022 ඔක්තෝබර් 22 දිනැති චක්‍රලේඛ අංක 2021/02 යටතේ පත් කරන ලද තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කමිටුවේ වටිනාකම් ඇස්තමේන්තුවට අනුව සහ 2019 වර්ෂයේ දී යටත් විජිත නිලධාරියාගේ හඳුනාගැනීම මත පදනම්ව, රජයේ ඉඩම් 19කට අදාළ එකතුව රු.මිලියන 3.27ක් අයකරගත යුතුව තිබුණි. කෙසේ වුවද, පසුගිය වසර 1 සිට 5 දක්වා කාලය තුළ මෙම මුදල අය කර ගැනීමට එලදායී පියවරක් ගෙන නොතිබුණි.

**වී මිලදී ගැනීම සහ විකිණීම සඳහා ලබා දුන් මුදල් නොපියවීම**

කිසිදු ගිවිසුමකින් තොරව බහුකාර්ය සමුපකාර සමිති දෙකකට ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සහ විකිණීම සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ දී ලබා දුන් රු.මිලියන 20.73 ක් වූ මුළු අත්තිකාරම් මුදලින් රු.මිලියන 14.26 ක් හෝ සියයට 69 ක් මේ දක්වා පියවා නොතිබුණි.

## කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය**

2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වාරියපොල කළුගමුව මාර්ගයේ ගොන්නව පාලම සිට බමුණාකොටුව මංසන්ධිය දක්වා සහ බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘති සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2014 වර්ෂයේදී පිළිවෙළින් රු. මිලියන 9.62 ක් හා රු. මිලියන 4.74 ක් වූ ගෙවා

තිබුණි. මණ්ඩලයට මුදල් ගෙවා වසර 10 කට ආසන්න කාලයක් ගතව තිබුණද මෙම ව්‍යාපෘතිවලින් ජනතාවට ජලය ලබාගැනීමට නොහැකිව තිබූ නිසා වැයකරන ලද රු. මිලියන 14.38 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි.

**නිෂ්කාර්ය ගොඩනැගිලි**

කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19ක හා රජයට අයත් ගොඩනැගිලි 60 ක් සහිත අක්කර 80 ක් පමණ ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදානොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**ඉඩම් අත්පත්කර ගැනීම්**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කුලියාපිටිය (බටහිර), කොබෙයිගනේ, පන්නල, මල්ලවපිටිය සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති 45 ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වර්ෂ 02 සිට වර්ෂ 47 දක්වා කාල පරාසයන් තුළ ප්‍රමාද වී තිබූ නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**සම්පත් පැතිකඩ**

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 30 හි සම්පත් පැතිකඩ අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ 2022 දෙසැම්බර් 31 දින වන විට තාවකාලික නිවාස 4,744 ක්, අනවසර පදිංචි 6,596 ක්, විදුලිය රහිත නිවාස 3,908 ක්, අනාරක්ෂිත ළිං 17,372 ක්, අර්ධ ස්ථිර නිවාස 33,513 ක්, වල වැසිකිළි 3,818 ක්, වැසිකිළි නොමැති නිවාස 7,654 ක්, පදිංචියට නිවසක් නොමැති පවුල් 4,505 ක් පැවතියද, දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම ගැටළුවලට විසඳුම් ලැබෙන පරිදි යෝජනා සකස් කර ප්‍රතිපාදන උපයෝජනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බව නිරීක්ෂණය විය.

**ඉඩම් පවරාදීමේ කටයුතු**

බමුණාකොටුව, මහව සහ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ග්‍රාම සේවා වසම් 08 ක් තුල පිහිටි රජයේ ආයතනවලට අදාල ඉඩම් හා ගොඩනැගිලි එම ආයතන වෙත පවරා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත්ව වර්ෂ 3 සිට වර්ෂ 13 දක්වා කාලයක් ගත වී ඇතත්, එම ඉඩම් පවරාදීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**බහුකාර්ය සංවර්ධන සහායකයින්**

සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථිර පත්වීම් නොලැබූ බහුකාර්ය සංවර්ධන සහායකයින් 324 ක ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටියද, අනුමත තනතුරක නිශ්චිත රාජකාරියක සේවයේ යොදවා නොතිබුණි.

## මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වත්කම් ගිණුම්ගත නොකිරීම**

2023 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.මිලියන 106.87 ක්වූ කාර්යාල ගොඩනැගිලි, ඉඩම, රජයේ නිවාස, සන්නිවේදන උපකරණ, පරිගණක හා උපාංග, ලී බඩු,

කෘෂිකාර්මික උපකරණ සහ විදුලි උපකරණ හා එකතුව රු.මිලියන 58.88 ක් වූ මගී ප්‍රවාහන රථ හා කෘෂිකාර්මික වාහන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබීමෙන් දේපල පිරියත හා උපකරණ සහ දේපල පිරියත උපකරණ සංචිතය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

**වත්කම් තක්සේරු නොකිරීම**

වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඉදිකර තිබූ රජයේ නිවාස හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු පරිපාලන නිලධාරී නිල නිවාසය හා එය පිහිටි ඉඩම තක්සේරු කර එම වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත්කර නොතිබුණි.

## නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**නාය යෑමේ අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් ඉවත් කිරීමේ ව්‍යාපෘති**

නාය යෑමේ අධි අවදානම් කලාපයක් ලෙස 2017 වර්ෂයේ හඳුනාගෙන තිබුණු අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හැටන්, සමනළගම ස්ථානයේ පවුල් 12 ක් එම ස්ථානයෙන් ඉවත් කිරීමට තීරණය කර ඉන් පවුල් 06 ක් සඳහා රජයේ ඉඩමක නිවාස ඉදිකිරීමට රු.මිලියන 6.3 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 06ක් ගතව ඇතත් ඉදිකිරීම් කටයුතු අවසන් නොකර අතර මග නවතා තිබුණි .

තවද, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2019 වර්ෂයේ ඉවත් කරනු ලැබූ පවුල් 04 කට කළුගල මිල්ලගහමුල ප්‍රදේශයේ ඔවුන් විසින් මිලදී ගත් ඉඩම්වල නිවාස ඉදිකිරීමට සහ ඉඩම මිලදී ගැනීම සඳහා රු.මිලියන 2.7 ක් ගෙවා තිබුණද, 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 30ක පමණ පහල මට්ටමක පැවතුණි.

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

රජය ලබාදෙන රුපියල් ලක්ෂ 04ක මුදලින් ප්‍රතිලාභියා විසින් මිලදී ගන්නා ඉඩමක රජය විසින් ලබාදෙන මූල්‍යාධාර මත නිවාසයක් ඉදිකිරීමේ අවස්ථාව යටතේ , ආපදා සහන සේවා ඒකකය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අවදානම් ලෙස හඳුනාගත් පවුල් 159 ක් සඳහා නිවාස ඉදිකර නැවත පදිංචි කිරීමට සැලසුම් කර තිබුණි. එයින් පවුල් 115 ක් නැවත පදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම රජය විසින් නිවාස ඉදි කර දීමේ වැඩසටහන යටතේ, ආපදා සහන සේවා ඒකකය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පවුල් 970 ක් වර්තමාන පදිංචි ස්ථානයෙන් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද ,ඉන් පවුල් 798 ක් ආරක්ෂිත ස්ථානයන්හි ස්ථාන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**උසාවි තීන්දු අනුව ඉඩම් සන්තකය පවරා නොගැනීම**

1981 අංක 58 දරන සහ 1983 අංක 29 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත අනුව බ්ලැක්පූල් ස්ථානයේ අනවසර පදිංචිකරුවන් ඉවත් කර අදාල ඉඩමේ සන්තකය පවරා ගැනීමට නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 76818 දරන නඩුවට අදාලව 2006 නොවැම්බර් 28 දින ලබාදී තිබුණු තින්දුව හා 2010 ඔක්තෝබර් 01 දින නුවරඑළිය මහාධිකරණය විසින් ලබාදී තිබුණු තීන්දුව අනුව, සන්තකය පවරා ගැනීමට 2024 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනිම**

තලවාකැලේ හා නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනයේ ඇතුළත් කර සිටි වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දීමනා ඉල්ලුම්කරුවන් 881දෙනෙකු සඳහා ලබාදිය යුතු වූ 2023 ජූලි හා අගෝස්තු මාසවලට අදාල රු.මිලියන 8.8 ක දීමනා අදාල ප්‍රතිලාභීන්ට ගෙවා නොතිබුණි.

## පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාබනික පොහොර බෙදාහැරීම**

පරිසර හිතකාමී පොහොර බෙදාදීමේ වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ 2022 යල කන්නයේදී රු.මිලියන 298.1 ක් හා 2022/2023 මහ කන්නයේදී රු.මිලියන 681.4 ක් වටිනා කාබනික පොහොර නිර්දේශිත කාල සීමාව තුළ හා නිර්දේශිත ප්‍රමිතින්ට අනුකූලව නිකුත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පුලස්තිගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවින් 211 ක් වෙත 2022 යල කන්නයේදී හා 2022/23 මහ කන්නයේදී බෙදාදීමට තිබූ රු.මිලියන 9.5 ක් වටිනා කාබනික පොහොර ගොවීන් විසින් රැගෙනයාම ප්‍රතික්ෂේප කිරීම මත විනාශ වෙමින් පැවතුණි.

**වී මිලදී ගැනීම්**

2021 යල කන්නයේදී පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් හරහා ගොවීන් වෙතින් වී මිලදී ගෙන, මිලට ගත් වී තොග සහල් කර නැවත රජය වෙත භාර දීමේ වැඩසටහන යටතේ දිඹුලාගල, තමන්කඩුව, ලංකාපුර, ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වී මිලදි ගෙන තිබුණි. එසේ මිලදී ගත් වීවලින් භාණ්ඩාගාර ලේකම්ගේ 2021 ජූලි 22 දිනැති අංක **DFD/Paddy/**2021-3 චක්‍රලේඛයේ 7(1) වගන්තිය ප්‍රකාරව රු. මිලියන 215 ක් වටිනා සහල් කිලෝ මිලියන 2.18 ක් රජයට ලබාදීමට වී මෝල් හිමියන් විසින් කටයුතු කර නොතිබුණි.

2021 යල කන්නයේදී සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් 19 ක් හරහා ගොවීන් 294 ගෙන් වී ලබාගත් බවට අධීක්ෂණ කටයුතු භාර

සංවර්ධන නිලධාරීන් මඟින් අදාළ ආකෘති පත්‍ර සකස් කර, වී සඳහා රු.මිලියන 87.46 ක් හා ඇසුරුම් මලු හා වියලුම් කුලී ලෙස රු.මිලියන 7.68 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් මඟින් ගෙවීම් කර තිබූ නමුත් එම වී ලබා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම**

පිබිදෙමු පොළොන්නරුව රජරට නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 1,303.86ක කොන්ත්‍රාත් වටිනාකමට පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත 2016 දෙසැම්බර් 15 වන දින ප්‍රදානය කර තිබුණි. එම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 15දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද, 2023 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් අවසන් කරහාර දී නොතිබුණු අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 79 ක් හා සියයට 94 ක් වී තිබුණි.

**හිඟුරක්ගොඩ බස් නැවතුම්පල ඉහල මහල ඉදි කිරීම**

හිඟුරක්ගොඩ බස් නැවතුම්පල ඉහල මහල ඉදි කිරීමේ ව්‍යාපෘති කටයුතු පිබිදෙමු පොළොන්නරුව රජරට නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ 2019වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණි .එහිදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදෙස් නොසලකා හැර ව්‍යාපෘති භාර නිලධාරින් කටයුතු කිරීම නිසා තාක්ෂණික දෝෂ පැන නැඟීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි .මේ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කර තිබූ රු.මිලියන 11.17 ක මුදල නිෂ්කාර්ය වී තිබුණු බව නිරීක්ෂණය විය.

## පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන**

කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ 2021 හා 2022 වර්ෂවල එකතුව රු.මිලියන 6.84 ක් වැයකර ඉදිකර තිබුණු කන්දකුලිය අගය එකතු කල කරවල නිෂ්පාදන ගම්මානය 2023 දෙසැම්බර් 31 දින වන විටද කරවල වේලීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

**ප්‍රමාද පොළී ගෙවීම**

ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැඟිල්ලේ රු. මිලියන 28.37 ක් වූ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් බේරුම් කරන ක්‍රියාවලියෙන් පසු එම බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොළී ලෙස රු.මිලියන 10.35 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

## රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **ගංවතුර හා නායයෑම් නිසා හානියට පත් නිවාස වෙනුවෙන් වන්දි නොගෙවීම** | ගංවතුර හා නායයෑම් නිසා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ හානියට පත් නිවාස වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල් රු.මිලියන 338.40 ක් විය. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු රු මිලියන 312.44 ක ශේෂයක් ද මෙම ශේෂය තුළ පැවැති අතර වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම ගෙවීම් ප්‍රමාදයට හේතු වී තිබුණි. |
| **රජයේ නිවාස අභාවිතව පැවතීම** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 07ක් වර්ෂ 05කට වැඩි කාලයක සිට අභාවිතව තිබීම නිසා එම නිවාස කැලෑවෙන් වැසී පැවති අතර දොර ජනෙල් සොරුන් රැගෙන ගොස් තිබුණි. එම නිවාස මත්ද්‍රව්‍ය ඇතුළු විවිධ දුරාචාර සඳහා භාවිතා කරන අතර අනවසරකරුවන් පදිංචි වීමේ අවදානමක් ද පැවැතිණි. නිවාස පොරොත්තු ලේඛනයේ සිටින නිළධාරීන් 77 දෙනෙකුට රජයේ නිවාස ලබා ගැනීමේ ප්‍රමාදයක් ද පැවැතිණි. |
| **තරඟකාරී ලංසු නොකැඳවීම** | කුරුවිට නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ ජලනල එලීමේ ව්‍යාපෘතිය, සඳහා තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව රු.මිලියන 11.96 ක් වූ කොන්ත්‍රාත්තුව කොටස් 04කට බෙදා ප්‍රජා මූල සංවිධාන වෙත පවරා තිබුණි. එමෙන්ම, බට අතුරා නැවත පිරවීමේදී පැවැති පස් යෙදීම පිළිබඳ අධ්‍යයනය කිරීම වෙනුවට මිල අධික වැලි යොදා කානු පිරවීම නිසා කොන්ත්‍රාත් වටිනාකමින් රු.මිලියන 9.67ක් එනම් සියයට 87ක් වැනි විශාල පිරිවැයක් මේ සඳහා දැරීමට සිදු වී තිබුණි. |
| **ව්‍යාපෘති අසාර්ථක වීම්** | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 09ක පවුල් ඒකක 973ක් වෙත කුකුළු පැටවුන් 10522 ක් ලබා දී තිබුණි. ඉන් රු. මිලියන 1.49 ක පැටවුන් 3288 ක් මිය ගොස් තිබීම, පැටවුන් මිල දී ගැනීමට පෙර රජයේ පශු වෛද්‍ය නිර්දේශය ලබා නොතිබීම, පසුවිපරමක් නොතිබීම, කෑම මිල අධික නිසා වෙනත් ආහාර දීමෙන් බිත්තර නොදැමීම, ප්‍රසම්පාදන පිරිවිතරයන්ට අනුව කිකිළි පැටවුන් 09කට එක් කුකුළෙකු යන අනුපාතය අනුගමනය කර නොතිබීම ආදී හේතු මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. |
| **ප්‍රමිතිගත නොවූ ඉදිකිරීම්** | ඕපනායක සංස්කෘතික මධ්‍යස්ථානයේ වේදිකාව ප්‍රමිතියකට ඉදිකර නොතිබුණු අතර වේදිකා රාමුව මත විසුරුවා තිබුණු බොහෝ ලෑලි දිරාපත්ව පැවැතිණි. මේ නිසා ප්‍රමිතිගත වේදිකාවක් ඉදිකරන තෙක් මෙම සංස්කෘතික මධ්‍යස්ථානය භාවිතා කළ නොහැකි වූ අතර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කළ රු.මිලියන 4.11 ක මුදල නිෂ්ඵල වී තිබුණි. |

**අවිධිමත් මුදල් අයකිරීම් හා වැයකිරීම්**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කළ අමාදහර පොසොන් කලාපය 2023 සඳහා අවිධිමත් ලෙස මූල්‍ය කමිටුවක් පිහිටුවා මුදල් රෙගුලාසි 170(2) ට පටහැනිව ලදුපත් නිකුත් කිරීමකින් ද තොරව මහජනතාවගෙන් රු.මිලියන 1.3 ක් අයකර තිබුණි. එම මුදලින් රු.මිලියන1.29 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් හා වවුචර් පිළියෙල කිරීමකින් තොරව වැයකර තිබුණි.

## වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ආර්ථික මධ්‍යස්ථානය අභාවිතව පැවතීම**

2018 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව, රු.මිලියන 291.639 ක් වැය කරමින් ඉදිකරන ලද වවුනියාව ආර්ථික මධ්‍යස්ථානය 2023 දෙසැම්බර් 31 දක්වා පොදු භාවිතය සඳහා විවෘත කර නොතිබුණි. කෙසේ වුවද, මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා ගාස්තු, පිරිසිදු කිරීමේ ගාස්තු සහ ජල ගාස්තු වශයෙන් එකතුව රු.මිලියන 7.85 ක් පසුගිය වසර 06 සඳහා ගෙවා තිබුණි.

**බදු කුලී අය නොකිරීම**

දීර්ඝකාලීන බදු පදනම මත රජයේ ඉඩම වසර 12ක කාලයක් සඳහා බදු දීම වෙනුවෙන් කුලිය සහ දඩ මුදල් එකතුව වශයෙන් වවුනියාව ලංකා බැංකු ශාඛාවෙන් ලැබිය යුතු රු. මිලියන 45.39ක මුදලක් අය කිරීමට වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

**අතරමඟ නතරකර ඇති ව්‍යාපෘති**

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පෙරපාසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු රු. මිලියන 2 ක වටිනාකමකින් යුක් කොන්ත්‍රාත්තුවක් මගින් 2019 වර්ෂය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණු අතර එසේ වුවද, වැඩ සම්පූර්ණ කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1.55ක මුදලක් වැය කර තිබුණු අතර එය ඵලරහිත වියදමක් වී තිබුණි

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම**

2022/2023 මහකන්නයේ රජයේ වී මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක DFD/2023-1 දරන 2023 පෙබරවාරි 09 දිනැති චක්‍රලේඛයේ 2.3.2 ඡේදය අනුව අතැති වී තොග 2023 මාර්තු හා අප්‍රේල් මාස ඇතුළත බෙදාහැරීමට හැකි පරිදි සහල් බවට පත් කර අවසන් කිරීමට කුඩා හා මධ්‍යම වී මෝල් හිමිකරුවන්ගේ ධාරිතාව සැලැකිල්ලට ගෙන වී මිලදී ගැනීමට අවශ්‍ය මුදල් අදාල වී මෝල් හිමිකරුවාට ගෙවිය යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වුවත්, 2023 ඔක්තෝබර් 12 දිනැති විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පදවි ශ්‍රී පුර

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි වී මෝල් ගබඩාවක එකතුව රු.මිලියන 42.74 ක් වූ කිලෝග්‍රෑම් 427,440ක වී තොග පූර්ව මාස හයකට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.

2019/2020 මහ කන්නයේ වී මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන් සහ ලංකා සතොස ආයතනයෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු. මිලියන 6.49ක් වූ සහල් කිලෝග්‍රෑම් 77,146කට අදාල මුදල් වර්ෂ 03ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.

## යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**මද්දුවිල් ආර්ථික මධ්‍යස්ථානය අභාවිතව පැවතීම**

අනුපිළිවෙළින් 2018 සහ 2020 වර්ෂවල අමාත්‍යාංශ දෙකක් විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් 2021 වර්ෂයේදී රු.මිලියන 196.04 ක් වැයකර යාපනය, මද්දුවිල් ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර තිබුණි.කෙසේ වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා ආර්ථික මධ්‍යස්ථානය පොදු භාවිතය සඳහා ක්‍රියාත්මක කර නොතිබුණි.

**අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වසරේ දී අමාත්‍යාංශයක් විසින් ලබා දී තිබූ රු.මිලියන 75.32ක අරමුදල් මගින් චුන්නාකම් ප්‍රදේශයේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. 2019 වර්ෂය වන විට අවසන් කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘතිය රු.මිලියන 65.95 ක් වැය කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දක්වාත් එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

# වැවිලි අංශය

විශේෂී ජාත්‍යන්තර වෙළෙඳපොළ බණ්ඩ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත,ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැවිලි භෝග සංවර්ධනය, රටට උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහල නැංවීම, වගාකරුවාගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම අරමුණු කරගෙන වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මගින් ජාතික සෞභාග්‍යය උදාකිරීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දැක්ම වී තිබුණි. මෙම අමාත්‍යාංශයට අදාළ දෙපාර්තමේන්තු 02ක් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන 28ක් පැවතිණි. මෙම අමාත්‍යාංශය හා ආයතන විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම, ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කරගත් වැවිලි භෝග මත පදනම්ව වූ අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

තේ,රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු

තේ, රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම, තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම

වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම.

රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් ද ඇතුළත්ව ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම.

දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.

වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම

කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

බහු භෝග වගාවන් සහ සංගත ගොවිපළ ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.

# විගණන නිරීක්ෂණ

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**හිඟ බදු ආදායම්**

1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 10කින් රජයට අයවිය යුතු රු.මිලියන 587ක බදු ආදායම හිඟව පැවතුණි.

**කුරුණෑගල වැවිලි සමාගම**

1995 නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකර ගෙන තිබූ අංක 1558 දරන කල් බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් මත ගණනය කළ බදු කුලිය, වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතු විය. වර්තමානයේදි ශුද්ධ වත්කම් අඩුවී ඇති බව දක්වමින් සමාගම විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 326.5 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු අතර එයින් රු.මිලියන 168 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

**බැඳුම්කර අයනොකිරීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4:7 වගන්තිය අනුව අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ 06 සිට වර්ෂ 33 දක්වා කාලපරාසයන් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.මිලියන 4.2 ක් 2024 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

**ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතිය**

කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ 2017 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කළ යුතුව පැවතුණි. එහෙත් නියමිත කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු.මිලියන 10.4 කින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු.මිලියන 4.2 ක් එනම් සියයට 40ක් නිශ්කාර්යව පැවතුණි.

**අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානය**

රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය හරහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා රු.මිලියන 49.7ක් වැය කර ආරම්භ කර තිබුණු අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයේ (FEAS CENTER) කාර්යයන් 2023

ඔක්තෝම්බර් මාසයේ සිට සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණි. එබැවින් අදාල ගොඩනැගිල්ල හා රු.මිලියන 38.9ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලිබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතිණි. තවද එම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණු වූ ගෝලීය වෙළඳපල තුළ ඵලදායී ලෙස තරඟ කිරීමට ශ්‍රී ලංකාවේ ස්වභාවික හා කෘතීම රබර්වලට අගය එකතුකිරීම සඳහා, රබර් නිෂ්පාදනවල නිර්මාණය හා අනුකරණ (simulation) සඳහා අංශුමාත්‍ර පරිමිත සේවා භාවිතා කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය සහ කළාපයට අංශුමාත්‍ර පරිමිත සේවා සැපයීමේ විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

## පොල් සංවර්ධන අධිකාරිය

**තත්ත්ව පරීක්ෂාවන් සිදු නොකිරීම**

1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය හා 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛනයේ 3 වන ඡේදය ප්‍රකාරව අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කළ යුතු වුවද 2023 වර්ෂයේදී එ. ජ. ඩොලර් 277,510 ක් වූ පොල් ආශ්‍රිත නිෂ්පාදන (දිසිදි පොල් හැර) මෙ.ටො. 172,685 ක් අපනයනය කර තිබුණද ඒ පිළිබඳ තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

**විශේෂ වෙළඳපලවල් සඳහා අපනයන තත්ත්ව පරීක්ෂාවන්**

1987 දෙසැම්බර් 10 දිනැති අංක පොසංඅ/දිපො/මෝ/87/15 අභ්‍යන්තර චක්‍රලේඛයෙහි 3 හා 4 වගන්ති ප්‍රකාරව ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි විශේෂ වෙළඳපලවල් සඳහා අපනයනය කරන්නා වූ දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම, ආදර්ශ ගැනීම, තත්ත්වය සහතික කිරීම සඳහා දෛනික නිෂ්පාදනයෙන් සියයට 25ක ආදර්ශ එකතු කිරීමත් එසේ එකතු කරනු ලබන ආදර්ශ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල දැයි පරීක්ෂා කිරීමත් සිදු කළ යුතු වේ. එසේ වුවද, 2023 වර්ෂය තුළදී දිසිදි පොල් මෙ.ට්‍රො 5,082 ක් එම රටවලට අපනයනය කර තිබුණද පරීක්ෂා කිරීම සඳහා ආදර්ශ එකතු කිරීම සියයට 10 ක් පමණක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය**

කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. එහෙත් 2023 වර්ෂයේදී එහි පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණු අතර කර්මාන්ත ශාලාවේ පවතින

යන්ත්‍ර 18 න් 14ක් අක්‍රියවද අනෙකුත් යන්ත්‍ර අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේද පැවතීම තුළින් පුහුණු මධ්‍යස්ථානය පිහිටු වීමේ අරමුණු ඉටු නොවන බවත් පවතින වත්කම් සියල්ල නිශ්කාර්යව දිරායමින් පවතින බවත් නිරීක්ෂණය විය.

## පොල් පර්යේෂණ ආයතනය

**බැඳුම්කර අයනොකිරීම්**

අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවී නැවත නොපැමිණි නිලධාරීන් 08 දෙනෙකු හා අනිවාර්ය සේවා කාලය අඩුවෙන් සම්පූර්ණ කරන ලද එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 45.7 ක මුදල 2023 වර්ෂය අවසාන වන විටත් අය කරගෙන නොතිබුණි.

**කිනියම ව්‍යාපෘතිය**

පර්යේෂණ ආයතනයට අයිති කිනියම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අක්කර 141 ක සමස්ථ භූමි ප්‍රමාණය ආවරණය වන ආකාරයට නල ජල පද්ධතියක් සවි කර තිබු අතර ඒ සඳහා පෞද්ගලික සමාගමකට රු.මිලියන 21 ක් ගෙවා තිබුණි. එහෙත් අවශ්‍ය ධාරිතාවය නොමැති වීම හා නළ පද්ධතියේ කොටසක් අක්‍රීය වීම හේතුවෙන් සිටුවන ලද ගස්වලින් ගස් 400 කට එනම් සියයට 5 ක් වැනි සුළු ප්‍රමාණයකට පමණක් මෙමඟින් ජලය සැපයීම සිදුකළ හැකිව තිබූ අතර ඉතිරි සියයට 95 සඳහාම බවුසර මඟින් ජලය සැපයීමට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ගෝලීය තේ වෙළඳපොළ කොටස පහත වැටීම**

ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය හා අපනයනය ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදි සියයට 18 ක් වූ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) 2023 වර්ෂය වන විට සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2023) අනුව නිරීක්ෂණය වුවද වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් සුදුසු ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන්**

“සිලෝන් ටී” සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ඉහල මට්ටමේ ප්‍රචාරණය සඳහා රූපවාහිනි මාධ්‍යය යොදාගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් රූපවාහිනි වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීමට හා ඒවා චීන, ජපන්, අරාබි, යුක්රේන්, ජර්මන් සහ තුර්කි භාෂා හයට පරිවර්තනය කිරීමට 2016 සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 174.3ක් වැයකර තිබුණි. කෙසේවුවද, එම වෙළෙඳ දැන්වීම ප්‍රචාරණය වෙනුවෙන් මාධ්‍ය ආයතනවලට ගෙවීම් කිරීමට අදාළ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම දැන්වීම් මාධ්‍ය ප්‍රචාරය කළ බවට තහවුරු නොවුණි. තවද, රු.මිලියන 39.8 ක

වියදමින් නිර්මාණය කරන ලද ඩිජිටල් නිශ්පාදන, ඩිජිටල් වීඩියෝ පට, පෝස්ටර් නිර්මාණ ආදී නිර්මාණාත්මක කාර්යයන් 31 ක්ද 2023 වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර නොතිබුණි.

**මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම**

ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2019 සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 107 ක මුදලක් වැයකර තිබුණි. නමුත් සකස් කර තිබූ මාධ්‍ය සැළසුම් අතුරින් චීලී රාජ්‍ය සඳහා ඉදිරිපත් කර තිබූ මාධ්‍ය සැලසුම හැර අනෙකුත් රටවල් 10 ක් සඳහා ඉදිරිපත් කර තිබුණු මාධ්‍ය සැළසුම්වල සඳහන් කාල වකවානු 2023 වර්ෂය අවසාන වන විට ඉකුත් වී තිබුණු නමුත් සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

**නිදහස් වෙළඳ ගිවිසුම්**

ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් 2021 සිට 2023 දක්වා වාර්තාකර නොතිබුණි. තවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්දියාවට සහ පාකිස්ථානයට සිදුකළ අපනයන ප්‍රමාණය පිළිවෙලින් සියයට 10 කින් හා සියයට 100 කින් අඩුවී තිබුණි.

**තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම**

තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා රු.මිලියන 53.9 ක වටිනාකමකට 2020 වර්ෂයේදී පුද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂකගේ (තොරතුරු තාක්ෂණ) තහවුරුකිරීම් මත එකතුව රු.මිලියන 15.7 ක් 2023 දෙසැම්බර් 31 වනවිට කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මාස 18 කදී කාර්යය නිම කල යුතු වුවද වසර 03 කට ආසන්න කාලයක් ගත වුවද මෙම තොරතුරු තාක්ෂණ පද්ධතිය සකස් කර නොතිබුණි. එසේම මෙම පුද්ගලික ආයතනය විසින් ලබා දුන් රු.මිලියන 26.9 ක කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය 2022 අප්‍රේල් 30 දින වන විට අවසන් වී තිබුණි.

**කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයේ අලාභය**

2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයෙන් මණ්ඩලයට රු.මිලියන 62.6 ක අලාභයක් සිදු වී තිබූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරික්ෂාකාරී ලෙස කටයුතු කළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් ණය**

2012 ජුනි 19 දින පැවති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 11 ප්‍රකාරව මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.මිලියන 25 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි “Ceylon Tea Museum” හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට තීරණය කර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විට අදාළ නියෝගය නිකුත්කර වර්ෂ 10 කට වැඩි කාලයක් ගතව තිබුණද වත්කමෙහි හිමිකම පවරා ගැනීමට හෝ ණය මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා දුන් රු.මිලියන 10 ක ණය මුදලින්ද රු.මිලියන එකක් පමණක් අයකරගෙන තිබුණි.

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**නිශ්කාර්ය වත්කම්**

2020 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.මිලියන 3.5ක ව්‍යාපෘති ද්‍රව්‍ය හා 2020 හා 2021 වර්ෂයන්හිදී කුඩා තේවතු හිමියන් වෙත බෙදා දීමට ලැබුණු රු. මිලියන 6 ක දියර ඉසින යන්ත්‍ර හා වතුර පොම්ප නිශ්කාර්යව ගබඩාවේ පැවතුණි.

2021 වර්ෂයේදි “ව්‍යාප්ති අංශයේ ජංගම ප්‍රචාරණ රථයේ අභ්‍යන්තර උපකරණ සවිකිරීමේ ප්‍රසම්පාදනය'' සඳහා පුද්ගලික සමාගමකට රු.මිලියන 4.9 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර එහි ගිවිසුම ප්‍රකාරව ප්‍රචාරණ රථයේ විදුලි සැපයුම ලබාගැනීම සඳහා විදුලි ජනක යන්ත්‍රයක් සවිකළ යුතු වුවද, විගණන දින වන විටත් විදුලි ජනක යන්ත්‍රය සවිකර නොතිබූ අතර මිලදී ගත් රු.මිලියන 1.8ක් වටිනා ඩිජිටල් තිරයද (LG Panel 55 video wall) අක්‍රීයව අධිකාරියේ ගුවණාගාරයේ තබා තිබුණි.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**සේවක අර්ථසාධක හා භරකාර දායක නොගෙවීම**

2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.මිලියන 689 ක සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල්, රු.මිලියන 49.7 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සහ ඊට අමතරව රු.මිලියන 73ක්වූ වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල් සහ රු.මිලියන 18ක් වූ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයේ දායක මුදල්ද 2023 වර්ෂය අවසන් දින දක්වා ගෙවා නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු වතු අංශයේ අධිභාර වටිනාකම පිළිවෙලින් රු.මිලියන 78ක් හා රු.මිලියන 9 ක් වී තිබුණි.

ඩකුළ

**හිඟ පාරිතෝෂික ගෙවීම්**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තියට අනුකූලව සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වේ. එහෙත් සංස්ථාව විසින් පසුගිය වර්ෂ කිහිපයක සිට සහ 2023 වර්ෂයේදී පාරිතෝෂික නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම රු.මිලියන 629 ක්ද ඒ සඳහා වූ අධිභාර රු.මිලියන 25.8ක්ද වී තිබුණි. ඉහත අරමුදල් නොගෙවීම නිසා ඒ සම්බන්ධ නඩු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා රු.මි. 1.9 ක නීතිඥ ගාස්තු ගෙවීමටද සංස්ථාවට සිදුවී තිබුණි.

**අපේක්ෂිත තේ අස්වැන්න නොලැබීම**

2023 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුළු තේ අස්වැන්න කිලෝග්‍රෑම් 5,089,282 ක් වූ අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 24 කින් පමණ පහළ යාමකි. එසේම 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් 9,170,548ක අස්වැන්නක් ලබාගැනීමට ඇස්තමේන්තු කර තිබුණද සියයට 55ක ඉලක්කයක් පමණක් ලඟාකරගෙන තිබුණි. බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණයෙන් තේ කිලෝග්‍රෑම් 940,151ක අස්වැන්නක් අපේක්ෂා කර තිබුණද සත්‍ය වශයෙන් ලබාගෙන තිබුණේ තේ කිලෝග්‍රෑම් 364,597 ක් පමණි. එය අපේක්ෂිත තේ අස්වැන්න හා සැසඳීමේදී සියයට 61ක අඩුවීමකි. සංස්ථාව සතු වතුයායන් 14න් වතු 13ක 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය සියයට 03 සිට සියයට 444 දක්වා ඉහල ගොස් තිබුණි.

**වතුයායන් 16න් 8ක්ම අලාභ ලැබීම**

සංස්ථාව සතු වතුයායන් 16න් 8ක්ම 2023 වර්ෂයේදී අලාභ තත්ත්වයේ පැවති අතර ගෝමර හා කැලෑබොක්ක වතුයායන් 2022 වර්ෂයේ පිළිවෙලින් රු.මිලියන 8.9ක හා රු.මිලියන 31ක ලාභ ලැබුවද 2023 වර්ෂයේදී රු.මිලියන 46.7ක හා රු.මිලියන 16.8ක අලාභ ලබා තිබුණි. සංස්ථාවේ සේවක පිරිවැය මුළු පිරිවැය හා සැසඳීමේදී සියයට 50කට වැඩි අගයක් ගෙන තිබුණු අතර හෙයාපාර්ක් වතුයායේ සේවක පිරිවැය එහි මුළු පිරිවැයෙන් සියයට 98 ක්ද එහි විකුණුම් පිරිවැයට සාපේක්ෂව සියයට 112 ක් ගෙන තිබුණි. හුන්නස්ගිරිය, රංගල, හාගල හා වුඩ්සයිඩ් යන වතු යායන්හි සේවක පිරිවැය එම වතුයායන්වල මුළු පිරිවැයෙන් සියයට 80 කට වැඩි මට්ටමක පැවතීම වතුයායන්වල අලාභයට ඍජුවම බලපා තිබුණි.

**නිෂ්කාර්ය කර්මාන්තශාලා**

වර්තමානය වන විට සංස්ථාවේ තේ කර්මාන්තශාලා 09 ක් පැවතිය ද ඉන් කර්මාන්තශාලා 03 ක පමණක් නිෂ්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර කර්මාන්තශාලා 05 ක් දීර්ඝ කාලයක සිට වසා තිබුණි. එක් තේ කර්මාන්තශාලාවක් 2022 ඔක්තෝබර් සිට නඩත්තු කටයුතු වෙනුවෙන් වසා තිබුණු අතර භාවිතයට නොගන්නා ගෝමර වතු

යාගේ නකල්ස් බංගලාව නැරඹුම් ස්ථාන කිහිපයකට මැදිව තිබුණද එම බංගලාව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

## කුරුණෑගල වැවිලි සමාගම

**නිෂ්කාර්ය වත්කම්**

හිරියාල පළාත් වතු කාර්යාලයට අයත් වතු 07 ක සවිකිරීමට 2023 දෙසැම්බර් මාසයේ මිලදීගෙන තිබුණු රු.මිලියන 0.97 ක් වටිනා CCTV කැමරා උපකරණ, අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන ගනේවත්ත ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි.

## හලාවත වැවිලි සමාගම

**ණය හා පොළී කපාහැරීම්**

හලාවත වැවිලි සමාගම විසින් 2010 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට, ඇල්කඩුව වැවිලි සමාගමට, රාජ්‍ය වැවිලි සංස්ථාවට, රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට හා රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට ලබා දුන් එකතුව රු.මිලියන 105ක ණය මුදල් හා එම පොළී රු.මිලියන 119.7ක් 2014 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පමණක් පූර්ණ හානිකරණයක් වශයෙන් සලකා කපාහැර තිබුණි.

## ජනතා වතු සංවර්ධන මණ්ඩලය

**ජීව විද්‍යාත්මක වත්කම් වාර්ෂිකව සංගණනය හා තක්සේරු නොකිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මූලිකව හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවද මණ්ඩලය විසින් රු.මිලියන 33 ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම එලෙස වාර්ෂිකව තක්සේරු නොකර ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. එම අගය සත්‍යාපනය කර ගැනීම සඳහා ද වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ගස් සංගණන හා තක්සේරු වාර්තාද විගණනයට ඉදිරිපත් නොවීය. එසේම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් මණ්ඩලය විසින් පාලනය කරනු ලබන වතුයායන් 18 කට අදාල හෙක්ටයාර 11,585.44 ක ඉඩම්වල වටිනාකමද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

**අලාභ හා ව්‍යවස්ථාපිත වගකීම්**

අඛණ්ඩව අලාභ ලැබීම මත 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.මිලියන 607.02 ක් හා රු.මිලියන 1,795.70 ක් වශයෙන් සෘණ අගයන් ගෙන තිබුණු

අතර එදිනට පැහැර හරින ලද ව්‍යවස්ථාපිත ගෙවීම් රු.මිලියන 1,513.49 ක්ද වී තිබුණු බැවින් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පැවතුණි. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වගකීම රු.මිලියන 2,883.43ක් දක්වා වැඩිවී තිබුණි.

**ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද පෞද්ගලික ආයතනයක් සඳහා 2022 – 2024 කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට රු.මිලියන 2ක් ගෙවා තිබුණි. එම ආයතනය විසින් සකස් කළ සැලැස්ම තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි අරමුණු හා කාර්යයන් ඇතුළත් වීම හේතුවෙන් එය රේඛීය අමාත්‍යාංශය විසින් එය අනුමත කර නොතිබුණි. මෙම සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබූ නමුත් ව්‍යාපාර සැලැස්මේ ප්‍රගතිය විශ්ලේෂණය කිරීම සඳහා 2022 මැයි මාසයේ සිට වසරක කාලයක් දක්වා රු.මිලියන 2ක්ද ගෙවීම් කර තිබුණි.

**හිඟ බදුකුලී**

හන්තාන තේ කර්මාන්ත ශාලාව පෞද්ගලික ආයතනයකට බදු පදනමට ලබා දී තිබුණු නමුත් 2021 සිට 2024 පෙබරවාරි දක්වා වූ කාලය සඳහා නියමිත පරිදි බදුකුලී ගෙවා නොතිබූ බැවින් හිඟ හිටි බදු කුලිය සහ සියයට 5 ප්‍රමාද ගාස්තු රු.මිලියන 18.8 ක් 2024 පෙබරවාරි 29 දිනට අයවිය යුතුව තිබුණි.

**හිමිකම් නොමැති ඉන්ධන හා ප්‍රවාහන දීමනා ගෙවීම්**

2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි 2021 හා 2022 වර්ෂයන්හි දී ඉන්ධන හා ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති නිලධාරීන් 16ක් වෙත රු.මිලියන 20.9ක් ගෙවීම් කර තිබූ අතර 2023 වර්ෂයේදී එම දීමනා සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 11 ක් වෙත රු.මිලියන 10.25 ක් ගෙවීම් කර තිබුණි. එසේම චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව නිල වාහනයක් හිමි නිලධාරියකුට ආයතනයේ නිල වාහනය පාවිච්චි කිරීම සහ ඉන්ධන දීමනාව ලබා ගැනීම හෝ ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්ප දෙකෙන් එකක් පමණක් තෝරා ගත යුතු වුවද, මණ්ඩලයේ සභාපති විසින් ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව ලබා ගනිමින් මණ්ඩලයේ නිල වාහනයක්ද භාවිතා කරන අතර එම වාහනය සඳහා ඉන්ධන වියදමද ආයතනය විසින් දරනු ලබයි. 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ඉන්ධන හා වාහන දීමනා ලෙස රු.මිලියන 4.4 ක් මණ්ඩලය විසින් සභාපති වෙත ගෙවීම් කර තිබුණි.

**හිඟ බදු ආදායම්**

දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කර තිබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි වලින් මණ්ඩලය වෙත 2023

දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 387.8 ක බදු ආදායමක් හිඟව පැවතුණි.

**අනුමත නොවූ හා අවිධිමත් පත්කිරීම්**

සභාපති අංශයේ රහස්‍ය ලේකම් තනතුරේ සේවය කරන JM 1-1 වැටුප් කාණ්ඩයේ නිලධාරිනියක් 2021 ඔක්තෝබර් 15 දින සිට අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතික්ෂේප කරන ලද තනතුරක් වූ සභාපතිගේ පුද්ගලික සහකාර තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා සභාපති විසින් පත්වීමක් ලබා දී MM 1-1 වැටුප් කාණ්ඩයට හිමි දීමනා සහ 2023 දෙසැම්බර් දක්වා ඉන්ධන, ප්‍රවාහන හා විශේෂ දීමනා ඇතුළුව රු.මිලියන 4.5 ක් එම නිලධාරිනියට ගෙවා තිබුණි. එසේම 2023 නොවැම්බර් සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම නිලධාරිනියට කළමනාකරු (පාරිභෝගික) තනතුර ලබා දී තිබුණි.

# කර්මාන්ත හා නිෂ්පාදන කටයුතු

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් තහවුරු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 02 ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා 11 ක් සහ සමාගම් 08 ක් ක්‍රියාත්මක වනු ලබයි. එම ආයතන විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව පැවතුණි.

**කාර්යභාරයන්**

2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 30 දක්වා ඉහළ නැංවීම.


2030 වන විට නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 20 දක්වා ඉහළ නැංවීම.

2030 දී ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය සියයට 10 දක්වා ඉහළ නැංවීම.

2030 වන විට දළ දේශීය නිෂ්පාදිතදයෙහි කාර්මික අපනයනයන්ගේ දායකත්වය සියයට 20 දක්වා ඉහළ නැංවීම.

2030 වන විට කර්මාන්ත සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණය සියයට 1 දක්වා ඉහළ නැංවීම (ජාත්‍යන්තර සම්මතය සියයට 3) යන අරමුණු ඉටු කර ගැනීමට කර්මාන්ත අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට රු. මිලියන 8,489 ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර 2023 වර්ෂය අවසාන වන විට රු.මිලියන 6,920 ක් පමණක් උපයෝජනය කර තිබු අතර, එදිනට  රු.මිලියන 1,569 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උපයෝජනය කර තිබූ මුදලින් රු.මිලියන 880 ක් කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන් සඳහා ද, එරාවූර් හි රෙදිපිළි නිෂ්පාදන හා ආශ්‍රිත කර්මාන්ත සඳහා විශේෂිත කලාපයක් නිර්මාණය කිරීම සඳහා රු.මිලියන 268 ක් ද , අලිමංකඩ ලුණු ලේවාය වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 100 ක් ද ,  කුඩා හා සුළු කර්මාන්ත නියාමක හා ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 2,594 ක් සහ පාරිසරික හිතකාමී විසඳුම් සඳහා චක්‍රීය අරමුදල වෙනුවෙන් රු.මිලියන 211 ක් ද උපයෝජනය කර තිබුණි.




රූප සටහන් අංක 2.36: කර්මාන්ත අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ වියදම්

## විගණන නිරීක්ෂණ

**කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන් කර නොදීම**

2023 දෙසැම්බර් 31 වන විට කර්මාන්තපුර 17 කට අදාලව අක්කර 109.5ක් වූ ඉඩම් කට්ටි 89 ක් කර්මාන්තකරුවන් වෙත වෙන් කර ලබා නොදීම හේතුවෙන් ඉඩම් නිශ්කාර්යව පැවතුණි.

**කර්මාන්තකරුවන් ඉඩම් සංවර්ධනය නොකිරීම**

බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 43 ක් වෙන් කර තිබුණු අතර ඉන් කර්මාන්තකරුවන් 7 ක් වෙත වෙන් කර දී තිබුණ අක්කර 4 පර්චස් 20.13ක් වූ මුලු ඉඩම් ප්‍රමාණයම කිසිඳු සංවර්ධන කටයුත්තක් සිදු නොකර නිශ්කාර්යව පැවතුණි.

1993 ජූනි 24 දිනැති හා අංක 772/22 ගැසට් පත්‍රයේ අඩංගු ජාතික පාරිසරික පනතේ සඳහන් කොන්දේසි අදාල කර ගනිමින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ හෙක්ටයාර 10 (අක්කර 24) ට වැඩි සංවර්ධන කටයුතු සඳහා පමණක් බවට වන වගන්තිය අනුව රයිගම කර්මාන්තපුරය ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු වේගවත් කරගැනීම සඳහා අක්කර 200ක් වූ මුළු ඉඩමෙන් අක්කර 24 ක භූමි භාගයක් තුල මෙම කර්මාන්තපුරය ඉදිකිරීමට යෝජනා කරමින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක්

ලබා ගැනීමේ අවශ්‍යතාවය බැහැර කරමින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි.

**රයිගම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම**

රයිගම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් තෝරාගත් ආයෝජකයන් අතරින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණු ආයෝජකයන් 4 දෙනෙකු තම ආයෝජනයන් ඉවත් කරගෙන තිබුණි. ඒ හේතුවෙන් රු.මිලියන 1,185.4 ක් ආයෝජනය තුළින් රැකියා අවස්ථා 715 ක් කර්මාන්ත ක්ෂේත්‍රයට එකතු කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

**පරිපාලන ගොඩනැගිලි භාවිතයකින් තොරව පැවතීම**

බටඅත කර්මාන්තපුරයේ හා රයිගම කර්මාන්තපුරයේ පිළිවෙළින් රු.මිලියන 31.66ක් හා රු.මිලියන 87.96 ක වියදමින් පරිපාලන ගොඩනැගිලි 02ක් ඉදිකර තිබුණද වර්තමානය වන විට භාවිතයකින් තොරව වසා දමා තිබුණි.

**බැහැර කරන අපද්‍රව්‍ය මුහුදට යොමු කිරීමේ යෝජනාව සඳහා ජනතා විරෝධතා ඇතිවීම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 105 ක ඉඩමක රු.මිලියන 343.41 ක වැයකර සම් පදම් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා 1999 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කර්මාන්තපුරයක් ස්ථාපිත කර තිබුණි. එහෙත් මෙම කර්මාන්තපුරයෙන් බැහැර කරන අපද්‍රව්‍ය මුහුදට යොමු කිරීමට යෝජනා වී තිබීම හේතුවෙන් අවට ධීවර ජනතාවගේ විරෝධතා නිසා ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ ආයෝජනය කළ ආයෝජකයින් 06 දෙනෙකුට 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 17.55 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

**ඉඩම් ඌන උපයෝජනය**

2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස නැවත කර්මාන්තපුරය සංවර්ධනය කර තිබුණ ද කර්මාන්තකරුවන් 23කට ලබාදුන් ඉඩම් අක්කර 70 රූඩ් 1 පර්චස් 2.3 කින් ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදුකරනු ලබන්නේ ඉඩම් අක්කර 34 රූඩ් 3 ක් ලබාගත් කර්මාන්තකරුවන් 10ක් පමණක් බවත් ඒ අනුව කර්මාන්තපුරයට වෙන් කළ මුලු ඉඩම් අක්කර 105 න් අක්කර 60 කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් උපයෝජනය නොවී නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය. තවද එයට ආසන්නව සූරියවැව අක්කර 20 ක ඉඩමක කර්මාන්තපුරයක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 252.7 ක් වැය කිරීම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**මන්නාරම කර්මාන්තපුරය**

මන්නාරම දිස්ත්‍රික්කයේ අක්කර 24 ක ඉඩමක රු.මිලියන 356ක් වැයකර කර්මාන්තපුරයක් ඉදිකර වර්ෂ 13 ක් ගත වී තිබුණි. එහෙත් අක්කර 6 ක භූමියක එක් කර්මාන්තකරුවෙක් පමණක් ඇගළුම්

කර්මාන්තයක් පවත්වා ගෙන යනු ලබන බව නිරීක්ෂණය වූ අතර අනෙකුත් කර්මාන්ත ආරම්භ කිරීමක් 2023 දෙසැම්බර් 31 දක්වා සිදු කර නොතිබුණි.

**අපේක්ෂිත රැකියා බිහි නොවීම**

කර්මාන්තපුර 16 කට අදාලව කර්මාන්තකරුවන් 130 ක් විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති වාර්තාවන්ට අනුව උත්පාදනය කිරීමට අපේක්ෂා කළ රැකියා ප්‍රමාණය 10,475 ක් වුවද වර්තමාන රැකියා ප්‍රමාණය 1,504 ක් වූයෙන් අපේක්ෂිත මට්ටම කරා ලඟා වීමේ ප්‍රතිශතය සියයට 14 ක් විය.

**හිඟ බදු**

කර්මාන්තපුර 13 කට අදාළව කර්මාන්තකරුවන් 107 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.මිලියන 205.23 ක් වී තිබුණි.

**කර්මාන්තකරුවන් සමඟ දීර්ඝකාලීන බදු ගිවිසුම් අත්සන් නොකිරීම**

කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන් කිරීමේ ලිපියට අනුව ඉඩම වෙන් කිරීමෙන් පසුව අවුරුදු 35 ක දීර්ඝකාලීනව බදු ගිවිසුමක් අත්සන් කල යුතු වුවද කර්මාන්තපුර 25 ක කර්මාන්තකරුවන් 322ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

**කාර්යයන්හි ප්‍රගතිය**

කර්මාන්තපුර සංවර්ධන වියදම් සඳහා 2023 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 1,000 ක් වූ අතර 2023 වර්ෂයේ වියදම රු.මිලියන 880 ක් විය. එයින් කර්මාන්තපුර 9 කට අදාලව සංවර්ධන කටයුතු 19 ක් වෙනුවෙන් මුළු ඇස්තමේන්තුගත වියදම වන රු.මිලියන 489.55 ක් එකවර ගෙවා තිබුණද එම කාර්යයන්හි ප්‍රගතිය සියයට 0 ක් වූ අතර දඹුල්ල කර්මාන්තපුරයේ වැට හා ගේට්ටුව ඉදිකිරිම සඳහා මුළු ඇස්තමේන්තුගත වියදම වන රු.මිලියන 14.96 ක් එකවර ගෙවා තිබුණද එහි ප්‍රගතිය සියයට 15 ක් වී තිබුණි.

**ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම**

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කර ගැනීම, එළිපෙහෙළි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු. මිලියන 3.27 ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද 2023 වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්ඵල වියදම් බවට පත්ව තිබුණි.

**නව නිපැයුම් වාණිජකරණය සඳහා සම්මන්ත්‍රණ**

නව නිපැයුම් වාණිජකරණය සඳහා සම්මන්ත්‍රණ(Symposium) 3ක් රු.මිලියන 5.55 ක වියදමින් 2023 වර්ෂයේදී පෞද්ගලික හෝටලයක පවත්වා තිබුණු අතර ඉදිරිපත් වූ නව නිපැයුම්කරුවන් 115 ක් අතුරින් නව නිපැයුම් 15 ක් වාණිජකරණය සඳහා හඳුනාගෙන තිබුණද ඉන් 4 ක් පමණක් වාණිජකරණය සඳහා ගිවිසුම් අත්සන් කිරීමට එකඟතාවය පල කර තිබුණු අතර වාණිජකරණය සඳහා සාකච්ඡා මට්ටමේ පවතින නව නිපැයුම් සංඛ්‍යාව 11 කි. ඒ අනුව ඉදිරිපත් වූ නව නිපැයුම්කරුවන්ගෙන් සියයට 3ක අඩු ප්‍රතිශතයක් වාණිජකරණය සඳහා ගිවිසුම් ගත වීමට එකඟ වී තිබුණි.

**ශ්‍රී ලංකා ප්‍රමිත සහතිකය ලබා ගැනීම**

දේශීය රතු මැටි උළු නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සඳහා වූ ව්‍යාපෘතියක් සඳහා 2023 වර්ෂයේ රු.මිලියන 4.5ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර කර්මාන්තකරුවන් 30 දෙනෙක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූලික සහතිකකරණ ගාස්තුවෙන් සියයට 50 ක් එක් ආයතනයක් සඳහා උපරිමය රු.150,000 කට යටත්ව අමාත්‍යාංශය විසින් දැරීමට අපේක්ෂා කර තිබුණි. කර්මාන්තකරුවන් 10 දෙනෙකු මේ සඳහා අයදුම් කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එක් කර්මාන්තකරුවෙකු හෝ ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර මෙම මූල්‍ය සහනය ලබා ගෙන නොතිබුණි.

## ලංකා පිඟන් සංස්ථාව

**අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදන ඉලක්කය කරා ළඟානොවීම**

2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව නිෂ්පාදනය වැඩිකිරීම සඳහා මහියංගනය කම්හල නැවත ආරම්භ කර ඒකක 2,875,000 ක් ද එරගම කම්හලේ ඒකක 3,250,000 ක් ද වශයෙන් ඒකක 6,125,000 ක වාර්ෂික නිෂ්පාදන ඉලක්කයක් කරා ළඟාවීමට අපේක්ෂා කර තිබුණි. 2023 වර්ෂයේ කම්හල් දෙකෙහි නිෂ්පාදනය සම්බන්ධව ලබාගත් තොරතුරු අනුව මහියංගනය හා එරගම කම්හල්වල සත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් ඒකක 231,239 ක් ඒකක 887,205 ක් වශයෙන් ඒකක 1,118,444ක් වී තිබුණි. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදන ඉලක්කය කරා ළඟා වීමේ මට්ටම සියයට 18 ක් වී තිබුණි.

**අපේක්ෂිත විකුණුම් ආදායම**

පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් සියයට 25 කින් වැඩි කිරීමට අපේක්ෂා කර තිබුණද 2022 වර්ෂයේ රු.මිලියන 90.77ක් වූ විකුණුම් ආදායම 2023 වර්ෂයේදී රු.මිලියන 65.29 ක් දක්වා රු.මිලියන 25.47 කින් එනම්, සියයට 28 කින් පහත වැටී තිබුණි. අලෙවි නියෝජිතයින් මඟින් විකුණුම් කිරීමේදී ලබාදුන් සියයට 3 ක් වූ වට්ටම් අනුපාතය 2023 වර්ෂයේදී සියයට 20 ක් දක්වා වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**වෑ උඩ කර්මාන්තශාලාව බදුදීම**

සංස්ථාව සතු වෑ උඩ කර්මාන්තශාලාව ඇතුළු ඉඩම 2019 ජූලි මාසයේ රු.මිලියන 136.7 කට තක්සේරුකර තිබුණි. එහෙත් ඒ සම්බන්ධව සැලකිල්ලට ගැනීමක් හෝ 2023 වර්ෂයේදී බදු කුලිය තක්සේරු කිරීමකින් තොරව, රේඛීය අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ලංසු කැඳවීමකින් තොරව කර්මාන්තශාලාව ඇතුළු ඉඩම වර්ෂ 5ක කාලසීමාවක් සඳහා රු.මිලියන 10කට තනි පුද්ගලයෙකුට බදු දී තිබුණි.

**ඉඩම් අල්ලාගැනීම්**

එරගම කම්හල සතු භූමියේ අක්කර 3.5 ක කොටසක් පෞද්ගලික අයෙකු විසින් අල්ලාගෙන සිටීම සම්බන්ධ ගැටළුව ද මහියංගනය කම්හල පවතින ඉඩමේ 2015 වර්ෂයට පෙර සිට පවුල් 125 ක්ද, ඇලයාපත්තුව ඉඩමේ කොටසක්ද පෞද්ගලික පාර්ශවයක් විසින් භාවිතා කිරීම සම්බන්ධ ගැටළු ද නිරාකරණය වී නොතිබුණි.

**බංගදෙණිය කම්හල් භූමිය නිෂ්කාර්යව පැවතීම**

බංගදෙණිය කම්හල පිහිටි ඉඩමේ ගොඩනැඟිලි කඩා ඉවත් කර තිබුණු අතර අක්කර 7 රූඩ් 1 පර්චස් 28 ක් වූ ඉඩම නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම තවත් කම්හල් 5 ක නිෂ්පාදන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් එම කම්හල් පිහිටි ඉඩම් හා ගොඩනැඟිලි ඇතුළු වත්කම් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**නව නිර්මාණ හඳුන්වාදීම**

නව නිර්මාණ සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ශිල්පීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක පුහුණුවක් රටපුරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් වැඩසටහන් 29 ක් පැවැත්වීමට රු.මිලියන 8.5 ක් වෙන්කර තිබුණ ද පුහුණු වැඩසටහන් 17 ක් පමණක් පවත්වා තිබුණි. මේ නිසා වැඩසටහන් හරහා ශිල්පීන්ට නව නිර්මාණ 450 ක් හඳුන්වාදීමට සැලසුම්කර තිබුණ ද නව නිර්මාණ 216 ක් පමණක් හඳුන්වා දී තිබූ අතර නිර්මාණ 234 ක් හඳුන්වාදීමට නොහැකි වී තිබුණි.

**නිශ්ක්‍රීය යන්ත්‍ර**

2020 වර්ෂයේ බතික් නිෂ්පාදන ඉගැන්වීම හා එම කර්මාන්තයේ නියුතු ශිල්පීන්ට පොදු පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් පිරිපහදු පද්ධතියක් රු.මිලියන 2.99 ක් වැයකර 2021 දෙසැම්බර් 16 දින ස්ථාපිත කර තිබුණද 2023 වර්ෂයේදී ද එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොතිබූ අතර යන්ත්‍රය නිශ්ක්‍රියව පැවතුණි.

**තොග තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීම**

2023 වර්ෂය තුළ දී බාහිර ආයතන මඟින් සංවිධානය කරන ලද අලෙවි ප්‍රදර්ශන 6 කට මධ්‍යස්ථානය සහභාගී වී තිබූ අතර එක් එක් ප්‍රදර්ශනය සඳහා යවන ලද තොග, විකුණන ලද තොග, ඉතිරි වූ

තොග, අලෙවි ආදායම යනාදී තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## ජාතික ශිල්ප සභාව

**තොගයක් අස්ථානගතවීම් ගිණුම්ගත නොකිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 9 හි 44 හා 47 ඡේද ප්‍රකාරව තොග සම්බන්ධ සියලුම අලාභයන් කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවත් වරාගොඩ පුහුණු මධ්‍යස්ථානයේ පිරිවැය රු.මිලියන 1.32 ක් වූ තඹ රැහැන් කිලෝග්‍රෑම් 2099.5 ක තොගයක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර හෝ හෙළිදරව්කර නොතිබුණි.

**බැංකු ශේෂ අනාවරණය නොකිරීම**

ජාතික ශිල්ප සභාවට අයත් පුහුණු මධ්‍යස්ථානවල පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුම් 75 ක එකතු ශේෂය වූ රු.මිලියන 4.22 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**ශිල්ප සමාජ අධීක්ෂණය නොකිරීම**

2023 ඔක්තෝබර් 31 වන විට සියලුම පළාත් හා දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ශිල්ප සමාජ 178 ක් පිහිටුවා තිබුණද ශිල්ප සමාජ ලියාපදිංචිය හා අධීක්ෂණය ජාතික ශිල්ප සභාව මඟින් සිදු කළ යුතු වුවත් ලියාපදිංචිය හැර වෙනත් කිසිදු අධීක්ෂණයක් හා මඟ පෙන්වීමක් සිදු කර නොතිබුණි.

**සෙරමික් පුහුණු මධ්‍යස්ථානයේ නිශ්කාර්ය වත්කම්**

වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය මූලික වශයෙන් සෙරමික් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම මඟින් ශිල්පීන්ට සේවා සැපයීම උදෙසා පිහිටුවා තිබුණද අංශ 05 කට අයත් විදුලි පෝරණු, දර පෝරණු, ගෑස් පෝරණු, බෝල්මිල් යන්ත්‍ර, කිරුම් තරාදි, බ්ලෙන්ජර්යක් වශයෙන් රු.මිලියන 19.41 ක් වටිනා යන්ත්‍රෝපකරණ 2019 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි. තවද රු.මිලියන 2.8 ක් වටිනාකමැති බෝල්මිල් යන්ත්‍ර 02 ක් සහ විදුලි පෝරණු 03 ක් වසර ගණනාවක සිට අක්‍රීයව පැවතුණි.

තවද, වරාගොඩ, මොලගොඩ, පොල්ගොල්ල හා බුලත්සිංහල පුහුණු මධ්‍යස්ථානවල පිහිටුවීමට යෝජිතව තිබූ අමුද්‍රව්‍ය බැංකු වෙනුවෙන් 2021 වර්ෂයේ මිලදී ගත් රු.මිලියන 1.14 ක් වටිනා උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

**වේවැල් යන්ත්‍ර නිෂ්පාදනය**

වේවැල් යන්ත්‍ර තුනක් නිෂ්පාදනය කරගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට 2022 වර්ෂයේදී රු.මිලියන 3.85 ක් ගෙවා තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ යන්ත්‍ර සභාව වෙත ලැබී නොතිබුණි.

**කාවන්තිස්සපුර ගම්මානය ඉදිකිරීම**

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්ගෙන් 2013 වර්ෂයේ දී දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගෙන තිබූ හෙක්ටයාර් 1.6187 ක භූමියක

කාවන්තිස්සපුර ගම්මානය ඉදිකර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට ඒ සඳහා බදු කුලී වශයෙන් රු.මිලියන 3.36 ක් හා ඉන්දීය රජයේ මූල්‍ය ආධාර රු. මිලියන 18.43 ක් හා සභාව විසින් රු.මිලියන 8.74 ක් වැය කර තිබුණද එදින වන විටත් භූමිය හා ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි.

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

**මුදල් ගෙවා තිබුණද දේපළ පරිහරණ අයිතිය හා හිමිකාරත්වය නොලැබීම**

ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරණ කැබිනට් තීරණය මඟින් මණ්ඩලය වෙත පවරා දී තිබූ අතර ගැනුම් ප්‍රතිෂ්ඨාව ලෙස මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 දිනැතිව රු. මිලියන 15.25 ක් ගෙවා තිබුණි. එහෙත් 2023 දෙසැම්බර් 31 දක්වා ද දේපලෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය හා පරිහරණය කිරීමේ අයිතිය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

**කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්**

කෞතුකාගාර අලෙවි ප්‍රදර්ශනාගාරය වෙනුවෙන් 2023 වර්ෂය තුළ රු. මිලියන 2.01 ක් වියදම් කර තිබුණ ද 2023 නොවැම්බර් මාසයේදී කෞතුකාගාර භූමියෙන් ලක්සල ප්‍රදර්ශනාගාරය ඉවත් කිරීම නිසා එම වියදම් අනාර්ථික වී තිබුණි. එමෙන්ම කැබිනට් අනුමැතිය මත 2013 සිට 2015 වර්ෂය දක්වා රු. මිලියන 175.12 ක් වැයකර ප්‍රදර්ශනාගාරය නවීකරණය කිරීම වෙනුවෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් රු.මිලියන 91 කට ආසන්න මුදලක් ලැබිය යුතුව පැවතුණි.

**සමාජ ආරක්ෂණ දායකත්ව බදු නොගෙවීම**

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත අනුව ස්ව තක්සේරු පදනම මත මාසිකව බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.59 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

**විගණන ගාස්තු නොගෙවීම**

2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මණ්ඩලයේ විගණන කටයුතු සිදු කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු විගණන ගාස්තු රු. මිලියන 9.29 ක් 2023 දෙසැම්බර් 31 දින දක්වා ද නිරවුල් කර නොතිබුණි.

**ණය හා පොළී ගෙවීම්**

මණ්ඩලය විසින් 2011 සිට 2017 කාලපරිච්ඡේදය තුළදී කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 256.81 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. 2023 වර්ෂය තුළ දී ණය වාරිකය රු. මිලියන 75.79 ක් හා පොලිය වශයෙන් රු. මිලියන 51.23 ක් ගෙවා තිබුණි. 2023 වර්ෂය සඳහා සමස්ථ ණය හා පොලිය වශයෙන් පිළිවෙලින් රු.

මිලියන 103.28 ක් රු. මිලියන 53.26 ක් ගෙවා තිබුණි. එය උපයන ලද ආදායමෙන් සියයට 24 ක් වී තිබුණි. ණය ආපසු ගෙවීම සඳහා යෝග්‍ය සැලැස්මක් සකස් කර මූල්‍ය පිරිවැය පාලනය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

ආරක්ෂක සේවාව සඳහා මිලගණන් කැඳවීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තාර්කික පදනමකින් තොරව 06 වන අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය තෝරාගෙන තිබුණි. එම ලංසුකරු තෝරා ගැනීම නිසා මණ්ඩලයට වර්ෂය සඳහා රු.මිලියන 1.45 ක මූල්‍ය අලාභයක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

**SLS ලාංඡනය සහිත භාණ්ඩවල පිරිවිතරයන්හි අනුකූලතාව පරීක්ෂා කිරීම**

SLS ලාංඡනය භාවිතය සඳහා බලපත්‍ර නිකුත් කළ විට නිරතුරුවම, නිෂ්පාදිත අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වීම තහවුරු කිරීම වෙනුවෙන් තත්ව පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර කොන්දේසිවලට අනුකූලවීම සත්‍යාපනය කිරීම සඳහා විවෘත වෙළඳපොලෙන් නිෂ්පාදිතයේ නියැදි ලබා ගෙන පිරිවිතරයන්හි අනුකූලතාවය පිරික්සීම සඳහා පරීක්ෂාවන් සිදුකළ යුතුය. එසේ වුවද, 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමිති සහතික ලාංඡනය ලබාගෙන තිබූ භාණ්ඩ සංඛ්‍යාව 924 ක් වුවත් 2023 වර්ෂයේදී වෙළඳපොල සමීක්ෂණ සිදුකර තිබුණේ භාණ්ඩ වර්ග 183 ක් එනම් සියයට 20 ක් සඳහා පමණි.

## කාර්මික තාක්ෂණ ආයතනය

**ඖෂධ රසායනාගාරය නිෂ්කාර්යව පැවතීම**

සංවර්ධිත රටවල උසස් ඖෂධ රසායනාගාරවලට සමගාමීව පහසුකම් සහිතව ජීඑල්පී (GLP) තත්ත්වය ඇතුළුව ප්‍රතීතනය ලත් අති නවීන ඖෂධ රසායනාගාරයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.මිලියන 99.42 ක් වැයකර ආයතනය තුල 2019 සිට පවත්වාගෙන ගොස් තිබුණි. එහෙත් දිවයිනේ ඇති රෝහල් පද්ධතියද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනීම හා බෙදා හැරීම් කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් උක්ත රසායනාගාරයෙන් සේවාවන් ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. මෙම නිසා රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ ශ්‍රී ලංකාව තුල ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතීතනය ලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස භාවිතා කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

**ඛණිජතෙල් හා ලිහිසිතෙල් රසායනාගාරය නිෂ්කාර්යව**

**පැවතීම**

2016 අගෝස්තු 31 දිනැති අමප/16/1576/19/96 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිසමේ (PUCSL) නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය ඛණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස රු.මිලියන 117.7 ක් වැයකර උපකරණ අත්පත්කර ගෙන සවිකර ඛණිජතෙල් හා ලිහිසිතෙල් රසායනාගාරයක් ස්ථාපනය කර තිබුණි. එහෙත් රසායනාගාරය සඳහා ඛණිජ තෙල් සාම්පල් ලැබීමේ ක්‍රමවේදයක් නිර්මාණය වී නොතිබීම නිසා පිහිටුවීමේ මූලික කර්තව්‍ය ඉටු නොවන බව නිරීක්ෂණය වූ අතර වර්තමානයේ රටට ආනයනය කරන ඛණිජතෙල්වල තත්වය සම්බන්ධයෙන් ගැටළු පවතින බවට මහජන මතයක් රටතුල පවතිද්දී එම කටයුත්ත සඳහාම ස්ථාපිත රසායනාගාරයෙන් අදාළ කටයුත්ත ඉටු වී නොතිබුණි.

**පර්යේෂණ තුළින් සොයාගෙන තිබූ නව තාක්ෂණයන් භාවිතයට යොදා නොගැනීම**

ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය විසින් ඉකුත් වසර 05ක කාලය තුළ රු.මිලියන 9.02 ක භාණ්ඩාගාර ප්‍රදාන භාවිතා කර සිදුකර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 05ක පර්යේෂණ තුළින් සොයාගෙන තිබූ නව තාක්ෂණයන් වසර 03ට වඩා වැඩි කාලයක් ගතවී තිබූ නමුත් 2023 වර්ෂය අවසාන දින වන විටත් පැවරීමෙන් තොරව අභාවිතව පැවතුණි. 2018 වර්ෂයේ දී සිදු කරන ලද රබර් සහ මිනිරන් භාවිතයන් නැනෝ සංයුතියේ තාප සන්නායකතාවය වැඩි දියුණු කිරීම, වාහන වලින් පිට වන වායු විමෝචනය අඩු කිරීම සඳහා නැනෝ අංශු ආධාරක යොදා ගැනීම පිළිබඳ පර්යේෂණය, පරිසරයට අහිතකර පොලිතීන් වෙනුවට යොදා ගත හැකි පරිසර හිතකාමී පොලිතීන් හා ලන්ච්ෂීට් නිෂ්පාදනයකට සුදුසු තාක්ෂණයක් සොයා ගැනීම වැනි පර්යේෂණයන් සිදුකර තිබුණද තාක්ෂණය භාවිතයට යොදා ගැනීමේ පාර්ශවයක් හඳුනා ගෙන නොතිබීම නිසා යෙදවූ පිරිවැයට සාපේක්ෂව ඵලදායි භාවිතයක් සිදුවී නොතිබුණි. දේශීය සම්පත් සඳහා අගය එකතු කිරීමේ තාක්ෂණය තුළින් ඒවායේ කාර්යක්ෂම භාවිතය ඉහළ නැංවීමේ ප්‍රතිලාභයද දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට යොදා ගැනීමේ අවස්ථාව ද ඒ අනුව මග හැරී තිබුණි. එසේ වුවද සොයා ගත් තාක්ෂණය පාරිසරික අවශ්‍යතා සඳහා භාවිතයට යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

# ධීවර කටයුතු

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුද සහ හෙක්ටයාර් 489,000 වූ කලපු හා අභ්‍යන්තර ජලාශ මනා ලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන තිරසාර ධීවර කර්මාන්තයක් බිහිකිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 43.28 ක් දක්වා වර්ධනයක් ලගාකරගැනීමෙන් මහජනතාවගේ පෝෂණ මට්ටම පවත්වා ගැනීම, ජාතික ආර්ථිකය හා විදේශ විනිමය වර්ධනය සඳහා මත්ස්‍ය අපනයන තුළින් සුවිශේෂි දායකත්වයක් ලබාදීම, ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම අපේක්ෂිත ප්‍රතිඵල වී තිබුණි. එම ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යාවස්ථාපිත ආයතන 6 ක් විසින් පහත සඳහන් ප්‍රධාන කාර්යය භාර්යන් ඉටුකළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම.

ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත නව ධීවර වරායන් ඉදිකිරීම. නවීන සංනිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියළුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම

අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම.

ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම.

නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම.

උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම.

ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා ධීවර ප්‍රජාව සඳහා එලදායි බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.

සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අපනයනය වෙළඳපල ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

වැව් කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම.

බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.

ධීවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.

**ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

2023 වර්ෂයේ දී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා ධීවර අමාත්‍යාංශය සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 9,202 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2023 වර්ෂය අවසන් වනවිට ඉන් රු.මිලියන 8,210 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 992 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | ධීවර අමාත්‍යාංශය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | 7,511 | 1,691 | 9,202 |
| වියදම රු.මිලියන | 6,612 | 1,598 | 8,210 |
| ඉතිරිය රු.මිලියන | 899 | 93 | 992 |

වගු අංක 2.21 : ප්‍රතිපාදන උපයෝජනය කිරීම

ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ව්‍යාවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවල දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ධීවර අමාත්‍යාංශය

**ධීවර වරායන් හා නැංගුරම්පලවල් ඉදි කිරීම සහ වැඩි දියුණු කිරීම**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කයිකාවල මුහුදු ප්‍රදේශයේ නැංගුරම්පලක් ඉදිකිරීම සඳහා පැකේජ 2ක් යටතේ තෝරාගත් ලංසුකරුවෙක් සමඟ වසරක් ඇතුළත ඉදිකිරීම සඳහා එකතු වටිනාකම රු.මිලියන 245.8 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම් දෙකකට 2014 සැප්තැම්බර් 14 දින එළඹ තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් සමාගම විසින් පැකේජ 02 සඳහාම ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 29 දින රු.මිලියන 49.16 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් පැකේජ 02 සඳහාම ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තු සඳහා ඉදිකිරීම් බලපත්‍රයක් නොතිබීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමත් සමඟම නවතා දැමීමට සිදුවී තිබුණු අතර අත්තිකාරම් මුදල ගෙවා වසර 09 ක කාලයක් ගතවී තිබුණද අදාල මුදල ආපසු අයකර ගෙන නොතිබුණි.

**ප්‍රමාද පොලී ගෙවීම**

2023 දෙසැම්බර් 31 දින වනවිට ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘති 05 සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු. මිලියන 209.69 ක මුදලක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබූ අතර රු. මිලියන 20.49 ක ප්‍රමාද පොලී මුදලක් තවදුරටත් ගෙවීමට සහතික කර තිබුණි. ඒ අනුව ගෙවා තිබූ ප්‍රමාද පොලී එකතු වටිනාකම රු. මිලියන 230.19 ක් වී තිබුණි.

**ඉලක්කගත ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනයට ලඟා නොවීම**

අක්වෙරළ, වෙරළාසන්න හා කලපු, මිරිදිය, ජලජීවි වගා, ඉස්සන් යන ක්ෂේත්‍ර 05 න් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 2022 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 397,230 ක්වූ අතර 2023 වර්ෂයේ එය මෙට්‍රික් ටොන් 407,070 ක් විය. මේ අනුව මෙට්‍රික් ටොන් 9,840 ක වැඩිවීමක් සිදු වී තිබුණු අතර එය සියයට 2.5 ක සමස්ත නිෂ්පාදනයේ වර්ධනයක් සිදු වී තිබුණි. 2023 වර්ෂයේ ඉලක්කගත ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වූ දිනකට ග්‍රෑම් 43.28 ක් වූ අතර 2023 වර්ෂයේ දී තථ්‍ය මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 32.5 ක් වූ බැවින් හා 2023 වර්ෂයේදී එම ඉලක්කය ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**අමාත්‍යාංශ ලේකම් නිල නිවසට හානි සිදු වීම**

නාරාහේන්පිට, මුහන්දිරම් ඊ.බී. දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබූ ධීවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා ධීවර අමාත්‍යාංශය විසින් සපයා තිබූ සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් විගණනය වෙත වාර්තා කර තිබුණි. තවද, ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව සිදුවී තිබෙන රු. මිලියන 1.81 ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රජය සතු වත්කම් සුරක්ෂිතව තබාගැනීම සඳහා වගකීම පැවරී තිබූ වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**දියවර දිරිය ණය යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කටයුතු සහ මිරිදිය ධීවර කටයුතුවලට නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමත් ගුණාත්මක තත්ත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයන් ලබාගැනීමත් අරමුණු කරගනිමින් ධීවර යාත්‍රා වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ලංකා බැංකුවේ අනුග්‍රහය යටතේ 2011 වර්ෂයේ දී දියවර දිරිය ණය යෝජනා ක්‍රමය ආරම්භ කර තිබූ අතර 2023 වර්ෂය අවසානයට රු.මිලියන 776 ක්වූ ණය මුදල සඳහා පොලී සහනාධාරය වූ රු.මිලියන 12 ක මුදල ධීවර දෙපාර්තමේන්තුව විසින්

2023 වර්ෂයේ දී ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. ධීවරයින්ට ලබා දී තිබුණු ණය මුදල, ණය වාරික ආපසු අයවීම, අයකළ පොලීය, ණය අය නොවන ධීවරයින් සම්බන්ධව ගෙන තිබෙන ක්‍රියාමාර්ග, ණයලාභීන් විසින් මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට දායකවීම සහ ධීවර ප්‍රජාවට ලැබී තිබූ සහන සම්බන්ධව මුළු කාලපරිච්ඡේදය තුළ දීම පසුවිපරම් කිරීමක් කර නොතිබුණ අතර ඒ පිළිබඳ ප්‍රමාණවත් විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඉහත ගණුදෙනුවේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

**සියයට 50 රජයේ සහනාධාර ක්‍රමවේදය යටතේ ධීවර යාත්‍රා ඉදි කිරීම**

2016 වර්ෂයේදී ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රජයේ සහනාධාර යටතේ අඩි 55 කින් යුත් නවීන තාක්ෂණය සහිත ධීවර යාත්‍රා 10 ක නිශ්පාදන පිරිවැයෙන් සියයට 50ක සහනාධාර දායකත්වයක් ලබාදීම සඳහා රු.මිලියන 130 ක් 2016 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතනයක් වෙත ගෙවා තිබුණි.මෙම සියයට 50 රජයේ සහනාධාර ක්‍රමවේදය යටතේ, ඉදිකිරීම ආරම්භ කර තිබූ අඩි 55 කින් යුත් ධීවර යාත්‍රා 2 ක් විගණිත දින වන විට වසර 08කට වැඩි කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම අවසන් කර එහි ධීවර යාත්‍රා භාරකරුවන් වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි.

**කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය**

කලපු සංවර්ධන වැඩසටහන යටතේ කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හලාවත කලපුවේ සීමා මායිම් සලකුණු කිරීම සඳහා අවශ්‍ය සීමා මායිම් කණු සංඛ්‍යාව 1,784 ක් වුවද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කණු සංඛ්‍යාව 4,060 ක් ලෙස සටහන්වීම නිසා රු. මිලියන 3.83 ක්වූ කණු 2,276 ක් වැඩිපුර සාදා නිමකර තිබුණු අතර එම කණු හලාවත කලපුවේ ස්ථාන 13 ක ගොඩගසා තිබුණි. මුදල් රෙගුලාසි 128(1)(ඵ) ප්‍රකාර මහජන මුදල් වියදම් කිරීමේ දී අරපිරිමැස්ම සහ කාර්යක්ෂමතාවය, විධිමත් බව සහ අවංකභාවය පිළිබඳව ගණන්දීමේ නිලධාරීන් වගකිව යුතු වුවද, ඒ පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය. මෙලෙස වැඩිපුර මිලදීගෙන තිබූ කොන්ක්‍රීට් කණු පුත්තලම කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා යොදා ගැනීමට පසුව තීරණය කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දිනවන විටත් එම කොන්ක්‍රීට් කණු පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය**

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වසර 12 ක් ගත වී තිබුණ ද කළමනාකරණ භාරය පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි. තව ද මත්ස්‍ය වෙළඳපල

සංකීර්ණය තුළ මසුන් හැසිරවීම සෞඛ්‍යානුකූලව සිදුකිරීමට වෙළඳාම් කරනු ලබන මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතියක පවත්වාගෙන යන බවට සහතික කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් හඳුන්වා දී නොතිබුණි.

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**තත්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් පවරා දෙන ලද වත්කම් ගිණුම්ගත නොකිරීම**

පුදුකුඩිරිප්පුහි පිහිටි රු. මිලියන 75.88 ක්වූ ඉස්සන් අභිජනනාගාරය, ජලජීවී වගා සංවර්ධන හා තත්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් 2009 දෙසැම්බර් 30 දින අධිකාරියට භාරදී තිබුණද එම වත්කම් හඳුනාගෙන අධිකාරියේ පොත්වල ගිණුම්ගතකර නොතිබුණි. 2015 ජුනි 22 දිනැති තක්සේරු වාර්තාවට අනුව මෙම අභිජනනාගාර ඉඩම රු. මිලියන 3.72 කටද, ගොඩනැගිල්ල රු. මිලියන 44.23 කටද, ලී බඩු හා සවි කිරීම්, මෝටර් සයිකල්, වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර් හා අනෙකුත් තොග වටිනාකම රු. මිලියන 3.15 ක්වූ නමුත් එම වටිනාකම් කිසිවක් ගිණුම් ගතකර නොතිබූ අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින්ද මෙම වත්කම්වල පැවැත්ම තහවුරු කර නොතිබුණි.

**නිෂ්කාර්ය වියදම්**

අධිකාරියට හිමිකාරිත්වය නොමැති හෙක්ටයාර් 1361.76 ක ඉඩම් 04ක සහ වපසරිය හඳුනාගත නොහැකි ඉඩමක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට රු.මිලියන 107.6 ක මුදලක් වැයකර තිබුණද 2024 මැයි 27 දක්වා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබූ බැවින් එම වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

**මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය බදු දීම**

2018 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. මිලියන 16.87 ක්වූ මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මත්ස්‍ය ආහාර නිෂ්පාදනය සඳහා පුද්ගලික සමාගමක ඉඩමක සවිකර යන්ත්‍රය බදු දී තිබුණි.බදු ගිවිසුමේ 8 කොන්දේසිය අනුව 2020 ජුනි 05 දින සිට මාසික වාරිකය රු.150,000 බැගින් නියෝජිතායතනය වෙත ලැබිය යුතු වුවත් මේ දක්වා කිසිදු බදු මුදලක් ලැබී නොතිබුණු බැවින් මාස 31 ක් සඳහා ලැබිය යුතුව තිබූ රු. මිලියන 4.65 ක මුදල ආයතනයට අහිමි වී තිබුණි.

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

**ණයගැති ශේෂය වර්ධනය වීම**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ඔවුන්ගේ අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කටයුතු කිරීමේදී මූලික වශයෙන්ම ඉන්ධන අලෙවිය, විදුලිය හා ජලය ධීවර බෝට්ටු සඳහා අලෙවිය තුළින් ආදායම් උපයා ගන්නා අතර වරායන්හි ඉඩම්, අයිස් යන්ත්‍රාගාර, ගුදම්, ගොඩනැගිලි වැනි දේපල පෞද්ගලික පාර්ශවයන්ට බදු පදනම මත ලබා දීමෙන් හා නැංගුරම් ගාස්තු තුළින්ද ආදායම් රැස් කරනු ලබයි. නමුත් සංස්ථාවට හිමි මෙම ආදායම් වාර්ෂිකව නිසි පරිදි අය නොවීම තුළ මෙම ආදායම් ණයගැති ශේෂය වාර්ෂිකව ඉහළ යමින් පවතින බවත් ඒ අනුව 2021 ණයගැති ශේෂය රු. මිලියන 599.81 ක්ද 2022 හා 2023 වසර වලදී පිළිවෙලින් රු. මිලියන 819.34 ක් හා රු. මිලියන 871.22 දක්වාද වර්ධනය වී තිබුණි.

# පශු සම්පත්

ශ්‍රී ලංකාව නාගරික ජනගහනයට වඩා ග්‍රාමීය ජනගහනයක් ජීවත්වන රටක් වන අතර ග්‍රාමීය ජනතාව බොහෝ විට ප්‍රාථමික කර්මාන්තයන්හි නියැලෙන පිරිසක් වේ. ඒ අනුව මෙම ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි හා සත්ව නිෂ්පාදන මිලදී ගැනීම ඒවා සඳහා හොඳ මිලක් ලබා දීම හා නිෂ්පාදනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ප්‍රාථමික නිෂ්පාදන ද්විතීය නිෂ්පාදන බවට පරිවර්තනය කර ඒවා විදේශ වෙළඳ පොළ වෙත යොමු කිරීම ඊට සම්බන්ධ රාජ්‍ය ආයතන වල කාර්යභාරය විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයට අදාළ කාර්යභාරය පහත සඳහන් පරිදි විය.

**කාර්යභාරය**

විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැළපෙන පරිදි පශු සම්පත් හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරි ගැන්වීම.

පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අපනයනය සඳහා දිරි ගැන්වීම.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම.

මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් සහ ආයෝජන පහසුකම් සැපයීම.

රජය සතු සත්ත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිතා කිරීමේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම.

කුකුල් මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම.

කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීම මගින් දේශීය නිෂ්පාදනය සහ පරිභෝජන අවස්ථා පුළුල් කිරීම.

සත්ත්ව ගොවිපොළවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම.

පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැපයීම.

ඉහත කාර්යභාරය ඉටු කිරීම සඳහා මෙම අංශයට අදාළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මිල්කෝ පෞද්ගලික සමාගම මගින් ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**එළු අභිජනන ව්‍යාපෘතිය**

වසරකට 50 බැගින් වසර 05 ක් තුල එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීමේ අරමුණින් 2019 වර්ෂයේදී ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය තුල බෝයර් වර්ගයේ එළු අභිජනන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය අවසන් වන විට රු.මිලියන 91.97 ක් වැයකර තිබුණු අතර එම කාලය තුළ රු.මිලියන 2.36 ක ආදායමක් පමණක් ලබා ගෙන තිබුණි. එසේම මෙම කාලය තුල එළුවන් 23 ක් පමණක් ක්ෂේත්‍රයට නිකුත් කර තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**මුදල් භාරකාරිනියගේ මූල්‍ය අක්‍රමිකතාවය**

ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් භාරකාරිනිය විසින් 2018 සිට 2023 ජූලි මස දක්වා කාලය තුළ දෛනිකව රැස්කල ආදායමින් රු.මිලියන 14.75 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මුදල් භාරකරු වෙත භාර නොදී පෞද්ගලික පරිහරණයට ලබාගෙන අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා 2023 අවසන් දින වන විටත් නිකුත් කර නොතිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය සඳහා 2022 අගෝස්තු 15 දින රු.මිලියන 96.55 ට ස්වයංක්‍රීය ජෛව ප්‍රතිකාරක යන්ත්‍රයක් මිලදී ගෙන සවිකර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින තෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි**

2013 වර්ෂයේ සිට පැවත එන මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු.මිලියන 19.25 ක් 2023 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**හිඟ බිම්කුලි සහ දඩ**

පොල් සංවර්ධන අධිකාරිය මඟින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී මෙම අධිකාරිය විසින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව නියමිත කාල තුළදී පොල් තොග ඉවත් කර නොගැනීම හේතුවෙන් තැරැව්කරුවන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වූ අවුරුදු 5 ට වැඩි හිඟ බිම්කුලි සහ දඩ රු. මිලියන 8.81 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

**නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ**

පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදී ගව ආහාර ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4 ක් පැවති අතර එම යන්ත්‍රවලින් මසකට ගව ආහාර මෙ.ටො 900 (3.75*දින 30* පැය 8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ හැකි වුවද එම යන්ත්‍ර වසර 15 ක සිට නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 4 ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 04 ක් සහ මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 1 ක් ද පැවති අතර, මෙයින් කුකුළු ආහාර මසකට මෙට්‍රික් ටොන් 2,580 (10.75*දින 30* පැය8) ක් ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට එම යන්ත්‍ර පිළිවෙලින් වසර 15 ක් හා වසරක් වශයෙන් නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය.

**අපේක්ෂිත කිරි නිෂ්පාදනයේ හා තත්‍ය කිරි නිෂ්පාදනයේ විචලතාවයන්**

ක්‍රියාකාරී සැලසුම අනුව 2019-2023 දක්වා මණ්ඩලයේ අපේක්ෂිත කිරි නිෂ්පාදනය සහ තත්‍ය කිරි නිෂ්පාදනය පහත පරිදි අඩුවීම් නිරීක්ෂණය විය.

| වර්ෂය | ක්‍රියාකාරී සැලසුම අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | තත්‍ය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | අඩුවීම (ලීටර් මිලියන) | අඩුවීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **2019** | 17.91 | 12.43 | 5.48 | 31 |
| **2020** | 15.11 | 12.03 | 3.08 | 20 |
| **2021** | 15.22 | 9.7 | 5.52 | 36 |
| **2022** | 12.54 | 6.43 | 6.11 | 49 |
| **2023** | 8.92 | 4.87 | 4.05 | 45 |

වගු අංක 2.22 : අපේක්ෂිත හා තත්‍ය කිරි නිෂ්පාදනය

## මිල්කෝ පෞද්ගලික සමාගම

**මිනිස් පාරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනය**

කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘති යටතේ නව යන්ත්‍රාගාරය සවිකිරීමෙන් පසු 2017 වර්ෂයේ ජූලි මාසයේදී නිෂ්පාදනය කරන

ලද කිරිපිටි කිලෝග්‍රෑම් 771,652 ක් දෝෂ රහිත බවට පරීක්ෂණ වාර්තා නිකුත් කර විකුණා තිබුණි. නමුත් මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට වූ පාරිභෝගික පැමිණිලි හේතුවෙන් එම තොග නැවත ගබඩා වෙත ගෙන්වාගෙන තිබුණි. එයින් රු. මිලියන 475.2 ක් වටිනා කිරිපිටි කිලෝග්‍රෑම් 720,000 ක ප්‍රමාණයකින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සත්ත්ව ආහාර ලෙස විකිණීමෙන් පසු ඉතිරි කිලෝග්‍රෑම් 17,938 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි. එසේ වුවද මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**දියර කිරි මිලදී ගැනීම**

අපේක්ෂිත වෙළඳපොළ කොටස ළඟාකර ගැනීම සඳහා ඉලක්කගත නිෂ්පාදනය සිදු කිරීමට ප්‍රධාන යෙදවුම වන දියර කිරි, රටෙහි සමස්ත නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. එහෙත් සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම 2020, 2021 හා 2022 යන වර්ෂයන්දී පිළිවෙලින් රටතුල සමස්ත දියර කිරි නිෂ්පාදනයෙන් සියයට 14 ක්, 13 ක් හා 9 ක් තරම් පහළ මට්ටමක පැවතුනු අතර 2023 වර්ෂයේදී 2022 වර්ෂයට සාපේක්ෂව දියර කිරි මිලදී ගැනීම ලීටර් 7,762,535 කින් හෙවත් සියයට 16 කින් ද පහත වැටී තිබුණු බව නිරීක්ෂණය විය.

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| දියර කිරි එකතුකිරීම් (ලීටර්) (සමාගමේ වාර්තා අනුව) | 67,287,519 | 67,905,259 | 47,538,337 | 39,775,802 |
| සමස්ථ කිරි නිෂ්පාදනය (ලීටර්) | 491,538,618 | 513,305,478 | 506,449,602 | * |
| (ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව) | | | | |
| අත්පත් කර ගැනීමේ ප්‍රගතිය | 13.68 | 13.22 | 9.38 | |

*ලබාගත නොහැකි විය

වගු අංක 2.23 : සමස්ත දියර කිරි නිෂ්පාදනය හා සමාගමේ මිලදී ගැනීම

**උපයෝගීතාවය සැලකිල්ලට නොගෙන කර්මාන්තශාලා ඉදි කිරීම**

බඩල්ගම කිරි සැකසුම් කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම සඳහා රු.බිලියන 9.93 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගත වී 2021 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 11.87 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පැවතුණි. එම කර්මාන්තශාලාව නිමවීමෙන් පසු අදාළ කර්මාන්තශාලාවේ යන්ත්‍ර ධාරිතාවයට අනුව දිනකට සමාගමට දියර කිරි ලීටර් 400,000ක් අවශ්‍ය බව වාර්තා කර තිබුණි. වර්තමානයේ අනෙකුත් ක්‍රියාකාරී කර්මාන්තශාලා 04 සඳහා ද ආයතනයට එකතු කළ හැකි දෛනික දියර කිරි ප්‍රමාණය ලීටර් 200,000 ක් පමණක් වන බැවින් මෙම යන්ත්‍ර සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ**

සමාගමට අයත් පොළොන්නරුව කිරි කර්මාන්තශාලාව තුළ ඇති 2011 ජනවාරි 20 දින කල්බදු පදනම මත මිලදීගත් රු. මිලියන 104.18 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය නිෂ්පාදන දෝෂ නිසා වසර 13 ක කාලයක සිට භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර සමාගමට අයත් දිගන කිරි කර්මාන්තශාලාව තුළ ඇති රු. මිලියන 15.45 ක් වූ අයිස් ක්‍රීම් බඳුන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය වසර 11 ක කාලයක සිට භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුනි.

# පරිසර



තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් යන දැක්ම හා තිරසර ස්වභාවික සම්පත් කළමනාකරණය තුළින් පරිසර ආරක්ෂණය තහවුරු කරමින් තිරසර පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම පරිසර අමාත්‍යාංශයේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටු කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා 2023 වර්ෂයේදී ක්‍රියාත්මකව පැවති ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 04 ක් වූ මධ්‍යම පරිසර අධිකාරිය, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය, GSMB තාක්ෂණික සේවා සමාගම සහ ශ්‍රී ලංකා දේශගුණ අරමුදල් පුද්ගලික සමාගම යන ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම.

පරිසර හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

පරිසර හා ස්වාභාවික සම්පත්වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපායමාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

පරිසර හා ස්වාභාවික සම්පත්වලට අදාල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ තිරසර පරිසර සංකල්ප මෙන්ම ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීම.

ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යාන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.

පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදීම.

ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.

යහපත් පරිසර කළමනාකරණය සඳහා රාජ්‍ය සහ දේශපාලන අංශයේ කැපවීම උදෙසා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත රු. මිලියන 2,233 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුන අතර 2023 වර්ෂය අවසන් වන විට

එයින් රු. මිලියන 1,796 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට ඉතිරිය රු. මිලියන 437 ක් විය.

## විගණන නිරීක්ෂණ

### පරිසර අමාත්‍යාංශය

**දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය**

දේශගුණික වෙනස්වීම් සඳහා සූදානම් වීමේ ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභියාගේ ධාරිතාව සහ පද්ධති ශක්තිමත් කිරීමේ මූලික අරමුණ ඇතිව ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවෙහි ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු එ.ජ.ඩොලර් මිලියන 1.8 ක විදේශ ප්‍රදාන මත දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය 2019 අප්‍රේල් 11 දින ආරම්භ කර තිබුණි.

මෙම ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත භුවමාරු ජාලකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා උපදේශන සේවාවක් ලබා ගැනීමට පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. පද්ධතිය වෙත දත්ත සැපයීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ආදී දේශගුණ විපර්යාස සම්බන්ධ දත්ත සැපයිය හැකි පාර්ශවකාර ආයතන 55 ක් හඳුනාගෙන තිබුණු නමුත් අදාල ආයතන මඟින් ලබාදිය යුතු දත්ත නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද හඳුනාගත් ආයතන 55 න් ආයතන 08 ක් සමඟ පමණක් අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් දත්ත සපයන ආයතන වෙත දත්ත ජාලය සඳහා ප්‍රවේශ වීමට අවසර ලබා දී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

උපදේශන සේවාවක් ලබා ගැනීම සඳහා 2024 මාර්තු 31 වන විට රු. මිලියන 29.76 ක් වැයකර පැවතියද එදින වන විටත් මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. මේ සඳහා ලබාගෙන පැවති රු. මිලියන 3.1 ක් වූ කාර්යසාධන බැඳුම්කරය ද 2024 අප්‍රේල් 12 දින කල් ඉකුත් වීමට නියමිතව පැවතිණි. තවද, මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතියද ඒ පිළිබඳව නොසලකා 2022 හා 2023 වර්ෂයන්ට අදාලව රු. මිලියන 1.8 ක් වූ නඩත්තු වියදමක්ද ගෙවා තිබුණි.

මෙම පද්ධතිය සඳහා රු. මිලියන 12.4 ක වැට් රහිත මිලට ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 55 ක් 2020 දෙසැම්බර් 30 දින ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන තිබූ අතර මිලදී ගෙන මාස 14 කට

පසුව පාර්ශවකාර ආයතන 55 වෙත අවබෝධතා ගිවිසුම්වලට එළඹීමෙන් තොරවම ඒවා ලබා දී තිබුණි. විගණන නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පාර්ශවකාර ආයතන 27 අතුරින් පාර්ශවකාර ආයතන 20 ක් ම මෙම ඩෙස්ක්ටොප් පරිගණක ජාලය වෙත දත්ත සම්ප්‍රේෂණය කිරීමට හෝ ඊට අදාල දත්ත සැකසීම සඳහා භාවිත කර නොතිබුණි.

2021 නොවැම්බර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බැවින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසු විපරම් කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කර තිබුණ ද අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය**

සුවදායී භූමිදර්ශ, ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය, යහ පැවැත්ම සහ සෞඛ්‍ය සම්පන්න පරිසර පද්ධති උදෙසා සමාජ ආර්ථික සංවේදී ප්‍රදේශ වල පිහිටි කෘෂිකාර්මික භූමි දර්ශ කළමනාකරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. එක්සත් ජාතීන්ගේ ජගත් පරිසර පහසුකම් වැඩසටහනේ (GEF) එ. ජ.ඩොලර් මිලියන 2 ක් සහ සහාය මූල්‍යාධාර එ.ජ. ඩොලර් මිලියන 9.05 ක් වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 11.05 කට මූල්‍යාධාර යටතේ පරිසර අමාත්‍යාශය, ජෛව විවිධත්ව ජාත්‍යන්තර ආයතනය (Institute of Biodiversity International), හා දකුණු ආසියානු පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP) යන විධායක පාර්ශවකාර ආයතන මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය නියමු ආකෘතියක් ලෙස තෝරාගත් ග්‍රාමීය එල්ලංගා වැව් පද්ධති ප්‍රතිස්ථාපනය යටතේ පළුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෙල්ලන්කඩවිල එල්ලංගා පද්ධතියට අයත් තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කර තිබුණි.

වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමේ අරමුණින් රු. මිලියන 51.56 ක් වැයකර තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කර තිබුණ ද වැවෙහි වාන් ජලය එල්ලංගාවේ පහළ පිහිටි වැව් කරා ගලා යාමට හැකිවන පරිදි ඇළ මාර්ග පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් වැව මඟින් වගා කටයුතු සඳහා ජලය මුදා හැරීමට නොහැකි වී තිබුණි.

එසේම තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණයට අදාල ගිවිසුමේ නිමැවුම් ලෙස අක්කර 200 ක කුඹුරු ප්‍රතිස්ථාපනය සහ පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපනය ද දක්වා තිබුණ ද 2013 අගෝස්තු 01 දිනැති හා අංක 1821/34 දරන ගැසට් පත්‍රය මඟින් තුම්බිකුලම වැව සහ ඒ ආශ්‍රිත හෙක්ටයාර් 2,744 ක ප්‍රදේශයක් තුම්බිකුලම රක්ෂිත වනාන්තරයට

අයත් ලෙස නම්කර තිබුණු බැවින් උක්ත ගිවිසුමේ නීත්‍යානුකූලව ළඟාකර ගත නොහැකි නිමවුම් දක්වා ඇති බව ද නිරීක්ෂණය විය.

ව්‍යාපෘතිය යටතේ තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව 2022 ජනවාරි 26 දින පළඟස්වැව ප්‍රාදේශීය සම්බන්ධිකරණ රැස්වීමේදී සාකච්ඡා සටහන් අනුව වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වන ජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම වැව සොරොව්වක් රහිතව ඉදිකිරීමට එකඟතාවය ලබා දී තිබුණි. එසේවුවද රු.මිලියන 1.5 ක් වැයකර මෙම වැවෙහි සොරොව්වක් ඉදිකර ඇති බව 2023 අගෝස්තු 14 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2009 අංක 65 දරන කැලෑ සංශෝධන පනතේ 7.1 (ඕ) වගන්තිය අනුව යම් පාරක් තැනීම, දැනටමත් තනන ලද යම් පාරක් වෙනස් කිරීම, එසේ තනන ලද පාරක් භාවිතා කිරීම ආදී ක්‍රියා රක්ෂිත වනයක තහනම් ක්‍රියා ලෙස දක්වා තිබුණ ද සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 2.1 ක් වැයකර පිවිසුම් මාර්ගයක් සකස් කර තිබුණු අතර මෙම ව්‍යාපෘති ප්‍රදේශය තුම්බිකුලම රක්ෂිතයට අයත්වීම තුළ එය කැලෑ පනතට පටහැනි ක්‍රියාවක් බව නිරීක්ෂණය විය.

**අනාර්ථික ගනුදෙනු**

අමාත්‍යාංශයට අයත් සහ 2013 වර්ෂයේදී තෙවන පාර්ශවීය රක්ෂණාවරණයක් පමණක් ලබාගෙන තිබූ වාහනයක් අනතුරකට ලක්ව වර්ෂ 10 කට අධික කාලයක් අළුත්වැඩියා වියදම පියවීමට නොහැකිව පෞද්ගලික ගරාජයක රඳවා තිබුණි. කෙසේ වුවද මෙම වර්ෂ 10 ක කාලය තුළදීම මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණය සිදු කර අළුත්වැඩියා වියදම අයකරගත යුතු ආකාරය නිවැරදිව තීරණය කර නොතිබුණි. 2023 වර්ෂයේදී මෙම වාහනය රු. මිලියන 1.8 කට අපහරණය කර තිබුණු අතර අපහරණය කරන ලද මුදලින් රු. මිලියන 1.6 ක් අළුත් වැඩියා කිරීමේ වියදම ගෙවා ඉතිරි මුදල මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ අනුව රජයට රු.මිලියන 1.6 ක අලාභයක් සිදු කර තිබුණි.

## මධ්‍යම පරිසර අධිකාරිය

**පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා නොතිබීම**

ජාතික පාරිසරික පනත් ප්‍රකාරව යම් ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට පූර්වයෙන් නියමිත ප්‍රමිතීන්වලට අනුකූලව එකී අපද්‍රව්‍ය මුදා හැරීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු වේ. එහෙත් උතුරුමැද හා බස්නාහිර පළාත් කාර්යාලයන්හි සහ මහනුවර හා මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයන්හි අධීක්ෂණයට යටත් ප්‍රදේශවල බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ව්‍යාපාර 272 ක් වූ අතර ඒ තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කර

වසර 1 ½ ක සිට වසර 28 ක කාලයක් ඉක්ම වූ ව්‍යාපාරත්, ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂය හඳුනා නොගත් ව්‍යාපාරත් පැවතියද අධිකාරිය විසින් එම ව්‍යාපාර සම්බන්ධයෙන් අවශ්‍ය පියවරයන් කාලීනව ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**බලපත්‍රය කොන්දේසිවලට අනුකූලව කටයුතු කර නොතිබීම**

2024 මැයි 21 දිනට පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබූ මාතලේ සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකට අයත් කළුගල්, ඩොලමයිට් කැනීම් කර්මාන්ත 10 ක් පැවතුණි. තවද, අප ජලය ජල මූලාශ්‍ර වෙත මුදාහරිනු ලබන කර්මාන්ත 03 ක්, අපද්‍රව්‍ය ප්‍රතිකර්මයකින් තොරව බාහිර පරිසරයට මුදාහැර තිබූ කර්මාන්ත 02 ක්, නියමිත ප්‍රමිති හා උපමානවලට අනුකූලව කටයුතු කර නොතිබුණු කොළඹ දිස්ත්‍රික්කයේ කර්මාන්ත 07 ක් ද විය. තවද විශ්ලේෂණ වාර්තා, කැණීම් බලපත්‍ර වැනි පූර්වයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබූ කර්මාන්ත 25 ක් සම්බන්ධයෙන්ද අධිකාරිය විසින් අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි.

**වලංගු කාලසීමාව ඉක්මවූ බලපත්‍ර අලුත් කර නොගැනීම්**

පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව වලංගු කාලසීමාව ඉක්මවීමට මාස 03 කට පෙර ඉල්ලුම් කර බලපත්‍රය අලුත් කර ගත යුතු නමුත්, එසේ බලපත්‍රය අලුත් කරනොගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන මාතලේ, දඹුල්ල, කොළඹ, මහනුවර, මොණරාගල සහ අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ව්‍යාපාර 396 ක් 2024 මැයි 20 වන විටත් පැවතිණි.

**චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ගෙවීම්**

අධිකාරිය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගෙන තිබියදී 2022 වර්ෂයේ සේවකයින්ගේ ඉතිරි නිවාඩු සඳහා රු. මිලියන 34.2 ක් 2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව ගෙවා ඇති බවට විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබියදීත් 2023 වර්ෂයේ ඉතිරිකරගත් නිවාඩු සඳහාද රු. මිලියන 31 ක් ගෙවා තිබුණි.

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

**නිෂ්කාර්ය මුදල් ශේෂය**

2011 වර්ෂයේදී අනතුරට පත්වූ නැවකින් ලැබුණු රු.මිලියන 10 ක වන්දියක් හා 2022 වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් වලින් රු.මිලියන 100 ක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැර කර එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරමින් තිබුණු අතර

ආයෝජන පොලී එකතුවීමෙන් 2023 වර්ෂය අවසානයට එම අරමුදලේ ශේෂය රු.මිලියන 119.5 ක් වී තිබුණි. එසේ වුවද, සමුද්‍රීය පරිසර දූෂණය වැලැක්වීම සම්බන්ධයෙන් කළයුතු කාර්යයන් හඳුනා ගෙන සිදුනොකිරීම නිසා මෙම අරමුදල නිෂ්කාර්යව පැවතුණි.

**විද්වත් කමිටු දීමනා**

MV-X Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් වූ හානිය තක්සේරු කිරීම සඳහා පත් කල විද්වත් කමිටුවට ගෙවිය යුතු දීමනා තීරණය කිරීම සඳහා 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුවේ සාමාජිකයින් 04 දෙනෙකු විසින් දිනකට එ.ජ. ඩොලර් 350 ක් බැගින් එ.ජ. ඩොලර් 584,500 ක් ගෙවීමට, එම කමිටුවට නම්කර තිබුණු ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරියාගේ නිර්දේශය ලබා නොගෙන තීරණය කර තිබුණි. එසේම විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ එම රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විද්වත් කමිටුවට ගෙවා තිබුණු රු.මිලියන 6.5 ක දීමනාව ගණනය කළ ආකාරය පිළිබඳව ද විගණනය වෙත සනාථ නොකරන ලදී.

**නෞකාවෙන් විසිරුණු පබලු ඇහිඳීම සඳහා දරණ ලද වියදම**

ප්‍රජා සහභාගීත්වයෙන් MV - X Press Pearl නෞකාවෙන් විසිරුණු පබලු ඇහිඳීම සඳහා 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් දක්වා දීමනා ලෙස රු.මිලියන 248.2 ක් හා උපකරණ, ප්‍රවාහන, ආහාර හා වෙනත් වියදම් සඳහා රු.මිලියන 553.8ක් වැයකර තිබුණි. දෛනිකව එකතු කරනු ලබන මුළු පබළු ප්‍රමාණයෙහි සාමාන්‍ය අගය 2022 දී කි.ග්‍රෑම් 44 සිට 2023 වනවිට කිලෝ ග්‍රෑම් 20 කට ආසන්න අගයක් දක්වා එනම් සියයට 55 කින් අඩුවී තිබුණු නමුත් ප්‍රජා සහභාගීත්වය සඳහා දරන ලද වියදමේ අඩුවීම රු.මිලියන 124 සිට රු.මිලියන 106 දක්වා රු.මිලියන 18 ක් එනම් සියයට 15 ක් පමණක් වීතිබුණි.

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**අනවසර ඉදිකිරීම්**

2012 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 2,763කින් 2,445ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2015 සිට 2023 දක්වා අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණු රු. මිලියන 3.9 කින් සියයට 85 වන රු. මිලියන 3.3 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**වෙරළ ඛාදනය නැවැත්වීම සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම**

2017 වර්ෂයේදී ඇතිවූ ගංවතුර තත්ත්වය පාලනය සඳහා පිළියමක් ලෙස කළුගඟ මෝය කට පුළුල් කිරීම නිසා කළුතර අවට වෙරළ ඛාදනය දැඩි ගැටලුවක් බවට පත්වීමෙන් එම මුහුදු ඛාදනය නැවැත්වීමේ පිළියමක් ලෙස 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 189 ක් වැයකර ව්‍යාපෘති කාර්යන් 19 ක් සිදුකර තිබුණ ද එම ගැටලුව සඳහා ස්ථිර පිළියමක් ලැබී නොතිබුණි.

**වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල**

පොලිස් ස්ථාන 31 කින් ලබාගත් විස්තර අනුව 2014 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව අධිකරණවලින් ලැබිය යුතුව තිබූ රු. මිලියන 10.1 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

# වනාන්තර සහ වනජීවී

"වන ජීවීන් හා වන සම්පත සුරැකි තිරසර දේශයක්" දැක්ම කරගත් " වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම අරමුණු කර ගනිමින් ස්ථානීය හා පරිබාහිර සත්ත්ව සංරක්ෂණය ද තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියමු ආයතන සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම" යන මෙහෙවර ඉටුකිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු තුනක්, ව්‍යවස්ථාපිත ආයතනයක්, ව්‍යවස්ථාපිත අරමුදල් තුනක් සහ විදේශාධාර ව්‍යාපෘතියක් 2023 වර්ෂයේදී ක්‍රියාත්මකව පැවති අතර අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යභාරය ඉටුකළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

අමාත්‍යාංශ විෂය යටතට අයත් ආයතයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 03 ට රු. මිලියන 8,671 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු අතර 2023 වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 7,775 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 896 ක් ඉතිරි කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**අලි මිනිස් ගැටුම**

2023 වර්ෂය තුළදී විදුලි වැටවල් ඉදිකිරීම සඳහා රු.මිලියන 58.6 ක් හා එහි නඩත්තුව සඳහා රු.මිලියන 14.4 ක් ද ඇතුළුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය සඳහා කාලය තුළ පමණක් විදුලි වැටවල් සඳහා වැය කර තිබුණු මුදල රු. මිලියන 2,355.9 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට විදුලි වැටවල සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 5,389.97 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

| | 2023 | 2022 | 2021 | 2020 | 2019 | එකතුව |
|---|---|---|---|---|---|---|
| වන අලි මරණ | 488 | 439 | 375 | 327 | 407 | 2,036 |
| මිනිස් මරණ | 184 | 145 | 142 | 113 | 122 | 706 |
| ශාරිරික හානි | 239 | 179 | 58 | 75 | 145 | 696 |
| දේපළ හානි | 3,429 | 2,668 | 1,326 | 850 | 2,148 | 10,421 |

වගු අංක 2.24 : පසුගිය වර්ෂ 05 තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි

**අලි ඇතුන්ගේ වාසස්ථාන සුපෝෂණය**

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තබ්බෝව අභයභූමියේ හෙක්ටයාර 315 ක කලපු අන්දර ඉවත් කර අලි ඇතුන්ගේ වාසස්ථාන සුපෝෂණය සඳහා රු. මිලියන 57.4 ක් ද, ඉවත් කළ ප්‍රදේශය නඩත්තුව සඳහා රු. මිලියන 5.8 ක් ද වැය කර තිබුණි. නමුත්, 2023 වර්ෂය අවසන් වන විටත් විශාල භූමි ප්‍රදේශයක කලපු අන්දර නැවත වැවී තිබුණි. මේ හේතුවෙන් අලි ඇතුන්ට රක්ෂිතයෙහි රැඳී සිටීමට අපහසු වී ඔවුන් කිලෝමීටර් 50 ක් පමණ ඈත ගම්මානවලට ගමන් කරන බව නිරීක්ෂණය විය.

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**හිඟ බදු ආදායම්**

නුවරඑළිය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යෑම සඳහා පුද්ගලික සමාගමකට ලබා දී තිබුණු භූමි ප්‍රමාණයට වඩා පර්චස් 72 ක් වැඩියෙන් 2016 වර්ෂයේ සිට පරිහරණය කර තිබුණු අතර එම සමාගම විසින් 2019 වසරේ සිට වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම නවතා තිබුණි. ඒඅනුව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පර්චස් 72 ක් සඳහාත්, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පර්චස් 174 සඳහාත් අයවිය යුතු රු. මිලියන 5.4 ක බදු මුදල් (වැට් බදු සමඟ) අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**හිඟ බලපත්‍ර ගාස්තු**

නුවරඑළිය දිසාවන කාර්යාල බල ප්‍රදේශය තුළ ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේක්ෂණ කුළුණු 06 ක වාර්ෂික බලපත්‍ර අලුත් නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 22.8 ක ආදායමක් අහිමි වී තිබුණි. සම්ප්‍රේක්ෂණ කුළුණු පිළිබඳ පසු විපරම් කිරීමේ දුර්වලතා මේ සඳහා හේතු වී තිබුණි.

**හිග ගල් කොරි ආදායම්**

අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් සෑම මාස 06 කට වරක්ම එක් එක් කැණීම් ස්ථාන වල සිදු කරන ලද කැණීම් ප්‍රමාණය, සමෝච්ඡ රේඛා සිතියම් අනුව ගණනය කර අදාළ රජයේ ඉඩම් කළමනාකාරිත්වය හිමි ආයතනය, පුපුරණ ද්‍රව්‍ය පාලන අධිකාරිය හා කැණීම්කරු වෙත දැනුම් දිය යුතු වේ. එහෙත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ

කළමණාකාරීත්වයට යටත්වන ප්‍රදේශවලට අදාල වූ එම වාර්තා නියමිත කාලවකවානු තුළ දෙපාර්තමේන්තුව විසින් ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ගල්කොරි හිමිකරුවන් විසින් සීමාව ඉක්මවා සිදු කරන කැණීම් වෙනුවෙන් හිඟ ගාස්තු කාලීනව හා නිසියාකාරව අය කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒඅනුව බදුල්ල, අම්පාර හා මොණරාගල දිසාවන් හි ගල් කොරි හිමියන් ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු හිඟ ආදායම් පිළිවෙලින් රු.මිලියන 5.2 ක්, රු. මිලියන 34.1 ක් හා රු. මිලියන 7.6 ක් වී තිබුණි.

**වනාන්තර ගැසට් නොකිරීම**

රක්ෂිත වනාන්තර ලෙස මොණරාගල දිසාව තුළ 2021 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබුණු හෙක්ටයාර් 25,892 ක වනාන්තර 147 ක් ද, අම්පාර දිසාව තුළ 2019 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබු හෙක්ටයාර 22,657.78 ක් වූ වනාන්තර 64 ක් ද පැවතිණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ප්‍රසිද්ධයට පත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රක්ෂිත වනාන්තර ආශ්‍රිතව අනවසර ඉඩම් අල්ලා ගැනීම් බහුලව සිදුවී තිබුණි. එමනිසා ඒවා රක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට සිදු වී තිබීමෙන් පවතින ස්වභාවික වනගහන ප්‍රතිශතය ක්‍රමයෙන් අඩුවීමට හා ඒ තුළින් තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැක.

**රෝපනය කරන ලද පැළ හානිවීම්**

රෝපනය කරන ලද පැළ බෙදා හැරීමේ කාර්යය සඳහා සැළසුම්ගත වැඩ පිළිවෙලක් නොතිබීම හේතුවෙන් විවිධ වැඩසටහන් යටතේ 2019 වසරේ සිට ප්‍රධාන පැළ තවාන් 49 ක රෝපණය කර තිබුණු විවිධ වර්ගයේ පැළ 861,921 ක් හානියට ලක්වී තිබුණි. දියතලාව හමුදා කඳවුර හා සම්බන්ධ හෙක්ටයාර 42 ක් වූ නරියා කන්ද පයිනස් වන වගා භූමිය තුළ 2021 වර්ෂයේ රෝපණය කර තිබුණු පැළ 160,000 කින් බොහොමයක් ද හානියට ලක් වී තිබුණු අතර වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් පැළ තවාන් 04 ක රෝපණය කර තිබුණු පැළ 325,500 කින් පැළ 210,759 ක් හානියට ලක්වී තිබුණි.

**උපරිම දැව ඵලදාව ලබා ගැනීමට නොහැකිවීම**

1998 සිට 2011 දක්වා කාලය තුල අපේක්ෂිත වර්ධන කාලය සම්පූර්ණ වී තිබූ අම්පාර දිසා වන කාර්යාලයට අයත් වාණිජ වන වගා 03ක් 2023 දෙසැම්බර් 31 වනවිටත් හෙළීම් කිරිම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට මුදා හැර නොතිබුණි. මේ නිසා වගාවන්වලට ස්වාභාවික හේතුන් සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන හානි හා වන අපරාධ හේතුවෙන් උපරිම දැව ඵලදාවක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වන බව නිරීක්ෂණය විය. එමෙන්ම වන වගා බිම් මඟින් දේශීය පරිභෝජනය හා අපනයනය සඳහා අවශ්‍ය වන දැව

නිෂ්පාදනය වර්ධනය කිරීම පසු බැමකට ලක්ව තිබුණු බවද නිරීක්ෂණය විය.

**කැබලිත්ත රක්ෂිතයේ අනවසර වගා කිරීම්**

දීර්ඝ කාලයක සිට කැබලිත්ත රක්ෂිතයේ ඉඩම්වල අනවසර වගා කිරීම් හේතුවෙන් අක්කර 25,000 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැර කිරීමට සිදු වී තිබුණි. මායිම් කණු සිටුවා දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ප්‍රමාණය වෙන් කර නොගැනීම, නිලධාරීන්ගේ හිඟකම, නිලධාරීන් සඳහා පවතින යටිතල පහසුකම් අවම වීම වැනි කරුණු හේතුවෙන් කැබලිත්ත රක්ෂිතය සුරැකීම දෙපාර්තමේන්තුවට අසීරු කාර්යයක් වී තිබුණු අතර හේන් ගොවිතැන සඳහා ඉඩම් ඉල්ලීමද ඉහළ ගොස් තිබුණි.

## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

**සත්වෝද්‍යාන ආරම්භ කිරීමේ අරමුණු ඉටු නොවීම**

ශ්‍රී ලංකාවට ආවේණික සහ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමේ අරමුණින් පින්නවල සත්වෝද්‍යානය ආරම්භ කර ඇත. එහි දැනට සිටින සත්ත්ව විශේෂ 26 තුළ ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ 03 කට අයත් සතුන් 10 දෙනෙකු පමණක් රඳවා තිබුණි. කෙසේ වුවද, ඒ තුළ සිටි ගැහැණු හා පිරිමි වලසුන් දෙදෙනා අතර පවතින වයස් පරතරය හා දිවියන් 05 දෙනාගේ නොගැලපීම් හේතුවෙන් පැටවුන් බිහි වී නොතිබුණි.

**පරිසර ආරක්ෂණ පනතට පටහැනිව අපද්‍රව්‍ය බැහැර කිරීම**

පින්නවල අලි අනාථාගාරය සඳහා 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23(අ) සහ 23(ආ) වගන්ති අනුව පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. මේ අතර අලි අනාථාගාරයේ අලි ගාල් පවිත්‍ර කිරීමෙන් ඉවත් කරන අප ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය 2020 ඔක්තෝම්බර් 31 දින සිට අක්‍රීයව පැවතීම හේතුවෙන් අපජලය දිනපතා මා ඔය වෙත මුදා හරිමින් පැවතුණි.

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

**නිෂ්කාර්ය උපකරණ**

මෙම ව්‍යාපෘතිය යටතේ 2020 හා 2021 වර්ෂ වලදී අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ගම්මාන වටා සහ කුඹුරු වටා විදුලි වැට ඉදි කිරීම සඳහා මිලදී ගෙනතිබුණු උපකරණවලින් කොටසක් අදාල සමිතිවලට හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුරාධපුර හා කුරුණෑගල සහකාර අධ්‍යක්ෂ කාර්යාලවලට නිකුත් කර තිබුණි. එහෙත් 2023 වර්ෂය අවසන් වන විටත් රු. මිලියන 80.7 ක උපකරණ සහ එනජයිසර් බල ගැන්වීම සඳහා මිලදී ගන්නා ලද රු. මිලියන 0.5 ක්වූ 12V (90Am) බැටරි 16 ක් භාවිතයට නොගෙන

රිටිගල, මොරගොඩ හා මහ දිවුල්වැව වනජීවී බීට්ටු කාර්යාල පරිශ්‍රයන්හි අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. තවද 2020 වර්ෂයේ මිලදී ගෙන තිබුණු Tension Spring ඒකක 3,183 න් ඒකක 56 ක් පමණක් විදුලි වැටවල් සඳහා නිකුත් කර තිබීමෙන් රු.මිලියන 7.8 ක් වටිනා ඒකක 3,127 ක්ද රු. මිලියන 1.4 ක් වටිනා විදුලි වැටට හානියක් සිදුවන අවස්ථාවකදී නාද වන Fence voltage alarm with siren and flashlight ඒකක 09 ක් ද භාවිතයට නොගෙන 2023 වර්ෂය අවසන් වන විටත් නිශ්කාර්යව මොරගොඩ වනජීවී බීට්ටු කාර්යාලයේ ගබඩාවේ පැවතුණි.

**වත්කම් හානි සම්බන්ධයෙන් අලාභ අය කර නොගැනීම**

රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා මිලදීගෙන තිබූ වටිනාකම රු. මිලියන 2.8 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම තක්සේරු නොකළ nut & bolt 122 ක් 2022 වර්ෂයේදී සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ අතර ඒසඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට 2023 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## වන සත්ව සංරක්ෂණ අරමුදල

**නියමිත ප්‍රමිතියෙන් තොර භාණ්ඩ මිලදී ගැනීම**

2021 මාර්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට ඇතිරීම සඳහා වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් සහ කිලෝමීටර් 1,500 ක් දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍ය වන උපකරණ රු. මිලියන 87.3 ක මුදලකට දින 90 ක් තුළ රාජ්‍ය සමාගමක් වෙතින් සපයා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව රු. මිලියන 13.4 ක් වටිනා අයිතම පමණක් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු අතර ඒවා තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීමෙන් තොරව භාර ගෙන තිබූ බවද නිරීක්ෂණය විය. තවද, ලබා දී තිබූ භාණ්ඩද ගබඩා කර තිබූ ස්ථානවල කැඩී බිඳී විනාශ වී යමින් පැවතුණි. නියමිත පරිදි සැපයුම් සිදු නොකිරීම නිසා 2022 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණු අතර ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම වූ රු. මිලියන 8 ක මුදල ඊට අදාළ අත්තිකාරම් බැඳුම්කරයෙන් හෝ පියවා ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

## සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල

**පක්ෂීන් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**

හම්බන්තොට සෆාරි උද්‍යානයේ ප්‍රදර්ශනය කිරීම සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 66 ක් ගෙවා විදේශීය පක්ෂීන් 136 දෙනෙකු මිලදී ගෙන තිබුණි. මෙම පක්ෂීන් ප්‍රදර්ශනය සඳහා ඉදිකරනු ලබන

පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණු අතර ඒ වන විට රු.මිලියන 18.8 ක් වැය කර තිබුණි. මේ හේතුවෙන් පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි.

## රාජ්‍ය දැව සංස්ථාව

**වැඩ බිම සඳහා තැන්පත් කර ඇති ඇප මුදල්**

වැඩබිම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇප ලෙස තබා තිබුණු රු.මිලියන 15.9 ක මුදලින් අවුරුදු 02 ඉක්මවා තිබූ රු. මිලියන 10.2 ක ඇප මුදල් ආපසු ලබාගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. භාරදී තිබූ ඇතැම් වැඩබිම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉවත්වීම් සහතික ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැඩ නිමකර ඇති වැඩ බිම් වල ඇප තැන්පත් ලබා ගැනීමට ද නොහැකි වී තිබුණි.

**වන අපරාධ දැව සම්බන්ධයෙන් කටයුතු නොකිරීම**

2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ මඟ පෙන්වීම් ප්‍රකාරව වන අපරාධ දැව සම්බන්ධයෙන් කටයුතු කල යුතු වේ. නමුත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන්, වන අපරාධ දැව විනාශ වීම, දැව කළමණාකරණය හා ගබඩා පහසුකම් කළමනාකරණය කර ගැනීම අපහසු වීම වැනි අසීරුතාවලට සංස්ථාව මුහුණ පා සිටින අතර මහනුවර ප්‍රාදේශීකයට අදාළව පමණක් කඳන් දැව ඝන ඩෙසිමීටර් 159.90 ක් සහ ඉරූ දැව ඝන ඩෙසිමීටර් 30.93 ක් දිරාපත් වෙමින් ද, ගබඩා ඉඩ පහසුකම් ඇහිරී ගොස් ද තිබුණි.

**පරිත්‍යාග දැව ඉවත් තිරීම**

පරිත්‍යාග වශයෙන් ලැබෙන දැව ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී ඉවත් කිරීම් 1,157 ක් සඳහා රු. මිලියන 41.9 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට සිදුවී තිබුණි. තවද, කොන්ත්‍රාත් පිරිවැය රු.100,000 ට වැඩි කාර්යයන් සහ රු.15,000 ට වැඩි අලාභ ලබන ගස් කැපීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබා දීමට විශාල කාලයක් ගත වීමෙන් ඉතා අවධානම් සහිතව නොපමාව ඉවත් කළ යුතු ගස් පවා ඉවත් කිරීම ප්‍රමාද වී තිබුණි.

**ඌණ උපයෝජිත භාණ්ඩ**

අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගැනීමෙන් තොරව 2023 වර්ෂයේ දී සංස්ථාව විසින් මිලදීගෙන ප්‍රාදේශීය කාර්යාල 13 ක් වෙත බෙදා හැර තිබුණු රු. මිලියන 35.8 ක් වටිනා දම්වැල් කියත් (chain saw) 100 කින් 75 කට වැඩි ප්‍රමාණයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකිරීම හේතුවෙන් ඌණ උපයෝජිතව පැවතුණි.

**ණයට විකුණුම් වෙනුවෙන් අයවිය යුතු මුදල්**

ණය පදනම මත ලබාදුන් දැව සහ දැව ආශ්‍රිත ගෘහ භාණ්ඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ණය ශේෂය රු. මිලියන 966 ක්වූ අතර ඉන් වසර 01 සිට වසර 04 කට වැඩි කාලයක් ඉක්ම වූ ණය ශේෂය රු. මිලියන 240 ක් විය.

# ජල සම්පාදන හා ජලාපවාහනය


එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 06 අනුව සියළු දෙනාටම ජලය හා සනීපාරක්ෂාව ලබාගැනීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම බලාපොරොත්තුවේ. ඉහත ඉලක්කයන් මූලික කරගත් රටෙහි සමස්ථ ජල සැපයුම සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාරය ඉටුකිරීම, ජලසම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ ඒ යටතේ වූ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය ඇතුලු දේශීය හා විදේශීය ණය ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති මගින් සිදුකරමින් පවතී. සැමට ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව යන දැක්ම යටතේ පිහිටුවා ඇති ජල සම්පාදන අමාත්‍යාංශයේ සමස්ත ජනගහනයට ආරක්ෂිත හා ප්‍රමාණවත් පානීය ජල පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රවේශය සහතික කිරීමටත්, සැමට ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීමත් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත කාර්යභාරයන් ඉටුකළ යුතුව ඇත.

**කාර්යභාරයන්**

පානීය ජලසම්පාදන හා සනීපාරක්ෂක විෂයට අදාලව ප්‍රතිපත්ති සැකසීම, ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.


අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් සම්බන්ධ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ හා ඇගයීම.

රටේ ආරක්ෂිත පානීය ජල සැපයුම් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත හා නිවැරදි සංඛ්‍යා දත්ත වාර්තා වී නොමැති අතර 2023 වර්ෂය අවසන් වන විට රටෙහි නල ජල සැපයුම් මගින් ආවරණය වන ප්‍රමාණය සමස්ථ ජනගහනයෙන් සියයට 61.6 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.




රූප සටහන් අංක 2.37 : **රටෙහි පානීය නල ජල සැපයුම (2016 සිට 2023 වසර දක්වා)**

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය




රූප සටහන් අංක 2.38 : පානීය ජල සැපයුමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හා ප්‍රජා මූල සංවිධාන, පළාත් පාලන ආයතන හා වෙනත් අංශවල දායකත්වය
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රටෙහි පානීය ජල සැපයුමෙහි ප්‍රමුඛතම කාර්යභාරය ඉටුකරනු ලබන අතර 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී සියයට 1.5 ක වර්ධනයක් සහිතව රටෙහි සමස්ත පානීය ජල සැපයුමෙන් සියයට 48.1 ක් පමණ මණ්ඩලය විසින් ආවරණය කර තිබුණි. කෙසේ වුවද, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රටෙහි සමස්ත පානීය ජල සැපයුම සියයට 1.4 කින් වර්ධනය වී තිබුණු අතර ප්‍රජා මූල සංවිධාන මඟින් සිදුකරන ලද ව්‍යාපෘති වලින් ලැබී ඇති දායකත්වය සියයට 0.1 කින් පමණ අඩුවී තිබුණි.

## ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය - ජල සම්පාදන අංශය

2023 වර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන යටතේ ජල සම්පාදන අමාත්‍යාංශය සඳහා රු. මිලියන 74,520 ක වාර්ෂික ප්‍රතිපාදන ලැබී තිබුණු අතර රු. මිලියන 47,109 ක් අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහා වැයකර තිබුණි.

## විගණන නිරීක්ෂණ

**මැණික්කඩවර හා මහපල්ලේගම ප්‍රජා ජල ව්‍යාපෘතිය**

ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන මැණික්කඩවර හා මහපල්ලේගම ප්‍රජා ජල ව්‍යාපෘතිය ආරම්භ කල ඉඩම නායයාමට ලක් වී තිබූ අතර විගණන දින වූ 2024 මාර්තු වන විට ව්‍යාපෘතිය නවතා තිබුණි. 2020 අගෝස්තු මස ජාතික ගොඩනැගිලි පරීක්ෂණ සංවිධානයේ භූ සමීක්ෂණ වාර්තා අනුව අදාල භූමිය ඉදිකිරීම් කටයුතු සුදුසු නොවන බව දක්වා තිබූ නමුත් ලබාදී තිබූ නිර්දේශ 07න් නිර්දේශ 02 ක් ක්‍රියාත්මක නොකර ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. ව්‍යාපෘති නවතා දමන අවස්ථාව වන විට ව්‍යාපෘතිය වෙනුවෙන්

රජයේ මුදල් රු.මිලියන 32.86 ක් වැය කර තිබුණු අතර එම සම්පූර්ණ මුදල නිෂ්කාර්ය සහ අනාර්ථික වැයක් බවට පත්ව තිබුණි.

**වරාය ප්‍රමාද ගාස්තු ගෙවීම**

සැමට පානීය ජලය සැපයීමේ අරමුණින් 2021 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආරම්භ කරන ලද ‘සැමට ජලය’ වැඩසටහන සඳහා 2022 වර්ෂයේදී ආනයනය කරන ලද පයිප්ප හා උපාංග සහිත කන්ටේනර් 122 ක් වරායෙන් නිදහස් නොකර වසරකට වැඩි කාලයක් ගත වී තිබූ බැවින් කන්ටේනර් 117 ක් වෙනුවෙන් Colombo International Container Terminals (CICT) වෙත හා කන්ටේනර් 05 ක් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට වෙත ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 945.08ක් 2023 වර්ෂය තුළදී නිශ්කාර්යව ගෙවා තිබුණි.

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ රු. මිලියන 1,959.6 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ අතර එයින් රු. මිලියන 896.38 ක් එනම් සියයට 45.73 ක් මෙම ක්ෂේත්‍රය සඳහා උපයෝජනය කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

**ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය තුළදී ලබා දී තිබූ එකතුව රු.මිලියන 389 ක් වූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 216.65 ක් එනම් සියයට 56 ක් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ළමා අරමුදල (UNICEF) මගින් රටෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබී තිබූ විදේශ ප්‍රදාන යටතේ වූ සියයට 66 ක් එනම් රු.මිලියන 6.56 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර ඉතිරිව පැවතුණි. ප්‍රදානයක් ලෙස වාර්ෂිකව ලැබෙන මෙම මුදල් ඵලදායී ලෙස උපයෝජනය කර ප්‍රතිලාභී ජනතාවට සහන සැලසීම දිගින් දිගටම දෙපාර්තමේන්තුව විසින් නොසළකා හැර තිබුණු අතර ඊට අදාළව පෙර වර්ෂයේ ඉතිරි වූ ප්‍රතිපාදනය රු.මිලියන 2.32 ක් වී තිබුණි.

**මාතලේ දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති**

ඇස්තමේන්තු වටිනාකම එකතුව රු.මිලියන 47.90 ක් වූ මාතලේ දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 05 ක් ගින් පවුල් 970 කට ජලය ලබාදීමට අපේක්ෂා කර තිබුණද සත්‍ය ලෙස ජල සැපයුම ලබා දී තිබුණේ පවුල්

377 කට පමණක් වන අතර එම ජලයද පිරිසිදු පානීය ජලය බවට තහවුරු කරන වාර්තා නොතිබුණි.

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති**

2021 වර්ෂය තුලදි ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 77.68 ක් වූ ප්‍රජා ජල ව්‍යාපෘති 09 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉදි කිරිම සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්වලට එළැඹී තිබුණි. එම කොන්ත්‍රාත් 9 න් ඇස්තමේන්තු වටිනාකම එකතුව රු.මිලියන 51.22 ක් වූ කොන්ත්‍රාත් 6 ක ඉදිකිරිම් අත්හැර දමා තිබූ අතර අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත් අවසන් කර තිබුණි. එම කොන්ත්‍රාත් වෙනුවෙන් වැයකර තිබූ එකතුව රු.මිලියන 38.31 ක මුදල ඵලදායී වී නොතිබුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කය තුල 2019, 2020 හා 2021 යන වර්ෂවලදි ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 19 ක් පොම්පාගාර, ළිං, ජල ටැංකි, ජල කුළුණු ඉදිකිරිම් අවසන් නොකර තිබිමෙන් හා ජල ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ජල පොම්ප හා අනෙකුත් උපාංග ලබා නොදිම හේතුවෙන් ඉදකිරීම් කටයුතු අවසන් කර ප්‍රතිලාභි ජනතාවට පානිය ජලය සැපයිමට නොහැකි වි තිබු අතර 2023 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 14 ක් සඳහා රු.මිලියන105.67 ක් වැයකර තිබුණි. එමෙන්ම පුත්තලම, ත්‍රිකුණාමලය, මාතලේ, මඩකලපුව සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල 2021 වර්ෂය තුලදී ඉදිකිරිම් ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 11 ක ඉදිකිරිම් කටයුතු විවිධ හේතුන් මත අතර මඟ නවතා දමා තිබූ අතර ඒ වන විට එම ව්‍යාපෘති වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු.මිලියන18.64 ක මුදලද නිශ්කාර්ය වී තිබුණි.

**මුදල් ලැබී තිබූ නමුත් වැඩ අවසන් කර නොතිබුණු ව්‍යාපෘති**

වව්නියාව දකුණ, අරවන්තුලාව ජල සම්පාදන ව්‍යාපෘතියෙහි පළමු අදියර සඳහා සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහාහීල්ල පැරකුම් ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා පිළිවෙලින් වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා හම්බන්තොට පලාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේදී රු.මිලියන 7.25 ක් දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ මුදල් ලැබී වසර 03 ක් පමණ ගත වී තිබුණත් 2023 දෙසැම්බර් 31 වන විටත් එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කර නොතිබුණි. තවද ව්‍යාපෘති සඳහා ලැබී තිබූ මුදලින් රු.මිලියන 5.56 ක මුදලක් ප්‍රයෝජනයට නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**නැනෝ පිරිපහදු යන්ත්‍ර ස්ථාපිත කිරිම**

අනුරාධපුර දිස්ත්‍රික්කය තුල 2021 හා 2022 වර්ෂය තුල ප්‍රජා ජල ව්‍යාපෘති 08 ක් සඳහා එකක් රු.මිලියන2.43 බැගින් වූ නැනෝ පිරිපහදු යන්ත්‍ර 08 ක් රු.මිලියන19.44 ක් වැය කරමින් ස්ථාපිත කිරිමට දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර තිබුණි.

කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී මූල්‍ය හා කාර්යය ශක්‍යතාවය පිළිබඳ සලකා බැලීම් නොකර සියලු කොන්ත්‍රාත්තු එක් පුද්ගලික ආයතනයක් වෙත පවරා තිබීමෙන් වැඩ අවසන් කිරීමෙන් තොරව අතරමග නවතා දමා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද එකතුව රු.මිලියන 6.56 ක සම්පූර්ණ පිරිවැයම නිශ්කාර්ය වී තිබුණි.

**ඉටු නොකල ඉදිකිරීම් හා සවිකිරීම් වෙනුවෙන් ගෙවීම් කිරීම**

2021 වර්ෂය තුල ඉදිකිරීම් ආරම්භ කරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 05 ක ඉටු නොකල වැඩ වෙනුවෙන් රු.මිලියන1.36 ක් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඕපල්ගල මෙත්සිත් ජල ව්‍යාපෘතියේ ඉටු නොකල ඉදිකිරීම් හා සවිකිරීම් වෙනුවෙන් රු.මිලියන1.15 ක් පරික්ෂාවකින් තොරව ගෙවීම් කර රජයට පාඩු සිදු කර තිබුණි.

**ජල පරීක්ෂණ සිදුකිරීම**

දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාළ 2014 මාර්තු 13 දිනැති අංක 17/2014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පිරිසිදු පානීය ජලය සැපයීම දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යභාරය බැවින් ජල ව්‍යාපෘතිවල වසරකට ජල පරීක්ෂණ 02 ක් සිදුකල යුතු ලෙස ප්‍රජාමූල සංවිධාන වෙත දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබා දී තිබුණද එපරිදි ජල පරීක්ෂණ සිදු නොකරන බව නිරීක්ෂණය විය. තවද ජල තත්ව පරීකෂණ මගින් පානයට නුසුදුසු බවට වාර්තාවන ජලය නිසි ප්‍රමිතියකට අනුව සකස් කිරීම සඳහාද විධිමත් වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ සනීපාරක්ෂාව සැපයීම සඳහා පහසුකම් සපයන ප්‍රධාන ආයතනය වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා 2020- 2025 වර්ෂයන් වෙනුවෙන් සැමට ජලය ව්‍යාපෘතිය සහ පසුව ධාරිතා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලබා දීමට අපේක්ෂා කර තිබූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාවද ඇතුළත් කර සකස් කර තිබූ සංයුක්ත සැලැස්මේ ඉලක්ක හා ළඟා කර ගැනීම් පහත පරිදි වේ.

| කාර්ය සාධන දර්ශකය | ඒකකය | 2023 | |
|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා කරගත් |
| ආරක්ෂිත පානීය ජල ආවරණය | ජනගහනයෙන් % | - | 97.3 |
| ආරක්ෂිත නල ජල ආවරණය | ජනගහනයෙන් % | 59.8 | 48.1 |
| නව ජල සැපයුම් සම්බන්ධතා | සංඛ්‍යාව | 160,000 | 115,509 |
| ආරක්ෂිත නල මලාපවහන පහසුකම් | ජනගහනයෙන් % | 2.1 | 2.07 |
| ආදායම් නොලබන ජල සැපයුම් | | | |
| කොළඹ නගරය | පිරිපහදු කල ජලයෙන් % | 19 | 19.25 |
| දිවයින පුරා | පිරිපහදු කල ජලයෙන් % | 23.91 | 25.32 |

වගු අංක 2.25 : කාර්ය සාධන දර්ශකය ළඟා කරගැනීම

## විගණන නිරීක්ෂණ

| | |
|---|---|
| **සූර්යබල පද්ධති ප්‍රසම්පාදනය** | සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසුකරුවන් නොවීම ප්‍රධාන අපගමනයක් වීම මත නැවත ලංසු කැඳවන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාර්තා කල අංක DGM/M&E/SOLAR/2021/01 දරණ ප්‍රසම්පාදනය නැවත ඇගයීමට ලක් කරන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවට (TEC) නියෝග කර තිබුණි. කෙසේ වෙතත්, වටිනාකම රු. මිලියන 73.07 ක් වී තිබූ මෙම සූර්යබල පද්ධති ප්‍රසම්පාදනයට අදාල කොන්ත්‍රාත්තුව නැවත ඇගයීමෙන් පසු පිරිනැමීමට මණ්ඩලයේ සභාපතිවරයා මුලසුන දැරූ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව පිරිනැමුණු සමාගමේ කොටස්වලින් සියයට අසූවක හිමිකාරිත්වය සභාපතිවරයාගේ එක් සහෝදරයකුට සහ එම සහෝදරයාගේ දරුවන්ට හිමිව තිබුණු අතර 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතියේ 05 (04) වගන්තියේ අවශ්‍යතා අනුව සභාපතිවරයා මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පවතින වක්‍ර උනන්දුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෙළි කර නොතිබුණි. |
| **අධ්‍යක්ෂක මණ්ඩල ස්වාධීනත්වය පිළිබඳ ගැටලු** | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල යහපාලන අත්පොතෙහි 4.4.1 ඡේදයට අනුව අධ්‍යක්ෂවරුන් මණ්ඩලය වෙතින් ස්වාධීන විය යුතු වුවත්, 2023 සැප්තැම්බර් මස විශ්‍රාම ගන්නා ලද එතෙක් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි ලෙස සේවය කල නිලධාරිනිය 2023 ඔක්තෝබර් සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත්කර විගණන හා කළමනාකරණ කමිටුවේද සමාජිකාවක් ලෙසද පත්කර තිබුණි. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය කරගෙන තිබූ එම නිලධාරිනිය සම්බන්ධ කරුණු සාකච්ඡාවේදී එම කමිටුවේ ස්වාධීනත්වයට බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| **වාහන අනතුරු සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම** | මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වෙත වෙන්කර තිබූ නිල වාහනය 2023 අප්‍රේල් 12 දින අනතුරට ලක්ව තිබූ අතර ඊට අදාල ඇස්තමේන්තුගත අලාභය රු. මිලියන 13 ක් වී තිබුණි. අනතුර රියදුරුගේ නොසැලකිලිමත්කම සහ අපරීක්ෂාකාරීබව හේතුවෙන් සිදුවී ඇති බව උසාවිය විසින් තීරණය කර තිබුණු නමුත් මණ්ඩලය විසින් මුදල් රෙගුලාසි 104 (3,4) ප්‍රකාරව මූලික හා විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු අය නිශ්චය කර නොතිබුණි. ඉහත අලාභ හානිය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණු අතරම අවශ්‍ය ලිපිලේඛන නියමිත පරිදි |

ඉදිපත් නොකිරීම හේතුවෙන් ඉහත අලාභය රක්ෂණය මගින් ආවරණය කර ගැනීමටද නොහැකිවී තිබුණි.

**මණ්ඩලයේ නිලධාරීන් අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම**

රේඛීය අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද සේවකයින් පහළොස් දෙනෙකුගේ වැටුප් සහ දීමනා ලෙස 2023 වර්ෂය තුල රු. මිලියන 24.34 ක මුදලද ඇතුළත්ව 2015 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා රේඛීය අමාත්‍යාංශයෙන් රු. මිලියන 263.33 ක් ප්‍රතිපූරණය කර ගත යුතුව පැවතුණි. මෙයින් සේවකයින්ගෙන් හතර දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තිබුණද අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා යොදවා තිබුණි. තවද 2020 සිට 2023 වර්ෂය අවසානය දක්වා ජනාධිපති කාර්යාලයට මුදා හරින ලද සේවකයකු වෙනුවෙන් එකතුව රු. මිලියන 5.04 ක මුදලක් මණ්ඩලය වෙත අයවිය යුතුව තිබුණි. ඊට අමතරව අගමැති කාර්යාලයට තවත් මණ්ඩලයේ සේවකයෙකු වැටුප් ගෙවීමෙන් තොරව නිදහස් කර තිබුණි.

**ව්‍යාපෘත් මුදල් අවභාවිතා කිරීම**

මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වාහන ආනයනය කිරීම සඳහා වූ ප්‍රතිපාදන භාවිතා කරමින් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සඳහා කිසිදු දායකත්වයක් නොමැති අති සුඛෝපභෝගී ක්‍රීඩා උපයෝගීතා වාහනයක් රු.මිලියන 39.2 කට මිලදීගෙන තිබුණි. CBG-7386 අංක දරන මෙම වාහනය ව්‍යාපෘති පරිශ්‍රයට රැගෙන ඒමෙන් තොරව ආනයනය කල 2019 වර්ෂයේ සිට ජල සම්පාදන අමාත්‍යාංශය වෙත නිදහස් කර එය ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුගේ පරිහරණයට ලබාදී තිබුණි. 2023 ජනවාරි 19 දින සිට අමාත්‍යවරයා ඉවත් වීමෙන් පසුව එම වාහනය අවිධිමත් පරිදි වෙනත් අමාත්‍යාංශයක් වෙත රැගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය වූ අතර 2024 මැයි 14 දින වන විටත් එම වාහනය අමාත්‍යාංශයට හෝ අදාල ව්‍යාපෘතියේ කටයුතු සඳහා භාර දී නොතිබුණි.

**වාහන අවභාවිතා කිරීම**

2015 මැයි 25 දිනැති PED i/2015 අංක දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදයට අනුව මණ්ඩලයේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා වෙත රාජකාරි හා පුද්ගලික පාවිච්චිය සඳහා වෙන්වෙන්ව එක් නිල වාහනය බැගින් වෙන්කල යුතු වුවද 2022 සහ 2023 වර්ෂ සඳහා නිල වාහන 02 බැගින් සභාපති සහ උප සභාපති සඳහා අනුයුක්ත කර තිබුණි. 2022 ජනවාරි 14 දිනැති 01/2015 (ii) අංක දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ උපසභාපතිවරයා සඳහා අනුමත ඉන්ධන සීමාව මාසිකව ලීටර් 145 බැගින් වුවද 2022 සහ 2023 වර්ෂවලදී සභාපතිවරයා හා උපසභාපතිවරයා විසින් පිළිවෙලින් සීමාව ඉක්මවා භාවිතා කර තිබූ ඉන්ධන ලීටර් 5,806 ක් වෙනුවෙන් රු.1,945,159

ක් සහ ලීටර් 6,393 ක් වෙනුවෙන් රු.2,290,662 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2022-2023 කාල පරිච්ඡේදය තුල මණ්ඩලයේ උප සභාපති වෙත ලබාදී තිබූ PK-3575 අංක දරන කැබ් රථය මණ්ඩලයේ රාජකාරිවලින් පරිබාහිර වෙනත් පුද්ගලයන්ගේ භාවිතය සඳහා අවස්ථා 07 ක දී ලබාදී තිබූ බව එම වාහනයේ දෛනික ධාවන සටහන් අනුව නිරීක්ෂණය වූ අතර එහිදී කිලෝමීටර් 13,698 ක් එම පරිබාහිර පුද්ගලයන් විසින් ධාවනය කර තිබුණු බවද නිරීක්ෂණය විය.

පවත්නා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ නියමයන්ට පටහැනිව මුදල් අයකිරීමේ පදනමට මණ්ඩලයේ වාහන කාර්යාල වේලාවෙන් පසුව හා නිවාඩු දිනවලදී පුද්ගලික භාවිතය සඳහා අවසර ලබාදෙමින් මණ්ඩලය විසින් අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත්කර තිබුණි. ඒ අනුව කිලෝමීටර් 1 සඳහා රු.2.50 , රු.7.50, රු.15.00 බැගින් ගෙවීමේ පදනමට නිලධාරීන් මණ්ඩලයේ වාහන පුද්ගලික කටයුතු සඳහා භාවිතා කර තිබූ අතර 2023 ජනවාරි සිට ජූලි දක්වා නිලධාරීන් 13 දෙනෙකුගෙන් යුත් නියදියක් පරීක්ෂා කිරීමේදී පුද්ගලික භාවිතය සඳහා ඉන්ධන ලීටර 12,009 ක් භාවිතා කර තිබූ බවත් වාහන නඩත්තුව සඳහා වැය වන අනිකුත් වියදම් හැර ඉන්ධන වියදම වෙනුවෙන් පමණක් මණ්ඩලය විසින් රු.3,929,918 ක මුදලක් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

**ලෝක ජල දින සම්මන්ත්‍රණය**

2022 වර්ෂයේ ලෝක ජල දිනයට සමගාමීව සම්මන්ත්‍රණයක් පවත්වා තිබූ අතර ඒ සඳහා ව්‍යාපෘති අරමුදල් වලින් රු.මිලියන 18.15ක් ඇතුලුව රු.මිලියන 23.44 ක් වැයකර තිබුණි. මෙහි කටයුතු සංවිධානය සඳහා Event Management සමාගමක් යොදවා ගෙන තිබූ අතර ඒ සඳහා රු.මිලියන 18.16 ක් වැයකර තිබුණි. සමාගමක් තෝරා ගැනීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පෙර ලංසු කැඳවා තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.2.2 ඡේදයට අනුව ලංසු කැඳවීම ප්‍රසිද්ධ කර ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 21ක කාලයක් ලබාදිය යුතු වුවත් ඒ සඳහා දින 10ක් පමණක් ලබාදී තිබුණි.

**නිල්වලා ලවණ බාධකයේ තහඩු (sheet pile) ඉවත් කිරීම**

මාතර නිල්වලා ගඟ ජල පෝෂකයෙන් ලබාගන්නා ජලය සඳහා ලුණු මිශ්‍ර වීම වළක්වා ගැනීම සඳහා 2023 වර්ෂයේ නිල්වලා ගඟ හරස් කර ලවණ බාධකයක් ඉදිකර තිබුණි. 2023 වර්ෂයේ ඇති වී තිබූ ගං වතුර තත්වය නිසා ගොවීන්ගෙන් හා ප්‍රදේශවාසීන්ගෙන් ඇතිවූ බලපෑම හේතුවෙන් රු. මිලියන 7.8 ක් වැයකර එම **sheet pile** ඉවත් කර තිබුණි. නිල්වලා ලවණ බාධකය සංවර්ධනය නිසා වූ බලපෑම පිළිබඳව කල අධ්‍යනය මත ලංකා හයිඩ්‍රොලික් ආයතනය විසින්

නිකුත් කරන ලද වාර්තා මගින් මෙම ඉදිකිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා **sheet pile** නැවත ස්ථාපිත කළ යුතු බව අවධාරණය කර ඇති අතර පරිසර අධිකාරියේ කමිටුවක් විසින් නිකුත් කරන ලද වාර්තාවකින් ද මාතර දිස්ත්‍රික්කය ජලයෙන් යටවීමට ලවණ බාධකය ඉදිකිරීම සහ වෙනත් හේතු බලපා ඇති බව අවධාරණය කර තිබුණි.

**Sheet pile** ඉවත් කිරීමෙන් පසු මණ්ඩලයේ තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව පිරිපහදු කිරීමට ලබාගන්නා ජලය තුල ලවණ පවතින බව තහවුරු වී ඇත. එබැවින්, තහඩු ස්ථාපිත කිරීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය මෙන්ම ලවණ බාධකය ඉදිකිරීමේ පිරිවැය වන රු.මිලියන 2,482 ක් පමණ වන පිරිවැය අනාර්ථික වියදමක් වී ඇත. තවද 2019 සිට 2022 දක්වා කාලය තුල නිල්වලා ලවණ බාධකය හේතුවෙන් ජලයෙන් යටවීමෙන් හානියට පත් ගොවිතැන් වෙනුවෙන් වන්දි ගෙවීම තීරණය කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුව විසින් නිර්දේශ කරන ලද වන්දි මුදලෙහි වටිනාකම රු. මිලියන 1,208.4 ක් විය.

**ණයගැති ශේෂ අයකර ගැනීම**

වටිනාකම රු. මිලියන 2,344.78 ක් වූ වෙළඳ ණය ගැතියන්, නව සම්බන්ධතා ණය ගැතියන්, මලාපවහන ණයකරුවන් සහ අනෙකුත් ණය ගැතියන් වසර දෙකකට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි. තවද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රජයේ නිල නිවාස සඳහා ලබා දී ඇති ජල සම්බන්ධතා 23 ක් සම්බන්ධයෙන් රු.මිලියන 3.51 ක මුදලක් 2023 වර්ෂය අවසානයේ දී අයකර නොගෙන දීර්ඝ කාලයක් හිඟ හිටව පැවතිණි.

හිටපු සේවකයන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම් රු. මිලියන 17.5 ක් දිගුකාලයක සිට හිඟ හිටව පැවතුණි. ඉහත ණය සහ අත්තිකාරම් ලබාගෙන ඇති සේවකයන්ගෙන් සියයට 90 කට වැඩි පිරිසකට නියමිත මුදල් අයකර නොගෙන විශ්‍රාම ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

**අරමුදල් නිෂ්ක්‍රීයව තබා ගැනීම**

ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය සඳහා සහන කාලයෙන් පසුව, 2023 වර්ෂය අවසානයේදී එ.ජ. ඩො. මිලියන 45 ක ණය වාරික හයක් ගෙවා ඇතත් චීන සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ණයවලින් රු. මිලියන 16,836.51 ට සමාන එ.ජ.ඩො. මිලියන 52 ක මුදලක් එනම් ණයවලින් සියයට 29 ක් 2023 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන Escrow ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**අවිධිමත් ලෙස කොන්ත්‍රාත් මිල විචලනයන් සඳහා ගෙවීම්**

**තීරණය කිරීම**

මහනුවර නාගරික අපජල කළමණාකරණ ව්‍යාපෘතිය - පැකේජ 2 කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරුගේ හිමිකම් ඉල්ලීම් 1 හා 2 මඟින් ආශ්‍රිත පිරිවැය සහ කාලය දීගුකිරීම සඳහා ඉල්ලීම් සිදුකර තිබූ නමුත් ව්‍යාපෘතිය භාර ඉංජිනේරුවරයා ඒ සම්බන්ධව එකඟ නොවූ බැවින් ආරවුල් විනිශ්චය මණ්ඩලය වෙත හිමිකම් ඉල්ලීම ඉදිරිපත් කර තිබුණි. ආරවුල් විනිශ්චය සභාවේ තීරණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් Dissatisfaction Notice ලබාදීම හේතුවෙන් සාමූහික එකඟතාවය තුලින් නිවරදි කර ගැනීමේ කටයුතු 2019 සැප්තැම්බර් මස ආරම්භ කර තිබුණි. මෙහිදී කොන්ත්‍රාත්කරු විසින් හිමිකම් වටිනාකම ලෙස රු.මිලියන 1,745.20 සහ රු.මිලියන 1,304.69 ක් ලෙසද, ඉංජිනේරු ඇස්තමේන්තු අනුව හිමිකම් වටිනාකම ලෙස රු.මිලියන 89.35 ක්ද, ව්‍යාපෘති කළමණාකරණය ඒකකය විසින් හිමිකම් වටිනාකම ලෙස රු.මිලියන 791.12 සහ රු.මිලියන 1,138.31 වශයෙන් විවිධ වටිනාකම් ඉදිරිපත් කර තිබුණි. මෙම වටිනාකම් වල නිවැරදිතාවය, සම්පූර්ණත්වය, වලංගුභාවය පිළිබඳ විධිමත් පරීක්ෂාවකින් තොරව හිමිකම් වටිනාකම ලෙස රු.මිලියන 1,304.69 ක් ගෙවන ලෙස 2021 නොවැම්බර් 23 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ගනු ලැබූ තීරණය සඳහා 2021 දෙසැම්බර් 20 දිනැති අංක 4299(g) දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් එකඟතාවය ලබාදී තිබුණි.

# කාන්තා හා ළමා කටයුතු

සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ සාධාරණව හා සමානව භුක්ති විඳින සමෘද්ධිමත් සමාජයක් යන දැක්මෙන් යුතුව ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ආර්ථික සවිබලගැන්වීම, කාන්තාවන්, ළමුන්, අවදානමට ලක්විය හැකි හා වරප්‍රසාද නොලබන පුද්ගලයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ආයතනික හා මානව සම්පත් සේවා සැපයීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම යන මෙහෙවර කොට ගෙන කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

**කාර්යභාරයන්**

කාන්තා හා ළමා ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම.

රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.

ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතටපත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම

කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම.

පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.

පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.

අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම හා සෙවණ සරණ කැපකරු මාපිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම.

සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන්වලට අදාළ කටයුතු කිරීම හා එම පුද්ගලයින් පුහුණු කිරීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.

මෙම කාරයභාරයන් ඉටුකිරීම සඳහා අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 03 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 12 ක් ක්‍රියාත්මකව පැවතුණි. එම ආයතන විගණනයේදී අනාවරණය වූ කරුණු පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

**Lanka Women E-market**

**වෙබ් අඩවිය ක්‍රියාකාරී නොවීම** ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්වය නගාසිටුවීම හා ආර්ථික සවිබල ගැන්වීමේ අරමුණ ඇතිව ඔවුන්ගේ නිෂ්පාදන මාර්ගගත වේදිකාවක් හරහා ප්‍රවර්ධනය කිරීම සඳහා රු.මිලියන 4.4 ක් වැයකර Lanka Women E-market වෙබ් අඩවිය ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් ලෙස 2022 මාර්තු 08 දින එළි දක්වා තිබුණි. මෙම වෙබ් අඩවිය එළි දක්වා වසර 2 ක කාලයක් ගත තිබුණද, කිසිදු නිෂ්පාදන අලෙවියක් සිදු වී නොතිබුණු අතර සැපයුම්කරුවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ලියාපදිංචි වීම පමණක් සිදු කර තිබුණි. තවද, එකගවූ පිරිවිතරවලට අනුකූලව වෙබ් අඩවිය නිර්මාණය වී නොමැති බවද, ඒ අනුව E-market පද්ධතිය පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික සහාය නොලැබීම, ව්‍යවසායක කාන්තාවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය අවම වීම, නිෂ්පාදිත වල පැහැදිලි ඡායාරූප ගැනීමේ හැකියාවක් නොමැති වීම

හා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රමාණවත් පසුවිපරමක් සිදු නොකිරීම යනාදිය ඩිජිටල් අලෙවිකරණ වේදිකාව අසාර්ථක වීමට හේතු වී තිබුණි.

**ග්‍රාම ශක්ති වැඩසටහන**

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ශ්‍රී ලංකාවේ පවතින දරිද්‍රතාවය 2030 වන විට තුරන් කිරීම අරමුණ කර ගෙන දිළිඳුකම පිටු දැකීම සඳහා ජනාධිපති කාර්යාලය යටතේ ග්‍රාම ශක්ති කාර්යාංශයක් ස්ථාපනය කිරීම හා “ග්‍රාම ශක්ති’ වැඩසටහන යටතේ 2023 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 25 සඳහා අදියර I හා II වශයෙන් සමිති 3,618 ක් ස්ථාපිත කර තිබුණි. එනමුත් එම සමිතිවලින් 2,067 ක් එනම් සියයට 57 ක් පමණ අක්‍රීය මට්ටමේ පැවති අතර ග්‍රාම ශක්ති සමිති හා ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල රු.මිලියන 635.7 ක මුදලක් නිශ්කාර්යව පැවතුනි.

## පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**වීදි දරුවන් සම්බන්ධ දත්ත පද්ධතියක් නොවීම**

ජාතික ප්‍රතිපත්තීන් හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින්ද, නීතිමය ගැටළු වලට මුහුණදුන් ළමයින්ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, බරපතල අවදානමට ලක්වන වීදි දරුවන් හඳුනාගෙන එම දරුවන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට හා එම දරුවන්ගේ අයිතීන් තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් නිසි යාන්ත්‍රණයක් මේ දක්වා සකස් කර ක්‍රියාවට නංවා නොතිබුණි.

**විදේශ රටවලට දරුකමට හදාවඩා ගැනීමට දරුවන් ලබාදීම**

විදේශ රටවලට ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදාවඩා ගැනීම සඳහා 2019-2023 දක්වා කාලය තුල දරුවන් 32 නෙකු ලබා දී තිබූ අතර, විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතතෙහි 10C වගන්තිය අනුව හදාවඩා ගැනීම සඳහා ලබාදුන් දරුවන් පිළිබඳව අවුරුදු 10 ක් යනතෙක් පසුවිපරම් වාර්තා ලබාගත යුතු වුවද, එම පසුවිපරම් වාර්තා නිසි පරිදි අඛණ්ඩව වසර 10 ක් යනතෙක් ලබා නොගැනීම හේතුවෙන් එම දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට හැකි වී නොතිබුණි.

**ප්‍රතිපාදනය ඌන උපයෝජනය**

ළමා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2023 වර්ෂය තුල UNICEF මූල්‍යාධාර ලෙස ලැබුණු රු. මිලියන 35.9 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 21.3 ක එනම් සියයට 60 ක් ඉතිරි වී තිබුණි. තවද, හදිසි අවස්ථාවල සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වය, සූරාකෑම, අපයෝජනය, නොසලකා හැරීම සහ හානිකර භාවිතයන් වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වැඩිදියුණු කල ළමා

ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහාය වීම යන අරමුණ සඳහා රු.මිලියන 7ක මූල්‍යාධාර ලබා දී තිබුණු අතර එමගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 23 ක් අතරින් 11 ක්ම ව්‍යාපෘතියේ අදාල අරමුණුවලට සම්පූර්ණයෙන්ම බැහැර වූ ක්‍රියාකාරකම් සඳහා යොදා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**පුහුණු පාඨමාලා හා උපදේශන සේවා ලබා දීමේ කටයුතු නතර වීම**

අපයෝජනයට සහ විවිධ ගැටළු වලට මුහුණ දුන් ගැහැණු දරුවන්ට උපදේශනය ලබා දීම, ජීවන කුසලතා වර්ධනය, වෘත්තීය පුහුණුව ලබාදීම තුලින් සමාජගත කිරීම සඳහා පවතින එකම ආයතනය වන පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය සහ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය යන මධ්‍යස්ථාන 02 ක 2021 මැයි මාසයේදී කොවිඩ් අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීමට පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගෙන 2023 ජූනි 06 දින ආපසු භාර දී තිබුණි. එහෙත් ආයතනයෙහි භෞතික සම්පත් හා අවට පරිසරය යථා තත්ත්වයට පත්කර නොතිබුණු අතර මධ්‍යස්ථාන දෙක යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් රු. මිලියන 3.85 ක් වැයවන බවට ඇස්තමේන්තු කර තිබුණද, එහි අළුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි. ඒ හේතුවෙන් මාස 6 කට වරක් පළාත් පරිවාස දෙපාර්තමේන්තුව මගින් තෝරාගනු ලබන ආයතනගත දැරියන් 40 ක් සඳහා පුහුණු පාඨමාලා හා උපදේශන සේවා ලබා දීමේ කටයුතු නතර වී තිබුණි.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම**

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී තිබුණද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට 2023 වර්ෂයේ අවසන් දිනය දක්වාම අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් අදාල ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් කමිටු, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ස්වාධීන තාක්ෂණික කව ලෙස ස්ථාපනය සහ පැවැත්වීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**අදාල ආයතන අතර විධිමත් සම්බන්ධීකරණයක් නොවීම**

දත්ත පද්ධතිය ස්ථාපනය කර ළමා අපචාර සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා පොලීසිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ රේඛීය අමාත්‍යාංශය අතර විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට 2023 වර්ෂය අවසානය දක්වා කටයුතු නොකිරීම හේතුවෙන් දිවයිනෙන් ලැබෙන ළමා අපචාර සම්බන්ධ පැමිණිලි කොපමණද යන්න හා එම පැමිණිලිවල වර්තමාන ප්‍රගතිය සම්බන්ධව සොයා බලා තහවුරු

කිරීමට අධිකාරියට නොහැකි තත්වයක් පවතින බව විගණනයේදී අනාවරණය විය.

**වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක ආරම්භ නොකිරීම**

පළාත් මට්ටමින් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලබා දී තිබුණු නමුත් 2023 වර්ෂය අවසානය දක්වා පළාත් 7ක වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවා නොතිබුණි. දකුණු පළාතේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය 2013 වර්ෂයේ ආරම්භ කර තිබුණද, පැවති අඩුපාඩු හේතුවෙන් 2015 වර්ෂයේ සිටම මෙම ඒකකය සහ ලැබී තිබුණු තාක්ෂණික උපකරණ නිෂ්කාර්යව පවතින අතර නැවත එම තාක්ෂණික උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමට රු.මිලියන 7.8 ක් ඇස්තමේන්තු කර තිබුණි.

**වින්දිත ළමුන්ට නවාතැන් පහසුකම් සඳහා ආරක්ෂිත නිවාසයක් පවත්වාගෙන නොයාම**

නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මාර්ගෝපදේශයේ 2.5 වගන්තිය ප්‍රකාරව වින්දිත ළමයින්ට නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා ආරක්ෂිත නිවාසයක් (safe house) 2023 වර්ෂය අවසානය දක්වාම අධිකාරිය විසින් පවත්වාගෙන යාමට අපොහොසත්වී තිබුණි.

**නිෂ්කාර්ය ඉඩම්**

2014 වර්ෂයේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ භාවිතයට ගන්නා ලෙස වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර මෙම ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 2023 වර්ෂය තුළදී පමණක් රු.මිලියන 1.08 ක් වැය කර තිබුණි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු.මිලියන 18.3 ක වටිනාකමකට 2016 වර්ෂයේදී වර්ෂ 30 ක කල් බදු පදනම සඳහා ලබාගෙන තිබුණද එම ඉඩම 2023 වර්ෂයේ අවසානය දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ආයෝජනය**

2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගත් රු.බිලියන 43 ක මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර එදිනට ආයෝජන පොළිය රු.බිලියන 2.8 ක් විය. බැංකු මූලා අංශය විසින් 2023 වර්ෂය තුළදී සියයට 11 සිට සියයට 26 දක්වා පොලි අනුපාත යටතේ මෙම මුදල් ආයෝජන කර තිබුණත් බැංකු වෙත ලබා දී තිබුණු පොලි අනුපාතය සියයට 5 ක් වූ අඩු බව නිරීක්ෂණය විය. මෙයින් සමෘද්ධිලාභීන් වෙත

ගෙවිය යුතු පොලිය සියයට 4 ක් වේ. අනිවාර්ය ඉතිරිකිරීම් මුදල් සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය නොකර බැංකු මූල්‍ය අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරීම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර පොලී ආදායම උපයා ගැනීමේ අවස්ථාව අහිමිවීම නිසා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ඇති අවස්ථාද අහිමිව පැවතුණි.

**ප්‍රතිලාභීන්ට ණය ලබාදීම**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළින් ණය වර්ග 34 ක් යටතේ 2023 වර්ෂය තුළ ප්‍රතිලාභින් 350,604 ක්ද ඇතුළත්ව ප්‍රතිලාභින් 12,309,875 ක් සඳහා ණය ලබා දී තිබුණි. ලබාදී තිබූ ණය මුදල් වලින් 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය ශේෂය රු. බිලියන 73.8 ක් වී තිබුණි. සමස්ථ බැංකු පද්ධතිය සතු මුළු ආයෝජනය රු. බිලියන 242 ක් වුවත් ප්‍රතිලාභීන් සඳහා ලබාදී තිබූ ණය ප්‍රමාණය රු. බිලියන73.8 ක් පමණක් වූ අතර එය සමස්ථ ආයෝජනයෙන් සියයට 30 ක් විය.

**නිෂ්කාර්ය වියදම්**

2019 වර්ෂයේදී සමෘද්ධි සහනාධාරය තවත් ලක්ෂ 6 කට ලබාදීමට සහ ඔවුන් සවිබලගැන්වීම සඳහා අපනයන ගම්මාන 5,000 ක් පිහිටුවීමත් එමඟින් වසරකට ඩොලර් මිලියනයක් ඉපයීමටත් අරමුණු කර තිබුණි. වැඩසටහන යටතේ හිමිකම් ප්‍රදානය සඳහා දිවයින පුරා සමාරම්භක වැඩසටහන් පැවැත්වීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීම් සිදුකිරීම සඳහා වැඩසටහන් 350 ක් ක්‍රියාත්මක කිරීමට සමාජ ආරක්ෂණ අරමුදලින් රු. මිලියන 144.7 ක් වැයකර තිබුණි. වියදම පියවා ගැනීම සඳහා සමෘද්ධිලාභින්ගේ සහනාධාර මුදලින් රු. 500 බැගින් 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 143 ක් අයකර තිබුණි. නමුත් වැඩසටහන යටතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**විගණනයට යටත් නොවන අරමුදල්**

දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව ඉවත් කරන ලද පනත් යටතේ පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි වලට අයත්වන්නාවූ සියළු නිශ්චල හා චංචල දේපල රජයට පවරාදිය යුතු වේ. එසේ වුවද එම ආයතන සතුවූ ස්ථාවර වත්කම් හා අරමුදල් ශේෂයන් ස්ථාවර තැන්පත් වශයෙන් 2023 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය යටතේ රඳවාගෙන තිබුණි. තවද එදිනට දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය අංශය සතුව රක්ෂණ අරමුදල් ද ඇතුළුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 15 ක් පවතින බවත් එයින් අරමුදල් 06 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා බවත් ඉතිරි අරමුදල් 09 අක්‍රිය අරමුදල් බවත් නිරීක්ෂණය විය. මෙම සියළු අරමුදල් වල පවතින මුදල් බැංකු මූල්‍ය අංශය විසින් ආයෝජනය කර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පොලී මුදලද ඇතුළුව සමස්ථ ආයෝජන අරමුදල රු මිලියන 49,523 ක් වී තිබුණි. කෙසේ වුවද

මෙම කිසිදු අරමුදලක් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව මෙමඟින් රාජ්‍ය මුදල් අවභාවිතාවී ද යන්න පරීක්ෂා කල නොහැකි වීම හේතුවෙන් මෙම මුදල් රාජ්‍ය මූල්‍ය පාලනයෙන් බැහැර වී ඇත.

**සේවක ණය ලබාදීම**

දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජාමූල බැංකු, දිස්ත්‍රික් කාර්යාල හා බැංකු මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරින් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට පටහැනිව සේවක පරිභෝගික ණය, සේවක නිවාස ණය, විශේෂ සේවක ණය හා විශේෂ ආපදා ආදි වශයෙන් විවිධ සේවක ණය යෝජනා ක්‍රම මඟින් ණය ලබා දී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට එම ණය ශේෂය රු.මිලියන 14,286 ක් වී තිබුණි.

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙතින් ලබාගත් මුදල් ප්‍රතිපූර්ණය නොකිරීම**

සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා අරමුදල් ගිණුම් වලින් 2020 වර්ෂයේදී ජීවන තත්ත්වය යථා පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් අඩු ආදායම් ලාභි පවුල් වෙත රු. 5,000 ක දීමනාවක් ලබාදීම සඳහා බැංකු පද්ධතිය තුලින් රු. මිලියන 32,418 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාගෙන 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 කට වැඩි කාලයක් ගත් වී තිබූ නමුත් බැංකුව වෙත එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**බැංකු පද්ධතියේ මූල්‍ය වංචා**

2019 වර්ෂයේ සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට වටිනාකම රු.මිලියන 234.9 ක් වූ මූල්‍ය වංචා 165 ක් වාර්තා වී තිබුණි. එයින් තවදුරටත් රු.මිලියන 218.4 ක් වූ මූල්‍ය වංචා 98 ක විනය කටයුතු සිදුකරමින් පැවතුණි. මේ අතර 2014 ජනවාරි 03 දින සිට 2018 අගෝස්තු 31 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවලින් වටිනාකම රු.මිලියන. 263.8 ක් වූ අක්‍රමිකතා 15 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරින් විසින් දිගින් දිගටම මෙසේ මූල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු හා විනය නියෝගය තුළින් දඬුවම් ලිහිල් වීමද හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය.

**ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 59 හා 97 වන වගන්ති ප්‍රකාරව රාජ්‍ය සේවයේ කිසියම් තනතුරකට යම් තැනැත්තෙකු විසින් පත්කිරීම් බලධරයා වෙත සාවද්‍ය තොරතුරු හෝ ව්‍යාජ (කූට) ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය වූ විටෙක එම පත්වීම් වහාම අවලංගු කර එය ශූන්‍ය හා බලරහිත කර, ඒ වන විටත් වැටුප් හා දීමනා වශයෙන් රජය විසින් ගෙවා ඇති සියළු මුදල් එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකල යුතුවේ. නමුත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට බඳවාගෙන තිබූ නිළධාරීන් 363

දෙනෙකු විසින් සිය පත්වීම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට පෞද්ගලික ලිපිගොනු මගින් සනාථ වී තිබුණි. එයින් 77 දෙනෙකු සේවයෙන් පහකර තිබුණු අතර 20 දෙනෙකු පනත ප්‍රකාරව වන්දි ලබාගැනීමේ එකඟතාවයෙන් සේවයෙන් ඉවත් වී තිබුණි. නියැදි විගණනයට භාජනය වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සේවය කර විශ්‍රාම වැටුප් රහිතව සේවය අවසන් කර තිබුණු නිලධාරීන් හා දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 30 දෙනෙකු විසින් පත්වීම් දින සිට රු.මිලියන 195 ක් ද, මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක නිළධාරීන් 4 දෙනෙකු වෙනුවෙන් 1999 වර්ෂයේ සිට රු.මිලියන 40 ක්ද, කොළඹ හා මාතර දිස්ත්‍රික්ක වල නිළධාරීන් 17 දෙනෙකු සඳහා 2023 වර්ෂයට අදාලව පමණක් රු.මිලියන 8.7 ක් ද වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණ ද වගකිව යුතු නිලධාරීන් විසින් මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## සමාජ ආරක්ෂණ මණ්ඩලය

**පරිගණකගත තොරතුරු පද්ධතියක් නොමැතිවීම**

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරිම සඳහා 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණද පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වි තිබුණි.

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

**අරමුදල් ඌණ උපයෝජනය**

ආයතනය විසින් මුදල් අය කර පවත්වා ගෙන යනු ලබන පාඨමාලාවලින් සියයට 20 ක් අරමුදලට වාර්ෂිකව බැර කරනු ලබයි. 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 කොටසේ 7 වන පරිච්ඡේදයේ 7.1.4 ඡේදය ප්‍රකාරව ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා එම මුදල් යෙදවිය හැකි වුවත් 2023 වර්ෂයේ ගිණුම්ගත කර තිබු රු. මිලියන 8 ක මුදලින් රු. 3.5 ක් එනම් සියයට 43 ක් පමණක් ඩිජිටල්කරණ වැඩසටහනකට සහ තත්ත්ව සහතික වීමේ වැඩසටහන වෙනුවෙන් වැය කර තිබුණි. තවද පසුගිය වර්ෂයන්හි රු.මිලියන 4.2 ක් පාඨමාලා ආදායමක් අරමුදලට මාරු කර තිබුණද ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වෙනුවෙන් මුදල් වැය කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදල් ශේෂය රු.මිලියන 13.6 ක් දක්වා වර්ධනය වී ඌණ උපයෝජිතව පැවතුණි.

# වරාය හා නාවික

දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සමුද්‍රීක සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සමුද්‍රිය සේවා මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයහි වරාය හා නාවික අංශයෙහි දැක්ම වේ. මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජයා කන්ටේනර් ටර්මිනල්ස් පුද්ගලික සමාගම, වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම සහ මාගම්පුර වරාය කළමනාකරණ (පුද්) සමාගම ලෙස දෙපාර්තමේන්තුවක්, හා ව්‍යවස්ථාපිත ආයතන 05 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකල යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

වාණිජ වරායන් සංවර්ධනය, කළමනාකරණය හා ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.


බහාලුම් අංගන, තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලන කටයුතු සිදුකිරීම.

නෞකා හිමිකාරත්වය සහ මෙහෙයුම්, නැව් කළමනාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා සම්බන්ධිත කටයුතු සහ නාවික සැපයුම්කරුවන් සහ පරිහරණයකරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහායවීම.

නාවික ශාස්ත්‍ර, නාවික සේවා කටයුතු සහ වෙරළාසන්න මගී ප්‍රවාහන කටයුතු නියාමනය කිරීම.

බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනිම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයට රු.මිලියන 3,962 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර 2023 අවසන්වන විට ඉන් රු.මිලියන 3,176 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව 2023 තුළ රු.මිලියන 786 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.




රූප සටහන් අංක 2.39 - වාර්ෂික ප්‍රතිපාදන, සත්‍ය වියදම හා ඉතිරිය

මූලාශ්‍රය - 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## විගණන නිරීක්ෂණ

### වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

**අමාත්‍යාංශයේ අරමුණුවලට අනුකූල නොවන වියදම්**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරා ඇති සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු වූ ණය පියවීම සඳහා 2017 දෙසැම්බර් 14 දින රාජ්‍ය බැංකුවකින් ලබාගන්නා ලද රු.මිලියන 3,950.85 ක ණය මුදලට වාර්ෂිකව 33.30% ක පොලියක් (පොලී අනුපාතය වෙනස්වේ) සමග වසර 15 ක කාලයක් තුල ගෙවිය යුතු වන රු.මිලියන 11,796.87 ක ණය මුදල හා වාරික මුදල (පොලිය ඇතුලත්ව) ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. මේ අනුව 2023 වර්ෂයේදී ණය වාරික හා පොලී ලෙස පිළිවෙලින් රු.මිලියන 329.2 ක් හා රු.මිලියන 820.7 ක් වන මුළු මුදල රු.මිලියන 1,149.9 ක් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යයක් නොවූවද අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ ගෙවීම් කර තිබුණි.

**ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති**

අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන යටතේ කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම සඳහා 2023 වර්ෂයට වෙන්කරන ලද රු.මිලියන 240 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස ඉතිරිය සියයට 14 විය. තවද, මෙම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි 2020 පෙබරවාරි 24 දින සිට සිට මාස 15 කින් එනම් 2021 මැයි 23 දින අවසන් කළ යුතු වුවත් අවසන් ශක්‍යතා වාර්තාව ලබාදී තිබුණේ 2023 පෙබරවාරි 17 දින වේ.

**බැදීම් ගාස්තු හා ණය පොලී නිශ්කාර්යව ගෙවීම**

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ එ.ජ. ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට 2018 ජනවාරි 10 දින ගිවිසුම් ගත වී තිබුණි. ණය ගිවිසුම අත්සන් කර වසර 06 ක් ගතවී තිබුණ ද වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් එ.ජ. ඩොලර් 905,194 ක් පමණක් උපයෝජනය තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20 ක මුදලක් උපයෝජනය නොකළ ණය සඳහා බැදීම් ගාස්තු සහ ණය පොළී ලෙස අනාර්ථිකව ගෙවීමට සිදු වී තිබුණි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ජාත්‍යන්තර ස්ථානය**

2023 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 6,949,912 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 24 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2022 වර්ෂයට සාපේක්ෂව නැව් බඩු මෙහෙයුම් කටයුතු වල සියයට 1.3 ක වර්ධනයක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාලුම් හැසිරවීම 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී සියයට 2.04 කින් වැඩි වී තිබුණි

**නැව් බඩු මෙහෙයුම් කටයුතු**


කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2019 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 4,708 ක් වී තිබුණත්, 2023 වර්ෂය වන විට එම සංඛ්‍යාව 4,809 ක් දක්වා වැඩිවී තිබුණි. කෙසේ වුවද, මෙහෙයවන ලද විසිසම (TEUs) බහාලුම් ඒකක ගණන 2019 දී මිලියන 7.23 ක සිට 2023 වර්ෂයේදී මිලියන 6.9 ක් දක්වා අඩු වී තිබුණි. එසේම මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2019 වර්ෂයේදී මෙ.ටො.මිලියන 9.5 ක සිට 2023 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 6.3 ක් දක්වා අඩුවී තිබුණි. විස්තර වගුව 2.26 හි දැක්වේ.

| විස්තරය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,708 | 4,337 | 4,180 | 4,073 | 4,809 |
| මෙහෙයවන ලද විසිසම (TEUs) බහාලුම් ඒකක ගණන (ඒකක '000) | 7,228 | 6,854 | 7,249 | 6,862 | 6,949 |
| මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටොන් '000) | 9,530 | 8,894 | 9,229 | 6,249 | 6,271 |

වගු අංක 2.26 : ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහාලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව


**යාත්‍රා ආගමනය**

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2023 වර්ෂයේදී කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම යාත්‍රා 589 කින් හෙවත් සියයට 16 කින් වැඩිවී තිබුණි. මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ යාත්‍රා වෙනුවට විශාල ප්‍රමාණයේ යාත්‍රා පැමිණීම හේතුවෙන් 2018 වර්ෂයෙන් පසුව 2021 වර්ෂය දක්වා බහාලුම් යාත්‍රා පැමිණීමේ ක්‍රමික අඩුවීමක් නිරීක්ෂණය වූ නමුත් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ බහලුම්ගත යාත්‍රා 603 ක එනම් සියයට 18 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් යාත්‍රා පැමිණීමද 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 4.55 ක් පසුබැසීමක් නිරීක්ෂණය විය. විස්තර රූපසටහන 2.40 හි හා රූපසටහන 2.41 හි පරිදි වේ.




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| බහලුම්ගත | 3,739 | 3,604 | 3,281 | 3,180 | 3,287 | 3,890 |
| සාම්ප්‍රදායික | 51 | 77 | 64 | 62 | 31 | 32 |
| වෙනත් | 541 | 517 | 461 | 433 | 330 | 315 |

රූප සටහන් අංක 2.40 : කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - වර්ගීකරණය සහිතව
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| පැමිණි මුළු යාත්‍රා සංඛ්‍යාව | 4,331 | 4,198 | 3,806 | 3,675 | 3,648 | 4237 |

රූප සටහන් අංක 2.41: කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - මුළු යාත්‍රා සංඛ්‍යාව
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තා


**පර්යන්ත මෙහෙයුම් කටයුතු**

කොළඹ වරාය විසින් 2001 දී බහාලුම් ඒකක 1,726,616 ක් මෙහෙයවා තිබූ අතර 2023 වන විට එම සංඛ්‍යාව බහාලුම් ඒකක 6,949,912 දක්වා වර්ධනය වී තිබූ නමුත් මෙම බහාලුම් මෙහෙයුම් කටයුතුවලදී කොළඹ වරාය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොල කොටස 2001 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා වර්ෂ විසි දෙකක කාලය තුළ සියයට 81 ක සිට සියයට 28 ක් දක්වා පහත වැටී තිබුණි. කොළඹ වරාය තුළ වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු 2021 වර්ෂය දක්වා ජය බහාලුම් පර්යන්තය (JCT) මගින් පමණක් සිදු කර තිබූ අතර 2021 වර්ෂයේ සිට නැගෙනහිර බහාලුම් පර්යන්තය (ECT) මෙහෙයුම් කටයුතු සඳහා එකතු විය. දිගුකාලීන බදු පදනම මත දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT) 2001 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර සියයට 26 ක වෙළඳපොල කොටසක්ද, කොළඹ ජාත්‍යාන්තර බහාලුම් පර්යන්තය (CICT) 2013 වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කර සියයට 46 ක වෙළඳපොල කොටසක්ද 2023 වර්ෂය වන විට හිමිකරගෙන තිබුණි. පසුගිය වර්ෂ පහක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර වගුව 2.27 පරිදි වේ.

| වර්ෂය | SLPA (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 3.550) | වෙළඳපල කොටස | SAGT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 1.950) | වෙළඳපල කොටස | CICT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 2.400) | වෙළඳපල කොටස | එකතුව බහාලුම් විසිසම ඒකක |
|---|---|---|---|---|---|---|---|
| 2019 | 2,282,618 | 32 | 2,052,153 | 28 | 2,893,566 | 40 | 7,228,337 |
| 2020 | 2,097,804 | 31 | 1,872,052 | 27 | 2,884,906 | 42 | 6,854,762 |
| 2021 | 2,198,334 | 30 | 1,838,693 | 25 | 3,212,331 | 45 | 7,249,358 |
| 2022 | 1,925,895 | 28 | 1,752,236 | 26 | 3,184,053 | 46 | 6,862,184 |
| 2023 | 1,965,131 | 28 | 1,763,863 | 26 | 3,220,918 | 46 | 6,949,912 |

වගු අංක 2.27 : පසුගිය වර්ෂ පහක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර

මූලාශ්‍රය : ශ්‍රීලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තා




රූප සටහන් අංක 2.42 : ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහාලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපොල කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවතුණි. අධිකාරියේ බහාලුම් මෙහෙයුම් කටයුතු (JCT) සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Berth Occupancy Ratio) සලකා බැලීමේදී 2019 සිට 2023 වර්ෂය දක්වා එය පිළිවෙලින් සියයට 70 ක්, 72 ක්, 70 ක්, 63 ක් හා 58 වී තිබුණි. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2023 වර්ෂයේදී 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 8 කින් අඩුවී තිබුණි. SAGT හා CICT බහාලුම් පර්යන්තයන්හි ධාරිතාවය පිළිවෙලින් විසිසම ඒකක මිලියන 1.95 ක් හා මිලියන 2.4 ක් වුවද, 2023 වර්ෂයේ සත්‍ය බහාලුම් මෙහෙයුම් පිළිවෙලින් විසිසම ඒකක මිලියන 1.96 ක් හා විසිසම ඒකක මිලියන 3.22 ක් වූ අතර CICT පර්යන්තය උපරිම ධාරිතාවයද ඉක්මවා තිබුණි. නමුත් අධිකාරියේ සියලු පර්යන්තයන්වල (JCT සහ ECT) ධාරිතාවය විසිසම ඒකක මිලියන 3.55 ක් වුවද, 2023 වර්ෂයේ සත්‍ය බහාලුම් මෙහෙයුම් විසිසම ඒකක මිලියන 1.92 ක් එනම් සියයට 58 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වරාය අධිකාරිය සතු පර්යන්තයන්වල ධාරිතා උපයෝජනය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**නැගෙනහිර බහාලුම් පර්යන්තයේ ඌන උපයෝජනය**

කොළඹ වරායේ දැනට ඉදිකර ඇති බහාලුම් හැසිරවීම සඳහා වූ පර්යන්ත අතුරින් ගැඹුර මීටර් 14.25 ට වඩා වැඩි ගැඹුරු බේසමක් සහිත විශාල ප්‍රමාණයේ නැව් පැමිණිය හැකි පර්යන්ත වන්නේ කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) හා නැගෙනහිර බහාලුම් පර්යන්තය (ECT) පමණි.

JCT පර්යන්තයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම මත ECT පර්යන්තය ඉදිකිරීම සඳහා කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව බහාලුම් විසිසම ඒකක මිලියන 0.8 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය

රු.මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහාලුම් පර්යන්තයේ අදියර 1 හි ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණි. නමුත් බහාලුම් හැසිරවීම සඳහා අවශ්‍ය දොඹකර නොතිබීම හේතුවෙන් ජය බහාලුම් පර්යන්තය සඳහා මිලදීගත්, නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි දොඹකර තුනක්, 2020 පෙබරවාරි 07 දිනැති අංක PA/HD/25 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නැගෙනහිර බහාලුම් පර්යන්තයේ (ECT) සවිකර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණි. අනතුරුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක. අමප/21/0198/328/005/ටිබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නැගෙනහිර බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම, මෙහෙයුම් උපකරණ මිලදී ගැනීමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ හිමිකාරිත්ව සහිත බහාලුම් පර්යන්තයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2023 වර්ෂය තුළදී ගැඹුර මීටර් 14.25 ට වැඩි විශාල ප්‍රමාණයේ බහාලුම් නෞකා 30 ක් පර්යන්තය වෙත පැමිණ තිබූ අතර බහාලුම් 495,541 ක් පර්යන්තය තුල මෙහෙයවා තිබුණි. 2021 වර්ෂයේ සියයට 43 ක්ව පැවති පර්යන්ත ධාරිතා උපයෝජන අනුපාතය (Capacity Utilization) 2023 වර්ෂයේදී සියයට 62 ක් දක්වා වැඩිවී තිබුණි. නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි විශාල පරිමාණයේ දොඹකර 12 ක් (STS Cranes) හා රේල් පීලි මත සවිකර ක්‍රියාකරන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් (ARMG Cranes) එ.ජ. ඩොලර් මිලියන 282.56 ක ඇස්තමේන්තුගත පිරිවැයට මිලදී ගැනීමට අදාළව 2021 දෙසැම්බර් 18 දින ප්‍රසම්පාදනය කර තිබූ අතර එයින් දොඹකර 03 ක් 2024 පෙබරවාරි 07 සහ තවත් දොඹකර 03 ක් 2024 ජුනි 05 දින ද රේල් පීලි මත සවිකර ක්‍රියාකරන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 12 ක් 2024 අගෝස්තු 05 දිනද වරාය වෙත ලැබී තිබුණි. 2022 ජනවාරි 04 දින සිට නැගෙනහිර පර්යන්තයෙහි දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බැවින් පර්යන්තයේ ධාරිතාවය සම්පූර්ණයෙන් උපයෝජනය කළ නොහැකිව පැවතුණි.

**ප්‍රමාද වූ ව්‍යාපෘති**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් දැනට ප්‍රධාන මෙහෙයුම් කටයුතු සිදු කරන ජය බහලු පර්යන්තයේ දිග මීටර් 600 ක් පමණක් වීම නිසා දිග මීටර් 330 ක් වූ විශාල ප්‍රමාණයේ නෞකා 2 ක් එකවර හැසිරවීම අපහසුවීම හේතුවෙන් අධිකාරියට ව්‍යාපාරික අවස්ථාවන් අහිමිවී යන බැවින් එම පර්යන්තය මීටර් 120 කින් දීර්ඝ කිරීමට සහ ගැඹුර මීටර් 15 ක් ලෙස නැව්තොට සකස් කිරීමට 2017 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2018 නොවැම්බර් 29 දින වරාය අධිකාරිය, කොන්ත්‍රාත්කරු සමග ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 5,035 (VAT රහිත) ක් විය. කොන්ත්‍රාත් ගිවිසුම අනුව, දින 07 ක් තුලදී කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමේ නිවේදනය නිකුත් කළ යුතු වුවත් එලෙස නිවේදන නිකුත් කර කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2020 සැප්තැම්බර්

29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් කොන්ත්‍රාත්තුව සංශෝධනය කර තිබූ අතර ඒ හේතුවෙන් වසර 02 ක කාලයකට පසු එය 2020 නොවැම්බර් 23 දින වැඩ ආරම්භ කිරීමේ නිවේදනය නිකුත් කර තිබුණි. ඒ අනුව 2023 ජූලි 31 දින වන විට කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපේක්ෂා කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 82.6 ක් පමණක් වී තිබුණි.

**පනතට අනුකූල නොවන අධිභාර බදු ගෙවීම්**

2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රු.මිලියන 2000 ක් ඉක්මවනු ලබන තනි පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාර හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත සියයට විසිපහක ප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු නමුත් 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම මත අධිභාර බද්ද රු.මිලියන 1,196.94 වෙනුවට අධිකාරිය රු.මිලියන 1,952.2 ක් අධිභාර බදු ලෙස රු. මිලියන 755.33 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

**විධිමත්ව ඉඩම්පවරා දී නොතිබීම**

ඩී.ආර්.විජේවර්ධන මාවතේ පිහිටි වටිනාකම රු.මිලියන 628.5 ක් වූ අක්කර 02 රූඩ් 03 පර්චස් 9.61 ක් වූ ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාරදී තිබූ සහ කැනල් අංගනය (බටහිර) කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන වටිනාකම රු.මිලියන 947.5 ක් වූ අක්කර 02 ක ඉඩම් රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ නමුත් එම ඉඩම් වෙනුවෙන් වන්දි මුදල් 2023 දෙසැම්බර් 31 දින දක්වා අධිකාරියට ලැබී නොතිබුණි. තවද, විධිමත් ක්‍රියාමාර්ග අනුව වටිනාකම් වත්කම් ලේඛනවලින් ඉවත්කර නොතිබුණි.

කොළඹ 10 විජේවර්ධන මාවතේ සන්නිවේදන කුලුණ ඉදිකරන ස්ථානය අසල ඇති ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබාදීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය වන රු.මිලියන 37.9 තුළ වර්ෂයක් හා වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරිච්ඡේද තුළ නිරවුල් නොවූ ශේෂ පිළිවෙලින් රු.මිලියන 8.2 ක්, රු.මිලියන 29.7 ක් පැවතුණි. මෙම ඉඩමට අදාලව කල් බදු ගිවිසුමකට ද එළඹ නොතිබූ අතර විගණිත දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

තවද, සිරිල් සී පෙරේරා මාවතේ පිහිටි වටිනාකම රු.මිලියන 83.72 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ නමුත් නීත්‍යානුකූල හුවමාරුවීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි

**ආර්ථිකමය කටයුතුවලට භාවිතා නොකරන ඉඩම්**

ත්‍රිකුණාමලය වරායට අයත් ඉඩම්වල 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පදිංචි වූ අනවසර පදිංචිකරුවන්ට එරෙහිව 2023 ජූලි 10 දින වන විට පවරන ලද නඩු සංඛ්‍යාව 147 ක් වූ අතර කාලච්ඡේදය තුළ ඉවත් නොවූ පදිංචිකරුවන් සංඛ්‍යාව 37 ක් විය. එසේම, ඉදිරියේදී නඩු පැවරීමට යෝජිත පිරිස 46 ක්ව තිබුණි. තවද, ත්‍රිකුණාමලය වරායට අයත් හෙක්ටයාර් 1,871 ක් වූ විශාල ඉඩම් කට්ටි 04 ක් ආර්ථිකමය වශයෙන් භාවිතයට නොගෙන පැවතුණි.

**අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම.**

2010 වර්ෂයේදි දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (South Asia Gateway Terminal Ltd-SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණි. කෙසේ වුවද, 2023 වර්ෂය අවසන් වන තෙක් අදාල කොටස් හිමිකම අධිකාරිය වෙත ඒ අනුව ලබාදී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට 2023 වර්ෂයේ ශේෂ සනාථ මගින් පිළිතුරු ලබාදී තිබුණි.

**පරිපාලිත සමාගම් සඳහා ප්‍රතිපත්ති සකස් නොකිරීම**

2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය අනුව පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කල යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් 03 සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

**පරිපාලිත සමාගමක් විසින් ලබාගත් ණය වෙනුවෙන් ඇපවීම.**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් ලෙස මාගම්පුර වරාය කළමණාකරණ සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2013 ජූලි 05 වන දින සංස්ථාපනය කර තිබුණු අතර කළමනාකරණ ගිවිසුමක් මඟින් හම්බන්තොට වරායේ මෙහෙයුම් කළමනාකරණය සමාගම වෙත පවරා තිබුණි. සමාගම විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාගත් බලපත්‍රයක් මඟින් හම්බන්තොට වරායේ ඉන්ධන සැපයුම්කරුවෙකු ලෙස මෙහෙයුම්

ආරම්භ කළ අතර ඒ සඳහා 2014 වර්ෂයේදී සමාගම පුද්ගලික බැංකුවකින් එ.ජ. ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ඒ අනුව ගබඩා කිරීම සහ ජාත්‍යන්තර නෞකාවලට ප්‍රති අපනයනය කිරීම අරමුණු කරගෙන විශාල ලෙස ඉන්ධන ආනයනය කරන ලදී. කෙසේ වෙතත්, මූලික වශයෙන් ලෝක වෙළඳපලේ තෙල් මිල පහත වැටීම හේතුවෙන් සමාගමට ඉන්ධන සැපයුම මඟින් සැලකිය යුතු පාඩුවක් සිදුවී තිබුණු බැවින් එයින් ණය මුදල හා පොළිය ලෙස එ.ජ.ඩොලර් මිලියන 26.49 (රු.මිලියන 9,617) ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබුණි. 2017 නොවැම්බර් සිට සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතු ප්‍රමාණවත් වත්කම් නොවූයෙන් බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණු අතර 2023 වර්ෂය අවසාන වන විටද නඩු කටයුතු අවසන්ව නොතිබුණි. තවද, බස්නාහිර පළාත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක HC (Civil) 97/2021/CO දරන නඩු තීන්දුව ප්‍රකාරව 2022 ජුනි මස 01 වන දින සිට ඈවරකරුවකු පත්කර සමාගම ඈවර කිරීමේ කටයුතු දැනට සිදුකරගෙන යනු ලබයි.


## සී/ස ලංකා නැව් සංස්ථාව

**සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

සී/ස ලංකා නැව් සංස්ථාව ශ්‍රී ලංකාවේ නාවික ආනයන අපනයන ප්‍රවාහන කාර්යයෙහිලා පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය හිමිකාරිත්වය ඇති ව්‍යවසායයකි. රාජ්‍ය අංශයේ ආයතන භාණ්ඩ ආනයනය කිරීම, රේගු නිශ්කාෂණ හා අනෙකුත් සේවාවන් වෙනත් නැව් සමාගම් මඟින් සිදු කිරීම අවම කර එම සේවාවන් රාජ්‍ය හිමිකාරිත්වය සමඟ දේශීය ආයතනයක් මඟින් සිදුකර විදේශ විනිමය රට තුළ රඳවා ගැනීමේ අරමුණෙන් මෙම සමාගම වෙත රාජ්‍ය අනුග්‍රහය ලබා දී තිබූ අතර එම සමාගමට Ceylon Breeze හා Ceylon Princess නමින් නැව් දෙකක හිමිකාරිත්වය සතු විය. සමාගමේ ප්‍රධාන ආදායම් මාර්ග දෙක වනුයේ සංස්ථාවේ නැව් මඟින් ආදායම් ඉපයීම, (Voyage) සංස්ථාවේ නැව් වෙනත් ආයතන වෙත මෙහෙයුම් කටයුතු සඳහා කුලී පදනම මත ලබා දීම හා වෙනත් ආයතන මඟින් කුලී පදනම මත නැව් ලබා ගැනීම (Charter Hire) වේ. 2023 වර්ෂයේ Voyage මඟින් රු.මිලියන 878.67 ක් හා Charter Hire සේවාව මඟින් රු.මිලියන 5,336.83 ක් ආදායම් ඉපයීම සිදු කර තිබුණි. සමාගම ඉහත යාත්‍රා මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී එ.ජ. ඩොලර් මිලියන 70 ක කාලීන ණය පහසුකමක් හා එම පොලිය ගෙවීමට පොලී ප්‍රාග්ධනිත ණයක් ලෙස එ.ජ. ඩොලර් මිලියන 5.44 ක් මහජන බැංකුවෙන් ලබා ගෙන තිබුණි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වසර තුළ ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 12.4 කින් අවප්‍රමාණයවීම හේතුවෙන් රු.මිලියන

2,811.9 ක විනිමය අලාභයක් සිදුව තිබීම සමාගමේ සමස්ත අලාභයට හේතු වී තිබුණි

.




රූප සටහන් අංක 2.43 : 2015-2023 නැව් සංස්ථාවේ ආදායම් හා වියදම්

මූලාශ්‍රය - 2015-2023 නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ

සමාගම 2016 වර්ෂයේ සිට අලාභයන් වාර්තා කර තිබූ අතර 2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අ අනුව අලාභය රු.මිලියන 1,857.13 ක් වූ අතර සමුච්චිත අලාභය රු.මිලියන 10,855.14 ක් විය. තවද, 2023 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම්වල අගය රු.මිලියන 9,210.1 ක සෘණ අගයක් ගෙන තිබුණි. මේ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවක් පැවතුණි.

**රාජ්‍ය අංශය විසින් නැව් මඟින් භාණ්ඩ ආනයනය**

අමප/16/0035/737/003 2016 ජනවාරි 21 දිනැති අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා 2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ආධාර ව්‍යාපෘතිද ඇතුළුව සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කළ යුත්තේ ලංකා නැව් සංස්ථා සමාගම හරහා වන අතර එහිදී රාජ්‍ය අංශයේ ආයතනවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු වේ. කෙසේ වෙතත් 2018 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා රාජ්‍ය අංශයේ භාණ්ඩ සමාගම හරහා ප්‍රවාහනය කිරීමේ අවස්ථා සාපේක්ෂව අඩු වී තිබූ අතර රාජ්‍ය ආයතන නැව් සංස්ථා සමාගම හරහා භාණ්ඩ ආනයනය නොකරන්නේ නම් ඒ සඳහා අත්හැරීමේ නිවේදන (Waivers) ලබා ගත යුතු වේ. 2021/22 වර්ෂයේ හා 2022/23 වර්ෂයේ අත්හැරීම් නිවේදන පිළිවෙලින් 185ක් හා 118 ක් රාජ්‍ය අංශයේ විශාල වශයෙන් ආනයන කටයුතු වල යෙදෙන රාජ්‍ය ආයතන වෙත ලබා දී තිබූ අතර එම ආයතන වෙත

සමාගමෙන් සේවා ලබා නොගෙන වෙනත් නැව් සමාගම් මඟින් භාණ්ඩ ආනයනය කර තිබුණි.

## වෙළඳ නාවික ලේකම් කාර්යාලය

**වගකීම් හා සැලසුම්**

ශ්‍රී ලංකාවේ වෙළඳ නාවික කටයුතු පරිපාලන භාර හා සමුද්‍ර කටයුතු අධීක්ෂණය කිරීමේ සමස්ථ වගකීම වෙළඳ නාවික ලේකම් කාර්යාලය මඟින් ඉටු කරයි. මෙම ආයතනය 1971 අංක 52 දරණ වෙළඳ නැව් කටයුතු පනත, 1972 අංක 10 දරන නැව් ඒජන්තවරුන්ට බලපත්‍ර ලබා දීමේ පනත, 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පිළිබඳ පනතේ වගන්ති සහ පසුකාලීනව සම්පාදනය කළ රෙගුලාසි බලපැවැත්වේ. එම කාර්යාලය මඟින් මුහුදේ සැරිසරන ජීවිත දේපලවල ආරක්ෂාව සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව ප්‍රවීණත්වය පිළිබඳ සහතික ලබාදීම ශ්‍රී ලංකා රජය යටතේ නැව් ලියාපදිංචිය නැව් ඒජන්තවරුන්ට බහාලුම් මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්ට වාර්ෂික බලපත්‍ර ලබාදීම සහ සියලුම ජාතික හා ජාත්‍යන්තර සම්මුතීන් හා රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මකවීම පිළිබඳ වගකීම දරයි. 2023 වර්ෂයේදී ලේකම් කාර්යාලයේ වියදම රු.මිලියන 115.7 ක් වූ අතර සංයුක්ත සැලැසුමට අනුව ප්‍රධාන කාර්යයන් 12 ක්, කෙටි කාලීන සැලැසුම් 04 ක් හා දිගු කාලීන සැලැසුම් 03 ක් ඉදිරි සැලැසුම් ලෙස දක්වා තිබුණි. එහෙත් ක්‍රියාකාරි සැලැස්ම අනුව ILO සම්මුතියට අනුකූලව ජෛවමිතික අංග එකතු කරමින් සියලුම ලාංකික නාවිකයින්ට හැඳුනුම්පත් නිකුත් කිරීම (SID) සම්බන්ධ ක්‍රියාකාරකම පමණක් ඇතුළත්කර තිබූ අතර අනෙකුත් ක්‍රියාකාරකම් එහි ඇතුළත්කර නොතිබුණි.

**ගිණුම්ගත නොකල හා නිශ්කාර්ය වත්කම්**

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/2023 හා 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 08/02 වගන්තිය ප්‍රකාරව හඳුනාගත් මූල්‍ය නොවන වත්කම් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතු වේ. එහෙත් යාපනය වෙළඳ නාවික උප ලේකම් කාර්යාලය, සංචාරක බංගලාව හා දියත්මඟ යන මූල්‍ය නොවන වත්කම්වල ඉදිකිරීම් වටිනාකම රු.මිලියන 79.28 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී රු.මිලියන 45.48ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. නමුත් එම වත්කම 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව පැවති අතර එහි නඩත්තු වියදම් සඳහා 2022 හා 2023 වර්ෂයට රු.මිලියන 3.4 ක් වියදම් කර තිබුණි.

## ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම

**සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය** ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අත්‍යාවශ්‍ය සේවාවන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සැපයීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියයට 40 ක හා ලංකා නැව් සංස්ථාවේ සියයට 15 ක කොටස් ප්‍රාග්ධනයකින් යුතුව සමාගම පිහිටුවා ඇත. සමාගමේ වර්තමාන ව්‍යාපාරික කටයුතු ලෙස වරාය ගමනාගමන මෙහෙයුම් පාලනය, ඒවා නියාමනය, භාණ්ඩ හැසිරවීම, රැකියා නියෝජිත ආයතන සංවිධානය කිරීම, ගාලු මුවදොර පිටියේ කලමනාකරණය පරිපාලනය හා නාවික කාර්යය මණ්ඩලය බඳවා ගැනීම වේ. 2023 වර්ෂයේ සමස්ථ ආදායම රු.මිලියන 145.66 ක් වූ අතර සමස්ථ වියදම රු.මිලියන 143.24 ක් විය. එහෙත් පෙර වසරට සාපේක්ෂව ආදායම සියයට 3 කින් පහළ බැස තිබූ අතර සමස්ථ ලාභයද රු.මිලියන 7.1 සිට රු.මිලියන 2.4 දක්වා රු.මිලියන 4.7 කින් පහළ බැස තිබුණි. සමාගම විසින් 2014 වර්ෂයේදී Tangyo Haulage පුද්ගලික සමාගමෙන් ප්‍රවාහන රථ ගිවිසුම් පදනම මත ලබාගෙන ඒ සඳහා ගිවිසුම් ප්‍රකාරව මුදල් නොගෙවීම හේතුවෙන් සැපයුම්කාර සමාගම වෙත රු.මිලියන 28.9 ක වන්දියක් ගෙවන ලෙස අධිකරණය විසින් 2017 වර්ෂයේදී නියම කර තිබුණි. තවද, වරාය අධිකාරියට අයත් Macculum Gate පරිශ්‍රයේ භෝජනාගාරයක් 2008 සිට 2023 දක්වා පවත්වා ගෙනයාම සඳහා තෙවන පාර්ශවයක් සමග ගිවිසුම් ගතවී තිබූ අතර ඒ වෙනුවෙන් රු.මිලියන 4.5 ක මුදලක් සමාගමට අයකර ගත යුතුව තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

# ගුවන් සේවා අංශය

රජයේ පවතින ප්‍රතිපත්තිවලට අනුකූලව සහ විවිධ අවස්ථාවල ලබා දෙන මඟපෙන්වීම් අනුව වරාය, නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රයට හා ඒ හා සම්බන්ධ ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යය වන අතර ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ සිවිල් ගුවන්සේවා අධිකාරිය, සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම හා සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ එහි පාලිත සමාගම් වලට අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සිදුකරනු ලැබේ.

## විගණන නිරීක්ෂණ

### සිවිල් ගුවන් සේවා අධිකාරිය

**අපගමන බදු ගිණුම් ගත කර නොකිරීම**

අධිකාරියේ ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව, අපගමන බද්ද මත (Embarkation Levy) සේවා ගාස්තු ආදායම උපචිත පදනම මත හඳුනා ගත යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විට ගුවන් සමාගම් හයකින් ලැබිය යුතු රු.මිලියන 11,070.73 ක් වූ අපගමන බදු ගිණුම් ගත කර නොතිබුණි. එබැවින්, ඉන් මහා භාණ්ඩාගාරයට, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමට බෙදාහැරිය යුතු මුදල්, පිළිවෙලින් රු. මිලියන 8,303.05කින්, රු. මිලියන 899.50 කින් සහ රු. මිලියන 1,798.99 කින් අඩුවෙන් දක්වා තිබුණි.ඊට අමතරව, අධිකාරියේ අපගමන බද්ද මත සේවා ගාස්තු ආදායම රු. මිලියන 69.19 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**විදේශීය විකුණුම් අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම**

අංක 1550/7 හා 2008 මැයි 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි සහ අංක 23/1937/628/094 හා 2023 නොවැම්බර් 28 දිනැතිව නිකුත් කරන ලද කැබිනට් තීරණය අනුව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශපත්‍රයක් සම්බන්ධයෙන්ම ඇමෙරිකානු ඩොලර් 60 ක විදේශීය විකුණුම් අධිභාරය (OSS Levy) හෝ එම මුදලට සමාන මුදලක් අය කළ යුතු අතර, එසේ අය කරනු ලබන අධිභාරය, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වුවද, අධිකාරිය, ගැසට් නිවේදනයේ ආරම්භයේ සිට 2023 නොවැම්බර් 20 දක්වා එසේ එකතු කල මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායමක් ලෙස සලකා තිබුණි.

තවද, අංක 23/1937/628/094 හා 2023 නොවැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින්ද අදාළ අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස ද අධිකාරියට උපදෙස් ලබා දී තිබුණි. ඒ

අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අධිකාරියේ රඳවාගත් ඉපැයීම් ඒකාබද්ධ අරමුදලට යැවීමට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය රඳවාගත් ඉපැයීම් ද යවා නොතිබුණි.

**අරමුදල් දායක මුදල් වැඩිපුර ගෙවීම**

සේවක භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් පනත්වල අර්ථ දක්වා ඇති ඉපැයීම්වලට පටහැනිව අධිකාරිය විසින් එම අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී විවිධ දීමනා වර්ග 7ක් ඇතුළත් කර තිබුණි. මෙම වැරදි ගණනය කිරීම හේතුවෙන් 2020-2023 නියැදි විගණන කාලපරිච්ඡේදය තුළ සේවක භාරකාර අරමුදලට රු.මිලියන 125.15 ක් හා සේවක අර්ථසාධක අරමුදලට රු. මිලියන 15.02 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**අහිමි වූ පොළී ආදායම්**

අධිකාරියේ කාර්ය මණ්ඩල හා පරිපාලන අත්පොත අනුව, දේපළ හා වාහන ණය සඳහා පොළී අනුපාතය සියයට 7 ක් විය යුතු වුවද, අධිකාරිය විසින් පොළී අනුපාතය ලෙස සියයට 4.2 ක් පමණක් අය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 සහ 2023 වර්ෂවලට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි, පිළිවෙලින් රු. මිලියන 2.11 ක් සහ රු.මිලියන 1.79 ක් වූ ණය පොළී ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි.

## ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**පරිපූරක ගිවිසුම යටතේ ගෙවීම්**

සමාගම විසින් සීමාසහිත චයිනා හාබර් ඉංජිනියරින් සමාගම (CHEC) සමඟ 2013 සැප්තැම්බර් 06 දින මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා අත්සන් කරන ලද ප්‍රධාන ගිවිසුම (2009 නොවැම්බර් 27 දින අත්සන් කරන ලද හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව) සඳහා මත්තල නඩත්තු, අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණය (MRO) ව්‍යාපෘතියට අදාළ මුළු පිරිවැය ඇ.ජ.ඩොලර් මිලියන 122.03 ක අතිරේක කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූරක ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් ගිවිසුමේ කොන්දේසි අනුව චීනයේ EXIM බැංකුව විසින් සපයන සහන ණය, සමාගම විසින් ලබාගෙන නොතිබූ බැවින් ගිවිසුමේ පාර්ශ්වයන් ඉන් බැඳී නොතිබුණි.

එහෙත් සමාගමේ සභාපතිවරයා විසින් 2013 ඔක්තෝබර් 03 දින CHEC වෙත ආරම්භක නියෝගයක් නිකුත් කර ඇති අතර, ඒ අනුව, ගිවිසුම වලංගුව නොතිබියදී, මගී පර්යන්ත ගොඩනැගිල්ලේ නව ගේට්ටු විවේකාගාරයක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි.

අංක MMEZD/AV/04/AASL-MRIADEV දරන ලිපිය මගින් සංචාරක රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද කමිටුව

විසින් ලබා දුන් තීරණයට අනුව සහ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර ඉදිරිපත් කරන ලද නැවත තක්සේරු කිරීමේ පරිපූරක වාර්තාව අනුව, CHEC විසින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 565.49 ක වටිනාකමට සමාන එ.ජ. ඩොලර් මිලියන 1.65 ක වටිනාකමැති බිල්පත්, කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. අවසාන වශයෙන්, CHEC සහ සමාගම විසින් ඉන්ජිනේරු සහතික කිරීමකින් තොරව "Quantum of Merit" පදනම මත ඉහත මුදල වාරික තුනකින් ගෙවීමට එකඟ වී තිබුණි.කෙසේ වෙතත්, බොහෝ සැලසුම් වර්තමානය සඳහා සුදුසු නොවීම හා ගොඩනැගිලි ඉදිකිරීම එතෙක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් ඉහත කී මුදලින් රු.මිලියන 187.60 ක් (එ.ජ.ඩොලර් 547,524 ) අනාර්ථික වී තිබුණි.

**ඒකාබද්ධ අරමුදලට නියමිත ලාභය ලබා නොදීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 5.3 වගන්තිය අනුව, බදු ගෙවීමෙන් පසු ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් (30) ඒකාබද්ධ අරමුදල/කොටස් හිමියන් වෙත බෙදා හැරිය යුතුය. 2023 වර්ෂය සඳහා සමාගම රු.මිලියන 28,121ක බදු පසු ලාභයක් වාර්තා කර තිබුණු අතර ඒ අනුව රු. මිලියන 8,436 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැරිය යුතු වුවද , සමාගම විසින් රු. මිලියන 5,000 ක් පමණක් බෙදාහැර තිබුණි.

තවද, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු ලාභය රු.මිලියන 4,802 ක් වාර්තා කර තිබුණු අතර ඒ අනුව රු. මිලියන 1,440 ක මුදලක් බෙදා හැරිය යුතුය .කෙසේ වුවද, සමාගම ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණේ රු. මිලියන 1,000ක් පමණි.

**අනාර්ථික වියදම්**

BIA සංවර්ධන II වන අදියරේ 2 වන පියවර ව්‍යාපෘතිය (පැකේජය A - මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදි කිරීම) සහ ඒ ආශ්‍රිත වැඩ සම්බන්ධ ව්‍යාපෘතිය,අත්හිටුවන ලද කාල සීමාව තුළ දැරූ රු. මිලියන 184 ක බැඳීම් ගාස්තු සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් අනාර්ථික වී තිබුණි.

**ලෝක ශ්‍රේණිගත කිරීම් පහත වැටීම්**

ඉන්ටර්නැෂනල් එයාර්පෝර්ට් කවුන්සිලය (ACI) විසින් 2018 වසරේ ලෝක ගුවන් තොටුපළ පිළිබඳව නිකුත් කරන ලද තොරතුරුවලට අනුව, ලෝකයේ ගුවන් තොටුපළවල් 2,583 කින් ශ්‍රී ලංකාව මුළු ගුවන් සංචලන අනුව 370 වැනි ස්ථානයේද, මුළු මගී සංචලන අතින් 205 වැනි ස්ථානයේද සහ මුළු භාණ්ඩ ප්‍රවාහනය අතින් 89 වන ස්ථානයේ ද පසු විය. කෙසේ වෙතත්, 2022 වසරේ ACI වාර්තාවට අනුව, ගුවන් තොටුපළ 2,677 කින්, ශ්‍රී ලංකාව මුළු ගුවන් සංචලන අනුව 548 වන ස්ථානයේද, මුළු මගී සංචලන අනුව 292 වන ස්ථානයේද, සහ මුළු භාණ්ඩ ප්‍රවාහනය අනුව 116 වන ස්ථානයේද

විය. ඒ අනුව 2018 සංඛ්‍යාලේඛන හා සසඳන විට ලෝක ශ්‍රේණිගත කිරීම පහත වැටෙමින් පවතින බව නිරීක්ෂණය විය. කළමනාකාරිත්වය විසින් දක්වන ලද අදහස්වලට අනුව, පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කොවිඩ් වසංගත තත්ත්වය යනාදියයි.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල මෙහෙයුම්**

2023 වර්ෂය තුළ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි මෙහෙයුම් පිරිවැය රු.මිලියන 2,412.9 ක් වී තිබුණු අතර මෙහෙයුම් ආදායම රු.මිලියන 288 ක් වී තිබුණි. තවද, ගුවන් තොටුපළේ මෙහෙයුම් පාඩුව (බදුවලට පෙර) රු. මිලියන 2,124.1 ක් වූ අතර ප්‍රධාන වශයෙන් විදේශ විනිමය ලාභයේ බලපෑම හේතුවෙන් 2023 වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රු. මිලියන 926.6 ක් විය. එසේ වුවද, 2018 සිට 2023 වර්ෂය දක්වා බදු ගෙවීමෙන් පසු සමුච්චිත ශුද්ධ පාඩුව රු. මිලියන 38,489 ක් වී තිබුණි. මත්තල ගුවන් තොටුපළේ අපේක්ෂිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුවද, පසුගිය වසර හය තුළ හසුරුවන ලද මුළු මගීන් සංඛ්‍යාව 190,750 ක් පමණක් වූ අතර පසුගිය වසර හය තුළ මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,182 ක් පමණක් වී තිබුණි.

එබැවින් ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා මිල ඉහළ යාම සහ විචලනයන් ඇතුළුව වැය කර තිබූ ඩොලර් මිලියන 247.7 ට සමාන රු. මිලියන 36,564 ක මුළු මුදල, ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි. තවද, ඉහත ඉදිකිරීම සඳහා මුලින් ලබාගත් ඩොලර් මිලියන 190 ක විදේශ ණය සඳහා වාර්ෂික ණය පොලිය ලෙස සමාගම විසින් රු. මිලියන 1,590 ක මුදලක් ගෙවා තිබුණි.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (BIA) සංවර්ධන ව්‍යාපෘතියේ II වන අදියරේ 2 වන පියවර යටතේ ඉදිකිරීම් කටයුතු 2020 මාර්තු 04 දින ජපානයේ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබුණි. මාස 9 ක ප්‍රමාදයකින් පසු කොන්ත්‍රාත්තුව යටතේ වැඩ ආරම්භ කර තිබුණද, 2022 අප්‍රේල් 12 දින මුදල් අමාත්‍යාංශය විසින් විදේශ ණය සේවා සැපයීම සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන්, ප්‍රදායකයා විසින් ණය පහසුකම යටතේ සියලුම ගෙවීම් අත්හිටුවීම මත ඉදිකිරීම් කටයුතු නතරකර තිබුණි. ඒ වන විට කොන්ත්‍රාත්තුවේ සත්‍ය ප්‍රගතිය සියයට 5.38 ක් පමණක් විය. පසුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත රු.මිලියන 800 ක දළ ඇස්තමේන්තුවක් සහිතව හඳුනාගත් වැඩ විෂයයක් ක්‍රියාත්මක කිරීමට සමාගම ක්‍රියාකර තිබුණි.

ගොනුවේ ඇතුළත් තොරතුරු අනුව, මුලිකව ඉහත කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත් ගොනු (packages) කර ජාතික තරඟකාරී ලංසු තැබීමේ

පටිපාටිය හරහා ලංසු කැඳවීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම 2023 පෙබරවාරි 03 දින පැවති සිය රැස්වීමේදී ඉහත ප්‍රසම්පාදනය සඳහා, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) විසින් ගනු ලැබූ තීරණයක් යොමු කරමින් ලංසුකරුවන් දෙදෙනෙකුගෙන්, සීමිත මිලගණන් කැඳවා තිබුණි. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ ඇස්තමේන්තුගත පිරිවැය සියයට 10 ක අසම්භාවයන් සහිතව රු.මිලියන 275 ක් විය.

ව්‍යාපෘති අංශයේ ප්‍රධානියාගේ 2023 මාර්තු 01 දිනැති ලිපියෙන් උපදේශකගේ ඉංජිනේරු නියෝජිත වෙත රු. මිලියන 640.28 ක පිරිවැයකට එක් මිල ඉදිරිපත් කිරීමක් පමණක් ලැබුණු බවත් එය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 365.28 කින් වැඩි බවත් දන්වා තිබුණි. තවද, උපදේශකගේ ඉංජිනේරු නියෝජිතයා විසින්ද ඔහුගේ අංක IAS-NK/PMU/Pk A/23/1557 හා 2023 මාර්තු 07 දිනැති ලිපියෙන් ද ලංසු මිල, ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුවට වඩා සියයට 100 කින් වැඩි බව ඉස්මතු කර තිබුණි. කෙසේ වෙතත්, සාකච්ඡාවලින් පසුව, සියයට 2.5ක වට්ටමක්, සියයට 4.7ක අසම්භාවයන් සහ වැට් බද්ද ඇතුළුව රු. මිලියන 475.12 ක මුළු පිරිවැයකට 2023 මැයි 31 දින ලංසු පිළිගැනීමේ ලිපිය නිකුත් කර තිබුණි. ඉංජිනේරු ඇස්තමේන්තුව හා සසඳන විට කොන්ත්‍රාත් මිල සියයට 73 කට වඩා වැඩි බව නිරීක්ෂණය විය.

## සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ එහි පරිපාලිත සමාගම

**සමාගමේ හා සමූහයේ ලාභ/අලාභ**

2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය (බදු පසු) රු.මිලියන 7,925.01 ක් වූ අතර එය 2023 වර්ෂයේදී - රු.මිලියන 71,306.66ක අලාභයක් විය. එදිනට සමුච්චිත අලාභය රු.මිලියන 592,626.52 ක් වූ අතර 2023 මාර්තු 31 දිනට සමාන අලාභය රු.මිලියන 599,605.96 ක් වී තිබුණි. එදිනට සමූහයේ ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.මිලියන 327,144.66 ක් (2023 - රු.මිලියන 418,568.67) ද සමූහයේ මුළු ස්කන්ධය රු.මිලියන (381,723.67) ක් (2023 – රු.මිලියන (494,429.99) ද විය.

තවද, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම රු.මිලියන 3,870.86 ක (2023 - රු.මිලියන 73,621.53 අලාභය) ශුද්ධ ලාභයක්ද රු.මිලියන 607,613.60 ක සමුච්චිත අලාභයක් (2023 - රු.මිලියන 610,487.76 ක අලාභය) ද ලබා ඇති අතර, එදිනට, සමාගමේ ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.මිලියන 344,130.60 ක් (2023 - රු.මිලියන 431,624.55) ද සමාගමේ මුළු ස්කන්ධය රු.මිලියන (400,534.71) ක් (2023 – රු.මිලියන (509,174.88)) ද වී තිබුණි. 2024 අප්‍රේල් 25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය හා පෞද්ගලීකරණය කරන තුරු “ දිගුකල් පැවැත්මක් ඇත.” යන උපකල්පනය මත 2024 ජූලි 11 දින භාණ්ඩාගාර ලේකම් (වැඩ

බලන) විසින් ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) සමාගමට සිය මෙහෙයුම් කටයුතු කරගෙන යාම සඳහා දක්වන මූල්‍ය සහයෝගය තහවුරු කරමින් නිකුත් කරන ලද ලිපිය ද සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන දිගුකල් පැවැත්මක් ඇත යන උපකල්පනය මත සකස් කර තිබුණි.

ගුවන්යානා ඇණිය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අවශ්‍යතා තක්සේරුවට අනුව, ගුවන් යානා 27 ක් අවශ්‍ය වූ අතර 2024 අගෝස්තු 12 දිනට සමාගම යටතේ භෞතික හා මෙහෙයුම් ගුවන් යානා ඇණි පිළිවෙලින් 22 ක් හා 18 ක් විය. ඉන්, ගුවන්යානා 03 ක්, 2023 ඔක්තෝබර් 29 දින සිට 2024 අගෝස්තු දක්වා වූ කාලය තුළ භාවිතයෙන් බැහැරව ඇති අතර එම කාලය තුළ බදු කුළී වශයෙන් රු. මිලියන 2,808.96 ක් ගෙවා තිබුණි.

## මිහින් ලංකා (පෞද්ගලික) සමාගම

**ඇවරකරුගේ ගිණුම් ඉදිරිපත් කිරීම**

අංක MOF/DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් සමාගම ඇවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කර වාණිජ මහාධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2018 මාර්තු 18 දින ඇවරකරුවකු පත් කර තිබුණි. විගණිත 2016/17 මූල්‍ය වර්ෂයේ සිට ඇවරකරු පත් කළ දිනය දක්වා වූ කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමාගම් පනතේ 296(1) වගන්තිය ප්‍රකාරව ඇවරකරු විසින් පිළියෙල කරන ලද 2018 ජනවාරි 29 දින සිට 2022 ජනවාරි 28 දක්වා අර්ධ වාර්ෂික ඇවරකරුගේ ලැබීම් හා ගෙවීම් ගිණුම් 7 ක පිටපත් විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2019 ජනවාරි 28 දින ඉදිරිපත් කර තිබුණ ඇවරකරුගේ ලැබීම් හා ගෙවීම් ගිණුම අනුව ආරම්භක මුදල් ශේෂය රු.මිලියන 102.18 ක් වූ අතර 2017 මාර්තු 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 384.74 ක් වීම හේතුවෙන් රු. මිලියන 282.55 ක වෙනසක් ද නිරීක්ෂණය විය. විගණිත මූල්‍ය ප්‍රකාශන දිනය හා ඇවරකරුගේ ගිණුම් දිනය අතර කාලය සඳහා ගිණුම් ඉදිරිපත් කර නොමැති බැවින් මෙම ශේෂ අතර වෙනසට හේතු විගණනයේදී නිරීක්ෂණය නොවීය.

# ආයෝජන ප්‍රවර්ධනය

බොහෝවිට ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල ඒක පුද්ගල ආදායමේ මන්දගාමී වර්ධනයට හේතු වී ඇත්තේ ප්‍රාග්ධන ඌනතාවයි. මෙම ඌනතාවය මගහරවා ගැනීම සඳහා අනුගමනය කළයුතු හොඳම උපාය ක්‍රමය වන්නේ ආයෝජන ප්‍රවර්ධනයයි. ඒ අනුව ආයෝජන ප්‍රවර්ධනය යනු රටක් ආයෝජනය කිරීම සඳහා සුදුසු ස්ථානයක් ලෙස තෝරාගනු ලැබීමට අවශ්‍ය පසුබිම ඇති කිරීමට කටයුතු කිරීමයි. ඒ අනුව ආයෝජකයන්ට අවශ්‍ය භෞතික, න්‍යායික, මූල්‍ය හා පාරිසරික පහසුකම් සැපයීම ආයෝජන ප්‍රවර්ධනය මඟින් සිදුවේ. ඒ අනුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය

ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම

ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය

කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම


තාක්ෂණ උද්‍යාන ඇති කිරීම
ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු

ඉහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ පහත සඳහන් ආයතනවලට ප්‍රතිපාදන සලසා ති බුණි. ඇස්තමේන්තුගත ප්‍රතිපාදන, තත්‍ය වියදම හා ඉතිරිවීම් පහත දැක්වේ.

| ආයතනයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.මිලියන | තත්‍ය වියදම රු.මිලියන | ඉතිරිවීම් රු.මිලියන |
|---|---|---|---|
| ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 1,485.8 | 1,215.25 | 270.55 |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 824 | 378.74 | 445.26 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 300 | 300 | - |
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව | 7 | 6 | 1 |
| ටෙක්නො පාක් ඩිවෙලොප්මන්ට් කම්පනි ප්‍රයිවෙට් ලිමිටඩ් | - | - | - |
| තොරතුරු තාක්ෂණ උද්‍යාන | 13 | 11.33 | 1.67 |
| | 2,629.8 | 1,911.32 | 718.48 |
| | ====== | ======= | ====== |

වගු අංක : 2.28 අමාත්‍යාංශය හා අදාළ ආයතනවල ඇස්තමේන්තුගත ප්‍රතිපාදන, තත්‍ය වියදම හා ඉතිරිවීම්

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යයභාරය ඉටුකිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත එකතුව රු. මිලියන 2,629.8 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 1,911.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 2.47 හි දැක්වේ




රූප සටහන් අංක 2.47 : ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම
මූලාශ්‍රය - 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව සිදුකළ විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්-**

**වරාය නගර ව්‍යාපෘතිය**

දිනෙන් දින ඉහළ යන ඉඩම් ඉල්ලුමට සරිලන පරිදි කොළඹ නගරය පුළුල් කිරීම සඳහා කොළඹ වරායට යාබද ඉඩම් ගොඩකිරීමේ යෝජනාවක් වශයෙන් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘති සමාගම විසින් ඇ.ඩොලර් මිලියන 143 ක වන්දි මුදලක් ඉල්ලුම් කර තිබුණු අතර ඒ වෙනුවට හෙක්ටයාර් 2 ක වාණිජමය ඉඩමක් ව්‍යාපෘති සමාගමට ලබා දී තිබුණි. මෙම ඉඩමේ තක්සේරු වටිනාකම වාර්තා කර නොතිබුණු අතර මේ අනුව ඉඩමේ වටිනාකමින් රජයට අලාභයක් සිදු වී තිබුණි.

වරාය නගරයේ අපජලය කළමනාකරණය සඳහා ස්ථිර විසඳුමක් සපයන තුරු තාවකාලික විසඳුම සඳහා අපේක්ෂිත වියදම රු.මිලියන 1,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද සැලස්මේ වෙනස් කිරීම් හා මිල ගණන් ඉහළ යාම් හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 3,700 දක්වා වැඩි වී තිබුණි. මෙම කාර්යය කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ත්‍රෛපාර්ශවීය ගිවිසුම් ප්‍රකාරව 2019 වර්ෂයේදී අවසන් විය යුතු වුවත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මසයේදීය. 2017-2019 කාලය තුළදී රු.මිලියන 1,600 ක මුදලක් වැය කර තිබුණද 2023 සැප්තැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. එසේම, රු.මිලියන 2,900 ක මුළු පිරිවැයකට ඇස්තමේන්තු කර තිබුණු ස්ථිර විසඳුමේ කාර්යයන්ද 2022 වර්ෂයේදී සම්පූර්ණ කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි. 2022 වර්ෂය වන විටත් තාවකාලික හා ස්ථිර විසඳුම් දෙකම ක්‍රියාත්මක කර නොතිබුණි. එහෙයින් තාවකාලික විසඳුම මගින් අපේක්ෂිත කාර්යයන් ඉටු වී නොමැති බැවින් ස්ථිර විසඳුම ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු කර නොතිබීමෙන් තාවකාලික විසඳුමට වැය කරන රු.මිලියන 3,700 රජයට පාඩුවක් බව නිරීක්ෂණය විය.

ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි උපලේඛන අංක 10 අනුව, වාණිජමය ඉඩම්, පොදු ඉඩම් සහ මාර්ග සඳහා වූ ඉඩම් ඇතුළුව ඉඩම් කොටස් 118 ක වැඩබිම් වැඩි දියුණු කිරීම 2019 සැප්තැම්බර් 16 දින වන විට අවසන් කළ යුතු වුවත් 2023 සැප්තැම්බර් 30 දින වන විට ඉඩම් කොටස් 85 කට පමණක් අවසන් කිරීමේ සහතික ලබා දී තිබුණි. තවද, මාර්ග, පාලම් හා උමං මාර්ග 2020 මාර්තු 14 දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 සැප්තැම්බර් 30 දින වන විට සියයට 50 ට වැඩි ප්‍රතිශතයකින් නිම කර තිබුණු අතර ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි. 2020 මාර්තු 09 අවසන් කළ යුතු භූමි අලංකරණ කටයුතු වලින් 2023 නොවැම්බර් 30 දින වන විටත් අවසන් කර තිබුණේ සියයට 77 ක් පමණි. අදියර 7 කින් නිමකිරීමට සැලසුම් කර තිබුණු දකුණු මලාපවාහන මාර්ගය නිම කිරීම 2023 ජූලි 11 සිදු කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 30 වන විටත් එහි අදියර තුනක් සැළසුම් අදියරේ පැවතුනි.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**අයකර ගත නොහැකි ආයෝජන මුදල්**

මණ්ඩලය විසින් ආයෝජනය කර ඇති සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් අඛණ්ඩ පසු විපරම් ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමාගම් ලේඛනයෙන් කපා හැර ඇති සමාගම් 26 ක සිදුකර තිබුණු රු.මිලියන 40.22 ක් වූ කොටස් ආයෝජනයන් අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි.

**අපනයන ප්‍රවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු නොකිරීම**

2023 වර්ෂය තුළ රු.මිලියන 16.49 ක වියදමින් පවත්වන ලද අපනයන ප්‍රවර්ධන වැඩසටහන් 07 ක් සඳහා සහභාගී වූ අපනයනකරුවන් 81 දෙනෙක් සම්බන්ධයෙන් ප්‍රගතිය ඇගයීමට මණ්ඩලය විසින් ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියා පටිපාටි අනුගමනය කර නොතිබුණි.

## ටෙක්නො පාක් ඩිවෙලොප්මන්ට් කම්පනි ප්‍රයිවෙට් ලිමිටඩ්

**තාක්ෂණික උද්‍යාන ඉදිකිරීමේ**

ප්‍රමාදයගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ඉදිකිරීම 2021 වසරේ ආරම්භ කර වසර 2 ක් ගත වී තිබුණද භෞතිකව පරීක්ෂාව සිදු කළ 2024 පෙබරවාරි 05 දින වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන කොන්ත්‍රාත් ගිවිසුම්වල 14.6 වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ප්‍රමාද කිරීම මත පිළිවෙලින් රු.මිලියන 236.36 ක් හා රු. මිලියන 416.8 ක් ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව රජයට සිදුවී ඇති පාඩුව රු. මිලියන 653.16 ක් විය. තවද, ගාල්ල තාක්ෂණික උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2022 අප්‍රේල් සිට රු. මිලියන 18.17 ක් හා කුරුණෑගල උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 36.19 ක් සහ ගාල්ල උද්‍යානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට 2022 මාර්තු 31 දින රු. මිලියන 950.6 ක් ගෙවීම් කළ යුතුව තිබුණි.

මීට අමතරව නුවරඑළිය හා නුවර යෝජිත තාක්ෂණික උද්‍යාන ඉදිකිරීම් කටයුතු සඳහා තෝරාගෙන තිබුණු සමාගම 2021 නොවැම්බර් 16 හා 2022 පෙබරවාරි 24 දින ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**තොරතුරු තාක්ෂණ උද්‍යාන**

2023 වර්ෂයේදී යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ සහතිකපත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා 11 කට සහ මාර්ගගත හා අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ වැඩමුළු 3 කට සිසුන් 320 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද පාඨමාලා 2 කට හා එක් වැඩමුළුවකට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 43 ක් එනම් සියයට 13 ක් විය. 2020 වර්ෂයේ සිට ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 126 සිට 2023 වර්ෂය වන විට 43 දක්වා ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ පාඨමාලා 10 ක් සඳහා අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව 300 ක් වුවද පාඨමාලා 3 ක් සඳහා ලියාපදිංචි වී තිබුණු සිසුන් සංඛ්‍යාව 155 ක් විය. යාපනය හා මන්නාරම උද්‍යාන දෙකෙන්

අපේක්ෂිත පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් රු.මිලියන 1.1 ක් හා රු.මිලියන 2.19 ක් වුවද ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව අඩු වීම හේතු කොට ගෙන රාජ්‍ය ආදායමට එකතු කර ගත හැකිව තිබුණේ යාපනය උද්‍යානයෙන් රු.131,080 ක්ද මන්නාරම උද්‍යානයෙන් රු.833,500 ක්ද වශයෙන් විය. මෙම උද්‍යාන නඩත්තුව හා පාඨමාලා පැවැත්වීම සඳහා 2023 වර්ෂයේදී යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වැය කර තිබුණු පිරිවැය පිළිවෙලින් රු.මිලියන 6.33 ක් හා රු.මිලියන 5 ක් විය. ඒ අනුව උද්‍යාන දෙක, සිසුන් 198 දෙනෙකුගෙන් එකතු කළ ආදායමට වඩා රු.මිලියන 10.37 ක් වැඩියෙන් වැය කර තිබුණි.

# මහජන ආරක්ෂාව

මහජන සේවාවන් කාර්යක්‍ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගනිමින් රට තුළ සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමත්, පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීමත්, දේශීය හා විදේශීය පුද්ගලයන් සඳහා ආගාමික හා විගාමික කාර්යයන් සඳහා පහසුකම් සැලසීමත්, ජාතික ආර්ථිකයට ශක්තියක් වන ලෙසට රට තුළ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ජාලය නියාමනය කිරීමත්, මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම ද මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ශ්‍රී ලංකා පොලීසිය,විශේෂ කාර්ය බලකාය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යන ආයතන මඟින් සිදුකෙරේ.

**කාර්යභාරයන්**

මහජන ආරක්‍ෂාව තහවුරු කිරීම ඉලක්කකර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.

සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස්කර ගැනීමේ වැඩපිළිවෙල ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟින් ක්‍රියාත්මක කිරීම.

අභ්‍යන්තර ආරක්‍ෂාව තහවුරු කිරීම ඉලක්කකර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ජන ජීවිතය සුක්‍ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරුම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්දනය කිරීම හා මැඩපැවැත්වීම.

රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිතය ගත කිරීමට අවශ්‍ය රැකවරණය සෑම විටම පවත්වාගෙන යාම.

රථවාහන භාවිතයේදී මාර්ගවල සිදුවන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරුවලින් සිදුවන මරණ, ආබාධ, රෝහල්ගතවීම් වලක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම්, මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම හා මග දෙපස රථවාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවමකර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලීසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්‍ෂණ හා ක්‍රමෝපායන් යොදා ගනිමින් නවීකරණය කිරීම.

ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථාව සැලසීම.

ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම.
පුද්ගල අනන්‍යතාවය දේශීයව තහවුරු කිරීමට සහතිකවන පසුබිම සැකසීම නවීකරණ හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම.

මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## විගණන නිරීක්ෂණ

### මහජන ආරක්ෂක අමාත්‍යාංශය

**එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී (Formed Police Unit) සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීම**

අංක අමප/16/0738/703/083 දරන 2016 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බලඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්තන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉහත සඳහන් කර ඇති භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. මිලියන 1,590 ක මුදලක් අනුමත කර තිබූ අතර, එම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත 2017 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/1811/784/001-1 යටතේ තවත් රු. මිලියන 1,175 ක මුදලක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ Formed Police Unit ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය වැඩිකර ගැනීම, මෙම ඒකකයේ රාජකාරී නියුක්ත නිලධාරීන්ට අමතර ආදායමක් ලැබීම තුළින් එම නිලධාරීන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කර ජීවන තත්ත්වය ඉහළ නැංවීම, ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය වෙත ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාගැනීම, සහභාගී වන නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය හා ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, විශේෂ කාර්ය බලකායේ සුදුසුකම් සහිත නිලධාරීන් හට අවස්ථා ලබාදීම තුළින් අභිප්‍රේරණය කිරීම යන අරමුණු ළඟාකර ගැනීමයි.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා රැගෙන යාමට අවශ්‍ය වාහන 57 ක් ට්‍රේලර් 03 ක් මේ දක්වා මිලදී ගෙන කටුකුරුන්ද ගෝනහේන, පූගොඩ, මොරටුව, අම්පාර, කැලණිය සහ අසනිගම යන විශේෂ කාර්ය බලකායේ කඳවුරු තුළ ස්ථානගත කර නඩත්තු

කටයුතු සිදු කරමින් පවතින අතර, කටුකුරුන්ද පුහුණු පාසල තුළ එම වාහන අතුරින් වාහන 17 ක් සහ රාජකාරී සඳහා රැගෙන යාමට මිලදී ගෙන ඇති අනෙකුත් භාණ්ඩ හා උපකරණ ගබඩාකර නඩත්තු කර පවත්වාගෙන යන බව විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය ආරම්භ කර 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙම වාහන සහ අනෙකුත් භාණ්ඩ හා උපකරණ ලබාගැනීම ඇතුළුව රු. මිලියන 1,873 ක් පමණ වැයකර තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත ආයතනික අරමුණු ඉටු වී නොතිබුණි. සාමසාධක රාජකාරී සඳහා පිටව යාම ප්‍රමාදවීම මත මිලදී ගන්නා ලද වාහන ඇතුළු අනෙකුත් භාණ්ඩ හා උපකරණ අවුරුදු 01 සිට 06 අතර කාලයක් නඩත්තු කරමින් නිශ්කාර්යව පැවතීම සහ එම භාණ්ඩවලට ලබාදී ඇති වගකීම් කාලය ද උපයෝජනයකින් තොරව ඉකුත් වීම උපකරණ නිෂ්ක්‍රියව පැවතීමෙන් සිදුවන හානි පිළිබඳ අවධානම මෙන්ම සමහර භාණ්ඩ කල් ඉකුත්වී පැවතීම ද විගණනයට නිරීක්ෂණය විය.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

**මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර නිකුත් කිරීම**

තොරතුරු තාක්ෂණ අංශයෙන් ලබාගත් වාර්තාව අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ කඩිනම් සේවාව සහ සාමාන්‍ය සේවාව යටතේ ලැබී තිබූ ගමන් බලපත්‍ර අයදුම්පත් 113,916 ක් අතරින් ගමන් බලපත්‍ර 48,770 ක් එනම් සියයට 43 ක් පමණක් වර්ෂය තුළ නිකුත්කර තිබුණි. ඉදිරිපත් කර තිබූ ලේඛනවල පැවති අඩුපාඩු හා විවිධ දෝෂ හේතුවෙන් ගමන් බලපත්‍ර 65,146 ක් නිකුත් කළ යුතුව පැවතුණි. ලබා දී ඇති උපදෙස් පරිදි අයදුම්පත් ඉදිරිපත් නොකිරීම නිසා එම දෝෂ නිවැරදිකර විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සිදුවීමෙන් විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම්කරුවන්ට මෙන්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ටද අමතර කාලයක් හා පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

**මාර්ගගත නොවන ක්‍රමවේදය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කිරීම**

තොරතුරු තාක්ෂණ අංශය මගින් විගණනය වෙත ලබාදුන් වාර්තාව අනුව 2023 වර්ෂය තුළදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල වෙත මාර්ගගත නොවන සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් 321,216 ක් ලැබී තිබූ අතර, වර්ෂය තුළදී ඉන් ගමන් බලපත්‍ර 198,592 ක් එනම් සියයට 62 ක් පමණක් නිකුත්කර තිබුණි.

**හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගැනීම**

දෙපාර්තමේන්තුව විසින් හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගැනීමට 2003 වර්ෂයේ තෝරාගෙන තිබූ පුද්ගලික ආයතනයක් මගින් 2024 වර්ෂය දක්වා අවුරුදු 21 ක පමණ කාලයක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව සැපයුම් දිගු ලබාදෙමින් ප්‍රසම්පාදන කාර්යයෙන් බැහැරව

ගමන් බලපත්‍ර මිලදී ගනිමින් පැවතුණි. කාලීන ඉල්ලුම අනුව හිස් ගමන් බලපත්‍රවල අවශ්‍යතාවන් තීරණය නොකර සාමාන්‍ය මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් අවස්ථා කිහිපයකදී ගමන් බලපත්‍ර හිඟතාවයන් ඇතිවී තිබුණි. මෙ නිසා 2022 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ගමන් බලපත්‍ර ගුවන් මඟින් ගෙන්වීමට සිදුව තිබු අතර ඒ සඳහා ගුවන් භාණ්ඩ ප්‍රවාහනය, ලේඛන සහ අමතර වැඩ ගාස්තු ලෙස එ.ජ. ඩොලර් 33,672 ක් පුද්ගලික ආයතනයක් වෙත ද, අනෙකුත් ගාස්තු ලෙස රු.මිලියන 0.38ක් ගෙවීමට සිදුවීම නිසා දෙපාර්තමේන්තුවට රු.මිලියන 13.18 ක අතිරේක වියදමක් සිදු වී තිබුණි.

2023 ඇතුලු පසුගිය වර්ෂ 5 ක කාලය තුළ ගුවන් ගමන් බලපත්‍ර ඉල්ලුම හා නැවත මිලදී ගැනීම්(re-order) යටතේ මිලදී ගැනීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | ගමන් බලපත්‍ර සඳහා ඉල්ලුම | නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | සාමාන්‍ය මිලදී ගැනීම් | විශේෂ මිලදී ගැනීම් |
|---|---|---|---|---|
| 2019 | 580,990 | 570,692 | - | - |
| 2020 | 192,508 | 207,697 | 1,000,000 | - |
| 2021 | 409,464 | 382,527 | - | - |
| 2022 | 997,686 | 912,039 | 60,000 | 95,000 |
| 2023 | 921,977 | 910,574 | 845,000 | 75,000 |

වගු අංක.2.29 2019 සිට 2023 දක්වා ගමන් බලපත්‍ර ඉල්ලුම, නිකුත් කිරීම් සහ මිලදී ගැනීම්
මූලාශ්‍රය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**භාණ්ඩ/වත්කම් ගිණුම්ගත නොකිරීම**

විගණනය වෙත ලද තොරතුරු අනුව 2012 සිට විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබු අතර ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබු මුළු භාණ්ඩ/වත්කම් වටිනාකම රු.මිලියන 901.87 ක් ව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 වන විට එයින් දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්කර තිබුණු භාණ්ඩ/වත්කම් ප්‍රමාණය රු.මිලියන 50.16 ක් පමණක් වී තිබුණි.

**ප්‍රමාණවත් කාඩ්පත් තොග පවත්වාගෙන නොයාම**

දෙපාර්තමේන්තුව විසින් නියමිත කාලයන් තුළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ප්‍රමාණවත් කාඩ්පත් තොගයන් පවත්වාගෙන නොයාම හේතුවෙන්, 2023 වර්ෂයේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් වෙනුවෙන් ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු තහවුරු කිරීමේ ලිපි 51,000 ක ප්‍රමාණයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට මුද්‍රණය හා තැපැල් වියදම් ලෙස රු. මිලියන 2.9 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

## ශ්‍රී ලංකා පොලීසිය

**සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව**

ශ්‍රී ලංකා පොලීසිය ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ 45 කින් හා ක්‍රියාකාරී පොලිස් කොට්ඨාශ 79 කින් සමන්විත වන අතර දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන සංඛ්‍යාව 607 ක් වේ. මෙම පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානයන්හි 2023 දෙසැම්බර් 31 දිනට නිල ඇඳුම් කාර්ය මණ්ඩලය ලෙස 81,738 ක් ද, පොලිස් සහායක සේවා කාර්ය මණ්ඩලය ලෙස 1,180 ක් ද සිවිල් කාර්ය මණ්ඩලය ලෙස 6,409 ක් ද ලෙස එකතුව 89,327 ක් සේවය කරන අතර සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 25,888 ක් විය.

**පොලිස් ස්ථානවල සඳහා නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොවීම**

පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි.

**පොලිස් ආඥා පනත සංශෝධනය**

1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය අනුව සංශෝධන සිදුකළ යුතු ක්ෂේත්‍ර 16 ක් 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද, 2024 අප්‍රේල් මාසය වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි.

**ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදය**

දඩ මුදල් අය කරගැනීම වේගවත් කිරීමත්, රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථවාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System) ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතිය ද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිත කර නොතිබුණි.

**ජාතික පොලිස් විද්‍යාලයේ නේවාසිකාගාරය ඉදිකිරීම**

කටාන ජාතික පොලිස් විද්‍යාලයේ නේවාසික පහසුකම් ලබාදීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 අගෝස්තු 20 දින ලංසු ප්‍රදානය කර තිබූ අතර, ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදුවීම නිසා 2023 අප්‍රේල් 26 දින ඉදිකිරීම් අත්හිටුවා තිබූ අතර, ඉටුකර ඇති වැඩවල වටිනාකම රු.මිලියන 97.3 ක් පමණක් බවට උපදේශක

ආයතනය තීරණය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 42.2 ක් නැවත අයවීමට තිබුණ ද, එය අයකර නොතිබුණි. ගොඩනැගිල්ලේ අත්තිවාරමේ හා කොන්ක්‍රීට් තට්ටුවල (Slab) පිටතට නෙරා ඇති යකඩ කම්බි මල බැදී දිරාපත් වෙමින් පැවති අතර, වැඩබිමේ තිබූ රු.මිලියන 1.7 ක් පමණ වටිනා කම්බි තොගයක් ද මළ බැදී දිරාපත් වෙමින් පැවතුණි.

**රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය**

2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී තිබූ මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක කරමින් පවතින නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ**

රථවාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ අවසන්වරට 2016 වර්ෂයේදී මිලදීගෙන තිබූ අතර, මිලදීගත් ප්‍රමාණය 25 ක් විය. ඊට පෙර 2014 වර්ෂයේදී 30 ක් ද, 2010 දී 100 ක් ද, මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ අතරින් ද විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. 2018 – 2023 කාලපරිච්ඡේදයේ වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර 500 බැගින් ඉල්ලුම් කර තිබුණ ද, එයින් කොටසක් හෝ මිලදී ගෙන නොතිබුණි. ඒ අනුව වේග සීමා කඩකරමින් අධික වේගයෙන් රථවාහන ධාවනය කිරීම, රථවාහන අනතුරු සිදුවීමට ප්‍රධාන හේතුවක් වන නමුත්, එය අවම කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට 2023 වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාකර නොතිබුණි.


# විදේශ රැකියා

ශ්‍රී ලංකාව ස්වභාවික සම්පත් බහුල රටක් වුවද විදේශ වෙළඳපලේ අනම්‍ය ඉල්ලුමක් සහිත නිෂ්පාදන සඳහා වූ තාක්ෂණික හා ප්‍රාග්ධන ඌනතාවය නිසා තවදුරටත් ප්‍රාථමික භාණ්ඩ අපනයනය කරන රටක තත්ත්වයේ රැඳී සිටීමට සිදු වී ඇත. එමෙන්ම රටේ ඛනිජ සම්පත්වල හිඟතාවය නිසා තවදුරටත් සීමිත ජල විදුලිබල ශක්තීන් හැර අනෙකුත් සියලුම බලශක්ති අවශ්‍යතා සඳහා විදේශ වෙළඳපල වෙත යාමට සිදු වීම මගින් රටේ ආනයන අපනයන පරතරය දිගින් දිගටම අවාසිදායක තත්ත්වයක පැවතුණි. මෙම තත්ත්වයෙන් ජය ගැනීම සඳහා හොඳම විසඳුම අනම්‍ය ඉල්ලුමක් සහිත විදේශ ශ්‍රම වෙළඳපලක් බිහි කිරීම නමුත් ඒ සඳහා සුදුසු විදේශ පුහුණු ශ්‍රම බලකායක් බිහිකිරීමට කටයුතු කළ යුතුය. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාරය ඉටු කිරීමේ ප්‍රමුඛතම ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වන අතර පහත සඳහන් ආයතනික ව්‍යුහය මගින් එහි සේවාව පුළුල් කර තිබුණි.

- විදේශ දූත මණ්ඩල 15 ක කම්කරු සුභසාධන අංශ පිහිටුවා තිබීම.
- විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටළු වලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා රැඳවුම් නිවාස 05 ක් මෙම සුභසාධන අංශ යටතේ පවත්වා ගෙන යාම.
- විගමනික ශ්‍රමිකයන් හුරුකිරීමේ සහ පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 10 ක් පවත්වා ගෙන යාම හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශිය කාර්යාල 06 ක් ස්ථාපිත කර තිබීම.

2023 වර්ෂය තුළ කාර්යාංශය විසින් තම සේවාව තුළින් එකතුව රු.මිලියන 12,222ක ආදායමක් උපයා තිබුණු අතර මුළු වියදම රු.මිලියන 4,439 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට කාර්යාංශය සතු මුළු ආයෝජන වටිනාකම රු.මිලියන 17,705 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු අනුව 2023 වර්ෂයේ කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 297,656 ක් වී තිබුණි. එයින් 164,608 හෙවත් සියයට 55.3 ක් පිරිමි පුද්ගලයන් වූ අතර 133,048 හෙවත් සියයට 44.7 ක් කාන්තාවන් වී තිබුණි.
කාර්යාංශයේ තොරතුරු අනුව විදෙස්ගත වූ ශ්‍රමිකයන්ගේ පුහුණු මට්ටම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.




රූප සටහන් අංක 2.45 : විදෙස්ගත වූ ශ්‍රමිකයන්ගේ පුහුණු මට්ටම්

| පුහුණු | | | | අර්ධ පුහුණු | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | % | පිරිමි | කාන්තා | එකතුව | % | |
| 106,763 | 101,823 | 208,586 | 70.08 | 57,845 | 31,225 | 89,070 | 29.92 | 297,656 |

වගු අංක 2.30 :කාන්තා හා පිරිමි බව අනුව පුහුණු මට්ටම

කාර්යාංශයෙහි ලියාපදිංචි වීමේ සංඛ්‍යා ලේඛනවලට අනුව, සියයට 44 ගෘහස්ත ගෘහ පාලන සහකාර, සියයට 31 ක් අඩු පුහුණු ශ්‍රමිකයන්, සියයට 1 ක් අර්ධ නිපුණතා සහ සියයට 21 පුහුණු ශ්‍රමිකයන් යන කාණ්ඩ යටතේ විය. ඉතිරි සංඛ්‍යා ලේඛනගත කර ඇත්තේ කම්කරු නොවන කාණ්ඩය යටතේ - මධ්‍යම මට්ටමේ සියයට 2, ලිපිකරු සහ අදාළ සියයට 1 යටතේය. ඔවුන් ප්‍රධාන වශයෙන් ගල්ෆ් කලාපීය රටවල එනම් බහරේන්, කුවේට්, ඕමානය, කටාර්, සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සේවයේ යෙදී සිටිති.

## විගණන නිරීක්ෂණ

### ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**නිවාස ණය වැඩසටහනට ලබා දුන් මුදල් ආපසු ලබා නොගැනීම**

2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.මිලියන 100 ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. නිවාස ණය වැඩසටහනේ වලංගු කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී තිබුණද, එම මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**විධිමත් අනුමැතියකින් තොරව ගෙවිය යුතු ශේෂයන් ආදායමට ගැනීම**

2022 දෙසැම්බර් 22 දින විගණන කළමනාකරණ රැස්වීමේදී නැවත ගෙවීමේ තැන්පතුවල 2008 සිට 2018 දක්වා කාලපරිච්ඡේදයට අදාළ වූ රු.මිලියන 679 ක ශේෂයක් පමණක් ආදායමට ගැනීමට සාකච්ඡා කර තිබූ නමුත් එම කාලසීමාවට අදාළ සියලුම ගෙවිය යුතු ශේෂයන් ඇතුළත් කර රු.මිලියන 1,388.8 ක් විධිමත් අනුමැතියකින් තොරව ආදායමට ගැනීමට කටයුතු කර තිබුණි. මෙම ගෙවිය යුතු ශේෂ ආදායම් ලෙස ගිණුම් වලට ගැනීමට පෙර හැකි සෑම ආකාරයකින්ම අදාළ පුද්ගලයින් දැනුවත් කර, ගෙවීම් කිරීම සඳහා උපරිම උත්සාහයක් ගත් බවට තහවුරු නොවීය.

**පනතට අනුකූල නොවන ලෙස ශ්‍රමිකයන් විදේශගත කිරීමට අනුමැතිය ලබා දීම**

1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53(3) වගන්තියට අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයෙකු විසින්ම, එසේ පිටත්ව යාමට පෙර කාර්යාංශයේ ලියාපදිංචි විය යුතු වේ. නමුත් කාර්යාංශය විසින් 2023 මාර්තු 20 දින සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට සංචාරක වීසා මත ගෘහසේවිකාවන් විදේශගත කිරීමට විදේශ රැකියා ඒජන්සි ආයතනවලට අවසර ලබා දී තිබුණු අතර ඒ සඳහා එ.ජ.ඩො. 100 ක් කාර්යාංශය වෙත ගෙවිය යුතු බව 2023 මාර්තු 20 දිනැති සභාපති චක්‍රලේඛ අංක 07/2023 මගින් අනුමත කර තිබුණි. මෙම ක්‍රමය මගින් රැකියා ගිවිසුමක් නොමැතිව ගෘහසේවිකාවන් විදේශගත කරන අතර විදේශගත වීමෙන් පසු දින 30 ක් උපරිම දින 45 ක කාලයක් තුළ රැකියාව ලබා දී සේවා යෝජකයා සමඟ අත්සන් කරන ලද ගිවිසුම තානාපති කාර්යාලයට ලබා දුන් බවට තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කළ යුතු වුවත්, 2024 ජුනි 6 දින වන විට රාජ්‍යයන් දෙක වෙත සංචාරක වීසා මත ගෘහසේවිකාවන් 4,942 ක් විදේශගත කර තිබූ අතර ඉන් 3,954 ක් සඳහා රැකියා ලබා දී තිබූ බවට තානාපති කාර්යාලයේ තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කර නොතිබුණි. ඒ අනුව කාර්යාංශ පනතට අනුකූල නොවන ලෙස ශ්‍රමිකයන් විදේශගත කිරීමට කාර්යාංශය විසින්ම අනුමැතිය ලබා දී තිබුණි.

**දූත මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්**

2023 අප්‍රේල් 6 දිනැති සභාපතිගේ චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව විදේශදූත දූත මණ්ඩල කාර්ය මණ්ඩලය බඳවා ගැනිමේදී මින් පෙර කිසිදු අවස්ථාවක දූත මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා බඳවා නොගත් කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බව සහ 2018 ජූලි 02 දිනැති අංක 34.27.12 දරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පෙර දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණ වසර 3 ක් කාර්යාංශයේ සේවය කර තිබිය යුතු බව සඳහන් කර තිබුණි. නමුත් කාර්යාංශ කාර්ය මණ්ඩලයේ 16 දෙනෙකු දූත මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගෙන තිබුණු අතර එයින් 07 දෙනෙකුම පෙර දූත මණ්ඩල සේවයේ නිරතව සිටි නිලධාරීන් වූ අතර, ඉන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවට බඳවා ගත් නිලධාරීන් බව නිරීක්ෂණය විය. තවද එක් අයෙකුගේ දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණ වසර 3 ක කාර්යාංශයේ සේවය සම්පූර්ණ කර නොතිබුණි.

**දෙවරක් ගුවන් ටිකට්පත් ගාස්තු ගෙවීමට සිදු වීම**

2023 ජූලි 25 දින දකුණු කොරියාව බලා පිටත්ව යාමට නියමිතව සිටි ශ්‍රමිකයින් 6 දෙනෙකු විසින් එදිනට නියමිත ගුවන්යානයේ ටිකට්පතක් රු. 279,000 කට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් මිලදී ගෙන තිබුණු අතර විදේශ රැකියා ඒජන්සි සමාගමේ මිල

රු.319,522 කට එනම් රු.40,522 ක් වැඩියෙන් ගෙවා මිලදී නොගැනීම හේතුවෙන් ඔවුන්ව එදින කොරියාව බලා පිටත් කර යැවීම අත්හිටුවා තිබුණි. නමුත් ඉන් එක් ශ්‍රමිකයෙකු පිටත් වන මොහොතේ නැවත රු.319,522 ක් ගෙවා එම ගුවන් යානයේම තවත් ආසනයක් වෙන් කර ගැනීමෙන් පසුව ඔහු පමණක් පිටත් කර තිබුණු අතර අනෙකුත් ශ්‍රමිකයින් 5 දෙනා ඉන් මසකට පසුව රු.329,291 බැගින් ගෙවා නැවත වරක් ටිකට්පත් මිලදී ගෙන යැවීමට කටයුතු සලස්වා තිබුණි. ඒ අනුව කාර්යාංශයේ ඉහළ කළමනාකාරීත්වය විසින් මෙම ශ්‍රමිකයින් 6 දෙනා සඳහා ටිකට්පත් වෙනුවෙන් රු.මිලියන 1.7 ක් වැය කිරීම වෙනුවට රු.මිලියන 3.6 ක් වැය කිරීමට කටයුතු සලස්වා තිබුණි.

**සුරක්ෂා නිවාසය නැවත භාර දීමේ ප්‍රමාදය නිසා නිෂ්කාර්ය වියදම් සිදු වීම**

ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ රාජකාරී කටයුතු සඳහා තිදෙනෙකු පමණක් පත් කර තිබූ අතර සුදුසුකම් සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම මත හා 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී එහි සිදු වී තිබූ අවිනය ක්‍රියා හේතුවෙන් සුරක්ෂා නිවාසයේ නවාතැන් ගෙන සිටි රැඳවියන් විසින් කලහකාරී ලෙස හැසිරීම මත සුරක්ෂා නිවාසයට අලාභ හානි සිදුකර තිබී ඇත. 2023 ජනවාරි 31 දින කුලි කාල සීමාව අවසන් වී ඉන් ඉවත් වී තිබූ බැවින් වහාම එයට සිදු වී තිබූ හානි පිළිබඳ පරීක්ෂා කර යථා තත්ත්වයට පත් කර එහි හිමිකරු වෙත නැවත භාරදිය යුතුව තිබුණි. එය සිදු කිරීමට වගකිව යුතු නිලධාරියෙකු සුභසාධන අංශයේ නොසිටීමෙන් අලාභය තක්සේරු කිරීම 2023 මැයි 16 දින දක්වා ප්‍රමාද වී තිබුණි. එලෙස ප්‍රමාද වීම මත ගොඩනැගිල්ල අලුත්වැඩියා කර හිමිකරු වෙත භාර දෙන තෙක් 2023 පෙබරවාරි 01 දින සිට ජූලි 31 දින දක්වා වූ මාස 7 ක් සඳහා කුලී මුදල, ජලබිල්පත්, විදුලි බිල්පත් හා අලාභ හානි සඳහා යන සියලුම වියදම් ලෙස රු.මිලියන 19.13 ක් නිෂ්කාර්යව ගෙවීමට සිදු වී තිබුණි.

**තෑගි වවුචර්පත් හිමිවිය යුතු පාර්ශ්වයන්ට ලබා නොදීම**

ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථම වරට විදේශගත වන ශ්‍රමිකයින්ට ලබා දීමට රු.10,000 ක් වටිනා සතොස තෑගි වවුචර් පත් 14,000 ක් මිලදී ගෙන තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට වවුචර් 46 ක් පමණක් නිකුත් කර තිබුණු අතර 2024 අගෝස්තු 14 දින වන විටත් රු.මිලියන 9.8 ක් වටිනා තෑගි වවුචර් පත් 995 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව වවුචර් පත් මිලදී ගෙන මාස 11 ක් ඉක්මවා ගොස් තිබුණද, රු.මිලියන 128.23 ක් වටිනා තෑගි වවුචර්පත් ඉතිරි වී තිබුණි. මෙම වවුචර් පත් උත්සවයක් පවත්වා බෙදාහැරීමේ කටයුතු ආරම්භ කරන තෙක් ප්‍රමාද කිරීම හේතුවෙන් ගෘහසේවිකාවන් 1,161 කටද, ප්‍රථම වතාවට විදේශගත වූ කාන්තාවන් පෙර විදේශගතව සිටි බවට ව්‍යාජ තොරතුරු භුවා දක්වමින් පුහුණුවෙන් නිදහස් කර තිබූ ගෘහසේවිකාවන් 12,100 කටද

වශයෙන් ගෘහසේවිකාවන් 13,261 කට මෙම රු.10,000 ක තැගි වවුචර් පත අහිමි වී තිබුණි. ඒ අනුව කාර්යාංශය විසින් අනුගමනය කරන ලද අවිධිමත් ක්‍රියාමාර්ග හේතුවෙන් දරන ලද වියදම් වලට අදාළ ප්‍රතිලාභ හිමි විය යුතු පාර්ශවයන් වෙත එම ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

**සේවා පළපුරුද්ද නොමැතිව පුහුණුවෙන් නිදහස් කිරීම**

2022 ජුනි 07 දිනැති කාර්යාංශයේ සභාපතිගේ අංක CH/01/01 දරන ලිපිය අනුව ගෘහස්ථ ක්ෂේත්‍රයේ රැකියා සඳහා පෙර සේවා පළපුරුද්ද පවතින නමුත් ලිඛිත සාක්ෂි මගින් සනාථ කරගත නොහැකි ශ්‍රමිකයින් විදේශගත වීමේදී පෙර සේවා පළපුරුද්ද ඇති බවට සනාථ කර ගෙන පුහුණුවෙන් නිදහස් කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවසන් අනුමැති) වෙත අනුමැතිය ලබා දී තිබුණු අතර, 2023 ජනවාරි 09 දිනැති TR-D/02-01-11 ලිපිය අනුව පළමු වතාවට විදේශගත වන ගෘහසේවකයින් සඳහා දින 28 ක නේවාසික පුහුණුවක් ලබා දිය යුතු අතර ඒ සඳහා අයකරන ගාස්තුව රු.22,410 කි. 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා පුහුණුවෙන් නිදහස් කර විදේශගත කර තිබූ ශ්‍රමිකයින්ගේ පෙර විදේශගත වීම් පිළිබඳව තොරතුරු කාර්යාංශයේ ලියාපදිංචි තොරතුරු පද්ධතිය මගින් විගණනය විසින් ලබා ගත් අතර ඒ තුළ ප්‍රථම වතාවට කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වී තිබූ ගෘහ සේවිකාවන් සංඛ්‍යාව 28,165 ක් බවට තහවුරු විය. ඒ අනුව 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා කාර්යාංශයට රු.මිලියන 631.2 ක් වූ පුහුණු ආදායම් අහිමි වී තිබුණි.

**වෙළඳ කුටි මිලදී ගැනිම**

2022 ඔක්තෝම්බර් 15 හා 16 දෙදින, ගාල්ල සමනළ උයනේදී පැවති වැඩසටහන සඳහා වෙළඳ කුටියක් රු. 170,000 කට කුලී පදනම මත ලබා ගෙන තිබූ අතර, 2023 යාපනය දිස්ත්‍රික් වැඩසටහනේදී එය කුලී ගාස්තුවක්ද මිලදී ගැනීමක්ද යන්න කිසිදු පදනමක් සටහන් නොකර එම ආයතනය විසින්ම කුටියක් රු.500,000 කට ලබා ගෙන තිබුණි. ඒ අනුව 2022 වසරේදී කුටි 30 ක් වෙනුවෙන් රු.මිලියන 5.1 ක් වැය කර තිබූ අතර 2023 වසරේදී කුටි 25 ක් වෙනුවෙන් රු.මිලියන 12.5 ක් වැයකර තිබුණි. ආයතන තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබූ අතර 2023 මැයි 29 දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව මෙම කුටි මිලදී ගැනිම සිදු කර තිබුණි.

## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම

**විදේශීය රැකියාගත කිරීම්**

2022 හා 2023 වර්ෂවලදී පිලිවෙළින් විදේශීය රැකියා ඇබෑර්තු 2,860 ක් හා 2,303 ක් සමාගම වෙත ලැබී තිබුණද එම ඇබෑර්තු වලින් 316 දෙනෙකු හා 663 දෙනෙකු පමණක් රැකියා සඳහා විදේශගත කර තිබුණි. එය ලැබුණු රැකියා ඇබෑර්තුවලින් පිළිවෙලින් සියයට 4 ක් හා සියයට 28.7 ක අඩු ප්‍රමාණයක් පමණක් විය. තවද 2023 වර්ෂයේදී විදේශගත වූ 663 දෙනා අතුරින් 203 ක් බාහිර පාර්ශවයන් මාර්ගයෙන් ශ්‍රමිකයින් විසින් සොයා ගන්නා ලද රැකියා අවස්ථා සඳහා විදේශගත වූ ශ්‍රමිකයින් විය. එය 2023 වර්ෂයේදී විදෙස්ගතවූවන්ගේ සංඛ්‍යාවෙන් සියයට 30 ක් විය. නමුත් 2023 වර්ෂයේදී විදේශ රැකියා ශ්‍රම වෙළඳපොළ ප්‍රවර්ධන කටයුතු සඳහා විදේශ සංචාරයන් වෙනුවෙන් රු.මිලියන 8 ක මුදලක් වෙන් කර තිබුණද, විදේශ සංචාරයන් 6 ක් වෙනුවෙන් රු.මිලියන 12.04 ක් වියදම් කර තිබුණි. ඉන් ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සඳහා රු.මිලියන 0.22 ක් පමණක් වැය කර තිබුණි.

**ඇප තැන්පතු ආපසු නොගෙවීම**

2006 වර්ෂයේදී දකුණු කොරියාවට රැකියා සඳහා පිටත් වන විගමණිකයින්ගෙන් ආපසු ගෙවීමේ පදනම මත අය කරනු ලැබූ එකතුව රු.මිලියන 15.2 ක් වූ ඇප තැන්පතු මුදල් වර්ෂ 15 ක් ගත වී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 4.7 ක ශේෂය තුළ වර්ෂ 5 ත් 10 ත් අතර රු.මිලියන 4.09 ක ශේෂ පැවතුණි.

**ගැටළු සහගත ගෙවීම්**

2023 ජූලි 15 හා 16 දෙදින යාපනය මුටෙව්ලි ක්‍රීඩාංගනයේ පවත්වා තිබූ ජංගම රැකියා වෙළඳ ප්‍රදර්ශනය සඳහා සමාගම විසින් වෙළඳකුටි 05 ක් හා නාම පුවරුවක් මිලදී ගැනීමට අදාළව මිල ගණන් කැඳවීමක් සිදුකර නොතිබුණු නමුත් 2023 ජූලි 08 දින සමාගමේ සභාපතිගේ පෞද්ගලික නමට මිල ගණන් හා ඉන්වොයිස් පත් ඉදිරිපත් කර තිබුණු අතර මිලදී ගත් ආයතනයක් සඳහන් කර නොතිබුණි. ආයතනයේ නම වෙනුවට Glocal Fair නමින් ලිපි ශීර්ෂයක් භාවිතා කර තිබුණු අතර Glocal Fair නමින් වූ බැංකු ගිණුමක් වෙත රු.මිලියන 2.18 ක් ගෙවීම් කර තිබුණි.

**වැඩි මිල ගුවන් ටිකට්පත්**

2006 අංක 25 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශයට පටහැනිව 2023 අගෝස්තු 08 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී දකුණු කොරියාව බලා පිටත් වන ශ්‍රමිකයින්ට අවශ්‍ය ගුවන් ටිකට්පත් 3,767 ක් පුද්ගලික නියෝජිතායතන හරහා මිලදී ගෙන තිබුණි. එම ටිකට්පත් සඳහා රු.මිලියන 122.6 ක් ශ්‍රමිකයින්ගෙන් වැඩියෙන් අයකර ගෙන තිබුණු අතර ඉන් විදේශ රැකියා ඒජන්සිය හා පුද්ගලික නියෝජිතායතන 04 ක් පිළිවෙලින් රු.මිලියන 27.8 ක හා රු.මිලියන 94.8 ක ලාභයක් උපයා ගෙන තිබුණි.

**පුද්ගලික නියෝජිතායතන හරහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම**

2022 ඔක්තෝබර් 26 දිනැති අංක 51/2022 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සමාගම එක් ටිකට්පතක් වෙනුවෙන් සියයට 1 ත් සියයට 7 ත් අතර වූ උපරිම ලාභාන්තිකයක් තබා ගෙන ටිකට්පත් නිකුත් කිරීම කළ යුතුය. එහෙත් 2023 වර්ෂයේදී ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ මිල ගණන් වලට වඩා වැඩි මිල ගණන් යටතේ පුද්ගලික නියෝජිතායතන හරහා ටිකට්පත් මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් සමාගම වෙත පෙර වර්ෂයේ උපයා ගෙන තිබුණු ලාභය සියයට 5 ක සිට සියයට 2.5 ක් දක්වා අඩු වී තිබීම හේතුවෙන් සමාගමට රු.මිලියන 27.1 ක අලාභයක් වී තිබුණි.

# කම්කරු

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණය, කාර්මික සාමය තහවුරු කිරීම සහ විදේශීය රැකියා වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ රට තුළ ඵලදායිත්වය ප්‍රවර්ධනය කිරීම තුළින් දේශීය හා විදේශීය ශ්‍රම බලකාය ආර්ථික සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ. අමාත්‍යාංශයේ කම්කරු අංශයේ කාර්යභාරයන් පහත පරිදිවේ.

**කාර්යභාරයන්**

රැකියා නියුක්තිය සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලාංකා ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම

සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීම කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම

වෘත්තීය සමිති ලියාපදිංචිය සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට දායක කර ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවර හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම

ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

මෙම කාර්යභාරයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 02 ක් හා අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන 07 ක් ක්‍රියාත්මකව පැවතුණි. එම ආයතන විගණනයේදී අනාවරණය වූ කරුණු පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### කම්කරු විදේශ රැකියා අමාත්‍යාංශය

**වන්දි මුදල් නොගෙවීම**

රැකියාවේ යෙදී සිටියදී අගතියටපත් පාර්ශවයන් සඳහා හිමිවිය යුතු බවට උසාවියෙන් තීරණය කරන ලද නඩු 54 කට අදාළ රු.මිලියන 12.34 ක වන්දි මුදල් 2023 දෙසැම්බර් 31 දිනටද අදාල නියෝග අනුව සේවායෝජකයින් විසින් ගෙවා නොතිබුණි. මේ අතර

වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්මවූ නඩු 11 ක්ද, වසර 5 – 10 අතර නඩු 22 ක් හා වසර 1 – 4 අතර නඩු 11 ක්ද විය.

## සේවක අර්ථ සාධක අරමුදල- කම්කරු අංශය

**කේවල ගිණුම්වලට බැර නොවූ මුදල් ශේෂ පැවතීම**

2023 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජික ගිණුම් ශේෂයෙන් රු.මිලියන 95,625ක් විවිධ හේතු මත එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමෙන් තොරව පැවතුණි .

සාමාජික අරමුදල තුල ඇති කම්කරු කොමසාරිස් ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකර ශ්‍රීලංකා මහ බැංකුවේ රඳවාගෙන ඇති රු.මිලියන 12,237ක්, නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තෙක් කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 440ක් හා සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙනයනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 78,797ක ශේෂය අදාළ සාමාජිකයන් වෙත විභජනය කර නොතිබුණි. විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,009 ක් ද, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 2,590 ක් ද, ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු.මිලියන 552 ක් ද සාමාජික අරමුදල යටතේ තවදුරටත් නිරවුල් කිරීමට පැවතුණි.

**සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා මිළදී ගත් උපකරණ නිෂ්කාර්යව පැවතීම**

ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 27.89ක වටිනාකමින් යුත් පරිගණක 60ක් , කැමරා 60 ක් සහ මුද්‍රණ යන්ත්‍ර 60 ක් 2022 හා 2023 වර්ෂවලදී මිලදී ගෙන තිබුණි. 2024 මාර්තු 14 දින ගබඩාව භෞතිකව පරීක්ෂාවේදී පරිගණක 51 ක් කැමරා 53 ක් හා මුද්‍රණ යන්ත්‍ර 50 ක් බෙදාහැරීමකින් තොරව ඌන උපයෝජිතව පැවතීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

**ආයෝජන මත ප්‍රතිලාභ නොලැබීම**

අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 15ක සිදුකර තිබූ රු. මිලියන 17,401.39 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2023 වර්ෂයේදී ද, ලැයිස්තුගත සමාගම් 9 ක සිදුකර තිබූ රු. මිලියන 4,390.49 ක්වූ සමාන්‍ය කොටස්වල ආයෝජනයන් සඳහා 2019 වර්ෂයේ සිටද අරමුදලට ප්‍රතිලාභ ලැබී නොතිබුණි.
ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5,000 ක් 2013 වර්ෂයේදී පුද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ

අතර එම සමාගම යටතේ ඉදිකිරීමට නියමිත වූ කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටල් සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 27 වන විට අවසන් කළ යුතුව පැවතුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි බව අදාළ සමාගම විසින් දන්වා තිබුණි. මේ නිසා යථෝක්ත ආයෝජනය සිදු කර වර්ෂ 11ක් ගත වුවද කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි.

**හිඟ දායක හා අධිභාර මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීම්**

2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 12,755.09 ක් අයකර ගැනීම සඳහා අරමුදල විසින් බාහිර ආයතනවලට එරෙහිව පවරා තිබූ මුළු නඩු සංඛ්‍යාව 14,096 ක් විය, බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව එකතුව රු.මිලියන 201.3ක් ඉල්ලුම්කර අධිකරණයේ පවරා ඇති මුළු නඩු සංඛ්‍යාව 62 ක්ද විය. තවද, වර්ෂය අවසානය ට එකතුවරු.මිලියන 2,420ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 4,381ක් අක්‍රීය තත්වයේද එකතුව රු. මිලියන 1,232 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 2,138 ක් විවෘත වරෙන්තු තත්ත්වයේද පැවතුනි.

**ලියාපදිංචි නොවූ සේවායෝජකයින්**

අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවායොජකයින් සංඛ්‍යාව 2023 දෙසැම්බර් 31 දිනට 28,994ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 401.25ක් විය. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු එහෙත් ලියාපදිංචි වීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබිණි.

## සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලය

**අරමුදලට ලද දායක මුදල් සාමාජික ගිණුම්වලට බැර නොකිරීම**

2024 අප්‍රේල් 01 දින වනවිට ද 1981 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජක ආයතන 4,526 ක් විසින් සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය වෙත බැර කරන ලද එකතුව රු.මිලියන 516.79 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි. මේ හේතුවෙන් සාමාජික අරමුදල් ශේෂය හා කේවල ගිණුම් ශේෂ එකතුව අතර නොසැසඳීමක් මෙන්ම සාමාජිකයන්ට තම දායක මුදල් ආපසු ලබා ගැනීමේ දී අවාසිදායක තත්ත්වයක් පවතින

කාමිකරු

බව ද නිරීක්ෂණය විය. ඉහත ශේෂය තුල ඇතුලත් වසර 09 ත් 42 ත් අතර කාලයක සිට පැවත එන ශේෂය රු.මිලියන 20 ක් විය.

**තොරතුරු පද්ධතිය ස්ථාපනය ප්‍රමාදවීම**

සේවායෝජක හා සාමාජික ගිණුම්, සාමාජික අරමුදල වඩාත් නිවැරදිව හා විශ්වාසනීයව පවත්වාගෙන යාම, සාමාජිකයින් හා සේවායෝජකයින් සඳහා මාර්ගගත සන්නිවේදන ක්‍රම මගින් පද්ධතිය හා සම්බන්ධ වීමට පහසුකම් සැලැස්වීමේ අරමුණින් තොරතුරු පද්ධතියක් ස්ථාපනය සඳහා මුදල් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය හා මණ්ඩලය අතර 2016 වර්ෂයේ දී අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් මණ්ඩලය විසින් දෘඩාංග මිලදී ගැනීම හා පුහුණු කටයුතු සඳහා රු.මිලියන 183.28 ක් වැයකර තිබුණද එදින දක්වාම ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

**හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ**

2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල පවතින වසර 20 කට වැඩි ශේෂවල එකතුව රු.මිලියන 3.83 ක් වූ අතර අදාළ සාමාජිකයින් හඳුනාගෙන මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ.**

2024 මාර්තු 31 දිනට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස ප්‍රතිලාභීන් 1,240 කට රු.මිලියන 23.04 ගෙවිය යුතුව පැවතුණි. මෙම ශේෂය තුල වසර 07 ත් 28 ත් අතර කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 826 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 9.9 ක් වී තිබුණි.

**ආයෝජන ප්‍රතිලාභ**

2023 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැව්ලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් අයවිය යුතු හිඟ පොලී මුදල රු.මිලියන 26.29 ක් වී තිබුණි.

**සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව ගිණුම් පවත්වාගෙන යාම**

2023 දෙසැම්බර් 31 දිනට සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව පවත්වාගෙන යන ගිණුම් 7,566 කට අදාලව රු.මිලියන 41.22 ක මුදලක් පැවතුණි. 2015 වර්ෂය දක්වා හඳුනාගත නොහැකි එම සාමාජික ගිණුම් පරිගණක පද්ධතියේ අගුළු දැමීමට ක්‍රියාකර තිබූ අතර 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් හිමිකරුවන් හඳුනාගෙන සාමාජික ගිණුම්වලට බැර කර නොතිබුණි.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් යන දැක්මෙන් යුතුව ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී ඉහත කාර්යභාරයන් ඉටු කිරීම සඳහා එකතුව රු.මිලියන 418,720ක් ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 416,333ක් උපයෝජනය කරමින් විශ්‍රාමිකයින් 704,795 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප්ද, විශ්‍රාමිකයින් 55,091 දෙනෙකු සඳහා පාරිතෝෂික ප්‍රදානයන්ද ගෙවා තිබුණි.

ඉහත කාර්ය හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

**රජයේ වැටුප් ලබන විශ්‍රාමිකයින් වෙත ජීවන වියදම් දීමනාව ගෙවීම**

2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාල සීමාව තුලදී විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව හිමි නොවුණද, එසේ ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුප් ලබන විශ්‍රාමිකයින් 269 දෙනෙකු වෙත ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් රු. මිලියන 94.5 ක් වැඩිපුර ගෙවා තිබූ බව කලුතර, දඹුල්ල, මැදුම්බර, හංවැල්ල, බමුණාකොටුව, මාතර, මාවනැල්ල, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන පරීක්ෂාවලදී හා දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**හඳුනානොගත් ලැබීම්**

2022 ජුනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවී වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එසේ ප්‍රේෂණය කරනු ලැබූ රු.මිලියන 47.2 ක දායක මුදල් හඳුනානොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**අන්තර් දීමනාව වැඩිපුර ගෙවීම**

2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් හංවැල්ල, මාතර, කෑගල්ල, අකුරණ, යටිනුවර, බිංගිරිය, මාවනැල්ල, දිවුලපිටිය, කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන පරීක්ෂාවලදී හා දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය මඟින් හඳුනාගත් විශ්‍රාමිකයින් 47 දෙනෙකු සඳහා රු.මිලියන 13.7 ක් අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.

# ක්‍රීඩා

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහි කිරීම හා විනයගරුක, ක්‍රීඩාශීලී සමාජයක් ඇති කිරීම තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායකවීම ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන 11 ක්, ක්‍රීඩා අරමුදලක් හා ක්‍රීඩා සංගම් 67 මඟින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කළ යුතුව තිබුණි.

**කාර්යභාරයන්**

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණය ප්‍රවර්ධනය කිරීම

ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම.

ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම.

ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේ තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම

ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමණාකරණය කිරිම, ක්‍රීඩා සමිති සංවිධානය සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම.

තරුණ පරපුරේ අභිලාශයන් ඉටුවන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමට පියවර ගැනීම සහ ඔවුනට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.


තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම

රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොට ගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු.

තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇති වන හා ඔවුනට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකි

වන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම.

2023 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 10,250 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර 2023 වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 6,146 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු. මිලියන 4,104 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තරය රූපසටහනෙහි දැක්වේ.




| | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන රු. මිලියන | 8,032 | 2,218 | 10,250 |
| වියදම | 4,960 | 1,186 | 6,146 |
| ඉතිරිය | 3,072 | 1,032 | 4,104 |

රූප සටහන් අංක 2.46 : ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති ප්‍රතිපාදන හා වියදම
මූලාශ්‍රය : 2023 මූල්‍ය ප්‍රකාශන

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

**ජාත්‍යන්තර ජයග්‍රහණ**

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රීඩකයින් ප්‍රධාන ජාත්‍යන්තර තරගාවලි 19 කට සහභාගී වී ජයග්‍රහණ ලෙස රන් 11 ක් රිදී 15 ක් සහ ලෝකඩ 22 ක් වශයෙන් පදක්කම් 48 ක් ලබා ගෙන තිබුණි. තවද ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ එංගලන්ත සංචාරය (T20) සහ ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ එංගලන්ත සංචාරය (ODI) යන තරඟාවලින්ට සහභාගී වී ශූරතාව ලබා ගෙන තිබුණි.

### ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

**දියගම ක්‍රීඩා සංකීර්ණය සංවර්ධනය කිරීම**

අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට අදාලව 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, ඉන් රු.මිලියන 606 ක් පමණක් වැයකර තිබුණි. එයින් රු. මිලියන 487

ක් වැය කර ඉදිකර තිබූ මීටර් 400 කෘත්‍රිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වී පැවතීම හා මන්තීරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබීම හේතුවෙන් එම ධාවන පථයේ තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩකයන් අපහසුතාවට පත්වී තිබුණි. එසේම විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 30 ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදී ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණු අතර රු. මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වී තිබියදී ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම නොකොට, එම ගිවිසුම අවලංගු කර තිබුණි. තවද, මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර ගැනීම සඳහා, ගිවිසුමක් නොමැතිව රු. මිලියන 5.4 ක අත්තිකාරම් මුදලක් රජයේ ඉදි කිරීමේ ආයතනයක් වෙත 2019 වර්ෂය තුල ගෙවා තිබුණද, අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබුණු නමුත් ගෙවූ අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

**කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම**

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය මාස 06 ක් තුල නිම කිරීම සඳහා රු.මිලියන 12.23 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට 2018 මාර්තු 28 දිනැතිව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණු නමුත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. තවද අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් කාලසීමාව මාස 20 කින් දීර්ඝ කිරීම, අමතර වැඩ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කටයුතු කිරීම, බේරුම්කරණ ක්‍රියාවලියකට කඩිනමින් යොමු නොවීම සහ මිල විචලනයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු විසින් එම තීරණ ලබා දීමට වසරකට වඩා වැඩි කාලයක් ගත කිරීම ආදී කරුණු හේතුවෙන්, එකඟ වූ වටිනාකමට වඩා රු. මිලියන 4.23 ක බදු සහිත වටිනාකමක් අමතරව ගෙවා තිබුණු අතර එම ක්‍රීඩා පිටි භාවිතා කළ හැකි තත්ත්වයට මේ වෙන තෙක් පත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

2013 සිට 2020 දක්වා වූ වර්ෂවල ආරම්භ කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 557.03ක් වූ මොණරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය ඇතුලු ඇස්තමේන්තු වටිනාකම් එකතුව රු. මිලියන 1,649.83 ක් වූ ව්‍යාපෘති 09 ක් නිම නොකොට අත්හැර දමා තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වැය කළ මුළු මුදල රු. මිලියන 606.13 ක් වී තිබුණි.

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,024.86 ක් වූ වැඩ නිමකළ යුතු ව්‍යාපෘති 07 ක වැඩ 2023 වර්ෂය අවසන් දින වන විටත් නිම කර නොතිබුණු අතර, එයින් ව්‍යාපෘති 05ක ප්‍රමාද කාලය මාස 19 සිට මාස 70 දක්වා වූ කාල පරාසයන් තුළ විහිදී පැවතුණි. ඉතිරි ව්‍යාපෘති 02 කට අදාළව ව්‍යාපෘති නිම කළ යුතු දිනයන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘති වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 802.52 ක් වැයකර තිබුණි.

**වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්**

2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) අනුව ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරි සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව 2023 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංගම් 72 ක් ලියාපදිංචි කර තිබූ නමුත් එයින් දැනට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින ක්‍රීඩා සංගම් 67 කින් සංගම් 63 ක්ම එලෙස ක්‍රියාකාරි සැලසුම් ඉදිරිපත් කර නොතිබුණි.

**ලෝක ශූරතා නෙට්බෝල් තරඟාවලිය**

2023 වර්ෂය තුලදී දකුණු අප්‍රිකාවේ පැවැත්වූ ලෝක ශූරතා නෙට්බෝල් තරඟාවලිය වෙනුවෙන් සහභාගී වන්නන් සඳහා අනුමැතීන් ලබාදීම වෙනුවෙන් නිසි කාලරාමු සහිත ක්‍රමවේදයක් හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. තවද මෙම තරඟාවලිය සඳහා සහභාගිවන්නන් වෙනුවෙන් ගුවන් ටිකට්පත් මිළදී ගැනීම සඳහා රු.මිලියන 8.78 ක මුදලක් 2023 වර්ෂය තුළ ගෙවා තිබුණ ද ගැනුම්කාර සමාගම විසින් අවස්ථා ගණනකදී පළමු මිල කැඳවීමේදී ඉහල මිල ගණන්ද, දෙවන මිල කැඳවීමේදී අවම මිල ගණන්ද ඉදිරිපත් කර ඇණවුම් ලබාගෙන තිබුණු බැවින් මෙම ටිකට්පත් මිළදී ගැනීමේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් තොර වූ බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙල**

2023 වර්ෂයේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙල පැවැත්වීම සම්බන්ධයෙන් නිසි පරිදි සැලසුම් නොකිරීම, ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ටිකට්පත් ප්‍රසම්පාදනය විනිවිදභාවයකින් සිදු නොකිරීම මත ගුවන් ටිකට්පත් හා වීසා නිසි කලට වේලාවට ආර්ථික වශයෙන් එලදායි ලෙස මිලදී ගැනීමට නොහැකි වී තිබීමෙන් දෙපාර්තමේන්තුවට රු. මිලියන 13.81 ක පාඩුවක් සිදු වී තිබුණි. මේ හේතුවෙන් ජාතික ඔලිම්පික් කමිටුව මගින් ටිකට්පත් ගාස්තුව ලෙස අයකර ගතයුතුව තිබූ රු.මිලියන 7.03 ක මුදලද දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. තවද මෙම ක්‍රීඩා උළෙල සඳහා නිසි කලට ක්‍රීඩකයන් හා නිළධාරීන්හට ස්ථානගත වීමට නොහැකිවීම තුළින් ශ්‍රී ලංකාවට අපේක්ෂිත ජයග්‍රහණ අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

## ක්‍රීඩා වෛද්‍ය ආයතනය

**මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපනය කිරීම**

2021 නොවැම්බර් 16 දින පෞද්ගලික ආයතනයක් වෙතින් රු. මිලියන 248.59 ක මුදලකට මානව කාර්යසාධන විද්‍යාගාරය සඳහා උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම, පුහුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා එම සමාගම හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. අදාළ සමාගම විසින් 2023 ජනවාරි 23 හා 24 දිනයන්හි උපකරණ ස්ථාපනය පමණක් සිදු කර තිබුණු නමුත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. සැපයුම්කරු විසින් පළමු හා දෙවන වර්ෂයේ සේවා සැපයීම සිදුකර නොතිබුණු අතර, ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් ඒ පිළිබඳව සැපයුම්කරු සමග සාකච්ඡා කර සේවාවන් ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු සිදුකර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුව ගිවිසුම පරිදි 2021 නොවැම්බර් 16 දින සිට සති අටක කාලසීමාව තුළ උපකරණ ස්ථාපිත කිරීම් සිදුකල යුතු වුවද සැපයුම්කරු මාස 13 ක ප්‍රමාදයකින් පසුව උපකරණ ස්ථාපනය කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි 26.1 අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් එක් සතියකට සියයට 1 බැගින් උපරිම සියයට 10ක් එනම් රු. මිලියන 24.86ක් අය කළ හැකි වුවද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමටද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

**වත්කම් කළමනාකරණය**

ක්‍රීඩා වෛද්‍ය ආයතනය සතුව විකිරණ ශිල්පියෙකු නොමැතිව, මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම මත පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් අනුමත නොකිරීම හේතුවෙන් රු. මිලියන 3.23 ක Mobile X Ray යන්ත්‍රයක්, රු. මිලියන 1.11 ක Radiation Protection Accessories Set උපකරණයක්, රු. මිලියන 4.31ක X කිරණ මේස සහ X- Ray Digital Film Imaging System එකක් ඇතුළත්ව සහ රු.මිලියන 1.63 ක් වැය කර සකස් කරන ලද X කිරණ කාමරය , මිලදී ගත් දින සිට පිළිවෙලින් වර්ෂ 07ක්, වර්ෂ 06 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් උපයෝජනය නොකොට නිශ්කාර්යව පැවතුණි.

## ජාතික ක්‍රීඩා අරමුදල

**ප්‍රසංගය ආදායම් ලබා නොදීම**

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ සේවක සුබසාධක සංගමය විසින් ජාතික ක්‍රීඩා අරමුදලට රු.මිලියන 5 ක ආධාර එකතු කිරීමේ අරමුණින් 2023 වර්ෂයේදී සංගීත ප්‍රසංගයක් පවත්වා තිබුණද ප්‍රසංගයෙන් ලද ආදායම් කිසිවක් අරමුදල වෙත ලැබී නොතිබුණි.

**අරමුණුවලට පරිබාහිර ගෙවීම්**

නීතිපති දෙපාර්තමේන්තුව විසින් නීතිඥ සහාය ලබාදෙන බව දක්වා සිටියදීත් 2023 වර්ෂයේදී අමාත්‍යවරයා විසින් හා අමාත්‍යවරයාට

එරෙහිව පවරන ලද නඩු 06 කට අදාළව එකතුව රු.මිලියන 8.25ක නීතිඥ ගාස්තු ක්‍රීඩා අරමුදලේ අරමුණු වලින් පරිබාහිර කටයුතු සඳහා අරමුදල විසින් ගෙවා තිබුණි.

**ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති**

ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය තුල රු.මිලියන 104.67 ක් විවිධ පාර්ශවයන් වෙත ලබා දී තිබුණ අතර ඒ සඳහා ව්‍යාපෘති යෝජනා විධිමත් පරිදි අනුමත කරගෙන ඒ මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා දී, වැඩ අවසන් අදියර අනුව වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට ඇස්තමේන්තුගත කර තිබූ මුළු මුදලම ව්‍යාපෘතිය වෙත නිදහස් කර තිබුණි. ඉහත පරිදි ලබා දී තිබුණු මුදලට අදාළව සිදු කළ යුතු කාර්යයන් සඳහා නිශ්චිත කාල රාමුවක් හඳුන්වාදීමෙන් එම කාලය තුළ අදාල ඉදිකිරීම් නිමකල බවට තහවුරුවක් ලබාගෙන ද නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 90.15ක වටිනාකමින් ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 07 ක භෞතික ප්‍රගතිය සියයට 0 සිට 60 දක්වා පරාසයක පැවති අතර, ඉතිරි ව්‍යාපෘති සාර්ථකව නිමකළ බවට ඉංජිනේරුවරයකු විසින් සහතිකයක් ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් ලබාදී තිබුණු මුදල් උක්ත ව්‍යාපෘතිය සඳහා යොදවා ගත්තේ ද යන්න හා එකී ව්‍යාපෘති වෙත නිදහස් කර තිබුණු මුදලට සරිලන ප්‍රතිලාභ ලබාගෙන තිබුණේද යන්න තහවුරු කිරීමට නොහැකි විය.

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

**ක්‍රිකට් සමාජ හා සංගම් වෙත මුදල් ලබාදීම**

2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිත වී තිබූ 19 න් පහළ ලෝක කුසලානය සඳහා ක්‍රීඩාංගණ සංවර්ධනය වෙනුවෙන් ක්‍රිකට් සංගම් 04 ක් වෙත රු.මිලියන 460.73 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. අදාළ කාර්යයන් 2024 ජනවාරි 19 දිනට පෙර නිමකළ යුතු වුව ද එකී කිසිදු ව්‍යාපෘතියක් අදාළ කාලය තුල දී නිමකර නොතිබුණි. අදාළ කාර්යයන් ඉටු නොකිරීම නිසා උක්ත මුදලින් රු.මිලියන 195.10 ක් අදාළ ක්‍රිකට් සංගම් විසින් අත රඳවා ගැනීමෙන් පසු ආපසු ලබාදීම නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සිදු වූ මූල්‍ය අලාභය ආසන්න වශයෙන් රු.මිලියන 4.8 කි. 2024 මැයි 31 දින වන විටත් රු.මිලියන 79.73 ක මුදලක් අදාල කාර්යයන් සඳහා යොදවා නොගෙන ඉහත ක්‍රිකට් සංගම් 04 විසින් අත රඳවාගෙන තිබුණි.

**යෝජිත මහනුවර උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉදිකිරීමට යෝජිත මහනුවර උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා මහනුවර ප්‍රදේශයේ අක්කර 1 රූඩ් 3 පර්චස් 20.2 ක ඉඩමක් වර්ෂ 30 ක බදු පදනම මත රු.මිලියන 26.5 කට 2017 අප්‍රේල් 20 දින බදු ගෙන තිබුණි. මෙම ඉඩමෙහි පදිංචිව සිටි පුද්ගලයකු ඉවත් කිරීම සඳහා රු.මිලියන

ක්‍රීඩා

0.5 ක් 2018 ජනවාරි 25 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් බදුකරු වෙත ගෙවා තිබියදී සහ ඉඩමේ පිඹුරු පත් අතර නොගැලපීමක් පවතින තත්ත්වයක් යටතේදී භුක්තිය නිරවුල් නොවූ ඉඩමක් සඳහා බදු ගිවිසුමක් ඇති කර ගැනීමට නීතිඥවරයෙකු වෙත 2017 සැප්තැම්බර් 06 දින රු.මිලියන 0.53 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. එමෙන්ම 2021 වර්ෂයෙන් පසුව මෙම ව්‍යාපෘතියේ කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබූ අතර ඉඩම බදු ගෙන වර්ෂ 06 ක් ගතව තිබියදීත් ඉදිකිරීම් මූලික අදියරේ පැවතුණි.

**සම්බන්ධීකාරක තනතුරු වෙනුවෙන් දීමනා ගෙවීම**

විධායක මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා විවිධ මට්ටමේ පුද්ගලයින් 44 දෙනෙකු සම්බන්ධීකාරක තනතුරු වෙනුවෙන් පළාත් මට්ටමින් බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත මාසික දීමනා, උත්සව හා දුෂ්කර දීමනා ලෙසත් ප්‍රවාහන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙසත් රු.මිලියන 65.98 ක් ගෙවා තිබුණි. එසේ වුවද ඉහත සම්බන්ධීකාරකවරුන් වෙත දෛනිකව ඉටුකල යුතු කාර්යයන් හඳුනාගෙන පැවරීම් කිරීම් වෙනුවට ඔවුන් වෙත ඉතා කෙටි කාලයක් තුළ ඉටුකල යුතු එක් කාර්යයක් හෝ කාර්යයන් 02 ක් පමණක් පවරා තිබීමෙන් ද ඔවුන් දරන නිත්‍ය රාජකාරි තනතුරු පිළිබඳව සොයා බැලීමකින් තොරව, ඉහත පුද්ගලයින් පත්කර ගෙන තිබීමෙන්ද ඔවුන් වෙත ගෙවා තිබූ මුදලට සරිලන සේවාවක් ලබා ගත්තේද යන්න විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.

**19 න් පහළ ලෝක කුසලාන තරඟාවලියේ සත්කාරකත්වය අහිමිවීම.**

2024 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබූ 19 න් පහළ ලෝක කුසලාන තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට අහිමිවීම නිසා ICC Business Corporation FZLLC සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එළඹ තිබූ 2023 ඔක්තෝබර් 13 දිනැති ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබීමට තිබූ ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 2.46 කට සමාන රු. මිලියන 787 ක් ක්‍රිකට් ආයතනයට අහිමිවී තිබුණි. එසේම, ලෝක කුසලානය පැවැත්වීමට නියමිත කාලය තුළ සංචාරක නිකේතන වල වෙන්කරවා ගෙන තිබූ කාමර 700 ක් පමණ වෙනුවෙන් ලද හැකිව තිබූ විදේශ විනිමය ආදායම සහ ලද හැකිව තිබූ සංචාරක ප්‍රතිලාභද රටට අහිමිවී තිබුණි.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**ප්‍රාග්ධන ව්‍යාපෘති ඉටුනොකිරීම** 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව රු. මිලියන 398 ක මූලික ඇස්තමේන්තුවක් මත ප්‍රාග්ධන ව්‍යාපෘති 10 ක් ඉටුකිරීම සඳහා සැලසුම් කර තිබුණද ප්‍රවර්තන වර්ෂය තුල රු. මිලියන 26.29 ක් වැය කර ඉදිකර තිබුණේ එක් ව්‍යාපෘතියක් පමණි.

## ජාතික යොවුන් සේනාංකය

**ක්‍රීඩක සංචිතයක් තෝරාගැනීම** ක්‍රීඩාවන් සඳහා දක්ෂතා අනුව හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 750 ක සංචිතයක් තෝරාගෙන එම සංචිතයෙන් 2024 ඔලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය හා ජයග්‍රහණ ලබා ගැනීම සහ 2025 වර්ෂයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 150 ක් රැකියාගත කිරීමට අපේක්ෂාවෙන් 2022 වර්ෂයේදී ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු. මිලියන 17.5 ක් ලබා දී තිබුණු නමුත්, 2023 වර්ෂය අවසන් වන විටත් එම කටයුත්ත සිදුකර නොතිබුණි. එසේ වුවද, ඒ වෙනුවෙන් රු. මිලියන 7.5 ක් වියදම් කර තිබුණු අතර ඉතිරි මුදල වන රු. මිලියන 10 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

**තනතුරු පුරප්පාඩු** සේනාංකයේ ප්‍රධාන කාර්යයන් වූ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීමය අධ්‍යාපනය කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානාධිපති සහ උපදේශක තනතුරු 137ක් දිගින් දිගටම පුරප්පාඩු වී පැවතීම සේනාංකයේ අරමුණු කරා ළඟා වීම හා පාඨමාලාවල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම කෙරෙහි දැඩිව බලපා තිබුණි.

## ජාතික තරුණ සේවා සභාව

**ආදායම් ලබා නොගැනීම** අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින නෙළුම් කුළුණ පරිශ්‍රයේදී පැවැත්වුණු 31st Night Youth Celebration සංගීතමය වැඩසටහනට සභාව විසින් රු. මිලියන 10.29 ක් වැය කර තිබුණි. එම වැඩසටහන පැවැත්වීමෙන් ලද රු.මිලියන 6.86ක ටිකට්පත් ආදායම සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**ගොවිපොළ පුහුණු පාඨමාලා නොපැවැත්වීම** 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(උ) හා 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීම ගොවිපොළවල් ආරම්භ කිරීමේ අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 09ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

**අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොමැති වැඩසටහන්** අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොමැතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි දේශගුණික විපර්යාස මැඩලීම සම්බන්ධයෙන් තාරුණ්‍යයේ දායකත්වය ලබාදීම මැයෙන් වැඩසටහනක් පෞද්ගලික හෝටලයක පවත්වා රු. මිලියන 1.2 වියදම් කර තිබුණි.

**ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම**

34 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 9.7 ක් වටිනා ආහාර, වතුර බෝතල් හා ටී-ෂර්ට් මිලදී ගැනීමේදී තරඟකාරි මිල කැඳවීමකින් තොරව මිල කමිටුවක් මගින් එය සිදුකර තිබුණි. තවද මි.ලි.500 පානීය ජල බෝතලයක් රු.70 බැගින් මිලදී ගෙන තිබුණු අතර එම බෝතලයක මිල රු.30 ක් වන බව සනාථ වූ බැවින් එමගින් රු.මිලියන 0.82 ක අවිධිමත් ගෙවීමක් සිදුකර තිබුණි.

**නව නිර්මාණ එළිදැක්වීම**

යෞවන සමාජවල තරුණ තරුණියන්ගේ දායකත්වයෙන් නව නිර්මාණ එළිදැක්වීම සභාවේ එක් අරමුණක් වුවද, ඊට පටහැනිව නළු නිළියන් සම්බන්ධ කොට කිණිහිරියා මල ටෙලිනාට්‍ය නිෂ්පාදනය කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 4.8 ක් දරා තිබූ අතර, මේ දක්වා එම ටෙලි නාට්‍ය කටයුතු ද අවසන් කර නොතිබුණි.

**ඇඟිලි සළකුණු යන්ත්‍ර ක්‍රියාත්මක නොවීම**

සභාව විසින් 2023 හා පූර්ව වර්ෂවල රු.මිලියන 4.7 ක් වැයකර ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍ර මිලදීගෙන තිබුණද, එම යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාත්මක වී නොතිබීමෙන් ඌණ උපයෝජිතව පැවතුණි.

## 2022 ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ T-20 ලෝක කුසලානය (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය ආශ්‍රිත විශේෂ විගණන වාර්තාව

**තරඟාවලිය නැරඹීමේ වියදම්**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව නියෝජනය කරන නිලතල දරන්නන් (Office Bearers) 07 දෙනෙකු ඇතුළු විධායක කමිටු සාමාජිකයින් 14දෙනෙකු ඕස්ට්‍රේලියාවේ පැවති තරඟාවලිය නැරඹීම සඳහා ගොස් සිටි බවට අනාවරණය වූ අතර ඔවුන් සඳහා ගුවන් ටිකට්පත්, වීසා ගාස්තු, ගමන් රක්ෂණ, දීමනා හා තරඟාවලි නැරඹීමේ ටිකට්පත් ලෙස රු.මිලියන 68.24 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. මෙයින් විධායක කමිටු සමාජිකයින් 3 දෙනෙකු රු. මිලියන 2.65ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ආපසු ගෙවා තිබුණි.

**මාධ්‍යවේදීන් සඳහා අනුග්‍රහය ලබා දීම**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම්වරයා විසින් තෝරාගත් මාධ්‍ය ආයතන හතරක් අමතන ලද 2022 සැප්තැම්බර් 30 දිනැති ලිපිය මගින් විධායක කමිටුව ගත් තීරණය අනුව එක් මාධ්‍යවේදියෙකුට ඕස්ට්‍රේලියාවට යාම ඊම සඳහා ගුවන් ටිකට්පත්ද එ.ජ.ඩොලර් 1,500ක දීමනාවක්ද ලබා දෙන බවට දන්වා යවා තිබුණි. 2022 සැප්තැම්බර් 23 දිනැති 12වන විධායක කමිටු රැස්වීමේදී මාධ්‍යවේදීන්

සිව්දෙනා සඳහා අනුග්‍රහය ලබා දෙන බවට විධායක කමිටු අනුමැතිය ලබා දුන්නද එම අනුග්‍රහයන් මොනවාද යන්න තීරණය කර තිබූ බව හෝ ගෙවන වටිනාකම් සඳහා විධායක කමිටු අනුමැතිය ලබාගෙන තිබූ බවට නිරීක්ෂණය නොවිය.

**වීසා ඉල්ලීම් ලිපි නිකුත් කිරීම**

විධායක කමිටු සාමාජිකයින් 11 දෙනෙකුට ද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිගේ පවුලේ ඥාතීන් හා හිතවතුන් 21 දෙනෙකුටද, උප සභාපතිගේ හිතවතුන් 02 දෙනෙකුටද, විධායක කමිටු සාමාජිකයින් 8 කගේ බිරින්දෑවරුන්/පවුලේ සාමාජිකයන් 9 කටද , ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සම්බන්ධ හා වෙනත් පුද්ගලයින් 11 දෙනෙකුට හා ඔවුන්ගේ බිරින්දෑවරුන් දෙදෙනෙක් වෙනුවෙන් වීසා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත වීසා ඉල්ලීම් ලිපි නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය

**වීසා ලබාගෙන ගොස් ආපසු ලංකාවට නොපැමිණීම**

වීසා නිකුත් කිරීම සඳහා ලිපි නිකුත් කල අය අතරින් එක් පුද්ගලයෙකු T-20 තරඟාවලිය නැරඹීම සඳහා වීසා ලබාගෙන 2022 නොවැම්බර් 03 දින ඕස්ට්‍රේලියාව බලා පිටත් වුවත් ඔහු 2023 සැප්තැම්බර් 11 දින වන විටත් ආපසු ලංකාවට පැමිණ නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ගුවන් ටිකට්පත් මිලදී ගැනීමේ වියදම්**

ඒ අනුව ඕස්ට්‍රේලියාවට යාම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුවේ නිලතල දරන්නන් 07 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 14.27ක්, විධායක කමිටු සාමාජිකයන් 07 දෙනෙකු සඳහා රු.මිලියන 8.40ක්, නිළධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 6.03ක්, අතිරේක ක්‍රීඩකයින් 05ක් වෙනුවෙන් රු. මිලියන 14.48ක්, සහය කාර්යය මණ්ඩලයේ දෙදෙනෙකු සඳහා රු. මිලියන 4.33ක් හා මාධ්‍යවේදීන් 04ක් සඳහා රු. මිලියන 3.33ක් ද බැගින් 29 දෙනෙකු සඳහා රු. මිලියන 50.85ක් ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

**නිළධාරීන් දෙදෙනකු විසින් ගුවන් ටිකට්පත් මිලදී ගැනීම**

2022 T-20 ලෝක කුසලාන තරඟාවලිය පැවති අතරතුර 29 දෙනෙකු ඕස්ට්‍රේලියාවට යාම සඳහා අවස්ථා 29 කදී ගුවන් ටිකට්පත් මිලදී ගෙන තිබූ අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති, ලේකම්, ප්‍රධාන විධායක නිලධාරී, අතිරේක ක්‍රීඩකයන්, සහාය කාර්ය මණ්ඩල හා මාධ්‍යවේදීන් ඇතුළු 12 ගේ රු.මිලියන 26.45ක් වටිනා ටිකට්පත් මිලදී ගැනීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පරිපාලන කළමණාකරු විසින්ද, ප්‍රධාන

ශ්‍රී

මෙහෙයුම් නිලධාරී හා අනෙකුත් විධායක කමිටු සාමාජිකයින් 12 දෙනෙකු සඳහා රු.මිලියන 16.25ක් වටිනා ටිකට්පත් මිලදී ගැනීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරී විසින්ද සිදු කර තිබූ අතර මෙලෙස නිළධාරීන් දෙදෙනකු විසින් වෙන වෙනම මිල ගණන් කැඳවීමට කටයුතු කිරීම ප්‍රශ්නගත බව නිරීක්ෂණය විය.

# වාරිමාර්ග

## වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශය හා 2023 වර්ෂයේ ඒ යටතේ ක්‍රියාත්මකව පැවති දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත මණ්ඩල 04ක්, රාජ්‍ය සමාගම් 01ක් හා ව්‍යාපෘති 14ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලපවාහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය මනා කළමනාකරණය යටතේ සපයාදීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී එකතුව රු.මිලියන 84,659 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර 2023 වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 53,679 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | වාරිමාර්ග අමාත්‍යාංශය<br>රු.මිලියන | වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>රු.මිලියන | එකතුව<br>රු.මිලියන |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන | 69,226 | 15,433 | 84,659 |
| වියදම් | 41,249 | 12,430 | 53,679 |
| ඉතිරිය | 27,977 | 3,003 | 30,980 |

වගු අංක 2.31 : වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව සඳහා වූ ප්‍රතිපාදන, වියදම හා ඉතිරිය

## විගණන නිරීක්ෂණ

**මොරගහකන්ද ජල විදුලිබලාගාරයෙන් උත්පාදිත විදුලිය වෙනුවෙන් අයකිරීම්**

මොරගකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදියර I, II හා III මගින් උත්පාදිත විදුලි වෙනුවෙන් 2021 – 2023 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පහත සඳහන් පරිදි රු. මිලියන 3,697.43 ක ඉන්වොයිස්පත් ඉදිරිපත් කර තිබු නමුත් ඉන් සියයට 23 ක් හෙවත් රු. මිලියන 853.73 ක් පමණක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවා තිබුණි. 2021 වර්ෂයේ සිට ඉදිරිපත්කල ඉන්වොයිස්පත්වලින් අය නොවූ වටිනාකම අයකර ගැනිම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| වර්ෂය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | ඉදිරිපත්කල ඉන්වොයිස් වටිනාකම | අයකරගත් වටිනාකම | 2023/12/31 දිනට හිඟ ආදායම | හිඟ මුළු ආදායම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| -------- | ------------------ | ---------------- | ------------- | ---------------- | ----------- |
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| **2021** | 1,221.67 | 1,200.62 | 643.73 | 556.89 | 46 |
| **2022** | 1,348.90 | 1,369.95 | 209.99 | 1,159.95 | 85 |
| **2023** | 1,335.90 | 1,126.86 | - | 1,126.86 | 100 |
| එකතුව | 3,906.47 | 3,697.43 | 853.73 | 2,843.70 | |

වගු අංක 2.31 : ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවන ලද ඉන්වොයිස් වටිනාකම

## උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

**ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ප්‍රගතිය**

උමාඔය පහළ නිම්න සංවර්ධන කටයුතු සඳහා 2010 වර්ෂයේදී අනුමත කරන ලද ඇස්තමේන්තුව රු. මිලියන 9,352 ක් වුවද පසුව එය රු.මිලියන 17,914 ක් ලෙස සංශෝධන කර 2024 ජුනි 30 වන විට රු.මිලියන 16,269 ක් වැය කර තිබූ නමුත් මේ දක්වා පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන්ගෙන් සියයට 50 ක් හෝ නිමකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**වාරි පහසුකම් සපයන ඉඩම් හඳුනා නොගැනීම**

ව්‍යාපෘතිය නව ඉඩම් හෙක්ටයාර 4,500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500 කට වාරි ජල පහසුකම් සපයා දීමේ මූලික අරමුණින් ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 750 ක් සඳහා පමණක් වගාකිරීමට වාරි පහසුකම් සපයා තිබුණු අතර අනෙකුත් ඉඩම් හඳුනා ගෙන නොතිබුණි.

**පහළ නිම්න සංවර්ධන කටයුතු**

අවසන් කර තිබූ  අලිකොටආර ජලාශයේ සිට කිලෝමීටර් 18 ක් දුරින් පිහිටි මීගස් ආර වැව හරහා ගෙනයනු ලබන ජලය කිලෝමීටර් 24 ක් දුරින් පිහිටි කුඩාඔය ජලාශයට ගෙනයාමෙන් පසු ප්‍රියන්තගේ වැව දක්වා ගෙනයාමට සැලසුම්කර තිබුණි. එසේ වුවද දුර්වල ව්‍යාපෘති සැලසුම්කරණය හේතුවෙන් පහල නිම්න සංවර්ධන කටයුතු නිම කර

නොතිබීම නිසා මීගස්ආර වැව දක්වා හෝ ජලය ගෙන යාමට නොහැකිවී තිබුණි.

**කුඩා ඔය ජලාශයට ජලය ගෙන ඒම**

උමා ඔය ද්‍රෝණියේ ජලය දකුණු පළාතේ කෘෂිකාර්මික කටයුතු සඳහා නිදහස් කිරීමට, තැන්පත් කර ගැනීම අරමුණු කොට ගෙන ඝන මීටර් මිලියන 22.5 කින් යුත් කුඩා ඔය ජලාශය ඉදි කිරීමට සැලසුම් කර තිබුණි. නමුත්, ජලාශයේ සැලැස්ම උමා ඔය සිට කුඩා ඔය ජලාශය වෙත ජලය රැගෙන එන කිලෝමීටර 30ක දිගින් යුත් සැලසුම්ගත ඇළ මාර්ගයට ඉහළින් සිටින සේ, නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කර ඉදිකර තිබුණි. ඒ අනුව උමා ඔය හැරවීමෙන් ගෙන එනු ලබන ජලය කුඩා ඔය ජලාශය තැන්පත් කිරීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## සියඹලන්ගමුව ඔයේ සිට මහ ගල්ගමුව වැව දක්වා පෝෂිත ඇල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2012-2014 කාල සීමාව එනම් වසර 3 ක් තුල නිම කිරීමට අපේක්ෂා කර තිබූ අතර වසර 9 ක් ගතවී තිබුණද මේ දක්වා නිමකර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය දක්වා රු. මිලියන 580.93 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර එයින් රු. මිලියන 374.95 ක් වැයකර තිබුණි.

**දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම**

දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පුද්ගලික සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව අදාළ සමාගම විසින් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා විදුලි ඒකක (kwh) 11,519.68 ක් නිෂ්පාදනය කර ජාතික විදුලි පද්ධතියට එක් කර තිබුණි. එම විදුලිය, ලංකා විදුලි බල මණ්ඩලය වෙත විකිණීම මගින් රු. මිලියන 200.93ක ආදායමක් අදාල සමාගම විසින් උපයාගෙන තිබුණෙන් ගිවිසුම අනුව එම ආදායමෙන් සියයට 15 ක් හෙවත් රු. මිලියන 30.14 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විය. එයින් රු. මිලියන 6.09 ක් එනම් සියයට 20 ක් පමණක් අයකර තිබූ නමුත් ඉතිරි රු. මිලියන 24.06 ක් නිසි පරිදි අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.
තවද 2023 වර්ෂය සඳහා නිෂ්පාදනය කර තිබූ විදුලි ඒකක ප්‍රමාණය හා විකිණීම මගින් උපයා තිබූ ආදායම හා ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායමත් හඳුනාගෙන නොතිබුණි.

## බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**නිර්දේශවලට පටහැනිව මිල විචලනයන් ගෙවීම**

මුල් කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරු වෙත මිල විචලනයන් සඳහා කිසිදු ගෙවීමක් නොකරන බවට වූ කොන්දේසිය සංශෝධනය කර මුලු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 47 ක් හෙවත් රු.මි. 1,085 ක් මිල විචලනයන් සඳහා ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි. තවද භාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් පැටවීමකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අරමුදල් සපයා ගත යුතු වුවද එම නිර්දේශය ද නොසලකා කොන්ත්‍රාත්තුවේ මිල විචලනයන් ගෙවීමට හැකි වන පරිදි රජයට අවාසිදායක ලෙස වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024 අප්‍රේල් 16 දින සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබුණි.

ව්‍යාපෘතියේ තවදුරටත් ඉටු කල යුතු සියයට 20 ක පමණ වැඩ කොටස් ඉතිරිව තිබියදී 2024 මැයි සිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර වී තිබුණි.

## යාන්ඔය ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**ගිවිසුම් සංශෝධනය**

යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වැව් බැම්ම ඉදිකිරීම, සැඳලි බැම් 04 ක් ඉදිකිරීම, වම් ඉවුරු ඇළ කි.මී. 18 ක් දිගින් යුතුව ඉදිකිරීම හා දකුණු ඉවුරු ඇළ කි.මී.12 ක් දිගින් යුතුව ඉදිකිරීමට යෝජිතව පැවතුණි. ඒ යටතේ වූ දකුණු ඉවුරු ඇළ හැර අනෙකුත් කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, එ.ජ.ඩොලර් මිලියන 176 ක ඍජු කොන්ත්‍රාත්තුවක් ලෙස චීන සමාගමක් සමඟ 2011 නොවැම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය ප්‍රධාන බැම්ම හා සැඳලි බැම් 04 ඉදිකිරීමට පමණක් සීමා වන පරිදි හා කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩොලර්.මිලියන 150 ක් වන පරිදි 2013 අගෝස්තු 16 දින සංශෝධනය කර තිබුණි. නැවත වරක් වම් ඉවුර ඇළ ඉදිකිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 39.5 ක ගිවිසුමක් 2017 දෙසැම්බර් 12 දින අදාළ කොන්ත්‍රාත්කරු සමඟම අත්සන් කර තිබුණි. ඒ අනුව මුල් අවස්ථාවේ එ.ජ.ඩොලර් මිලියන 176කට එකඟ වූ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 189.5ක් ගෙවීමට සිදු වී තිබුණි.

**ඉඩම් අහිමි වූවන්ට විකල්ප ඉඩම් ලබා දීම**

යාන්ඔය ජලාශය ඉදිකිරීම නිසා හොරොව්පතාන හා ගෝමරන්කඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් <u>හෙක්ටයාර් 4,148</u> ක් ජලයෙන් යටවී තිබුණි. නව ඉඩම් හෙක්ටයාර 1,515 කට වාරි ජල පහසුකම් සපයා වගාවන්ට එක් කිරීමේ මූලික අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 421 ක් එනම් සියයට 28 ක් පමණක් වගාකිරීම සඳහා

වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා යටවූ කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස්කර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් විකල්ප කුඹුරු ඉඩම් ලබාදීම වෙනුවට පවුල් 506 ක් සඳහා රු. මිලියන 1.8 බැගින් රු.මිලියන 910.80 ක අතිරේක වන්දි 2024 මැයි 31 වන විට ගෙවා තිබුණි.

**අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම**

2023 මාර්තු 28 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයක්ට අනුව යාන්ඔය ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියට සහ වම් ඉවුරු ප්‍රධාන ඇළ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව දැනට ගෙවා ඇති වන්දි මුදල් සහ ගෙවීමට නියමිත මූලික වන්දි මුදල් පිළිබඳ තොරතුරු ඇතුලත්ව එකී ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සලකා බැලීම පිණිස එක් මාසයක් තුල ඇමතිතුමා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සවිස්තරාත්මක වාර්තාවක් සකස්කර නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව හා වන්දි ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත සිදුකර ඇතිබව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

ව්‍යාපෘතියට අදාළව ඉඩම් කට්ටි 2,438 ක් සඳහා පමණක් වන්දි ගෙවීම් අවසන් කර තිබුණු අතර තවත් ඉඩම් කට්ටි 1,481 කට අදාළ වන්දි ගෙවීම් අවසන් කර නොතිබුණි. ජලාශයට යටවූ ඉඩම් කට්ටි 105 ක් සහ වම් ඉවුරු ඇලට යටවූ ඉඩම් කට්ටි 170 ක් සඳහා කිසිදු වන්දියක් මේ වනතෙක් ගෙවා නොතිබුණි.

**කොන්ත්‍රාත්කරු වැඩ බිමෙන් ඉවත් නොවීම**

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ වැඩබිම සඳහා ප්‍රවේශ වීම හා ඉවත්වීම වෙනුවෙන් එ.ජ.ඩොලර් 4,672,247ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු 2023 දෙසැම්බර් 31 දින දක්වා වැඩබිමෙන් ඉවත්වී නොතිබුණු අතර එහි ඇති තාවකාලික කාර්යාල ගොඩනැගිලි, ගල් අඹරන යන්ත්‍ර සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරක්ෂක සේවා සපයා ගනිමින් භූමිය තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි.

**ප්‍රතිඵල ළඟාකර ගැනීම පිළිබඳ පසු විපරම් නොකිරීම**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ සඳහා පානීය ජලය හා කෘෂිකාර්මික ඉඩම් පිළිවෙලින් හෙක්ටයාර් 2,287 කට හා හෙක්ටයාර 5,360 ක් වගා කිරීමට අවශ්‍ය ජලය ලබාදීම, වාහල්කඩ, පදවිය, ගෝමරන්කඩවල යන කෘෂිකාර්මික ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා පිරිසිදු පානීය ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිලාභ ලෙස හඳුනාගෙන තිබුණද මෙම අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ ඵලදායීව පසු විපරමක් කර නොතිබුණි. මේ හේතුවෙන් 2024 ජුනි 30 දිනට ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 40,385 ක් වැයකර තිබුණද ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආර්ථික ප්‍රථිලාභ ප්‍රමාණවත් පරිදි ජාතික ආර්ථිකයට එක්කර තිබුණේද යන්න තහවුරු නොවුණි.

## මාදුරු ඔය දකුණු ඉවුරු ඇලේ ඉදිකිරීම්

**දම්මින්න - වලමන්ඩිය මාර්ගය වැඩි දියුණු කිරීම**

මාදුරුඔය දකුණු ඉවුරු ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 38,500.90 ක් ඇස්තමේන්තු කර ප්‍රධාන ඇල ඇතුළුව සංවර්ධන කාර්යයන් 14 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම සංවර්ධන කාර්යයන් අතුරෙන් රු.මිලියන 7,475 ක ඇස්තමේන්තු මත පාලම් ඇතුළු ප්‍රධාන වෙලඳපොල මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ යටතේ දම්මින්න සිට වලමන්ඩිය දක්වා මාර්ගය කිලෝමීටර් 0+630 සිට කිලෝමීටර් 4+030 දක්වා කොටස වැඩිදියුණු කිරීම රු. මිලියන 93.46 ක ඇස්තමේන්තුවක් මත, 2021 ජුලි 30 දින ආරම්භ කර තිබුණි. උක්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී නිසි සැලැස්මකින් තොරව මාර්ගයේ තැනින් තැන කි.මී. 3.4 ක් කැනිම් කර තිබුණු අතර 2023 සැප්තැම්බර් වන විට වැට් බදු ඇතුළුව රු. මිලියන 82.99 ක් ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණි.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගෙවීම් පටිපාටිය.**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාලවල ගෙවීම් පරිපාටිය නිවැරදි කිරීම සඳහා ගණකාධිකාරී කාර්යමණ්ඩලයේ සේවය ලබා ගන්නා ලෙස 2016 සැප්තැම්බර් 22 රාජ්‍ය ගිණුම් කාරක සභාව නියෝග කර තිබුණි. එසේ වුවද එම නියෝගය නොසලකා 2017 අප්‍රේල් 07 දිනැති අංක 2013/31 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබූ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කල යුතු කාර්යයන් ඇතුළත් කර තිබුණි.

2021 ජනවාරි 01 සිට 2023 අගෝස්තු 30 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 මගින් ගණකාධිකාරිවරයෙකුගේ සහතික කිරීමකින් තොරව රු. බිලියන 13.2 ක් කොට්ඨාශ සහකාර විසින් සහතික කර ගෙවීම් කර තිබුණි.

**ගෙවීම් පටිපාටියේ අඩුපාඩු**

එහිදී 2022 වර්ෂයේදි රු. මිලියන 352.42 ක් වටිනා චෙක්පත් 1177 ක් මු.රෙ.385(1)අ ට පටහැනිව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නමට නිකුත්කර, රේඛනය අවලංගු කර ගෙවීම් සහතිකකල කොට්ඨාශ සහකාර විසින්ම මුදල් කරගෙන තිබුණි. ඉදිකිරීම හා නඩත්තු වැඩ සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය නිවැරදිව ලැබුණු බවට තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් සහතික කිරීම, නිවැරදිව ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර ඇති බවට තහවුරු කිරීමකින් තොරව ගෙවීම් සහතික කිරීම, සේවා ගිවිසුම් යටතේ බඳවාගත් අනියම් කම්කරුවන්ට සේවයට පැමිණි බව ලේඛන තහවුරුවකින් තොරව වැටුප් ගෙවීම, බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබාගත් යන්ත්‍රෝපකරණ සඳහා සැපයුම්කරුන්ගෙන් ඉන්වොයිස්පත් ලබාගැනීමකින් තොරව වවුචර් සහතික කිරීම, ගොවි සංවිධාන මගින් ඉදිකිරීම් හා නඩත්තු වැඩ කොන්ත්‍රාත් පදනම මත ඉටු කරවා ගැනීමේදී බිල්පතක් නොමැතිව ගෙවීම් සහතික කිරීම, ආයතන භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් සෘජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීමේ කොන්ත්‍රාත්වලට අදාළ වැඩකටයුතු ඉටු කර ඇති බවට අවසන් වැඩ සහතික කිරීමකින් තොරව ගෙවීම් සහතික කිරීම යන අඩුපාඩු ගෙවීම් ක්‍රියාවලිය තුළ සිදු වී තිබුණි.

**ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතාකර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය යොදා ගැනීම**

මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කම්කරුවන් මඟින් සපයාගත නොහැකි අවස්ථාවලදී පමණක් බාහිරින් සපයා ගතයුතු වුවත් සියලු පුහුණු හා නුපුහුණු ශ්‍රම අවශ්‍යතා ශ්‍රම සැපයුම් කරුවන්ගෙන් හෝ ගොවි සංවිධාන මඟින් හෝ තනි පුද්ගල කම්කරු ගිවිසුම් යටතේ සපයාගෙන තිබුණි. මේ ක්‍රමයට වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා දෙපාර්තමේන්තුව සතුව පවතින යන්ත්‍රෝපකරණ මඟින් අදාළ සේවා ලබාගත නොහැකි විටදී පමණක් අවශ්‍ය යන්ත්‍රෝපකරණ බාහිරින් සපයාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතුව පවතින 350 ක් පමණ වූ යන්ත්‍රෝපකරණ ඇණිය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පැවතියදී බාහිර සැපයුම්කරුවන් වෙතින් කුලී පදනම මත යන්ත්‍රෝපකරණ සපයාගෙන තිබුණි.

**වාහන පරිපාලනය**

වාරිමාර්ග අමාත්‍යාංශය නමින් වාහන 654 ක්ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින් වාහන 2004 ක් ද ලියාපදිංචි කර තිබුණද වාරිමාර්ග අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව අමාත්‍යාංශයට අයත් හා පරිහරණය කරණු ලබන වාහන සංඛ්‍යාව 74 ක්ද, දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව දෙපාර්තමේන්තුවට අයත් හා පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 1,544 ක්ද විය. ඒ අනුව අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වූ වාහන 580 ක්ද, දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වූ වාහන 460 ක්ද ලෙස එකතුව වාහන 1040 ක් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි. වාහන පාලනය සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා නොගැනිම හේතුවෙන් එම වත්කම් නිසි පරිදි පරිපාලනය කළ නොහැකිව තිබුණි.

**අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්**

දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදුකරනු ලබන 387 ක් වූ ජලාශ, වැව් අමුණු සහ යෝජනා ක්‍රමයන්හි රක්ෂිත ප්‍රදේශයන්හි අනවසර කටයුතු පිළිබඳ විධිමත් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අතරින් 116 ක අනවසර ඉදිකිරීම් හෝ වගාකිරීම් 397 ක් බවතින බව වාර්තා කර තිබුණද 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 65 වන වගන්තිය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තා කර නොතිබුණි.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

මහවැලි අධිකාරියට අයත් ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ආයතන, වැඩි ආදායම් ලබන පුද්ගලයින්, කර්මාන්ත සහ ආයෝජන වෙනුවෙන් ටෙන්ඩර්/වෙන්දේසි හෝ අනුග්‍රාහක හෙවත් වරණීය පදනම මත බැහැර කළයුතු වුවත්, ප්‍රධාන වශයෙන් වරණීය පදනම යටතේ ඉඩම් බැහැර කර තිබුණි. මේ අනුව 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ඉඩම් බැහැර කිරීම් පහත පරිදි විය.

| පදනම | බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය (හෙක්) | බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය (කට්ටි) | දීර්ඝකාලීන දීමනා පත්‍ර, නිදහස් දීමනා පත්‍ර ලබාදී ඇති ප්‍රමාණය (කට්ටි) | තවදුරටත් දීමනා පත්‍ර නිකුත් කළයුතු ප්‍රමාණය (කට්ටි) | තවදුරටත් නිකුත් කළයුතු දීමනා පත්‍ර ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|---|
| වාණිජ | 289 | 9,398 | 953 | 8,445 | 89 |
| නිවාස | 1,261 | 12,390 | 3,369 | 9,021 | 72 |
| ආයෝජන ව්‍යාපෘති | 6,534 | 797 | 204 | 593 | 74 |
| විහාරස්ථාන | 906 | 564 | 162 | 402 | 71 |
| රාජ්‍ය ආයතන හා වෙනත් | 9,776 | 1,586 | 390 | 1,196 | 75 |
| | 18,766 | 24,735 | 5,078 | 19,657 | 79 |

වගු අංක 2.32 : මහවැලි අධිකාරියට අයත් ඉඩම් වරණීය පදනම මත බැහැර කිරීම්

වාණිජ, නිවාස, ආයෝජන ව්‍යාපෘති, විහාරස්ථාන සහ රාජ්‍ය ආයතනවලට අදාළව 2023 දෙසැම්බර් 31 දින වනවිට ඉඩම් හෙක්ටයාර 18,766 ක් කට්ටි 24,735ක් වශයෙන් බැහැර කර තිබූ නමුත් ඉන් කට්ටි 19,657 ක් එනම් සියයට 79 ක් සඳහා දීර්ඝකාලීන දීමනා පත්‍ර, නිදහස් දීමනා පත්‍ර ලබාදීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අපොහොසත්වී තිබුණි.

ඉඩම් සංවර්ධන ආඥා පනත මඟින් ගොවිජන පංතියේ පුද්ගලයින් වෙත ඉඩම් කච්චේරි මඟින් ප්‍රධාන වශයෙන් ඉඩම් බැහැර කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට බැහැර කිරීම් පහත පරිදි විය.

| පදනම | බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය (හෙක්) | බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය (කට්ටි) | ප්‍රදාන පත්‍ර ලබාදී ඇති ප්‍රමාණය (කට්ටි) | තවදුරටත් නිකුත් කළයුතු ප්‍රදාන පත්‍ර ප්‍රමාණය (කට්ටි) | තවදුරටත් නිකුත් කළයුතු ප්‍රදාන පත්‍ර ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|---|
| ගොඩ | 51,387 | 201,324 | 125,912 | 75,412 | 37 |
| වාරි | 93,438 | 101,251 | 75,008 | 26,243 | 25 |
| වර්ෂා පෝෂක | 13,018 | 12,954 | 3,707 | 9,247 | 71 |
| | 157,843 | 315,529 | 204,627 | 110,902 | 35 |

වගු අංක 2.33 : ඉඩම් සංවර්ධන ආඥා පනත මඟින් ගොවිජන පංතියේ පුද්ගලයින් වෙත ඉඩම් කච්චේරි මඟින් බෙදා හැරීම

ගොඩ, වාරි සහ වර්ෂාපෝෂිත ලෙස 2023 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් හෙක්ටයාර් 157,843ක් එනම් කට්ටි 315,529 ක් වශයෙන් බැහැර කර තිබූ නමුත්, කට්ටි 110,902 කට එනම් සියයට 35 ක් සඳහා ප්‍රදාන පත්‍ර ලබාදීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අපොහොසත්වී තිබුණි.

**මහජන යහපත පිණිස ඉඩම් බැහැර කිරීම**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධානවලින් බැහැරව ජනාධිපතිවරයාගේ හා අමාත්‍යවරුන්ගේ පුද්ගලික ලැයිස්තු පදනම් කරගෙන මහජන යහපත පිණිස යන ප්‍රතිපාදනය යටතේ ඉඩම් බැහැර කර තිබුණි. නියැදි පරීක්ෂාවලට අනුව සී කලාපයේ පුද්ගලයින් 395 දෙනෙකු වෙතද, ඊ කලාපයේ පුද්ගලයින් 91 දෙනෙකු වෙතද, එසේ වරණීය පදනම මත 1998 සිට 2022 දක්වා කාලය තුළ ඉඩම් බැහැර කිරීමට තේරීම් ලබා දී තිබුණි.

**ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීම**

මහවැලි බලප්‍රදේශවල පවතින ඉඩම් අයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොතිබුණු අතර, 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ බලතල ප්‍රකාරව, ඉඩම් සම්බන්ධ

පොදු නීතීන් සහ අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් බැහැර කර තිබුණි. විගණනයට තොරතුරු ලද කලාප 07 ක අයෝජන ව්‍යාපෘති 186 ක් සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 229.3 ක රජයේ තක්සේරුව ලබා නොගෙන දළ තක්සේරුව මත පදනම්ව බදු අයකර තිබූ අතර මෙම ඉඩම් බදුදී වසර 02 ත් 34 ත් අතර කාලය ගතවී තිබුණද, රජයේ තක්සේරු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. කලාප 05 ක අධිකාරිය විසින් වසර 30 ක කාලයකට බදුදී තිබූ ඉඩම් හෙක්ටයාර 421.22 කට අදාළ බදු කාලය විගණිත දින වූ 2024 මැයි 10 වන විට අවසන්වී වසර 06 සිට වසර 13 දක්වා කාලයක් ගතවී තිබුණද, එම බදු ගිවිසුම් අලුත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, සී කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 85.42ක් අවිධිමත්ව අන්සතු කර තිබුණි.

**සංවර්ධනය නොකල ඉඩම්**

2012 ජුනි 12 දිනැති අංක:අමප/12/0581/508/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කෘෂි ව්‍යාපාර පුද්ගලික සමාගමක් වෙත සිද්ධපුර ගොවිපලෙන් හා මුතුවැල්ල ගොවිපලෙන් අක්කර 500 ක් බැගින් එකතුව අක්කර 1000 සත්ත්ව පාලන කටයුතු වෙනුවෙන් 2008 නොවැම්බර් 02 දින සිට වසර 30කට දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් මත ලබා දී තිබුණි. කෙසේ වෙතත් සත්ත්ව පාලන කටයුතු වෙනුවෙන් ලබා දෙන ලද මෙම භූමිය සංවර්ධනය නොකිරීම හේතුවෙන් දීර්ඝ කාලීන බදු බලපත්‍රය 2021 සැප්තැම්බර් 29 දින අවලංගු කර තිබුණි. මෙම භූමිය සංවර්ධනය කිරීම හා නැවත බදු දීම පිළිබඳ නිශ්චිත සැලැස්මක් අධිකාරිය වෙත නොතිබුණි. වෙනත් ආයෝජකයින් 16 දෙනෙකු වෙත කෙටි කාලීන බෝග වගාව සඳහා මෙම භූමියෙන් අක්කර 400ක් ලබා දී තිබුණි. බදු දුන් ආයෝජකයින් 16 අතුරින් 9 දෙනෙකු වර්ෂයට අදාළ බදු මුදල් ගෙවා නොතිබූ අතර අදාළ භූමිය එකඟ වූ පරිදි සංවර්ධනය කිරීමද කර නොතිබුණි.

**බදු කුලී අඩුවෙන් අය කිරීම**

බී කලාපයේ දම්මින්න කොට්ඨාශයේ අළුත්වැව ඒකකයෙන් කෘෂිකාර්මික ව්‍යාපෘති යටතේ පොල් වගා කිරීම සඳහා සමාගමකට දීර්ඝකාලීන බදු පදනම මත අක්කර 100 ක් 1983 දෙසැම්බර් 13 දින සිට අවුරුදු 30 ක කාලයකට ලබාදී තිබුණි. ඒ අනුව බදු කාලය 2013 දෙසැම්බර් 14 දිනෙන් අවසන්වී තිබුණද නැවත ලබා දී නොතිබුණු අතර අක්කර 100 සඳහා වර්ෂයකට රු.7,302 බැගින් 2013 සිට 2017 දක්වාද, වර්ෂයකට රු.8,764 බැගින් 2018 සිට 2021 දක්වා ද එකතුව රු. 80,330 ක මුදලක් මෙම සමාගමෙන් අයකර තිබුණි. කෙසේ වෙතත් 2013 වර්ෂයේ බදු කාලය අවසන්වූ මෙම ඉඩම සඳහා වෙනත් ආයතනයක් දීර්ඝ කාලීන බද්දක් ලබා දෙන ලෙස 2013 වර්ෂයේ සිට ඉල්ලීම් කර ඇති අතර, එහිදී ලබාගත් රජයේ තක්සේරුව අනුව මෙම අක්කර 100 පොල් වගාවේ තක්සේරු වටිනාකම 2013 දෙසැම්බර් 12 දිනට රු.මිලියන15 ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වාර්තා කර තිබුණි.

ඒ අනුව ගණනය කළ විට මෙම ඉඩම සඳහා 2014 සිට 2018 දක්වා වර්ෂයකට රු. මිලියන 0.6 බැගින් රු. මිලියන 3 ක් ද, 2019 සිට 2022 දක්වා වර්ෂයකට රු. මිලියන 0.72 බැගින් රු.මිලියන 2.88 ක් ද ලෙස එකතුව රු. මිලියන 5.88 ක මුදලක් අය කළයුතු වුවත්, අධිකාරිය අයකර තිබුණේ රු.80,330 ක් පමණි.

**කොත්මලේ නිවාඩු නිකේතනය**

හෙක්ටයාර 1.7176 ක භූමි භාගයක පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ල, ක්‍රීඩා සංකීර්ණය, පිහිනුම් තටාකය සහ නිවාස ගොඩනැගිලි 15 කින් යුක්ත කොත්මලේ නිවාඩු නිකේතනය ඉඩම් හා ගොඩනැගිලි බාහිර ආයෝජකයින් වෙත බදුදීමේදී අනුගමනය කරන සාමාන්‍ය පිළිවෙතින් බැහැරව කළමනාකරණ ගිවිසුමක් යටතේ පුද්ගලික පාර්ශ්වයක් වෙත 2013 නොවැම්බර් 25 දින පවරා දී තිබුණි. නිවාඩු නිකේතනය රු. මිලියන 0.3 ක මාසික කළමනාකරණ ගාස්තුවක් මත 2013 නොවැම්බර් මස සිට වසර 10 ක කාලයකට පවරාදී තිබුණද මේ සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා කළමනාකරණ ගාස්තුව තීරණය කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවුණි. 2022 නොවැම්බර් 30 දිනට රු.මිලියන 5.1 ක් වූ මෙම නිවාඩු නිකේතනය වෙනුවෙන් ලැබිය යුතු හිඟ කළමනාකරණ ගාස්තුව විගණිත දින වූ 2024 මාර්තු 22 දක්වා අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. කළමනාකරණ ගිවිසුමේ කොන්දේසි ගිවිසුමට එළඹෙන අවස්ථාවේ එකඟවූ රු. මිලියන 0.3 ක් වූ මාසික කළමනාකරණ ගාස්තුව දෙපාර්ශවයේ එකඟතාවය මත වර්ෂ 05 කට පසු වැඩි කළයුතු බවට එකඟවී තිබුණද 2018 නොවැම්බර් 25 දිනෙන් පසුව එම කළමනාකරණ ගාස්තුව වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි.

**දිගන විලේජ් රිසෝට් ආයතනය**

අධිකාරියට අයත්ව දිගන ගම්මානය තුළ අක්කර 07 ක ඉඩමක පිහිටා තිබූ දිගන විලේජ් රිසෝට් ආයතනය 1993 ජුනි 01 දින පුද්ගලික සමාගමක් වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් පවරාදී තිබුණි. කෙසේ වෙතත් මෙම ආයෝජනයෙන් එකඟ වූ ප්‍රතිලාභ ලැබී නොතිබුණු අතර, බදුකාර පාර්ශවය මෙම පරිශ්‍රය 1993 වර්ෂයේ සිට වසර 20 ක කාලයක් බාහිර පුද්ගලයන් හා ආයතන වෙත විවිධ උත්සව කටයුතු සහ නේවාසික පහසුකම් සැපයීමෙන් ආදායම් ඉපයීමක් සිදුකර තිබූ අතර, අධිකාරිය වෙත කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. ගණනය කර ඇති පරිදි හිඟ කුලී මුදල රු.මිලියන 4.5 ක් වේ. දෙපාර්ශවය අතර වූ ආරවුල අධිකරණය මඟින් විසඳා තිබූ අතර 2023 පෙබරවාරි 26 එදිනට පෙර නියමිත පරිදි පරිශ්‍රය අධිකාරිය වෙත භාරදිය යුතු වුවත්, එසේ භාර නොදීම මත නැවත 2023 මාර්තු 10 දින තෙල්දෙනිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. දේපළ භුක්ති විඳිමින් සිටි පාර්ශ්වය විධිමත්ව මෙම දේපළ අධිකාරිය වෙත නැවත භාරදීමකින් තොරව 2023 පෙබරවාරි 26 දින සිට අදාළ පරිශ්‍රයෙන් ඉවත්වී තිබූ අතර විගණිත දින වන 2024 මාර්තු 22 දින

වනවිට පරිශ්‍රය තුළට ඇතුළුවීමට නොහැකි තරමට කැලෑ වැවී වල්බිහිවී දේපළ විනාශවී පැවතුණි. එසේ වුවද පරිශ්‍රයට සිදුවී ඇති අලාභහානි තක්සේරු කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම අලාභ අයකර ගැනීමටත්, පරිශ්‍රය ඇතුළු අනිකුත් දේපල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් යෙදවීමටත් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**රක්ෂිත ප්‍රදේශ තුළ අනවසර වගා කිරීම**

අධිකාරියට අයත් මයුරපුර බලප්‍රදේශය තුළ හෙක්ටයාර 4,700 ක පමණ වන භූමි ප්‍රමාණයක් 2021 අප්‍රේල් 09 දින නිකුත් කරන ලද අංක 2222/62 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් හම්බන්තොට වන අලි කළමනාකරණ ප්‍රදේශය ලෙස නම් කර තිබුණි. එසේ වුවද මෙම භූමි ප්‍රදේශය තුළ පුද්ගලයන් දෙදෙනෙකු විසින් අඹ ගස් 6,000 ක් පමණ අනවසරයෙන් වගා කර තිබුණු අතර ආරක්ෂක අංශවල සහාය ලබාගෙන අනවසර වගාකරුවන් ඉවත් කිරීමට අදාළ නීතිමය කටයුතු 2021 අගෝස්තු 31 දිනට ප්‍රථම අවසන් කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණද, ඒ සඳහා කටයුතු කර නොතිබුණි. එනමුත් මෙම අනවසර අඹ වගාවට යාබදව වෙනත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් සිදු කරන හේන් වගාවක් එම ස්ථානවලින් ඉවත් කිරීම සඳහා නිලධාරීන් කටයුතු කරමින් පැවතුණි.

**අයුතු ඉඩම් පරිහරණය**

මයුරපුර කොට්ඨාශයේ හෙක්ටයාර 20.2343 ක භූමි ප්‍රමාණයක් පස් කැපීමේ ව්‍යාපෘතියක් සඳහා 2016 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත බැහැර කර තිබුණි. මෙම සමාගම 2016 දෙසැම්බර් 20 දින සිට 2017 දෙසැම්බර් 19 දක්වා අදාළ භූමියෙන් පස් කියුබ් 66,012 ක් කැනීම් කර තිබුණද, අධිකාරියට අයවිය යුතු ඉඩම් පරිහණ ගාස්තු රු.මිලියන 51.53 ක් විගණිත දින වන 2024 මාර්තු 19 දක්වා අයකර ගෙන නොතිබුණි. තවද, එකඟවූ පරිදි අදාළ භූමිය පුනරුත්ථාපන කටයුතු සිදුකර නොතිබුණි.

**කැණීම් භූමි පුනරුත්ථාපනය නොකිරීම**

මහවැලි අධිකාරිය පනතේ 12 (ඇ) වගන්තිය අනුව යම් විශේෂ ප්‍රදේශයක් තුළ භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ එය පවත්වාගෙන යාම අධිකාරියේ ප්‍රධානතම කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණද, ඛණිජ කැනීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී එම කැනීම් භූමි පුනරුත්ථාපනය කිරිම සම්බන්ධයෙන් අධිකාරිය නීති සම්පාදනය කර නොතිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයට පෙර දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා මහවැලි බලප්‍රදේශවලින් කළුගල්, පස් හා බොරළු විශාල වශයෙන් කැනීම් කිරීමට අවසර ලබාදී තිබූ නමුත්, එම භූමි පුනරුත්ථාපනය කිරිම ඇතුළු එම පරිසර පද්ධති සංරක්ෂණය කිරීම පිළිබඳ නීති පැනවීම හෝ වෙනයම් ආකාරයකින් කැනීම්කරුවන් දැනුවත් නොකිරීම හේතුවෙන් විගණිත දින වූ 2024 මැයි 20 දින වන

විටද එම කැනීම් භූමි පුනරුත්ථාපනය කිරීමකින් තොරව අනාරක්ෂිත විශාල දිය පිරුණු වලවල් ලෙස අත්හැර දමා තිබුණි.

**කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේදී හිඟ ආදායම් අය නොකිරීම**

ඛණිජ කැනීම් බලපත්‍ර දීර්ඝ කරනු ලබන අවස්ථාවන්හීදී පෙර වර්ෂ සඳහා අයවිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගැනීමෙන් පසු නව බලපත්‍රයක් නිකුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හා වගකිවයුතු නිලධාරීන් අදාළ හිඟ ගාස්තු යාවත්කාලීනව අයකර ගැනීම නොසලකා හැරීම මත 2019 වර්ෂය අවසන් වන විට අධිකාරියට අය වියයුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු එකතුව රු.මිලියන 1,898.91 ක් විය. 2020 දෙසැම්බර් 14 දිනැති අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එසේ කළුගල් ව්‍යාපාරිකයින්ගෙන් අයවිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් කපා හැරීමටත්, ඉතිරිය වාරික 36 කින් අයකර ගැනීමටත් යන සහන සලසාදී තිබුණි. ඒ අනුව සී, එච්, එල් හා වලව කලාපවලට අදාළව අධිකාරියට අයකර ගත හැකිව තිබූ කපා හරින ලද හිඟ ගාස්තුව රු. මිලියන 1,311.08 ක් විය. ඉතිරි හිඟ මුදල් ගෙවීමට ලබා දෙන ලද සහන කාලසීමාව 2023 දෙසැම්බර් 31 දින වනවිට අවසන්ව තිබූ නමුත්, කැනීම්කරුවන් 57 කගෙන් රු. මිලියන 271.42 ක මුදලක් 2024 මැයි 20 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

**රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම**

අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සමාගම රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ප්‍රතිසංවිධානයට අදාළ අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට ආයෝජකයින්ගේ ව්‍යාපෘති වාර්තා පරීක්ෂා කොට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, ඊට අදාළ කටයුතු ඉටු කර නොතිබුණි.

**ඈවර කිරීම් අවසන් නොකල සමාගම්**

අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීමට තීරණය කර ඊට අදාළ මූලික කටයුතු ඉටු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම පරිහරණය කරමින් සිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ, බෙස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.213 ක ඉඩම හා ගොඩනැගිලි 2020 වර්ෂයේ නැවත මහවැලි අධිකාරියට පවරා තිබුණද, එම වත්කම් නිසි පරිදි භාරදීමට හා භාරගැනීමට කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂයේ මෙම ඉඩම රු.මිලියන 296 කටද, ගොඩනැගිල්ල රු.මිලියන 619 කටද තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණු අතර 2023 මැයි 15 දින විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම පාහේ කැඩී බිඳී විනාශවී ගොස් ඇති බවත් එම ගොඩනැගිලි තුළ ගෘහ භාණ්ඩ හා උපකරණ කිසිවක් නොමැති බවත් නිරීක්ෂණය කර තිබුණද, විගණිත දින වන 2024 අප්‍රේල් 28 දක්වා මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**නිෂ්පාදන කටයුතු සඳහා මුදා හරින ජලය සඳහා ගාස්තු අය නොකිරීම**

ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යන්ත්‍රස්ථාන ඉදිකිරීම, මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම අධිකාරියේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. මේ අනුව විදුලි බලය නිෂ්පාදනය කිරිම සඳහා වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ,කොත්මලේ, බෝවතැන්න, මාදුරුඔය, පොල්ගොල්ල හා උඩවලව ජලාශවලින් ජලය රඳවාගෙන නිකුත් කරනු ලබන අතර, එම ජලාශ නඩත්තුව හා මෙහෙයවීම වෙනුවෙන් අධිකාරිය වාර්ෂිකව විශාල වැය බරක් දරනු ලැබේ. කෙසේ වෙතත් 2022 හා 2023 වර්ෂයේ ජල විදුලි බලය නිපදවීම වෙනුවෙන් මෙම ජලාශවලින් පිළිවෙලින් ජල කියුබ් මීටර මිලියන 11,042.07 ක් හා 9,210.85 මුදාහැර තිබූ අතර, ඉන් පිළිවෙලින් ගිගා වොට් පැය 2,327.461 ක හා 1,845.758 ක විදුලිබලය නිෂ්පාදනය සිදුකර තිබූ නමුත් කිසිදු ගාස්තුවක් අධිකාරිය අයකර නොතිබුණි. මීට අමතරව අධිකාරියට අයත් ගංගා, ජලාශ, වැව් හා ඇල පද්ධතිවලින් නොයෙකුත් ව්‍යාපාර සඳහා ජලය විශාල ලෙස සපයා ඇති අතර විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව ගොවිපල/වැඩබිම් ස්ථාන 48 කට දිනකට ජලය ඝන මීටර් 133,113 ක් නිකුත් කරන නමුත්, ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් යටතේ ගාස්තු අය කිරීමක්ද සිදුනොවේ. උක්ත ජලවිදුලි බලාගාරවලට අමතරව අධිකාරිය විසින් නියාමනය නොකරන නමුත්, මහවැලි විශේෂ බලප්‍රදේශ තුළ විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 65 කින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගත යුතු වුවත් ඒ සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**එල්ලෙන විදුලි වැටවල් ඉදිකිරීම**

මහවැලි බී කලාපයේ අරලගංවිල, කන්දකාඩු, සිංහපුර අතර හා සී කලාපයේ මහවැලි පුහුණු මධ්‍යස්ථානය වටා එල්ලෙන ලෙස විදුලිවැට ඉදිකිරීමට ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසමට පිළිවෙලින් රු. මිලියන 4.84 ක්, රු. මිලියන 9.23 ක් හා රු. මිලියන 8 ක් වශයෙන් අත්තිකාරම් ලබාදී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව මෙලෙස එක් ආයතනයකට කොන්ත්‍රාත් පැවරීම හා ගෙවීම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. මෙම අලි වැටවල් නිසි පරිදි ඉදිකිරීම් කර ඇති බවට අධිකාරියේ තාක්ෂණ අංශය හෝ වෙනත් පාර්ශවයක් විසින් තහවුරු කර නොතිබීම හා නිසි පරිදි බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකිවීම මත අත්තිකාරම් නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි.

**නැවත පදිංචි කල ජනතාවට ජල පහසුකම් නොමැතිවීම**

මොරගහකන්ද ජලාශය ඉදිකිරීම හේතුවෙන් නිවාස දේපල අහිමිවූ ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු 2022 නොවැම්බර් මස වනවිට අවසන්වී තිබුණි. එසේ වුවද මෙම නැවත පදිංචි කළ ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වූ බීමට සහ අනෙකුත් කටයුතු සඳහා ජල සැපයීම පිළිබඳ මූලිකව නිසි සැලසුම් සකස් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විගණිත දින වන 2024 අප්‍රේල් 28 දින වනවිටත් වැල්ලේවෙල සහ නව ගුරුවෙල පදිංචි කළ පිළිවෙලින් පවුල් 47 ක් හා 426 ක් වෙනුවෙන් බීමට සහ අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් දෛනිකව බවුසර් රථ මඟින් ජලය ලබාදීමට සිදුවී තිබුණි. මේ වෙනුවෙන් 2023 වර්ෂයේ රු. මිලියන 40.73 ක් 2024 ජනවාරි සිට මාර්තු දක්වා රු. මිලියන 8.55 ක්ද අධිකාරිය විසින් වැය කර තිබුණි. මෙසේ නැවත පදිංචි කළ ජනතාව අතුරින් නවගුරුවෙල නව ලග්ගල සහ නීරම්ඔය ඒකකවල පදිංචි පවුල් 161 ක් සඳහා විගණිත දින වන 2024 අප්‍රේල් 28 දින වනවිටත් කුඹුරු ඉඩම් ලබාදී නොතිබූ අතර, ඔවුන්ගේ ජීවනෝපාය කරගෙන යාමට මේ නිසා නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් ආරම්භයේදී ව්‍යාපෘතියෙන්ද, පසුව 2022 ජූලි මස සිට විගණිත දින වන 2024 අප්‍රේල් 28 දින දක්වා අධිකාරිය විසින්ද, 2022 වර්ෂයේ රු. මිලියන 4.45 ක්ද, 2023 වර්ෂයේ රු. මිලියන 9.43 ක් ද, ලෙස එකතුව රු. මිලියන 13.88 මුදලක් මෙම නැවත පදිංචිකරුවන්ගේ වියළි ආහාර සලාකය ලබාදීමට වැය කර තිබුණි. තවද 2024 අප්‍රේල් 28 දිනට තවදුරටත් කුඹුරු ලෙස සැකසීමට හඳුනාගෙන තිබූ අක්කර 181.5 ක් වූ අතර, ඉන් අක්කර 72 ක වනාන්තර භූමිය සම්පූර්ණයෙන් එළිපෙහෙළි කිරීමටද අක්කර 87 ක් රළු මට්ටම් කිරීමටද ඉතිරිව තිබුණි.

අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම 3 ක් ක්‍රියාත්මක කර තිබුණි. මහවැලි

සවිය ණය යෝජනා ක්‍රමය 2010 වර්ෂයේ රු.මිලියන 72.75 කින් ආරම්භ කර තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ ශේෂය රු. මිලියන 82.02 ක් වී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 66.57 ක මුදලක් 2023 නොවැම්බර් 31 දිනට ණය ලෙස ලබාදී තිබුණද, අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ණය සඳහා බැංකුව අයකර ගන්නා පොලියෙන් කිසිදු මුදලක් අධිකාරිය වෙත හිමි නොවේ. මොරගහකන්ද අත්වැල ණය යෝජනා ක්‍රමය 2017 වර්ෂයේ රු.මිලියන 25 ක ප්‍රාග්ධනයෙන් ආරම්භ කර තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම මුදලින් ජනපදිකයින්ට ලබාදී තිබුණේ රු.මිලියන 11.68 කි. නිකුත් නොකළ ණය සඳහා ලැබෙන පොලී ආදායම චක්‍රීය අරමුදලට එකතුවීමද සිදුනොවේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩසටහන යටතේ 2006 වර්ෂයේ අධිකාරිය විසින් රු.මිලියන 50 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලබාදී තිබුණද, 2023 දෙසැම්බර් 31 දිනට එම ණය මුදලෙන් කොපමණ ණය ලබාදී තිබේද, පොළිය කොපමණද යන්න සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් අධිකාරිය සතුව නොතිබුණි.

## ජල සම්පත් මණ්ඩලය

**දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදි කිරීම**

බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු. මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීම්ද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරීත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණු අතර ගෙවා තිබූ යුරෝ 3,094,488 ක අත්තිකාරම් මුදල නිශ්කාර්ය වී තිබුණි.

ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පිළියල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබා ගෙන විගණිත දිනය වන විට රු.මිලියන 0.645 ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බව හඳුනා ගෙන වසර 4 ක් ගත වී තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

**මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය** ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු. මිලියන 12.77 ක බදු

මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමථයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍යවරයා භාවිතා කළ නිළ නිවස පුළුල් කිරීමේ කාර්ය සඳහා යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව ලබා දී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජූලි 18 දින සිට 2022 ජූලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකද, 2022 අගොස්තු 01 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික ගොඩනැගිල්ලකද පවත්වා ගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු. මිලියන 30.51 ක් ගෙවා තිබුණි.

# පතල් කැනීම

ලංකාව ස්වාභාවික ඛනිජ සම්පත්වලින් පොහොසත් රාජ්‍යයකි. සංවර්ධනය වෙනුවෙන් මෙම සම්පත් භාවිතා කිරීමේ අවස්ථා බොහෝ පවතින බවද අවිවාදාත්මකය. මෙම සම්පත් නියාමනය හා කළමණාකරණය කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ලංකා මිනරල් සෑන්ඩ් සමාගම, ලංකා පොස්පේට් සමාගම, කහටගහ ග්‍රැපයිට් ලංකා සමාගම හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම යන ආයතන මගින් සිදුකරනු ලබයි. 2023 වර්ෂයේ මෙම ආයතනවල සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවලදී අණාවරණය වූ කරුණු පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

**ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය ස්ථාපනය නොකිරීම**

කාර්යාංශය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා 2022 වර්ෂයේ දී රු.මිලියන 1.66 ක් වැයකර තිබුණි. කාර්යාංශය විසින් යෝජිත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රු. මිලියන 20.39 කට පරිගණක 60 ක්ද 2023 පෙබරවාරි 21 වන දින මිලදී ගෙන තිබුණු නමුත් 2023 පෙබරවාරි 20 දින උක්ත ප්‍රසම්පාදන කාර්ය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබූ රු. මිලියන 1.66 ක වියදම අනාර්ථික වී තිබුණි. තවද, 2024 මාර්තු 15 විගණිත දින වන විට මිලදීගත් රු. මිලියන 4.08 ක් වටිනා පරිගණක යන්ත්‍ර 12 ක් නිෂ්කාර්යව ගබඩාව තුළ රඳවාගෙන තිබුණි.

**ගවේෂණ බලපත්‍රය ලබා නොගැනීම**

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම වෙත ඛණිජ ගවේෂණය සඳහා නිකුත් කර තිබූ අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රයේ වළංගු කාලය 2022 දෙසැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණු අතර අදාල ගවේෂණ ප්‍රදේශය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීම සඳහා එම සමාගම වෙත සති 2 ක කාලයක් ලබාදී තිබුණි. එසේ වුවද ගවේෂණ බලපත්‍රයෙහි ඇතුළත් ග්‍රිඩ් 07 ක භූමි ප්‍රදේශයක් 2023 ඔක්තෝබර් 09 දින සිට 2025 ඔක්තෝබර් 08 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගවේෂණ කටයුතු කිරීමට වෙනත් පුද්ගලික සමාගමක් වෙත අංක EL/434 දරන ගවේෂණ බලපත්‍රය නිකුත් කර තිබුණි.

**ඇපටයිට් සහ පොස්පේට් ඛනිජ සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක් සිදුකිරීම**

ශ්‍රී ලංකාව තුළ පොස්පේට් ඛනිජය සඳහා කාර්යාංශය විසින් සමීක්ෂණයක්, සිදුකරන තෙක් පොස්පේට් ඛනිජය සඳහා කිසිදු ගිවිසුමකට එළඹීම 2000 ජුනි 02 දිනැති අංක SE(FR)884-99 දරන බුලන්කුලම එදිරිව ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය හා වෙනත් අය

යන නඩුව මගින් තහනම් බවට තීරණය වී තිබුණි. මීට අමතරව ජාතික විද්‍යා සභාවේ සහ ජාතික විද්‍යා පදනමේ උපදේශනය මත කාර්යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ ඇපටයිට් සහ අනෙකුත් පොස්පේට් ඛනිජ සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක් සිදුකර වාර්තාවක් පලකළ යුතු බවත්, තීරණය වී තිබුණි. ඒ අනුව වර්ෂ 22 කට පසු කාර්යාංශය විසින් එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධයෙන් සිදුකරන ලද සමීක්ෂණයේ වාර්තාව ජාතික විද්‍යා පදනමේ හා ජාතික විද්‍යා ඇකඩමියේ නිර්දේශයන් ලබා ගැනීමට පෙර 2023 ජුනි 21 වන දින කාර්යාංශයේ නිල වෙබ් පිටුව හරහා සහ පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. 2023 අගෝස්තු 25 වන දින ජාතික විද්‍යා පදනම විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව මගින් අධිකරණය නියෝග කළ කාර්ය නිසි පරිදි ඉටු කිරීමට කාර්යාංශය අපොහොසත් වී ඇති බව දන්වා තිබූ අතර සමීක්ෂණ වාර්තාව සඳහා ජාතික විද්‍යා පදනමේ අනුමැතිය ලබාදී නොතිබුණි. නඩු තීන්දුව අනුව ජාතික විද්‍යා පදනමේ එකඟතාව ලබාදීමෙන් පසු සමීක්ෂණ වාර්තාව ප්‍රසිද්ධියට පත් කිරීම හා අපනයන බලපත්‍ර ලබාදීම කාර්යාංශය විසින් සිදුකළයුතු වුවද ඊට පටහැනිව ලංකා පොස්පේට් සමාගම විසින් තෝරා ගත් පොස්පේට් අපනයනකරුවන් වෙත කාර්යාංශය විසින් අපනයන බලපත්‍ර ලබාදී තිබූ අතර ඒ මත පෞද්ගලික අපනයනකරුවන් දෙදෙනෙකු විසින් මෙට්‍රික් ටොන් 7500 ක් හා 2350 ක් අපනයනය කර තිබුණි.

**බලගැන්වීමේ නිලධාරී පුරප්පාඩු**

නීති විරෝධී ලෙස සිදු වන ඛනිජ කැණීම්, සකස් කිරීම්, වෙළඳාම් කිරීම් වැටලීමේ අරමුණින් කාර්යාංශය තුළ බලගැන්වීමේ ඒකකයක් ස්ථාපිත කර බලගැන්වීමේ නිලධාරී තනතුරු 06 ක් අනුමත කරගෙන තිබුණද 2023 වර්ෂය අවසානය වන විටත් පුරප්පාඩු තනතුරු 3 ක් සඳහා බඳවා ගැනීම් නොකිරීම හේතුවෙන් එම වැටලීම් කටයුතු දුර්වල වී තිබුණි.

**ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර නොතිබීම**

2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට විගණන දින වූ 2024 ජූලි 16 දක්වා කටයුතු කර නොතිබුණි.

## ලංකා මිනරල් සෑන්ඩ් සමාගම

**අභාවිත යන්ත්‍රය (Spiral Machine)**

ඛණිජ වැලි සැකසීම සඳහා මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි හි නව යන්ත්‍රාගාරයක් ඉදිකිරීමට 2013 පෙබරවාරි 13 දින රු.මිලියන 2.25 කට හෙක්ටයාර 17.69 ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. යන්ත්‍රාගාර කටයුතු සැලසුම් කිරීමට පෙර එම වර්ෂයේදීම රු. මිලියන 39.34 කට සර්පිලාකාර යන්ත්‍රයක් (Spiral Machine) මිලදී ගෙන තිබුණු අතර

එම යන්ත්‍රය පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නිෂ්කාර්යව තබා තිබුණි. එම යන්ත්‍රාගාරය සඳහා 2015 වර්ෂයේදී සේවකයන් 117 ක් බඳවාගෙන තිබුණද 2023 වර්ෂය අවසානය තෙක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර එම බඳවාගත් සේවකයන් පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය සඳහා යොදවා ගෙන තිබුණි. 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2023-2026 කාලය තුළ ඉල්මනයිට් මෙ.ටොන් 100,000 ක් නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන තිබුණි.

**දිරි දීමනා වර්ග දෙකක් ගෙවීම**

ලාභය මත ගෙවනු ලබන අනුමත දිරි දීමනාව පිළිබඳව සඳහන් නොකර ඉල්මනයිට් නිෂ්පාදනය මත පදනම්ව දිරි දීමනාවක් ගෙවීම සඳහා 2022 අගෝස්තු 2 දින භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර තිබුණු අතර රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022 නොවැම්බර් 29 දින ඒ සඳහා අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව 2023 වර්ෂය තුළදී වාර්ෂික ලාභය මත දිරි දීමනා ලෙස රු.මිලියන 193.68 ක්ද ඉල්මනයිට් නිෂ්පාදනය මත දිරි දීමනාව ලෙස රු.මිලියන 84.16 ක්ද ගෙවා තිබුණි.

**ගුදම් ධාරිතා මට්ටම ඉක්මවා යෑම නිසා ඉල්මනයිට් නිෂ්පාදනය නවතා දැමීම**

2023 වර්ෂය ආරම්භයේ ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 105,282 ක් සමාගම සතුව පැවතුණු අතර 2023 වර්ෂයේදී සමාගමේ ඛනිජ වැලි මෙ.ටොන් 111,286 ක් නිෂ්පාදනය කර තිබුණි. එයින් සියයට 30 ක ඛනිජ වැලි ප්‍රමාණයක් පමණක් වර්ෂය තුළ අලෙවි කර තිබුණි. රු.මිලියන 1,854.19ක වටිනාකමකින් යුත් ඛනිජ වැලි මෙ.ටොන් 187,951 ක තොගයක් යන්ත්‍රාගාරයෙහි ගුදම් තුළ රඳවා ගෙන තිබුණි. ප්‍රධාන ඛනිජ නිෂ්පාදනය වූ ඉල්මනයිට් මෙ. ටොන් 53,856 ක් 2023 වර්ෂය තුළ නිෂ්පාදනය කර වර්ෂය අවසානයේ මෙ.ටොන් 78,287 ක් ඉතිරිව තිබුණු අතර ගුදම් ධාරිතා මට්ටම ඉක්මවා යෑම හේතුවෙන් ඉල්මනයිට් නිෂ්පාදනය 2024 මැයි මාසය වන විට නවතා දැමීමට සිදු වී තිබුණි.

**අනාර්ථික වියදම්**

සමාගම සතුව වීල් ලෝඩර් යන්ත්‍ර 13 ක් පැවතුණද 2023 වර්ෂය තුළ යන්ත්‍ර 7 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර ඉතිරි යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. සේවයේ යෙදවූ යන්ත්‍ර 7 ද වර්ෂය තුළ පැය 17,343 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර වීල් ලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරුවන් 21 දෙනෙකු සේවයේ යොදවා 2023 වර්ෂය තුළ රු.මිලියන 20.37 ක වැටුප්, දීමනා හා අතිකාල ලෙස ගෙවා තිබුණි. එසේවුවද, රු.12,400 ක පැයක රේටයකට කුලී පදනමට ගත් ලෝඩර් යන්ත්‍රයක් ද සේවයේ යොදවාගෙන තිබුණු අතර. එම කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී පැයකට රු.9,500 ක් ඇස්තමේන්තු කර තිබියදී එම රේටයට වඩා රු.2,900 ක් වැඩි මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2023 නොවැම්බර් 17 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කුලී පදනමට ගත් යන්ත්‍රය පැය 817.9 ක් සේවයේ යොදවා යන්ත්‍ර සැපයුම්කරුට රු.මිලියන 7.16 ක් ගෙවා තිබුණි.

**අභාවිත යන්ත්‍ර**

ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරි කර ගැනීම සඳහා ඩ්‍රයර් යන්ත්‍රයක් 2016 ජූනි 30 දින ආනයනය කිරීම සඳහා රු.මිලියන 45.12 ක් ගෙවා තිබුණු අතර එම යන්ත්‍රය ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් කර භාවිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**අභාවිත යන්ත්‍රාගාර**

කැණීම් කරනු ලබන ඛනිජ වැලි වල ගුණාත්මකභාවය වැඩි කිරීම, අනවශ්‍ය ප්‍රවාහන හා මෙහෙයුම් පිරිවැය අඩු කිරීම අරමුණු කරගෙන රු.මිලියන 264.78 ක් වටිනා ජංගම යන්ත්‍රාගාර දෙකක් 2022 නොවැම්බර් මාසයේ සමාගම විසින් මිලදී ගෙන තිබුණු අතර රු. මිලියන 159.34 ක් වටිනා එක් යන්ත්‍රයක් 2023 ක්‍රියාකාරී සැලැස්මට අනුව පොඩුවාකට්ටු ව්‍යාපෘතිය තුළ ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද 2024 අප්‍රේල් 30 දින වන විටත් ස්ථාපනය නොකර පරිශ්‍රය තුළ නිෂ්කාර්යව පැවතුණි.

## ලංකා පොස්පේට් සමාගම

**අභාවිත යන්ත්‍ර**

2014 වර්ෂයේදී රු. මිලියන 35.87 ක් වැයකර මිලදී ගෙන තිබුණු ක්‍රෂර් යන්ත්‍රයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සමාගම් පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණු අතර මීට අදාළ රඳවා ගැනීම් රු. මිලියන 4.39 ක් ද 2014 වර්ෂයේ සිට නිරවුල් කර නොතිබුණි.

**පොල් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය නවතා දැමීම**

2014 වර්ෂයේදී රු.මිලියන 21.23 ක ප්‍රාග්ධනක් වැයකරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා තිබූ අතර මුළු ව්‍යාපෘතිය තුළින් රු.මිලියන 31.71 ක අලාභයක් සිදුවී තිබුණි.

**අනාර්ථික වියදම්**

සමාගම විසින් ඛනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකකයක් රු.350 ක් බැගින් දේශීය සමාගමකින් මිලදී ගෙන විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 දක්වාම යන්ත්‍ර සඳහා භාවිතා කරමින් පැවතුණි. අදාළ භාණ්ඩ ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී තොගය ශූන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින ඒකකයක් රු.79,082 ක් බැගින් රබර් බුෂ් ඒකක 200 ක් රු.මිලියන 15.82 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.70,000 ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම තොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින් රු. මිලියන 15.75 ක අලාභයක් සමාගමට සිදුව තිබුණි. මිලදී ගත් මෙම තොගය විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව සම්බන්ධක ඇණ ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවා නිෂ්කාර්යව තබා තිබුණි.

**අවිධිමත් ප්‍රසම්පාදනයන්**

සමාගමේ TGM-160 Six Roller ඇඹරුම් යන්ත්‍රය සඳහා ගියර් පෙට්ටි උපාංගයක් 2022 වර්ෂයේදී චීනයේ බර යන්ත්‍ර විකුණුම් ආයතනයක් වෙතින් රු.මිලියන 4.80 (එ.ජ.ඩො.13,000) කට ආනයනය කර තිබුණි. මීට අදාළ 2021 නොවැම්බර් 24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව සැපයුම්කරු දකුණු ආසියානු කලාපයේ TGM ඇඹරුම් යන්ත්‍ර අමතර කොටස් සැපයීමේ නියෝජිතයාවීම හේතුවෙන් එම ආයතනයෙන් අදාළ උපාංගය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එහෙත් උපාංගයේ තරඟකාරී වෙළඳපොළ මිලගණන්, පිරිවිතරයන් සහ තරඟකාරී සැපයුම්කරුවන් පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර නොතිබුණි. අදාළ උපාංගය 2023 මැයි 10 වන දින ආයතනයේ ප්‍රධාන ගබඩාව වෙත ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ ආයතනික සාමාජිකයින්ගෙන් සැදුම් ලත් කමිටුවක් විසින් ගියර් පෙට්ටි උපාංගයේ මාදිලියේ වෙනසක් ඇති බැවින් උපාංගය පිළිගත නොහැකි බවට වාර්තා කර තිබුණි. එසේ වුවද සම්පූර්ණ මිල ගෙවා තිබීමත් උපාංගය මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබිම හේතුවෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සැපයුම්කරු සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකිව තිබුණි.

## කහටගහ ග්‍රැපයිට් ලංකා සමාගම

**ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ගැටළු හා නිල නිවාසවල අනවසරයෙන් පදිංචිවීම්**

කහටගහ පතලට අයත් එකතුව අක්කර 32.5 ක් වූ ඉඩම් කොටස් දෙකක් සම්බන්ධයෙන් අයිතිවාසිකම් ඉදිරිපත් කරමින් බාහිර පුද්ගලයින් විසින් පිළිවෙලින් 2004 සහ 2007 වර්ෂ වලදී සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි. එසේ වුවද එම නඩු කටයුතු විගණිත දිනය වූ 2023 මැයි 31 දින වන විටත් අවසන් වී නොතිබුණි. තවද, පතලේ සේවය කළ පුද්ගලයින් තිදෙනෙකුද ඇතුළුව 11 දෙනෙකු පතල් භූමිය තුළ පිහිටි අක්කර 2 රූඩ් 2 යි පර්චස් 7 ක ප්‍රදේශයක් තුළ පිහිටි නිල නිවාසවල අනවසරයෙන් පදිංචි වී සිටින අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කර තිබුණත් 2023 දෙසැම්බර් 31 දක්වාම එම ගැටළුව නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

**අගය එකතු කළ, නිමි හෝ අර්ධනිමි නිෂ්පාදනයන් සිදු නොකිරීම**

මිනිරන් ඛනිජය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් සිදුකිරීම අරමුණු කර ගෙන සමාගමේ විද්‍යාගාරය ස්ථාපිත කර තිබුණද ඊට අදාළ කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි. අපනයනය සඳහා සකස් කරන ලද මිනිරන් සාම්පල තුළ අන්තර්ගත කාබන් ප්‍රතිශතය මිනුම් කිරීම පමණක් එහිදී සිදුකර තිබුණි. සමාගම වර්තමානය වන විට පියලි (Flake- කාබන් සියයට 97-99) සහ චිප්ස් (Chips-කාබන් සියයට 90-92) යන ආකාරවලින් පමණක් මිනිරන් අපනයනය

කරමින් තිබුණු අතර අගය එකතුකර නිමි හෝ අර්ධනිමි වශයෙන් නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි.

**අවිධිමත් ඉඩම් පවරා ගැනීම**

2003 ඔක්තෝබර් 15 දිනැති ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියට අනුව දොඩම්ගස්ලන්ද යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් අවශ්‍යය ඉඩ පහසුකම් කහටගහ පතලට අයත් ඉඩම්වලින් ලබා දීමට 2003 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයක් සඳහා ඉඩම නිදහස් කර තිබුණු නමුත් 2023 වන විට එම කාලයද ඉක්මවා වසර 17 ක් පුහුණු මධ්‍යස්ථානය පවත්වා ගෙන යමින් පවතින නමුත් බදුකුලී ගිවිසුමකට එළඹීමට හා බදුකුලී අයකිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

**මිහිතුල සංවර්ධන කාර්යයන්**

මිහිතුල සංවර්ධන කාර්යයන් අරමුණු කරගෙන පතලේ පළමු අඩි 1130 මට්ටමේ සිට අඩි 2000 මට්ටම දක්වා පිවිසුමට දෙවන පතල් වලක් (2nd shaft) ස්ථාපිත කර මූලික කටයුතු වසර කිහිපයකට පෙර ආරම්භ කර, 2023 වර්ෂයේ රු.මිලියන 8 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

## ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම

**කන්තලේ වැලි කැණීම හා ගං ඉවුර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය**

කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියපුර ග්‍රාම නිලධාරී වසමේ මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන පරිදි තැන්පත් වී ඇති කියුබ් 103,128 ක් වූ වැලි නිධිය ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත පවරා තිබුණි. ඒ අනුව ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය 2022 ජූලි 10 වන දින සිට නතර කර තිබූ එයින් පසු කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදුකර නොතිබුණි. එසේ වුවද, 2022 අගෝස්තු 01 වන දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා වැටුප්, දීමනා, ගෙවල් කුලී, කාර්යාල වියදම්, ගමන් වියදම් යනාදිය සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.77 ක් වියදම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 168.25 ක් වැයකර මහවැලි ගඟේ බාදන වාරක 03ක් ඉදිකිරීමට සමාගම සැලසුම් කර තිබුණි. එයින් එක් බාදන වාරකයක් ඉදිකර අවසන් කර තිබූ අතර ඉතිරි බාදන වාරක 02 හි ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 හා 54 ක් වූ අතර මෙම බාදන වාරක ඉදිකිරීම්වල ගිවිසුම් කාලය ඉක්මවා ගොස් තිබුණි.

**මුතූර් වැලි ව්‍යාපෘතිය**

සමාගම ක්‍රියාත්මක කර තිබුණු මුතූර් වැලි ව්‍යාපෘතියේ කැණීම් කටයුතු 2022 අප්‍රේල් සිට නතර කර තිබුණි. කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදු නොකර 2023 වර්ෂය අවසානය වන විට වැටුප්,


දීමනා, ඉන්ධන, විදුලිය, ගෙවල් කුලී යනාදීය සඳහා රු.මිලියන 1.57 ක් වියදම් කර තිබුණි.

**කැල්සයිට් නිධිය කැණීම් කිරීම** රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක රක්ෂිතය තුල පවතින කැල්සයිට් නිධිය කැණීම් කර අගය එකතුකර අපනයනය කිරීමත්, දේශීය වශයෙන් භාවිත කිරීමත් අරමුණු කරගෙන ව්‍යාපෘතියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව සිදුකිරීමට තීරණය කර තිබුණි. ඒ සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට උපදේශන සේවා ගාස්තු ගෙවීම, ප්‍රවාහන, ගමන් වියදම්, සංයුක්ත දීමනා පරීක්ෂණ ගාස්තු යනාදිය සඳහා 2023 වර්ෂය අවසාන වන විට සමාගම විසින් රු.මිලියන 3.3 ක් වැයකර තිබුණද ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

**වැලි විකුණුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම** කන්තලේ සිරිමංගලපුර වැලි විකුණුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා 2023 ජූනි මස සිට සේවකයන් 06 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර වැටුප් හා වේතන, ඉන්ධන, ගෙවල් කුලී, සුභසාධක, විදුලිය යනාදිය සඳහා රු.මිලියන 1.76ක් වියදම් කර තිබුණි. එහෙත් ව්‍යාපෘතිය නවතා දැමීමට 2024 ජනවාරි මාසයේදී තීරණය කර තිබීම හේතුවෙන් වැය කළ මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ 2023 වර්ෂය නිම වන විට දේශීය හා විදේශීය ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘති 27 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ගිවිසුම් අනුව එම ව්‍යාපෘතිවල මුළු මූල්‍ය වටිනාකම්වල එකතුව රු. මිලියන 763,564.47 ක් වී තිබුණි. 2023 වර්ෂය නිම වන විට එම ව්‍යාපෘතිවල සමස්ත මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 476,942.93 ක් වී තිබුණි.

නියමිත කාලය තුළ නිම කර අදාල ප්‍රතිලාභීන්ට අවශ්‍ය සේවාව ලබා දීමට නොහැකිවීම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පොදු අඩුපාඩුවක් ලෙස නිරීක්ෂණය වූ අතර ඉහත ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 19ක් සඳහා ගිවිසුම් අනුව නිමවිය යුතු කාලය ඉක්මවා අවස්ථා 02 සිට අවස්ථා 08 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබාදී දී තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘති කාලයන් අපේක්ෂිත කාලය ඉක්මවා ආසන්න වශයෙන් වර්ෂ 1.5 සිට 7 ක් දක්වා ගතවී තිබුණත් 2023 වර්ෂය නිමවන විටත් නිම නොවී පැවතුණි. එම ව්‍යාපෘති 19 හි කාල ප්‍රමාදයන් සම්බන්ධව විස්තර පහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ.




රූප සටහන් අංක 2.47 : ව්‍යාපෘති සඳහා කාල දීර්ඝ කිරීම් ලබාදීම
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ඉහත සඳහන් පරිදි අසාමාන්‍ය ලෙස ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම හේතුවෙන් එම ජල සම්පාදන ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින ජනතාවට අවශ්‍ය සේවාව නියමිත පරිදි ලබාදීමට නොහැකිවීම සහ මණ්ඩලයට ලැබීමට ඇති ආදායම් නියමිත කාලයට නොලැබීමෙන් වන පාඩු ආවරණය කර ගැනීම සඳහා ජල ගාස්තු වැඩිකිරීමට සිදුවීම, උපදේශක සේවාව සඳහා ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා විශාල මුදලක් වැය වී තිබීම මෙන්ම පහත උදාහරණ ලෙස දක්වා ඇති පරිදි විවිධ අහිතකර ප්‍රතිඵලයන්ට මුහුණදීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

- මහකොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘති අදියර 01 හි මූලික කොන්ත්‍රාත් පිරිවැයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 3.46 කින් සහ රු.මිලියන 5,917 කින් කොන්ත්‍රාත් පිරිවැය ඉහළ ගොස් තිබුණි.
- රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ නිර්මාණ වෙනස්කම් සඳහා අනුමැතිය ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් එකතුව රු.මිලියන 720 ක් වූ හිමිකම් ඉල්ලා තිබුණි.
- මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කාල දිගු සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 1,304.69 ක හිමිකම් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි.

අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා බල ශක්ති ඉතුරුම් ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචනය හා ඉදිකිරීමේ අධීක්ෂණ උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ වීම මත උපදේශන සේවාවේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 159 කින් ඉහළ ගොස් තිබුණි. ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කිරීමට හේතු ලෙස රටෙහි පැවති කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම සහ ආර්ථික අවපාත තත්ත්වය දක්වා තිබුණද ඉහත සඳහන් ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 12 කම මුල් ගිවිසුම අනුව නිමවිය යුතු දිනය ඉහත සඳහන් ආර්ථික අවපාත හා කොවිඩ් 19 ව්‍යාප්ත වීමට පෙර දිනයන් වී තිබුණි.

රටෙහි පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති සඳහා ණය ආපසු ගෙවීම අත්හිටවන බව 2022 අප්‍රේල් 12 දින නිල වශයෙන් රජය විසින් ප්‍රකාශ කිරීමෙන් පසු ව්‍යාපෘති 31 ක විදේශ ණය වාරික ගෙවීම අත් හිටුවා තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 28 දින පත් කරන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ සහ කඩිනම් කිරීමේ බලතල සහිත නිලධාරි කමිටුව විසින් ව්‍යාපෘති 07ක් 2022 වසර තුළ සම්පූර්ණයෙන් අවසන් කිරීමටත්, ව්‍යාපෘති 14 ක කටයුතු තාවකාලිකව අත්හිටුවීමටත් සහ ව්‍යාපෘති 10 ක් 2023 වසර තුළ සම්පූර්ණයෙන් නිම කිරීමටත් තීරණය කර තිබුණි.

ඉහත තීරණ හේතුවෙන් ඉදිකිරීම්වල අවසන් අදියරේ පැවති ව්‍යාපෘති 14 ක් අතරමග නවතා දමා තිබුණි. නියැදි පරීක්ෂාවට ලක්වූ රු.මිලියන 6,402 ක මුදලක් වැය කල ව්‍යාපෘති 05 ක් එසේ නවතා තැබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලබාදීම දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි.

2023 දෙසැම්බර් 31 දින වනවිට ඉහත ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 24 කට අදාලව එකතුව රු. මිලියන 16,750 ක මිල විචලනයක් සඳහා ඉල්ලුම් කර තිබුණ අතර ඉන් රු.මිලියන 13,631.4 ක මිල විචලනයන්ට අදාලව ගෙවීම් කර තිබුණි. ඒ අනුව තවදුරටත් සාකච්ඡා මට්ටමේ පවතින මිල විචලනයන් ඉල්ලුම් කිරීම් වටිනාකම්වල එකතුව රු.මිලියන 3,118.5ක් වී තිබුණි. ව්‍යාපෘති 11 කට අදාලව නියමිත කාලය තුල අදාල ඉදිකිරීම් නිමකර ණය දෙන ආයතන වෙතින් ණය ප්‍රතිපූර්ණය කර නොගැනීම හේතුවෙන් කැපවීම් ගාස්තු (Commitment Charge) ලෙස එකතුව රු.මිලියන 2,251.53 ක මුදලක් එම ව්‍යාපෘති ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා මහා භාණ්ඩාගාරය විසින් අදාල ණය දෙන ආයතන වෙත ගෙවා තිබුණු අතර එම වියදමින් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් රටට ලැබී නොතිබුණි. තවද ව්‍යාපෘති නියමිත දිනට නිම නොවී හෝ අතරමඟ නැවතී තිබුණද එම ව්‍යාපෘති වලට අදාල ණය වාරික සහ පොලී ගෙවීම නියමිත දිනයන්ට සිදුකළ යුතුව තිබුණි. ඒ අනුව ඉහත සඳහන් ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 24 කට අදාලව අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට නොලැබී ණය වාරික ලෙස එකතුව රු.මිලියන 6,107 ක් ගෙවීමට සිදුවී තිබුණි. එමෙන්ම ඉහත සඳහන් පරිදි අතරමඟ නැවතී ඇති ව්‍යාපාති සඳහා මිලදී ගෙන ඇති යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් වත්කම් නිශ්කාර්යයව හෝ විනාශවෙමින් පවතින බවද නිරීක්ෂණය වී තිබුණි.

ඉහත කී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව තවදුරටත් නිරීක්ෂණය වූ අඩුපාඩු කිහිපයක් පහත සඳහන් වේ.

## ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| **විස්තීර්ණ උපායමාර්ගික සැලැස්ම** | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද විස්තීර්ණ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමට අනුව, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් 2020-2030 කාලසීමාව තුළ මොණරාගල, කිලිනොච්චි සහ මුලතිව් සඳහා ප්‍රතීක පවිත්‍රාගරවල අවශ්‍යතාවක් නොතිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් එම දිස්ත්‍රික්කවල ප්‍රතීක පවිත්‍රාගාර සඳහා රු. මිලියන 345.53 ක් ආයෝජනය කර තිබූ අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිම කරන ලද ප්‍රතීක පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය නිම නොකිරීම හේතුවෙන් 2023 පෙබරවාරි මාසයේ සිට එය ක්‍රියාත්මක නොවීය. |
| **විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන්ගේ සනීපාරක්ෂක පහසුකම්** | ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව, කෑගල්ල, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රු.මිලියන 0.25 බැගින් වූ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන්ගේ සනීපාරක්ෂක ඒකක 84 ක් ඉදිකිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය අවසන් වන විට කෑගල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල ඒකක 48 ක් හෙවත් සියයට 57 ක් පමණක් ඉදිකර තිබුණු අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. |
| **රිදීමාලියද්ද ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය** | ප්‍රතිලාභීන් 250 කට ජලය බෙදාහැරීම සඳහා 2019 දී රු. මිලියන 26 ක් වැයකර ඉදිකරන ලද රිදීමාලියද්ද ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතියෙහි ජලයෙහි තත්වය අපේක්ෂිත මට්ටමේ නොපවතින බැවින් වසර දෙකකට වැඩි කාලයක සිට අක්‍රීයව පැවතුණි. |

## නාගරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 1)

| | |
|---|---|
| **අදාළ නොවන වියදම්** | මෙම ව්‍යාපෘතියේ අරමුදල් උපයෝගී කරගෙන 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 4.39 ක මුදලක් ව්‍යාපෘති අරමුණුවලින් පරිබාහිර වෙනත් කටයුතු සඳහා වැය කර තිබුණි. |

## මහකොළඹ ජලය හා අප ජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 01

**මණ්ඩලයේ වත්කම් ලේඛනවල ඇතුළත් නොවූ වත්කම්**

ව්‍යාපෘතිය යටතේ මිලට ගත් Crew Cabs 14 ක් හා Double Cabs 07 ක් මණ්ඩලයට වෙත පැවරුබව ප්‍රකාශ වුවද මණ්ඩලයේ වත්කම් ලේඛන අනුව වාහන 16 ක් ලබා දී ඇති බව තහවුරු විය. මේ අනුව එකතුව රු.මිලියන 28.46 ක වාහන 5 ක් පිළිබඳව විගණනයට සාක්ෂි ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණය අපොහොසත් විය.

**DMA මීටර් අක්‍රියව පැවතීම**

කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 49 සිට 18 දක්වා අඩු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර ආදායම් නොලබන ජල කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවාහ මිනුම් දත්ත ලබා ගැනීමට සහ ඉලක්කයේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට DMA මීටර් 36 ක් එ.ජ.ඩො. 383,710.2 ක් එනම් දළ වශයෙන් රු.මිලියන 115 කට ස්ථාපනය කොට තිබුණි. කෙසේ වෙතත්, 2024 මැයි 28 විගණන දින වන විට ඉහත DMA මීටර් 36 න් 31 ක්ම අක්‍රියව පැවතුණි.

**විධිමත් ලෙස ස්ථාවර වත්කම් භාර නොදීම**

ව්‍යාපෘතියේ කටයුතු වසර දෙකක සිට අවසන් කර කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණද, රු.මිලියන 16,452.7 ක් වටිනාකමින් යුත් ස්ථාවර වත්කම්වලට අදාළ වත්කම් ප්‍රාග්ධනීකරණ කටයුතු අවසන් කර නොතිබුණි. එමෙන්ම 2024 අගෝස්තු 31 දක්වා වත්කම් භාරදීමේ ආකෘති පත්‍ර මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත විධිමත් ලෙස ස්ථාවර වත්කම් භාර දී නොතිබුණි. තවද, නල එළන ලද සියලුම මාර්ග කොළඹ මහ නගර සභාවට පවරා දෙවසරක් ගතවී ඇතත්, ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් තබා ඇති රු. මිලියන 109.83 ක් ආරක්ෂක තැන්පතු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## මහකොළඹ ජලය හා අප ජලය කළමණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- ව්‍යාපෘති 02

**ස්ථාපනය කරන ලද DMA මීටර් 23 ක් අක්‍රියව පැවතීම**

ICB 04 කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ නගරයේ දකුණු කොටසේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23 ක (DMAs) ආදායම් නොවන ජලය කළමනාකරණය කිරීම සඳහා ජල ප්‍රවාහ මිනුම් දත්ත රැස් කිරීමට එ.ජ.ඩොලර් 246,337.8 (වත්මන් වටිනාකම දළ වශයෙන් රු. මිලියන 73.9) වටිනා DMA මීටර් 23 ක් ස්ථාපනය කර තිබුණි. කෙසේ වෙතත්, 2024 මැයි 02 දින සිදු කරන ලද විගණනයේදී එම සියලු මීටර් දෝෂ

සහිත බවත්, 2021 වසරේ සිටම සමහර මීටර අක්‍රියව පවතින බවද නිරීක්ෂණය විය.

**ගෘහස්ථ ජල මීටර් තොගයක් අස්ථානගතවීම**

ICB 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කටයුතු සඳහා ආනයනය කරන ලද රු. මිලියන 51.36 ක වටිනාකමින් යුත් “NWS&DB” ලෙස සංකේතවත් කරන ලද Ningbo වර්ගයේ ගෘහස්ථ ජල මීටර 6548 ක තොගයක් කොන්ත්‍රාත්කරු භාරයේ තිබියදී අස්ථානගතවී තිබුණි. මෙලෙස අස්ථානගත වූ ජල මීටර 913 ක් පුද්ගලික සමාගමක විකිණීමට තබා තිබියදී සොයා ගෙන තිබුණි.

**ලාභ සහ පොදු කාර්ය වියදම්**

ජල සම්පාදන මණ්ඩලය සඳහා ගෘහස්ථ ජල මීටර 122,500 ක් සහ Gunmetal furrules 100,000 ක් ආනයනය කිරීම සඳහා ණයවර ලිපිය (LC) විවෘත කිරීම සඳහා ICB 3 කොන්ත්‍රාත්කරු වෙත ව්‍යාපෘතියේ අරමුණ උල්ලංඝණය කරමින් රු. මිලියන 870 ක් ගෙවා තිබූ අතර එම වටිනාකම තුල සියයට 15 ක් වූ කොන්ත්‍රාත්කරුගේ ලාභය සහ පොදු කාර්ය වියදම් ලෙස රු. මිලියන 113.56 ක් ඇතුලත් විය. තවද මෙම ව්‍යාපෘතිය මගින් ජල සම්පාදන මණ්ඩලයේ භාවිතය සඳහා රු. මිලියන 1,657.87 ක් වටිනා ජල සම්බන්ධතා ද්‍රව්‍ය සහ රු. මිලියන 293.85 ක් වටිනා රසායනික ද්‍රව්‍ය ICB 4 සහ ICB 3 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් හරහා ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ උල්ලංඝනය කරමින් ඉහත සැපයුම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ලාභය සහ පොදු කාර්ය වියදම් (15%) ලෙස ව්‍යාපෘතිය රු. මිලියන 254ක් ගෙවා තිබුණි.

**තෙලවල පුහුණු මධ්‍යස්ථානය**

ව්‍යාපෘති පුහුණු හා සංවර්ධන ධාරිතා වැඩිදියුණු කිරීමේ යෝජනාව යටතේ රු. මිලියන 1,571 ක වියදමකින් මණ්ඩලයේ අභ්‍යන්තර අවශ්‍යතා සඳහා පමණක් නොව වාණිජ පදනම මත බාහිර ක්‍රියාකාරකම් සඳහාද යොදාගත හැකි වන පරිදි තෙලවල පුහුණු මධ්‍යස්ථානය (CEWAS) ඉදිකොට තිබුණු අතර 2022 දෙසැම්බර් 16 දින සිට මණ්ඩලයේ නිළධාරීන් යොදාගනිමින් එහි ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණි. 2023 වර්ෂය තුළ එහි නඩත්තුව සඳහා රු. මිලියන 41.63 ක් පමණ වැය කර තිබූ අතර මුළු ආදායම රු. මිලියන 27.28 ක් විය. ඒ අනුව එම කාලය තුළ පාඩුව රු. මිලියන 14.35 කි. තවද, රු. මිලියන 7.22ක් වටිනා උපකරණවලින් යුත් වර්ග මීටර් 337.5ක අංගසම්පූර්ණ කාර්යාල පරිශ්‍රය, වර්ග මීටර් 74ක් සහ වර්ග මීටර් 50ක ඉඩ ප්‍රමාණයකින් යුත් පරිගණක විද්‍යාගාර 2ක්, වර්ග මීටර් 73ක පුස්තකාලයක් හා රු. මිලියන 4.1ක ව්‍යායාම උපකරණ සමග වර්ග මීටර් 55 ක ව්‍යායාම ශාලාවක් විවෘත කළ දින සිට කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව නිශ්ක්‍රීයව පැවතුණි.

**ඉලක්ක ළඟා කර ගැනීම**

ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 ට වඩා අඩුකර වඩා හොඳ ජල සම්පාදන සේවාවක් ඵලදායී ලෙස ලබාදීමේ අරමුණින් මෙම

ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කර මාස 111ක් ගතවී ඇතත්, කටයුතු සම්පූර්ණයෙන් නිමකර ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී තිබුණේ දිස්ත්‍රික් මිනුම් කලාප (DMA) 42 න් කලාප 25ක් පමණි. මේ හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය සපුරා ගත්තේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් රු. මිලියන 2,902.76 ක ණය ආපසු ගෙවීම්ද බැදීම් ගාස්තු සහ පොලී ගාස්තු ලෙස පිළිවෙලින් රු. මිලියන 9.27 ක් හා රු. මිලියන 295.86 ක් ද 2023 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ගෙවා තිබුණි.

ව්‍යාපෘතියේ සංශෝධිත අවසන් කිරීමේ දිනය ඉක්මවා විගණන දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටත් වසර 2ක් ගතවී ඇතත් රු. මිලියන 14,599ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදී නොතිබුණි.

## මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය - 03

**කාල දීර්ඝ කිරීමේ ගාස්තු ගෙවීම**

ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදෙන ලද කාල දිගුමත පදනම්ව ICB 01 සහ ICB 02 කොන්ත්‍රාත්කරුවන් වෙත පිළිවෙළින් එ.ජ.ඩො. 385,759.65 සමඟ රු.මිලියන 345, එ.ජ.ඩො. 1,637,367 සමඟ රු.මි. 89.7 ක් සහ ICB 3 කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 436.48 ක් ව්‍යාපෘති උපදේශකවරයාගේ අනුමැතියකින් තොරව කාල දීර්ඝ කිරීමේ පිරිවැය (Prolongation Cost) වශයෙන් ව්‍යාපෘති අරමුදල් භාවිතා කර ගෙවීම් කර තිබුණි.

**විචල්‍ය හිමිකම් ගෙවීම**

කාලය දීර්ඝ කිරීම්වලට අදාළ ලේඛණ වලට අනුව (EOT) කොන්ත්‍රාත් වටිනාකම හැර අමතර පිරිවැයක් සඳහා හිමිකම්පෑමට කොන්ත්‍රාත්කරු වෙත අයිතියක් නොමැති බවට කොන්ත්‍රාත්කරු එකඟවී ඇතත් එම කොන්දේසියට බැහැරව යමින් කොන්ත්‍රාත්කරුගේ විචල්‍ය හිමිකම් සඳහා රු.මිලියන 532.91 ක් සහ එ.ජ.ඩො. 3,046,465 ක් ව්‍යාපෘතිය විසින් ගෙවීමට පියවර ගෙන තිබුණි.

**අවසාන ද්‍රව්‍යමය සැසඳුම් සිදු නොකිරීම**

ව්‍යාපෘතියේ ICB 01 සහ ICB 02 කොන්ත්‍රාත්තුවල භෞතික කාර්යයන් පිළිවෙලින් 2022 මාර්තු 15 සහ 2022 මැයි 21 දින වන විට සම්පූර්ණ කර තිබුණද විගණිත 2024 මැයි වන විටත්, අවසාන බිල්පත් ගෙවීම් සිදුකර නොතිබුණි. එමෙන්ම උක්ත කොන්ත්‍රාත් දෙකෙහි කටයුතු සම්පූර්ණ කර වසර 2 ක් ගතවුවද FIDIC කොන්දේසිවල 7.6 වගන්තිය අනුව අවසාන බිල්පත් නිරවුල් කිරීමට පෙර සිදුකළ යුතු අවසාන ද්‍රව්‍යමය සැසඳුම් (Material reconciliation) සිදුකර නොතිබුණි.

## අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

**අනාර්ථික වියදම්**

ICB 3 කොන්ත්‍රාත්තුව යටතේ මොරගස්මුල්ල ජල ටැංකියට ජලය පොම්ප කිරීම සඳහා මොරගස්මුල්ල ප්‍රදේශයේ බූස්ටර පොම්පාගාරයක් ඉදිකිරීමට රු. මිලියන 86 ක් වෙන් කරන ලද අතර එහි ඉදිකිරීම් කටයුතු සියයට 93.88 ක් දක්වා නිම කිරීමෙන් පසු ජල සම්පාදන මණ්ඩලය විසින් එම ටැංකියට ජලය සැපයීමට තීරණය කිරීමත් සමඟ එම ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. ICB 03 කොන්ත්‍රාත්තුව යටතේ මාලිගාකන්ද ප්‍රදේශය දක්වා එළන ලද මිලිමීටර් 1200 සම්ප්‍රේෂණ නළයට සෘජුවම නල මාර්ගය සම්බන්ධ කිරීම මගින් මොරගස්මුල්ල ජල ටැංකිය අධි පීඩනයකින් යුක්ත එකක් බවට පත්ව තිබුණි. කෙසේ වෙතත්, මෙම තීරණය ගන්නා විට මිල විචලන සඳහා කරන ලද ඉල්ලීම සඳහා වූ රු.මිලියන 28.86 සමග එකතුව රු.මිලියන 66.5 ක් වැය කර තිබුණි.

**නිම නොකල ඉදිකිරීම්**

වසරක් ඇතුළත සේවක නිලනිවාස 6 ක් ඉදිකිරීම සඳහා වටිනාකම රු. මිලියන 129 ක කොන්ත්‍රාත්තුවක්, 2021 අගෝස්තු 10 වැනි දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. කෙසේ නමුත් 2023 සැප්තැම්බර් දක්වා කාල දීර්ඝ කිරීම් හතරක් ලබා දී ඉතිරි වැඩ කිහිපයක් තිබියදී මණ්ඩලය විසින් අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. 2023 සැප්තැම්බර් 11 දිනට අවසන් සහතික කළ බිල් වටිනාකම අනුව රු.මිලියන 131.51 කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබූ අතර ඒතුල රු.මිලියන 44.12 මිල විචලතා ගෙවීමක්ද ඇතුළත් වී තිබුණි. කෙසේ වෙතත් විගණිත දින වූ 2024 ජුලි 10 වන විටත් ඉදිකිරීම් පරිශ්‍රයන්වල ටයිල් වැඩ ඇතුළු නිමා කිරීම් වැඩ ඉතිරිව පැවතුණි. ඒ අනුව ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම තුල ඉදිකිරීම් පූර්ණ වශයෙන් නිමකර ගැනීමට ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## අළුත්ගම, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

**අපේක්ෂිත ජල ධාරිතාවය නොලැබීම**

මෙම ව්‍යාපෘතියට අදාල ජල පවිත්‍රාගාරයට දෛනිකව ලබාදිය යුතු ඝණමීටර 78,500 ක ජලධාරිතාවය සහතික කිරීම සඳහා පැරණි තුළුමුව නවීකරණය කිරීමට යෝජිත වී තිබූ අතර ඒ වෙනුවෙන් වෙන්කර තිබූ එ.ජ.ඩොලර් මිලියන 9.1 ක ඇස්තමේන්තුගත පිරිවැයෙන් එ.ජ.ඩොලර් මිලියන 7.2 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද නවීකරණ කටයුතු අවසන් කර නොතිබූ අතර සවිකරන ලද නව පොම්පවලින් ලබාගතහැකි වී තිබුණේ ඝණ මීටර් 57,000 ජල ධාරිතාවයක් පමණි.

2024 පෙබරවාරි 2 වන විට පැරණි තුළුමුවේ මෙහෙයුම් කටයුතු සම්පූර්ණයෙන් නවතා දමා තිබූ අතර නව පොම්ප සවිකිරීමේ දෝෂ, පොම්පවල පවතින අධික දෙදරීම පාලනය කළ නොහැකි වීම වැනි හේතු ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**නව පොම්පවල දෝෂ පැවතීම**

එසේම මුහුදු ලවණ මිශ්‍රිත කාලය තුළදී පමණක්, කි.මී. 15.5 ක් දුරින් පිහිටි කොලේමෝදර නව තුළුමුවෙන් කෙත්හේන ජල පවිත්‍රාගාරය වෙත අමුජලය සම්ප්‍රේෂණය කිරීමට සැලසුම්කළද පැරණි තුළුමුවේ නව පොම්පවල පවතින දෝෂ හේතුවෙන් වරින්වර පිරිපහදුව වෙත නව තුළුමුවෙන් අමු ජලය පොම්ප කිරීමට සිදුවීම නිසා, පොම්ප අක්‍රීය වූ කාලය තුල පමණක් රු.මිලියන 106 ක අමතර විදුලි වියදමක් මණ්ඩලයට දැරීමට සිදුව තිබුණු අතර එම වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකරගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. තවද පැරණි තුළුමුව පරිශ්‍රයේ එ.ජ.ඩොලර් 490,000 ක් වැයකර ස්ථාපනය කරන ලද විදුලිජනන යන්ත්‍රය නිසි ප්‍රමිතියෙන් තොරවීම නිසා වසරක් ඉක්ම යාමට ප්‍රථම අක්‍රීය වී තිබුණු අතර එහි දෝෂ සඳහා වගකීම්කාලය ඉකුත්වීමට පෙර නිසි ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපෘති කළමනාකරණය අපොහොසත්ව තිබුණි.

**රොන්මඩ සණීකරණ ඒකකය**

ධාරිතාවයට සරිලන පරිදි අඩුපිරිවැයක් යටතේ රොන්මඩ තටාංගනයක් ඉදිකිරීම් වෙනුවට, කොන්ත්‍රාත්කරුගේ නිර්මාණ සැලසුම් සමාලෝචනය සහ නිසි අධීක්ෂණයකින් තොරව එ.ජ.ඩොලර් මිලියන. 4.76 ක (වර්තමාන රු.මිලියන 1,428) පිරිවැය ඇස්තමේන්තුවක් මත ඉදිකරන ලද සැලසුම්කල රොන්මඩ සණීකරණ ඒකකයේ භෞතික ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 90 ක් පමණක් වූ අතර ඒ වන විට කොන්ත්‍රාත්කරු වෙත ඇස්තමේන්තුගත මුදලින් සියයට 98 ක් ගෙවා අවසන් කර තිබුණි. කෙසේ නමුත් එකදු පරීක්ෂණ වටයක් හෝ ක්‍රියාත්මක කොට නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ලබාදිය යුතු සේවක පුහුණු කිරීමේ වැඩසටහන්ද කොන්ත්‍රාත්කරු විසින් ලබාදී නොතිබුණි.

## වාරිමාර්ග අංශය

| ව්‍යාපෘතියේ නම | ණය/ආධාර මුදල | | 2023.12.31 දිනට උපයෝජනය | | | 2023.12.31 දිනට ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | ආරම්භක වර්ෂය | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| මහවැලි ජල සුරක්ෂිතතා ආයොජන වැඩසටහන (ශ්‍රී ලංකා රජය/ආසියානු සංවර්ධන බැංකුව)(MWSIP) | 557.50 | 160,356 | 2015 | 368.16 | 92,849 | 57.90 | 45 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ මුහුණ දීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (හරිත දේශගුණික අරමුදල /එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) (CRIWMP)** | 52.08 | 10,416 | 2017 | 36.75 | 7,351 | 70.56 | 82 |
| **ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (ලෝක බැංකුව)(IWWRMP)** | 45.03 | 13,939 | 2021 | 10.31 | 3,215 | 23.07 | 38.60 |
| **දේශගුණික බලපෑම් අවමකිරීමේ බහු අදියර වැඩසටහන (CResMIPA)** | 93.00 | 27,900 | 2021 | 2.231 | 677 | 2.42 | 25.60 |
| **නාච්චිදූව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය** | 93.00 | 156 | 2020 | 0.0436 | 79 | 51.09 | 100 |
| **නකල්ස් කඳුවැටියේ අවධානමට ලක්ව ඇති ගංඟා ද්‍රෝණි,දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) GCF Knuckels)** | 48.97 | 7,836 | 2023 | 0.0827 | 26 | 0.34 | 1 |
| **උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය** | 529.05 | 99,100 | 2010 | 508.45 | 84,256 | 85.02 | 99.66 |

වගු අංක 2.34 :වාරිමාර්ග අංශයේ ව්‍යාපෘති

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- අදියර 01

**මිණිපේ අමුණ එසවීමේ කොන්ත්‍රාත්තුව**

මිණිපේ වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් සහිතව මිණිපේ අමුණ එසවීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 1,864.8 ක බදු රහිත වටිනාකමට විදේශ සමාගමකට 2018 ජනවාරි 05 දින භාර දී තිබූ අතර, එය 2020 නොවැම්බර් 12 දින අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත් කාලය 2021 ජූලි 13 දින දක්වා දින 243කින් දීර්ඝ කර තිබුණි. අනතුරුව මෙම කොන්ත්‍රාත්තුව දින දීර්ඝ කිරීමෙන් තොරව වසර 02 කට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, මෙම කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 22 ක් විය. මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 2,912.85 දක්වා වැඩිකර ඉතිරි වැඩ මුල් කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කරවා ගැනීමට සංශෝධිත ගිවිසුම් අංක 02 අත්සන් කිරීමටත්, කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 21 දින දක්වා වැඩි කිරීමටත් 2023 ජූනි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව යටතේ යෝජිත මිණිපේ අමුණ මධ්‍යයේ රොන් මඩ ඉවත් කිරීමේ දොරටුවක් සවි කිරීමට සැලසුම් කර තිබී, එය සවිකිරීම තුළින් පසුකාලීනව දොරටුව ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේදී ප්‍රායෝගික ගැටළු ඇතිවිය හැකි බවට හඳුනා ගැනීමෙන් පසු එම වැඩ විෂයය ඉවත් කිරීම සඳහා දින 134 ක් ලබාදී තිබීම මතභේදයට තුඩුදී තිබුණි.

**ඇළ මාර්ගයේ ඉදිකිරීම් නවතා දැමීම**

මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 6.225 ක් දුරට ඉදිකරන ඇළ මාර්ගයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 64 ක්ව තිබියදී කොන්ත්‍රාත්කරුට ඇති වූ මූල්‍ය අවහිරතා මත කොන්ත්‍රාත්තුව තවදුරටත් කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් එකී කොන්ත්‍රාත්තුව 2021 ජූලි 13 දින අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර අලාභය අයකර ගැනීමට උත්සාහ දැරීමේදී කොන්ත්‍රාත්කරු පැවරූ නඩුවක් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ලබා දුන් අත්තිකාරම් සුරක්ෂණයෙන් රු. මිලියන 185.89 ක්ද කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම වූ රු. මිලියන 390.51 ක්ද මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**වයඹ ඇළ මාර්ගය ඉදි කිරීම**

වයඹ ඇළ මාර්ගයේ නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා කි.මී. 17+050 ක ඇළ ඉදි කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2018 – 2021 කාලය තුළ නිම කළ යුතු වුවත් ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශවල ඉඩම් කොටස් පවරා ගෙන භූමියේ අයිතිය නිරවුල් කර භාරදීමට වසර 2 ½ ක කාලයක් ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 05 දක්වා අවස්ථා 04 කදී

කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. එහිදී ඉඩම් හිමිකරුවන් 03 දෙනෙකුට අදාළ වන්දි සම්බන්ධ ගැටළුවක් හේතුවෙන් ඇළ මාර්ගයේ මීටර් 355 ක ප්‍රමාණයක් ඉදිකිරීමට නොහැකිව කොන්ත්‍රාත්තුව දීර්ඝ කාලයක් ප්‍රමාද වී තිබුණි.මෙකී ප්‍රමාද වීම හේතුවෙන් වැට් බදු සහිතව රු. මිලියන 7,226.62 කට ලබා දී තිබූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 15,154.74 දක්වා රු. මිලියන 7,928.12 කින් එනම්, සියයට 110 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික හා මූල්‍ය අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම හේතු ලෙස දක්වමින් මිල විචලනය සඳහා වෙන් කර තිබූ රු. මිලියන 162 , රු. මිලියන 5,827.7 දක්වා වැඩි කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩ හා ප්‍රමාණ වෙනස් වීම් සඳහා රු. මිලියන 540 ක් වෙන්කර තිබුණද එය රු.මිලියන 2,024.9 දක්වා රු.මිලියන 1,484.9කින් වැඩි කර තිබුණි. එහිදී මීටර් 13 ක් පළලට විවෘතව සකස් කිරීමට සැලසුම් කර තිබූ ඇළ මාර්ගය පසුව උපදේශක සමාගම විසින් මීටර් 10 ක් පළලට ඇළ මාර්ග 02 ක් ලෙසට සංවෘතව කොන්ක්‍රීට් යොදා සකස් කිරීමට තීරණය කර ඒ අනුව සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් කොන්ක්‍රීට් ඝන මීටර් 45,425 ක් අතිරේකව යොදාතිබූ අතර රු. මිලියන 1,245.54 ක් අතිරේකව වැය කිරීමට සිදුව තිබුණි. මෙහිදී උපදේශක සමාගමේ නිර්මාණ සැලසුම් කිරීමේ ප්‍රවීණත්වය අභියෝගයට ලක්ව තිබුණි.

**සැලසුම් කිරීම හා උපදේශන සේවා ලබා දීම**

මෙම වැඩසටහන සූදානම් කිරීමේ තාක්ෂණ සහාය (PPTA) සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ කණ්ඩායමේ ප්‍රධානියා පසුව මෙම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට බැඳී ව්‍යාපෘතියේ Team Leader & Chief Design Engineer ලෙස වසර 07 ක කාලයක් සේවය කරමින් පැවතුණි. ඒ සඳහා මාසිකව යුරෝ 26,000 (රු.මිලියන 8.5) වැටුපක් ගෙවමින් පැවතුණු අතර, 2023 ජූනි වනවිට ඔහු වෙත රු. මිලියන 702.18 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සහාය වූ පුද්ගලයෙකු වැඩසටහනේ උපදේශන සමාගමේ සේවය කිරීම තුළින් වැඩසටහන් සුපරීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයකට ලක්ව තිබුණි. මෙම උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කල උපදේශකවරුන් යොදා ගැනීම සඳහා වූ අත්පොතෙහි 1.11 ඡේදයටද පටහැණි විය.

**කාල පදනමට උපදේශක ගාස්තු ගෙවීම**

ඉදිකිරීම් කොන්ත්‍රාත්වල කාර්යසාධනය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීම කලයුතු වුවත්, කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීම සඳහා 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයකට

එ.ජ.ඩොලර් මිලියන 22.09 ක වටිනාකමකට දේශීය උපදේශන සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් කටයුතුවල ඇති වූ ප්‍රමාදය නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමෙන් මෙම දීර්ඝ වූ කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තුද ගෙවීමට සිදුවීමෙන් කොන්ත්‍රාත් ගිවිසුම 2024 ජූනි 30 දක්වා අවස්ථා 06 කදී දීර්ඝ කර පිරිවැය එ.ජ.ඩොලර් මිලියන 41.56 දක්වා වැඩිකර ගෙන තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අදියර 01 සහ 02 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට වෙන්කර තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 25.93 ක් බැවින්, අනිකුත් වියදම් සඳහා වෙන්කළ මුදලින් වැඩි වූ උපදේශක ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.

**දේශීය හා විදේශීය උපදේශන සේවා වියදම්**

ව්‍යාපෘතිය ආරම්භයේදී විදේශිකයින් 34 දෙනෙකු උපදේශන කටයුතු සඳහා බඳවා ගෙන තිබූ අතර, වර්තමානයේ විදේශිකයන් 08 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. විදේශීය පුද්ගලයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 (රු. මිලියන 5.5 සිට රු. මිලියන 9) දක්වා පරාසයක වැටුප් ද, යුරෝ 110 සිට 70 අතර පරාසයකදී දිනකට යැපීම් දීමනා ද ගෙවමින් පැවතුණි. මෙම විදේශීය පුද්ගලයන් වෙත 2023 ජූනි 30 දිනට යුරෝ 12,843,998 (රු.මිලියන 4,341) ක වැටුප් ගෙවා තිබුණු අතර යුරෝ 1,068,599 (රු.මිලියන 361.18) ක යැපීම් දීමනා ද ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු සඳහා විදේශීය උපදේශන සමාගම මඟින් එයට අනුබද්ධ දේශීය සමාගම් 02 ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, මේවන විට 110 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සහ කොන්ත්‍රාත් ක්‍රියාත්මක වන ප්‍රදේශවල පිහිටා ඇති වැඩබිම් කාර්යාල 08 ක සේවය කරන 48 ක කාර්ය මණ්ඩලයක් සඳහාද කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවමින් පැවතුණි.

**උපදේශන සමාගම සඳහා වෙනත් වියදම්**

මීට අමතරව ව්‍යාපෘතියට අයත් වාහන 14 ක්, යතුරු පැදි 03 ක් උපදේශන සමාගම වෙත ලබා දී තිබූ අතර 2023 ජූනි 30 දිනට ඒවායේ මෙහෙයුම් හා නඩත්තුව සඳහා රු. මිලියන 67 ක්, උපදේශන සමාගමේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම සඳහා රු. මිලියන 9.65 ක්, උපදේශන සමාගමට අයත් කාර්යාල පිහිටුවීම සඳහා රු. මිලියන 13.47 ක්ද ඒවා නඩත්තු කිරීම සඳහා රු. මිලියන 84.83 ක්ද 2023 ජූනි 30 දිනට වැය කර තිබුණි.

**මහපෙන්වීම්වලට පටහැනි ලෙස උපදේශක බඳවා ගැනීම**

2013 වර්ෂයේ නිකුත් කළ ආසියානු සංවර්ධන බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මහ පෙන්වීම් අත්පොතෙහි 1.11 (b) සහ (c) ඡේද අනුව තෝරා ගන්නා උපදේශක අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් (උදා:- නිර්මාණ සැලසුම් සකස් කිරීම, පාරිසරික ඇගයීම්) කලින් සිදුකර තිබෙනම් උපදේශන කටයුතු සඳහා නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ණය ගන්නා ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ. එසේ වුවද මෙම වැඩසටහනේ උතුරු මැද හා වයඹ ඇළවල් ඉදිකිරීම සහ මිණිපේ ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල නිර්මාණ සැලසුම්, පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා අධ්‍යනය වාර්තා හා Modification Report සකස් කර ඒ සඳහා රු. මිලියන 102.98 ක මුදලක් රාජ්‍ය සමාගමක් හරහා ලබාගත් සමාගමක් පසුව මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශක සමාගමේ ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස 2015 වර්ෂයේ සිට කටයුතු කරමින් පැවතුණි. තවද මෙම සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරු වූ වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරින්ගෙන් සමන්විත විය.

**මහකිතුල උමං මාර්ගය, මහකිතුල හා මහකිරුල ජලාශ හා ඇළ ඉදිකිරීම**

මහකිතුල උමං මාර්ගය, මහකිතුල හා මහකිරුල ජලාශ 02 හා එම ජලාශ 02 ක අතර ඇළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2020 – 2024 කාලය තුළ රු. මිලියන 9,978.48 ක වටිනාකමකට ඉදිකිරීමට භාරගත් සමාගමට ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් සහ ඉදිකිරීම් උපකරණ නොමැති වීම, දුර්වල වැඩබිම් කළමනාකරණය මත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රගතිය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2023 මැයි 26 අවලංගු කර තිබූ අතර, ඒ වනවිට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක් විය. මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම සහ ඒ අතර පිහිටි මහදඹේ ජලාශය වැඩි දියුණු කිරීම සඳහා අක්කර 778 ක කැලෑ ප්‍රදේශයක පිහිටි ගස් 47,552 ක් දැව සංස්ථාව විසින් කපා ඉවත් කර තිබුණි.

කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වනවිට මහකිතුල ජලාශයේ වැව් බැම්ම සකස් කිරීම සඳහා අත්තිවාරම් කපා මැටි දමා අදාළ වැව් බැම්මේ සියයට 1.5 ක වැඩ නිමකර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 58.2 ක් වැයකර තිබුණි. එම ඉදිකිරීම අධීක්ෂණය සඳහා උපදේශන වියදම් ලෙස රු. මිලියන 139 ක් වැයකර තිබුණි.

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 02

**කි.මී.277 ක් දිග උමං ඇළ ඉදිකිරීම**

මෙම උමං ඇළ ඉදි කිරීමේදී මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. මෙහිදී තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කිරීමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි.

**01 වන උමං විදුම් යන්ත්‍රයේ පිරිවැය**

01 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු. මිලියන 4,535ක විශාල මුදලක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.

**02 වන උමං විදුම් යන්ත්‍රය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් 02 වෙනි උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම නිර්දේශ කර නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවටත් කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබිය දී නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි. 02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්, රු. මිලියන 6,021.87 ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් පිටතට එන අවස්ථාව වන විට රු. මිලියන 3,635.61 ක් වැය කර තිබුණි. ඒ අනුව, ත්‍රිකුණාමලය සිට කෝඳුරුවාව දක්වා ප්‍රවාහනය කර එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු. මිලියන 3,055.36 ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.

**ඇළ මාර්ගයේ ඉතිරි කි.මී.68.3 ඉදිකිරීම සඳහා සැලසුමක් නොවීම**

2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට මොරගහකන්ද ජලාශයේ සිට කනදරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් නිම කිරීමට මේවන විට සැලසුම් කර ඇති බැවින් කි.මී. 68.3 වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර එහි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දින තෙක් ඉදිරිපත්ව නොතිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාත් ඇල ඉදිකිරීම මගින් මහකනදරාව ජලාශයට ලැබෙන ජලය භාවිතා කර රඹෑව, මැදවච්චිය ප්‍රදේශයට පානීය ජලය සැපයීම සඳහා රු. මිලියන 11,515ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ  අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනයේ ණය ආධාර මත ආරම්භ කර එහි වැඩ කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි.

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

**ව්‍යාපෘති ප්‍රතිපාදන අඩු කිරීම**

ව්‍යාපෘතියට යෙදවීමට නියමිතව තිබූ එ.ජ.ඩොලර් මිලියන 75.03 ක මුදල එ.ජ.ඩොලර් මිලියන 35.03 දක්වා එ.ජ.ඩොලර් මිලියන 40කින් අඩු කිරීමට 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. ඒ අනුව, ලෝක බැංකුවේ ජාත්‍යාන්තර සංවර්ධන සංගමය ව්‍යාපෘතියට ලබා දීමට එකඟ වූ ඇ. ඩොලර් මිලියන 25 ක් අවලංගු කිරීමටත්, තවත් ඇ.ඩො. මිලියන 10 ක මුදලක් ව්‍යාපෘති වැඩ කටයුතුවලින් ඉවත් කර දිස්ත්රික් 25 හි දිස්ත්‍රික් සම්බන්ධීකරණ, කමිටු අනුමත කරන වාරිමාර්ග, මහවැලි, උතුරු, නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග, ප්‍රජා මූලික සංවිධාන හරහා පුනරුත්ථාපනය කිරීමටත්, ශ්‍රී ලංකා රජය ව්‍යාපෘතියට යොදවන ඇ.ඩො. මිලියන 05 ක මුදල අවලංගු කිරීමටත් තීරණය කර තිබුණි.

**අම්පාර සේනානායක සමුද්‍රයේ රලපනාව සහ මාර්ගය ඉදිකිරීම**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අම්පාර සේනානායක සමුද්‍රයේ රලපනාව සහ වැව් බැම්ම මත පවතින මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා රු. මිලියන 532.85 (බදු රහිත) ක වටිනාකමට කොන්ත්‍රාත්තුවක් 2022 දෙසැම්බර් 28 දින පිරිනමා තිබුණි. එකී රලපනාව සකස් කිරීමේදී අඩු ගුණත්වයෙන් යුත් කළුගල් යොදා එයට මතුපිටින් ඉහළ ගුණත්වයේ

කළුගල් යොදන බවට මාධ්‍ය මගින් ප්‍රචාරණය වී තිබුණි. මේ සම්බන්ධව ව්‍යාපෘතිය විසින් විමර්ශණයක් සිදුකර තිබූ අතර රළපනාව සකස් කිරීම සඳහා වැඩබිම වෙත ප්‍රවාහනය කර තිබූ කළුගල් වර්ග දෙකක කියුබ් 282 ක් ප්‍රමිතියෙන් තොර බවට එහිදී හඳුනාගෙන තිබූ අතර ඒවා කොන්ත්‍රාත්කරු ලවා වැඩ බිමෙන් ඉවත් කිරීමටත් රළපනාවට යොදා ඇති ප්‍රමිතියෙන් තොර ගල් ඉවත් කර නැවත පිළිසකර කිරීමටත් පියවර ගෙන තිබුණි. වාරිමාර්ග නිලධාරින්ද රළපනාවේ සමහර ස්ථාන වලට කොන්ත්‍රාත්කරු ප්‍රමිතියෙන් තොර කළුගල් යොදා ඇති බවට හඳුනාගෙන තිබුණි.

**ස්ථිර බර එසවුම් යන්ත්‍ර සවි කිරීම**

මහවැලි අධිකාරියට අයත් පොල්ගොල්ල හා උඩවලව ජලාශ 02 සඳහා ස්ථිර බර එසවුම් යන්ත්‍ර 02 ක් සවි කිරීම සඳහා ව්‍යාපෘතියෙන් රු. මිලියන 805 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සඳහා ටෙන්ඩර් කැඳවා මාස 07 කට පසු එනම් 2022 අප්‍රේල් 08 දින කොන්ත්‍රාත් 02 රු. මිලියන 797.61ක මුදලකට පිරිනමා තිබුණත්, කොන්ත්‍රාත්කරු කලින් ඉදිරිපත් කළ මිලට කොන්ත්‍රාත්තුව සිදු කිරීමට අකැමැති වීමත්, රුපියල අවප්‍රමාණය වීමෙන් ආනයනික අමුද්‍රව්‍ය සඳහා වැඩි මිලක් ගෙවීමට සිදුවීමත් නිසා මෙම කොන්ත්‍රාත්තු 2 රු. මිලියන 1,248.37කට සිදුකිරීමට කොන්ත්‍රාත්කරු පසුව එකඟ වී තිබුණි. ඒ අනුව කලින් පැවති මිලට වඩා රු.මිලියන 450.76 වැඩිපුර ගෙවා කොන්ත්‍රාත්තුව සිදු කිරීමට ගිවිසුම් මගින් එකඟ වී තිබූ අතර 2023 වර්ෂය අවසානයට උඩවලව ජලාශය සඳහා ඉදිකරන බර එසවුම් යන්ත්‍රයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 33 ක්ද පොල්ගොල්ල ජලාශය සඳහා බර එසවුම් යන්ත්‍රයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 37 ක්ද විය.

**චලන අධීක්ෂණය සඳහා ස්වයංක්‍රිය භූමිතික මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම**

කොත්මලේ හා රන්දෙණිගල ජලාශ වේළි වල චලනයන් අධීක්ෂණය සඳහා ස්වයංක්‍රිය භූමිතික මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2022 වර්ෂයේ එ.ජ.ඩොලර් මිලියන 1.75 කට (රු. මිලියන 629.92) විදේශීය සමාගමක් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුවට මිල ගණන් කැඳවා මාස 11 කට පසුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්කරු මුල් මිලට කොන්ත්‍රාත්තුව භාර නොගැනීම නිසා 2023 පෙබරවාරි 24 දින මහවැලි අධිකාරිය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. 2023 වර්ෂයේදී ද මෙම කොන්ත්‍රාත්තුව ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**කලාවැව වම් ඉවුරු ඇළ ගේට්ටු අලුත්වැඩියා කිරීම**

මහවැලි අධිකාරියට අයත් කලාවැව වම් ඉවුරු ඇළ මාර්ගයේ ගේට්ටු අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවක් රු. මිලියන 153.99 ක බදු රහිත වටිනාකමට 2022 ජනවාරි 24 දින ලබා දී තිබූ අතර, එම කොන්ත්‍රාත්තුව

2023 ජනවාරි 23 අවසන් කළ යුතුව පැවතුණි. 2023 වර්ෂය අවසානයටද මෙහි ඉදිකිරීම් ප්‍රගතිය සියයට 39ක් වූ අතර, කොන්ත්‍රාත්තුව 2024 ජූලි 30 දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීම නිසා ඇති වූ මිල විචලතාව රු. මිලියන 28.18 දක්වා ඉහළ ගොස් තිබූ අතර ඒ සඳහා වෙන්කළ මුදල රු. මිලියන 13.99ක් වීමෙන් සීමාව ඉක්මවා රු. මිලියන 14.19 ක් වැය කිරීමට සිදුව තිබුණි.

**මිල විචලනය සඳහා ගෙවීම් කිරීම**

මුලතිවු දිස්ත්‍රික්කයට අයත් මුතියන්කඩ්ඩු දකුණු ඉවුරු ඇළ අදියර 02 හි පුනරුත්ථාපනය කිරීම් කොන්ත්‍රාත්තුව හා කිළිනොච්චි දිස්ත්‍රික්කයට අයත් පිරමන්තලාරු වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ පහළ නිම්නය පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තු 2021 වර්ෂයේදී පිරිනමා තිබුණි. එහෙත් කොන්ත්‍රාත් කාලය පිළිවෙලින් 2024 හා 2023 දක්වා දීර්ඝ කිරීමට සිදුවීමෙන් කොන්ත්‍රාත් සඳහා වූ මිල විචලතාවයන් පිළිවෙළින් රු.මිලියන 49.13 හා රු.මිලියන 8.01 ක් දක්වා වැඩිවී තිබුණි. එම වැඩිවීම සඳහා ගෙවීමට කොන්ත්‍රාත්තු යටතේ ඉටු කල යුතු වූ වැඩ කොටස් රු.මිලියන 33.85 කින් හා රු.මිලියන 7.02 කිතන් අඩු කර තිබුණි.

## උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය ද්‍රෝණියේ සිට ජල ඌණතාවයෙන් පෙළෙන දක්ෂිණ කලාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කරගෙන ශ්‍රී ලංකා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබ් සමාගම 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඊට අදාළ සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව එ.ජ. ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රු. මිලියන 74,325.75ක් විය. ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට එ.ජ. ඩොලර් මිලියන 504.05 ක් වැඩ සහතික කොට ගෙවා තිබුණි.

**ව්‍යාපෘති මූල්‍යනය**

ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කිරීමට යටත්ව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය මුදල අත්හිටුවා තිබීම හේතුවෙන් විදේශීය ණය ගිවිසුම යටතේ එ.ජ. ඩොලර් මිලියන 50 ක් හෙවත් රු. මිලියන 6,522.85 ක් මූල්‍යනයෙන් අනතුරුව 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ එ.ජ. ඩොලර් මිලියන 453.91 ක් හෙවත් රු. මිලියන 67,737.73 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මගින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී

ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.

**ව්‍යාපෘති ප්‍රමාදය**

ව්‍යාපෘතිය වසර 7 ක් තුළ එනම් 2015 නොවැම්බර් 15 දිනට නිම කිරීමට නියමිතව පැවති අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාද කාලය වසර 8 කුත් මාසයක් වී තිබුණි. ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභ වූ විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොඅඩු මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතිය වසර 8 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු.මිලියන 162,250 ක් වී තිබුණි. තවද මෙම ප්‍රමාදය හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම, පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම, බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම යන ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

**කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කිරීම**

උක්ත ප්‍රමාදය කාලය තුළ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම මගින් සේවායෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 71 ක් ඉදිරිපත් කර තිබූ නමුත් එම කිසිදු අවස්ථාවකදී කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.01ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා එනම් එ.ජ.ඩොලර් මිලියන 26.45 ක් අයකළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. ප්‍රමාද ගාස්තුව ලෙස අයකරගෙන තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 6.63ක් පමණක් වූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම මුදලින් එ.ජ.ඩොලර් මිලියන 5.3 ක් ආපසු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ නොසලකා ගිවිසුම් කාලය දීර්ඝ කිරීම**

මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා 2023 ජනවාරි 08 දින වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වූ කාලය 2023 ජූනි 30 දින දක්වා යෝජනා කර තිබුණි. ඒ සඳහා මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2023 ජනවාරි 16 දිනැති නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට

යටත්ව අනුමැතිය ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද වන දිනක් පාසාම ජාතික විදුලිබල පද්ධතියට දෛනික 120MW විදුලිබල ප්‍රමාණයක් එකතු කිරීමට නොහැකි වන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලයට බාහිර පාර්ශවයෙන් විදුලිය මිලදී ගැනීමට දිනකට රු. මිලියන 100ක් පමණ අමතරව වැය කිරීමට සිදු වන බැවින් කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූනි 30 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපොහොසත් වන්නේ නම් 2023 ජූනි 30 දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම සකස් විය යුතු බවට මුදල් අමාත්‍යවරයා යෝජනා කර තිබුණි. එසේ වුවද ඊට අනුකූලව ගිවිසුම සකස් කිරීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා හරිමින් ව්‍යාපෘති කාලය දීර්ඝ කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රජයට අමතර වැය බරක් නොමැතිව දීර්ඝ කරනු ලබන කාලය තුල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කල යුතු බවට නියම කර තිබූ බැවින් EPC කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූලව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් පැන නගින පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව හා නියමිත දිනට ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පැන නගින ආවස්ථික පිරිවැය අය කර ගැනීමට සිදු වන බව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොතිබුණි.

**කොන්ත්‍රාත්කරු විසින් දීර්ඝ කිරීම් වියදම් ඉල්ලීම්**

කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූලි මස ඉදිරිපත් කර තිබූ දෙවන හිමිකම්පෑමේ බිල්පත මගින් කාලය දීර්ඝ කිරීමට අදාළ හේතු 8 ක් සඳහා එ.ජ.ඩොලර් මිලියන 105.16 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ තුළ 2020 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය එ.ජ.ඩොලර් මිලියන 56.15 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය එ.ජ.ඩොලර් මිලියන 4.56 ක් ද 2020 මාර්තු 21 සිට 2020 ජූනි 15 දක්වා දීර්ඝ කල කාලසීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ලෙස එ.ජ.ඩොලර් මිලියන 10.4 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ලෙස එ.ජ. ඩොලර් මිලියන 0.4 ක් ද ඇතුළත්ව පැවතුණි. එහිදී FIDIC අන්තර්ජාතික ගිවිසුම් කොන්දේසි හා අමාත්‍ය මණ්ඩල තීරණයන් මගින් පනවා තිබූ සීමාවන් නොසලකා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මෙහෙයවා තිබූ අතර මෙම හිමිකම් පෑම පිළිබඳ තොරතුරු හෝ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම පිළිබඳ උක්ත සංදේශය තුළ දක්වා නොතිබුණි.

**කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම ඉල්ලීම**

කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 181.34 ක ප්‍රමාද ගාස්තුවක් සේවායෝජක වන රජයෙන් ඉල්ලා තිබුණි. මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් නිලධාරීන්

7 දෙනෙකුගෙන් සමන්විත සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ගණනය කර ඉදිරිපත් කරන ලද ප්‍රමාද ගාස්තුව වෙනුවට, එ.ජ. ඩොලර් මිලියන 19.52 ක ප්‍රමාද ගාස්තුවක් නිර්දේශ කර තිබුණි. එකී ප්‍රමාද ගාස්තු හිමිකමට අමතරව ඉරාන රජයට පනවා තිබූ ආර්ථික සම්බාධක හා වෙනත් දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතුන් මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි, එ.ජ.ඩොලර් මිලියන 19.09 ක අමතර ගාස්තුවක් ගෙවීමට ද නිර්දේශ කර තිබුණි. ඒ අනුව ප්‍රමාද ගාස්තුව හා සානුකම්පිත හේතු මත සළකා බැලීමට නිර්දේශ කර තිබූ මුදල එකතු කර එ.ජ.ඩොලර් මිලියන 38.62 ක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට කමිටුව නිර්දේශ කර අර්ථ ගන්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි.

**අමතර ගාස්තු ගෙවීම්**

මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම එම ක්‍රියාවලියට සම්බන්ධ වූ හා ඒ පිළිබඳ පූර්ණ අවබෝධයෙන් යුතු නිලධාරීන් ඇතුළත් කර නොතිබීමෙන් හා ව්‍යාපෘතියට ඍජුව සම්බන්ධ නොවූ නිලධාරී කණ්ඩායමක් සම්මුති සාකච්ඡා කමිටුව සඳහා පත්කිරීමට යෝජනා කර තිබිමෙන් කමිටුව විසින් අත්‍යවශ්‍ය පාර්ශව සමඟ ප්‍රමාණවත් සන්නිවේදනයක් සිදුකර නොතිබීම, ව්‍යාපෘතියේ කටයුතු මූලික ගිවිසුම්ගත කාලයකට සමාන කාලයකින් ප්‍රමාද වී තිබියදී ඒ මගින් ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර අයකර ගැනීමේ හැකියාව පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබීම, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරිමේදී "රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම" යන කොන්දේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතුන් මත අමාත්‍ය මණ්ඩලය කැමැත්ත මත එ.ජ. ඩොලර් මිලියන 19.09ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කර තිබුණි.

**ප්‍රමාද ගාස්තු හා අමතර ගාස්තු ගෙවීම්**

2021 නොවැම්බර් 01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර එම අනුමැතිය මත පළමුව සියයට 50 ක වාරිකයක් පමණක් ගෙවීමටත්, ඉතිරිය කොන්ත්‍රාත්කරුගේ වගකීම් කාලය අවසන් වීමෙන් පසුව ගෙවීමටත් යන පදනම මත ලංකා විදුලිබල මණ්ඩලය විසින් පළමු සියයට 50 වාරිකය වන එ.ජ. ඩොලර් මිලියන 19.31 න් 2022 වර්ෂයේ එ.ජ.ඩොලර් මිලියන 7.43 ක් ද 2023 වර්ෂයේ ඇමරිකානු ඩොලර් මිලියන 11.52 ක් ද වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 18.96 ක් ගෙවා තිබුණි.

ව්‍යාපෘතියේ ප්‍රතිස්ථාපන මාර්ගයේ මුල් සැලසුමට ඇතුළත් කර තිබූ පුහුල්පොළ වේල්ල ඉදිකිරීමේ පූර්ව අවශ්‍යතාවයක්ව පැවති බඳුල්ල, වැලිමඩ මාර්ගයේ පවතින පැරණි මාර්ගයේ මීටර් 250 ක් අමතරව දිර්ඝ කර නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් තම විෂය පථයෙන් බැහැරව යමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල රු.මිලියන 133.47 ක ඇස්තමේන්තුව අනුමත කර තම ඉන්වොයිස් වලින් අඩු කර ගෙවීමට කැමැත්ත පලකර තිබුණි. ඒ අනුව එම මාර්ගය සකස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට යොජනා කර තිබුණ ද, මාර්ගය සකස් කර නොතිබුණු අතර පුහුල් පොළ වේල්ල වැඩ බිම ප්‍රවේශ මාර්ගය හා නව මාර්ගය සකස් කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 1.51 ක් ඇස්තමේන්තු කර රු.මිලියන 1.32 ක් ගෙවා තිබුණි.

**ජල කාන්දුව වෙනුවෙන් වන්දි ගෙවීම**

ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණ සමාගමෙන් එ.ජ.ඩොලර් මිලියන 5 ක වන්දියක් ලබාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.මිලියන 1,931.34 ක් ගෙවා තිබූ අතර රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි 22 දින ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් එයින් රු. මිලියන 1,124.62 ක් විගණිත දිනය දක්වාම අය කර ගෙන නොතිබුණි. ඔවුන්ගෙන් අයකර ගත් මුදල නැවත ගෙවන ලෙස කොන්ත්‍රාත්කාර සමාගම විසින් ඉල්ලීමක් සිදු කර තිබුණි. තවද බලපෑමට ලක් වූ ජනතාව වෙත ගෙවන ලද වන්දි මුදල් හා පානීය ජලය සැපයීම වෙනුවෙන් සමාගම විසින් වැයකර තිබූ එ.ජ. ඩොලර් මිලියන 6.11 ක වියදම ද ලබා දෙන ලෙස සමාගම ව්‍යාපෘතියෙන් ඉල්ලා තිබුණි.

වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2024 පෙබරවාරි 05 දින ඉදිරිපත් කර තිබූ අංක අමප/24/0044/623/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ එ.ජ. ඩොලර් 514 ක පිරිවැයක් දරා නිම කරන ලද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 මාර්තු 31 දිනට අවසන් කිරීමත් සමඟ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය නඩත්තු කරන ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන වෙත එහි මෙහෙයුම් කටයුතු භාර දී වත්කම් හා ලේඛණ භාරදීම සිදු කල යුතුව පැවතුණද අදාල වත්කම් හා ලේඛණ ෆරාබ් සමාගමෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය භාර ගෙන අදාළ ආයතන වලට භාර දීමට කටයුතු කර නොතිබුණි.

## සෞඛ්‍ය අංශය

| ව්‍යාපෘතියේ නම | ණය /ආධාර මුදල | | ආරම්භක වර්ෂය | 2023/12/31දිනට උපයෝජනය | | 2023/12/31 දිනට ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | | එ.ජ. ඩො. මිලියන | රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය |
| සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ණය 37.5 | 6,937.50 | 2018 | 23.24 | 5,068.62 | 62 |
| | ආධාර 12.5 | 2,312.50 | -එම- | 6.28 | 1,329.68 | 50 |
| | දේශීය 10.00 | 1,850.00 | - එම- | 2.09 | 452.58 | 24 |
| සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යණය | ණය 110 | 21,975.00 | 2021 | 37.29 | 10,725.03 | 34 |
| | ආධාර 03 | 598.50 | - එම- | නැත | නැත | 0 |
| | දේශීය 10 | 1,995 | -එම- | 0.21 | 69.99 | 3 |
| කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යනය | ණය 209.11 | 41,717.45 | 2020 | 215.39 | 42,466.35 | 102 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරිමේ ව්‍යාපෘතිය - තෙවන අතිරේක මූල්‍යනය** | **ණය** 100 **සංශෝධනය 86.76** | 21,000 **සංශෝධනය 18,219.60** | 2021 | 86.76 | 18,219.60 | 100 |
| **සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය** | **ණය** 100.00 | 35,000.00 | 2022 | 15.34 | 5,536.54 | 15 |
| **ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක i** | **ණය** 50.845 | 8,030.46 | 2019 | 18.9 | 2,993 | 37 |
| **ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක ii** | **ණය** 14.22 **සංශෝධනය** 5.22 | 2,590.74 951.03 | 2019 | 3.05 | 653.27 | 69 |
| | **දේශිය** 11.85 **සංශෝධනය** 8.48 | 2,370.00 1,838.43 | **-එම-** | **-** | 25 | 1.4 |
| **සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය** | **ණය (ජපන් යෙන් ) 10,639** | 15,915 | 2018 | 243.10 (ජපන් යෙන් ) | 437.19 | 2.7 |
| | **දේශිය** | 713 | **-එම-** | | 107.23 | 15 |

වගු අංක 2.35 : සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති

## සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය

**සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට ගැනීම**

ලංසු කැඳවීමේ ලේඛන වල අන්තර්ගත කොන්දේසි සහ පිරිවිතරයන්ට පටහැනිව මාස දෙකක ආරක්ෂිත තැම්පතුවක් සහ වර්ෂයක පෙර ගෙවීමක් (upfront payment) අවශ්‍ය බව කොන්දේසියක් ලෙස සඳහන් කර තිබුණි.

ඒ අනුව මෙම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු වුවත් එයට පටහැනිව මෙම ලංසුව පිලිගෙන පෙර ගෙවීම් ලෙස රු.මිලියන 06 ක් හා මාස දෙකක ආරක්ෂිත තැම්පතු ලෙස රු.මිලියනයක් තෝරාගත් ලංසුකරුට ගෙවා තිබුණි. ඒ අනුව මෙම ගෙවීම නීතිවිරෝධී ගෙවීමක් වන අතර එලෙස ගෙවන ලද එකතුව රු.මිලියන 07 ක මුදල එකවර ආපසු අයකර ගත යුතු බව නිරීක්ෂණය කෙරේ.

ලංසු ලියවිලිවල අවශ්‍යතාවය,වර්ග අඩි ප්‍රමාණය 2,500 ලෙස දක්වා තිබුණද වර්ග අඩි 5000 ක පමණ පරිශ්‍රයක් ලංසුකරුගෙන් වැඩි මිලට ලබාගෙන තිබුණු අතර ගොඩනැගිල්ලේ පහත මහළ සම්පූර්ණයෙන්ම ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**ශල්‍ය ගෝස් මීටර් මිලියන 03 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය**

2012 දෙසැම්බර් 05 දිනැති අංක අමප/12/1602/509/005-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණින් රජයේ රෝහල්වලට අවශ්‍ය වාර්ෂික ශල්‍ය ගෝස් අවශ්‍යතාවය දේශීය නිෂ්පාදකයන්ගෙන් ලබාගෙන තිබුණු අතර එහිදී වෛද්‍ය සැපයීම් අංශයේ ලියාපදිංචි වී සිටින ශල්‍ය ගෝස් නිෂ්පාදකයන්ට වාර්ෂික කෝටා ක්‍රමයකට ගෝස් සැපයීමට අනුමැතිය ලබාදී තිබුණි. නමුත් 2022 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශය විසින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP) හරහා රු. මිලියන 268.5 ක් වටිනා ශල්‍ය ගෝස් මීටර් මිලියන 03 ක් ආනයනය කර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

එහිදී මාස 03 ක ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාම සඳහා ගෝස් මීටර් මිලියන 03 ක් ලබා ගැනීමටත්, රු.මිලියන 500 ඉක්ම වූ ප්‍රසම්පාදනයන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවට සිදුකළ නොහැකි වීම මත ඇණවුම මීටර් මිලියන 03 දක්වා අඩුකර ලංසු කැඳවීමටත්, වැඩබලන වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ සහභාගීත්වයෙන් 2022 නොවැම්බර් 21 දින පැවති ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේදී වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් ලංසු ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරු වූ Sisili Projects Consortium පුද්ගලික සමාගමට ගෝස් මීටර් මිලියන 03 ක ඇණවුම ප්‍රදානය කිරීමටත් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළ වැඩි

මිළට ගෝස් මිළදී ගැනීමේ හදිසි අවශ්‍යතාවයක් නොතිබුණු බවත්, ඇණවුම ප්‍රදානය කළ අවස්ථාව වනවිට දේශීය සැපයුම්කරුවන් විසින් ගෝස් මීටර 3,635,700 ක ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු බවත්, 2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ආසන්න වශයෙන් ගෝස් මීටර් මිලියන 08 ක ලැබීම් හා නිකුත් කිරීම් සිදුකර තිබුණු බවත් නිරීක්ෂණය විය.

මෙලෙස ඇණවුම ලබාගත් සැපයුම්කරු, වෛද්‍ය සැපයීම් අංශයේ කෝටා ක්‍රමය යටතේ රු.74.96 බැගින් ගෝස් සපයන ලද දේශීය සැපයුම්කරුවකු බවත්, මෙම ඇණවුමේදී මීටරයක් රු.89.50 බැගින් ඉන්දියාවෙන් ආනයනය කර සැපයීමට ලංසුව ඉදිරිපත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. නමුත් මෙම තොගය සැබෑ ලෙසම ඉන්දියානු නිෂ්පාදකගෙන්ම ලබාගත් තොගයක්ද නැතිනම් දේශීයව නිෂ්පාදනය කළ තොගයක්ද යන්න සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් තහවුරු කරගෙන නොතිබුණි.

## සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

**සෞඛ්‍ය ප්‍රවර්ධන වෑන් රථ සඳහා මහජන ඇමතීම් පද්ධතියක් (Public Addressing System) සපයා සවි කිරීම**

සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතයට ගනිමින් 2021 වර්ෂයේදී ඉන්වොයිසි වටිනාකම රු.මිලියන 87.21 ක් වන "Nissan Urvan" වර්ගයේ වෑන් රථ 09 ක් මිලදී ගෙන තිබුණි. යථෝක්ත වෑන් රථ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා යොමු කිරීමට පෙර මහජන ඇමතීම් පද්ධතියක් (Public Addressing System) සපයා සවි කිරීම සහ ඒ ආශ්‍රිත කාර්යයන් 2021 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු නමුත් විගණිත දිනය වන 2024 මැයි 31 දින වන විටත් එම ප්‍රසම්පාදන කාර්යය ආරම්භ කර නොතිබුණු බව අනාවරණය විය. මේ අනුව යථෝක්ත වෑන් රථ නමය, අදාළ කාර්යය සඳහා පරිවර්තනය කිරීමේ කටයුතු සඳහා වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් ගත වී ඇතත් තවමත් එම කාර්යය සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය අසමත් වී තිබුණි. මේ අතර එම වෑන් රථ අදාළ අරමුණට පටහැනිව වෙනත් ධාවන රාජකාරීවල යොදවා තිබූ බව නිරීක්ෂණය විය.

## නාගරික හා නිවාස සංවර්ධන අංශය

| ව්‍යාපෘතියේ නම | ණය මුදල | | කාලය | 2023.12.31 දිනට උපයෝජනය | 2023.12.31 දිනට ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ. ඩො. මිලියන | රු. මිලියන | ආරම්භක වර්ෂය | එ.ජ. ඩො. මිලියන | රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය |
| අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | Euro 52 | 8,354.32 | 2016 | 5.07 | 1,783.14 | 21.34 |
| නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය | 5.27 | 1,064.79 | 2022 | 1.33 | 437.95 | 41.13 |
| කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය දීමේ ව්‍යාපෘතිය (SCURP) | 200<br>** 130 | 35,163.7<br>** 47,096 | 2019 | 58.75 | 15,985.67 | 33.94 |

වගු අංක 2.36 : නාගරික හා නිවාස සංවර්ධන අංශයේ ව්‍යාපෘති

## කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)

ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 42,031.74 කට සමාන එ.ජ.ඩො. මිලියන 321 ක් වූ කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP) සඳහා රු.මිලියන 27,890.22 කට සමාන එ.ජ.ඩො. මිලියන 213 ක් සැපයීමට, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතිය අවසන් කරන විට එයින් එ.ජ.ඩො. මිලියන 199 ක් පමණක් එනම් සියයට 93 ක් වැය කර තිබුණි.

උක්ත ව්‍යාපෘතිය අවසන් කරන විට ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් රු. මිලියන 198 ක් වැයකර තිබුණු අතර එහි වැඩ අවසන් කර නොතිබුණි. මෙම කොටස යටතේ ඉදිකරන ලද පොම්පාගාර 3, ගංවතුර පාලන ගේට්ටු 3 සහ අනෙකුත් කුඩා ගබඩා කිරීමේ පද්ධති යනාදිය ගංවතුර කළමනාකරණ පද්ධතියට ඒකාබද්ධ කිරීම, සවිකර ඇති ජලමට්ටම් මිනුම් හා වර්ෂාපතන මාපක දත්ත අදාළ මධ්‍යස්ථාන වෙත යොමුකිරීම, කොළඹ අගනගර ප්‍රදේශ සඳහා ගංවතුර අනතුරු ඇඟවීම් පද්ධතිය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම මගින් සාමාන්‍ය ජනතාවට වැදගත් වන තොරතුරු වෙබ් අඩවිය හරහා බෙදාහැරීම සහ නාගරික සංවර්ධනය සහ දේශගුණික වෙනස්වීම් හේතුවෙන් නිර්මාණය වන අවදානම් තත්වයන් සඳහා සහාය දීම යන කාර්යයන් සිදුකල නොහැකිව තිබුණි. මේ නිසා රු. මිලියන 600 ක් වැය කර 2016 ඉදිකර තිබූ ජල

පාලන දොරටු 3 හා අනෙකුත් ඉදිකිරීම් වූ පොම්පාගාර 3 ඇතුළු වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි. තවද , මෙම කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය සතුවද වැඩපිළිවෙලක් පවත්නා බවක් නිරීක්ෂණය නොවුණි.

කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP) අවසන් කිරීමේදී, ව්‍යාපෘතිය සතු දේපළ පැවරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ලිඛිත අධිකාරී බලය පැවරීමක් නොමැතිව රු. මිලියන 28,115 වටිනා වත්කම් හා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 81 ක් සහ වටිනාකම වූ රු. මිලියන 2,929.44 ක විශේෂඥ වියදම පළාත් පාලන ආයතන 4 කට, නාගරික සංවර්ධන අධිකාරියට හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ව්‍යාපෘතියේ අභිමතය පරිදි පවරා තිබුණි.

## උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP)

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩො. මිලියන 202 ක් ණය දෙන ආයතනය විසින් ලබාදීමට ගිවිසගෙන තිබුණද, ව්‍යාපෘතිය ආරම්භ කර වසර 7 ක් ගත වූ පසුවත් රු.මිලියන 16,437 කට සමාන එ.ජ. ඩො. මිලියන 89.92 ක් එනම් සියයට 44 ක ප්‍රතිශතයක් පමණක් වියදම් කිරීම හේතුවෙන් එ.ජ.ඩො. මිලියන 92 ක් අවලංගු කිරීමට 2021 දෙසැම්බර් 31 දින ණය ලබාදෙන ආයතනය තීරණය කර තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු වලින් වැඩි කොටසක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.
ව්‍යාපෘතිය අවසන් කරන විට රු. මිලියන 649 ක අත ඉතිරි මුදලක් පැවති අතර එම මුදල ව්‍යාපෘතියේ අසම්පූර්ණ උප ව්‍යාපෘතීන්හි බිල්පත් පියවීම වෙනුවෙන් රඳවාගෙන අදාළ බිල්පත් පියවීමට කටයුතු නොකර 2022 ජූලි 05 දින ණය දෙන ආයතනය වෙත නැවත යැවීමට කටයුතු කර තිබුණි. එබැවින් අසම්පූර්ණව පැවති උපව්‍යාපෘති 22 ක් සඳහා ගෙවිය යුතු රු.මිලියන 277 ක් රජයේ අරමුදලින් දැරීමට සිදුව තිබුණි. එයින් රු. මිලියන 22.78 ක් 2023 සැප්තැම්බර් 30 දින වන විට අමාත්‍යාංශය විසින් පියවා තිබුණි.

## නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව ආසියානු සංවර්ධන බැංකුව විසින් රු.මිලියන 1,064.79 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.27 ක් ලබා දී තිබුණි. ශ්‍රී ලංකා රජය රු.මිලියන 232.35 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.15 ක් වියදම් කළ යුතුව තිබුණි. ව්‍යාපෘතිය 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි. නමුත් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සියල්ල 2020 වර්ෂය අවසාන වනවිට නවතා දමා තිබුණු අතර, නැවත ගිවිසුම් කාලය 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සංරචක 3 ක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා දඹුල්ල, ත්‍රිකුණාමලය, කුරුණෑගල හා රත්නපුර නගර තෝරාගෙන 2019 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 418.29 ක් වැයකර තිබුණි. කාලය දීර්ඝ කිරිමේදී ත්‍රිකුණාමලය හා දඹුල්ල යන දිස්ත්‍රික්ක සඳහා පමණක් ප්‍රමුඛතාවය දීමට තීරණය කිරීම හේතුවෙන් කුරුණෑගල හා රත්නපුර යන දිස්ත්‍රික්ක සඳහා වැයකර තිබූ මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

## නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය (SCURP)

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය සඳහා ණය දෙන ආයතනය විසින් එකඟ වූ එ.ජ.ඩො. මිලියන 200 ක ණය මුදලෙන්, ව්‍යාපෘතිය ආරම්භ කර වසර 4යි මාස 6කට පසු 2023 දෙසැම්බර් 31 වන විට භාවිත කර තිබුණේ එ.ජ.ඩො. මිලියන 58.75 කට සමාන රු මිලියන 15,986ක් පමණි.

ව්‍යාපෘතියේ අරමුදල් භාවිතයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් එ.ජ.ඩොලර් මිලියන 200 ක ණය මුදලින් එ.ජ.ඩොලර් මිලියන 70ක් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. මේ අනුව 3 වැනි අදියරේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හිටුවා තිබූ අතර නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාවද 1,272 කින් අඩු කර තිබුණි. තවද එ.ජ.ඩොලර් මිලියන 42 ක් වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය එ.ජ.ඩොලර් මිලියන 28 දක්වා එ.ජ.ඩොලර් මිලියන. 14කින් අඩු කර තිබුණි. සංශෝධිත ගිවිසුමට අනුව ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා පුද්ගලික හවුල්කාර දායකත්වය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණි.

## අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)

ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කර 2023 සැප්තැම්බර් 30 දින නිම කල යුතු වුවත්, ණය ගිවිසුම අනුව ප්‍රංශ නියෝජිතායතනය එකඟවූ ණය මුදල වන යූරෝ මිලියන 52 ක මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට යූරෝ මිලියන 5.07 කට සමාන රු.මිලියන 1,783.14 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ණය මුදලින් සියයට 10 ක තරම් ඉතා අඩු ප්‍රතිශතයක් උපයෝජනය කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. පසුව ව්‍යාපෘතියේ විෂයපථය සංකෝචනය කර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු පමණක් සිදුකර තිබූ අතර 2023 වර්ෂය තුලදී දේශීය අරමුදලින් පමණක් පවත්වාගෙන ගොස් තිබුණි.

මුල් අදියරේදී අනුරාධපුර උතුරු හා දකුණු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රු.මිලියන 288 ක් වැය කර තිබුණු අතර නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ දී මූලික කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 1,176 , රු. මිලියන 1,795 ක් දක්වා එනම් සියයට 53 කින් වැඩිකර නැවත ( Addendum) ගිවිසුම්ගත වී තිබුණි. තවද ජාතික මෙහෙයුම් මැදිරිය දුන් උපදෙස්

මත දේශීය අරමුදල් උපයෝජනය කරමින් 2024 වර්ෂයේදී රු.මිලියන 2,070 ක ප්‍රතිපාදන මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි. නමුත් ණය සපයන අයතනය සමඟ කටයුතු කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ නොතිබුණි.

## ප්‍රවාහන හා මහාමාර්ග අංශය

| ව්‍යාපෘතියේ නම | ණය/අධාර මුදල | | ආරම්භක වර්ෂය | 2023.12.31 දිනට උපයෝජනය | | 2023.12.31 දිනට ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | **එ.ජ.ඩො. මිලියන** | **රු. මිලියන** | | **එ.ජ.ඩො. මිලියන** | **රු. මිලියන** | **මූල්‍ය ප්‍රගතිය** | **භෞතික ප්‍රගතිය** |
| **එකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන -1** | 800 | 104,000 | 2014 | 544 | 97,178 | 68% | ග්‍රාමීය මාර්ග : 93% ජාතික මාර්ග : 54% |
| **එකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන -2** | 900 | 137,070 | 2018 | 509 | 109,316 | 57% | 67% |
| **අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය** | 175 | 59,062 | 2021 | 48 | 13,952 | 27% | 27% |
| **බදුල්ල චෙන්කලඩි මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය** | 120 | 15,600 | 2017 | 79 | 15,520 | 66% | 92% |
| **ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය** | 40 | 4,560 | 2013 | 2.55 | 435.24 | 85% | 90% |
| **සවුදි අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්යාපෘතිය** | *SRA-225 | 7,800 | 2013 | *SRA - 219 | 8,292 | 97% | 100% |
| **චීනයේ එක්සිම් බැංකුව (හුනන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය** | 85 | 17,930 | 2018 | 73.15 | 14,070 | 100% | 100% |
| **කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය** | 52 (යුරෝ) | 10,192 | 2021 | 13.85 | 3,238 | 26% | 61% |
| **මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය** | 69.33 | 13,762 | 2021 | 0.85 | 153 | 1% | 9% |
| **පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්යාපෘතිය** | 10 (කුවේට් ඩිනාර්) | 4,632 | 2015 | 6.6 (කුවේට් ඩිනාර්) | 4,128 | 66% | 96% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘති | 10 | 1,457 | 2017 | 34 | 5,264 | 94% | 94% |
| ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | 7 | 2,086 | 2017 | 5.97 | 1,749.15 | 93.39 | 98.81 |
| වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය | 293.89 | 46,381.72 | 2019 | 172.94 | 48,470.6 3 | 58.84 | 82 (වරාය පිවිසුම් ගුවන් මාර්ගය) |
| | | | | | | | 34.9 (වරාය අධිකාරි යේ නව ගොඩනැගි ල්ල) |
| කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය(OFID II) | 50 | 6,499.57 | 2013 | 41.67 | 7,349.44 | 92 | 99 |
| බස්නාහිර පළාත් මාර්ග ව්‍යාපෘතිය(OFID III) | 17 | 2,209.84 | 2017 | 14.79 | 2,993.92 | 99.92 | 100 |
| A-017 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (OFID IV) | 40 | 5,497.90 | 2022 | 7.72 | 2,529.19 | 35 | 39.17 |

වගු අංක 2.37 : ප්‍රවාහන හා මහාමාර්ග අංශයේ ව්‍යාපෘති

## අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP)

**මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම**

ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, උප සංරචක 1.2 යටතේ මාර්ග අංශයේ ආයතන සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම සඳහා එ.ජ. ඩොලර් මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. මෙම උප සංරචකය මගින් මාර්ග අංශයේ සමස්ත කළමනාකරණය වැඩිදියුණු කිරීම මගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ එහි විකාශනය වන සම්බන්ධතා සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර 02 ක් ගතවී ඇතත් මෙම සංරචකය ක්‍රියාත්මක කර නොතිබුණි.

**ගොවීන් සඳහා සැපයුම් දාමය වැඩිදියුණු කිරීම සහ සේවා සඳහා ප්‍රවේශය**

2021 අගෝස්තු 16 දිනැති අංක CM: 34/2021 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 අගෝස්තු 17 දිනැති අංක 21/1524/319/028 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ස්ථාපිත කිරීමට ව්‍යාපෘතියේ සංරචක 2 යටතේ සැලසුම් කර තිබුණි. මුලදී, මෙම සංරචකය සඳහා එ.ජ.ඩො මිලියන 50 ක මුදලක් වෙන් කර තිබුණද 2023 මැයි 09 දින ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවෙන් එය එ.ජ.ඩො. මිලියන 15 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නිර්දේශවලට පටහැනිව 2023 වර්ෂය අවසන් වන විටත් මෙම සංරචකය ආරම්භ කර නොතිබුණි.

## ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad Program)

**කොන්ත්‍රාත් පරිපාලනය**

අදාල මූල්‍ය ආයතන වලින් ලබාගත් අත්තිකාරම් ඇපකර මගින් හිඟ හිටි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට විරුද්ධව කොන්ත්‍රාත්කරුවන් විසින් වාරණ නියෝග ලබාගැනීම හේතුවෙන් පළාත් 05 ක අත්හිටුවා තිබුණු කොන්ත්‍රාත් පැකේජ 12 ක එකතු වටිනාකම රු. මිලියන 2,793.41 ක අත්තිකාරම් මුදල් 2023 දෙසැම්බර් 31 වන විට එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිව තිබුණි. තවද කාර්යසාධන ඇපකරවලින් අයකරගැනීම් ප්‍රමාදවීම හේතුවෙන් රු. මිලියන 2,668.47 ක් අයවීම හිඟහිට තිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාදය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ණය ආධාර සීමා කිරීම හේතුවෙන් මාර්ගවල අත්‍යාවශ්‍ය වැඩ පමණක් ඉටු කිරීමට තීරණය කිරීම නිසා මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් යටතේ 2023 දෙසැම්බර් 31 දින වනවිට ලබාදී තිබුණු රු. මිලියන 6,250.03 ක වැඩ පූර්ව අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතව පැවතුණි.

කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.7 උප වගන්තියට අනුව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ මුදල දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වූ මුදල රු. මිලියන 2,671.28 ක් බව නිරීක්ෂණය විය. එම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 14.8 උප වගන්තියට අනුව 2023 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවියයුතු ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 284.77ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම නිසා රජයට අමතර මුදලක් වැය කිරීමට සිදුව තිබුණි.

**භාවිතය සඳහා වාහන කුලී පදනමට ලබා ගැනීම**

වැඩසටහන විසින්ම මිලදී ගත් වාහන 335 න් 318 ක් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට පෙර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. එබැවින්, වැඩසටහන මගින් වසර තුළදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ පළාත් කාර්යාලවල භාවිතය සඳහා වාහන 14 ක් කුලී පදනම යටතේ ලබා ගෙන තිබුණි. 2023 දෙසැම්බර් 15 දිනට එම වාහන සඳහා බදු කුලී ලෙස රු. මිලියන 16.36 ක් වැය කිරීමට සිදුව තිබුණි.

**මූලික සැලැස්මේ නොමැති මාර්ග ප්‍රතිසංස්කරණ**

2022 වසරේ RMC 04 පැකේජය යටතේ පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගයේ අතිරේක කොන්ත්‍රාත් කාර්යයක් (Variation) ලෙස බලංගොඩ - බෝවත්ත - කල්තොට මාර්ගය 2022 දී ප්‍රතිසංස්කරණය කර තිබුණි. පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු දැනටමත් ලබා දී ඇති කොන්ත්‍රාත්කරුවන් 04 දෙනාටම කිලෝමීටර් 16 ක් වූ මෙම මාර්ගයේ මුළු දිග ප්‍රමාණයට අදාල ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණු අතර එහිදී අදාල ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි. තවද මෙම මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු වැඩසටහනේ මූලික සැලැස්මේද ඇතුලත් වී නොතිබුණි. මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පවත්වා අදාළ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) විසින් 2023 නොවැම්බර් 30 දින ඉදිරිපත් කර තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විගණනයට අනාවරණය නොවුණි.

## දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (Second iRoad Program)

**සහතික කල බිල්පත් ප්‍රමාදය**

කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.7 උප වගන්තිය ප්‍රකාරව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ වටිනාකම දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල රු.මිලියන 5,558.94 ක් බව නිරීක්ෂණය විය. එයින් රු.මිලියන 1,188.03 ක අතුරු ගෙවීම් සහතිකපත් අගය 2022 වර්ෂයේ සහතික කර තිබුණු අතර එය 2023 වර්ෂය අවසන් වන විටත් ගෙවා නොතිබුණි. තවද, කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.8 උප වගන්තිය ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,074.11 ක ප්‍රමාද පොලී සඳහා ප්‍රතිපාදන සිදු කර තිබුණි.

**වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවය**

කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම හා ඉතිරි මාර්ග පුනරුත්ථාපන කටයුතුවල විෂය පථය සීමාවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8,197.88 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**අවලංගු කරන ලද කොන්ත්‍රාත් පැකේජ**

2023 දෙසැම්බර් 31 දිනට සේවායෝජක හා කොන්ත්‍රාත්කරුවන් විසින් ඌව, උතුර හා බස්නාහිර පළාත්වල කොන්ත්‍රාත් පැකේජ 10 ක් අවලංගු කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,014.10 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවට පටහැනි තීරණ**

2023 ජූලි 13 දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා නිකුත් කරන ලද රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවට අනුව, වැඩසටහන විසින් දැනටමත් වැඩ ආරම්භ කර ඇති මාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ඉදිරියේදී එම මාර්ග ධාවනය කළ හැකි තත්ත්වයට පමණක් පත් කර එම මාර්ග අයිතිව ඇති රාජ්‍ය ආයතන වෙත නැවත භාරදීමට කමිටුව විසින් නිර්දේශ කළද, ඉහත කමිටු තීරණවලට පටහැනිව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 321.71 ක් වූ කි.මී. 9.02 ක දිගින් යුතු ගම්පහ දිස්ත්‍රික්කයේ නව මාර්ග 04 ක පුනරුත්ථාපනය කිරීම් වැඩසටහන විසින් අලුතින් ආරම්භ කර තිබුණි.

## කොළඹ ජාතික මහාමාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

**ඔරුගොඩවත්ත -අඹතලේ මාර්ගය අදියර II**

2023 දෙසැම්බර් 31 දිනැති ප්‍රගති වාර්තාවට අනුව, ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගයේ අදියර II කොටස නිම කිරීමේ කාල සීමාවේ සිට වසර 2ක් ගත වී තිබුණද, කොන්ත්‍රාත්තුව තව දුරටත් සියයට 94.2 ක ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි.

## ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය

**කාර්යසාධනය**

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතියේ (TCAMP) අවසන් දිනය 2023 සැප්තැම්බර් 30 වුවත්, අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 100 න් අත්කරගත් කාර්යසාධනය සියයට 98.81 ක් වී තිබුණි.

**විචල්‍ය පිරිවැය**

කොන්ත්‍රාත්තුව ආරම්භයේදී හඳුනා නොගෙන, විචල්‍ය නියෝග යටතේ අතිරේක කාර්යයන් හඳුනා ගැනීම හේතුවෙන්, උපදේශන කාර්යයේ මූලික විෂය පථය වෙනස් වී ඇති බව නිරීක්ෂණය වූ අතර, කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන අත්පොතේ 14 වන අතිරේකයට අනුව අනුමැතිය ලබා නොගෙන කොන්ත්‍රාත් පැකේජයේ මුළු පිරිවැයෙන් සියයට 17.79 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 29.23 ක් දක්වා විචල්‍ය එකතු කිරීමක් සිදු කර තිබුණි.

**උපදේශන වාර්තා සඳහා ගෙවීම් කිරීම**

කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල (GCC) 3.1 වගන්තියට අනුව, සේවා සපයන්නා විසින් පිරිවිතරයන් සහ සේවා

විස්තරයට අනුකූලව සේවාවන් ඉටු කළ යුතුය. රු. මිලියන 161ක මුදලක් ගෙවා තිබුණද එම උපදේශන වාර්තාව අධිවේගී මාර්ග ජ්‍යාමිතික සැලසුම් කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි තත්වයේ පවතින බව නිරීක්ෂණය වූ අතර. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව වාර්තා ලබා නොගෙන ගෙවීම් නිකුත් කිරීම විගණනයේදී ගැටලුකාරී විය.

කොන්ත්‍රාත්තුවේ අරමුණ මාර්ග වෙන්කිරීම් සහ ජලාපවහන සිතියම් සකස් කිරීම සහ බස්නාහිර, වයඹ සහ සබරගමුව පළාත්වල ජාතික ජීඅයිඑස් ආකෘතියේ පවතින ජලාපවහන පද්ධති සහ අවශ්‍ය ජලාපවහන වැඩිදියුණු කිරීම් හඳුනාගැනීම පිළිබඳ තොරතුරු රැස්කිරීම වුවද. විචලතා නියෝග අංක 01,02,03 සහ 06 මගින් කොන්ත්‍රාත්තුවේ විෂය පථයට අයත් නොවන රියදුරු වැටුප් ගෙවීමට සහ ද්විත්ව කැබ් රථයක් ලබාදීම සඳහා රු. මිලියන 10.79 ක් වැයකර ඇති බව නිරීක්ෂණය විය.

## ඒ -17 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - රක්වාන සූරියකන්ද

**කාර්යසාධනය**

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු වසර 04 කට පසු 2022 වසර අවසානයේ සිට ආරම්භ කර තිබුණි. තවද ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘති කටයුතු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇති අතර අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 46 ට සාපේක්ෂව සියයට 39 ක ප්‍රගතියක් පමණක් ලබා ඇති බව නිරීක්ෂණය විය.

**ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය**

විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ඉඩම් කට්ටි 1515ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 789ක් සඳහා පමණක් 38(අ) වගන්තිය නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දක්වා 17 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටි සඳහා වන්දි තක්සේරු කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අධීක්ෂණය එම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් බලපෑ අතර අනාගතයේ දී ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට එය අහිතකර ලෙස බලපෑ හැකිය.

**සැලසුම්ගත පරිදි නිම කිරීමේ අවිනිශ්චිතතාවය**

සූරියකන්ද - රක්වාන ව්‍යාපෘතිය යටතේ මාර්ග ඉදිකිරීම් කටයුතු 2022 ඔක්තෝබර් 17 දින ආරම්භ කර 2024 ඔක්තෝබර් 16 දින නිම කිරීමට සැලසුම් කර ඇත. දැනට පවතින අඩු ප්‍රගතිය අනුව, මුල් නිම කිරීමේ දිනය වන 2024 ඔක්තෝම්බර් 16 වන දිනට පෙර මාර්ගයේ ඉතිරි මාර්ග ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ව්‍යාපෘතියට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.

**පරිසර සංරක්ෂණය**

පාංශු ඛාදනය අවම කිරීම සහ බෑවුම් කැපීම් ස්ථාවර කිරීම සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද 2021 පෙබරවාරි 18 දිනැති ලිපියේ මාර්ගෝපදේශ හා යෝජනා

අනුව ඉදිකිරීම් අතරතුර බෑවුම් කැපීම් ඇති කළ යුතුය. තවද, කැණීම් කරන ලද ද්‍රව්‍ය සහ ඉදිකිරීම් සඳහා භාවිතා කරන කිසිදු අපද්‍රව්‍යකින් ජලය අපවිත්‍ර කිරීමට ඉඩ නොතැබිය යුතු අතර කැණීම් කරන ලද පස් සුදුසු කසල ස්ථාන වෙත ප්‍රවාහනය කළ යුතු අතර බාදනයට නිරාවරණය නොවිය යුතුය. කෙසේ වෙතත්, පස බාදනය වන ස්ථාන සහ දුර්වල ජලාපවහන පහසුකම් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## කුළුණු මත ඉදිකෙරෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය

**ප්‍රමාද ගාස්තු හා කාලය**

| | |
|---|---|
| **දීර්ඝ කිරීමේ ගාස්තු** | වරාය පිවිසුම් ගුවන් මාර්ගය ඉදිකිරීමට අදාළ උපදේශකවරයාගේ ප්‍රගති වාර්තාවට අනුව, කොන්ත්‍රාත්කරු විසින් වගකිව යුතු ප්‍රමාදයක් පවතින අතර, අපේක්ෂිත නිම කිරීමේ දිනය වන 2024 සැප්තැම්බර් 08 දිනට කටයුතු අවසන් කිරීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. ඒඅනුව අවසන් වරට දින දීර්ඝ කිරීම් අනුමත කල 2024 මැයි මාසයෙන් පසු ප්‍රමාද ගාස්තු අය කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් 2023 දෙසැම්බර් 31 දිනට කාලය දීර්ඝ කිරීම් පිරිවැය සඳහා රු. මිලියන 493.03 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. |
| **සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය** | සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිම කර ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීම ප්‍රමාද වීම හේතුවෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට සිටින කාර්ය මණ්ඩලය සංචලනය කිරීම සඳහා විචලතා නියෝග 03 ක් යටතේ ව්‍යාපෘතිය විසින් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 221.53 ක මුදලක් වැය කර තිබුණි. |
| **දෝෂ නිවැරදි නොකිරීම්** | 2021, 2022 සහ 2023 වර්ෂ තුළ අනුක්‍රමික උෂ්ණත්වය ඉක්මවීම, ABC ඉහළ මට්ටමේ වෙනස්වීම්, ඉහළ සහ පැති මතුපිට ඉරිතැලීම්, කුළුණුවල අඩු ශක්තිය, බෑවුම් ආරක්ෂාව සඳහා ගෙන ඇති නුසුදුසු ක්‍රියාමාර්ග, bottom ducts නොගැලපීම යනාදී දෝෂ සඳහා නිකුත් කරන ලද අනුකූල නොවීමේ වාර්තා (non-conformance reports) 21 ක් 2023 දෙසැම්බර් 31 වන විට ද නිවැරදි කර නොතිබුණු බව නිරීක්ෂණය විය. |

## බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය(OFID III)

| | |
|---|---|
| **ව්‍යාපෘති කාර්යයන්** | ජාතික මාර්ග 04 කින් කිලෝමීටර් 25.8 ක ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ සිදුකිරීමට බලාපොරොත්තු විය. 2015 ජුනි 26 වැනි දින ණය ගිවිසුම අත්සන් කළද ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ 02ක පුනරුත්ථාපන කටයුතු වසර 2 ½ කට පසුව ආරම්භ කර තිබූ අතර ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 645 කින් ඉක්මවා තිබුණි. කඩුවෙල සිට අතුරුගිරිය මාර්ගයේ ඉතිරි වැඩ නිම නොකර ඉතිරි ණය මුදලින් මුල් වැඩ විෂය පථයට අයත් නොවන ඕරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 9/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය |

දැනටමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. තවද, කොන්ත්‍රාත් පැකේජය යටතේ වල්ගම-අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 1.25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ විෂය පථයෙන් පසුව ඉවත් කර ඇත.

**ලැබිය යුතු ශේෂ**

ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනට පසුගිය වසර හතර තුළ වෙළඳ දැන්වීම්, මැනුම් කටයුතු, නායයෑම් අධ්‍යයනය, පදික වේදිකාව සැලසුම් කිරීම සහ පාරිසරික උපදේශන වියදම් සඳහා රු. මිලියන 16.96 දක්වා ලැබිය යුතු ශේෂ දෙකක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**ප්‍රධාන කාර්යසාධන දර්ශක**

ව්‍යාපෘති ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල සහ ප්‍රතිලාභයන් මැනීමට ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) ස්ථාපිත කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියෙන් මහජනතාවට ලැබෙන ප්‍රතිලාභ මට්ටම විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.

කඩුවෙල - අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 9.5 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු 2018 ජනවාරි 29 වන දින රු.මිලියන 1,065 ක වියදමින් ආරම්භ කර 2019 ජූලි 28 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුට දින 841ක කාලය දීර්ඝ කිරීම මගින් 2023 අගෝස්තු 29 දක්වා ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් දින 841ක කාලය දීර්ඝ කිරීමේ පිරිවැයට අදාළව රු. මිලියන 311ක් ඉල්ලා ඇති බවත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතිය විසින් එම හිමිකම් පෑම අනුමත කර ඇති බවත් නිරීක්ෂණය විය .එය විගණනයේදී ගැටලු සහගත විය.

ව්‍යාපෘතියේ උපදේශන ගිවිසුම 2018 මාර්තු 08 දින රු. මිලියන 147.79 කට ආරම්භ කරන ලද අතර අවසන් දිනය 2019 ජූලි 28 විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන ගාස්තුව රු. මිලියන 299.36 දක්වා සංශෝධනය කර ඇති අතර අවසන් කිරීමේ දිනය 2023 ජනවාරි 31 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර ඇත. ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙන් සියයට 102.57 ක් නියෝජනය කරමින් රු. මිලියන 151.59 ක් ගෙවා තිබුණි.තවද, ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

# පළාත් සභා



1987 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 154 අ (1) ව්‍යවස්ථාව මගින් බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර, උතුර, සබරගමුව යන පළාත් සභා 09 ක් පිහිටුවා ඇත.

පළාත් සභාවක් ආණ්ඩුකාරවරයාගේ පාලනය යටතේ පවතින අතර ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබයි. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයෙකු කටයුතු කරනු ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 05 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. දැනට පවතින පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඉ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකණු ලැබ ඇත. ඒ අනුව සභාවක් නොමැතිව සබරගමුව, නැගෙනහිර හා උතුරු මැද පළාත් සභාවන් 2017 වර්ෂයේ සිටද, වයඹ, මධ්‍යම හා උතුරු පළාත් සභාවන් 2018 වර්ෂයේ සිටද, බස්නාහිර ඌව හා දකුණ පළාත් සභාවන් 2019 වර්ෂයේ සිටද 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පවත්වාගෙන යමින් පැවතුණි.

## පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| **මූල්‍ය ප්‍රකාශන විගණනය** | සෑම පළාත් සභාවක් විසින්ම සභාවේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය ප්‍රකාරව එම මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපති විසින් කළ යුතුය. |
| **ඒකාකාරී ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම** | ආරම්භයේ සිට මේ දක්වාම පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඒකාකාරී ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබූ අතර 2022 හා 2023 වර්ෂවලදී පළාත් සභා 09 විසින් විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.<br><br>එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එකිනෙකට වෙනස් ආකෘතීන්, නාමයන් හා ප්‍රභවයන් භාවිත කරමින් වටිනාකම් සටහන් කර තිබුණි. පළාත් සභා අරමුදල් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා විධිමත් ඒකාකාරී මාර්ගෝපදේශයක් හෝ චක්‍රලේඛයක් රජය හෝ පළාත් සභා විසින් නිකුත් කර නොතිබූ අතර ඒවා විශ්ලේෂණය කර සංසන්දනාත්මකව භාවිතා කරමින් තීරණ ගැනීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. |

නිශ්චිත මාර්ගෝපදේශයක් නොලැබීම හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ද නියාමනයක් සිදු නොවීම හේතුවෙන් පළාත් සභාවලට තොරතුරු වසං කිරීමේ, අත්හැරීමේ හෝ තීරණ ගන්නන් නොමඟ යන ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතින බව නිරීක්ෂණය විය.

**පළාත් සභාවල ආදායම් හා වියදම්**

පළාත් සභාවන් උපචිත පදනම, මුදල් පදනම, වැඩිදියුණු කරන ලද මුදල් පදනම යන පදනම් විකල්ප ලෙස භාවිතා කර තිබීම හා ඒකාකාරී ක්‍රමවේද අනුගමනය නොකිරීම යන තත්ත්වයන්ට යටත්ව පළාත් සභාවන්හි ආදායම හා වියදම සැසැඳීම සිදු කරන ලදී.

| පළාත් සභාව | රැස්කල ආදායම | ප්‍රතිශතයක් ලෙස % | රජයේ ප්‍රදානවල එකතුව (රු.මි) | මුළු ආදායම (රු.මි) | මුළු වියදම (රු.මි) | අතිරික්තය (ඌනතාවය) (රු.මි) |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 43,287 | 40.9 | 62,396 | 105,683 | 96,349 | 9,334 |
| මධ්‍යම පළාත් සභාව | 5,692 | 11.1 | 45,409 | 51,101 | 51,032 | 69 |
| දකුණු පළාත් සභාව | 8,053 | 13.9 | 49,555 | 57,608 | 58,461 | (851) |
| වයඹ පළාත් සභාව | 10,186 | 19.2 | 42,658 | 52,844 | 49,527 | 3317 |
| උතුරු මැද පළාත් සබාව | 4,156 | 12.9 | 27,997 | 32,153 | 30,415 | 1738 |
| ඌව පළාත් සභාව | 2,032 | 5.6 | 33,790 | 35,822 | 38,766 | (2944) |
| නැගෙනහිර පළාත් සභාව | 3,362 | 7.8 | 39,228 | 42,590 | 40,287 | 2303 |
| උතුරු පළාත් සභාව | 2,127 | 5.6 | 35,419 | 37,546 | 36,646 | 900 |
| සබරගමුව පළාත් සභාව | 4,649 | 10.7 | 38,570 | 43,219 | 41,645 | 1574 |
| එකතුව | **83,544** | | **375,022** | **458,566** | **443,128** | **15,440** |

වගු අංක 2.38 : **2023 වර්ෂයේ පළාත් සභාවල ආදායම්,වියදම්, අතිරික්තය / ඌණතාවය පිළිබඳ විස්තර**

**මූලාශ්‍ර: 2023 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

**පළාත් සභා ආදායම්**

පළාත් සභා 09 විසින් 2023 වර්ෂයේදී එකතුව රු.මිලියන 458,566 ක ආදායම් රැස් කර තිබුණි. එම ආදායම බදු , බදු නොවන හා වෙනත් ආදායම් ලෙස රු.මිලියන 83,544 න් සමන්විත වී තිබුණි. කෙසේවුවද, රජය විසින් පළාත් සභාවලට ලබා දී තිබූ රජයේ ප්‍රදාන එකතුව රු.මිලියන 375,022 ක් වී තිබුණි. ඒ අනුව පළාත් සභා 09 හි මුළු ආදායමින් සියයට 82 ක් රජයෙන් ලබා දුන් ප්‍රදාන වලින් සමන්විත වී තිබූ බැවින් සියළු පළාත් සභා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන මත යැපෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

වගු අංක 2.38 හි දක්වා ඇති ආකාරයට භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපෙමින් පළාත් සභා පවත්වාගෙන යන නමුදු පිළිගත් පොදු චක්‍රලේඛවලට පටහැනිව පළාත් සභාවල ආණ්ඩුකාරවරුන්ගේ

අනුමැතිය මත නිලධාරීන්ගේ ඉන්ධන දීමනා වැඩිකර ගැනීම්, අනෙකුත් ආකාරයේ සාධාරණ නොවන දීමනා ලබා ගැනීම් හා ආයතන සංග්‍රහයට පටහැනිව නිවාස කුලී දීමනා වලින් ලබා ගැනීම මගින් පළාත් සභාවල අරපිරිමැස්මකින් තොරව වියදම් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

**පළාත් සභා වියදම්**

සෑම පළාත් සභාවක් විසින්ම පෞද්ගලික පාරිශ්‍රමික, අනෙකුත් භාණ්ඩ හා සේවා නඩත්තු වියදම් ඇතුළත්ව පුනරාවර්ථන වියදම්ද, ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වියදම්ද වාර්ෂිකව දරනු ලබයි. 2023 වර්ෂයේදී පළාත් සභා 09 විසින් එකතුව රු. මිලියන 443,128 ක් වියදම් කර තිබුණි. එම වියදමින් සියයට 96 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 4 ක් ප්‍රාග්ධන වියදම් ලෙස වැය කර තිබුණි. එසේම මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 77 ක් පළාත් සභාවල පෞද්ගලික පඩි නඩි ගෙවීමට වැය කර තිබුණි.

**ඉතිරි කිරීම් හා ආයෝජන**

පළාත් සභා විසින් රජයෙන් ලැබෙන ප්‍රදාන ඌන උපයෝජනය කර හෝ පළාත් සභා ආදායම නිසි ලෙස ඇස්තමේන්තු කිරීමකින් තොරව මධ්‍යම රජයෙන් අධි ප්‍රතිපාදනයන් ලබා ගැනීම හේතුවෙන් වසර අවසානයේදී ඉතිරිවන ප්‍රතිපාදන, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම වාර්ෂිකව ක්‍රමක්‍රමයෙන් වැඩි වී තිබුණි. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| 2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා බැංකු ශේෂය (රු.මි) | පළාත් සභාව | දෙසැම්බර් 31 දිනට ආයෝජන ශේෂය (රු.මි) 2023 | 2022 |
|---|---|---|---|
| 3,748 | බස්නාහිර පළාත් සභාව | 35,500 | 25,500 |
| 2,714 | දකුණු පළාත් සභාව | 7,159 | 5,840 |
| 2,507 | වයඹ පළාත් සභාව | 11,679 | 9,703 |
| 2,734 | සබරගමුව පළාත් සභාව | 3,966 | 3,050 |
| 419 | ඌව පළාත් සභාව | 778 | 1,184 |
| 787 | මධ්‍යම පළාත් සභාව | 274 | 19 |
| 5,124 | උතුරු මැද පළාත් සභාව | 1,983 | 1,793 |
| 1,280 | නැගෙනහිර පළාත් සභාව | 618 | - |
| 3,269 | උතුරු පළාත් සභාව | - | - |
| 22,582 | එකතුව | **61,957** | **47,089** |

වගු අංක 2.39 : **පළාත් සභාවල මුදල් හා බැංකු ශේෂය, ඉතිරිකිරීම් හා ආයෝජන පිළිබඳ විස්තර**

**මූලාශ්‍ර; 2023 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

ඉහත දක්වා ඇති පරිදි 2022 වර්ෂයේදී රු. මිලියන 47,089 ක් වූ ආයෝජන හා ඉතිරි කිරීමේ ගිණුම්වල එකතුව 2023 වර්ෂයේදී රු.මිලියන 61,957 ක් දක්වා වැඩි වීමෙන් සියයට 32 කට ආසන්න

ප්‍රමාණයකින් ආයෝජන හා ඉතිරි කිරීම් වැඩි වී තිබුණි. කෙසේ වුවද, ඒකාකාරී ගිණුම් ක්‍රමවේදයක් නොතිබූ බැවින් උතුරු පළාත් සභාවේ හා නැගෙනහිර පළාත් සභාවේ 2022 හා වර්ෂයේ ආයෝජන පිළිබඳ හා උතුරු පළාත් සභාවේ 2023 වර්ෂයේ ආයෝජන පිළිබඳ තොරතුරු විගණන වෙත ලබා ගැනීමට නොහැකි විය.

**පළාත් සභාවල මුදල් හා බැංකු ශේෂ**

සෑම පළාත් සභාවකම වර්ෂ අවසානයේදී සැලකිය යුතු තරම් මුදල් ශේෂ පවතින බව අනාවරණය වී තිබුණි. එම මුදල් ශේෂ භාණ්ඩාගාරය වෙත ආපසු යැවීමක් සිදු නොවේ.

ඉහත වගු අංක 2.39 හි දක්වා ඇති පරිදි 2023 දෙසැම්බර් 31 දින වන විට පළාත් සභා 09 හි රු.මිලියන 22,582 ක මුදල් හා බැංකු ශේෂයන් පැවති බව තහවුරු විය. මේ අනුව පළාත් සභාවලට ප්‍රතිපාදන ලබා දීමේ දී මහා භාණ්ඩාගාරය, මුදල් කොමිසම, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වැනි ආයතන විසින් පළාත් සභා සතු ආයෝජන හා ඉතිරි කිරීම් ප්‍රමාණය පිළිබඳව කිසිදු අවධානයක් යොමු කිරීමෙන් තොරව ප්‍රතිපාදන ලබා දීම සිදු වන බව නිරීක්ෂණය විය.

**පළාත් සභාවල වත්කම්**

2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 409,890 ක් ලෙස හඳුනාගෙන තිබූ පළාත් සභාවල මුළු වත්කම් ප්‍රමාණය 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 517,112 ක් ලෙස රු.මිලියන 107,222 ක් හෙවත් සියයට 26 කින් වර්ධනය වී තිබුණි. එසේම 2023 වර්ෂයේදී පළාත් සභාවල මුළු වත්කම්වලින් රු.මිලියන 413,336 ක් එනම් පළාත් සභාවල මුළු වත්කම්වලින් සියයට 80 ක් මූල්‍ය නොවන වත්කම් වී තිබුණි. තවද, බස්නාහිර පළාත් සභාව ඇතුළුව බොහෝ පළාත් සභා විසින් ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් කාලීනව ප්‍රත්‍යාගණනය කිරීමටත් පරිහරණය කරන ලද වත්කම් නිසි ලෙස පවරා ගෙන ගිණුම්ගත කිරීමටත් කාලීනව කටයුතු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

| පළාත් සභාව | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය (රු.මි) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය (රු.මි) | 2022 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය (රු.මි) |
|---|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 51,606 | 98,356 | 64,965 |
| මධ්‍යම පළාත් සභාව | 11,391 | 13,756 | 9,258 |
| දකුණ පළාත් සභාව | 48,259 | 60,745 | 58,358 |
| වයඹ පළාත් සභාව | 90,373 | 106,380 | 96,693 |
| උතුරු මැද පළාත් සභාව | 28,793 | 35,864 | 31,997 |
| ඌව පළාත් සභාව | 82,952 | 85,387 | 88,220 |
| නැගෙනහිර පළාත් සභාව | 17,819 | 19,881 | 18,007 |
| උතුර පළාත් සභාව | 53,271 | 57,751 | 25,956 |

| | | | |
|---|---|---|---|
| සබරගමුව පළාත් සභාව | 28,872 | 38,992 | 16,436 |
| එකතුව | 413,336 | 517,112 | 409,890 |

වගු අංක 2.40 : **2022 හා 2023 වර්ෂවල පළාත් සභා වල වත්කම් පිළිබඳ විස්තර**

**මූලාශ්‍ර: 2023 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

**පළාත් සභා වගකීම්**

2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,601 ක් වූ පළාත් සභාවල මුළු වගකීම් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,492 ක් දක්වා සුළු වශයෙන් අඩු වී තිබුණි. එක් එක් පළාත් සභාවේ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පළාත් සභාව | 2023 දෙසැම්බර් 31 දිනට මුළු වගකීම් ශේෂය (රු.මි) | 2022 දෙසැම්බර් 31 දිනට මුළු වගකීම් ශේෂය (රු.මි) |
|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 644 | 520 |
| මධ්‍යම පළාත් සභාව | 679 | 962 |
| දකුණ පළාත් සභාව | 2,212 | 1,627 |
| වයඹ පළාත් සභාව | 98 | 100 |
| උතුරු මැද පළාත් සභාව | 1,118 | 1,000 |
| ඌව පළාත් සභාව | 867 | 1,047 |
| නැගෙනහිර..පළාත් සභාව | 553 | 984 |
| උතුර පළාත් සභාව | 3,300 | 3,104 |
| සබරගමුව පළාත් සභාව | 1,021 | 1,257 |
| එකතුව | **10,492** | **10,601** |

වගු අංක 2.41 : පළාත් සභාවල වගකීම්

**මූලාශ්‍ර: 2023 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

## බස්නාහිර පළාත් සභාව

**වෙස්ප්‍රෝ මුද්‍රණාලය**

වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2023 අගෝස්තු 08 දිනට ගණනය කර තිබූ භෞතික තොගයට අදාළව ආයතනය විසින් නඩත්තු කර තිබූ ගබඩා ලෙජරය කාර්ය පත්‍රිකා සාරාංශය මිලදී ගැණුම් සාරාංශය පදනම් කරගෙන අයිතම 38 ක මුද්‍රණ ද්‍රව්‍ය සම්බන්ධව සිදුකරන ලද තොග විගණනයේදී රු. මිලියන 42 ක් වටිනා මුද්‍රණ තොග ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර අදාළ තොග මිලදී ගැනීමේදී ඇතැම් මුද්‍රණ ද්‍රව්‍ය ආයතනයට ලැබී නොතිබියදී ආයතනයට ලැබුණු බවට ලියකියවිලි ඉදිරිපත් කර, සහතික කර ගෙවීම් කර තිබුණි.

**කල් ඉකුත්වූ ඖෂධ**

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය ආයතන 7 ක 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2 ක් වටිනා කල් ඉකුත්වූ ඖෂධ හා රු. මිලියන 19 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ පැවතුණු නමුත් එකී ඖෂධ කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකරගැනීම**

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 16 කින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂවලට අදාළ ඔප්පු 4,896 කින් වටිනාකම රු. මිලියන 7,303 ක තොරතුරු 2023 වර්ෂයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණ ද ඔප්පු 4693 ක් සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ටෙන්ඩර් පටිපාටියක් බැහැරව බලපත්‍ර නිකුත් කිරීම**

අධිකාරිය විසින් 2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු මගී සේවා බලපත්‍ර 6,047 න් බලපත්‍ර 5,454 ක් හෙවත් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවෙන් සියයට 90 ක් විධිමත් ටෙන්ඩර් පටිපාටියකින් බැහැරව නිකුත් කර තිබුණි.

**මාසික නිල නිවාස කුලී දීමනාවක් ගෙවීම**

ආයතන සංග්‍රහය අනුව මාසික නිවාස කුලී ලෙස දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 14 දෙනෙකුට 2017 නොවැම්බර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 25 ක මාසික නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණි

**දෛනික පැමිණීම හා පිටවීම තහවුරු කර නොගැනීම**

2023 වර්ෂයේදී බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන් 1,710 ක්, හෙද කාර්ය මණ්ඩලය 2,556 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ 7,224 ක් සඳහා දෛනික පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන ඔවුන් විසින් පවත්වාගෙන යන දින පොත්වල සඳහන් වේලාවන් පදනම් කරගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**ඉන්ධන දීමනා ගෙවීම**

බස්නාහිර පළාත් සභාවේ ආයතන 10 කට අදාළව තනතුරු 14 කට අයත් නිලධාරීන් 39 දෙනෙකුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් සීමාවන් ඉක්මවා පළාත් ආණ්ඩුකාර අනුමැතිය මත 2012 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු. මිලියන 16 ක ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

**මූල්‍ය අලාභ අයකර නොගැනීම**

කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කයන්හි සමුපකාර සමිති 5 ක සමිතිවල නිලධාරින් විසින් සිදුකරන ලද මුදල් වංචා හා මුදල් ඌනතා

වටිනාකම රු. මිලියන 338 ක් වුවද අදාල දිස්ත්‍රික්කයන්හි සහකාර සමුපකාර කොමසාරිස්වරු විසින් ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මුල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රු. මිලියන 13 ක් මුල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් හෙනරත්ගොඩ සමිතියේ සභාපති වන සමුපකාර සංවර්ධන නිලධාරියෙකුට සහ කාරක සභිකයින් 11 දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කර තිබුණි. මේ සම්බන්ධ විමර්ශනය පවත්වා 2023 වර්ෂය අවසානය වන විට වසර 3 ½ ක් ගතවී තිබුණද, මූල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**වාහන අලුත්වැඩියා වියදම්**

2022 සැප්තැම්බර් 21 දින අනතුරට ලක්ව තිබූ Discovery වර්ගයේ ජීප් රථයෙහි අලුත්වැඩියා වියදම රු.මිලියන 19 ක් වී තිබූ අතර රක්ෂණ වන්දි ලෙස රු.මිලියන 14 ක් සමුපකාර රක්ෂණ සමාගමෙන් 2024 පෙබරවාරි 09 දින ගෙවා තිබුණි. 2024 මාර්තු 31 දින වන විටත් අනතුරට අදාළ වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අලුත්වැඩියාව සඳහා ගෙවීමට නියමිත ඉතිරි මුදල වූ රු.මිලියන 5 ක් ගෙවා ජීප් රථයේ අලුත්වැඩියා කටයුතු අවසන් කර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## දකුණු පළාත් සභාව

**ඉන්වෙන්ට්‍රි භාන්ඩ ආපසු භාර නොදීම**

අමාත්‍යවරුන්ට හා මන්ත්‍රීවරුන්ට රු.මිලියන 10.5 ක් වැය කර ලැප්ටොප් යන්ත්‍ර 51 ක්, ටැබ් යන්ත්‍ර 54 ක් හා පරිගණක යන්ත්‍රයක් 2015 අගෝස්තු 25 දින ලබා දී තිබුණි. 2019 අප්‍රේල් 10 දින සිට පළාත් සභාව විසුරුවා හැර තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා ආපසු සභා ලේකම් කාර්යාලයට භාරදී නොතිබුණු අතර එදින දක්වාම ඒවා නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්**

වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව 06 දෙනෙකුගෙන් සමන්විත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ වයස අවුරුදු 78 ක්ද සාමාජිකයින් 5කගේ වයස අවුරුදු 67 ත් 77 ත් අතර පරාසයන් තුළද පැවති අතර ඔවුන්ගේ කොමිෂන් සභා සාමාජිකයින් ලෙස සේවා කාලය අවුරුදු 03 සිට අවුරුදු 29 දක්වා වූ කාල පරාසයන් තුළ පැවතුණි. එයින් වයස අවුරුදු 77 හා 78 ක් වූ සාමාජිකයන් දෙදෙනා 1994 වර්ෂයේ සහ 1997 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස දිගින් දිගටම නැවත නැවතත් පත් කිරීම් සිදු කර තිබූ අතර ඔවුන්ගේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවා කාලය පිළිවෙලින් වර්ෂ 29 ක් හා 26 ක් ලෙස පැවතුණි. මෙම තත්ත්වය කොමිෂන් සභා තීරණ වල විනිවිදභාවය, අපක්ෂපාතී බව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

**ස්වයං රැකියා ආධාර ලබා දීම**

දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ස්වයං රැකියා ආධාර ලබා දීම සම්බන්ධයෙන් විධිමත් මාර්ගෝපදේශයන් සකස් කර නොතිබුණි. පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලබා දෙනු ලබන නාම ලේඛන පදනම් කර ගනිමින් ස්වයං රැකියා ආධාර ලබා දී තිබුණු අතර පළාත් සභාව ක්‍රියාත්මක නොවූ 2021 වර්ෂයේදී මන්ත්‍රී ප්‍රතිපාදන, මන්ත්‍රීවරු 13 දෙනෙක් විසින් ඉදිරිපත් කරන ලද නාම ලේඛන වලට අනුව රු.මිලියන 3 ක් ස්වයං රැකියා ආධාර ලබා දී තිබුණි.

**හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීම**

පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් සඳහා නියමිත මුද්දර ගාස්තු ගෙවා නොමැති විට, හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගත යුතුවේ. එහෙත් මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2021 අගෝස්තු සිට 2022 අප්‍රේල් දක්වා මාස 08 කට අදාළ රු. මිලියන 9.6 ක් වූ ඔප්පු 2784 ක තොරතුරු 2023 පෙබරවාරි මස 24 දින පළාත් ආදායම් ප්‍රාදේශීය කාර්යාලයට ලැබී තිබුණද, 2023 නොවැම්බර් 27 දින වන විටත්, ඒ සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

2018 මැයි සිට 2020 අගෝස්තු දක්වා වූ මාස 19 කට අදාළ රු. මිලියන 0.5 කට වඩා වැඩි වටිනාකම් සහිත ඔප්පු 7481 ක් සම්බන්ධයෙන් වූ උපලේඛන මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2020 ජුලි 30 දින සහ 2021 අප්‍රේල් 07 හා සැප්තැම්බර් 23 යන දින වලදී පළාත් ආදායම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. එම ඔප්පුවලින් 2023 ජනවාරි 01 සිට 2023 නොවැම්බර් 24 දින වනවිටත් ඔප්පු 5154 ක් සම්බන්ධයෙන් අදාළ ඔප්පු හඳුනාගෙන ප්‍රමුඛතාවය ලබාදිය යුතු ඔප්පු සඳහා ලිපිගොනු විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.

**ඉඩම් හුවමාරු කිරීම්වලට අදාළ ඔප්පු ලියාපදිංචිය පරීක්ෂව**

දකුණු පළාත හැර වෙනත් පළාත්වල නොතාරිස්වරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් හුවමාරු කිරීම්වලට අදාළ ඔප්පු ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2023 නොවැම්බර් 27 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලය තුළ රු.මිලියන 54.9 ක් වටිනා ඉඩම් හුවමාරු අවස්ථා 18කට අදාළව තොරතුරු නිරීක්ෂණය වූ අතර, ඉන් ඔප්පු 16 කට අදාළව තොරතුරු ලබා ගෙන ගොනු විවෘත කර නියමිත මුද්දර ගාස්තු ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි.

**දේපළ පැවරීම් ගාස්තු ගෙවීම පැහැර හැරීම**

පෞද්ගලික ආයතනයක් සතු රු.මිලියන 243 ක් වූ දේපල තවත් පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමේදී ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු. මිලියන 9.7 ක් ගෙවීම පැහැර හැර තිබුණි.

**වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය**

2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (MSMIS) මඟින් කල් ඉකුත් වූ ඖෂධ වසරක් තුළ හඳුනාගෙන අපහරණය සඳහා කටයුතු කර, මුදල් රෙගුලාසි 102 සිට 109 ප්‍රකාරව පොතෙන් කපාහැරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කල යුතු බව 2021 දෙසැම්බර් 08 දිනැති අංක 01/2021 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ දක්වා තිබුණද ගාල්ල ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම කමිටු වාර්තා මඟින් අනාවරණය කරගෙන තිබුණු රු.මිලියන 23.6 කට ආසන්න කල් ඉකුත් වූ ඖෂධ PRONTO පද්ධතිය මඟින් විධිමත් අවසරයකින් තොරව භාණ්ඩ සමීක්ෂණය සඳහා ලබාදී තිබූ මුරපද භාවිතා කර මකා දමා තිබුණි.

**මධ්‍ය වායු සමීකරණ පද්ධති අසාර්ථක වීම**

කඹුරුපිටිය මූලික රෝහලට රු.මිලියන 14.4 ක (බදු රහිත) වටිනාකමට 2015/2016 වර්ෂවල මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කර තිබුණද සවි කරන ලද අවස්ථාවේ සිටම එය අක්‍රීයව පැවතුණි. තවද, බලපිටිය මූලික රෝහල සඳහා මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් රු.මිලියන 7.7 ක් වැයකර 2016 ජූනි 20 දින ස්ථාපනය කර තිබුණද එයද 2017 දෙසැම්බර් 03 දින වන විට සම්පූර්ණයෙන්ම අක්‍රීයව පැවතුණි. ඒ අනුව රෝහල් දෙකහි ශල්‍යාගාර පවත්වා ගැනීම සඳහා රු.මිලියන 4.4 ක මුදලක් වැයකර Split AC යන්ත්‍ර 22 ක් සවිකර තිබූ අතර විගණිත දින දක්වාම ඉහත ව්‍යාපෘති අසාර්ථක වීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ තොරතුරු කළමනාකරණ පද්ධතිය**

2016 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් දක්වා රු.මිලියන 15 ක් වැයකරමින් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර තිබුණද දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන් එම කාර්යයෙන් ඉවත්වීම තුළ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබුණි. එමෙන්ම,තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 8.8 ක් වැයකර ලබාදුන් ටැබ් පරිගණක 225 හි වර්තමාන හිමිකාරීත්වය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

**භෞතික පැවැත්ම තහවුරු නොවූ වාහන සහ යතුරුපැදි**

දකුණු පළාත් සභාවේ ආයතන නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු වාහන සහ යතුරුපැදි 178 ක් හා ආයතන විසින් ඉදිරිපත් කර තිබූ වාහන ලැයිස්තුවල සඳහන්

වාහන 07 ක් සහ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගතකර තිබූ වාහන හා යතුරු පැදි 04 ක් ඇතුළුව වාහන 201 ක භෞතික පැවැත්ම තහවුරුකර ගත නොහැකි විය. එයින් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් නමින් ලියාපදිංචි යතුරු පැදි 30 ක් වෙනුවෙන් අවස්ථා කිහිපයකදී නිදහස් ආදායම් බලපත්‍ර ලබාදී තිබූ අතර වාහනවල අයිතිය හා භෞතික පැවැත්ම පිළිබඳව තහවුරු කර නොගෙන නිදහස් ආදායම් බලපත්‍ර ලබාගත්තේ කෙසේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

**ප්‍රසම්පාදනවල විනිවිදභාවය පිළිබඳ ගැටලු**


දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාතර දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයේ මුලටියන ගමගෙවත්ත අමුණෙහි ගේබියන් බැම්ම ඉදිකිරීම සඳහා රු.මිලියන 8.2 ක් හා රත්මලාව අමුණ ඉදිකිරීම සඳහා රු.මිලියන 11 ක ඇස්තමේන්තු සකස්කර 2024 මාර්තු 05 දින පුවත්පත් මඟින් ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කර තිබූ අතර එසේ කිරීමට පෙර සිටම ඉදිකිරීම් සිදුකිරීමට අපේක්ෂිත වැඩ බිම වෙත ඉදිකිරීම් ද්‍රව්‍ය වූ බඹගල් ඝනමීටර් 355 ක් හා ABC ඝන මීටර් 34 ක් පමණ ප්‍රවාහනය කර ගොඩගසා තිබුණි. දෙපාර්තමේන්තු කළමනාකරණය මේ පිළිබඳව දැනුවත් වී තිබුණද ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම හේතුව මත ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රසම්පාදනයේ විනිවිදභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

**නිෂ්කාර්ය වත්කම්**

දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගැසට් කර තිබූ වැව් 905 ක ආක්‍රමණශීලී ජලජ පැළෑටි ඉවත් කර ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 84 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගෙන 2023 සැප්තැම්බර් 14 දිනට දින 587 ක් ගත වී තිබුණද, යන්ත්‍රය එදින දක්වා පැය 414 ක් පමණක් භාවිතා කර තිබුණි. එමෙන්ම වැව් 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යන්ත්‍රය යොදා ගෙන තිබුණද ප්‍රතිසංස්කරණය කර තිබුණේ වැව් 03 ක් පමණක් වීම නිසා යන්ත්‍රය දින 234 ක් නිෂ්කාර්යව පැවතුණි. ඉන් අළුත්වැඩියා කටයුතු සඳහා දින 199 ක් ගත කර තිබූ අතර ආනයනික සමාගම ප්‍රමාණවත් සේවා සැපයීමක් සහ අළුත්වැඩියාවක් සිදු කර නොතිබුණි. නමුත් යන්ත්‍රය මිලදී ගැනීමේදී මේ පිළිබඳව සලකා බලා නොතිබුණි.

## මධ්‍යම පළාත් සභාව

2023 වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක පළාත් සභාවේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත රූපසටහනෙහි දැක්වේ.




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත ආදායම | 45,256 | 43,403 | 48,021 | 45,558 | 54,444 |
| තථ්‍ය ආදායම | 40,066 | 42,304 | 45,811 | 48,375 | 51,101 |
| ඇස්තමේන්තුගත වියදම | 46,335 | 44,281 | 50,060 | 45,558 | 56,792 |
| තථ්‍ය වියදම | 40,312 | 42,538 | 45,203 | 51,247 | 51,032 |

රූප සටහන් අංක 2.48 : ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය : මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

**ගිණුම්ගත නොවූ බදු**

වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයෙකු වෙත බදු දී තිබුණු ඉඩමකින් 2010 ජනවාරි 10 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු බදු රු.මිලියන 23.32ක් අය කර නොතිබූ අතර එම අය අයකර ගත යුතු බදු පිළිබඳ ඉඩම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

**හිඟ ආදායම්**

2023 දෙසැම්බර් 31 දිනට පළාත් සභා ආදායම් ගිණුමේ විෂයයන් 04 කට අදාළව රු.මිලියන 135.83ක හිඟ ආදායම් අය කර නොතිබුණි. මෙයින් එකතුව රු.මිලියන 68.56ක් ඉඩම් බදු කරුවන්ගෙන් අයකර ගත යුතුව පැවතුණි. සමස්ථ හිඟ ආදායමෙන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයකර නොගත් ප්‍රමාණය රු.මිලියන 28.51 ක් වී තිබුණි.

**අතිරේක මුද්දර බදු රැස් නොකිරීම**

1990 අංක 17 දරන මධ්‍යම පළාත් මුදල් ප්‍රඥප්තියේ 73(8) වගන්තිය යටතේ සිදුකර තිබුණු දේපල විකිණීම් නැවත තක්සේරු කිරීමේ සිද්ධීන් 96 ක තොරතුරු කැඳවීම් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේ දී අවස්ථා 70 කට අදාළව දේපල හුවමාරු කිරීම්/ විකිණීම් පිළිබඳව අයකළ යුතු අතිරේක මුද්දර බදු රු.මිලියන 5.94 ක් අදාළ ගැනුම්කරුවන්ගෙන් මාස 10 ත් වසර 07 ත් අතර කාලයක සිට රැස්කර ගැනීමට ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**විගණන අධිභාර අයනොකිරීම**

පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2013 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන 06 කට අදාළව නිකුත් කර තිබුණු විගණන අධිභාර 15 ක එකතුව රු.මිලියන 9.7 ක් වූ අතර

එම අධිභාරයන් අදාළ පාර්ශවයන්ගෙන් අයකිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2023 වර්ෂය අවසාන දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**කල් ඉකුත් වූ ඖෂධ**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රෝහල් 03 ක 2023 වර්ෂය අවසාන දිනට මාස 03 සිට මාස 96 දක්වා කාල පරාසයක් තුළ එකතුව රු.මිලියන 3.25 ක් වූ කල් ඉකුත් වූ ඖෂධ ඒකක 452,650 ක් හා ගලගෙදර ප්‍රාදේශීය රෝහලේ රු.398,280 ක තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 72,206 ක් පැවතුණි

**විදුලි බලාගාරවලින් බදු අයනොකිරීම**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක පිහිටි ජල විදුලි බලාගාර 03 ක් වර්ෂ 03 සිට වර්ෂ 20 දක්වා කාලසීමාවක සිට විදුලිය නිෂ්පාදනය කර ජාතික පද්ධතියට විදුලිය මුදාහැර ඇතත් එම බලාගාර සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටත් ජල හැරවුම් අවසර පත් නිකුත් කර බදු අයකිරීමට කටයුතු නොකිරීමෙන් රු.මිලියන 4.67ක බදු ආදායමක් පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

**ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම**

මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමත කර තිබූ රු.මිලියන 31.65ක් වූ කර්මාන්ත 02 ක් ද, වෙනත් අරමුදල් යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල රු.මිලියන 239.62ක් වූ ව්‍යාපෘති 25 ක්ද HSEP ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කල රු.මිලියන 421.32ක් වූ ව්‍යාපෘති 33 ද 2023 වර්ෂය තුළදී ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**ඇපකර මුදල් අය නොකිරීම**

තෙල්දෙණිය මූලික රෝහලේ සේවය කළ වෛද්‍ය නිලධාරිවරයෙකු 2016 මැයි 02 සිට 2021 මැයි 01 දින දක්වා කාලය තුළ වැටුප් රහිත නිවාඩු අනුමත කරගෙන විදේශගතවී තිබුණු නමුත් 2023 ඔක්තෝබර් වන විටද සේවයට වාර්තා කර නොතිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව අය කරගත යුතු රු.මිලියන 1.17 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**වාහන භෞතිකව නොතිබීම**

මෝටර් රථ ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් තහවුරු කිරීම්වලට අනුව පළාත් සභාවට අයත් වාහන ලෙස අනාවරණය වූ වාහන 734 න් වාහන 12 ක තොරතුරු මධ්‍යම පළාත් සභාවේ ආයතන මඟින් අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු අයුරකින් තහවුරු නොවුණි.

**අනාර්ථික වියදම්**

2018 ඔක්තෝබර් 18 දින මධ්‍යම පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අමාත්‍යවරුන් හා පෞද්ගලික කාර්යය මණ්ඩලය භාවිතා කළ වාහන 61 ක් ප්‍රධාන ලේකම් හා අනෙකුත් ආයතනවලට භාර දී තිබුණි. එම වාහන, අවශ්‍යතාවය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට ලබා ගැනීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමකින් තොරව, එම අධිකාරිය විසින් එහි ප්‍රධාන /විධායක ඉංජිනේරුවරුන් සඳහා ද්විත්වකාර්ය වාහන 12 ක් 2018 සිට 2023 අගෝස්තු දක්වා කාලය තුළ කුලී පදනම මත සේවයේ යොදවා ගෙන කුලී ලෙස එකතුව රු.මිලියන 75.092 ක් පෞද්ගලික පාර්ශවයන් වෙත ගෙවා තිබුණි.

**ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

2018 සිට 2023 දක්වා කාලය තුළ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘති සඳහා රාජ්‍ය නොවන සංවිධාන 03 කින් ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 3.03ක් අදාළ අරමුණුගත කාර්යන්ට යොදවා ගැනීමකින් තොරව ආදායමට බැර කර තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

සංචාරක කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ රු.මිලියන 7.95ක් වැයකර රංගිරි දඹුලු රජමහා විහාරයට අයත් ඉඩමක, ආයුර්වේද සුවතා මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. 2023 වසර අවසාන වන විට ඉදිකර වසර 07 ක කාලයක් ගතවී තිබුණද, මෙම මධ්‍යස්ථානය භාවිතයකින් තොරව පැවතුණි. මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අඹතැන්න සේවා මධ්‍යස්ථානයේ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණ පුහුණුව ලත් කාර්යමණ්ඩලය බඳවා ගැනීම ප්‍රමාද වීම මත 2015 වර්ෂයේදී සේවා මධ්‍යස්ථානයට මිලදී ගෙන තිබූ රුමිලියන 4.04ක් වූ යන්ත්‍ර 03 ක් වසර 08 කට වැඩි කාලයක සිට සේවා මධ්‍යස්ථානය තුළ නිෂ්කාර්යයව පැවතුණි.

**ගොවිපල් සංඛ්‍යාව හා සත්ත්ව සහණය අඩුවීම**

සත්ව අභිජනන කටයුතු සංවර්ධනය තුලින් කෘෂිකාර්මික සතුන්ගේ නිෂ්පාදන දායකත්වය ඉහළ නැංවීම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද 2020 වර්ෂයේ මධ්‍යම පළාතේ ලියාපදිංචි වී තිබුණු සමස්ත ගොවිපල් සංඛ්‍යාව 38,081ක් වුවද 2022 වර්ෂය වනවිට එම සංඛ්‍යාව ගොවිපල් 31,344 ක් දක්වා 6,737 කින් අඩුවී තිබුණි. ඒ අතරින් එම කාලයට අදාළව දේශීය කිරි නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වය දක්වන එළගව හා මීගව ගොවිපල් සංඛ්‍යාව 6441කින් එනම් සියයට 17කින් අඩුවී තිබුණි. එසේම 2020 වර්ෂයේ 100,423 ක්වූ සත්ව ගහනය 2022 වර්ෂයේදී 82,228 ක් දක්වා 18,195කින් පහළ ගොස් තිබීම කිරි නිෂ්පාදනය අඩු වීමට බලපා තිබුණි. 2020 සිට 2022 දක්වා පශු සම්පත් ක්ෂේත්‍රයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 123.16ක් වැයකර තිබුණද ගොවීන් විශාල සංඛ්‍යාවක් සත්ව පාලනයෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය.

**පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ නොකිරීම**

2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට වෙන්කල ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නවයාලතැන්න දිස්ත්‍රික් කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පාංශු විද්‍යාගාරය නවීකරණය සහ පාංශු පරීක්ෂණ උපකරණ සඳහා රු.මිලියන 17.52 ක් වැයකර තිබුණද 2023 වර්ෂය අවසාන වනවිට වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද, පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ නොකර ඒ සඳහා සපයන ලද උපකරණ ඇසුරුම් තුළම රඳවා නිෂ්කාර්යයව පැවතුණි.

**අතරමඟ නතර කර තිබූ ව්‍යාපෘති**

2021 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මුල්හාල්කැලේ කෘෂිකර්ම උපදේශක නිල නිවාසය, වලපනේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ලෙස නවීකරණය කිරීම සඳහා 2021 ඔක්තෝබර් 04 දින රු.මිලියන 10.23 කට ගිවිසුම්ගත වී තිබුණු අතර 2021 දෙසැම්බර් 30 දිනට ඉදිකිරීම් නිම කිරීමට නියමිත වී තිබුණි. එසේ වුවද 2022 දෙසැම්බර් 15 දින වන විට වැඩ අතර මඟ නවතා තිබුණු අතර ඉටුකර තිබූ වැඩ සඳහා රු.මිලියන 4.09ක් ගෙවීම්කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් එහි ඉදිකිරීම් අවසන්කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැය කල මුදල් නිශ්ඵල වියදම් බවට පත්වී තිබුණි.

## වයඹ පළාත් සභාව

**වාහන අනතුරු**

හිටපු ආණ්ඩුකාරවරයකු විසින් භාවිතා කරන ලද මෝටර් රථය 2020 ජූලි 1 දින අනතුරකට පත්වී තිබුණි. එම මෝටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 5.3 ක් පළාත් සභාව විසින් වැයකර තිබුණද, රක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණේ රු.මිලියන 3.9 ක් පමණි. ඉතිරි මුදල වූ රු.මිලියන1.4 ක් රියදුරාගෙන් අය කිරීමට තීරණය කර තිබුණද, විගණිත දිනය වූ 2024 මාර්තු 06 දින වන විටත් එම මුදල් අය කරගෙන නොතිබුණි.

වයඹ පළාත් සභා ලේකම් කාර්යාලයේ ප්‍රයෝජනයට ලබා දී තිබුණු වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිනිය වෙත ලබා දී තිබියදී 2002 ඔක්තෝබර් 11 වන දින එම රථය අනාරක්ෂිතව ගාල් කර තිබිය දී සම්පූර්ණයෙන්ම ගිනිගෙන විනාශයට පත් වීමෙන් සිදු වූ අලාභය 2024 ජනවාරි 19 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

පළාත් මූල්‍ය රීති 54.4 ප්‍රකාරව 2020 ජනවාරි 03 දින දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව රියදුරු විසින් පදවාගෙන ගොස් දඹුලු පාරෙහි සමන්පුර ප්‍රදේශයේ දී අනතුරකට ලක්වී තිබුණු වෑන් රථය නැවත සකස් කිරීමට පළාත් සභාවෙහි ප්‍රතිපාදන රු.මි. 1.4 වැය කර තිබුණි. උක්ත වාහනය පූර්ණ රක්ෂණය සිදු කර

තිබුණද, රියදුරුගේ බීමත්කම යන කාරණාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණ කර තිබුණේ රු.මිලියන 0.4 ක් පමණි. අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 10 දින වන විටත් වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි

කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන දෙකක් අනතුරුට ලක්වී පිළිවෙලින් වසර 3 ½ ක් හා වසර 02 මාස 03 ක් ගතවී තිබුණද මූලික පරීක්ෂණ අවසන් වී විනය පරීක්ෂණ අවසන් වී නොතිබීමෙන් එකතුව රු.මිලියන 18.3 ක අලාභ අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි.

2018 ඔක්තෝබර් 10 දින පළාත් සභාව විසුරුවා හැරීමට පෙර දේශපාලන අධිකාරිය වෙත වෙන්කර තිබූ ද්විත්ව කාර්යය කැබ් රථයට 2014 දෙසැම්බර් 30 දින සිදුවූ අනතුරට අදාලව රු.මිලියන 6 ක අලාභයක් සිදුවී තිබූ අතර, එයින් රු.මිලියන. 3.96 ක මුදලක් රක්ෂණ සමාගම මඟින් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඉතිරි රු.මිලියන 2.06 ක මුදල අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් 2023 අගෝස්තු 08 දින වන විටත් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**වාහන පාලනය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් හා ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියෙන් වාහන 288 ක ලියාපදිංචිය සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු අනුව, වයඹ පළාත් සභාවේ ආයතන නමින් ලියාපදිංචි කර තිබූ වාහන 38 ක් පළාත් සභාවේ ආයතන සතුව නොපැවතුණි.

**පෞද්ගලික නම්වලින් ලියාපදිංචි වාහන**

වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භාවිතා කරන වාහන 03 ක් පෞද්ගලික නම්වලින් ලියාපදිංචි කර තිබුණි.

**ජන කලා කේන්ද්‍රයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම**

ජන කලා කේන්ද්‍රයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු. මිලියන 209.7 ක් වැයකර තිබුණු නමුදු, 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය අතරමඟ නතර කර දමා තිබුණි.

**බිල්පත් මගින් නියමිත පරිදි අත්තිකාරම් අයනොකිරීම**

වයඹ පළාත් සභාව සහ කුරුණෑගල මහා නගර සභාව ඒකාබද්ධව ඉදිකරනු ලබන කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 973.6 ක්වූ සයමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත 2020 දෙසැම්බර් 24 දිනට ලබාදී තිබුණු අත්තිකාරම් මුදල වූ රු. මිලියන 185.1 ක් වී තිබුණි. මුදලින් ගෙවන ලද අටවන (08) බිල්පත දක්වා වූ වටිනාකම රු.මිලියන 87.7 ක් වුවද අයකරගෙන තිබූ අත්තිකාරම් මුදල රු. මිලියන 24.2 ක් පමණක් වී තිබුණි.

**අධිභාර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම**

1996 වර්ෂයේ සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු එකතුව රු.මිලියන 3.3 ක් වූ අධිභාර සහතික 07 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වගකිව යුතු පාර්ශවයන් විසින් ගෙන නොතිබුණි.

**ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම**

2017 අප්‍රේල් 09 දිනැති අංක 03/ 2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවත්, පළාත් සභාවේ කිසිදු පාසලක එපරිදි කටයුතු කර නොතිබුණි.

**ඉඩම් අයිතිය තහවුරු කර නොගැනීම**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප කාර්යාල 03 කට අයත් වූ පාසල් 364 ක එම භූමියෙහි/ ඉඩමෙහි අයිතිය තහවුරු කර ගැනීමට 2024 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**ස්ථාන මාරු පටිපාටිය විධිමත්ව ක්‍රියාත්මක නොවීම**

වයඹ පළාතේ විදුහල්පති ශ්‍රේණිධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය අනුව පාසල්වල එකම පාසලක වසර 5 කට වැඩි විදුහල්පති සේවා කාලයක් සහිත විදුහල්පතිවරු ස්ථානමාරු කළ යුතු වුවද, ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක නොවීම තුල කුරුණෑගල කලාපයේ පමණක් වර්ෂ 05 ත් 14 ත් අතර කාලයක් එකම පාසලේ සේවය කරනු ලබන විදුහල්පතිවරුන් 72 දෙදෙනෙකු විය.

**සමුපකාර කටයුතු**

සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ 04 කට අයත් ලියාපදිංචි සමිති 677 ක් වෙතින් සමුපකාර අරමුදලට හිඟ දායක මුදල වූ රු.මිලියන. 113.5 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මහව සහ කුලියාපිටිය සහකාර කොමසාරිස් කාර්යාලයන්ට අදාලව පිළිවෙලින් ලිපිගොනු 287 ක් හා 93 ක්ද ණය හා විවිධ ආරවුල්වලට අදාල රු. මිලියන 50.1 ක් වටිනා මුළු ලිපිගොනු 380 ක් මාස 01 සිට මාස 31 දක්වා කාල පමාවක් ගතව පැවතියද තීන්දු ලබාදී නොතිබුණි.

වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ 04 පිහිටි සමුපකාර සමිති 61 ක වගකිවයුතු නිලධාරීන් 149 දෙනෙකුගෙන් රු.මිලියන 88.4 ක මුදල් වංචා, මුදල් අඩුවීම් 2023 වර්ෂය අවසන් වන විට වාර්තා වී තිබුණද ඊට අදාල විමර්ශනයන් සිදුකිරීමට දුර්වල මට්ටමක පැවතුණි.

**ඉඩම් පරිපාලන කටයුතු**

විගණනයට ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව එදිනට ආයතන හා පුද්ගලයින් 55 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟහිටි දීර්ඝකාලීන බදු වටිනාකම රු.මිලියන 107.9 ක් වී තිබුණි.

කුරුණෑගල මල්කඩුවාව අක්කර 01 යි පර්චස් 4.3 ක්, පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් වෙත වර්ෂ 30 ක් සඳහා දිර්ඝ කාලීන බදු ලබා දී තිබුණ අතර බදු ගිවිසුම් අනුව කටයුතු නොකිරීම නිසා ඉඩම ආපසු භාරදෙන ලෙසට අධිකරණ තින්දුවක් ලබාදී තිබුණි. පුද්ගලික ආයතනය විසින් ඉඩමේ භුක්තිය ප්‍රාදේශිය ලේකම්වරයා වෙත භාර දී නොතිබුණු අතර අදාළ ඉඩම බදු ලබාදුන් දින සිට බදු මුදල් හා ඒ මත පොළි වශයෙන් රු.මි. 52 ක් අයවිය යුතුව පැවතුණි.

පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මනතිව් ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 29 පර්චස් 10 ක පමණ රජයේ ඉඩම 1988 ජුනි 29 දින සිට වසර 30 ක කාලයක් පුද්ගලික සමාගමක් වෙත දිගුකාලීනව බදුදී තිබුණි. එම පුද්ගලික සමාගමට ලබාදුන් ඉඩම එම සමාගම විසින් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව 2008 ජුනි 11 දින වෙනත් පුද්ගලික සමාගමකට විකුණා තිබුණි

**සෞඛ්‍ය සේවා කටයුතු**

රෝහල් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ (HHIMS) පද්ධතිය ක්‍රියාත්මක කිරීමට දඹදෙණිය, ගල්ගමුව හා නිකවැරටිය රෝහල් සඳහා ලබා දී තිබූ ලැප්ටොප් පරිගණක 22 ක් කේත කියවන 20ක් මුද්‍රිත යන්ත්‍ර 02 ක් ස්ටිකර් ප්‍රින්ටර් 04 ක් හා ස්ටිකර් රෝල් 15 ක් නිශ්කාර්යව පැවතුණි.

**සියඹලන්ගමුව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය**

වෛද්‍ය සත්කාර ඒකකය හා නිල නිවාසය සඳහා රු.මි. 18.6 ක් වැයකර 2018 වර්ෂයේදී ඉදිකරන ලද සියඹලන්ගමුව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ කටයුතු 2022 වර්ෂයේ මාර්තු 31 දින ආරම්භ කර තිබුණි. එසේවුවද, එහි සේවය කරන ලද ප්‍රධාන වෛද්‍ය නිලධාරි 2023 ජනවාරි 06 දින සිට පුහුණුවක් සඳහා එම ස්ථානයෙන් නිදහස් කිරීමත් සමඟ එදින සිට රෝගී සත්කාර සේවාවන් නවතා එම ඒකකය නිශ්කාර්යව වසා දමා තිබුණි.

**නිශ්කාර්ය උපකරණ**

ව්‍යාපෘතියක් යටතේ මිලදීගෙන තිබූ රු.මිලියන 1.2 ක් වටිනා Emergency Trolley 04ක් හා Drugs Trolley 08 ක් 2024 මාර්තු දක්වා බෙදා නොහැර මාස 14 ක කාලයක් මාරවිල රෝහල් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

**දෛනික සාමාන්‍ය සේවා කාල සඳහා අතිකාල දීමනා ගෙවීම**

නියමිත දෛනික සේවා කාලය තුළට ගැනෙන දිවා විවේකය සඳහා වූ විනාඩි 30 ක කාලයද ඇතුළත්ව මධ්‍යහන 12.00 සිට ප.ව 1.00 දක්වා වූ පැයක කාලයට 2022 හා 2023 වර්ෂ සඳහා අතිකාල දීමනා ලෙස කුරුණෑගල හා පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

කාර්යාලවලට අනුයුක්ත පිළිවෙලින් වෛද්‍යවරු 21 දෙනෙකු සඳහා රු.මිලියන 1.9ක් ද, වෛද්‍යවරු 11 දෙනෙකු සඳහා රු. මිලියන 1.2ක් ද වශයෙන් අතිකාල දීමනා ගෙවා තිබුණි.

**පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුදල්**

2023 වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන 30 කට ගෙවිය යුතු උසාවි දඩ මුදල් රු.මිලියන 275.3 ක් හා පළාත් පාලන ආයතන 22 කට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.මිලියන 353.5 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පළාත් පාලන ආයතන වලට ලබාදීමට ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

**නිශ්කාර්ය ලූණු ගබඩාව**

ගල්ගමුව රජයේ ගොවිපලේ පවතින 2022 වර්ෂයේ පෙබරවාරි 02 දින වැඩ අවසන් කර භාරදී තිබුණු රු. මිලියන 3.6 ක් වටිනා ලූණු ගබඩාව 2023 වර්ෂය අවසානය වන විටත් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

**වන්නිගම ඒකාබද්ධ ගොවිපල ආදායම් හා වියදම්**

වන්නිගම ඒකාබද්ධ ගොවිපල සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 12.57 ක් වූ අතර, මුළු පුනරාවර්තන වියදම සහ මූලධන වියදම පිළිවෙලින් රු.මිලියන 34.01ක් සහ රු.මිලියන 1.54 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමවත් ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ගොවිපල විසින් උපයාගෙන නොතිබුණි.

**නෛතික ප්‍රතිපාදනයන් නොමැතිව දීමනා ගෙවීම**

වයඹ පළාත් පරිසර අධිකාරියේ විධායක නිලධාරීන්ට නෛතික ප්‍රතිපාදනයන් නොමැතිව 2015 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාලයට විධායක දීමනා ලෙස රු.මිලියන 4.52 ක් ගෙවා තිබුණි. තවද, නෛතික ප්‍රතිපාදන නොමැතිව සහකාර අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිලධාරීන් 3 දෙනෙකුට රු.මිලියන 2.32ක් ගෙවා තිබුණි.

**නීතිරීතිවලට පටහැනි පත්කිරීම්**

වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය, වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ සඳහන් නීතිරීතිවලට පටහැනිව ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂවරයෙකු පත්කර 2017 ජූනි 01 දින සිට 2023 නොවැම්බර් 30 දක්වා රු.මිලියන 1.57 ක් ගෙවීම් කර තිබුණි.

**පෙර පාසල් නියාමනය**

වයඹ පළාතේ සියලුම පෙර පාසල් වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාත තුළ ක්‍රියාත්මක පෙර පාසල් 2152 කින් පෙර පාසල් 910 ක් ලියාපදිංචි කර නොතිබුණි. ඒ

අනුව වයඹ පළාතේ පිහිටි පෙර පාසල් සංඛ්‍යාවෙන් සියයට42 ක් ආයතනයේ නියාමනයට ලක් වී නොතිබුණි.

**ලැබිය යුතු ධාවන සටහන් පත්‍ර ගාස්තු**

2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.මිලියන 13.49 ක් හා ප්‍රමාද ගාස්තු රු.මිලියන 2.71 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**මගී සේවා අවසර පත්‍ර පැවරීම**

මගී සේවා අවසර පත්‍රයක් වෙනත් පුද්ගලයෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර එසේ පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේය යනුවෙන් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 50.25 ක් වටිනා බලපත්‍ර 112 ක් වෙනත් පාර්ශවයන් වෙත පැවරීමට කටයුතු කර තිබුණි.

2011 වර්ෂයේ අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම මඟින් ටෙන්ඩර් කැඳවා රු.මිලියන 19.28 ක් වටිනා මාර්ග බලපත්‍ර 40 ක් වර්ෂ 05 ක වලංගු කාලසීමාවක් සඳහා ලබාදීමට කටයුතු කර තිබුණු අතර එම බලපත්‍රවල වලංගු කාලසීමාව 2016 වර්ෂයෙන් අවසන් වූ පසු 2016 හා 2021 වර්ෂ වලදී නැවත ටෙන්ඩර් කිරීම තුලින් රු.මිලියන 38.57 කට ආසන්න මුදලක් උපයාගත හැකිව තිබුණද එම බලපත්‍ර 40 හෝ නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණි.

## සබරගමුව පළාත් සභාව

**දේශන ශාලාව ඉදිකිරීම**

කරපිංච කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 27.6 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද දේශන ශාලාවේ ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පුහුණු වැඩසටහන් 2024 ජනවාරි දක්වා ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

**සමාජ සුභසාධක උපකරණ බෙදා හැරීම**

2021 නොවැම්බර් මාසයේදී සමාජ සුභසාධක අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ආබාධිතයන් වෙත බෙදා දීම සඳහා සමාජ සේවා අංශය වෙත නිකුත් කර තිබූ රු.මිලියන 2 ක් වූ ශ්‍රවණාධාර උපකරණ 143 ක් සහ 2023 වර්ෂයේදී ලැබී තිබූ රු.මිලියන 5.5 ක් වූ කිහිලිකරු 44 ක් ,කොමඩ් රෝද පුටු 98 ක් ,සාමාන්‍ය රෝද පුටු 04 ක් ,කොමඩ් පුටු 22ක් , ඇවිදින රාමු 84 ක් ,අත්වාරු 63 ක් හා වායු මෙට්ට 72 ක් 2024 මාර්තු 05 දිනවන විටත් අදාළ පාර්ශවයන්ට බෙදා දීමෙන් තොරව ගබඩාවේ පැවැතිණි .

**ජාලගත සෞඛ්‍ය කළමනාකරණ පරිගණක තොරතුරු පද්ධතිය**

ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වූ ජාලගත සෞඛ්‍ය කළමනාකරණ පරිගණක තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2021, 2022 හා 2023 වර්ෂවල මිල දී ගෙන පළාතේ රෝහල් වෙත ලබා දී තිබූ එකතුව රු. මිලියන 9 ක් වූ තාක්ෂණික උපකරණ 131 ක් තීරු කේත මුද්‍රණයට අදාළ ස්ටිකර් නොමැතිවීම හේතුවෙන් 2024 පෙබරවාරි 26 දින වන විටත් අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබුණි.

**නිශ්කාර්ය වත්කම්**

ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු. මිලියන 67ක් වැයකර ඉදිකර තිබූ ගෙවන වාට්ටු සහිත ගොඩනැගිල්ල 2020 නොවැම්බර් 09 දින කෑගල්ල ආයුර්වේද රෝහල වෙත භාර දී තිබුණද 2024 ජනවාරි 18 දින වන විටත් නිශ්කාර්යව පැවතිණි. තවද මෙම ගොඩනැගිල්ල නැවත අලුත්වැඩියා කළ යුතු තත්ත්වයකට පත්ව තිබුණු බව නිරීක්ෂණය විය.

**අතිරික්ත තොග රඳවා ගැනීම්**

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් 2023 වර්ෂයේදී රු.මිලියන 38 ක් වූ තාර බැරල් 970 ක් සහ රු. මිලියන 5.3 ක් වූ කෝලාස් බැරල් 120 ක් මිල දී ගෙන 2023 මැයි මාසය තුළ දී විධායක ඉංජිනේරු කාර්යාල වෙත බෙදා හැර තිබුණි. ඒ වන විට ගබඩා සතුව ප්‍රමාණවත් තොග පැවතිය දී සහ විධායක ඉංජිනේරු කාර්යාල අතර තොග හුවමාරු කිරීමේ හැකියාව පැවතියදී නැවත තොග මිල දී ගැනීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 31 ක් වටිනා තාර බැරල් 783.7 ක් සහ රු. මිලියන 5.3 ක් වටිනා කෝලාස් බැරල් 120 ක් මාස 07 ක කාල පරිච්ඡේදයක් ගබඩාවල අතිරික්ත තොග ලෙස රඳවා ගෙන තිබුණි.

**විධිමත් අනුමැතිය රහිත රක්ෂණ යෝජනා ක්‍රම**

සබරගමුව පළාත් සභාව විසින් 2011 වර්ෂයේ සිට පළාත් සභාව විසුරුවන ලද 2017 වර්ෂය තෙක් සියලුම මන්ත්‍රීවරුවන්ටත්, පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ආණ්ඩුකාරවරයා සහ සභාපතිවරයා සඳහාත් රක්ෂණ යෝජනා ක්‍රම 02 ක් අමාත්‍ය මණ්ඩල තීරණය මත ක්‍රියාත්මක කර තිබුණි. මෙම රක්ෂණ යෝජනා ක්‍රම මගින් ලබා දී තිබුණු රක්ෂණ ආවරණය 1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනතේ 02 වගන්තියට අනුකූල නොවූ බැවින් 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වාර්ෂික වාරික ලෙස රු. මිලියන 53.8 ක් නීත්‍යානුකූල නොවන ලෙස පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## නැගෙනහිර පළාත් සභාව

**නිෂ්කාර්ය වත්කම්**

**2021** ර්වෂයේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා රු. මිලියන 17.67 ක ස්ථිතික ෂ්‍රෙඩර් යන්ත්‍ර 30 ක් මිල දී ගෙන තිබුණි. එහෙත් ෂ්‍රෙඩර් යන්ත්‍ර

ක්‍රියාත්මක කිරීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත කාර්යය සඳහා භාවිත කර නොතිබුණු අතර වසර 02 ක් පුරා අක්‍රියව පැවතුණි .

**ප්‍රතිපාදන අදාළ කටයුතු සඳහා යොදා නොගැනීම**

පෝෂණ වැඩසටහන, පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන වැඩ, පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති වැඩ සහ UNICEF හි ව්‍යාපෘති කටයුතු සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු රු මිලියන. 96.97ක මුදල 2022,හා 2023 වර්ෂවලදී අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීමට සහ පොදු තැන්පතු ශේෂයන් පියවීමට භාවිතා කර තිබුණි.

**සංචාරක ආකර්ශනීය ස්ථාන**

මෙම පළාතේ සංචාරක ආකර්ශනීය ස්ථාන 48 ක් හඳුනාගෙන තිබුණද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 මාර්තු 18 වැනි දිනැති අංක 1985/73 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(A) කොටස ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 10 ක් ඉටු කිරීමට හෝ පසුගිය වසර 05 තුළ තමන්ගේම ආදායමක් උපයා ගැනීමට ක්‍රියා කර නොතිබුණි .එසේ වුවද 2019 වසරේ සිට 2023 දක්වා කාර්යාංශයේ විවිධ කටයුතු සඳහා රු මිලියන.128.4 ක මුදලක් පළාත් අරමුදල් ගිණුමෙන් ගෙවා තිබුණි

## ඌව පළාත් සභාව

**බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය අසල නැරඹුම් වේදිකාවක් හා ගිමන්හලක් ඉදිකිරීම**

ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඌව පළාත තුළ සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම සඳහා බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය අසල නැරඹුම් වේදිකාවක් හා ගිමන්හලක් අදියර 03 ක් යටතේ ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. එහි පළමු අදියර යටතේ රු.මිලියන 2.23 ක් වැයකර නැරඹුම් වේදිකාව පමණක් ඉදිකර තිබුණි. 2023 නොවැම්බර් 20 වන විටද නැරඹුම් වේදිකාවට පිවිසෙන පඩිපෙල අර්ධ වශයෙන් නිමකර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති නමුත් ඇස්තමේන්තු ප්‍රකාරව පඩිපෙල සඳහා සම්පූර්ණ වටිනාකම වූ රු. මිලියන 0.55 ක් ගෙවා තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු නතර කර දමා තිබීමෙන් ව්‍යාපෘති පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර වැය කරන ලද මුදල නිශ්කාර්ය වී තිබුණි.

**නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු. මිලියන 1.191 ක් වටිනා ව්‍යායාම උපකරණය (Treadmill sprit fitness) 2023 ජූලි 04 දින වන විටත් බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

පූර්ව අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන රෝහල වෙත නිකුත් කර තිබුණු එකතුව රු. මිලියන 1.457 ක් වූ උපකරණ රෝහල් විසින් භාවිතා කර නොතිබූ අතර බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ආපසු භාරදී තිබුණි.

2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයට අදාළව මිල දී ගෙන තිබුණු වටිනාකම රු. මිලියන 11.08 ක් වූ වෛද්‍ය හා අනෙකුත් කාර්යාල උපකරණ අයිතම 04 කට අදාළ ඒකක 99ක් 2023 ජූලි 04 දිනවනවිටත් අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන, නිශ්කාර්යව පැවතුණි.

2022 වර්ෂයේ මිල දී ගෙන වැල්ලවාය මූලික රෝහල වෙත නිකුත් කර තිබූ එකතුව රු. මිලියන 11.09ක් වූ වෛද්‍ය උපකරණ 06 ක් විගණිත දින වූ 2023 ජූලි 18 දින වන විටත් ඖෂධ ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 4.13 ක් වූ ගමේවෙල ජල යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ ආරම්භ කර ඔක්තෝබර් 31 දිනට අවසන් කළ යුතුව පැවතියදී 2024 ජනවාරි 23 දින වන විටත් කාණු කපා නල එළීම පමණක් සිදුකර තිබුණි.

කෘෂිකර්මාන්තය සඳහා කාබනික පොහොර හා වෙනත් කාබනික යෙදවුම් පළාත් මට්ටමින් නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ඌව පළාත් සභාව විසින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන රු. මිලියන 70.7 ක්ද, පළාත් විෂය නිශ්චිත ප්‍රතිපාදන (PSDG) රු. මිලියන 21.24 ක්ද, ලෙස එකතුව රු.මි. 91.94 ක් වැය කර තිබුණි. වැඩ සටහන යටතේ කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා රු. 15,000 ක උපරිමයකට යටත්ව මූල්‍යාධාර ඇතුළත් පැකේජයක් ලබාදීම සඳහා මොණරාගල දිස්ත්‍රික්කයෙන් ප්‍රතිලාභීන් 1686 ක් සහ බදුල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රතිලාභීන් 2268 ක් තෝරාගෙන තිබුණි. කෙසේවුවද, පැකේජය යටතේ ලබාදීමට අපේක්ෂිත වූ එප්පාවල රොක් පොස්පේට් කිලෝග්රෑම් 800,000 ක් ලබානොදීම හේතුවෙන් සැලසුම්ගත පරිදි පොස්පේට් සහිත කාබනික පොහොර මෙට්‍රික්ටොන් 26,000 නිෂ්පාදනය සිදු කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ වැයකර තිබුණු රු.මිලියන 32.35 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. 2024 මාර්තු 15 දින වන විට වැඩසටහන ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි.

**පාසල් නිල ඇඳුම්**

ඌව පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 04 ක් 2021 හා 2022 වර්ෂවලදී පාසල් සිසුන් සඳහා අවශ්‍ය නිල ඇඳුම් ඇණවුම් කිරීමේදී

ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු කිරීමකින් තොරව ඇණවුම් කිරීම හේතුවෙන් වර්ග 47 කට අයත් රු. මිලියන 2.47 ක් වටිනා නිල ඇඳුම් කට්ටල 6424 ක් ගබඩාවල සහ සංවර්ධන අංශයේ ගොඩගසා තිබුණි.

**ගුරු පුරප්පාඩු හා අතිරික්තතා**

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප 06 ක් තුළ විධිමත් ගුරු තුලනයක් සිදු නොකිරීම හේතුවෙන් ග්‍රාමීය පාසල් 382 ක ගුරුවරු 2214 කගේ ඌනතාවයක් පැවැති අතර නාගරික පාසල් 165 ක ගුරුවරු 583 කගේ අතිරික්තයක් පැවතුණි. අතිරික්ත ගුරුවරුන් සඳහා 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වැටුප් වශයෙන් රු. මිලියන 549.75 ක් ගෙවා තිබුණි.

**නිශ්කාර්ය කාර්ය මණ්ඩල පත්කිරීම්**

ඌව පළාත තුළ රසායනාගාරයක් රහිත පාසල් 27 ක් සඳහා රසායනාගාර සහායක සේවකයින් 32 දෙනෙකුද, පුස්තකාලයක් රහිත පාසල් 14 ක් සඳහා පුස්තකාල සහායක සේවකයින් 17 දෙනෙකු ද පත්කර තිබුණි. 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ මෙම නිශ්කාර්ය කාර්ය මණ්ඩලය සඳහා වැටුප් වශයෙන් රු. මිලියන 28.62ක් ගෙවා තිබුණි.

## උතුරු පළාත් සභාව

**පේදුරු තුඩුව මූලික රෝහලේ විශේෂ සංවර්ධන ඒකකය**

නෙදර්ලන්ත රජය විසින් රුපියල් බිලියන 04 ක වියදමින් පේදුරු තුඩුව මූලික රෝහලට වෛද්‍ය උපකරණ, ගෘහභාණ්ඩ සහිතව ඉදිකර භාරදුන් ගොඩනැගිලි ඇතුළු දේපළ, විශේෂ සංවර්ධන ඒකකයට අවශ්‍ය හෙදියන්, වෛද්‍යවරුන් සහ අදාළ කාර්ය මණ්ඩලය රෝහලට අනුයුක්ත කර සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පසුගිය වසර 01 ක කාලයක් කටයුතු නොකිරීම නිසා පළාත් සභාවට වෛද්‍ය උපකරණවල වගකීම් කාලයෙහි ප්‍රතිලාභය ලබා ගැනීමට නොහැකි තත්වයක් ඇති වී තිබුණි.

**වාහන වෙන්දේසි නොකිරීම**

2023 වර්ෂය තුළ පළාත් අමාත්‍යාංශ 03ක් සහ දෙපාර්තමේන්තු 05ක් විසින් වෙන්දේසි කිරීමට නියමිත පිරිවැය රු.මිලියන 16.97ක් වූ මෝටර් වාහන 56ක් අදාළ ආයතනවල මූල්‍ය තත්ව ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු නමුත් වෙන්දේසි කර නොතිබුණි.

**ප්‍රසම්පාදන ගිවිසුම් අත්සන් නොකිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනි වන පරිදි ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 33.03ක් වූ පිසූ ආහාර සහ වියළි ආහාර වර්ග 18 ක් ලබාගෙන තිබුණි.

**තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවීම**

2015 ජූලි 14 දිනැති උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛ PF/06/2015 ට පටහැනිව කිලිනොච්චිය දිස්ත්‍රික් රෝහල විසින් රසායනාගාරය සඳහා

අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රු.මිලියන 0.5කට වැඩි රු.මිලියන 35.95 ක් වූ ප්‍රසම්පාදන 15 ක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවීමකින් තොරව සිදුකර තිබුණි.

**වාර විභාගය සඳහා වැඩියෙන් මුදල් අය කිරීම**

2023 වර්ෂයේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් වසර 06 සිට 11 දක්වා සිසුන්ට 2022 වර්ෂය සඳහා පවත්වන ලද අවසාන වාර විභාගය සඳහා රු.මිලියන 18.95ක් සිසුන්ගෙන් අයකර තිබූ අතර රු. මිලියන 13.93ක් වැය කිරීමෙන් පසු සිසුන්ගෙන් අයකරන ලද අතිරේක මුදල වූ රු.මිලියන 5.02 ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කර තිබුණි.

**අදාළ නොවන මියදම්**

වවුනියාව මහ රෝහල් පරිශ්‍රයේ සවිකර ඇති විදුලි සංදේශ කුළුණු දෙකක් සඳහා වෙන වෙනම උප මීටර් සවි කර තිබුණද අදාළ ආයතනවලින් අයනොකර විදුලි බිල්පත් වවුනියාව දිසා රෝහලෙන්ම ගෙවා තිබුණි. එසේම 2016 පෙබරවාරි 01 සිට 2022 ජනවාරි 31 දක්වා කාලය තුළ රජයේ ආදායම් රු.මිලියන 4.54ක් වවුනියාව දිස්ත්‍රික් රෝගීන්ගේ සුභසාධක සංගමය වෙත මාරුකර තිබුණි.

**වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක නොකිරිම.**

උතුරු පළාත් රියදුරු සේවා නිලධාරීන් සඳහා 2017 වර්ෂයෙන් පසු වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක නොකිරිම නිසා ඇතැම් දෙපාර්තමේන්තුවල රියදුරන්ට වසර 06 සිට 19 දක්වා අඛණ්ඩව සේවය කිරීමට දී තිබුණි.

**දීමනා වැඩිපුර ගෙවීම්**

පාසල් වර්ගීකරණ චක්‍රලේඛයට අනුව ගුරුවරුන්ට අදාළ දීමනා ලබා නොදී 2019 වසරේ සිට 2023 වර්ෂය දක්වා දූපත් අධ්‍යාපන කලාපයේ ගුරුවරුන්ට වැඩිපුර ගෙවා තිබූ රු.මිලියන 10.23 ක දිමනා නැවත අයකරගෙන නොතිබුණි.

**ආණ්ඩුකාරවරයාගේ ආහාර දීමනා**

2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයට අනුව ආණ්ඩුකාරවරයාට ආහාර සම්බන්ධයෙන් කිසිදු දීමනාවක් සඳහන් කර නොමැති නමුත් 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලයට ආහාර සඳහා රු.මිලියන 4.04ක් ගෙවීම් කර තිබුණි.

**නිල නිවාස කුලී**

ආණ්ඩුකාරවරයාගේ කොළඹ පිහිටි උප කාර්යාල ගොඩනැගිල්ලේ මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරු විසින් මසකට රු.මිලියන 0.1 ක් ලෙස තක්සේරු කර තිබුණද, මෙම තක්සේරුවට පටහැනිව මාසිකව රු. මිලියන 0.08ක් බැගින් වැඩිපුර ගෙවීම් නිසා පළාත් අරමුදලට රු.මිලියන 1.24ක මූල්‍ය පාඩුවක් සිදු වි තිබුණි.

**පරිගණක හා උපකරණ අලුත්වැඩියා නොකිරීම**

උතුරු පළාත් පාසල්වලට සපයා දී තිබූ ඩෙස්ක්ටොප් පරිගණක 1,316, ලැප් පරිගණක 101, ටැබ් 186, බහුකාර්ය ප්‍රොජෙක්ටර් 91

සහ **සුහුරු පුවරු** 38 කැඩී ඇතත් ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ගුරු සම්පත් බෙදා හැරීම**

උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට ගුරු මණ්ඩලය විගණන කිරීමේදී උතුරු පළාත් අධ්‍යාපන පාර්තමේන්තුවේ **ගුරු සම්පත්** සියලුම සිසුන්ට ප්‍රයෝජනය වන ලෙස ඵලදායි ලෙස සමාන ලෙස බෙදී නොයාම නිසා කලාප 13 ක අතිරික්ත 560ක් සහ ඌනතා 439ක් පවතින බව නිරීක්ෂණය විය.

## උතුරු මැද පළාත

**හිඟ බදු**

2023 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24ට අදාළව දීර්ඝකාලීන ඉඩම් බලපත්‍ර හිමියන් 2,474 කගේ දීර්ඝකාලීන ඉඩම් බලපත්‍ර ගාස්තු රුපියල් මිලියන 398.06 ක් හිඟව පැවතුණි.

**විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත ගෙවා නොතිබීම**

2023 වර්ෂය අවසානයට උතුරු මැද පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු වූ රු. මිලියන 27.23 ක් වූ විශ්‍රාම වැටුප්, අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවා නොතිබුණි.

**ත්‍රිපෝෂ බෙදා හැරීම**

අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා 2023 පළමු අර්ධ වර්ෂයට අදාළ කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලබා දී තිබූ රු. මිලියන 26 ක් වූ ත්‍රිපෝෂ තොගයෙන් රු. මිලියන 1.1 ක් වූ ත්‍රිපෝෂ පැකට් 2310 අස්ථානගත වී තිබුණි. තවද රු. මිලියන 23.5 ක් වූ ත්‍රිපෝෂ පැකට් 52,500 ක් අනුරාධපුර දුම්රියපළේ දුම්රිය ගැල් තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් නිදහස් කර නොගෙන රඳවා තිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 1.08 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු තිබුණි.

**වැඩ ආරම්භ නොකිරීම මත අත්තිකාරම් මුදල් ආපසු ලබා ගැනීම**

2017 වර්ෂය තුළදී පොළොන්නරුව පලුගස්දමන මහා විද්‍යාලය සඳහා ශ්‍රවනාගාරයක් ඉදි කිරීම සඳහා ඉදිකිරීම් සමාගමක් සමග රු. මිලියන 542 ක් වූ වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. රු. මිලියන 100 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ නමුත් අදාල කාර්යය ආරම්භ කර නොතිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට 2023 දෙසැම්බර් 31 දක්වාම නොහැකි වී තිබුණි.

**හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම්**

හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 598 ක වටිනාකමකට පෞද්ගලික සමාගමක් සමග

ගිවිසුමකට එළඹ තිබූ අතර 2017 සැප්තැම්බර් 27 දිනරු. මිලියන 119.6 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා දී තිබුණි. කෙසේවුවද, තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම අතරමඟ නවතා දමා තිබූ අතර එම අවස්ථාව වන විට වැය කර තිබූ මුදල රු. මිලියන 369 ක් වී තිබුණි. ඉදිකිරීම නවතා වසර 07 ක් ඉක්මවා තිබුණදරු. මිලියන 45.1 ක් වූ වැඩිපුර ගෙවන ලද අත්තිකාරම් මුදල් 2023 වර්ෂය අවසානය වන විටද අයකර නොතිබුණි.

**උතුරු මැද පළාතේ දරුවන්ගේ විභාග ප්‍රතිඵල විශ්ලේෂණය**

පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව විසින් ලබා දෙන ලද විස්තර අනුව ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන විභාගවලට පෙනී සිටි උතුරු මැද පළාතේ දරුවන්ගේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය දක්වා 06 වන ස්ථානයේ පැවති උතුරු මැද පළාත 2021 හා 2022 වර්ෂවලදී 09 වන (අවසාන) ස්ථානයට පත් වී තිබුණි.

අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂයේදී 08 වන ස්ථානයේ පැවති උතුරුමැද පළාත 2021 සහ 2022 වර්ෂ වනවිට 09 වන (අවසාන) ස්ථානයට පත්වී තිබුණි.

2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 100 කට වඩා ලබා ගැනීම, අනෙකුත් පළාත්වල ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීමේදී උතුරු මැද පළාතට පිළිවෙලින් 5, 6, 6 වන ස්ථාන හිමි වී තිබුණි. එලෙස 100 ට වැඩි ලකුණු ලබාගත් ළමුන්ගේ ප්‍රතිශතය පසුගිය වර්ෂ 03 කදීම සියයට 50 සීමාවට ළඟා වී නොතිබුණි.

**රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන**

රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රු. මිලියන 43 ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එම මුදලින් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත 2021 වර්ෂයේදී රු. මිලියන 33 ක් ණය වශයෙන් ලබා දී තිබූ අතර 2024 පෙබරවාරි 26 දින වන විට එයින් රු. මිලියන 27.65 ක් ආපසු අයකර ගෙන නොතිබුණි. එම සමිතියෙන් අයවිය යුතු ණය මුදල් අය නොවීම හේතුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය ලබා දීමේ කටයුතු නවතා ඉතිරි මුදල් රු. මිලියන 15.35 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් උක්ත වැඩසටහනේ අරමුණ වූ “විවෘත වෙළඳපොල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම සහ සහල් මිල පාලනය” යන අරමුණු ඉටු වී නොතිබුණි.

# පළාත් පාලන ආයතන

ශ්‍රී ලංකාවේ පළාත් පාලන කටයුතු පළාත් පාලන ආයතන 341 ක් මඟින් ක්‍රියාත්මක වන අතර එම පළාත් පාලන ආයතන මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරය මඟින් ක්‍රියාත්මක වන මහා නගර සභා 28 කින් හා නගර සභා ආඥා පනතේ 255වන අධිකාරය මඟින් ක්‍රියාත්මක නගරසභා 37 කින්ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ක්‍රියාත්මක ප්‍රාදේශීය සභා 276 කින්ද සමන්විත වේ.මෙම පළාත් පාලන ආයතනවල 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ මතය පිළිබඳ සාරාංශයක් පහත වගුවෙහි දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු සභා ගණන | 2024 පෙබරවාරි 29 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සභා ගණන | විගණන වාර්තා නිකුත් කළ සභා ගණන | 2024 අගෝස්තු 15 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තත්ත්වා -ගණනය නොකළ | තත්ත්වා-ගණනය කළ | මතය ව්‍යාවනය | අහිතකර මතය |
| මහා නගර සභා | 28 | 24 | 24 | 0 | 20 | 3 | 1 |
| නගර සභා | 37 | 37 | 37 | 0 | 34 | 1 | 2 |
| ප්‍රාදේශීය සභා | 276 | 276 | 276 | 8 | 256 | 6 | 6 |
| එකතුව | 341 | 337 | 337 | 8 | 310 | 10 | 9 |

වගු අංක 2.42 : මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණන මතය

(කළුතර, කෑගල්ල, පුත්තලම සහ වවුනියා මහා නගර සභාවල 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.)

## වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයකර ගැනීම.

2023 වර්ෂයේ ඉහත පළාත් පාලන ආයතනවල වරිපනම් හා බදු, දේපල කුලී , බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් සඳහා බිල් කළ ආදායම රු.මිලියන 29,095 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වරිපනම් හා බදු රු. මිලියන | කුලී රු. මිලියන | බලපත්‍ර ගාස්තු රු. මිලියන | වෙනත් ආදායම් රු. මිලියන | මුලු ආදායම රු. මිලියන |
|---|---|---|---|---|---|
| මහා නගර සභා | 4,480 | 1,700 | 469 | 5,128 | 11,777 |
| නගර සභා | 1,336 | 824 | 91 | 1,424 | 3,675 |
| ප්‍රාදේශීය සභා | 1,903 | 2,908 | 693 | 8,139 | 13,643 |
| එකතුව | 7,719 | 5,432 | 1,253 | 14,691 | 29,095 |

වගු අංක 2.43 : පළාත් පාලන ආයතනවල වරිපනම් බදු, දේපල කුලී , බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම්

## විගණන නිරීක්ෂණ

**හිඟ ආදායම් අය කර ගැනීම**

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු හිඟ ආදායම රු.මිලියන 13,709 ක් වූ අතර වරිපනම් හා බදු අය කර ගැනීම සඳහා පනත්වල විධිවිධාන අනුව කටයුතු නොකිරීම, කුලී ආදායම් අය කර ගැනීම සඳහා කුලී ගිවිසුම්වල කොන්දේසි අනුව කටයුතු නොකිරීම, හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා නඩු නොපැවරීම හා වෙනත් ආදායම් අය කිරීම සඳහා පනත්වල විධිවිධාන, අතුරු ව්‍යවස්ථා විධිවිධාන සහ ගිවිසුම් අනුව කටයුතු නොකිරීම ඒ සඳහා හේතු වී තිබුණි.
ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වරිපනම් බදු අය නොවීම**

පළාත් පාලන ආයතනවල වසර 05 සිට 10 දක්වා කාල පරාසයක් තුල පවතින වරිපනම් බදු තක්සේරු කිරීමේ ප්‍රමාදයන්, දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය නොකිරීම් සහ සංවර්ධන බලපත්‍ර ලබා දීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කර බදු සංශෝධනය නොකිරීම හේතුවෙන් පළාත් පාලන ආයතනවලට අය විය යුතු විශාල වරිපනම් බදු ප්‍රමාණයක් අය නොවී පැවතුණි.

**ලැබිය යුතු කුලී ආදායම්**

කාලීනව කුලී තක්සේරු නොකිරීම, තක්සේරු කළ බදු කුලී අය කිරීම් ප්‍රමාද කිරීම සහ බදු ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හේතුවෙන් බොහෝ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු කුලී ආදායම් අතහැරී තිබුණි.

**අයවිය යුතු හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයනොවීම.**

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව උසාවි දඩ රු. මිලියන 1,838 ක් සහ මුද්දර ගාස්තු රු. මිලියන 8,999 ක් පළාත් සභාවලින් අයවිය යුතුව තිබුණි.විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | උසාවි දඩ රු. මිලියන | මුද්දර ගාස්තු රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 126 | 1,501 | 1,627 |
| නගර සභා | 25 | 647 | 672 |
| ප්‍රාදේශීය සභා | 1,687 | 6,851 | 8,538 |
| එකතුව | 1,838 | 8,999 | 10,837 |

වගු අංක 2.44 : හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු

උසාවි දඩ හා මුද්දර ගාස්තු නියමිත පරිදි පළාත් පාලන ආයතන වෙත ලබා දීම පළාත් සභා විසින් අතපසු කර තිබුණු අතර,එය පළාත් පාලන ආයතනවල අයවැය සහ සැලසුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා තිබුණි.

**වත්කම් හා වගකීම්-**
**ඉඩම් හා ගොඩනැගිලි**

රට තුළ ඇති වානිජ වටිනාකමින් වැඩි ඉඩම් සහ ගොඩනැගිලිවලින් විශාල ප්‍රමාණයක අයිතිය පළාත් පාලන ආයතන සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. මිලියන 260,789 ක් වේ. විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වටිනාකම රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 93,745 |
| නගර සභා | 43,292 |
| ප්‍රාදේශීය සභා | 123,752 |
| එකතුව | **260,789** |

වගු අංක 2.45 පාලන ආයතනවල ඉඩම් සහ ගොඩනැගිලි

ඉහත ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුළ ඇතුළත් ඉඩම් හා ගොඩනැගිලිවලින් බස්නාහිර පළාත් සහ උතුරුමැද පළාත්වල පළාත් පාලන ආයතන පමණක් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව වත්කම් වර්තමාන වෙළඳපොළ මිලට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දක්වා තිබුණි.

**මෝටර් රථවාහන**

2023 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන සංඛ්‍යාව 11,009 ක් වූ අතර ඒවායේ වටිනාකම රු. මිලියන 28,327 ක් විය.විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වාහන සංඛ්‍යාව | වටිනාකම රු.මිලියන |
|---|---|---|
| මහා නගර සභා | 3,342 | 11,600 |
| නගර සභා | 1,167 | 2,508 |
| ප්‍රාදේශීය සභා | 6,500 | 14,219 |
| එකතුව | 11,009 | 28,327 |

වගු අංක 2.46 : පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන

**ආයෝජන**

පළාත් පාලන ආයතනවල ප්‍රධාන අරමුණ පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම බැවින් ඒ සඳහා සභාවේ ආදායමට ගැළපෙන පරිදි වියදම් සැලසුම් කර අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. නමුත් පළාත් පාලන ආයතන බොහොමයක අයවැය සහ පරිපූරක ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඒවා ආදායම් ඉපයීමේ අරමුණු ඇතිව ස්ථාවර තැන්පතු හා වෙනත් තැන්පතුවල ආයොජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | ආයෝජන මුදල රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 12,479 |
| නගර සභා | 2,716 |
| ප්‍රාදේශීය සභා | 11,531 |
| එකතුව | 26,726 |

වගු අංක 2.47 : පළාත් පාලන ආයතනවල ආයෝජන

පළාත් පාලන ආයතනවලට පැවරී ඇති මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා , පොදු මංමාවත් පිළිබඳ කටයුතු සහ ජනතා සුභසාධන කටයුතු ඉටු කිරීම් නිසි පරිදි ඉටු කර නොතිබියදී ඒවායේ අරමුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යෑම ගැටළුකාරී තත්ත්වයක් විය.

**මුදල් හා බැංකු ගිණුම්**

**2023** වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල බැංකු ගිණුම්වල පැවති සහ අතැති මුදල් ශේෂය රු. මිලියන 12,720 ක් විය. විස්තර පහත දැක්වේ

| පළාත් පාලන ආයතන වර්ගය | මුදල රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 1,704 |
| නගර සභා | 1,724 |
| ප්‍රාදේශීය සභා | 9,292 |
| එකතුව | **12,720** |

වගු අංක 2.48 : පළාත් පාලන ආයතනවල බැංකු ගිණුම් හා අතැති මුදල් ශේෂය

**පළාත් පාලන ආයතනවල ණය**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) වෙතින් සහ වෙනත් ආයතනවලින් ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය රු.මිලියන 7,747 ක් විය. විස්තර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය. රු. මිලියන | වෙනත් ණය රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 3,946 | 1,641 | 5,587 |
| නගර සභා | 93 | 44 | 1,037 |
| ප්‍රාදේශීය සභා | 35 | 388 | 1,123 |
| එකතුව | 5,674 | 2,073 | 7,747 |

වගු අංක 2.49 : පළාත් පාලන ආයතනවල ණය

**අධිභාර**

මහා නගර සභා ආඥා පනතේ 226 වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්තිවලින් විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේදී පාර්ශවකරුවන් 130 දෙනෙකු වෙත රු.මිලියන 79.247 ක අධිභාර නිවේදන නිකුත් කරන ලද අතර එම අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 10 දෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද රු.මිලියන 50.361 ක් වූ අධිභාර නිවේදන සඳහා මුදල් අදාල සභා අරමුදලට ගෙවා තිබුණි. ඉහත පරිදි නිකුත් කරන ලද අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 62ක් සඳහා රු.මිලියන 2.150 ක් වටිනා අධිභාර සහතික ද 2023 වර්ෂය තුලදී නිකුත් කර ඇත.

**අධිභාර අයකර ගැනීමට කටයුතු නොකිරීම**

**2023** වර්ෂයට පෙර වර්ෂවලට අදාලව මහා නගර සභා ආඥා පනතේ 226 වගන්තිය, නගර සභා ආඥා පනතේ 182 වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්තිය අනුව විගණකාධිපති විසින් පාර්ශවකරුවන් 254 දෙනෙකු වෙත නිකුත් කළ රු.මිලියන 1.58 ක අධිභාර අයකරගෙන නොතිබුණි.

## බස්නාහිර පළාත

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 49 න් මහා නගර සභා 08ක් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) විධිවිධාන මඟින් ද, නගර සභා 13 ක් නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) විධිවිධාන මඟින් ද, ප්‍රාදේශීය සභා 28 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මඟින් ද පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතී.

**කොළඹ මහා නගර සභාව**

**(අ)** ලෝක බැංකුවේ ණය ආධාර මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කොළඹ නගරය ආශ්‍රිත නොරිස් ඇල සංවර්ධනය මඟින් ඊට එකතු වන වැසි ජලය සීඝ්‍රයෙන් බේරේ වැවට බැස යාම සඳහා මීටර් 632 කින් යුත් නව ඇළ මාර්ගයක් ඉදිකිරීමට ආරම්භ කළ නමුත් මහා නගර සභාවට අයත් නිවාස 36 කින් යුත් අබලන් නිවාස සංකීර්ණයක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වී තිබූ අතර ඉතිරිව තිබූ මීටර් 105 ක් වූ ඇළ මාර්ගය නිම කිරීම සඳහා 2023 වර්ෂයේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ රු.මිලියන 150 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. එම පදිංචිකරුවන් ඉවත් කිරීමට ගෙන තිබූ ක්‍රියාමාර්ග කඩිනම් නොවීම හේතුවෙන් මහා නගර සභාවට එකී මුදල උපයෝජනය කිරීමට නොහැකි වීමෙන් මරදාන ඩීන්ස් පාර වැසි ජලයෙන් යට වීම වළක්වා ගත නොහැකි වී තිබුණි.

(ආ) මහා නගර සභා ආඥාපනතේ 188(1) වගන්තිය යටතේ ඉඩදී නොමැති වියදමක් වූ රු. මිලියන 459.6 ක මුදලකට රු.3,500 බැගින් වූ තිළිණපත් 134,000ක් ලක් සතොස වෙතින් මිලදී ගෙන කිසිදු නිර්නායකයක් රහිතව එක් එක් නගර සභිකයින්ගේ අභිමතය පරිදි බෙදාහැර තිබුණි. රටේ පවත්නා ආර්ථික උද්ධමනය හේතුවෙන් ආර්ථික අපහසුතාවයට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම යන

කරුණ සඳහා මෙසේ සිදු කර තිබුණද මහා නගර සභා ආඥා පනත හෝ දරිද්‍රතා ආඥා පනත මඟින් මේ සඳහා නීතිමය විධිවිධාන සලසා නොමැති බව නිරීක්ෂණය විය.

**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව**

2023 වර්ෂය අවසානයේ මහා නගර සභාවට අයත් ලෙස හඳුනාගෙන තිබුණු ඉඩම් කට්ටි 206 කින් ඔප්පු හෝ හිමිකම් සහතික ලබාගෙන තිබුණේ බිම් කට්ටි 48 ක් සඳහා පමණි.

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

ජනජය සිටි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් 2014 සිට බිල්පත් වටිනාකම් අඩුවෙන් ගෙවීම නිසා තහවුරු කර නොගෙන ගෙවා තිබුණු ප්‍රමාද ගාස්තුව රු.මිලියන 31 ක් විය.

**කඩුවෙල මහා නගර සභාව**

කඩුවෙල බස් නැවතුම්පොළ පරිශ්‍රයේ උඩුමහලේ කඩ කාමර වලට ප්‍රවේශ වීම සඳහා රු.මිලියන 3ක් වැය කර 2013 ස්ථාපනය කර තිබූ විදුලි සෝපානය 2016 වර්ෂයේදී අක්‍රීය වී අවුරුදු 07 ක කාලයක් ගත වී තිබුණද, යථා තත්වයට පත් කර නොතිබුණි. 2021 වර්ෂයේදී ගන්නා ලද සභා තීරණයක් අනුව මෙය බස් නැවතුම් පොළ සඳහා ඵලදායී නොවන බවත් ප්‍රධාන කාර්යාලයේ සුදුසු පරිදි ස්ථාන ගත කිරීමටත් නිර්දේශ කර තිබුණු නමුත් එයද ක්‍රියාත්මක කර නොතිබුණි.

**මහරගම නගර සභාව**

මහරගම නගර සභාව විසින් දිරන හෝ නොදිරන කසළ කළමණාකරණය සම්බන්ධයෙන් කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබූ අතර 2023 වර්ෂයේ කසල බැහැර කිරීම සඳහා රු.මිලියන 113 ක් වැයකර තිබූ අතර ඊට අමතරව ඒ සඳහා සභාවේ කසල ප්‍රවාහන වාහන භාවිතා කර තිබුණි.

**කොලොන්නාව නගර සභාව**

සභාව විසින් පරිහරණය කරනු ලබන ප්‍රත්‍යාගණන වටිනාකම රු.මිලියන 3,706.3 ක් වූ ඉඩම් 21 ක් සඳහා හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

ඉඩම් නිරවුල්කර නොගැනීම සහ ගිවිසුමේ වැරදි සහගතභාවය නිසා මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙන් 2023 දෙසැම්බර් 31 වන දිනට ලැබිය යුතු වූ රු. මිලියන 255 ක ලැබීම අවිනිශ්චිත විය.

**සීතාවක ප්‍රාදේශීය සභාව**

2020 අයවැය යෝජනාවක් පදනම් කර ගෙන සුදුවැල්ල ආදාහනාගාර භූමියෙහි මෘතදේහ තැම්පත් කරන ස්ථානයක් ඉදි කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) නිර්දේශ කර තිබුණු රු.මිලියන 11.6ක (වැට් සහිත) ඇස්තමේන්තුව මත කොන්ත්‍රාත්තුව පුද්ගලික ආයතනයකට ලබා දී තිබුණි. 2023 ජනවාරි 31 දින ඒ සඳහා වූ රු.896,624 ක රඳවුම් මුදල නිදහස් කර තිබුණ ද 2023 දෙසැම්බර් 04 දින විගණනය විසින් සිදු කළ භෞතික පරීක්ෂාවට අනුව මෙම කොන්ත්‍රාත්තුව වැඩ අවසන් කිරීමකින් තොරව භාර දී තිබූ බවත් එහි ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කරන තෙක් ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය.

**පෑලියගොඩ නගර සභාව**

සභාවට අයිතියක් නොමැති දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක ඉදිකළ 4 කණුව පොදු වැසිකිළි පද්ධතිය සඳහා වැය කර තිබූ රු.මිලියන 10.204 ක මුදල අවිධිමත් ගණුදෙණුවක් වූ අතර මහජනයා නොගැවසෙන ස්ථානයක පිරිමි වැසිකිලි 3ක්, ගැහැණු වැසිකිලි 3 ක්, ආබාධිත වැසිකිලි 2 ක් හා ගැහැණු, පිරිමි නාන ස්ථාන 2ක් ලෙස විශාල වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමේ වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

**මීනුවන්ගොඩ නගර සභාව**

නිවිහැම් පාර ආරම්භවන ස්ථානයේ පිහිටා ඇති සභාවට අයත් රථගාල 2019 වර්ෂයේදී බදු පදනම මත ලබා දී තිබුණු අතර බදු ගැණුම්කරු එම වර්ෂයේදීම එම ස්ථානයේ තාවකාලික කඩ කාමර 10 ක් ඉදිකර 2020 වර්ෂයේ සිට වර්ෂ 3 ක කාලයක් සඳහා වෙනත් අය වෙත බදු පදනම මත ලබා දී තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව සභාව ඊට එරෙහිව කටයුතු කර නොතිබුණි.

**කටුනායක සීදූව නගර සභාව**

කටුනායක නව වෙළඳ සංකීර්ණයේ බදු දී තිබූ කඩ කාමර විවෘත නොකිරීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු අධීක්ෂණයක් සිදු කර නොතිබුණු හෙයින් වෙළඳ සංකීර්ණය ජන ශූන්‍ය වී තිබූ අතර ඵලදායි කටයුත්තක් සඳහා යොදවා ගත හැකිව පැවති එම ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි විශාල භූමි ප්‍රමාණයක් ද කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

**මීරිගම ප්‍රාදේශීය සභාව**

මීරිගම ප්‍රාදේශීය සභාවේ, 2019 වර්ෂයේ කුලියට දී තිබූ කඩ කාමර 31 ක් ව්‍යාපාර කටයුතු කරමින් පැවතුණද, පෙර මුදල් අයකර ගිවිසුම්ගත වීමෙන් පසුව කඩ කාමරවල යතුරු ලබා නොදීම හේතුවෙන්, හිඟ පෙර මුදල් ශේෂය රු. මිලියන 41 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**දොම්පේ ප්‍රාදේශීය සභාව**

දොම්පේ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේදී සභා අරමුදලින් සහ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු. මිලියන 8.6 ක් වැයකර රැස්වීම් ශාලාවක්ද සහිතව ඉදිකර තිබුණු ගොඩනැගිල්ල ඉදිකළ දින සිට නිෂ්කාර්යව හා අනාරක්ෂිතව පැවතුණි.

**ජාඇල ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා රාගම සති පොළ බදු දීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදු කිරීමකින් තොරව සභා තීරණයක් මත පැරණි බදුකරු වෙතම එම දේපළ බදු පදනමට ලබා දී තිබුණ ද ගිවිසුමකට එළඹ ගැනීමක් සිදු කර නොතිබුණු අතර 2019 වර්ෂය දක්වා එම බදුකරුගෙන් අයකර ගැනීමට පැවති රු. මිලියන 4ක මුදල 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

**මතුගම ප්‍රාදේශීය සභාව**

සභාව සතු ඉඩම් ලෙස හඳුනාගෙන තිබූ ඉඩම් 252 න් ඉඩම් 48 කට අදාලව නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාල ලේඛන සභාව සතුව නොතිබුණි.

**බේරුවල ප්‍රාදේශීය සභාව**

බේරුවල ප්‍රාදේශීය සභාවේ විශාල වශයෙන් රැස්වන කසළ බැහැර කරලීම සඳහා දිගුකාලීන ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. සභාවට අයත් සෝ සාතකාගාරයේ ගවයන් සෞඛ්‍යාරක්ෂිත මැරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සලකා නොතිබුණු අතර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි. තවද එහි ජලය ක්‍රමවත්ව බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති බැවින් අපජලය ඉඩමට යාබඳ බෙන්තර ගඟට මිශ්‍ර වී තිබුණි.

## දකුණු පළාත

**ගාල්ල මහා නගර සභාව**

සභාව විසින් යන්ත්‍රානුසාරයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව හා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව මහා පරිමාන කවිෂිමා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කර තිබුණි.ඉදිකර තිබූ ව්‍යාපෘතියේ පවතින ගැටළු 07 ක් නිරාකරණය කර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා පිරිවැය රු. මිලියන 220 ක් වූ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය ඵලදායී වී නොතිබුණි.

**ඉමදූව ප්‍රාදේශීය සභාව**

ඉමදූව ප්‍රාදේශීය සභාවේ වසර 17 කට පෙර රු. මිලියන 9.6 ක් වැයකර ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකර තිබුණු වර්ග මීටර 260 ක ඉමදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක් සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම නිසා ඵලදායී ආර්ථික කටයුත්තකට යොදාගත නොහැකිව පැවතුණි.

**කටුවන හා බෙලිඅත්ත ප්‍රාදේශීය සභා**

2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව කඩ කාමර බදු දුන් දිනයේදී හෝ මාස 06 ක් ඇතුළත උපරිම වාර 06 කට යටත්ව එක්වන් මුදල් අය කළයුතු වුවත්, එපරිදි කටයුතු නොකිරීම මත 2023 දෙසැම්බර් 31 දිනට කටුවන හා බෙලිඅත්ත ප්‍රාදේශීය සභා වලින් අයවිය යුතු එක්වන් මුදල් වල වටිනාකම රු.මිලියන 14.6 ක් විය.

**කළමණාකරණ අකාර්යක්ෂමතා**

තිස්සමහාරාම ,අඟුණුකොළපැලැස්ස ,අම්බලන්තොට හා වීරකැටිය යන ප්‍රාදේශීය සභා විසින් අනුමත කර තිබූ ගොඩනැඟිලි සැලසුම් 21 කට අදාළව අය කළ යුතු රු.මිලියන 3.9 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි.

**තංගල්ල නගර සභාව**

තංගල්ල නගර සභාවට අයත් අංක - 32 දරණ කඩ කාමරය 1994 මැයි 19 දින සිට බදු පදනමට ලබා ගත් බදුකරු විසින් බදුකුලී ගෙවීම පැහැර හැර තිබූ අතරම කඩ කාමරය පිහිටි ස්ථානයේ අනවසරයෙන් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ආපනශාලාවක් පවත්වා යමින් පැවතුණි. ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව** තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පන්නෙගමුව පොදු වෙළඳපොළ තුළ කඩ කාමර 28 සහිත නව වෙළඳ සංකීර්ණයක් හා විවෘත ගොඩනැගිල්ලක් රු. මිලියන 62.9 ක වියදමකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකර 2021 වර්ෂයේ සභාව වෙත පවරා තිබුණි. විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 11 දින වන විටත් මෙම වෙළඳ සංකීර්ණය ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ගොඩනැගිලි පරිශ්‍රය වල් බිහිවී දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණි. ඒ අනුව ඉදිකිරීම් සඳහා රු.මිලියන 62.9 ක රාජ්‍ය මුදල් වැයකර සභාවට භාරදී තිබුණු මෙම වෙළඳ සංකීර්ණය ප්‍රයෝජනයට නොගැනීම මහජන මුදල් නාස්තියක් හා සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අත්හැරීමක් බව නිරීක්ෂණය කෙරේ.

**සූරියවැව ප්‍රාදේශීය සභාව** ප්‍රාදේශීය සභාවට අදාලව සභා අරමුදලින් රු. මිලියන 21.6 ක් වැයකර ඉදිකිරීම් කටයුතු සහ සංවර්ධන කටයුතු සිදුකර තිබුණු කඩකාමර 04 ක්, පුස්තකාල ගොඩනැගිල්ලක්, ප්‍රජා ජල ව්‍යාපෘතියක් හා ජල කුළුනක් ප්‍රයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි.

**වැලිගම ප්‍රාදේශීය සභාව** **(අ)** 2022 වර්ෂයේදී වැලිගම ප්‍රාදේශීය සභාවේ කසළ ව්‍යාපෘතිය යටතේ පූතික ටැංකි වලින් බැහැර කරන අපජලය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ව්‍යාජ අයිතිකරු නමින් රු.මිලියන 16.8 කට ඉඩමේ වටිනාකම තක්සේරු කර ඉඩමක් මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා නීතිඥ හා මුද්දර ගාස්තු වශයෙන් රු.මිලියන 0.78 ක්ද සභා අරමුදලින් වැය කර තිබුණි. උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩම ප්‍රමාණවත් නොවීම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි.

**(ආ)** 2013 වර්ෂයේදී ඉඩම කැබලි කර විකිණීමෙන් පොදු කටයුතු සඳහා වැලිගම ප්‍රාදේශීය සභාවට පවරන ලද අක්කර 01, රූඩ් 01, පර්චස් 2.80 ක් වූ කළුවර බැද්ද ඉඩම හිටපු සභාපතිවරයෙකුගේ ඥාති සම්බන්ධතා ඇති සහ ඔහු විසින් 2012 දෙසැම්බර් 01 සිට 2013 නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් බදු ගෙන තිබූ කඹුරුගමුව බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගරාඬුව කඩලාන අක්කර 01 යි රූඩ් 2 ක් වූ පෞද්ගලික ඉඩමට හුවමාරු කරගෙන තිබූ අතර එම හුවමාරු කරන ලද කළුවර බැද්ද ඉඩම කැබලි කිරීම සඳහා ව්‍යාජ ලෙස අනුමැතිය ලබාදී නැවත එම ඉඩමෙන් අංක 4 හා 5 කොටස් පොදු කටයුතු සඳහා රු.මිලියන 3.85 ක් වැයකර සභාවට මිලදී ගෙන තිබුණි

(ඇ) වැලිගම ප්‍රාදේශීය සභාව සතු වරකාපිටිය ආදාහනාගාරය සඳහා රථගාල පිහිටි ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 27 වගන්තිය අනුව සභාවට පැවරීමට අනුමැතිය ලැබී තිබියදී, සාවද්‍ය තොරතුරු

ඉදිරිපත් කර තක්සේරු වාර්තාවක් ලබාගෙන තුන්වන පාර්ශවයක් වෙත රු.මිලියන 4 ක මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි

(ඇ) වැලිගම ප්‍රාදේශීය සභාවේ අඩුපාඩු සහිත හා අනුමත නොකරන ලද ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සංවර්ධන බලපත්‍ර ලිපිගොනු 58 ක් හා ඉඩම් අනුබෙදුම්වලට අදාළ ලිපිගොනු 134 ක් හිටපු සභාපතිවරයකු විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම වැලැක්වෙන පරිදි තම නිල කාමරයේ ගබඩා කරගෙන තිබූ අතර ලිපිගොනුවල ඇතුළත් ගොඩනැගිලි සැලසුම් පිටපත් 3 න් එක් පිටපතක් ගොනුවෙන් ඉවත් කර ව්‍යාජ මුද්‍රාවක් භාවිතා කරමින් ගොඩනැගිලි සැලසුම් අනුමත කර තිබුණි.

**වැලිගම නගර සභාව**

වැලිගම නගර සභාවේ ජයවික්‍රමගම පෙර පාසල රු. මිලියන 06 ක මුදලක් වැය කර පන්ති කාමර 05 කින් හා වැසිකිලි 05 කින් සමන්විතව ළමුන් 100 දෙනෙකු සඳහා අධ්‍යාපනය ලබාදීමේ පහසුකම් සහිතව 2002 වර්ෂයේ ආරම්භ කර තිබුණි. 2023 වර්ෂය වන විට එහි ගොඩනැගිලි අබලන් වී තිබූ අතර බාහිර පාර්ශවයන් විසින් මෙම දේපොල අනවසර පරිහරණය කළද ඒ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

**මාතර මහා නගර සභාව**

මාතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් නිල නිවාසය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත අදියර දෙකක් යටතේ රු. මිලියන 23.35 ක් ගෙවා තිබූ අතර මුළු පිරිවැය ඇස්තමේන්තු නිවැරදිව සකස් නොකිරීම, නිසිලෙස සැලසුම් නොකිරීම, නිවැරදි රේටයන් භාවිතා නොකිරීම, ඉටු නොකළ වැඩ කොටස් හා නිසි ප්‍රමිතියෙන් ඉටු නොකළ වැඩ වෙනුවෙන් එකතු වටිනාකම රු.මිලියන 4.2ක් වැඩිපුර සහා අරමුදලෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 4:3:1 (ඇ)(ii) විධිවිධාන වලින් බැහැරව සිවිල් වැඩ වටිනාකමින් සියයට 10උපරිමය වන රු.මිලියන1 .2 ක මුදල ඉක්මවා අමතර වැඩ (Extra work) හා වැඩිපුර වැඩ )Excess work) වෙනුවෙන් රු.මිලියන 7.89 ක් ගෙවා තිබුණි. එය මුළු ඇස්තමේන්තු වටිනාකමින් සියයට 61 ක් විය.

2021 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.මිලියන 14ක් වැය කර මාතර පොදු බස් නැවතුම් පොළෙහි ස්ථාපිත අප ජල හා මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතිය ඉදි කිරීමට අදාළව කොන්ත්‍රාත් ලබාදීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර තිබූ අතර අප ජල හා මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතිය මගින් මුදාහරින ජලය නියමිත ප්‍රමිතියට නොමැති බවද නිරීක්ෂණය වී තිබුණි. ඒ අනුව එම පිරිපහදුව මගින් රට අභ්‍යන්තර ජලාශවලට මුදාහරින අප ජලය හෝ අපසන්දන සඳහා වන ධාරණ සීමාවන් ඉක්මවා ඇති බැවින් නිසි පිරිපහදුවකින් තොරව බැහැර කිරීම නිර්දේශ නොකරන බැවින් උක්ත ඉදි කිරීම මගින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

මාතර මහා නගර සභාව විසින් කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2023 වර්ෂය අවසාන වන විට වසර 10කට ආසන්න කාලයක් ගතවී ඇතත්, මෙම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. අදාළ සමාගමට පවරා තිබූ සභාව සතු අක්කර 05ක භූමි භාගය සඳහා මාසික බදු කුලියක් අයකර ගැනීමටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන තත්ත්වයක් යටතේ එම ඉඩමේ තාවකාලික භුක්තිය අහෝසි කිරීමටත් 2023 වර්ෂය අවසාන වනවිටත් සභාව කටයුතු කර නොතිබුණි. එසේම නිර්මාණය වෙමින් පවතින විශාල කසළ කන්ද පාලනය කිරීමට කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍ර යොදවා පස්වලින් කසළ යට කිරීම සඳහා 2018 මැයි සිට 2023 වර්ෂය අවසාන වනවිට රු.මිලියන 57.72ක කුලියක් සභා අරමුදලින් ගෙවා තිබුණ ද ඒ මගින් ද ස්ථිර විසඳුමක් ලැබී නොතිබුණි.

## සබරගමුව පළාත

**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාව විසින් පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2017 වර්ෂය වන විට රු. මිලියන 4.6 ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය නොකිරීම නිසා වැයකළ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

කුරුවිට ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණය රුපියල් මිලියන 35 ක් වැයකර 2022 වර්ෂයේ නිමකර තිබුණ ද, මූලික අවශ්‍යතා අසම්පූර්ණ වීම නිසා 2023 දෙසැම්බර් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. තවද සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී රුපියල් මිලියන 3.2 ක් වැඩිපුර ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**රත්නපුර ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා විෂය නිලධාරිණිය විසින් ඉන්ධන බිල්පත් පියවීමේදී කූට ලේඛන සකස් කර 2023 මැයි සිට 2024 ජනවාරි දක්වා කාලය තුළ රුපියල් මිලියන 2.2ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර ඇති බව ඒ සඳහා පත් කළ මූලික විමර්ශන කමිටුව වාර්තා කර තිබුණි. අභ්‍යන්තර වැඩ බෙදීමක් නොමැති වීම මීට හේතුව වී තිබුණි. වවුචර් සමග වූ ඉන්ධන ඇණවුම් සියල්ල විකෘති කර ඇති බව ඉතා පැහැදිලි වුවත්, එම වවුචර් පරීක්ෂා කරන, නිර්දේශ කරන, අනුමත කරන හා ගෙවීම් සහතික කරන නිලධාරීන් ඒ පිළිබඳ නොසලකා හැර කටයුතු කර තිබීම ප්‍රශ්නගත විය.

**රත්නපුර මහා නගර සභාව**

මහා නගර සභාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා දරන්නාට පුද්ගලික වනසේ ස්ථිර කරන ලද කම්කරුවන් 157 ක් සේවයේ යොදවා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව කම්කරුවන් 65 ක් හා සේවා ගිවිසුම් මත 40 ක් අදාළ ක්ෂේත්‍ර වෙත බඳවා ගෙන 2023 වර්ෂය සඳහා රු. මිලියන 24 ක් වැටුප් ගෙවා තිබුණි. අතිරික්ත සේවකයින් වැඩි දෙනෙකු පරිපාලන කාර්යාලයේ, පුස්තකාලවල හා පෙර පාසැල්වල නිශ්චිත වැඩ පැවරුමකින් තොරව සේවයේ යොදවා තිබුණි.

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2021 යටතේ ප්‍රාදේශීය සභාවේ නගර ශාලා ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 56.1 ක කොන්ත්‍රාත් වටිනාකමකට හා දින 270 කින් නිම කිරීමට 2021 අගෝස්තු 12 දින ගිවිසුම් ගතවී වැඩ ආරම්භ කර තිබුණි. එහෙත් 2022 දෙසැම්බර් 02 දින දෙපාර්ශවයේම එකඟතාව මත රු.මිලියන 23.81ක නිමි වැඩ වටිනාකමක් සහිතව වැඩ අවසන් කර තිබුණ ද, ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ අවසන් කර නොමැති වීම හේතුවෙන් 2024 අප්‍රේල් 25 දින වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව රු.මිලියන 2 ක ආදායමක් අපේක්ෂාවෙන් රු.මිලියන 3.82 වැයකර ඩිජිටල් නාම පුවරුවක් 2019 වර්ෂයේ ස්ථාපනය කර තිබුණද, 2021 හා 2022 වර්ෂවල දී රු.මිලියන 0.37 ක ආදායමක් පමණක් උපයා තිබුණි. මෙම දැන්වීම් පුවරුවට අදාළ විෂය ලිපිගොනුව ද අස්ථානගත වී තිබුණි.

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේදී ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණ ද, එයින් නිපදවන ජීව වායු ඉතා සුළු ප්‍රමාණයක් පමණක් භාවිතයට ගෙන වැඩි ප්‍රමාණයක් පුළුස්සා විනාශ කරමින් පවතී. මෙම සියලු ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.මිලියන 8.7 ක් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

කතරගම දේවාලයට අයත් අක්කර 01 පර්චස් 04 ක්වූ ඉඩමට සින්නක්කර ඔප්පුවක් හෝ පැවරුම් ඔප්පුවක් මඟින් බාර දී නොතිබියදී රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 97.59 ක් වැයකර එහි ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

## වයඹ පළාත

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

ගිරිබාව ප්‍රාදේශීය සභාව 2019 වර්ෂයේ දී රු. මිලියන 6.86ක් වැයකර ඉදිකර තිබුණු නිරාවිය ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර ඒකකය සභා බලප්‍රදේශයේ කසල එකතු කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබුණි.

## මධ්‍යම පළාත

**මහනුවර මහා නගර සභාව**

මහ නගර සභාව සතු කැප්පෙටිපොළ, බෝගම්බර, මැණික්කුඹුර හා මධ්‍යම පොදු වෙළඳපොළ මස්කඩ, යන වෙළඳ සංකීර්ණවල කඩ කාමර 31 කින් කඩ කුලී අයකිරීමකින් තොරව ව්‍යාජ කුවිතාන්සි පත් අංක යොදා කඩ කුලී ලැබුණු බවට කඩ කුලී ලේඛනයේ සටහන් කර 2018 සිට 2023 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු. මිලියන 8.28 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.

මහා නගර සභාව සතු මැණික්කුඹුර, කැප්පෙටිපොළ, බෝගම්බර හා ජෝර්ජ්. ඊ.ද සිල්වා යන වෙළඳ සංකීර්ණ 04 ක කඩ කාමර 18 ක බදු අයිතිය පැවරීමේ දී අය කළ යුතු මුදල අය කළ බවට රිසිට්පත් ව්‍යාජ ලෙස සකස් කර රිසිට්පත් නොමැතිව කඩ පැවරීම හා සෞඛ්‍ය කාරක සභාවේ හා මහා සභාවේ අනුමැතියකින් තොරව කඩ කාමර පැවරීමෙන් ලබා ගත යුතු එක්වන් මුදල් සහා ආදායමට බැර නොකර, එකතුව රු. මිලියන 13.60 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අලාභය අය කර ගැනීමට හා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

මහා නගර සභාවේ මුදල් භාර නිලධාරිනිය දින 02 කදී දෛනිකව එකතු කළ රු.මිලියන 5.16 ක මුදලක් බැංකුගත නොකර අවභාවිතා කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**නාවලපිටිය නගර සභාව**

2020 හා 2021 වර්ෂවල එකතු කළ වරිපනම් ආදායම්, ආදායමට බැර නොකර රු. මිලියන 1.43 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණද ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ක්‍රියාත්මක කරන දිගන අලුත්වත්ත කසළ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂයේ රු. මිලියන 90 ක් මධ්‍යම පළාත් සභාවෙන් ලබා දී තිබුණි. 2023 වර්ෂයේ අවසන් දිනට එම ප්‍රතිපාදන වැය කර තිබුණ ද, මෙම ව්‍යාපෘතියේ ගොඩනැගිලි නිසි පරිදි සැලැසුම් නොකිරීම හා නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය මත සැලැසුම් කළ පරිදි ඉදිකිරීමට නොහැකි වී තිබීමෙන්, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම කාබනික පොහොර අංගනය සඳහා කසළවල අධික තෙතමනය ඉවත් කිරීමට 2021 වර්ෂයේ රු. මිලියන 10.29 ක් වැය කර මිලදී ගෙන තිබුණු යන්ත්‍රය මිලදී ගත් දින සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. එසේම, ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ පොලිතීන් හා ප්ලාස්ටික් මඟින් ඉන්ධනයක් නිෂ්පාදනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2021 ජනවාරි 28 දින සභාව පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණද 2023 වර්ෂයේ අවසාන දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති භූමිය සකස් කිරීම සඳහා 2021 හා 2022 වර්ෂවල සභා අරමුදලින් රු.මිලියන 29.78 ක් වැයකර තිබුණි. එහෙත්, මෙම යන්ත්‍රය සවි කිරීමට එකඟව ගිවිසුම්ගතව සිටි කොන්ත්‍රාත්කරු එය සවි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන්, ඒ වෙනුවෙන් සභාව දැරූ වියදම් නිෂ්ඵල වී තිබුණි. මේ සම්බන්ධව කොන්ත්‍රාත්කාර ආයතනය සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**මාතලේ මහා නගර සභාව**

2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008(vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අනුමත ඉන්ධන ඩීසල් ලීටර් 135 කට අදාළව ඉන්ධන දීමනාව වැටුපට එකතු කර ලබා දී තිබිය දී, එම ප්‍රමාණය ඉක්මවා 2021 ජූනි සිට 2023 ඔක්තෝබර් දක්වා අනුමැතියකින් තොරව මාතලේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ ගමන් වෙනුවෙන් රු.මිලියන 1.04 ක ඉන්ධන, ඇණවුම් මඟින් ලබා ගෙන තිබුණි.

2022 ඔක්තෝබර් 01 දින සිට 2023 අප්‍රේල් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමේ හා මිහිදන් කිරීමේ ගාස්තු ලෙස නිලධාරීන් විසින් අය කර තිබුණු මුදල් සඳහා වෙනත් ආදායම් ලැබීම්වලට අදාළ ලේඛන ව්‍යාජ ලෙස දක්වා, ලදුපත් වෙනස් කිරීම, අදාළ බලපත්‍රයේ සටහන් වෙනස් කිරීම, මුදල් ලබා ගෙන ලදුපත් නිකුත් නොකිරීම යනාදී වශයෙන් ලේඛන වෙනස් කර එකතු කරන ලද මුදල් රු.මිලියන 0.70 ක් ආදායමට බැර නොකර අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.

2023 වර්ෂයේ ගලි සේවා 57 ක් ලබා දීම වෙනුවෙන් අය කළ මුදල් සඳහා සේවා ලබා ගැනීමේ අයදුම්පතේ වෙනත් ආදායම් වෙනුවෙන් නිකුත් කළ කුවිතාන්සි අංක ව්‍යාජ ලෙස යෙදීම, ආදායම් අඩුවෙන් බැංකුගත කිරීම, කුවිතාන්සිපත් අවලංගු කළ බව දක්වා සභා අරමුදලට බැර නොකිරීම ඇතුළුව එකතුව රු. මිලියන 0.49 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.

**නුවරඑළිය මහා නගර සභාව**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24(ඇ) හා 24(ඈ) වගන්ති අනුව, 2007 මාර්තු 05 දිනැති අංක 1487/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ III උපලේඛනයේ 03 වන කොන්දේසියට අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියකින් හා නිර්දේශ ලබා ගැනීමකින් තොරව ග්‍රෙගරි වැවේ IV අදියරේ දී මහා නගර සභාව විසින් කොන්ක්‍රීට් ස්ලැබ් යොදා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 3.73 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහා නගර සභාවට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණි.

**කොටගල ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2015 මැයි 11 වන දින රු. මිලියන 83.37ක ගිවිසුමකට එළඹ වැඩ ආරම්භ කර තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු. මිලියන 21.56ක් වැය කර තිබුණද එහි පරිපාලන සහ තාක්ෂණික ගැටළු හේතුවෙන්, 2023 වර්ෂයේ අවසාන දින වන විට වැඩ අත්හිටුවා වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණ ද, වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඌව පළාත

**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ප්‍රතිපාදන උපයෝගී කරගෙන කසළ කළමනාකරණය සඳහා රු. මිලියන 3.97 කට කන්ටේනර් බහාලුම් 02 ක් සහ 2023 වර්ෂයේදී රු. මිලියන 3.45 ක් වැයකර මිලදීගෙන තිබුණු ජංගම වෙළඳ කුටි 05 ක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(XII) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර වසර 03 කට වඩා වැඩි කාලයකට බදු දීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු බව දක්වා තිබුණද ඊට පටහැනි ලෙස බුත්තල, බඩල්කුඹුර,වැල්ලවාය, තණමල්විල සහ බිබිල යන ප්‍රාදේශීය සභා 05 හි කඩ කාමර 96 ක් වසර 03 කට වඩා වැඩි කාලයක් සඳහා බදු දී තිබුණි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 83(1) වගන්තිය අනුව 2021 වර්ෂයට පෙර බුත්තල,බඩල්කුඹුර, වැල්ලවාය,මඩුල්ල,තණමල්විල,මොනරාගල,බිබිල හා කතරගම යන ප්‍රාදේශීය සභා 08 විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් 1573 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.

බඩල්කුඹුර, වැල්ලවාය, සියඹලාණ්ඩුව, මැදගම, තණමල්විල, බිබිල හා කතරගම යන ප්‍රාදේශීය සභා 07 විසින් ලබා දී තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර 126 ක වලංගු කාලය ඉකුත් වී තිබුණි. තවද බඩල්කුඹුර, තණමල්විල,බිබිල හා කතරගම යන ප්‍රාදේශීය සභා 04 විසින් සමාලෝචිත වර්ෂය තුල හඳුනා ගන්නා ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 41 ක් සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නිසි නියාමනයකට ලක්කර නොමැති බව නිරීක්ෂණය විය.

මඩුල්ල, මැදගම,තණමල්විල, බිබිල යන ප්‍රාදේශීය සභා 04 විසින් පවත්වාගෙන යනු ලබන ඝන අපද්‍රව්‍ය ඒකක සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

**තණමල්විල ප්‍රාදේශීය සභාව**

තණමල්විල ප්‍රාදේශීය සභාවට අයත් ඩංඩුම සතිපොළ අසල අංක 05 සහ අංක 06 කඩ කාමර 2019 වර්ෂයේදී බදු දී තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන ලංසු මුදලින් සියයට 50 ක මූලික මුදල් රු.මිලියන 1.5 ක් ගෙවූ බවට කඩ කාමර බදුදීමට අදාල ලිපි ගොනුවල දක්වා තිබුණද එම මුදල සභා අරමුදලට බැර කර නොතිබුණි.

## උතුරු පළාත

**කළමනාකරණ දුර්වලතා**

පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව විසින් මනල්කාඩු ප්‍රදේශයේ සංචාරකයින් සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2.80 කට නිම කරන ලද ව්‍යාපෘතියක් සහ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව මගින් 2014 වර්ෂයේදී රු.මිලියන 2.99 කට නිම කරන ලද මුඩලයිකුලි පානීය ජල යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම අත හැර දමා තිබුණි.

යාපනය මහ නගර සභාව විසින් වසර 05 ත් 27 ත් අතර කාලය සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දුන් එකතුව රුමිලියන 6.88 ක් වූ අත්තිකාරම් තිහක් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

වසර 5කට අධික කාලයක් සංචිත 03ක පැවති රු.මිලියන 373.56 ක් උපයෝජනය කිරීමට යාපනය මහනගර සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

යාපනය මහනගර සභාව, පේදුරුතුඩුව නගර සභාව, චාවකච්චේරිය නගර සභාව සහ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව සතු වෙළෙඳසැල් 238කට අදාළව වසර 05කට හෝ වසර 03කට වරක් අළුත් කළ යුතු දිගුකාලීන බදු ගිවිසුම් වසර 03 සිට වසර 43 ක් දක්වා කාලසීමාවක් තුළ අලුත් කර නොතිබුණි.

අනවසර ගොඩනැගිලි 31ක් සොයා ගන්නා ලද අතර, වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළ ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව, තුනුක්කායි ප්‍රාදේශීය සභාව සහ පුතුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව, වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවල වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව, කරච්චි ප්‍රාදේශීය සභාව, පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව සහ පූනකරි ප්‍රාදේශීය සභාව, මන්නාරම නගර සභාව, මන්නාරම ප්‍රාදේශීය සභාව, මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව සහ මුසලි ප්‍රාදේශීය සභාව සතුව පැවති, දිගුකාලීනව අබලන් වූ වාහන 91ක් අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට හෝ අපහරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව සහ පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව, වේලනෛ ප්‍රාදේශීය සභාව, වව්නියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව, වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව සහ වව්නියාව උතුර ප්‍රාදේශීය සභාව, කරච්චි ප්‍රාදේශීය සභාව පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව, පූනකරි ප්‍රාදේශීය සභාව සහ මන්නාරම නගර සභාව විසින් භාවිත කරන වාහන 80ක අයිතිය අදාළ සභාවේ නමට පැවරීමට කටයුතු කර නොතිබුණි.

2015 දෙසැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/01 හි 1.1 ඡේදයට පටහැනිව, යාපනය මහ නගර සභාවට, චාවකච්චේරි නගර සභාවට, වැල්වෙට්ටිතුරෙයි නගර සභාවට, චාවකච්චේරි ප්‍රාදේශීය සභාවට සහ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවට සහ පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවට අයත් නොවන ඉඩම්වල එකතුව රු.මිලියන 67.16ක වියදමින් ගොඩනැගිලි 36ක් ඉදිකර තිබුණි.

චාවකච්චේරි නගර සභාව, පේදුරුතුඩුව නගර සභාව, වැල්වැට්ටිතුරේ නගර සභාව, කරෙයිනගර් ප්‍රාදේශීය සභාව, නල්ලූර් ප්‍රාදේශීය සභාව, කයිට්ස් ප්‍රාදේශීය සභාව සහ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව සතු නොවූ එකතුව රු. මිලියන 318.81 ක් වූ ඉඩම් 67 ක් සහ ළිං 29 ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

යාපනය මහ නගර සභාව, පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව, ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව, කයිට්ස් ප්‍රාදේශීය සභාව, වේලනෛ ප්‍රාදේශීය සභාව, වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව, වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව, කරෙයිනගර් ප්‍රාදේශීය සභාව, චාවකච්චේරි ප්‍රාදේශීය සභාව, වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව, වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව, වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව සහ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව මගින් භාවිතා කරන ඉඩම් සහ ගොඩනැගිලි 98, සුසාන භූමි 188, ළිං 193 සහ වාහන 81 ක අයිතිය මෙතෙක් මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා විසින් පවරාගෙන නොතිබුණි.

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව, වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව, සහ වව්නියාව උතුර ප්‍රාදේශීය සභාව, කරච්චි ප්‍රාදේශීය සභාව, පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව සහ පූනකරි ප්‍රාදේශීය සභාව සතු ඉඩම් 345ක වටිනාකම තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ බොහෝ ගොඩනැගිලි සහ පොදු ළිං රු. මිලියන 53.48 ක් වූ මුළු පිරිවැයකට ඉදිකර තිබුණ ද, එ්වායේ අයිතිය තහවුරු කිරීමට සභාව අපොහොසත් වූ අතර මේ දක්වා ඒවා භාවිත කර නොතිබුණි.

උතුරු කඩිනම් පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ 2011 වසරේදී රු. මිලියන 26.14 ක වියදමින් නෙඩුන්කේනි බස් නැවතුම්පොළ සහ කඩසාප්පු ඉදිකර ඇති අතර වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව විසින් වසර 12 ක් පුරා ඒවා උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

කරච්චි ප්‍රාදේශීය සභාව විසින් සභා අරමුදල් සහ ප්‍රාදේශීය සංවර්ධන අරමුදල් යටතේ රු. මිලියන 100.16ක මුදලින් වෙළෙඳපොළ

සංකීර්ණ 03 ක්, කඩ සාප්පු 23 ක්, උද්‍යාන සහ වාහන නැවතුම් ඉදිකරන ලද අතර ඒවා වසර 01 සිට 2 දක්වා කාලයක් භාවිත කර නොතිබුණි.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කරච්චි ප්‍රාදේශීය සභාව විසින් උමායාල්පුරම් හි ඝන අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත් කිරීමේ අංගනය රු. මිලියන 4.09 ක වියදමක් දරමින් 2017 වර්ෂයේදී ඉදි කර තිබුණ ද, එය වසර 6 ක් පුරා උපයෝජනය කර නොතිබුණි.

## උතුරුමැද පළාත

**අනුරාධපුර මහා නගර සභාව**

නගර සභාවට අදාළව ඉකුත් වර්ෂවලදී සිදුවී තිබුණු රු. මිලියන 56.42 ක වංචා හා පාඩු වෙනුවෙන් විනය පරීක්ෂණ හා අවශ්‍ය නීතිමය කටයුතු සිදුකර නොතිබුණි.

අනුරාධපුර මහා නගර සභාවට අයත් නිල නිවාසයකින් සභාවට අයවිය යුතු හිඟ කුලී රු. මිලියන 11.23 ක් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**රඹෑව ප්‍රාදේශීය සභාව**

2023 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස 02 තුළ සරප් වෙත දෛනිකව ලැබී තිබුණු රු.349,515 ක් සභා අරමුදල වෙත බැර නොකර වංචා කිරීම සම්බන්ධයෙන් සරප් තනතුරේ රාජකාරි කළ නිලධාරිණියකගේ වැඩ තහනම් කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවය වෙතින් අලාභය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා රීති 13, 14, 15 අනුව කටයුතු කර නොතිබුණි.

**තලාව ප්‍රාදේශීය සභාව**

2019 අප්‍රේල් 15 දින අනතුරකට ලක්වී තිබුණු සභාවට අයත් කැබ්රථයේ අලාභයෙන් රු. මිලියන 4.46 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු නමුත් එම මුදල් අයකරගෙන නොතිබුණි.

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රු. මිලියන 3.2 ක් වැය කර ඉදිකරන ලද වත්කම් නිෂ්කාර්යව පැවති අතර දිරන කසළවලින් කාබනික පොහොර නිපදවීම සහ නොදිරන කසළ තේරීම් සිදුකර අලෙවි කිරීමක් සිදුකර නොතිබුණි. එම නිසා සභා බල ප්‍රදේශයෙන් දෛනිකව රැගෙන එන කසළ මොටෝගෝනෑව රක්ෂිතයට අවිධිමත්ව බැහැර කර තිබුණි.

**පදවිය ප්‍රාදේශීය සභාව**

ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් 2023 වර්ෂයේදී රු. මිලියන 5.83 වියදම් කර ධීවර ඔරු 34 ක් මිලදී ගෙන තිබුණ නමුත් එම ධීවර ඔරුවලින් 30 ක්ම ආදායම් උත්පාදනය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව සභා පරිශ්‍රයේ තිබුණි.

**පලාගල ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂයේදී හිඟුරුවැව ප්‍රදේශයේ රු මිලියන 19.74 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල සහ ළිඳ නිෂ්කාර්යව පැවතුණි.

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

සභාව විසින් ඉදිකරන ලද වටිනාකම රු. මිලියන 11.69 ක් වූ ගොඩනැගිලි 03 ක් හා වටිනාකම අනාවරණය නොවූ නිල නිවාසය භාවිතයට ගැනීම හා ආදායම් උත්පාදන අරමුණ සඳහා යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු නොකිරීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**

සභාවට අයත් කහටගස්දිගිලිය සතිපොළෙන් 2023 වර්ෂයේ ජනවාරි සිට ජුනි 31 දක්වා කාලය තුළ අයකර තිබුණු රු. මිලියන 1.07 ක ගාස්තු සභාව වෙත ලබානොදීම සම්බන්ධයෙන් එම කාලය තුළ කටයුතු කළ ආදායම් පරීක්ෂක නිලධාරියා වෙනත් සභාවක් වෙත ස්ථාන මාරුකිරීම පමණක් සිදුකර තිබුණු නමුත් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා සභාවට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

# මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොමැති රාජ්‍ය ව්‍යවසායන්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින රජයට අයත් ව්‍යාපාර(State Owned Enterprises) ගණයට ගැනෙන ආස්ථිතයන්හි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රාජ්‍ය සමාගම් දහතුනක(13), රාජ්‍ය සංස්ථා හතරක(04), ව්‍යවස්ථාපිත මණ්ඩල හයක(06), ව්‍යවස්ථාපිත අධිකාරී තුනක(03) හා වෙනත් ව්‍යවස්ථාපිත ආස්ථිතයන් දහතුනකින්(13) සමන්විත ආස්ථිතයන් තිස් හයකට (36) අදාල (වගු අංක 1,2 හා 3හි දැක්වේ) මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාපිත නියමයන්ට අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අදාල ආස්ථිතයන්හි කළමණාකරණ මණ්ඩලයන් විසින් 2024 ජූලි 31දින වන විටත් කටයුතු කර නොතිබුණද අදාල ආස්ථිතයන් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිසි අධීක්ෂණයට හා අවධානයට ලක්වී නොතිබුණි.

අදාල ආස්ථිතයන් විසින් අවසන් වරට විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අදාලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති වර්ෂයන් හා අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ලබාදී ඇති විගණන මතයන්, ආස්ථිතයන්හි මුළු වත්කම්, හිමිකම්, වගකීම්, මුළු ආදායම හා මුළු වියදම පිළිබඳ තොරතුරු පහත වගු අංක 2.50,2.51 හා 2.52හි දැක්වේ;

**වගු අංක : 2.50: රාජ්‍ය සමාගම්**

**(රු.මිලියන)**

| විගණිත ආයතනය | වර්ෂය | මතය | මුළු වත්කම් | හිමිකම් | මුළු වගකීම් | මුළු ආදායම | මුළු වියදම | බදු පසු ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|---|---|---|---|
| මිල්කෝ පුද්ගලික සමාගම | 2020 | ව්‍යාවනය කළ | 21,511.87 | 653.81 | 20,858.05 | 11,191.16 | 10,965.40 | 226.00 |
| ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පෞ) සමාගම | 2021 | තත්වාගණනය කළ | 263.58 | 209.14 | 54.44 | 65.99 | 56.62 | 9.00 |
| මහවැලි සත්ත්ව ව්‍යාපාරික (පෞ) සමාගම | 2019/2020 | ව්‍යාවනය කළ | 132.55 | (28.31) | 160.86 | 130.13 | 159.30 | (29) |
| Waters Edge Recreation Ltd | 2022 | තත්වාගණනය කළ | 150.69 | (8.09) | 158.79 | 209.87 | 211.84 | 0.90 |
| Waters Edge Ltd | 2022 | තත්වාගණනය නොකළ | 7,448.02 | 1,486.76 | 5,961.26 | 2,322.41 | 1,878.87 | 353.20 |
| ලංකා සළුසල සමාගම | 2010 | ව්‍යාවනය කළ | 275.62 | (367.36) | 642.98 | 231.21 | 150.99 | 80.21 |
| ලංකා සතොස ලිමිටඩ් | 2022 | ව්‍යාවනය කළ | 12,175.35 | (12,609.84) | 24,785.19 | 57,545.66 | 57,581.08 | (35.42) |
| සී/ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම | 2022 | තත්වාගණනය කළ | 119.15 | 45.20 | 73.95 | 249.77 | 255.04 | (5.27) |
| සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගම | 2020 | ව්‍යාවනය කළ | 272.06 | 13.55 | 258.50 | 5.61 | 8.58 | (3.86) |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලංකා රෙස්ට් හවුස් සමාගම | 2021 | ව්‍යාවනය කළ | 97.84 | (32.27) | 130.12 | 36.31 | 38.32 | (2.0) |
| ඇල්කඩුව වැවිලි සමාගම | 2021 | - | 1,673.45 | 681.15 | 992.30 | 757.98 | 431.82 | 323.03 |
| සී/ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම | 2021 | තත්වාගණනය කළ | 119.15 | 45.20 | 73.94 | 249.76 | 255.03 | (5.27) |
| නෝර්ත් සී ලිමිටඩ් | 2020/2021 | තත්වාගණනය කළ | 340.00 | 260.00 | 600.00 | 269.00 | 358.00 | (89.00) |

**වගු අංක : 2.51 රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල හා අධිකාරී** (රු.මිලියන)

| විගණිත ආයතනය | වර්ෂය | මතය | මුළු වත්කම් | හිමිකම් | මුළු වගකීම් | මුළු ආදායම | මුළු වියදම | බදු පසු ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|---|---|---|---|
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 2020 | තත්වාගණනය කළ | 5,689.42 | 4,223.40 | 1,466.01 | 3,290.00 | 3,312.00 | (22) |
| වතු ප්‍රජාව සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය | 2019 | තත්වාගණනය කළ | 0.05 | (0.45) | 0.5 | 0.00 | 2.50 | (0.50) |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 2019 | ව්‍යාවනය කළ | 2,912.23 | (924.83) | 3,837.06 | 1,129.43 | 1,478.32 | (415.29) |
| කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය | 2021 | තත්වාගණනය කළ | 266.52 | 242.82 | 23.63 | 127.65 | 140.05 | 15.80 |
| කිතුල් සංවර්ධන මණ්ඩලය | - | - | - | - | - | - | - | - |
| පොල් වගාකිරීමේ මණ්ඩලය | 2020 | - | 769.30 | 100.51 | 668.79 | 48.33 | 2.15 | 46.20 |
| ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2020 | - | 17,319.37 | 1,831.11 | 15,488.26 | 2,254.57 | 3,631.17 | (1,561.41) |
| සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 2018 | ව්‍යාවනය කළ | 549.05 | (930.23) | 1,479.27 | 233.48 | 184.83 | (167.21) |
| වී අලෙවි මණ්ඩලය | 2020 | ව්‍යාවනය කළ | 10,483.65 | (14,656.27) | 25,139.92 | 1,459.58 | 2,857.75 | 1,398.17 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 2021 | තත්වාගණනය කළ | 31.02 | 14.33 | 16.69 | 35.36 | 58.66 | 8.68 |
| නාගරික සංවර්ධන අධිකාරිය | 2021 | ව්‍යාවනය කළ | 219,766.08 | 77,103.82 | 142,662.26 | 4,041.96 | 3,790.60 | 235.10 |
| ධීවර වරාය නීතිගත සංස්ථාව | 2022 | ව්‍යාවනය කළ | 5,573.00 | 4,780.00 | 793.00 | 1,372.00 | 1,546.00 | 364 |
| ධීවර සංස්ථාව | 2018 | ව්‍යාවනය කළ | 1,985.00 | 397.00 | 1,588.00 | 3,179.00 | 3,213.00 | (34.00) |

වගු අංක : 2.52 වෙනත්(අරමුදල්/ පදනම්/ ආර්ථික මධ්‍යස්ථාන) (රු.මිලියන)

| විගණිත ආයතනය | මූල්‍ය වර්ෂය | මතය | මුළු වත්කම් | හිමිකම් | මුළු වගකීම් | මුළු ආදායම | මුළු වියදම | බදු පසු ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|---|---|---|---|
| තේ ශක්ති අරමුදල | 2017 | ව්‍යාචනය කළ | 666.19 | 65.65 | 600.54 | 181.87 | 43.50 | 184.47 |
| ජාතික පුස්තකාලය | 2021 | අභිතකර | 237.50 | 178.43 | 59.07 | 5.37 | 153.63 | 153.00 |
| සෞම්‍ය මූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම | 2019 | තත්වාගණනය කළ | 438.90 | 326.00 | 112.60 | - | 23.30 | 5.30 |
| විජය කුමාරතුංග අනුස්මරණ පදනම | - | - | - | - | - | - | - | - |
| බුද්ධශාසන අරමුදල | 2021 | තත්වාගණනය කළ | 845.24 | 843.24 | - | 42.44 | 24.80 | 17.70 |
| මධ්‍යම සංස්කෘතික අරමුදල | 2019 | ව්‍යාචනය කළ | 8,574.98 | 7,564.03 | 1,010.95 | 4,016.05 | 4,164.28 | 1,917.00 |
| ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය | 2022 | තත්වාගණනය කළ | 193.52 | 172.10 | 21.43 | 44.53 | 39.04 | 5.50 |
| චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයින් සඳහා වූ චිත්‍රපට සංස්ථාභාරය | 2022 | තත්වාගණනය කළ | 18.2 | 18.10 | 0.10 | 1.80 | 9.90 | 0.20 |
| සමෘද්ධි ක්ෂුද්‍රමූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල | 2019 | තත්වාගණනය නොකළ | 167.00 | 133.00 | 22.00 | 13.00 | 2.00 | - |
| සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල | 2019 | තත්වාගණනය කළ | 65.13 | 65.13 | - | 66.00 | 5.00 | - |
| ලක්ෂ්මන් කදිරගාමර් සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | 2022 | තත්වාගණනය කළ | 167.66 | 165.68 | 1.98 | 47.56 | 44.66 | 2.90 |
| වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානය | 2021 | තත්වාගණනය කළ | 256.55 | 253.96 | 2.57 | 18.92 | 12.59 | 6.32 |
| පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානය | 2021 | ව්‍යාචනය කළ | 75.42 | 65.10 | 10.32 | 8.96 | 15.30 | (6.34) |

## ක්‍රියාකාරී නොවන(Non-Operating) රාජ්‍ය ව්‍යවසායන්

විගණනයට ඉදිරිපත්වී ඇති තොරතුරු වලට අනුව 2024 ජූලි 31දින වන විට රාජ්‍ය සමාගම් දහයක්(10) හා රාජ්‍ය සංස්ථා දෙකක්(02) මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක මට්ටමේ නොපවතී. ඉන් ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව වසා දමා සංස්ථාව සතු ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාව බදු දීමට කටයුතු කර තිබූ අතර සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සියළු සේවකයින් 2023.09.30 දින විශ්‍රාම ගන්වා තිබුණි. එහෙත් අදාල සංස්ථා ඇවර කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. එසේම මෙහෙයුම් කටයුතු සිදු නොකරන රාජ්‍ය සමාගම් දහයක් (10) අතුරින් ඇතැම් සමාගම් අමාත්‍ය මණ්ඩල තීරණ මත ඇවර කිරීමට හා සමහරක් සමාගම් දිගින් දිගටම අලාභ ලැබීම මත සමාගම ස්වේච්ඡාවෙන් විසිරුවා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. විසිරුවා හැරීමට තීරණය කර තිබූ සමාගම් හතරක(04) ඇවර කටයුතු ආරම්භ කර තිබුණද අදාල

කටයුතු 2024 ජූලි 31දින වන විටත් අවසන් වී නොතිබුණු අතර සමාගම් හයක (06) ඇවර කටයුතු ආරම්භ කර නොතිබුණි.

අදාල ආස්ථිතයන් විසින් අවසන් වරට විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අදාලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති වර්ෂයන් හා අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ලබාදී ඇති විගණන මතයන්, ආස්ථිතයන්හි මුළු වත්කම්, හිමිකම්, වගකීම්, මුළු ආදායම හා මුළු වියදම පිළිබද තොරතුරු පහත වගු අංක 4 හි දැක්වේ;

**වගු අංක : 2.53 ක්‍රියාකාරී නොවන (Non-Operating) රාජ්‍ය ව්‍යවසායන් (රු.මිලියන)**

| විගණිත ආයතනය | වර්ෂය | මතය | මුළු වත්කම් | හිමිකම් | මුළු වගකීම් | මුළු ආදායම | මුළු වියදම | බදු පසු ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව | 2020 | අහිතකර | 924.10 | (51.20) | 975.30 | 75.10 | 5.10 | (2.7) |
| සී/ස කන්තලේ සීනි කර්මාන්තය | 2019 | ව්‍යාවනය කළ | 162.95 | (3.18) | 166.13 | 0.42 | 19.77 | 8.60 |
| සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනය | 2015 | ව්‍යාවනය කළ | 300.29 | (1445.21) | 1,745.49 | 5.91 | 10.19 | 1.50 |
| සී/ස ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම | 2019 | තත්වාගණනය කළ | 7.51 | 6.46 | 1.05 | 0.71 | 2.31 | (1.59) |
| සී/ස වෙන්චර් කැපිටල් (පුද්) සමාගම | 2018 | ව්‍යාවනය කළ | 15.60 | 15.22 | 0.38 | 0.50 | 0.13 | 0.30 |
| ලංකා සිමෙන්ති පුල්ගලික සමාගම | 2016 | ව්‍යාවනය කළ | 275.25 | (634.16) | 909.41 | 36.02 | 41.70 | 5.68 |
| ස්ලින්ටෙක් ඇකඩමිය | 2021/2022 | තත්වාගණනය කළ | 4.60 | (8.6) | 13.20 | 0.05 | 1.60 | 0.30 |
| ලංකා ජෙමොලොජිකල් ලැබෝරටරි පුද්ගලික සමාගම | 2013/2014 | තත්වාගණනය නොකළ | 139.01 | 124.18 | 14.83 | - | (0.26) | (0.26) |
| නැට්වෙල්ත් සෙකුරිටීස් ලිමිටඩ් | 2021 | තත්වාගණනය කළ | 1,286.47 | 811.26 | 475.21 | 61.55 | 79.49 | (423.38) |
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් | 2021 | තත්වාගණනය කළ | 1,258.48 | 1,257.30 | 1.19 | 1.68 | 3.90 | (2.2) |
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව | 2020 | ව්‍යාවනය කළ | 11,050.71 | (2,941.27) | 13,991.98 | 26.39 | 645.37 | (614.42) |
| පැලියගොඩ වෙයාර් හවුස් සමාගම | 2016 | තත්වාගණනය කළ | 220.56 | 196.66 | 23.90 | 84.26 | 9.78 | 65.87 |




# 03

# මූල්‍ය නොවන විගණනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කාර්යසාධන විගණන සිදු කිරීම විගණකාධිපතිවරයා වෙත අධිකාර බලය ලබාදී ඇත. 2012 වර්ෂයේදී කාර්යසාධන විගණන ඒකකයක් ආයතනය තුළ ස්ථාපනය කරන ලද අතර එතැන් සිට 2023 වර්ෂය අවසානය දක්වා ජාතික වශයෙන් වැදගත් වන විවිධ වූ මාතෘකාවන් යටතේ කාර්යසාධන විගණන වාර්තා සියයකට ආසන්න ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. කාර්යසාධන විගණනය මගින් යම් රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ යම් වියදම් ඒකකයක තෝරා ගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එහි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායී බව ඇගයීමට ලක් කරනු ලැබේ. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය (INTOSAI)විසින් සාමාජික රටවල උත්තරීතර විගණන ආයතන විසින් කාර්යසාධන විගණනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින් පවතින අතර අපරට තුළද මහජනතාව හා අනෙකුත් පාර්ශ්වයන අතර කාර්සාධන විගණන වාර්තා කෙරෙහි වැඩි අවදානයක් යොමු වී ඇත.

අපගේ විගණනය INTOSAI විසින් හඳුන්වා දී ඇති, දේශීය අවශ්‍යතාවන්ට අනුව ගලපන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතිවල( ISSAI) දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන සේ සිදු කරනු ලබයි. විගණන කටයුතු ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කාර්යසාධන විගණන අංශය මගින් මෙන්ම ශාඛා මට්ටමෙන්ද සිදු කරනු ලැබේ. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය විසින් සිදු කරනු ලබන සහයෝගීතා විගණනයන් සඳහා සහභාගී වීමද ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කාර්යසාධන විගණන අංශය විසින් සිදු කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය විසින් සිදුකර 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද කාර්යසාධන විගණන වාර්තාවල ප්‍රධාන කරුණු ඇතුලත් සාරාංශය වාර්තා පහත පරිදි වේ.

## තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම විගණනය කිරීම - ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ සුව පහසු ජාතික මහජන සෞඛ්‍ය පද්ධතිය (තිරසර සංවර්ධන ඉලක්ක 3 (ඈ)) සම්බන්ධව

### නිකුත් කිරීමේ පසුබිම

තිරසර සංවර්ධන අරමුණු 17 න් 3 වන අරමුණ වන්නේ සෞඛ්‍ය සම්පන්න ජීවිත සහතික කිරීම සහ සැම වයස් කාණ්ඩයකම හැම දෙනාගේම යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම වේ.මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා ස්ථාපිත 3 (ඈ) ඉලක්ක මඟින් පූර්ව අනතුරු ඇඟවීම් මගින් අවදානම් අඩු කිරීම, ජාතික හා ගෝලීය සෞඛ්‍ය අවදානම් කලමණාකරණය කිරීම සඳහා සියළුම රටවල්, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ධාරිතාව ශක්තිමත් කිරීම අපේක්ෂා කරන අතර එම ඉලක්ක වෙත ළඟා වීම 3(ඈ) 1 දර්ශකය වන ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි , ධාරිතාව හා හදිසි සෞඛ්‍ය සූදානම සහ 3(ඈ) 2 දර්ශකය වන තෝරාගත් ක්ෂුද්‍ර ජීවි නාශක ප්‍රතිරෝධ ජීවින් හේතුවෙන් රුධිර ආසාධන ප්‍රතිශතය මඟින් තක්සේරු කරනු ලැබේ. ජාත්‍යන්තර වශයෙන් රෝග ව්‍යාප්තිය වැළැක්වීම සහ එමඟින් ආරක්ෂා වීම පාලනය කිරීම සහ මහජන සෞඛ්‍ය ප්‍රතිචාරයක් දැක්වීම සඳහා 2005 මැයි 23 වන දින පැවති 58 වන ලෝක සෞඛ්‍ය සමුළුවේදී ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR 2005) සම්මත කර තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාවද ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි අනුගමනය කිරීමට බැඳී සිටී. වර්තමානයේදී බෝවන රෝග පැතිරීමේ ගැටළු, එම භාවිත සහ වෙනත් උවදුරු ආශ්‍රිත හදිසි අවස්ථා සහ විපත් ඇති වීමේ අවදානමට ලෝකවාසී ජනතාව ලක්ව සිටින අතර මෙම අවදානම සහ ඒවායේ ප්‍රතිවිපාක අඩු කිරීමත් සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා රටතුළ ඇති සූදානම සහ වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීම වාර්තාවේ අරමුණ විය.

## වාර්තාව නිකුත් කරන ලද ආයතන

සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්පාලන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය , තිරසර සංවර්ධන සභාව, ආපදා කලමණාකරන මධ්‍යස්ථානය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මුදල් කොමිසම හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- ජාතික සෞඛ්‍ය සභාව කඩිනමින් නැවත ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි මෙහෙයුම් කමිටුව සමඟ සෞඛ්‍ය කවුන්සිලයේ අඛණ්ඩ රැස්වීම් හරහා 3(ඈ) ඉලක්කය සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශවකරුවන් විසින් සිදු කරන සෑම ක්‍රියාකාරකමක් සඳහාම සහයෝගයෙන් කටයුතු කල යුතු බව

- එන්නත් ඇතුළු සෑම මිලදී ගැනීමක් සඳහාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කල යුතු අතර ඖෂධ සඳහා කාර්යක්ෂම බඩු තොග පාලන ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව

- ආපදා සූදානම් සහ ප්‍රතිචාර අංශය (DPRD) සහ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි කේන්ද්‍රස්ථානයන් සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ තම වගකීම පිලිබඳ සියළුම පාර්ශවකරුවන් දැනුවත් කිරීමට ක්‍රියා කිරීම හා සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAPHS) ක්‍රියාත්මක කිරීමේදී සියළුම පාර්ශවකරුවන්ගේ ක්‍රියාත්මක මැදිහත්වීම් ලබා ගත යුතු බව.

- රටේ සමස්ථ සෞඛ්‍ය තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉහළ සෞඛ්‍ය තොරතුරු පද්ධතියක් ස්ථාපිත කල යුතු බව

- මහජන සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා පහල මට්ටමේ රාජ්‍ය පාර්ශවීය ස්වයං තක්සේරු වාර්තාකරණයෙහි (SPAR) ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුබව.

- වගවීම්, සම්පූර්ණ, ස්වාධීන, සාක්ෂි මත පදනම් වූ, විනිවිදභාවයෙන් සහ ප්‍රතිකර්ම ක්‍රියාවන්ට යොමු කරන ආකාරයේ යාන්ත්‍රණ ස්ථාපිත කල යුතු බව.

- පනත යටතේ තිරසර සංවර්ධන සභාව තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) අධීක්ෂණය හා ඇගයීම සඳහා වන ප්‍රධාන ආයතන වන බැවින් 3(ඈ) ඉලක්කය ඇතුළු තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සඳහා අඛණ්ඩ අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු බව.

- 2021 සිට 2024 දක්වා රාජ්‍ය ආයෝජන වැඩසටහන තුල සෞඛ්‍ය සුරක්ෂිතතාව පිලිබඳ ව්‍යාපෘති/ වැඩසටහන් වලට ප්‍රමුඛත්වය දිය යුතු බව.

- පළාත් පදනමින් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වු ජාතික ක්‍රියාකාරි සැලැස්ම (NAPHS) හි මුදල් කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කල යුතු බවද රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය පළාත් සභා සමඟ සක්‍රීයව සම්බන්ධ විය යුතු අතර පළාත් සභා, සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වු ජාතික ක්‍රියාකාරී සැලැස්මක (NAPHS) වැදගත්කම අවධාරණය කල යුතු බව.

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (RDHS) සඳහා සම්පත් වෙන් කිරීමේදී ජනගහන ව්‍යාප්තිය සහ වෙනත් අදාල අවශ්‍ය සාධක තිබේද යන්න සලකා බැලිය යුතු බව.

සෞඛ්‍ය අංශය යටතේ වාර්තාවේ **ඇතුලත් කර ඇති නිරීක්ෂණ ඇතුළත් කර ඇත.**

## අපනයන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය හා ප්‍රවර්ධනයට සම්බන්ධ රාජ්‍ය ආයතනවල කාර්යභාරය ඇගයීම

### නිකුත් කිරීමේ පසුබිම

කෘෂිකර්මය සඳහා හිතකර දේශගුණික පරිසරයක් පැවතීම හා කෘෂි කර්මාන්තය පදනම් කරගත් ජීවන රටාවකට හුරු වු ජනතාවක් ජීවත්වීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට දේශීය පාරිභෝජනය සඳහා මෙන්ම අපනයනය ඉලක්ක කරගෙන කෘෂි බෝග වගා කටයුතු සිදු වේ. නමුත් දිර්ඝ කාලීනව අපනයන කෘෂිකාර්මික බෝග අපනයනයේ දායකත්වය ප්‍රමාණවත් වර්ධනයක් සිදු වී නොතිබීම, දේශීය වෙළඳපලේ ඇති හිඟතාවයන්, අගය එකතු කළ නිෂ්පාදන අපනයනය අඩු ප්‍රතිශතයක පැවතීමෙන් ලැබෙන විදේශ විනිමය ආදායම අඩුවීම, ඇතැම් අපනයන කෘෂිකාර්මික බෝග අපනයන කි.ග්‍රෑ. 1 ක අපනයන ආදායමට සාපේක්ෂව වැඩි වියදමක් දරමින් අනයනය කිරීම, ගොවීන්ට නිසි මිලක් නොලැබීම, ප්‍රති අපනයන ගැටළු හා විදේශ විනිමය ඉපයීමේ අවශ්‍යතාවය අනුව අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කරන රාජ්‍ය ආයතනවල කාර්යසාධනය ඇගයීම මෙම වාර්තාවේ අරමුණ විය.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන

ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා අපනයන කෘෂිකර්මය පිලිබඳ ප්‍රතිපත්තියක්ද ඇතුලත් කර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාවට නැංවීම.

- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනතට සාධනීය සංශෝධන ඇතුලත් කර කඩිනමින් බලාත්මක කිරීම.

- පර්යේෂණ ප්‍රමුඛතා හඳුනාගෙන ඒ සමඟ ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දීම මඟින් අගය එකතු කල නිෂ්පාදන අපනයන ප්‍රවර්ධනය

- දේශීය ඖෂධ සඳහා අවශ්‍ය බෝග නිෂ්පාදනය කිරීමට අමතරව අපනයන අරමුණු කොට ගෙන ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු ඔසු උයන්වල ඖෂධ වර්ග ප්‍රවර්ධනය

- කෘෂිකාර්මික භෝග වලින් හැකිතාක් අගය එකතු කිරීමේ නිෂ්පාදන අතුරු නිෂ්පාදන හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රමෝපායන් සැලසුම් කිරීම.

- අපනයන කෘෂිකාර්මික බෝගවලට අදාල බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා හැකියාව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වන බැවින් ඒ සඳහා අවශ්‍ය නීතිමය බලය අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබෙන පරිදි අදාල නීතිමය සංශෝධන ඇති කිරීම.

- කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය මඟින් සුළු අපනයන භෝග මිලදී ගැනීම, නිෂ්පාදකයන්ට අවශ්‍ය තොග ලබා දීම හා සාධාරණ මිලට ගුණාත්මක ද්‍රව්‍ය පාරිභෝගිකයන්ට ලබා දීම.

- පැල ගොවීන්ට ලබා දීමේදී අවශ්‍ය පහසුකම් පවතින නිශ්චිතව හඳුනාගත් වගාකරුවන්ට පමණක් පැල නිකුත් කිරීම හා අස්වනු නෙලීම දක්වා අඛණ්ඩව ක්‍රමවේදයක් සැකසීම.

- අපනයන කෘෂිකාර්මික බෝග ආශ්‍රිත ගොවීන්ට හා නිෂ්පාදකයන්ට යහපත් කෘෂිකාර්මික පිලිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිලිවෙත් (GMP) සහතික අනුව නිෂ්පාදන සඳහා පෙළඹවීම.

**කෘෂිකර්ම අංශය යටතේ වාර්තාව සඳහා ලබා දෙන ලද නිරීක්ෂණ ඇතුලත් කර ඇත.**

## බහලුම්ගත ජංගම ඩීසල් විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීමේ කාර්යසාධනය ඇගයීම

විදුලිබල මණ්ඩලය විදුලි ජනනයේදී ඇතැම් අවස්ථාවල ජනන ඌණතා හේතුවෙන් සහ සුළු ඌණතා හේතුවෙන් මුළු පද්ධතියම බිඳවැටීමට ලක්වන හෙයින් සුළු ඌණතා අවස්ථා මගහැරවීම සඳහා 1 MW /1.25 MVA බහාලුම්ගත ඩීසල් ජනක යන්ත්‍ර 50 ක්, බහාලුම්ගත ට්‍රාන්ස්ෆෝමර් 25 ක් සහ බහාලුම්ගත ඉන්ධන ටැංකි 25 ක් මිලදීගැනීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3,000 ක් වූ අතර ඒ සඳහා අවශ්‍ය අරමුදල් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වැයකර තිබුණි. ඒ අනුව 2023 අගෝස්තු 31 දිනට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් වූ අත්තිකාරම් මුදලද සහිතව

කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ මුළු මුදල එ.ජ.ඩො.මිලියන 12.21 කට සමාන රු.මිලියන 2,373.32 ක් විය.මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරනු ලැබූයේ ජාතික විදුලි පද්ධතියේ හදිසි බිඳවැටීම් වලදී අදාල සේවාව ප්‍රාදේශීය මට්ටමින් අඛණ්ඩව ලබා දීම වේ. විදුලිය බිඳවැටීමෙන් සිදුවන අවහිරතා මගහැරීමෙන් ජනජීවිතයේ සිදුවන විවිධ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ නමුත් එම අරමුණ ඉටුකරගැනීමට අපොහොසත්වීම හේතුවෙන් මේ පිළිබඳ සොයා බැලීම සඳහා කාර්‍යසාධන විගණනයක් කිරීමට තීරණය විය.

## වාර්තාව නිකුත් කරන ලද ආයතන

ලංකා විදුලි බල මණ්ඩලය, විදුලි බල අමාත්‍යාංශය
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,

## ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වර්ධනය වන ආකාරයෙන් අවම පිරිවැය සහිත දිගුකාලීන ජනන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මෙහි සඳහන් වන ක්‍රියා මාර්ග වලට එළඹීම

- එම සැලැස්මවලින් බැහැර ව්‍යාපෘතින් ආරම්භ කිරීමේදී ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම

- ලංසු ලේඛණ පිළියෙල කිරීමේදී අදාල අරමුණු නිවැරදිව ලගාකර ගැනීමට හැකිවන පරිදි කොන්දේසි ඇතුලත් කිරීම

- ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් නිර්දේශ කිරීමේදී අදාල අරමුණට ළඟා විය හැකි පරිදි වඩා තාර්කික පදනමකින් සිදු කිරීම

- ඉහල වටිනාකමකින් යුතු ප්‍රසම්පාදන සඳහා විස්තරාත්මක පිරිවැය ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර ලංසු ඇගයීමේදී ඇස්තමේන්තු හා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර ඇති අයිතම පිරිවැය අතර විචල්‍යතා ඇගයීම

- ඒකාබද්ධ විශාල ප්‍රමාණයේ කොන්ත්රාත්, සැපයීම සහ සවිකිරීම වැනි කොන්ත්‍රාත් සඳහා ද්විත්ව කවර ක්‍රමය යොදා ගැනීම, ව්‍යාපෘතිය කාලරාමුවකට අනුව සිදු කිරීම, මණ්ඩලය විසින් සිදු කළ යුතු සිවිල් වැඩ ආදිය නිසිකලට ඉටුකර දීම, ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව සම්බන්ධයෙන් මණ්ඩලයේ නිලධාරීන් උදෙසා ක්‍රමානුකූල පුහුණුවක් ලබාදීම

- ඉහළ තාක්ෂණික භාවයෙන් යුතු මිලදිගැනීම් සිදු කිරීමේදී ලංසු වල තාක්ෂණික හැකියාව පළපුරුද්ද පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම

**නිරීක්ෂණ ඇතුලත් කර ඇති අංශය** විදුලිබල හා බලශක්ති

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ ඇණිය උපරිම ධාරිතාවයෙන් යුතුව උපයෝජනය කිරීමේ කාර්යසාධනය

### නිකුත් කිරීමේ පසුබිම

මේ වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දීප ව්‍යාප්තව පැතිර පවතින අතර මණ්ඩලයේ කටයුතු විමධ්‍යගත කිරීම උදෙසා ප්‍රාදේශිය කාර්යාල 12 ක්, හා ඒ යටතේ ඩිපෝ 114 ක්, ප්‍රාදේශීය වැඩපලවල් 11 ක් රියදුරු අභ්‍යාස විද්‍යාල 07 ක් පිහිටුවා ඇත. 2022 දෙසැම්බර් 31 වන විට සමස්ථ රථ ඇණිය බස් රථ 6951 ක් වු අතර ධාවනය කල යුතු මුළු ධාවන කාල සටහන් ඉලක්කයෙන් ධාවනය කර තිබුණේ සියයට 84 ක් පමණි.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන

- ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය,
- ගමනාගමන කොමිෂන් සභාව

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළියෙල කිරීම කඩිනම් කිරීම.
- 1991 අංක 37 දරන ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව අදාළ කාර්යයන් සිදු කිරීම.
- පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වන ආකාරයට බස් රථ ඇණිය (Fleet) උපයෝජනය කර ගත හැකි පරිදි යෝජනා ක්‍රියාත්මක කිරීම.
- 2005 අංක 27 දරන ගමනාගමන මණ්ඩල පනත ප්‍රකාරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය හා ගමනාගමන මණ්ඩලයේ යෝජනාද ඇතුළත් කරමින් අයවැය ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීම.
- දැනට ධාවනය වන ගමනාන්ත බස් රථ සේවා ඵලදායි ලෙස සංශෝධනය කරමින් හඳුනාගත් නව මාර්ගවල බස් රථ ධාවනය, තැපැල් සේවා හා කුරියර් සේවා ආරම්භ කිරීම.
- නව කාර්යාල බස් සේවා හඳුන්වා දීම, මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කරමින් ප්‍රාදේශීය වැඩපොල හා ඩිපෝ මගින් පැරණි අමතර කොටස් හා පැරණි බස් රථ අළුත්වැඩියා කිරීම.
- කාර්මික අංශයේ කාර්යය මණ්ඩලය නිසි පරිදි උපයෝජනය කර ගැනීම, ටයර් නැවත පිරවීමේ කර්මාන්ත ශාලාවේ ධාරිතාවය ඉහළ නංවා බස් රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවුම් (Rebuild) හා පෙරසවි (Recap) කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම හා මගී

ජනතාවට ආරක්ෂාව හා පහසුව සැලසෙන අයුරින් රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙන්ම බස් රථ වලට සක්‍රීය කාලසටහන් සකස් කිරීම.

- කාලසටහනක් සකස්කරනු ලබන ධාවන මාර්ගවල මුළු වෙළඳපොල පංගුවෙන් සියයට 40 ක ප්‍රමාණය මණ්ඩලය මගින් ආවරණය සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

- බස් රථවල ඉන්ධන දහනය පිළිබඳ තත්ත්ව පරීක්ෂණයන් නිරන්තරව සිදු කිරීම සහ රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ හිඟය මග හරවා විධිමත් පරිදි රාජකාරි චක්‍ර සකස් කිරීම.

- බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා පැමිණෙන අවස්ථාවන්හිදී ඩිපෝ ඉංජිනේරු විසින් බස් රථයේ තත්ත්වය පිළිබඳ තත්ත්ව වාර්තා තබා ගැනීම, අළුත්වැඩියාවන් සිදු කර නැවත ධාවනයට යෙදවීමේදී එම බස් රථ ධාවනයට සුදුසු තත්වයේ තිබේද යන්න පරීක්ෂා කිරීම, බස් රථ තඩාංග සේවා හා ග්‍රීස් කිරීමේ කටයුතු කාලීනව සිදු කිරීම.

- බස් රථ වලට අවශ්‍ය අමතර කොටස් ඩිපෝ මගින් මිලදී ගැනීම වෙනුවට මධ්‍යගත සැපයුම් ක්‍රියාවලියක් සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- විශාල වටිනාකම් සහිත අයිතම් වන ටර්බෝචාජර්, රේඩියේටර්, ස්ටාටර් මෝටර්, ටයර්, පෙරසවි ටයර්, බැටරි, ඉන්ධන පොම්ප වැනි අමතර කොටස් සහ එන්ජින් ඔයිල් ඩිපෝ මට්ටමින් මිලදී ගැනීම අත්හිටුවා ප්‍රමාණ වට්ටම් ලබා ගත හැකි පරිදි විවෘත මිල කැඳවීම් මගින් අවශ්‍ය තොග මිලදී ගෙන ඩිපෝ වලට බෙදා හැරීමට කටයුතු කිරීම.

- බස් රථ සඳහා දුම් පරීක්ෂණ වාර්තා හා පාරිසරික බලපත්‍ර කාලීනව ලබා ගැනීම ආදිය මගින් මහජනතාවට ලාභදායී, විශ්වාසදායී හා සුවපහසු ප්‍රවාහන සේවයක් සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ ඇණිය (Fleet) ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු බව.

### නිරීක්ෂණ ඇතුලත් කර ඇති අංශය

- පොදු ප්‍රවාහන අංශය

## බන්ධනාගාර තුල පවත්නා තදබදය කළමනාකරණය කිරීම පිළිබඳ කාර්යසාධන විගණනය

බන්ධනාගාරයක ස්වරූපය පිළිබඳව එංගලන්තයේ ජෝන් හොවාර්ඩ් (John Horward) විසින් කරන ලද අධ්‍යනය අනුව, බන්ධනාගාර පිරිසිදුව, ඉඩකඩ සහිතව, අධ්‍යාපනික හා ආගමික ඉගැන්වීම් සිදු කළ යුතු අතර අදාළ පුද්ගලයන් ඉවත් වී ගිය පසුවත් ඔවුන් පිළිබඳව සොයා බැලිය යුතු ආයතනයක් ලෙස හඳුනාගෙන ඇත. සිරකරුවෙකු අපරාධකරුවකු ලෙස රඳවා තබමින් ඔහු කායිකව හා මානසිකව පීඩනයට ලක් කර වරදට දඬුවමක් දිය යුතුය යන තර්කනය හා වරදේ ප්‍රමාණයට හානියක් සිදු කළ යුතුය

යන සංකල්පය අතීතයේ බන්ධනාගාර පද්ධතිය තුළ පැවතිණි. මෙම සංකල්පය එකල සිටි විශ්ලේෂණ වාදීන්ගේත් සමාජ ශෝධකයින්ගෙත් විවේචනයට ලක් විය. මෙම කරුණු පදනම්කරගෙන බන්ධනාගාරය වදකාගාරයක් නොවිය යුතු අතර එය සමාජ ශෝධකාගාරයක් විය යුතුය යන තර්කය ගොඩ නැගුණි. මේ හේතුවෙන් වදකාගාරයක් ස්වරූපයෙන් පැවති බන්ධනාගාර චරිත ශෝධකාගාර බවට පත්වී විශෝධන ප්‍රතිපත්තිය මුල්කර ගනිමින් සිරකරුවන් පාලනය කිරීමක් සිදු කරයි.

## වාර්තාව නිකුත් කරන ලද ආයතන

බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

1877 අංක 16 දරණ බන්ධනාගාර ආඥා පනතේ 54 වන අධිකාරියට අදාලව සිදු කරන ලද සංශෝධනයන්හි 178 හා 179 පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුව කටයුතු කිරීම.

- නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා ශක්තිමත් හා ප්‍රමාණවත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීම හා ජීවනෝපාය පුහුණු කිරීම් ශක්තිමත් කිරීම.

- පූර්ව නඩු විභාග රඳවා ගැනීම් චෝදනා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමට අදාල පාර්ශවයන් මෙහෙය වීම.

- රිමාන්ඩ් බන්ධනාගාර කිරීම වෙනුවට නිවාස අඩස්සියේ තබා ගැනීම වැනි විකල්ප පිළිගත් ක්‍රම ශ්‍රී ලංකා අපරාධ යුක්ති පද්ධතියට හඳුන්වා දීම සඳහා පියවර ගැනීම.

- අධිකරණය මඟින් බන්ධනාගාර ගත කරන සැකකරුවන්ට අදාලව පොලිස් දෙපාර්තමේන්තුව විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන නියදි වලට අදාල රස පරීක්ෂක වාර්තා අධිකරණයට අප්‍රමාදව ඉදිරිපත් කිරීම.

- අපරාධ යුක්තිදාම ප්‍රවේශයේ පවතින ආයතන අතර සහයෝගීතා යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සහ හැකිතාක් නවීන තාක්ෂණය යොදා ගැනීම.

- නේවාසිකයන්ගේ නවාතැන් හා රැකවරණය සඳහා වූ ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව රැඳවියන් බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීම.

- බන්ධනාගාර කළමනාකරණයට පහසු වන පරිදි සමාජ ආරක්ෂාවට හානියක් නොවන සේ මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ නීති සංශෝධනය කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

- පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි යොදවා ගැනීම හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.
- බන්ධනාගාර දෙපාර්තමේන්තු තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීම.
- රැඳවියන්ගේ ශ්‍රමය හා දැනුම සාමාජීය වශයෙන් ඵලදායී කාර්යයන් සඳහා යොමු කරවීම.

## නිරීක්ෂණ ඇතුලත් කර ඇති අංශය

අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

# විශේෂ වාර්තා අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් විශේෂ විගණනයන් සිදු කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත අධිකාර බලය ලැබී ඇත. යම් අක්‍රමිකතාවයක්, වංචාවක්, වරදක් සිදු වී/සිදුකරන ලද බවට වන සිදුවීමක් හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් ගැඹුරින් පරීක්ෂා කර ඒ පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම වාර්තා මගින් සිදු කරයි. බැඳුම්කර නිකුත් කිරීමේ සිද්ධිය, සීනි බදු අනුප්‍රමාණයන් එකවර වෙනස් කිරීම නිසා සිදු වූ බලපෑම හා රාජ්‍ය ණය පිළිබඳ විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද වාර්තා කෙරෙහි වැඩි දෙනාගේ අවධානය යොමු වී තිබුණි. 2023 වර්ෂය තුළදී විගණකාධිපතිවරයා විසින් එසේ නිකුත් කරන ලද වාර්තා පිළිබඳ පසුබිම් තොරතුරු, නිකුත් කරන ලද ආයතන හා ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ මෙම ඡේදයේ ඇතුළත් කර ඇත. මෙම වාර්තා තුළ ඇතුළත් කරන ලද ප්‍රධාන නිරීක්ෂණ අදාළ විගණන අංශය යටතේ ඇතුළත් කර ඇත.

## ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම සමග ලංකා විදුලිබල මණ්ඩලය ඇති කරගත් මූලික ගිවිසුම් කාලය නිම වීමෙන් පසු මෙම බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට ගන්නා ලද තීරණය ක්‍රියාත්මක නොකර මූලික ගිවිසුම් කාලය නිම වී වසරකින් පසුව විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම දිර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්වයට සහ ලාභදායිත්වයට ඇති වී ඇති අයහපත් ප්‍රතිඵල හඳුනා ගැනීමත්, එම අයහපත් ප්‍රතිඵල හා අනාගතයේදී ක්‍රියාත්මක කරනු ලබන මෙවැනි ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රශස්ථ ලෙස ලබා ගැනීම සඳහා අවධානය යොමු කිරීම සඳහා මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන

විදුලිබල අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- බලාගාරය මිලදී ගැනීමේ ආර්ථිකමයභාවය පිළිබඳව නැවත සමාලෝචනය කර මිලදී ගැනීම් වාසිදායක තත්ත්වයක් තහවුරු වන්නේ නම් නොපමාව හෝ පවත්නා ගිවිසුම අවසන් වීමෙන් අනතුරුව බලාගාරය මිලදී ගැනීමට අවධානය යොමු කළ යුතු වීම

- රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කිරීමේදී අවධානයට ලක් කල යුතු කරුණු සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් හෝ/සහ නොසැලකිලිමත්භාවය හේතුවෙන්

නිවැරදි තක්සේරු වටිනාකමට වඩා අඩු වටිනාකමක් ලැබී ඇත්නම් ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන සුදුසු පියවර ගැනීම

- අදාල තක්සේරුව සිදු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රමාණවත් තොරතුරු ලබාදී නොමැති නම් සහ ඒ සඳහා අවශ්‍ය සහය ලබා නොදීම හේතුවෙන් තක්සේරුව අඩු වී ඇත්නම් ඒ පිළිබඳවද අවශ්‍ය පියවර ගැනීම

- යම් හෙයකින් බලාගාරය මිලදී නොගන්නේ නම් සහ තවදුරටත් මෙම බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට කටයුතු කරන්නේ නම් හෝ එම මිලදී ගැනීම සඳහා ගිවිසුමකට එළඹෙන්නේ නම් එම මිලදී ගැනීම රජයට උපරිම ආර්ථික වාසි ලැබෙන ලෙස ගිවිසුම්ගත වීම

- විදුලි පද්ධතියේ පැවතිය හැකි දුර්වලතාවයන් සහ පද්ධති සීමාවන් පිළිබඳව මෙන්ම එම දුර්වලතාවයන් හා සීමාවන් සඳහා ගත යුතු ඵලදායි විකල්පයන් පිළිබඳව ඉහළ කළමනාකරණය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම හා ඉහළ කළමනාකරණය විසින් අදාළ අංශ වලින් කාලිනව තොරතුරු ලබා ගෙන එම තොරතුරු කෙරෙහි අවධානය යොමු කර ප්‍රශස්ථ තීරණ ගැනීම

## 2022 ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ T-20 ලෝක කුසලානය (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය ආශ්‍රිත විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් 2022 ඔක්තෝබර් 09 දින සිට නොවැම්බර් 13 දින දක්වා ඔස්ට්‍රේලියාවේදී පවත්වන ලද 2022 වර්ෂයේ T-20 ලෝක කුසලාන (පිරිමි) තරඟාවලිය සම්බන්ධයෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අදාළව ශ්‍රී ලංකාවේ නිලසන්නාමය දරමින් ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමට අදාළව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය සමග ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගනුදෙනු හා සිද්ධි පරික්ෂා කිරීමේදී අනාවරණය වූ වෙනත් ආශ්‍රිත කරුණුද ඇතුළත් කර මෙම විශේෂ විගණන වාර්තාව නිකුත කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ.

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- ජාතික නිල සන්නාම සහ ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරවීම ප්‍රමුඛ කාර්යයන්හි නිරත ක්‍රීඩා සංගම් එකී කාර්යය ඉටු කිරීමේදී රජය හෝ ජාතිය වෙනුවෙන් භාරය දරමින් කටයුතු කරන සංගම් ලෙස වගකීම් සහ යුතුකම් පැවරීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම.

- ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනයට සහ ශ්‍රී ලංකා රජයට මූල්‍යමය අවාසියක් වන අයුරින් හෝ කීර්තිනාමයට හානි කර ලෙස ක්‍රියාකර ඇති පාර්ශවයන් හඳුනා ගෙන ඔවුන්ට එරෙහිව නිසි පියවර ගැනීම.

- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා, ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා සිය නියාමන කටයුතු පුළුල් කිරීම.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළ ප්‍රාග්ධන මිලදී ගැනීම්වලදී සිදු වී ඇති අවිධිමත් ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන එයට එරෙහිව පියවර ගැනීම හා විධිමත් ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම සහ තරගකාරීත්වය උපරිම වන පරිදි සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම, ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත පමණක් මිලදී ගැනීම් සිදු කිරීම .

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අනවශ්‍ය වියදම් නතර කර සහ හැකි අයුරින් වියදම් අවම කර ප්‍රාදේශීය වශයෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ පහසුකම් වර්ධනය කිරීම.

- මෙම වාර්තාවෙන් හඳුනා ගත් දුර්වල ක්ෂේත්‍ර විධිමත් කිරීම සඳහා රෙගුලාසි පැනවීම හෝ පවතින රෙගුලාසි ශක්තිමත් කිරීම සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරනවාද පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

- සියලු ජාතික ක්‍රීඩා සංගම්වලට අදාළ ලෙස පාර්ලිමේන්තු පාලනය තවදුරටත් ශක්තිමත් වන පරිදි අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ලබා දිය යුතු බවට සහ කාරක සභා හමුවට කැඳවීමේ හැකියාව ලැබෙන පරිදි ක්‍රීඩා පනතට අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.

## අනීතිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල චැසි අංක හා එන්ජින් අංක මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතියට වංචනිකව දත්ත ඇතුළත් කර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ව්‍යාජ සහතික නිකුත් කිරීම පිලිබඳව විශේෂ විගණන වාර්තාව - 2022

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව භාවිත කරන දෘඩ පිටපත් සහිත ලිපිගොනු මෙන්ම වයඹ පළාත් හා මධ්‍යම පළාත් වෙනුවෙන් ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ස්ථාපිත කර ඇති ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර (ERL) දත්ත පද්ධතිය තුළ ඇතුළත් තොරතුරු සංසන්ධනාත්මකව විමර්ශනයට ලක් කර නිරීක්ෂණය වූ කරුණු ඇසුරින් මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- මෝටර් වාහනයක ලියාපදිංචියට අදාළව සිදු කරනු ලබන සියලුම සංශෝධනයන්ට අදාළව අතීත තොරතුරු හා එම තොරතුරු වෙනස් කිරීමට දායක වූ පරිශීලකයන් සම්බන්ධ විස්තර ස්වයංක්‍රීයව පද්ධතිය තුළට ගබඩා වන පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම.

- මෝටර් රථ පනත ප්‍රකාරව ලියාපදිංචි මෝටර් රථයක වැසි අංකය වෙනස් කල නොහැකි බැවින් පරිගණක පද්ධතිය තුල කිසිදු අයුරකින් වැසි අංකයක් වෙනස් කිරීමට නොහැකි ලෙස එනම් එවැනි ඉල්ලීම් ස්වයංක්‍රීයව ප්‍රතික්ෂේප වන අයුරින් පද්ධතිය සංශෝධනය කිරීම.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය වෙත සම්ප්‍රේෂණය කෙරෙන දත්ත වෙනස් කර ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ERL දත්ත පද්ධතිය තුළින් පරිශීලකයින්ට ලබා දී ඇති අවස්ථාවන් අවුරා වංචනිකව ආදායම් බලපත්‍ර නිකුත් කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.
- මෙම වාර්තාවෙන් ලබා දී ඇති අදාළ වන නිරීක්ෂණ සම්බන්ධයෙන් ආයතනික මට්ටමින් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ප්‍රකාරව සහ වෙනත් අදාළ නීතීන් ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම.
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් භාවිතයට නොගත් හිස් අංක, අක්‍රීය කරන ලද අංක හා ලියාපදිංචි අංකයෙහි අවසන් ඉලක්කම් හතර, 13 න් අවසන් වන හා එම අංක හතරෙහි එකතුව 13 වන අංක ඇතුළුව මෙතෙක් භාවිතයට නොගත් හා අනාගතයේදී භාවිතයට නොගන්නා අංක සඳහා කිසිදු අයුරිකින් මෝටර් රථයක් ලියාපදිංචි වීම වැළැක්වීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය අවහිර කිරීම හා කලින් කලට එලෙස අවහිර කෙරෙන අංක ප්‍රසිද්ධියට පත්කිරීමට කටයුතු කිරීම.

## 2020 ජනවාරි 01 සිට 2022 මැයි 31 දක්වා කාලය තුළදී ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

ජාතික පාසල් වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී නියමිත ක්‍රමවේදයෙන් බැහැරව විවිධ පාර්ශවයන්ගේ ඉල්ලීම්/ නිර්දේශයන්/අභියාචනයන්/නියෝග මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෘජුව විදුහල්පතිවරුන් වෙත ලිපි නිකුත් කර සිසුන් ඇතුළත් කිරීම සහ විධිවිරෝධී ලෙස මැදිහත් වීම හේතුවෙන් චක්‍රලේඛ විධිවිධාන අනුව පන්තියක සිටිය හැකි උපරිම සිසුන් සංඛ්‍යාව ඉක්මවා එම පන්තිවලට සිසුන් ඇතුළත් කර තිබුණු බව විගණනයට හඳුනා ගැනීමට හැකි විය. මේ හේතුවෙන් විවිධ අවස්ථාවන්වලදී මහජන නියෝජනයන් විගණනයට ලැබී තිබුණු අතර මාධ්‍ය මගින් ද වරින් වර මේ සම්බන්ධයන් කරුණු සාකච්ඡා කර තිබූ බව හඳුනා ගැනීමට හැකි විය’

**වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ.**

අධ්‍යාපන අමාත්‍යාංශය

**ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්**

- අමාත්‍ය මණ්ඩල තීරණ හා අධිකරණ නියෝග මගින් පාසලක පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සීමාවන් නිර්ණය කර තිබියදී එම සීමාවන් ඉක්මවමින් සිසුන් ඇතුළත් කිරීම සඳහා විවිධ ක්‍රමවේද හඳුන්වා දීමෙන් වැළකීම සහ සිසුන් ඇතුළත් කිරීමේදී විනිවිද හා පාරදෘශ්‍යභාවයකින් යුතුව කටයුතු කිරීම.
- ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි වලට සිසුන් ඇතුළත් කිරීමේදී ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ, වරින් වර අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධිවිධානවලට පටහැනි ලෙස සිසුන් ඇතුළත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කටයුතු කිරීම හේතුවෙන් සියලුම සිසුන්ට ජාතික පාසලකට ඇතුළත් වීමට තිබූ සමප්‍රවේශ අවස්ථාව අහිමි වී ඇති බැවින් එලෙස අතරමැදි ශ්‍රේණියකට සිසුන් ඇතුළත් කිරීමේදී පවත්නා නීති රීති, රෙගුලාසිවලට අනුගතව කටයුතු කල යුතුවීම තුලින් අදාළ නිර්ණායකවලට යටත්ව සියලු සිසුන්ට සමාන අවස්ථා සලසා දීම.
- ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි වලට සිසුන් ඇතුළත් කිරීමේදී අදාළ චක්‍රලේඛය පරිදි අදාළ පාසලෙහි ස්ථාපිත කර ඇති කමිටුව මගින් නිර්දේශිත සිසුන් සඳහා අනුමැතිය ලබා දිය යුතු වුවත් ලේකම්වරයා විසින් එම ක්‍රමවේදයෙන් බැහැර වීම හේතුවෙන් අදාළ චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය වී ඇති බැවින් ලේකම්වරයාට නිශ්චිතව සාධාරණීකරණය කළ හැකි සුවිශේෂී හා විරල අවස්ථාවකදී හැර කිසිම අවස්ථාවකදී ඍජුව කරන ලද ඉල්ලීම්, නිර්දේශ, අනුග්‍රහකත්ව හා නියෝග ලෙස සැලකිය හැකි අවස්ථාවන් සඳහා ලිපි නිකුත් නොකිරීමට කටයුතු කිරීම.
- පවත්නා රෙගුලාසි නොසලකා හැර මහජන නියෝජිතයන් මෙන්ම තවත් විශේෂිත වූ පුද්ගලයින් විසින් කරන ලද ඉල්ලීම්, නිර්දේශ සහ අනුග්‍රහකත්ව ලිපි මත සිසුන් ඇතුළත් කර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කිරීම හේතුවෙන් සිසුන් සියලු දෙනාට සම ප්‍රවේශ අවස්ථාවක් නොලැබීම මත එය පක්ෂපාතී බවට හඳුනාගැනීමට හැකිවන අතර එලෙස ලැබෙන ලිපි සම්බන්ධයෙන් සුවිශේෂී අවස්ථාවක් ලබා දීම වැළැක්වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය හා එයට අනුබද්ධ ලෙස නිශ්චය කර ඇති ආයතනවල වසර තුනකට වඩා වැඩි කාලයක් සේවය කල කාර්යමණ්ඩලයේ දරුවන් ජාතික පාසල්වලට ඇතුළත් කිරීම සඳහා විශේෂ අවස්ථාවක් අදාළ චක්‍රලේඛ මගින් ලබා දී ඇති අතර එවැනි විශේෂ අවස්ථාවන් ලබා දීම තුළින් ද ඉහත ඡේදයෙහි පරිදි සමානාත්මතාවය කඩ වන බව හඳුනාගැනීමට හැකි වූ බැවින් එවැනි අවස්ථාවන් ලබා දීමද නැවත සලකා බැලීම.
- ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු සිදුකරන විට අදාළ ඉල්ලීම් භාරගැනීම, ලිපි පාසල්වලට සහ දෙමාපියන්ට නිකුත් කිරීමේ නිශ්චිතව හඳුනා ගත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් යම්කිසි මූල්‍ය හෝ වෙනත් අයථා ගනුදෙනු හෝ විවිධ අක්‍රමිකතා කුමන හෝ මට්ටමකදී සිදු වී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා වැඩිදුර පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කිරීම.

- තීරණ ගැනීමේදී බාහිර පාර්ශවයන්ගේ මැදිහත්වීම වැලැක්වීමට කටයුතු කිරීම සහ අදාළ තීරණ ගැනීමට හා නිර්දේශ ලබා දීම සඳහා විධිමත් චක්‍රලේඛ වලින් ලබා දී ඇති බලතල ඉක්මවා හෝ යටපත් වන අයුරින් අමතර කමිටු පිහිටුවා සාමාජිකයන් පත් කිරීමෙන් වැලකී සිටීම.

## ශ්‍රී ලංකාවේ දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

දුම්රිය මාර්ග ආරක්ෂණ පද්ධති විද්‍යානුකූලව සැලසුම් කිරීමේ වැදගත්කම වගකිව යුතු පාර්ශවයන්ට පෙන්වා දෙමින් සහ දැනට පවත්නා ආරක්ෂණ පද්ධති විධිමත් කිරීම පිළිබඳව අවධානය යොමුකරවීම සඳහා මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ කෙටියෙන්

- දැනට ක්‍රියාත්මක වන වර්ෂ 120 ක් පමණ පැරණි 1902 අංක 09 දරන ලංකා දුම්රිය ආඥා පනතෙහි නීතිරීති රෙගුලාසි, දණ්ඩනයන් හා නිල නාමයන් ඇතුළු පනතෙහි වගන්ති වර්තමානයට සුදුසු පරිදි කඩිනමින් සංශෝධනය කර කාර්යක්ෂම පරිපාලනයට උපයෝගී කරගත හැකි පරිදි පනත බලගැන්වීම කටයුතු කිරීම.
- දුම්රිය හරස් මාර්ගයන්හි ආරක්ෂාව නිසි පරිදි යෙදවීමට අවශ්‍ය පියවර ගැනීමත්, ඉහළ පිරිවැයක් දරා ස්ථාපිත කරන ලද ආරක්ෂිත පද්ධතීන් නිසි පරිදි නඩත්තු කරමින් සිදු වන අනතුරු වලක්වා ගැනීමට ගත හැකි සෑම පියවරක්ම ගැනීම.

- ශ්‍රී ලංකාව තුළ දුම්රිය හරස් මාර්ග කොපමණ ප්‍රමාණයක් තිබේද යන්න පිළිබඳ නිවැරදි අධ්‍යයනයක් සිදු කර යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කිරීම හා අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග අනතුරු වලින් මියගිය හා තුවාල ලැබූ පුද්ගලයින්ට සහ දේපළවලට වන්දි ලබාදීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- මාර්ග ආරක්ෂණ පද්ධති ඉදිකිරීම සඳහා වූ තම වගකීම නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් දුම්රිය එන්ජින්, මැදිරි හා මාර්ගයට සිදු වූ හානිය හා ඒවා යථාවත් කිරීමට දරන ලද පිරිවැය සම්බන්ධයෙන් අදාළ කාලපරිච්ඡේදයන් වලදී දුම්රිය සාමාන්‍යාධිකාරී තනතුරේ රාජකාරි කරනු ලැබූ පුද්ගලයින්ට එරෙහිව පවත්නා නීති පරිදි කටයුතු කිරීම.

- තාක්ෂණ ඇගයීම් කමිටුව විසින්විනිවිධභාවයෙන් කටයුතු කර ඇති බව අදාළ ප්‍රකාශ හා වාර්තා මගින් තහවුරු නොවන බැවින් හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලයට ප්‍රමාණවත් හා සත්‍ය තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ කාර්යභාරය නිසි පරිදි ඉටුකිරීම පිළිබඳව සලකා බැලීම.

- දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය අවලංගු කිරීමේ හැකියාව සොයා බැලීමට පත් කරන ලද කමිටුවක් මගින් ප්‍රසම්පාදනය අවලංගු කර නැවත ප්‍රසම්පාදනයක් සිදුකර මාර්ග ආරක්ෂණ පද්ධති ස්ථාපනය කරන ලෙස නිර්දේශ ලබා දී තිබියදීත් එම නිර්දේශයන් සම්බන්ධයෙන් ඇගයීම් කිරීමකින් තොරව වසර 2 ½ කට පමණ පසුව එකී ප්‍රසම්පාදනය අදාළ සමාගම වෙත පැවරීමට ක්‍රියාකිරීම පිළිබඳව හා එයට අදාලව ක්‍රියාකළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඒ හරහා යම් මූල්‍යමය අක්‍රමිකතාවක් සිදුවී ද යන්න පිළිබඳ පරීක්ෂා කළ යුතු වීම.

- සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තුව නොමග යැවීමට කටයුතු කල හා අදාළ කාලය තුළ ප්රසම්පාදන කාර්යය ඉටු නොකළ සැපයුම්කාර සමාගම සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුවීම.

# විශේෂ විමර්ශන අංශය

විමර්ශනය යන වචනය මූලික වශයෙන් යොදා ගනු ලබන්නේ යම් සිද්ධියක හෝ පවත්නා තත්ත්වයක සැබෑ ස්වරූපය හඳුනා ගැනීමේ උපකරණයක් වශයෙනි. යම් සිද්ධියක් හෝ පවත්නා තත්ත්වයකට පසුබිම් වූ කරුණු, අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග, එහි පවත්නා ලක්ෂණ, එමගින් ජනිත විය හැකි ප්‍රතිපල හා එහි පාර්ශ්වයන් යන කරුණු විමර්ශනයකදී අනාවරණය කොට විග්‍රහ කරනු ලැබේ. ඒ අයුරින් යම් විගණන ආස්ථිත්‍යකට අදාළව යම් සාමාන්‍ය නොවන හා සැක උපදවන යම් ගණුදෙනුවක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනාත්මක විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැනනඟින විට එවැනි විමර්ශන විගණන කාර්යයන් විශේෂ විමර්ශන අංශය මගින් සිදු කරනු ලබයි. ඒ සඳහා ජාතික විගණන කාර්යාලයේ සේවයේ නිරත විශේෂ විමර්ශන හා ව්‍යවහාරික විගණනය පිළිබඳ පුහුණුව සහ අත්දැකීම් සහිත නිලධාරීන්ගෙන් සමන්විතව විශේෂ විමර්ශන අංශයක් ස්ථාපිත කර ඇත. මෙම විගණන කටයුතු සිදු කිරීමේදී යෙදා ගන්නා ක්‍රමවේදය කාර්යාලීය වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති අතර ඒ අනුව පලමුවෙන් සිද්ධිය සම්බන්ධයෙන් වන අවදානම් රාමුව හඳුනා ගැනේ. ඒ අනුව විගණනය සැලසුම් කිරීම හා සම්පත් යෙදවීම, විගණනය ක්‍රියාත්මක කිරීම, අනාවරණ කරගැනීම, ප්‍රතිචාර ලබා ගැනීම හා වාර්තාකරණය යන පියවරයන් අනුගමනය කරනු ලැබේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 04 වගන්තිය පරිදි විගණකාධිපතිවරයා වෙත යොමු කරනු ලබන මහජන නියෝජනවලින් පැන නගින කරුණු, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම්, රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙතින් ලැබෙන තොරතුරු, ජනමාධ්‍ය මගින් අනාවරණය කරන තොරතුරු, කාලීනව වැදගත්කමක් ඇති වෙනත් ආර්ථික හා සමාජීය කරුණු යනාදි සැලකිල්ලට ගනිමින් විශේෂ විගණන විමර්ශනයකට ලක්කිරීමට තරම් ප්‍රමාණාත්මක හා ගුණාත්මක වන ගණුදෙනු හා සිද්ධීන් මෙම විමර්ශන අංශයේ දී විගණනයට ලක් කරනු ලැබේ.

අංශය තුල සිදුකරන විමර්ශනාත්මක විගණනයන්ට අමතරව ඇතැම් අවස්ථාවල දී මෙම අංශයේ නිලධාරීන් සේවා අවශ්‍යතාවය පරිදි වෙනත් විගණන අංශ/ශාඛා වෙත තාවකාලිකව අනුයුක්ත කර එම අංශ/ශාඛා වෙත පැවරී ඇති කාර්යන්ට අදාළ විශේෂ විමර්ශනයන් සිදු කරනු ලැබේ.

2023 වර්ෂයේ දී එලෙස විශේෂ විමර්ශනයට ලක් කළ ගණුදෙනු හා සිද්ධීන් සමූහය අතරින් ප්‍රමාණාත්මකව වැදගත් පරීක්ෂාවන් පහත දක්වා ඇත.

විමර්ශනට ලක්කළ ගණුදෙනු/සිද්ධීන්/ආයතන

i. 2022 ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ T -20 ලෝක කුසලාන (පිරිමි) ක්‍රිකට් තරඟාවලිය ආශ්‍රිත විශේෂ විගණනය

ii. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් කොටසක් අඩු වටිනාකමට තක්සේරු කර සමාගමකට ලබා දීම සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාව

iii. වී අලෙවි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ණය ගැති ශේෂය යටතේ දක්වා තිබුණු රු.මිලියන 3,047.107 ක ශේෂය පිළිබඳ පරීක්ෂාව

iv. මීතොටමුල්ල කසල කන්ද නාය ගිය ස්ථානයේ නාගරික උද්‍යානයක් ඉදිකිරීම හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධ විගණන පරීක්ෂාව

v. ලුනාව තානායම ඉඩම රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් විමර්ශනය

vi. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කළ ඉගෙනුම් ක්‍රියාවලිය තුල සහකම්පනය ව්‍යාපෘතියට අදාළ නියෝජනය පරීක්ෂාව

vii. ශ්‍රී ලංකා හඳුබිම අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ අලෙවි ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කර සමූපාකර සංගමයක් පිහිටු වීම වෙනුවට සමූපාකාර සමිතියක් පිහිටු වීම පිළිබඳ විගණන පරීක්ෂාව

viii. ජනමාධ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය ආශ්‍රිත නවීකරණය හා වැඩිදියුණු කිරීමේ කටයුතු පිළිබඳ විගණන පරීක්ෂාව

ix. මුදල් අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරියෙකු සඳහා ආචාර්ය උපාධිය හැදෑරීමට වැටුප් සහිත නිවාඩු ලබා දීම පිළිබඳ විගණන පරීක්ෂාව

x. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීම් පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂාව

xi. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලබා දීම හා නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳ විගණන පරීක්ෂාව

xii. ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ පාලන කටයුතු සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාව

xiii. දකුණු පාළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රජයේ වාහන අවභාවිතය හා ලිපිලේඛන අඩුපාඩු සහිතව පවත්වාගනෙ යාම පිළිබඳ පරීක්ෂාව

xiv. ශ්‍රී ලංකා කරතේ දෝ සම්මේලනයේ කටයුතු අතුරු පාලක කමිටුවක් යටතට පත්කිරීමට ක්‍රීඩා අමාත්‍යවරයා ලබාදුන් අනුමැතිය මඟ දමා චෝදනා එල්ලවී තිබුණු නිලධාරීන්ට සම්මේලනයේ කටයුතු පවත්වාගෙන යාමට ඉඩකඩ සැලසීම

xv. 2015-2022 කාලය තුල ශ්‍රී ලංකාවේ හොකී ක්‍රීඩාවේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාව

විශේෂ විමර්ශන අංශය විසින් අනාවරණය කර ගත් ඇතැම් නිරීක්ෂණ ජාතික විගණන පනතේ 11 හා 12 වගන්තිය පරිදි නිකුත් කරනු ලබන වාර්ෂික විගණණ වාර්තා ලෙස ද පනතේ 13 වගන්තිය පරිදි නිකුත් කරනු ලබන විශේෂ වාර්තාවන් ලෙස ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව පරදි සභාගත කරනු ලබන අතර ඇතැම් නිරීක්ෂණ කළමනාකරණය වෙත නිකුත් කරනු ලබන වාර්තාවලට පමණක් ඇතුළත් කරනු ලැබේ.

කෙසේ වෙතත් 2023 වර්ෂයේ විගණන කාර්ය මණ්ඩළයේ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් යටතේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මූල්‍ය ප්‍රකාශන විගණන කටයුතු සඳහා විශේෂ විමර්ශන අංශයේ

නිලධාරීන් වරින් වර වෙනත් විගණන ශාඛා වෙත තාවකාලිකව හා ස්ථිර පදනමින් අනුයුක්ත කිරීම විමර්ශන අංශයේ කාර්යභාරයන් වෙත සීමාකාරී බලපෑමක් ඇති කරවනු ලැබීය.

විමර්ශන විගණනයක් සඳහා සාපේක්ෂව වැඩි කාලයක් ගතවීම සහ විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබාදීමට ආයතන විසින් විශාල කාලයක් ගතකිරීම මෙන්ම එම පිළිතුරු නැවත නැවත සමාලෝචනය කිරීමට සිදුවීම යනාදී කරුණු එකිනෙක වර්ෂ තුල දී සිදුකරනු ලබන විශේෂ විමර්ශන විගණනයන්හි නිරීක්ෂණ ඉහත සඳහන් වාර්තාවල ඇතුලත් කිරීම විගණනය සිදුකරන වර්ෂය තුල දී හෝ බොහෝවිට ඉදිරි වර්ෂවල දී සිදු කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE